# විනය පිටකය

# 1

## භික්ඛු විභඞ්ගය.

ධම්මනාග උගත් පණ්ඩිත
මහාස්ථවිරයන් වහන්සේලාගේ
ආධාර ඇතුව
ආචාර්ය්‍ය අධිනීතිඥ

ඒ. පී. ද සොයිසා මහතා

විසින්
සිංහලට පරිවර්තනය කරන ලදී.

ධර්මසමය යන්ත්‍රාලය,
49, පළමුවෙනි මරදාන,
කොළඹ.

බු. ව. 2500.
ක්‍රි. ව. 1956.

රු: 7. 50.

# සිංහල ත්‍රිපිටකය

# 27

# විනය පිටකය

# 1

## භික්ඛු විභඞ්ගය.

1 පාරාජික පාළිය. 2 පාචිත්තිය පාළිය.

ධර්මවිනය උගත් පණ්ඩිත
මහාස්ථවිරයන් වහන්සේලාගේ
ආධාර ඇතුව
ආචාර්ය අධිනීතිඥ

**ඒ. පී. ද සොයිසා මහතා**

විසින්
සිංහලට පරිවර්තනය කරන ලදී.

ධර්මසමය යන්ත්‍රාලය,
49, පළමුවෙනි මරඳාන,
කොළඹ.

බු. ව. 2500.
ක්‍රි. ව. 1957.

MW 3256

# අනුශාසක මණ්ඩලය

පැලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර නායක මාහිමියන්වහන්සේ

මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙණේ B. A., P. H. D. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ ප්‍රඥාසාර නායක ස්ථවිරයන් වහන්සේ

කළුතර පුලිනතලාරාමාධිපති ගරු. බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන් වහන්සේ

අම්බලම්ගොඩ මහා විහාරස්ථ විද්‍යාලෝක විද්‍යාලයාධිපති ශ්‍රී සද්ධර්මභාරතීශ්වර පණ්ඩිතාචාර්ය විලේගොඩ ශ්‍රී ධර්මානන්ද මහාස්ථවිරපාදයන් වහන්සේ

වැලිතර මහාකප්පිණමුදලින්දාරාමස්ථ රාජපක්ෂ පරිවෙණාධිපති ගරු රත්දෙඹේ ශ්‍රීසුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන්වහන්සේ

බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ

බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඥාණවිමල ස්ථවිරයන්වහන්සේ

රත්දෙඹේ මහාචෛත්‍ය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සෝමාලෝක නායක ස්ථවිරයන්වහන්සේ

අඹගහපිටියේ සුගත ශාසනෝදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන්වහන්සේ

අම්බලන්ගොඩ අග්ගාරමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ

ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ

බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන් වහන්සේ

මාදම්පේ සුනන්දෝදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී ප්‍රඥානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ

මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ

පණ්ඩිත එච්. නන්දසාර මහතා

ආචාර්ය ආර්යරත්න ජේරුකාන මහතා

# සංඥාපනය

විනය පිටකයෙහි, විභඞ්ග, ඛන්ධක, පරිවාරයයි කොටස් තුනකි. විභඞ්ගයේ භික්ඛු හෝ මහා විභඞ්ග, භික්ඛුණී විභඞ්ග වශයෙන් දෙකකි ඛන්ධකය මහාවග්ග, චුල්ලවග්ග නමින් කොටස් දෙකකට බෙදන ලදී. සමහර මතානුසාරව විනය පිටකය, පාරාජික, පාචිත්තිය, මහාවග්ග, චුල්ලවග්ග, පරිවාර පාළියයි පොත් පසකට බෙදා තිබේ. මේ පොතට භික්ෂු විභඞ්ගයේ පාරාජික පාළියද, පාචිත්තිය පාළියේ සදමෙති සෙනාසන (භූතගාම) වර්ගය අවසන් කොටද ඇතුළත් කෙළෙමු

මේ පොත් ලියා ප්‍රසිද්ධ කිරීමට නොයෙක් පළාත්වල සඞ්ඝයා වහන්සේලා දුන් ආධාරය මහත් උපකාරයක් විය.

මේ පොත් පෙළ කියවීමට නොයෙක් තරාතිරම්වල පින්වතුන් දක්වන උනන්දුව ප්‍රීතියට කාරණක් වේ. සමහර පාඨශාලා ශිෂ්‍යයින් විසින්ද මේ පොත් පිළිවෙලට කියවීමට පටන් ගෙන තිබේ.

බොහෝ වැඩ කටයුතුවල යෙදී සිටින කාලයක ශාසන ආලයෙන් ආචාර්ය ආරියරත්න රේරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාර මහත් බව නැවතත් දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආරියරත්න රේරුකාන මහත්මයාගේ ආධාර ලැබුනා පමණක් නොව රත්දොඹේ ශ්‍රී සුධම්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන් වහන්සේද, පණ්ඩිත ජී. ඇස්. බී. ඩබ්ලිව්. නානායක්කාර මහතාද, සී. ඈන් ඒ මුදලිගේ මහත්මයාද, ඇල්. ජී. පෙරේරු මහතාද ආධාර කළෝය.

මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත් බෞද්ධ උපාසක පින්වතුන්ටත් සාමාජිකයින් වශයෙන් පොත් ගැනීමට බැඳී සිටින පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මට,

7 – 2 – 57.

ජී. පී. ද සොයිසා.

# ත්‍රිපිටකයට අයිති කොටස්.

---

## i විනය පිටකය.

1. පාරාජික පාළි
2. පාචිත්තිය ,,
3. මහාවග්ග ,,
4. චූලවග්ග ,,
5. පරිවාර පාළි

## ii සූත්‍රපිටකය.

1. දීඝ නිකාය
2. මජ්ඣිම නිකාය
3. සංයුත්ත නිකාය
4. අඞ්ගුත්තර නිකාය
5. ඛුද්දක නිකාය
    1. ඛුද්දක පාඨ
    2. ධම්මපද
    3. උදාන
    4. ඉතිවුත්තක
    5. සුත්ත නිපාත
    6. විමාන වත්ථු
    7. පෙත වත්ථු
    8. ථෙර ගාථා
    9. ථෙරී ගාථා
    10. ජාතක
    11. නිද්දේස
    12. පටිසම්භිදා
    13. අපදාන
    14. බුද්ධ වංස
    15. චරියා පිටක

## iii අභිධර්ම පිටකය.

1. ධම්ම සඞ්ගණිප්පකරණ
2. විභඞ්ගප්පකරණ
3. කථා වත්ථුප්පකරණ
4. පුග්ගලපඤ්ඤත්තිප්පකරණ
5. ධාතුකථාප්පකරණ
6. යමකප්පකරණ
7. පට්ඨානප්පකරණ

ධර්මසමය

# ත්‍රිපිටක පොත් පෙළ.

## සිංහලට පරිවර්තනය කර

දැනට අච්චුගස්වා ප්‍රසිද්ධකර තිබෙන පොත්

| | | | |
|---|---|---|---|
| 1. | දීඝනිකාය | I | කාණ්ඩය. |
| 2. | දීඝනිකාය | II | ,, |
| 3. | දීඝනිකාය | III | ,, |
| 4. | මජ්ඣිමනිකාය | I | ,, |
| 5. | මජ්ඣිමනිකාය | II | ,, |
| 6. | මජ්ඣිමනිකාය | III | ,, |
| 7. | මජ්ඣිමනිකාය | IV | ,, |
| 8. | මජ්ඣිමනිකාය | V | ,, |
| 9. | සංයුත්ත නිකාය | I | ,, |
| 10. | සංයුත්ත නිකාය | II | ,, |
| 11. | සංයුත්ත නිකාය | III | ,, |
| 12. | සංයුත්ත නිකාය | IV | ,, |
| 13. | සංයුත්ත නිකාය | V | ,, |
| 14. | සංයුත්ත නිකාය | VI | ,, |
| 15. | සංයුත්ත නිකාය | VII | ,, |
| 16. | අඞ්ගුත්තර නිකාය | I | ,, |
| 17. | අඞ්ගුත්තර නිකාය | II | ,, |
| 18. | අඞ්ගුත්තර නිකාය | III | ,, |
| 19. | අඞ්ගුත්තර නිකාය | IV | ,, |
| 20. | ඛුද්දක නිකාය | I | ,, |
| 21. | ඛුද්දක නිකාය | II | ,, |
| 22. | ඛුද්දක නිකාය | III | ,, |
| 23. | ඛුද්දක නිකාය | IV | ,, |
| 24. | ඛුද්දක නිකාය | V | ,, |
| 25. | ඛුද්දක නිකාය | VI | ,, |
| 26 | ඛුද්දක නිකාය | VII | ,, |
| 27. | විනය පිටකය | I | ,, |

ධර්මසමය යන්ත්‍රාලය,

49, පළමුවෙනි මරදාන,

කොළඹ.

# පටුන


| | | පිට |
|---|---|---|
| 1 | **පාරාජික පාළිය** | |
| 1 | භික්ෂු විභඞ්ගය (පාරාජික කාණ්ඩය) | 1 |
| I. | මෛථුන ධම්ම පාරාජික ශික්ෂාපදය | 14 |
| 1. | සුදින්න බණවර ,, | 14 |
| 2. | මැදිරියගේ කථාව ,, | 27 |
| 3 | සන්තත බණවර ,, | 29 |
| 4. | පදභාජනීය ,, | 31 |
| 5. | මිශ්‍ර කථා ,, | 42 |
| ii (2) 6. | අදින්නාදාන පාරාජික ශික්ෂාපදය | 52 |
| 7. | පදභාජනීය ,, | 59 |
| 8 | මිශ්‍රකථා ,, | 72 |
| 9 | මනුස්ස විග්ගහ පාරාජික ශික්ෂාපදය | 89 |
| 10. | පදභාජනය ,, | 95 |
| 11 | දෙවෙනි බණවර ,, | 102 |
| iii 12. | උත්තරි මනුස්ස ධම්ම පාරාජික ශික්ෂාපදය | 116 |
| 13. | පදභාජනීය හා ශුද්ධිකය | 121 |
| 14 | ඛණ්ඩ චක්‍රය | 128 |
| 15 | බද්ධ චක්‍රය | 130 |
| 16. | එකමූලිකය | 130 |
| 17. | සබ්බමූලිකය | 131 |
| 18. | ප්‍රත්‍යය හා සම්බන්ධ වාර කථා | 133 |
| 19. | අනාපත්ති | 135 |
| 20 | කථාවස්තු | 135 |
| 2. | **සංඝාදිසේස දහතුන** | 145 |
| 1. | සංඝාදිසේසය | 145 |
| | කථා | 158 |
| 2 | සංඝාදිසේසය | 163 |
| | කථා | 175 |
| 3. | සංඝාදිසේසය | 178 |
| | කථා | 182 |
| 4 | සංඝාදිසේසය | 184 |
| | කථා | 188 |
| 5. | සංඝාදිසේසය | 189 |
| | කථා | 210 |

| | | | |
|---|---|---|---|
| 6 | සංඝාදිසෙසය | | 211 |
| 7. | ,, | ,, | 227 |
| 8 | ,, | ,, | 235 |
| 9. | ,, | ,, | 251 |
| 10. | ,, | ,, | 259 |
| 11. | ,, | ,, | 264 |
| 12. | ,, | ,, | 268 |
| 13. | ,, | ,, | 272 |
| 3. | අනියත දෙක | | |
| 1 | පළමුවෙනි අනියත ශික්ෂාපදය | | 285 |
| 2. | දෙවෙනි අනියත ශික්ෂාපදය | | 289 |
| 4 | නිසගි පචිති තිස | | |
| (i) | කඨින (චීවර) වග්ග | | |
| 1. | පළමුවෙනි කඨින ශික්ෂාපදය | | 293 |
| 2 | උද්දොසිත ශික්ෂාපදය | | 295 |
| 3. | තුන්වෙනි කඨින ශික්ෂාපදය | | 301 |
| 4 | පුරාණ චීවර | ,, | 304 |
| 5. | චීවර පිළිගැනීමේ | ,, | 307 |
| 6 | අඤ්ඤාතක විඤ්ඤත්ති | ,, | 310 |
| 7. | තතුත්තරි | ,, | 314 |
| 8. | උපක්ඛට | ,, | 316 |
| 9 | දෙවෙනි උපක්ඛට | ,, | 319 |
| 10. | රාජ ශික්ෂාපදය | ,, | 321 |
| (ii) | එළක ලොම් කොසිය වග්ග | | |
| 1. | කොසිය ශික්ෂාපදය | | 326 |
| 2. | සුද්ධකාළක | ,, | 328 |
| 3. | ද්වෙභාග | ,, | 329 |
| 4 | ඡබ්බස්ස | ,, | 330 |
| 5. | නිසීදන සන්ථත ශික්ෂාපදය | | 333 |
| 6. | එළකලෝම | ,, | 337 |
| 7. | එළකලෝම ධෝවන | ,, | 339 |
| 8. | රූපිය | ,, | 342 |
| 9. | රූපිය සංවොහාර | ,, | 345 |
| 10. | කය වික්කය | ,, | 348 |

(iii) පාත්‍ර වග්ග.

| | | |
|---|---|---|
| 1. | පාත්‍ර ශික්ෂාපදය | 358 |
| 2. | ඌනපඤ්චබන්ධන ශික්ෂාපදය | 364 |
| 3. | භෛසජ්ජ ශික්ෂාපදය | 359 |
| 4. | වස්සිකසාටික ,, | 365 |
| 5. | චීවර අච්ඡින්දන ,, | 367 |
| 6 | සූත්‍ර විඤ්ඤත්ති ,, | 369 |
| 7. | මහාපේසකාර ,, | 371 |
| 8. | අච්චේකචීවර ,, | 375 |
| 9. | සාසඞ්ක ,, | 378 |
| 10. | පරිණත ,, | 381 |

## 2 පාචිත්ති පාළිය

1. මුසාවාද වග්ග

| | | |
|---|---|---|
| 1. | මුසාවාද ශික්ෂාපදය | 385 |
| 2. | ඔමසවාද ශික්ෂාපදය | 392 |
| 3. | පෙසුඤ්ඤ ශික්ෂාපදය | 407 |
| 4. | පදසෝධම්ම ,, | 410 |
| 5 | සහසෙය්‍ය ,, | 411 |
| 6. | දෙවෙනි සහසෙය්‍ය ,, | 414 |
| 7. | ධම්ම දේශනා ,, | 418 |
| 8. | භූතාරෝචන ,, | 421 |
| 9. | දුට්ඨුල්ලාරෝචන ,, | 426 |
| 10. | පඨවිඛණන ශික්ෂාපදය | 428 |

2. සේනාසන (භූතගාම) වග්ග

| | | |
|---|---|---|
| 1. | භූතගාම ශික්ෂාපදය | 429 |
| 2 | අඤ්ඤවාදක ,, | 431 |
| 3. | උජ්ඣාපනක ,, | 434 |
| 4. | පළමුවන සේනාසන ,, | 436 |
| 5. | දෙවෙනි ,, ,, | 437 |
| 6. | අනුපඛජ්ජ ශික්ෂාපදය | 439 |
| 7. | නික්කඩ්ඪන ,, | 440 |
| 8. | වෙහාසකුටි ,, | 442 |
| 9 | මහල්ලක විහාර ,, | 444 |
| 10 | සප්පාණක ,, | 446 |

# ශුද්ධිපත්‍රය

| පිට | පෙළ | වරද | නිවරද |
|---|---|---|---|
| 4 | 18 | තපස්විත් වෙහෙසන | තපස් ඇති |
| 21 | 3 | කියත්තෙ | කියත්තෙමි |
| 25 | 20 | මේ යන්න අත්හළ යුතුයි. | |
| 29 | 13 | ජේලියේ 11 යොදන්න වෙනුවට iii යොදන්න කියා යෙදිය යුතුයි. | |
| 30 | 30 | ආශ්‍රය | ආශ්‍රයට |
| 59 | 5 | සන්ථාන ඛණ්ඩයේ 56, 67 ඡේද වෙනුවට 4 පදභාජනීයේ 1, 2 ඡේද යොදන්න. | |
| 63 | 1 | යම්කින් | යම්කිසි |
| 65 | 31 | මෙහි 20 (ii) යන්න වෙනුවට | 26 (ii) විය යුතුයි |
| 67 | 1 | උපතියි | උපධියි |
| 70 | 7 | අනුත් | අනූත් |
| 93 | 28 | ජේලියේ ආයුධ යන්න අත්හළ යුතුයි. | |
| 95 | 29 | සන්ථාන ඛණ්ඩයේ 56 ඡේදය වෙනුවට පදභාජනීයේ 1, 2 ඡේද කියා විය යුතුයි. | |
| 101 | 2 | තැතිගති | තැතිගතී |
| 102 | 24 | ම | මරණ |
| 136 | 26 | කොතෙරේනම් | කෙරේනම් |
| 147 | 13 | ආශ්‍රමිණකවූද | අශ්‍රමිණකවූද |
| 148 | 2 | කා | යුක්තව |
| 149 | 13 | අකාශයෙහි | ආකාශයෙහි |
| 159 | 2 | මෙහි 1 (ii) වෙනුවට | 2 (i) යොදාගත යුතුයි |
| 164 | 1 | ගෙනදෙන්නෝ වෙති | ගෙණදෙන්නෝද වෙති |
| 175 | 9 | කෙ | කෙං |
| 196 | 36 | දනය | ධනය |
| 197 | 3 | අශ | දිශ |
| 199 | 19 | පිත්‍රයරක්ඛිතාවද | පිතුරක්ඛිතාවද |

| පිට | පෙළ | වරද | නිවරද |
|---|---|---|---|
| 231 | 7 | සපරික්‍රමන | සපරික්කමන |
| 241 | 2 | ඊශේ | ඊයේ |
| 241 | 30 | බවින් | බැවින් |
| 253 | 1 | පාරාජිතයේ | පාරාජිකයේ |
| 254 | 26 | සවල්ප | සවල්පය |
| 265 | 7 | මාදී | මාදීය |
| 268 | 31 | සප්විරති | සප්විරයෙති |
| 272 | 2 | සවල් | අසවල් |
| 274 | 7 | අතින් | අතින් |
| 281 | 31 | කොසිව | කොසියම |
| 284 | 9 | කලෙස් | කෙලෙස් |
| , | 13 | අයුෂ්මත් | ආයුෂ්මත් |
| 297 | 1 | බාහෝකල් | බොහෝකල් |
| 313 | 28 | කාලයතේ | කාලයෙන් |
| 338 | 4 | ඇත | ඇත |
| 341 | 2 | පැරණිවූ සිවිරත් | එළුලොම් සිවුරක් |
| ,, | 3 | ගස්සමා | අවුල් සරමා |
| 341 | 31 | අවුල්සරමාද යන්න අත්හල යුතුයි. | |
| 345 | 22 | කම | නම |
| 371 | 11 | 7 මනාපෙෂකාර ශික්ෂාපදය කියා යොදාගන්න. | |
| 385 | 21 | පේලියේ තියාති සහ තැනට (ii) මේ ලකුණද | |
| | 24 | පේලියේ කෙලෙස්නම් සහ තැනට iii මේ ලකුණද යොදන්න | |
| 386 | 15 | iv | vi |
| 402 | 31 | මතුසන්නට | මතුසන්නව |
| 412 | | මේ පිටේ සිට ශයනය යනු සයනය කියා වියයුතුයි. | |
| 417 | 18 | ගතයෝති | ගතයෝ නොවෙති. |

# විනය පිටකය

## පාරාජික පාළිය

### 1 භික්ෂු විභඞ්ගය

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

1 ඒ කාලයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වේරඤ්ජා නුවර සමීපයෙහි නළේරු යක්ෂයා අධිගෘහිතවූ කොසඹගස සමීපයෙහි පන්සියයක් පමණ මහා භික්ෂු සමූහයක් සමග වාසය කරණසේක.

2 වේරඤ්ජ නම් බ්‍රාහ්මණතෙම "භවත්නි, ශාක්‍ය වංශයෙන් පැවිදිවූ ශ්‍රමණ ගෞතම තෙම පන්සියයක් පමණවූ මහත් භික්ෂු සමූහයක් සමග වේරඤ්ජානුවර නළේරු නම් යක්ෂයා අධිගෘහිතවූ කොසඹ ගස සමීපයෙහි වාසය කරත්තේලු

3 "ඒ භවත් ගෞතමයන් වහන්සේ ඒ (භාග්‍යවතුන් වහන්සේ) මේ කාරණයෙනුදු අර්හත් නම් වනසේක. තමන්ම සියලු ධර්මයන් අවබොධ කරගත්තාලදී. ත්‍රිවිද්‍යා, අෂ්ට විද්‍යාවන් හා පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්තය. යහපත් ගමන් ඇත්තේය. තුන්ලොකය දත්තේය. දමනය කළයුතු පුරුෂයන් දමනය කිරීමට මීට වඩා ශ්‍රේෂ්ඨයෙක් නැත. දෙවි මිනිසුන්ගේ අනුශාසකයා. චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන් අවබොධ කළසේක. භාග්‍ය (පින්) ඇත්තේයයි (ii) මෙසේ යහපත් කීර්ති ශබ්දයක් පැන නැංගේය

4 "සොතෙම (i) දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බඹුන් සහිතවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත ලොකයෙහි දෙවි මිනිසුන් සහිතවූ (ii) සත්ව සමූහය විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ

කොට ප්‍රකාශකරයි. හෙතෙම මුල යහපත් මැද යහපත් අග යහපත් අර්ථ සහිත ව්‍යඤ්ජන ඇති දොස් නැති පිරිසිදුවූ බ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකාශ කරයි. (iii) එබඳු රහතුන්ගේ දැකීම ඇත්තේනම් යහපතැයි" කීයේය.

5 (i) ඉක්බිති වේරඤ්ජ බ්‍රාහ්මණතෙම (i) භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග ප්‍රතිවිය. සතුටු විය යුතුවූ සිහිපත් කටයුතුවූ කථාවකොට නිමවා එක පැත්තකට වී හුන්නේය. (ii) එක පැත්තකට වී හුන් වේරඤ්ජ බ්‍රාහ්මණතෙම භාග්‍ය-වතුන් වහන්සේට "භවත් ගෞතමයන් වහන්ස, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ (iii) දිරූ, මැහි මහළුවූ, බොහෝකල් ගත්, කලක් ඉක්මගිය, අන්තිම වයසට පැමිණි, බමුණන්ට නොවඳියි හෝ අස්නෙන් නොනැගිටී, හෝ අසුනක් (iv) බාර නොදෙයි" (iv) කියා මා විසින් එය අසනලදී. භවත් ගෞතමයන් වහන්ස, එය එසේමද? භවත් ගෞතමයන් වහන්සේ (මෙහි iii යොදන්න) බාර නොදෙයිද? භවත් ගෞතමයන් වහන්ස, එය අයුතුමය."

6 "බමුණ, (මෙහි 4 (i) යොදන්න) අතරෙහි මම යමෙකුට වදින්නෙම නම් හෝ දැක අස්නෙන් නැගිටින්නෙම නම් හෝ අසුන බාරදෙන්නෙම නම් හෝ ඔහු මම නොදක්නෙමි. බමුණ, තථාගතයන් වහන්සේ යමෙකුට වදින්නේ නම් හෝ දැක අස්නෙන් නැගිටින්නේ නම් හෝ අසුනක් බාරදෙන්නේ නම් හෝ ඔහුගේ හිස පැළී බිමට වැටෙන්නේයයි" වදාළසේක.

7 "භවත් ගෞතමයන් වහන්සේ සම්ගිරස නැති කෙනෙක් වැනිදැයි" ඇසීය. (ii) "බමුණ, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ සම්ගි රස නැත්තෙක් වැනියයි යම් කාරණයෙකින් මට මනාකොට කියන්නේ නම්, බමුණ, ඊට හේතුවක් ඇත්තේය. බමුණ, යම් ඒ රූපරසයෝ ඇද්ද, ශබ්ද රසයෝ ඇද්ද, ගන්ධ රසයෝ ඇද්ද, රස රසයෝ ඇද්ද, ස්පර්ශ රසයෝ ඇද්ද ඔව්හු තථාගතයන් වහන්සේට නැත්තාහ. මුල් සිඳින ලද්දාහ. මුදුන සිඳිනලද තල්ගසක් මෙන් කරණ ලද්දාහ.

ක්‍රමයෙන් නැති කරන ලදහ. මත්තෙහි නූපදිනා බවට පමුණුවන ලදහ. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ සම්භිරස නැත්තෙකු වැනියයි යමක් කාරණකොටගෙන මට මිනා-කොට කියන්නාහු කියත්ද, බමුණ, මේ ඒ කාරණයයි. ඔබ යමක් සඳහා කියයිද එය නොවේ.''

8 ''භවත් ගෞතමයන් වහන්සේ සම්භි පරිභොගයක් නැත්තෙක්දැයි'' ඇසීය (මෙහි 7 ඡේදය යෙදිය යුතුයි. යෙදීමේදී 'රසයන්' වෙනුවට 'පරිභොගයෝ' යොදන්න.)

9 ''භවත් ගෞතමයන් වහන්සේ වැඳීම් ආදී කුසල් නොකරණ බැවින් නොකිරීම් කියන්නෙක්දැයි'' ඇසීය. ''බමුණ, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ නොකිරීම් කියන්නෙකැයි යම් කාරණයකින් මට මිනාකොට කියන්නේ නම් බමුණ ඊට හේතුවක් ඇත්තේය. බමුණ, මම කායින් කරණ කරන බැව, වචනයෙන් කරණ කරන බැව, සිතින් කරණ කරන බැව නොකිරීම් කියමි. නා නා ප්‍රකාර ලාමක අකුශල ධර්මයන් නොකිරීම කියමි.'' ''ශ්‍රමණ ගෞතමයන් වහන්සේ නොකිරීම් කියන්නේයයි යම් කාරණයකින් මට මිනාකොට කියන්නේද?'' ''බමුණ, මේ ඒ ක්‍රමයයි. තුඹ යමක් සඳහා කියන්නේද එය නොවේ''

10 ''භවත් ගෞතමයන් වහන්සේ වැඳීම් ආදී ලෝක චාරිත්‍ර නැතිකරන්නෙක්දැයි'' ඇසීය. ''බමුණ, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ විනාශය කියන්නෙකැයි යම් කාරණයකින් මට මිනාකොට කියන්නේ නම්, බමුණ, ඊට හේතුවක් ඇත්තේය බමුණ, මම රාගයාගේ, ද්වේෂයාගේ, මෝහයාගේ විනාශය කියමි. නානාප්‍රකාර අකුශල ධර්මයන්ගේ විනාශය කියමි ශ්‍රමණ ගෞතමයන් වහන්සේ විනාශය කියන්නේයයි යම් කාරණයකින් මට මිනාකොට කියන්නේද, බමුණ, මේ ඒ ක්‍රමයයි. තුඹ යමක් සඳහා කියන්නේද එය නොවේ''

11 ''භවත් ගෞතමයන් වහන්සේ වැඳීම් ආදීය පිළිකුල් කරන්නේදැයි'' ඇසීය. ''බමුණ, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ වැඳීම් ආදිය පිළිකුල් කරන්නෙකැයි යම්

කාරණයකින් මට මහණගොව කියන්නේ නම්, බමුණ, ඒ ඒ හේතුවක් ඇත්තේය. බමුණ, මම ශරීරයෙන් කෙරෙන වැරදි පිළිකුල් කරමි. වචනයෙන් වන වැරදි පිළිකුල් කරමි. සිතින් වන වැරදි පිළිකුල් කරමි. නා නා ප්‍රකාර ලාමක අකුශල ධර්මයන් සමාපත්තියෙන් පිළිකුල් කරමි. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පිළිකුල් කරන්නෙකැයි (ii) යම් කාරණයකින් මට මහණගොව කියන්නේද, බමුණ, මේ ඒ කාරණයයි, නුඹ යමක් සඳහා කියයිද එය නොවේ''

12 ''භවත් ගෞතමයන් වහන්සේ හික්මිය යුත් නොහොත් නිග්‍රහ කළ යුත්තෙක් දැයි'' ඇසීය. ''බමුණ, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ හික්මිය යුත්තෙකැයි යම් කාරණයකින් මට මහණගොව කියන්නේද, බමුණ මම රාගය, ද්වේෂය, මෝහය, හික්මවීම පිණිස බණ කියමි. නා නා ප්‍රකාර අකුශල ධර්මයන් හික්මවීම පිණිස බණ කියමි. ''ශ්‍රමණ ගෞතමයන් වහන්සේ හික්මිය යුත්තෙකැයි (මෙහි 11 (ii) සොදන්න.)

13 'භවත් ගෞතමයන් වහන්සේ වැදීම ඇදීම නොකර තපස්වීන් පෙළනසුළු කෙනෙක් දැයි'' ඇසීය. ''බමුණ, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ තපස් ඇත්තෙකැයි යම් කාරණයකින් මට මහණගොව කියන්නේද, බමුණ මම කාය දුශ්චරිතය වාක් දුශ්චරිතය මනෝ දුශ්චරිතය තැවිය යුතුයයි කියමි. අකුශල ධර්මයන් තැවිය යුතුයයි කියමි. බමුණ, යමෙකුට එනම් තැවිය යුතු ලාමක අකුශල ධර්මයෝ ප්‍රහීන වූවාහු වෙත්ද, මුල් උදුරණ ලද්දාහු වෙත්ද, මුදුන සිඳින ලද තල්ගසක් මෙන් කරණ ලද්දාහු වෙත්ද, අභාවයට යවන ලද්දාහු වෙත්ද, නූපදින ස්වභාවයට පමුණුවන ලද්දාහු වෙත්ද, ඔහුට මම තපස් ඇත්තේයයි කියමි. බමුණ, තථාගතයන් වහන්සේ විසින් තැවීම කටයුතුවූ ලාමක අකුශල ධර්මයෝ ප්‍රහීන කරණ ලද්දාහ. සිඳින ලද මුල් ඇත්තාහ. මුදුන සිඳින ලද තල්ගසක් මෙන් කරණ ලද්දාහ. අභාවයට යවන ලද්දාහ. මිත්තෙනි

නූපදින ස්වභාවයට පමුණුවන ලද්දහ. බමුණ, ශ්‍රමණ ගෞතම තෙමේ තපස් ඇත්තේයයි යම් ක්‍රමයකින් කියන්නාහු කියත්නම් මේ ඒ ක්‍රමයයි. ඔබ යමක් සඳහා කියන්නෙහිද, එය නොවේ."

14 "භවත් ගෞතමයන් වහන්සේ දෙව්ලොව ඉපදීමෙන් පහවූයේදැයි" ඇසීම, "බමුණ, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ දෙව්ලොව ඉපදීමෙන් වෙන්වූයේයයි යම් හෙයකින් මට මනාකොට කියන්නේද, බමුණ, මම මත්තෙහි ගර්භයෙහි සයනය කිරීම නැමති භවයෙහි ඉපදීම නැති කරන ලදී සිඳින ලද මුල් ඇත්තාහු මෙන්ද, මුදුන සිඳින ලද තල්ගසක් මෙන් කරණ ලද්දාහුද, අභාවයට යවන ලද්දාහුද, මත්තෙහි නූපදින ස්වභාවයට පමුණුවන ලද්දාහුද, එය මම ඉපදීමෙන් වෙන්වීමයයි කියමි. බමුණ, තථාගතයන් වහන්සේ මත්තෙහි ගැබක සයනය කිරීම නැමති භවයෙහි ඉපදීම නැතිකරණ ලද්දහ මුල් උදුරාදමන ලද්දහ. මුදුන සිඳූ තල්ගසක් මෙන් කරණ ලද්දහ. අභාවයට යවන ලද්දහ. මත්තෙහි නූපදින ස්වභාවයට පමුණුවන ලද්දහ. බමුණ, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ඉපදීමෙන් තොරවූයේයයි කියා මට යම් හෙයකින් කියන්නාහු නම් මේ ඒ ක්‍රමයයි. ඔබ යමක් සඳහා කියන්නේ නම් එය නොවේ.

15 "බමුණ, යම්සේ අටක් හෝ දහයක් හෝ දොළසක් හෝ කිකිළි බිත්තර වෙත්ද, ඒ බිත්තර උඩ කිකිළිය මනාකොට නිදන ලද්දේද, මනාකොට උණුසුම් කරණ ලද්දාහු වෙත්ද, කුකුළු ගඳ ගස්වන ලද්දාහු වෙත්ද, ඒ කුකුළු පැටවුන්ගෙන් යම් කිසිවෙක් පළමුවෙන් පාදයේ නිය අගින් හෝ තොටු අගින් හෝ බිත්තරය බිඳ සැපසේ පිටවන්නේද, කිමෙක්ද? ඔහු කෙසේ වැඩිමහල්ද බාලයයි කිව යුත්තේයි" ඇසීම, "භවත් ගෞතමයන් වහන්ස, ඔහුට වැඩිමහල්යයි කිව යුතුය. හෙතෙම ඔවුන්ගේ වැඩිමලා ය. බමුණ, එපරිද්දෙන්ම මම හාත්පසින් වැසුන අවිද්‍යාවට ගිය සත්වයන් අතරෙහි අවිද්‍යා නැමැති බිත්තරය බිඳ තනිව ලෝකයෙහි ශ්‍රේෂ්ඨ බුද්ධත්වය ලැබුයෙමි. බමුණ, ඒ මම ලෝකයාට ජ්‍යේෂ්ඨය ශ්‍රේෂ්ඨය.

16 "බමුණ, මා විසින් වීර්‍යය පටන්ගන්නා ලද්දේ නොසැලුනේය. සිහිය එළඹ සිටියේය. මුළානොවීය. ශරීරය සංසිඳුනේය. දැඩි නැති විය. සිත සමාධිගත විය. එකඟවූයේය. බමුණ, ඒ මම (ii) කාමයන්ගෙන් වෙන්වූ අකුශල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් උපන් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කෙළෙමි. විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් ඇතුළත පැහැදීම ඇති සිත් හා එකට පහළවීම ඇති විතර්ක නැති විචාර නැති සිත එකඟ කිරීමෙන් උපන් දෙවෙනි ධ්‍යානයට පැමිණ වාසය කරයි. ප්‍රීතිය පහවීමෙන් උපෙක්ෂාවෙන් යුක්තව වාසය කළෙමි. සිහි ඇතිව යහපත් නුවණින් යුක්තව සසිත් සැපයක් වින්දෙමි, යමක් ආර්‍යයෝ උපෙක්ෂා ඇත්තේ සිහි ඇත්තේ සැපසේ වාසය කෙරේයයි කියත්ද, ඒ තුන්වෙනි ධ්‍යානයට පැමිණ වාසය කෙළෙමි සැප නැතිවීමෙන්ද දුක නැතිවීමෙන්ද පෙරම සොම්නස් දොම්නස් දෙකම අස්තඞ්ගතව යාමෙන් දුක් නැති සැප නැති උපෙක්ෂාවෙන් උපන් සිහියේ පිරිසිදුකම ඇති සතරවෙනි ධ්‍යානයට පැමිණ වාසය කරමි.

17 "ඒ මම මෙසේ සිත එකඟවූ කල්හි පිරිසිදුවූ කල්හි දීප්තිමත්වූ කල්හි කිලිටි නැතිවූ කල්හි කෙලෙස් නැතිවූ කල්හි පහවූ උපදුරු ඇති කල්හි මෘදුවූ කල්හි කර්මයට යෝග්‍යව සිටි කල්හි නොසෙල්වෙන බවට පැමිණි කල්හි පෙර විසූ කඳ පිළිවෙළ සිහිකරණ නුවණ පිණිස සිත නැමූයෙමි. (මෙහි 'කෙරෙයි' යන්න 'කෙළෙමි' කියා වෙනස්කොට 1 දීඝනිකායේ 74 ඡේදය යොදන්න.) (126 පිට) බමුණ, මේ මාගේ බිජුවටින් කුකුළු පැටියාගේ මෙන් ප්‍රථම පහළවීම වේ.

18 (මෙහි 'නමයි' යනු 'නැමීමි' කියා වෙනස්කොට I දීඝනිකායේ 76 ඡේදය යොදන්න)(128 පිට)බමුණ මේ මාගේ බිජුවටින් කුකුළු පැටවාගේ මෙන් දෙවෙනි පහළවීම වේ..

19 (මෙහි 'නමයි'යනු 'නැමීමි' කියා වෙනස්කොට 1 දීඝනිකායේ 78 ඡේදය යොදන්න,) (130 පිට) බමුණ, මේ මාගේ බිජුවටින් කුකුළු පැටවාගේ මෙන් තුන්වෙනි පහළවීම වේ.

20 මෙසේ කී කල්හි වෙරඤ්ජ බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට 'භවත් ගෞතමයන්වහන්සේ ජ්‍යෙෂ්ඨය, භවත් ගෞතමයන්වහන්සේ ශ්‍රේෂ්ඨය. (මෙහි 1 දීඝනිකායේ 132 පිටේ 'ස්වාමීනි, මෙතැන සිට ගනිමි' යන තැනට සොයාදන්න.) භවත් ගෞතමයන්වහන්සේ භික්ෂු සංඝයා සමග වෙරඤ්ජාවෙහි වස්විසීම ඉවසනසේක්වා'' කීයේය. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසූසේක. ඉක්බිති වෙරඤ්ජ බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන්වහන්සේගේ පිළිගැනීම දැන අස්නෙන් නැගිට, භාග්‍යවතුන් වහන්සේ ඉදිරිට නැමී වැද (පැදකුණුකොට) ගියේය.

21 එකල්හි වනාහී වෙරඤ්ජාවෙහි දුර්භික්‍ෂ ඇත්තේ වෙයි. ජීවත් වේදෝ නොවේදෝ යි සැක අදහස් දෙන ඇත්තේ, සුදුවූ ධාන්‍ය ඇත්තේ, සිට්ටු ක්‍රමයෙන් ජීවත්වීම ඇත්තේ පිඬු සිඟීමෙන් ජීවත්වන්ට නොහැක්කේ විය. එකල්හි වනාහී උතුරු දෙසයෙහිවූ අශ්ව වෙළෙන්දෝ අශ්වයන් පන්සියයක් සමග වෙරඤ්ජාවෙහි වාසයට පැමිණියාහු වෙත්. ඔවුන් විසින් අශ්වයින් සිටි භූමියේ භික්ෂූන්ට තැලියක් පමණ යව එක් නම්බට නිරතුරු සරණ ලද්දාහු වෙත්

22 භික්‍ෂූහු පෙරවරු වේලෙහි හැඳ පෙරවා පාත්‍ර සිවුරු රැගෙන වෙරඤ්ජාවට පිඬු පිණිස වැඩ පිඬු නොලබන්නාහු අශ්වභූමීන්හි පිඬු පිණිස හැසිර යව තැලිය තැලිය ආරාමයට ගෙනවුත් වනේ කොටා අනුභව කරත්. ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ යව තැලියක් ගලෙක්හි අඹරා භාග්‍යවතුන් වහන්සේට පිළිගැන්වූයේය. භාග්‍යවතුන් වහන්සේ එය වැළඳූසේක

23 භාග්‍යවතුන් වහන්සේ වංගෙඩි ශබ්දය ඇසූසේක. තථාගතවරයෝ දන්නාහුද විචාරත්, දන්නාහුද නොවිචාරත්. කාලය දැන විචාරත්, කාලය දැන නොවිචාරත්. තථාගත වරයෝ වැඩක් ඇතිව විචාරත්, වැඩක් නැතිව නොවිචාරත් වැඩක් නැති දෙය තථාගතයන් විසින් මාර්ගයෙන් නසනලදී දෙපරිද්දෙකින් භාග්‍යවත් බුදුවරු භික්‍ෂූන් විචාරත්. බණ හෝ වදාරන්නෙමි. ශ්‍රාවකයන්ට ශික්‍ෂාපද හෝ පනවන්නෙමියි කියාය.

24 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට කථා කළ සේක. "ආනන්දය, ඒ මංගෙහි ශබ්දය කුමක්දැයි" ඇසූ සේක. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැළ කළ සේක. "ආනන්දය, සාධුය, සාධුය, ආනන්දය, තොප වැනි සත් පුරුෂයන් නිසා දුර්භික්ෂය දිනන ලදී. පසුව ඇතිවන අය හැල් බත් හා මස් උසස් කොට ගණන් නොගන්නාහයි" වදාළ සේක.

25 ඉක්බිති ආයුෂ්මත් මහා මුගලන් ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පැත්තක හිඳියේය. එක් පැත්තක හුන් ආයුෂ්මත් මහාමුගලන් තෙමේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, දැන් වේරඤ්ජාවට දුර්භික්ෂ ගතී. අඳුනන් අඩුයකී. සුදු ඇට ඇත්තේය. සිට්ටු ක්‍රමයෙන් ජීවත්වීම ඇත, පිඩු සිඟා යෑමෙන් ජීවත්වන්නට නොහැක්ක, ස්වාමීනි. මේ පෘථිවියෙහි යට පැත්ත සම්පූර්ණය, කුඩා මැස්සන් විසින් බඳින ලද පිලවුන් නැති මීයක් මෙනි. එමෙන් සැමට රසවත්ය. ස්වාමීනි, මම පෘථිවිය පෙරලන්නෙම් නම් යහපති. භික්ෂූහු පෘථිවි රසය අනුභව කරන්නාහු නම් යහපත්යයි" කීයේය "මොග්ගල්ලානය යම් ඒ පෘථිවිය ඇසුරු කොට ඇති සත්තු වෙත්ද ඔවුනට කුමක් කරන්නෙහි දැයි" ඇසීය. "ස්වාමීනි, මම මහා පෘථිවිය ප්‍රමාණ එක් අතක් මවන්නෙමි. පෘථිවිය ඇසුරු කළ සත්තු වෙත්ද, ඔවුන් ඊට මාරු කරන්නෙමි. එක් අතකින් පොළොව පෙරලන්නෙමියි" කීයේය "මොග්ගල්ලානය, තොපට පොළොව පෙරළන්ට රුචි නොවේවා. සත්වයෝ විපරීතයට පැමිණෙන්නාහුය." "ස්වාමීනි, සියළු භික්ෂූහු උතුරුකුරු දිවයිනට පිණ්ඩපාතය පිණිස යන්නාහු නම් යහපතැයි කීයේය. මොග්ගල්ලානය, එපා. සියළු භික්ෂූන් උතුරුකුරු දිවයිනට පිණ්ඩපාතය නොයේවා."

26 ඉක්බිති රහසිගතවූ හුදකලාවූ ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට (ii) මෙසේ සිතට සැකයක් පහළවිය. කිනම්

භාග්‍යවත් බුදුනකෙනෙකුන්ගේ ශාසනය බොහෝ කල් නොපැවැත්තේද, කිනම් භාග්‍යවත් බුදුවරුන්ගේ ශාසනය බොහෝකල් පැවැත්තේද? (iii) ඉක්බිති ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සවස් කාලයෙහි ඵලසමවතින් නැගිටි සේ භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පැත්තකටවී සිටියේය. එකත්පසෙක සිටි ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට ''ස්වාමීනි, මෙහි රහසිගතවූ විවේකයට ගිය මට (මෙහි (ii) සඳහන) ''සාරිපුත්‍රය, (iv) විපස්සී බුදුරජාණන් වහන්සේගේද සිඛී බුදුරජාණන් වහන්සේගේද, වෙස්සභූ බුදුරජාණන් වහන්සේගේද ශාසනය බොහෝ කලක් (v) නොපැවැත්තේය. සාරිපුත්‍රය, කකුසඳ බුදුරජාණන් වහන්සේගේද කෝණාගම බුදුරජාණන් වහන්සේගේද කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේද ශාසනය බොහෝ කලක් පැවැත්තේයයි'' කීයේය.

27 ''ස්වාමීනි, යම් කරුණකින් භාග්‍යවත් (මෙහි 26 (iv) සඳහන) නොපැවැත්තේදැයි'' ඇසීය, ''සාරිපුත්‍රය, විපස්සී භාග්‍යවතුන් වහන්සේද, සිඛී භාග්‍යවතුන් වහන්සේද වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේද ශ්‍රාවකයන්ට විස්තර වශයෙන් ධර්මදේශනා කරන්ට වෙහෙසුනාහුය. උන්වහන්සේලාගේ (ii සූත්‍ර නමින් යුත් බණ, වාක්‍ය ගාථා දෙකින් මිශ්‍ර බණ, ගාථා, ප්‍රීති වාක්‍ය, මෙසේ කීයේය යන ධර්ම, ජාතක, විස්මය ජනක ධර්ම, බලවත් ප්‍රීතිවාක්‍ය යන අංග නාමයකින් යුත් ධර්මය ස්වල්පය, ශ්‍රාවකයන්ට ශික්ෂාපද නොපනවන ලදී. ප්‍රාතිමෝක්ෂය නොදෙසන ලදී. ඒ භාග්‍යවත් බුදුවරුන්ගේ පිරිනිවීමෙන් බුදුන් ගෙන් අසා අවබෝධ කරගත් ශ්‍රාවකයන්ගේ අතුරුදහන්වීමෙන් යම් ඒ පසුව සිටි ශ්‍රාවක කෙනෙක් ඇද්ද නොයෙක් නම් ඇත්තාහු නොයෙක් ගෝත්‍ර ඇත්තාහු නොයෙක් ජාති ඇත්තාහු නොයෙක් වංශ වලින් පැවිදිවූවාහු ඒ ධර්මය වහා අතුරුදහන් කලාහුය. සාරිපුත්‍රය, යම්සේ නොයෙක් මල් තැටියෙක්හි දමන ලද්දාහු නූලකින් නොගොතන ලද්දාහු වාතය විසුරුවයිද, පිඹ හරියිද, වනසයිද,

ඊට හේතු කවරේද? යම්සේ නූලකින් එකතු නොකරණ ලද්දාහුද එමෙනි ශාරිපුත්‍රය, එසේම ඒ භාග්‍යවත් බුදුවරුන්ගේ නැතිවීමෙන් නොයෙක් නම් ඇති, නොයෙක් ගොත්‍ර ඇති, නොයෙක් ජාති ඇති, නොයෙක් වංශවලින් පැවිදිවූ ශ්‍රාවකයෝ ඒ ශාසනය ඉක්මන නැතිකළාහුය. ඒ බුදුවරුද සිතින් සිත දැන ශ්‍රාවකයන්ට අවවාද කරන්නට නොවෙහෙසුනාහුය.

28 "ශාරිපුත්‍රය පෙරවූ දෙයක් කියමි. අර්හත් සම්‍යක් සම්බුද්ධවූ වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේ එක්තරා භයජනක වනලැහැබෙක්හි දහසක් භික්ෂු සංඝයා සිතින් සිත දැන අවවාද කරති, අනුශාසනා කරති. 'මෙසේ සිතව්. මෙසේ නොසිතව්. මෙසේ මෙනෙහි කරව්. මෙසේ මෙනෙහි නොකරව් මෙය අත් හරිව් මේව පැමිණ වාසය කරව්යයි' කියායි. ශාරිපුත්‍රය, ඉක්බිති ඒ භික්ෂූන් දහසට වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේ විසින් අවවාද කරන්නේ අනුශාසනා කරන්නේ රාගාදි වශයෙන් නොගෙන කෙලෙසුන්ගෙන් සිත මිදුණේය. ශාරිපුත්‍රය, එහි භයජනක වනලැහැබේ භයජනක බව මේ මෙසේ කිසි කෙලෙස් නැසූ කෙනෙක් ඒ වනලැහැබට පැමිණේද, බොහෝසෙයින් ලොම් කෙළින් සිටින්නේය. ශාරිපුත්‍රය, විපස්සී, සිඛී වෙස්සභූ බුදුවරුන්ගේ ශාසනය බොහෝ කල් නොපැවතීමට මේ හේතුවයි.

29 'ස්වාමීනි, යම් කරුණකින් (ii) කකුසඳ, කොනාගම්, කාශ්‍යප බුදුවරුන්ගේ ශාසනය බොහෝ කල් පැවැත්තේද ඊට හේතු ප්‍රත්‍යය කවරේද? (iii) ශාරිපුත්‍රය, කකුසඳ, කෝණාගම්, කාශ්‍යප යන බුදුවරු ශ්‍රාවකයන්ට විස්තර වශයෙන් ධර්මදේශනා කරන්නට වෙහෙස නුවූවාහුද, උන්වහන්සේලාගේ (මෙහි 21 (ii) ඡේදයෙහි "ස්වල්ප" වෙනුවට "බොහෝ"ද එසේම "අතුරුදහන් කළාහුය" යන්නට බොහෝ කලක් රැක්කාහුය' කියාද 'නූලකින් එකතු නොකරණ ලද්දාහු' යන්නට 'නූලකින් එකතුකරණ ලද්දාහු' කියාද, "නොවිසුරුවයි, පිඹ නොහරියි," "නොවනසයි, බොහෝ චිරස්ථායි වෙයි" කියා වෙනස්කර යොදාගත යුතුයි )

30 ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙමේ අස්නෙන් නැගිට තනිසව සිවුර එකාංශකොට පෙරවා, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතන්හි දොහොත් මුදුනේදී භාග්‍යවතුන් වහන්සේට "භාග්‍යවතුන් වහන්ස, මෙය කල්‍ය. සුගතයන් වහන්ස මෙය කාලය. යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවකයන්ට ශික්ෂාපද පනවන්නේද, ප්‍රාතිමෝක්ෂ උදෙසන්නේද, යමිසේ මේ බ්‍රහ්මචර්යය බොහෝ කල් පවත්නේවේ. බොහෝ කල් සිටින්නේවේයයි මෙසේ කීවේය." "ශාරිපුත්‍රය, ඔබ නවතින්න. ශාරිපුත්‍රය, ඔබ නවතින්න. තථාගතයන් වහන්සේම එයට කාලය දන්නේය ශාරිපුත්‍රය, තවම ශ්‍රාවකයන්ට ශික්ෂාපද නොපනවයි ප්‍රාතිමෝක්ෂ නොඋදෙසයි. යම්තාක් මෙහි කෙලෙස් ඇතිවන ඇතැම් කාරණයෝ සංඝයා කෙරෙහි පහළ නොවෙත්ද, එතාක්ම. ශාරිපුත්‍රය, සංඝයා කෙරෙහි කෙලෙස්වලට හේතු ධර්මයන් පහළවෙත්ද ඒ කෙලෙසුන්ට හේතු ධර්ම නැසීමට එකල ශාස්තෲන් වහන්සේ ශ්‍රාවකයන්ට ශික්ෂාපද පනවයි ප්‍රාතිමෝක්ෂය දේශනා කරයි. ශාරිපුත්‍රය, මේතාක් ලෝකයෙහි ඇතැම් ක්ලේශ ධර්ම කෙනෙක් සංඝයා කෙරෙහි පහළ නොවෙත්

31 "යම් තැනක සිට සංඝයා වස් ගණනින් මහත් බවට පැමිණියේද, (ii) එකල මෙලොකයෙහි කෙලෙසුන්ට හේතු කරුණු සංඝයා කෙරෙහි පහලවෙත්. එකල ශාස්තෲන් වහන්සේ ශ්‍රාවකයන්ට ශික්ෂාපද පනවනසේක. ඒ කෙලෙසුන්ට හේතු ධර්ම නැසීම පිණිස ප්‍රාතිමෝක්ෂය දේශනා කරණසේක. ශාරිපුත්‍රය, මේතාක් සංඝයා කෙරෙහි සමහර කෙලෙසුන්ට හේතු ධර්ම පහළ නොවෙත්.

32 "යම් තැනක සිට සංඝයා පිරිස් විශාලයෙන් මහත් බව පැමිණියේද (මෙහි 31 (ii) යොදන්න.)

33 "යම් තැනක සිට සංඝයා ලාභයෙන් මහත් බවට පැමිණියේද (මෙහි 31 (ii) යොදන්න.)

34 "යම් තැනක සිට සංඝයා උගත්කමින් මහත් බවට පැමිණියේද (මෙහි 31 (ii) යොදන්න) ශාරිපුත්‍රය, භික්ෂු

සංඝ තෙමේ දුශ්ශීලයන්ගෙන් තොරය. උපද්‍රවලින් තොරය. විපත්තින් බැහැර පහවූ දුශ්ශීලයන් ඇත්තේය. පිරිසිදුය සාර ගුණධර්මවලින් යුක්තය. සාරිපුත්‍රය, මේ භික්ෂූන් පන්සියය අතරින් යමෙක් බාලද හෙතෙම සෝවාන්ය. අපායෙහි නොවැටෙන සවභාව ඇත්තේය නිවණට නියමිත අවබෝධය ශ්‍රේෂ්ඨ පිහිට කොට ඇත්තේය.”

35 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ඇමතූ සේක. “ආනන්දය, යමෙකු විසින් ආරාධනා කරණු ලැබ වස්වසත්ද, ඔවුන් නොවිචාරා ඇවිදීමට යාම තථාගතවරුන් විසින් පුරුදු නොකරණ ලදී. එමු, වේරඤ්ජ බ්‍රාහ්මණයා විචාරමුයයි” වදාළ සේක. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ‘එසේය, ස්වාමීනියි” භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ හැද පොරවා පාත්‍රය හා සිවුර ගෙන ආයුෂ්මත් ආනන්ද තෙරුන්ව පෙරටුව වේරඤ්ජ බ්‍රාහ්මණයාගේ නිවසට වැඩි සේක. වැඩ, පනවන ලද අසුනෙහි වැඩ සිටි සේක.

36 ඉක්බිති වේරඤ්ජ බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේ වැද එකත් පසෙක සිටියේය. එකත් පසෙක සිටි වේරඤ්ජ බ්‍රාහ්මණයාට භාග්‍යවතුන් වහන්සේ “බමුණ, ඔබ විසින් අපි ආරාධනා කරණ ලද්දෙමු. වස්වුසුමු. ඔබගෙන් අපි දනවු හැරිහැරීමට යාමට අවසර ගනිමු. අපි දනවු හැරිහැරීමට යාමට කැමැත්තෙමුයි” කීවාහ. “භවත් ගෞතමයන් වහන්ස, ඇත්තය, ආරාධනා කෙළෙමු. අපි වස් වසවන ලද්දෙත් වෙමු. එතකුදුවුවත් යම් දියයුතු දෙයක් ඇද්ද, එය නොදෙන ලදී. එයද නැතිව නොවේ. නොදෙනු කැමැත්තෙන්ද නොවේ. ගිහිගෙයි වාසයෙන් බොහෝ වැඩකටයුතු ඇත්තේය. ඒව කොයින් අවකාශයක් ලබම්ද? භවත් ගෞතමයන් වහන්සේ හෙට දවස පිණිස භික්ෂු සංඝයා සමග මාගේ දානය පිළිගනු මැනවයි” කීයේය. භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දව ඉවසූ සේක. ඉක්බිති

භාග්‍යවතුන් වහන්සේ වේරඤ්ජ බ්‍රාහ්මණයා දැහැමි කථාවෙන් කරුණු සහිතව පෙන්වා සමාදන් කරවා තෙදගන්වා සතුටු කරවා අස්නෙන් නැගිට වැඩි සේක.

37 ඉක්බිති වේරඤ්ජ බ්‍රාහ්මණතෙම ඒ රාත්‍රිය ඇවෑමෙන් සිය ගෘහයෙහි රසවත් කෑ යුතු බුදිය යුතු දෙය පිළියෙළ කරවා "භවත් ගෞතමයන් වහන්ස දැනයම් කල් පැමිණියේය. සූදානම් කර අවසානයි" කීය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු වේලෙහි හැඳ පෙරව පාත්‍ර සිවුරු ගෙන වේරඤ්ජ බ්‍රාහ්මණයාගේ ගෘහය යම් තැනෙක්හිද, එහි පැමිණියේය. පැමිණ පනවන ලද අස්නෙහි භික්ෂු සංඝයා සමග හිඳගත් සේක. ඉක්බිති වේරඤ්ජ බ්‍රාහ්මණතෙම බුදුන් ප්‍රධානකොට ඇති භික්ෂු සංඝයා රසවත් කෑ යුතු බුදිය යුතු දෙයින් සියතින්ම පිළිදමා අවසන් කරවා වැළඳූ පාත්‍රයෙන් ඉවතටගත් අත් ඇති භාග්‍යවතුන් වහන්සේ තුන් සිවුරෙන් ඇන්දවූයේය. එක් එක් භික්ෂුව එක් එක් වස්ත්‍ර දෙකකින් ඇන්ද වූයේය.

38 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වේරඤ්ජ බ්‍රාහ්මණයා දැහැමි කථාවෙන් උදාහරණ සහිතව පෙන්වා සමාදන් කරවා උත්සාහවත් කරවා සතුටු කරවා අස්නෙන් නැගිට වැඩි සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වේරඤ්ජානුවර කැමතිතාක් කල් වාසයකොට සොරෙය්‍ය, සංකස්ස, කාන්‍යකුබ්ජයන්ට පිළිවෙළින් පැමිණ ප්‍රයාග ප්‍රතිෂ්ඨාන නම් තොටුපලට පැමිණි සේක. පැමිණ, ප්‍රයාග ප්‍රතිෂ්ඨාන තොටුපලින් ගංගානම් ගඟින් එගොඩවී බරණැස් නුවර යම් තැනෙක්හිද එහි වීසූ සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බරණැස් නුවර කැමතිතාක් වාසය කොට විශාලා මහනුවර යම් තැනෙක්හිද එහි වැඩි සේක. පිළිවෙළින් චාරිකාවෙහි හැසිරෙන්නේ විශාලා මහනුවර වාසය කළ සේක. භාග්‍යවතුන් වහන්සේ එහි මහාවනයෙහි කූටාගාර ශාලාවෙහි වාසය කරණ සේක.

වේරඤ්ජ කොටස නිමි

# 1 මෛථුන පාරාජිකා ශික්ෂාපද

## 1 සුදින්න බණවර

1 එකල්හි වනාහි විශාලා නුවරට සමීප තැන්හි කලන්ද නම් ගමෙක් වෙයි. එහි සිටු පුත්‍රයෙකුවූ සුදින්න නම් කලන්ද පුත්‍රයෙක් වෙයි. එකල්හි සුදින්න නම් කලන්ද පුත්‍රතෙම බොහෝ යහළුවන් සමග විශාලා නුවරට යම්කිසි කරුණක් නිසා ගියේය. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ මහත් පිරිසක් විසින් පිරිවරණ ලද්දේ දහම් දෙසමින් වැඩහුන්සේ වෙයි. සුදින්න කලන්ද පුත්‍රතෙම මහත් පිරිසක් විසින් පිරිවරණ ලදුව දහම් දෙසමින් වැඩහුන්නාවූ භාග්‍යවතුන් වහන්සේ දුටුයේය. දැක, ඔහුට මේ සිත විය. 'මමද බණ අසන්නෙම් නම් යහපතැයි' කියායි. ඉක්බිති සුදින්න නම් කලන්ද පුත්‍රතෙම ඒ පිරිස යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ, එකත්පසෙක හුන්නේය.

2 එකත්පසෙක හුන් සුදින්න නම් කලන්ද පුත්‍රයාට 'මම වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් (ii) යම් යම් පරිද්දකින් දේශනා කරණලද ධර්මය දනිම්. ගිහිගෙයි වසන්නහු විසින් සම්පූර්ණවූ සම්පූර්ණයෙන් පිරිසිදු, ලියවන ලද සක්ස් සේ පිරිසිදු මේ බ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරීමට පහසු නොවේ. (iii) මම හිසකේ රැවුල් බහා දමා කහට පෙවූ වස්ත්‍ර ඇඳ, ගිහිගෙන් නික්ම අනගාරිකයයි කියන ලද ශාසනයෙහි පැවිදි වන්නෙම් නම් යහපතැයි' සිතායි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ විසින් ධාර්මික කථාවෙන් කරුණු ගෙන හැර දක්වනලද සමාදන් කරවන ලද උත්සාහවත් කරණලද සතුටු කරණලද ඒ පිරිස හුන් තැනින් නැගී භාග්‍යවතුන් වහන්සේ වඳවා පැදකුණුකොට මැද ගියේය.

3 ඉක්බිති සුදින්න කලන්දක පුත්‍රතෙමේ පිරිස නැගීම ගිය නොබෝවේලාමකින් භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි සුදින්න

කලන්දක පුත්‍ර තෙමේ භාග්‍යවතුන් වහන්සේට 'ස්වාමීනි, මම (මෙහි 2 (ii) යොදන්න.) ස්වාමීනි, මම කෙසකේ රැවුල් බා දමා කහවත් පෙවූ වස්ත්‍ර හැඳ ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි පැවිදිවන්නට කැමැත්තෙමි. භාග්‍යවතුන් වහන්සේ මා පැවිදි කරවනසේක්වා''යි භාග්‍යවතුන් වහන්සේට සැළ කළේය

4 ''සුදින්නය, ඔබ මෙතෙක් ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි පැවිදිවීමට මව්පියන් වෙතින් අවසර ගත්තෙහිදැයි'' ඇසූසේක ''ස්වාමීනි, මම ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි පැවිදිවීම පිණිස අවසර නොගත්තෙමි.''යි කීයේය ''සුදින්නය, තථාගතවරයෝ මව්පියන් වෙතින් අවසර නොගත් පුත්‍රයෙකු පැවිදි නොකරති'' ''යම්සේ මට ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි පැවිදිවීම පිණිස අවසර දෙත්ද ස්වාමීනි මම එසේ කරන්නෙමි.'' කීයේය.

5 ඉක්බිති සුදින්න නම් කලන්දක පුත්‍රතෙමේ විශාලාවෙහි ඒ කටයුත්ත අවසන්කොට කලන්දක ගම යම් තැනෙක්හිද මවුපියෝ යම් තැනෙක්හිද එහි පැමිණියේය පැමිණ මවුපියන්ට (ii) ''මෑණියෙනි, පියාණෙනි, ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි පැවිද්ද මට අනුදන්නාසේක්වායි'' කීයේය මෙසේ කී කල්හි සුදින්න කලන්දක පුත්‍රයාගේ දෙමවුපියෝ සුදින්න කලන්දක පුත්‍රයාට (iii) ''දරුව සුදින්නය, ඔබ මෙතෙක් අපට ප්‍රියවූ සිත සතුටු කරන්නාවූ සුවසේ වැඩුනාවූ සුවසේ පෝෂ්‍ය කරනලද අපගේ එකම පුත්‍රයා වෙහිය. දරුව සුදින්නය, ඔබ කිසිදුකක් නොදන්නෙහිය. අපි මරණයෙනුදු ඔබගෙන් නොකැමැත්තෙන් වෙන් වන්නෙමු කිමෙක්ද, අපි ජීවත්ව සිටියදීම ඔබට ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි පැවිද්ද පිණිස කෙසේ අනුදන්නෙමුදැයි'' කීහුය.

6 දෙවනුවත් සුදින්න කලන්දක පුත්‍ර තෙමේ මව්පියන්ට (මෙහි 5 (ii) (iii) යොදන්න) තුන්වෙනුවත් සුදින්න කලන්දක පුත්‍රයාගේ මවුපියන්ට (මෙහි 5 (ii) (iii) යොදන්න)

7 ඉක්බිති සුදින්න කලන්දක පුත්‍රතෙම 'මවුපියෝ මට ගිහිගෙයින් නික්ම අනගාරික ශාසනයෙහි පැවිද්දට අවසර නොදෙත්යයි මෙහිම මට මරණය හෝ පැවිද්ද හෝ වේවා'යි එහි හිස්වූ නොඅතුරණලද බිම වැදහොත්තේය. ඉක්බිති සුදින්න කලන්දක පුත්‍රතෙම එක් වේලක් නොකා සිටියේය. දෙවේලක් නොකා සිටියේය. තුන්වේලක් නොකා සිටියේය. සතර වේලක් නොකා සිටියේය. පස්වේලක් නොකා සිටියේය. සය වේලක් නොකා සිටියේය. සත් වේලක් නොකා සිටියේය.

8 "ඉක්බිති සුදින්න කලන්දක පුත්‍රගේ මවුපියෝ සුදින්න කලන්දක පුත්‍රව (ii) (මෙහි 5 (iii) යොදන්න) 'දරුව සුදින්න, නැගිටින්න කන්න, බොන්න, පිරිවරන්න, කන්නේ, බොන්නේ, පිරිවරන්නේ කාම වස්තූන් පරිභෝග කරන්නේ පින් කරන්නේ ගිහිගෙයි ඇලෙව, අපි ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි පැවිද්ද පිණිස අවසර නොදෙන්නෙමුයි." කීවාහුය. මෙසේ කී කල්හි සුදින්න කලන්දක පුත්‍රතෙම නිශ්ශබ්දවිය.

9 දෙවනුවත් (මෙහි 8 (ii) යොදන්න) තුන් වෙනුවත් සුදින්න කලන්දක පුත්‍රගේ මවුපියෝ (මෙහි 8 (ii) යොදන්න) තුන්වෙනුවත් සුදින්න කලන්දක පුත්‍රතෙමේ නිශ්ශබ්දවිය

10 ඉක්බිති සුදින්න කලන්දක පුත්‍රගේ යහළුවෝ සුදින්න කලන්දක පුත්‍රතෙම යම් තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ "සුදින්න කලන්දක පුත්‍රව" (මෙහි 8 (ii) යොදන්න. "දරුව" වෙනුවට "යහළුව" යොදන්න.) දෙවනුවත් (මෙහි 10 මෙන් 8 (ii) යොදන්න) තුන් වෙනුවත් සුදින්න කලන්දක පුත්‍රගේ යහළුවෝ කලන්දක පුත්‍ර සුදින්නට "යහළු සුදින්නය, ඔබ (මෙහි 10 මෙන් 8 (ii) යොදන්න.) තුන්වෙනුවත් සුදින්න කලන්දක පුත්‍ර තෙමේ නිශ්ශබ්දවිය.

11 ඉක්බිති සුදින්න කලන්දක පුත්‍රගේ යහළුවෝ සුදින්න කලන්දක පුත්‍රගේ මවුපියන් යම් තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ, සුදින්න කලන්දක පුත්‍රගේ මවුපියන්ට

'මෑණියෙනි, පියාණෙනි, මේ සුදින්න තෙමේ 'මෙහිම මගේ මරණය හෝ පැවිද්ද හෝ වන්නේයයි' කියමින් නොඅතුරන ලද භූමියෙහි වැදහොත්තේය. ඉදින් තෙපි ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි පැවිද්දට සුදින්නට අවසර නොදෙන්නාහු නම්, එහිම මරණය වන්නේය. ඉදින් තෙපි සුදින්නට ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි පැවිද්දට අවසර දෙන්නාහු නම් පැවිද්දේද ජීවත ඔහු දකින්නාහුය. ඉදින් සුදින්න තෙමේ ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි පැවිද්දෙහි නොඇලෙන්නේ නම් ඔහුගේ ගතිය කවරක් වන්නේද? මෙහිම නැවත එන්නේය. සුදින්නට ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි පැවිද්දට අවසරය දෙව් ''

12 'දරුවෙනි, සුදින්නට ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි පැවිද්දට අවසර දෙමු '' ඉක්බිති සුදින්න කලන්දක පුත්‍රයාගේ යහළුවෝ කලන්දක පුත්‍ර සුදින්න යම් තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ කලන්දක පුත්‍ර සුදින්නට "යහළු සුදින්න, නැගිටින්න. මවුපියන් විසින් ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි පැවිද්දට අවසර දෙන ලද්දේයයි'' කීවාහුය.

13 ඉක්බිති කලන්දක පුත්‍ර සුදින්න තෙමේ මවුපියන් විසින් ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි පැවිද්දට අවසර දෙන ලද්දේලුයි ප්‍රීතිවූයේ ඔදවැඩි සිත් ඇත්තේ අතින් අවයව පිසිමින් නැගිට්ටේය. ඉක්බිති කලන්දක පුත්‍ර සුදින්න තෙමේ කීප දවසක් ශක්තිමත්ව, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැද එකත්පසෙක හිඳියේය. එකත්පසෙක හිඳි කලන්දක පුත්‍ර සුදින්න තෙමේ භාග්‍යවතුන් වහන්සේට, "ස්වාමීනි, මම මවුපියන් විසින් ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි පැවිද්දට අවසර ලද්දෙමි. භාග්‍යවතුන් වහන්සේ මා පැවිදි කරණ සේක්වායි'' කීයේය. කලන්දක පුත්‍ර සුදින්න තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිද්ද ලැබුයේය. උපසම්පදාව ලැබුයේය. උපසම්පදා වී

මෑසිකල් නොගිය සුදින්න තෙමේ අරණ්‍යයෙහි වාසය කරන්නේ, පිණ්ඩපාතයෙන් යැපෙන්නේ, පාංසුකූල සිවුරු දරන්නේ, ගෙපිළිවෙළින් පිඬු පිණිස හැසිරෙන්නේ, මෙබඳු කෙලෙස් කම්පා කරණ ධුතගුණ සමාදන්ව සිටියි. වජ්ජිගම ඇසුරුකොට වාසය කරයි.

14 ඒ කාලයෙහි වජ්ජි රට දුර්භික්ෂයක් ඇත්තේය. ජීවත්වේදෝ නොවේදෝයි සැක ඇතිවිය යුතු සුදු බොල් ඇටින් යුක්තය, සිට්වූ ක්‍රමයෙන් දිවි පැවැත්විය. උත්සාහයෙන් පිඬු සිඟීමෙන් යැපෙන්නට පහසු නොවේ. ඉක්බිති ආයුෂ්මත් සුදින්නට "දැන් වනාහි වජ්ජි රට ජීවත්වේදෝ නොවේදෝයි සැක ඇති, සුදු බොල් ඇට ඇති, සිට්වූ ක්‍රමයෙන් ජීවත්වන දුර්භික්ෂයකි. උත්සාහයෙන් පිඬු සිඟීමෙන් යැපෙන්නට පහසු නොවේ. මාගේ පොහොසත්ඥාති, මහත් වස්තුව ඇති, මහත් භෝග ඇති, බොහෝ රන් රිදී ඇති, බොහෝ වස්තු උපකරණ ඇති, බොහෝ ධන ධාන්‍ය ඇති නෑයෝ බොහෝ වෙත්. මම ඥාතීන් ඇසුරුකොට ජීවත් වන්නෙම් නම් යෙහෙක. නෑයෝ මා නිසා දන් දෙන්නාහුය. පින් කරත්, භික්ෂූහුද ලාභ ලබන්නාහුය. මමද පිඬුවලින් වෙහෙස නොවන්නෙමියි" සිතුවේය.

15 ඉක්බිති ආයුෂ්මත් සුදින්න තෙමේ සෙනසුන අකුලා පා සිවුරු ගෙන විශාලා නුවර යම් තැනෙක්හිද එහි ගියේය. පිළිවෙළින් ගොස් විශාලා නුවර යම් තැනෙක්හිද එහි පැමිණියේය. ආයුෂ්මත් සුදින්න තෙමේ ඒ විශාලා නුවර මහා වනයෙහි වාසය කරයි. ආයුෂ්මත් සුදින්නගේ නෑයෝ කලන්ද පුත්‍ර සුදින්න තෙමේ විශාලා නුවරට ආයේලැයි ඇසුවාහුය. ඔව්හු ආයුෂ්මත් සුදින්නට සැටක් පමණ තැටිවල පිසූ දානයක් ගෙනාවාහුය. ඉක්බිති ආයුෂ්මත් සුදින්න තෙමේ ඒ සැටක් පමණ තැටි බත් භික්ෂූන්ට බෙදාදී පෙරවරු වේලෙහි හැඳ පොරවා පා සිවුරු ගෙන කලන්ද ගමට පිඬු පිණිස ඇතුල්වූයේය. කලන්ද ගමෙහි ගෙපිළිවෙළින් පිඬු පිණිස හැසිරෙන්නේ තමාගේ පියාගේ ගෙය යම් තැනෙක්හිද එහි පැමිණියේය.

16 ඒ වේලාවෙහි ආයුෂ්මත් සුදින්නගේ ඥාති දාසියක් පෙරදින සවස තැම්බූ පිට්ටුවක් විසිකරණු කැමතිවූවාය. ඉක්බිති ආයුෂ්මත් සුදින්න තෙමේ ඒ ඥාති දාසියට "නැගණිය විසිකරණ ස්වභාව ඇති එය මාගේ පාත්‍රයෙහි මෙහි දමවයි" කීයේය. ඉක්බිති ආයුෂ්මත් සුදින්නගේ ඥාතිදාසි ඒ පෙරදින සවස තැම්බූ පිට්ටුව ආයුෂ්මත් සුදින්නගේ පාත්‍රයෙහි බහන්නී ඔහුගේ අත්වලද පාවලද ශබ්දයේද ආකාරය ගත්තීය. ඉක්බිති ආයුෂ්මත් සුදින්නගේ ඥාති දාසි තොමෝ ආයුෂ්මත් සුදින්නගේ මවු යම් තැනෙක්හිද එහි පැමිණියාය. පැමිණ, ආයුෂ්මත් සුදින්නගේ මවට "ආර්යාවෙනි, දන්නෙහිද? ආර්යයන් වහන්සේගේ පුත්‍රවූ සුදින්න තෙමේ පැමිණියේයයි" කීවාය "බාල, ඉදින් ඇත්තක් කියන්නෙහිද තී දාසභාවයෙන් මුදවමියි" කීවාය.

17 ඒ වේලාවෙහි ආයුෂ්මත් සුදින්න තෙමේ ඊයේ සවස තැම්බූ ඒ පිට්ටුව එක්තරා බිත්ති අයිනක් ලඟ හිඳ අනුභව කරයි. ආයුෂ්මත් සුදින්නගේ පියාතෙමේද වැඩපලින් එන්නේ ආයුෂ්මත් සුදින්න ඊයේ රාත්‍රියේ පිසූ පිට්ටුව එක්තරා ගෙයක් යටවහි අනුභව කරනු දැක, ආයුෂ්මත් සුදින්න යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් සුදින්නට "දරුව සුදින්නය, ඊයේ සවස පිසූ පිට්ටුවක් අනුභව කරන්නෙහිද? දරුව සුදින්නය, ගෙට යායුතු නොවේද?" "ගෘහපතිය, තොපගේ ගෙට ගියෙමි. මේ ඊයේ රෑ පිසූ පිට්ටුව (එතැනින් ලැබුණේයයි") කීවේය.

18 ඉක්බිති ආයුෂ්මත් සුදින්නගේ පියතෙමේ ආයුෂ්මත් සුදින්නගේ අතින් අල්වාගෙන ආයුෂ්මත් සුදින්නට 'දරුව සුදින්නය, එන්න ගෙට යන්නෙමුයි' කීයේය. ඉක්බිති ආයුෂ්මත් සුදින්න තෙමේ තම පියාගේ ගෙය යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ, පණවනලද අස්නෙහි වැඩහුන්නේය. ඉක්බිති ආයුෂ්මත් සුදින්නගේ පියතෙමේ ආයුෂ්මත් සුදින්නට "දරුව, බතපත්ව දෙනලදී. අනුභව කරවයි" කීයේය. "ගෘහපතිය, වුවමනා නැත.

මා පිණිස අද ආහාර අනුභව නොකෙළෙමියි" කීයේය. "දරුව, සුදින්න, හෙට දවසට ආහාර ඉවසනු මැනවයි" කීයේය ආයුෂ්මත් සුදින්න තෙමේ නිශ්ශබ්දව පිළිගත්තේය.

19 ඉක්බිති ආයුෂ්මත් සුදින්න තෙමේ අස්නෙන් නැගිට වැඩියේය. ඉක්බිති ආයුෂ්මත් සුදින්නගේ මවු තොමෝ ඒ රාත්‍රියගේ ඇවෑමෙන් අළුත් ගොමින් බිම පිරිබඩ ගන්වා ගොඩවල් දෙකක් කරවූවාය. එකක් අමු රන්ද අනික රන්ද වීය. ගොඩවල් තොපමණ මහත්වූයේද යත්, එහා පැත්තේ සිටි පුරුෂයා මෙහා පැත්තේ සිටි පුරුෂයා නොදකිති. ඔව්හු ගොඩවල් පැදුරුවලින් වසවා මැද අස්නක් පණවා ආවරණයක් කරවා ආයුෂ්මත් සුදින්නගේ පෙර බිරිඳ කැඳවූයේය. "පුත්‍රිය, එසේ නම් ඔබ යම් අලංකාරයකින් සරසන ලද්දවූ සුදින්න නම් මාගේ පුත්‍රයාට ප්‍රිය මනාප වූවාද ඒ අලංකාරයකින් සැරසෙන්නැයි" කීවාය. "ආර්යාවෙනි, එසේයයි" ආයුෂ්මත් සුදින්නගේ පෙර බිරිඳ ආයුෂ්මත් සුදින්නගේ මවට පිළිතුරු දුන්නීය.

20 ඉක්බිති ආයුෂ්මත් සුදින්න තෙමේ පෙරවරු වේලෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන සිය පියාගේ ගෙය යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ, පණවන ලද අස්නෙහි වැඩහුන්නේය ඉක්බිති ආයුෂ්මත් සුදින්නගේ පියතෙමේ ආයුෂ්මත් සුදින්න තෙමේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ, ඒ ගොඩවල් විවෘත කරවා ආයුෂ්මත් සුදින්නට (ii) "දරුව සුදින්නය, මේ තොපගේ මවු පසට අයත් ස්ත්‍රීධනයයි. අනික පියාගෙන් ආ දෙයකි. අනික මුත්තණුවන්ගෙන් ආ දේය. දරුව සුදින්න, ගිහිවී වස්තුවද පරිභෝග කරන්නට පින්ද කරන්නට හැකිය. දරුව සුදින්නය, ඔබ මෙහි එන්න ගිහිවී වස්තුවද පරිභෝග කරව, පිනුත් කරවයයි" කීයේය. "පියාණෙනි, (iii) උත්සාහ නොකරමි. සමත් නොවෙමි. මම ඇළුණේ බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙමියි" කීයේය.

21 දෙවෙනුවත් ආයුෂ්මත් සුදින්නගේ පියා ආයුෂ්මත් සුදින්නට (මෙහි 20 (ii) යොදන්න.) තුන්වෙනුවත්

ආයුෂ්මත් සුදින්නයන්ගේ පියා ආයුෂ්මත් සුදින්නට (මෙහි 20 (ii) ඡේදය බ.) "ගෘහපතිය, ඉදින් ඔබ නොඉක්මවන්නෙහි නම් ඔබට කියන්නෙමි" "දරුව සුදින්නය, කියව" "ගෘහපතිය, එසේ නම් ඔබ මහත් මහත් හණමලු කරවා රන්රුවනින් පුරා ගංගා නම් ගඟ මැද්දෙහි සැඩපහරෙහි දමව. එයට හේතු කවරේද, ගෘහපතිය, ඒ හේතුවෙන් තොපට බයක් හෝ තැතිගැන්මක් හෝ ලොමුදැහගැනීමක් හෝ ආරක්ෂාවක් හෝ යම් හෙයකින් වන්නේද, එය තොපට නොවන්නේය."

22 මෙසේ කී කල්හි ආයුෂ්මත් සුදින්නයන්ගේ පියා තෙමේ නොසතුටුවූයේය. පුත්‍රවූ සුදින්න තෙමේ කෙසේ නම් මෙසේ කියයිද, ඉක්බිති ආයුෂ්මත් සුදින්නයන්ගේ පියා තෙමේ ආයුෂ්මත් සුදින්නයන්ගේ පෙර බිරිඳට කථා කළේය. 'ස්ත්‍රිය, එසේ නම් ඔබත් යාච්ඤා කරව. පුත්‍රවූ සුදින්න තෙමේ තොපගේ වචනයද කරන්නේ නම් යෙහෙක." "ඉක්බිති ආයුෂ්මත් සුදින්නයන්ගේ පුරාණ භාර්‍ය්‍යා තොමෝ ආයුෂ්මත් සුදින්නයන්ගේ පාදා අල්වාගෙන ආයුෂ්මත් සුදින්නට "ආර්‍ය්‍ය පුත්‍රය, දිව්‍යාඞ්ගනාවෝ කෙබඳුද, යම් කෙනෙකු නිසා ඔබ බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙන්නෙහිදැයි" ඇසීය. "නැගනිය, මම දිව්‍යාඞ්ගනාවන් බලාපොරොත්තුවෙන් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි නොහැසිරෙමි."

23 ඉක්බිති ආයුෂ්මත් සුදින්නයන්ගේ පෙර බිරිඳ අද සිට මට සුදින්න ආර්‍ය්‍ය පුත්‍ර තෙමේ නැගණී කථාවෙන් කථා කෙරේයයි එහිම සිහි නැතිව වැටුනාය. ඉක්බිති ආයුෂ්මත් සුදින්න තෙමේ පියාට "ගෘහපතිය, ඉදින් කෑයුතු දෙයක් ඇත්නම් දෙව. නොවෙහෙසවයි" කීවේය. "දරුව සුදින්නය, අනුභව කරමයි" කීයේය. ඉක්බිති ආයුෂ්මත් සුදින්නයන්ගේ මව්ද පියාද ආයුෂ්මත් සුදින්න ප්‍රණීතවූ කෑයුතු දෙයින් බුදියයුතු දෙයින් සියතින් සැතපුවාහුය, පැවරුවාහුය.

24 ඉක්බිති ආයුෂ්මත් සුදින්නයන්ගේ මවු තොමෝ වැළඳූ පාත්‍රයෙන් ඉවත් කළ අත ඇති ආයුෂ්මත් සුදින්නට (ii) "දරුව සුදින්නය, මේ කුලය පොහොසත්ය මහත් ධන

ඇත්තේය. මහත් වස්තු ඇත්තේය. බොහෝ රන්රුවන් මසු කහවනු ඇත්තේය. බොහෝ මිත්තු උපකරණ ඇත්තේය. බොහෝ ධන ධාන්‍ය ඇත්තේය. දරුව සුදින්නය, ගිහිව වස්තු පරිභෝග කරන්නටද පින් කරන්නටද ලබන්නේය දරුව සුදින්නය, එන්න. ගිහිව වස්තු පරිභෝග කරව. පින්ද කරවයි." කීහ. (iii) "මෑණියෙනි, (මෙහි 20 (iii) සොයන්න) දෙවනුවත්, (මෙහි 20 (ii) (iii) සොයන්න) තුන්වෙනුවත් ආයුෂ්මත් සුදින්නගේ මවුතොමෝ ආයුෂ්මත් සුදින්නට (මෙහි 20 (ii) (iii) සොයන්න.) (iv) "දරුව සුදින්නය, එසේවී නම් බීජයක්වත් දෙව දරුවෙක් නැති වස්තුව ලිච්ඡවීහු ඇදගෙනයන්නාහයි" (v) කීවාය. "මෑණියෙනි, මෙය කරන්නට හැකියයි" කීයේය "දරුව සුදින්නය, දැන් කොහි වාසය කරන්නෙහිද?" "මෑණියෙනි, මහා වනයෙහිය." ඉක්බිති ආයුෂ්මත් සුදින්න තෙමේ අස්නෙන් නැගිට ගියේය.

25 ඉක්බිති ආයුෂ්මත් සුදින්නගේ මවු තොමෝ ආයුෂ්මත් සුදින්නගේ පෙර බිරිදට කථා කළාය. "එසේ නම් ස්ත්‍රීය යම් දවසක ඍතුවූවාද නම් ඔසප් උපන්නේද ඉක්බිති මට කියම." "ආර්යාවෙනි එසේයයි" ආයුෂ්මත් සුදින්නගේ පෙර බිරිද ආයුෂ්මත් සුදින්නගේ මවුට පිළිතුරු දුන්නීය. ඉක්බිති ආයුෂ්මත් සුදින්නගේ පෙර බිරිද නොබෝ කලකින්ම ඍතුවූවාය. ඇට ඔසප් උපන්නේය. ඉක්බිති ආයුෂ්මත් සුදින්නගේ පෙර බිරිද ආයුෂ්මත් සුදින්නගේ මවට "ආර්යාවෙනි, ඍතුවූයෙමි. මට ඔසප් උපන්නේය." "ස්ත්‍රීය, එසේනම් යම් අලංකාරයකින් අලංකාරවූයේ පුත්‍ර සුදින්නට ප්‍රියද සතුටුද වූයේද ඒ අලංකාරයෙන් අලඞ්කාර වෙවයි" කීවාය. "ආර්යාවෙනි, එසේයයි" ආයුෂ්මත් සුදින්නගේ පෙර බිරිද ආයුෂ්මත් සුදින්නගේ මවට ප්‍රති වචන දුන්නීය ඉක්බිති ආයුෂ්මත් සුදින්නගේ මවු තොමෝ ආයුෂ්මත් සුදින්නගේ පෙර බිරිද ගෙන මහා වනය යම් තැනෙක්හිද, ආයුෂ්මත් සුදින්න තෙමේ යම් තැනෙක්හිද, එහි පැමිණියාය. පැමිණ, ආයුෂ්මත් සුදින්නට මෙසේ කීවාය.

26 දරුවෙ සුදින්නය, මෙ කුලය (මෙහි 24 (ii) හා (iii) (iv) ) දෙමවුපියන් (මෙහි 24 (ii) හා (iii) (iv) ) තුන් වතාවක් ආයුෂ්මත් සුදින්නගේ මවු තොමෝ ආයුෂ්මත් සුදින්නට (මෙහි 23 (ii), (iii) (iv) එසේ කම එය කලහැකියයි පෙර බිරිඳ ඇතින් ගෙන මහාවනයට වැද ශික්ෂා පද නොපැනවීම නිසා දොස් නොදක්නේ පෙර බිරිඳ සමග තුන්වරක් මෛථුන ධර්මයෙහි හැසුරුණේය. ඕ තොමෝ ඒ කරණකොට ගැබ් ගත්තීය. භූමිනිශ්‍රිත දෙවතාවෝ (ii) ඒකාන්තයෙන් භික්ෂු සංඝ තෙමේ පිළිකා නැතිව සිටියේය. දොෂ නැත්තේය. කලන්ද පුත්‍ර සුදින්න විසින් පිළිකාවක් උපදවනලදී. දොෂයක් උපදවන ලද්දේයයි ශබ්ද පැවැත්වූවාහුය. (iii)

බිම් ඇසුරුකල දෙවියන්ගේ ශබ්දය අසා චාතුර්මහාරාජික දෙවියෝ ශබ්ද පැවැත්තුවාහුය. තාවතිංස, යාම, තුෂිත, නිර්මාන රති, පරනිර්මිත, වසවර්ති, බ්‍රහ්ම කොටසම අයත් දෙවියෝ (මෙහි ii) මෙසේ ඒ මොහොතෙහි, ඒ ක්ෂණයෙහි බ්‍රහ්මලෝකය දක්වා ශබ්දය උඩට පැන නැංගේය.

27 ඉක්බිති ආයුෂ්මත් සුදින්නගේ පෙර බිරිඳ ඇගේ ගර්භය මෙරුණ බවට පැමිණ පුතකු වැදුවාය. ඉක්බිති ආයුෂ්මත් සුදින්නගේ යහළුවෝ ඒ දරුවාට 'බීජක' යයි නමක් තැබුවාහුය. ආයුෂ්මත් සුදින්නගේ පෙර බිරිඳට බීජක මව යයි නමක් කළාහුය. ආයුෂ්මත් සුදින්නට බීජක පියා යයි නමක් කළාහුය. ඒ දෙදෙන මෑත කාලයෙහි ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිව රහත් බව ප්‍රත්‍යක්ෂ කළාහුය. ඉක්බිති ආයුෂ්මත් සුදින්න (ii) "මට ඒකාන්තයෙන් අලාභයෙක. මට ඒකාන්තයෙන් ලාභයක් නොවේ. මා ඒකාන්තයෙන් නපුරට ලබන ලදී. යහපතට ලබන ලද්දේ නොවේ. යම් බඳුවූ මම මෙබඳුවූ යහපත්ව ප්‍රකාශ කරණ ලද ධර්ම විනයෙහි පැවිදිව දිවි ඇතිතාක් සම්පූර්ණවූ පිරිසිදුවූ බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන්නට නොහැකි වීය (iii) හෙතෙම ඒ හැකයෙන් ඒ පසුතැවිල්ලෙන් කෙට්ටු වීය. කෘශවූයේ දුර්වර්ණවූයේ පඬුවන් පැහැ ඇතිවූයේ නහර මතුවූ අවයව

ඇත්තේ අකුලගතව නොමුඳු සිත් ඇත්තේ සැඟවුනු සිත් ඇත්තේ දුක්වූයේ අසහපත් සිත් ඇත්තේ විපිළිසරවූයේ දුටුවෝය.

28 ඉක්බිති ආයුෂ්මත් සුදින්නයන්ගේ යහළු භික්ෂූහු ආයුෂ්මත් සුදින්නහට "ඇවැත්නි සුදින්නය, ඔබ පෙර නම් පැහැයෙන් යුක්තවිය. පිනාගිය ඉන්ද්‍රියයන් ඇතිවූ මෙකිය. පැහැදුන මුහුණෙන් පාටක් ඇත්තෙහි. අතිශයින් පැදුන පාට සිවියක් ඇත්තෙහිය. ඔබ දැන් මේ කාලයෙහි කෘශය, රළුය, දුර්වර්ණය, පඬුවන්ය, නහර මතුවූ අවයව ඇත්තෙහිය. ඇතුළතව නොමුඳු සිත් ඇත්තේ සැඟවුණු සිත් ඇත්තේ දුක්වූයේ අසහපත් සිත් ඇත්තේ විපිළිසර වූයේ දැමෙත්තෙහිය ඇවැත්නි සුදින්නය, කිමෙක්ද? ඔබ කලකිරී බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙන්නෙහිද ?"

29 "ඇවැත්නි, මම නොඇලී බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි නොහැසිරෙමි මා විසින් පාප කර්මයක් කරණලදී. පෙර බිරිඳ හා මෛථුන ධර්මයෙහි හැසුරුණෙමි ඇවැත්නි, ඒ මට සැකයක් පිණිස විය. විපිළිසරයක් විය. (මෙහි 27 (ii) යොදන්න.

30 "ඇවැත්නි, සුදින්නය, නොපව සැක කිරීමෙන් කම් නැත පසුතැවීමෙන් කම් නැත. යම් බඳුවූ තෝ මෙසේ මනාකොට වදාරණ ලද ධර්ම විනයෙහි පැවිදිව දිවි ඇතිතාක් සම්පූර්ණවූ පිරිසිදුවූ බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙන්නට නොහැකි වෙහිය. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන්(ii) නොඇලීම පිණිස ධර්මදේශනා කරණලදී. ඇලීම පිණිස ධර්මදේශනා නොකරණලදී. වෙන්වීම පිණිස ධර්මදේශනා කරණලදී. එක්වීම පිණිස ධර්මදේශනා නොකරණලදී. දැඩිකොට නොගැනීම පිණිස ධර්මදේශනා කරණලදී. ගැනීම පිණිස ධර්මදේශනා නොකරණලදී. ඇවැත්නි, එසේ නම් තුඹ භාග්‍යවතුන් වහන්සේ විසින් නොඇලීම පිණිස ධර්මය වදාරද්දී ඇලීම පිණිස වෑයම් කරන්නෙහිද? වෙන්වීම පිණිස ධර්මය වදාරද්දී එක්වීම පිණිස වෑයම් කරන්නෙහිද? දැඩිසේ නොගැනීම පිණිස ධර්මය වදාරද්දී දැඩියේ ගැනීමපිණිස

ඈසම කරන්නෙහිද? ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් රාගය නැති කිරීම පිණිස ධර්ම දේශනා කළේ නොවේද? මත්වීම නැති කිරීම පිණිස, පිපාසා දුරු කිරීම පිණිස, ආලය නැසීම පිණිස, සසර කැඩීම පිණිස, තෘෂ්ණාව නැතිකිරීම පිණිස, නොඇලීම පිණිස, නැතිවීම පිණිස, නිවණ පිණිස ධර්මය දේශනා කළේ නොවේද? (iii) ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් (iv) කාමයන්ගේ පහ කිරීම විදාරණ ලද්දේ නොවේද? කාම හැඟීම්වල ඊශිරව ඥානය කියන ලද්දේ, කාම පිපාසාවල සංසිඳීම කියන ලද්දේ, කාම සිතිවිලි වල මුලින් නැසීම කියන ලද්දේ නොවේද? කාම දැවීම්වල සංසිඳීම කියන ලද්දේ නොවේද? (v) ඇවැත්නි, මෙය නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස පැහැදුනවුන්ගේ විශෙෂ පැහැදීම පිණිස නොවේ ඇවැත්නි, නැවතද මෙය නොපැහැදුනවුන්ගේ නොපැහැදීම පිණිස පැහැදුන ඇතමෙකුගේ වෙනස්වීම පිණිස වන්නේය.''

31 ඉක්බිති ඒ භික්ෂූහු ආයුෂ්මත් සුදින්නට නොයෙක් ආකාරයෙන් නින්දාකොට භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළාහුය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙහි මේ සිද්ධියෙහි භික්ෂු සංඝයා රැස්කරවා ආයුෂ්මත් සුදින්නයන්ගෙන් "සුදින්නය, ඔබ පෙර බිරිඳ සමග මෛථුන ධර්මයෙහි හැසුරුණේ ඇත්තදැයි'' ඇසීය. 'භාග්‍යවතුන් වහන්ස, ඇත්තය '' බුදුවූ භාග්‍යවතුන් වහන්සේ ගර්හා කළ සේක. ii "හිස් පුරුෂය, නුසුදුසුවූ නොගැලපෙන, ශ්‍රමණයන්ට නොගැලපෙන අකැප නොකටයුත්තක් කෙළෙහිද, හිස් පුරුෂය, කෙසේ නම් ඔබ මේබඳු මනාකොට දේශනා කරන ලද ධර්ම විනයෙහි පැවිදිව දිවි ඇතිතාක් කල් සම්පූර්ණවූ පිරිසිදුවූ බ්‍රහ්මචර්යයෙහි හැසිරෙන්නට නොහැක්කෙහිද? (iii) හිස්පුරුෂය, මා විසින් නොයෙක් ආකාරයෙන් නොඇලීමට ධර්මදේශනා කරණලද්දේ නොවේද? රාග සහිතකොට නොවීමට, වෙන්වීමට, එක්නොවීමට ධර්මදේශනා කරණ ලද්දේ නොවේද? බැඹි ලිහන්ට දැඩිකොට නොගැන්මට ධර්මදේශනා කරණ

ලද්දේ නොවේද? දූතයාට නොගැණීමට දෙශනා කරණ ලද්දේ නොවේද? හිස් පුරුෂය, ඔබ කෙසේ නම් මා විසින් නො ඇලීම පිණිස ධර්මය දේශනා කළ කල්හි රාග සහිත බව පිණිස සිතන්නෙහිද? වෙන් වීම පිණිස ධර්මය දේශනා කළ කල්හි එක්වීම පිණිස සිතන්නෙහිද? දූසියේ නොගැනීම පිණිස ධර්මදේශනා කළ කල්හි ගැනීම පිණිස සිතන්නෙහිද? හිස් පුරුෂය, මා විසින් (iii) (මෙහි 30 ඡේදයේ (ii) බලන්න.) හිස් පුරුෂය, මා විසින් නොයෙක් ආකාරයෙන් (මෙහි 30 ඡේදයේ (iv) බලනු.) (iv) හිස් පුරුෂය, තා විසින් දරුණු විෂ ඇති සර්පයෙකුගේ කටෙහි පුරුෂ ලිංගය දමනලද්දේ නම් යහපත ස්ත්‍රියගේ ස්ත්‍රී නිමිත්තෙහි පුරුෂ ලිංගය නොදමන ලද්දේ නම් යහපත. හිස් පුරුෂය, තා විසින් කළු සර්පයෙකුගේ කටෙහි පුරුෂලිංගය දමනලද්දේ නම් යහපත ස්ත්‍රියගේ ස්ත්‍රී නිමිත්තෙහි පුරුෂලිංගය නොදමන ලද්දේ නම් යහපත.

"හිස් පුරුෂය, තා විසින් ගිනිගත් දල්වෙන ගිනිසිළු ඇති අඟුරුමලෙක්හි පුරුෂලිංගය දමනලද්දේ නම් යහපත ස්ත්‍රියගේ ස්ත්‍රී නිමිත්තෙහි පුරුෂ ලිංගය නොදමනලද්දේ නම් යහපත. එයට හේතු කවරේද? හිස් පුරුෂය, (මුලින් කී කරුණෙන්) ඒ හේතුවෙන් මරණයට හෝ පැමිණෙන්නේය. මරණය හා සමාන දුකකට පැමිණෙන්නේය. ඒ හේතුකොටගෙන ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැප නැති, නපුරු ගති ඇති, නපුරු වැටීම් ඇති නරකයෙහි නූපදින්නේය. හිස් පුරුෂය, (දෙවනු කී කරුණෙන්) මේ හේතුකොටගෙන ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැප නැති, නපුරු ගති ඇති, නපුරු වැටීම් ඇති නරකයෙහි උපදින්නේය. (v)

"හිස් පුරුෂය, යම්බඳුවූ ඔබ සත්පුරුෂ ධර්මයක් නොවූ ග්‍රාම්‍ය ස්වභාවයක්වූ, නීච ස්වභාවයක්වූ නපුර ඇසුරු කළ දෙයක්වූ, පහත් ස්වභාවයක්වූ, රහසිගතවූ, දෙදෙනෙක් අතර ඇති සම්වැදීමකට; පැමිණියෙහිද, හිස් පුරුෂය, තුඹ බොහෝ අකුශල ධර්මයන්ට ආදි කතෘය, පෙරටුව යන්නාය. හිස් පුරුෂය, මෙය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිස පැහැදුනවුන්ගේ වැඩිවීම පිණිස නොවේ. හිස් පුරුෂය, නැවතමෙය නොපැහැදුනවුන්ගේ නොපැහැදීම

පිණිස පැහැදුනාවූ සමහරුන්ගේ වෙනස් බව පිණිසවේ.''

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් සුදින්නට නොයෙක් ආකාරයෙන් නිග්‍රහකොට (සැහැල්ලු නොවූ පැවැත්මෙහි) සැහැල්ලු නොවූ ජීවිකාවෙහි මහා ආශා ඇති බැව්හි, ලද දෙයින් සතුටු නොවන බැව්හි පිරිසෙහි ඇලුන බැව්හි කුසීත බැව්හි නුගුණ කියා නොයෙක් ආකාරයෙන් සැහැල්ලු පැවැත්මෙහි සැහැල්ලු ජීවිකාවෙහි අලෝභ බැව්හි, ලද දෙයින් සෑහෙන බැව්හි, කෙලෙස් නවන බැව්හි, කෙලෙස් කම්පා කිරීමෙහි සතුටු ගෙන දෙන බැව්හි කෙලෙස් සිඳින බිඳින බැව්හි වීර්‍ය්‍යයෙහි ගුණ කියා භික්ෂූන්ට ඊට ගැලපෙන දැහැමි කථාව කොට භික්ෂූන් ආමන්ත්‍රණය කළසේක.

32 ''මහණෙනි, එසේ නම් භික්ෂූන්ට ප්‍රයෝජන දසයක් සලකා ශික්ෂාපද පනවන්නෙමි. සංඝයාගේ යහපත් භාවය පිණිස, සංඝයාගේ පහසුව පිණිස, නිශ්මමිමව අපහසු පුද්ගලයන්ට දඬුවම් පිණිස, ශීලාචාර භික්ෂූන්ගේ පහසුව පිණිස, මෙලොව කෙලෙස් සංවරය පිණිස, පරලොව විපාක දෙන කෙලෙස් නැසීම පිණිස, නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිස, පැහැදුන වුන්ගේ වැඩි පැහැදීම පිණිස සද්ධර්මයාගේ පැවැත්ම පිණිස, විනයට උපකාර පිණිසද යන දසය ගැනයි. මහණෙනි, මේ ශික්ෂාපදය මෙසේ කිය යුත්තේය. (iii) (කවරේද) යම්කිසි භික්ෂුවක් මෛථුන ධර්මයෙහි සෙවෙන්නේද, (ඔහු) සත්තෙක් පැරදුනෙක් වේ. ආශ්‍රයට නුසුදුස්සෙක් වේ. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ මේ ශික්ෂාපදය පනවණ ලද්දේවේ.

(සුදින්න බණවර නිමි )

---

## 2 වැඳිරියගේ කථාව

1 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් විශාලා නුවර මහා වනයෙහි වැඳිරියක් කැම බීමවලින් සතුටුකොට ඈට මෛථුන ධර්මය කරයි. ඉක්බිති ඒ මහණතෙම පෙරවරු වේලෙහි හැඳපොරවා පාසිවුරු ගෙන විශාලානුවර පිඬු

පිණිස හැසුරුණේය. එකල්හි වනාහි බොහෝ භික්ෂූහු සෙනසුන්වල ඇවිදින්නට යන්නාහු ඒ භික්ෂුහුගේ පන්සල සමීපයෙහිද එතැනට පැමිණියාහුය. ඒ වැඳිරි තොමෝ දුර සිට එන ඒ භික්ෂූන් දැක ඒ භික්ෂූහු යම් තැනෙක්හිද එහි පැමිණියාය පැමිණ ඒ භික්ෂූන්ගේ ඉදිරියෙහි උකුල සෙලවීය. මිලිගය සෙලවීය. උකුල පෙන්නුම්ය. අදහස හෙළි කළාය.

2 ඉක්බිති ඒ භික්ෂූන්ට මේ සිතවිය. 'ඒකාන්තයෙන් ඒ මහණතෙම මේ වැඳිරිය සමග මෛථුන ධර්මය සේවනය කරයි.' කියා එකත්පසෙක සැඟවී සිටියාහුය. ඉක්බිති ඒ භික්ෂු තෙමේ විශාලා නුවර පිඩු පිණිස හැසිර පිණ්ඩපාතය රැගෙන පෙරළා ආයේය. ඉක්බිති ඒ වැඳිරි තොමෝ ඒ භික්ෂුව යම් තැනෙක්හිද එහි පැමිණියාය. ඉක්බිති ඒ මහණ තෙමේ ඒ පිණ්ඩපාතය කොටසක් වළඳා කොටසක් ඒ වැඳිරියට දුන්නේය. ඉක්බිති ඒ වැඳිරි තොමෝ අනුභවකොට ඒ භික්ෂුවට කටිය දිගු කළාය. ඉක්බිති ඒ භික්ෂුව ඒ වැඳිරිය සමග මෛථුන ධර්මය සෙවනය කරයි. ඉක්බිති ඒ භික්ෂූහු ඒ භික්ෂුවට "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් ශික්ෂාපද පැනවූයේ නොවේද? ඇවැත්නි, ඔබ කුමක් හෙයින් වැඳිරියක් සමග මෛථුන ධර්මය සෙවනය කෙරේදැයි" කීවාහුය. "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් ශ්‍රාවකයන්ට ශික්ෂාපද පණවන ලද බව සත්‍යය. ඒ මිනිස් ස්ත්‍රියක් සමගය. තිරිසන්ගතයන් හා නොවේය. ඇවැත්නි, එය එසේම නොවේද?

3 (i) "ඇවැත්නි, අයෝග්‍යවූ නොගැලපෙන නුසුදුසු ශ්‍රමණ භාවයට නොගැලපෙන, අකැප නොකට යුත්තක් කරණලදී. ඇවැත්නි, ඔබ කෙසේ නම් මෙසේ මනාකොට ප්‍රකාශ කරණලද ධර්ම විනයෙහි පැවිදිව දිවි හිමියෙන් සම්පූර්ණ, පිරිසිදු බ්‍රහ්ම චර්‍ය්‍යාවෙහි හැසිරෙන්ට නොහැක්කෙහිද, (ii) ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් (මෙහි 30 ඡේදයේ (ii) යොදන්න)

ඇවැත්නි, මේය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිස පැහැදුනවුන්ගේ වැඩි පැහැදීම පිණිස නොවන්නේය. ඇවැත්නි, නැවත මේය නොපැහැදුනවුන්ගේ නොපැහැදීම පිණිස පැහැදුන ඇතැමෙකුගේ වෙනස්වීම පිණිස වන්නේය.'' ඉක්බිති ඒ භික්ෂූහු ඒ භික්ෂුවට නොයෙක් ආකාරයෙන් ගර්හා කොට භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ කීහුය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙහි මේ නිදානයෙහිදී භික්ෂු සංඝයා රැස්කරවා "මහණ, තෝ වැදිරියක් සමග මෛථුන ධර්මයෙහි යෙදෙන්නෙහි යනු ඇත්තද?" "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය." භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළසේක. (මෙහි 31 ඡේදයේ ii කොටස) හිස් පුරුෂය, මා විසින් නොයෙක් ආකාරයෙන් (මෙහි 31 ඡේදයේ (ii) කොටස) යම්කිසි මහණෙක් යටත් පිරිසෙයින් තිරිසන්ගත සත්ත්වයකු සමගද මෛථුන ධර්මයෙහි යෙදුනේ නම්, පැරදුනේවේ. ආශ්‍රයට නුසුදුසුවේ.'' භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට මේ ශික්ෂාපදය මෙසේ පනවන ලද්දේමයි.

(වැදිරියගේ කථාව නිමි)

---

## 3 සන්ථත බණ වර

1 ඒ කාලයෙහි විශාලා නුවරවූ බොහෝ වජ්ජි පුත්‍රක භික්ෂූහු ඇතිතාක් අනුභව කළාහුය. ඇතිතාක් නිදාගත්තාහ. ඇතිතාක් නෑවාහුය. ඇතිතාක් කා, ඇතිතාක් නිදාගෙන ඇතිතාක් නා, නුනුවණින් මෙනෙහිකොට, සිල් බහා නොතබා, දුශීල බව ප්‍රකාශ නොකොට, මෛථුන ධර්මයෙහි යෙදුනාහ. ඔව්හු මෑත කාලයෙහි ඥාතීන්ගේ විපතක්ද ස්පර්ශ කළාහු, රෝග විපතක්ද ස්පර්ශ කළාහු, ආයුෂ්මත් ආනන්ද තෙරුන් වෙත පැමිණ මෙසේ කීයත්. 'ස්වාමිනි, ආනන්ද ස්ථවිරයන් වහන්ස, ස්වාමිනි, අපි බුදුන්වහන්සේට ගර්හා නොකෙළෙමු. ධර්මයට ගර්හා නොකෙළෙමු. සංඝයාට ගර්හා නොකෙළෙමු. ස්වාමිනි, ආනන්ද ස්ථවිරයන් වහන්ස, අපි තමාටම ගර්හා

කරණලද්දෝ වෙමු. අපි අනාථයෙකුට ගර්හා නොකරණ ලද්දෝ වෙමු. අපි දෙවසැත්කෝවෙමු පින්සැත්තෝවෙමු. යම්බඳුවූ අපි මෙසේ මනාකොට වදාළ ධර්මයෙහි පැවිදිව දිවි ඇතිතාක් සම්පූර්ණ පිරිසිදු බ්‍රහ්මචර්‍ය්‍යාමෙහි හැසිරෙන්ට නොහැකිවූමු ස්වාමීනි, ආනන්ද ස්ථවිරයන් වහන්ස, අපි දැන් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිද්ද ලබන්නෙමු. උපසම්පදාව ලබන්නෙමු. අපි දැනුදු විදර්ශනා කුශල ධර්මයන්ට පෙර පසුවූ බෝධි පාක්ෂිකවූ ධර්මයන් භාවනා කිරීමෙහි යෙදී සිටින්නෙමු. ස්වාමීනි, ආනන්ද ස්ථවිරයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කියන්නෙහි නම් යහපත." "ඇවැත්නි, එසේයැයි" ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ විශාලා නුවර වජ්ජි පුත්‍රයන්ට පිළිතුරුදී භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එහි පැමිණියහ. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැළ කළහ.

2 "තථාගත තෙමේ ශ්‍රාවකයන්ට පණවන ලද ශික්ෂා පදයක් වජ්ජීන් හෝ වජ්ජි පුත්‍රයන් නිසා හෝ අවලංගු කරන්නේය යන මේ කාරණ නොසිදුවේ. අවකාශ නැත." ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙහි මේ සිද්ධියෙහි දැහැමි කථාකොට භික්ෂූන් ඇමතූසේක. "මහණෙනි, යම් භික්ෂුවක් සිල් බහා නොතබා දුර්වලකම ප්‍රකාශ නොකොට මෛථුන ධර්මය සේවනය කරයිද, ආවාවූ හෙතෙම උපසම්පදා නොකටයුත්තේය. මහණෙනි, යම් භික්ෂුවක් සිල් බහා තබා දුර්වල බව ප්‍රකාශකොට මෛථුනය සේවනය කරයිද, ආවාවූ හෙතෙම උපසම්පදා කටයුතුය. මහණෙනි, මෙසේ වනාහි මේ ශික්ෂා පදය කියව්.

"යම්කිසි මහණෙක් භික්ෂූන් අතර අධිශීල (මාර්ගඵල) ශික්ෂාවෙහිද, පැනවූ ශික්ෂාපදයෙහිද යුක්ත වූයේ සිල් බහා නොතබා දුර්වල බව ප්‍රකාශ නොකොට යටත් පිරිසෙයින් තිරිසන්ගත ගැහැණු සතකු සමගද මෛථුන ධර්මයෙහි හැසිරේද (ඔහු) පැරදුණු ආශ්‍රය නුසුදුස්සෙකු වේ."

# 4 පදභාජනීය

1 යමෙක් වනාහි යනු යම්බඳු, යම්සේ යෙදුනු, යම් ජාති ඇති, යම් නමක් ඇති, යම් ගෝත්‍රයක් ඇති, යම් ස්වභාවයක් ඇති, යම්සේ වාසය කරණ, යම්සේ ආශ්‍රය කරණ, ස්ථවිර නමින් හෝ, නවක නමින් හෝ මධ්‍යම නමින් හෝ යන මේ තෙමේ යමෙක් වනාහි යයි කියනු ලැබේ.

2 'භික්ෂුව' යනු ඉල්වානුයි භික්ෂු නම්. පිඬු සිඟීමට පැමිණියේනුයි භික්ෂු නම්. කඩන ලද වස්ත්‍ර (සිවුරු) දරානුයි භික්ෂු නම්. නාමයෙන් භික්ෂු නම්. පිළිගැනීමෙන් භික්ෂු නම්. 'එව මහණයි' භික්ෂු නම් වේ. සරණාගමන තුනින් උපසම්පදා වූයේයයි භික්ෂු නම් වේ. යහපත් භික්ෂුව, අරටු ඇති භික්ෂුව, ශික්ෂිත භික්ෂු, ශික්ෂිමට නුවුවමනා භික්ෂුව, සමගි සංඝයා විසින් ඥප්තිය (දැනුම්දීම) සතර වෙනිකොට ඇති නොවරදින සුළු, තැනට සුදුසු උපසම්පදාවෙන් උපසම්පදා වූයේයයි භික්ෂු නම් වේ. එහි යම් මේ භික්ෂුවක් නොවරදින, තැනට සුදුසුලෙස පැවති ඥප්තිය සතරවෙනි කොට ඇති උපසම්පදාවෙන් උපසම්පදාවූ මේ තෙමේ මේ අර්ථයෙහි අදහස් කරණ භික්ෂුව නම් වේ.

3 ශික්ෂා යනු තුන් සික්මීමයි. ශ්‍රේෂ්ඨ ශීලය, ශ්‍රේෂ්ඨ සිත, ශ්‍රේෂ්ඨ ප්‍රඥාව යන තුනයි. එහි මේ ශ්‍රේෂ්ඨ ශික්ෂාව මේ අර්ථයෙහි අදහස් කරණ සික්මීමයි.

4 'සමග පැවැත්ම' යනු භාග්‍යවතුන් වහන්සේ විසින් යම් ශික්ෂා පදයක් පනවන ලද්දේද, මෙය සාජීව නම් එහි හික්මෙයි. එහෙයින් සමා පැවැත්මට පැමිණුනේය යනුයි.

5 'සිල් බැහැනොතබා දුබල බව නොපෙන්නා' යන මෙහි මහණෙනි, දුබල බව ප්‍රකාශ කිරීමක්ද ඇත්තේය. සිල් බැහැ නොතැබීමක්ද ඇත්තේය. මහණෙනි, දුබල බව ප්‍රකාශ කිරීමක්ද ඇත්තේය. සිල් බැහැ තැබීමක්ද ඇත්තේය. මහණෙනි, කෙසේ දුබල බව ප්‍රකාශ කිරීමද සිල් බැහැ නොතිබීමද වේද, (ii) මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම කලකිරුණේ නො ඇලුණේ ශ්‍රමණ භාවයෙන් චුතවනු

නැමැත්තේ භික්ෂු බව පෙලනු ලබන්නේ, භික්ෂු බවට ලජ්ජා වන්නේ, භික්ෂු බව පිළිකුල් කරන්නේ, ගිහි බව පතන්නේ උපාසක බව පතන්නේය. ආරාමිකයේ වැඩපල කරන්ට බලාපොරොත්තු වන්නේ සාමණේර බව පතන්නේ තීර්ථක බව පතන්නේ, තීර්ථක ශ්‍රාවක බව පතන්නේ, ශ්‍රමණයකු නොවන බව පතන්නේ ශාක්‍ය පුත්‍ර (ii) නොවන බව පතන්නේ 'මම බුදුන් අත්හරින්නෙම් නම් යහපත්යයි" කියයි. භගවති මහණෙනි, මෙසේ දුබලබව ප්‍රකාශ කිරීමද ශික්ෂා බහා නොතැබීමද වේ.

6 නැවතද වනාහි කලකිරුණේ හෝ ඇලුනේ (මෙහි 5 ii ඡේදයේදී 'බුදුන් අත්හරින්නෙම් නම් යහපත්යයි' වෙනුවට 'ධර්මය අත්හරින්නෙම් නම්' කියා වෙනස්කර යොදාගත යුතුය)

7 (මෙහි 6 ඡේදයේදී 'බුදුන්'-යන්නට 'සංඝයා' කියා වෙනස්කර යොදාගත යුතුයි.)

8 මම සිල් බහා තබන්නේ නම් යහපතැයි කියයි, අඟවයි (9 – 23 දක්වා ඡේද අගට "යහපතැයි, කියයි, අඟවයි" යෙදිය යුතුයි)

9 මම විනය අත්හරින්නෙම් නම්–

10 මම ප්‍රාතිමෝක්ෂය (හික්මීම් රැසිය) අත්හරින්නෙම් නම්–

11 මම උගෙණීම අත්හරින්නෙම් නම්–

12 මම උපාධ්‍යායන් (අවවාද දෙන්නන්) අත්හරින්නෙම් නම්–

13 මම ගුරුවරයා අත්හරින්නෙම් නම්–

14 එකට වසන්නා අත්හරින්නෙම් නම්-

15 මම ගෝලයා අත්හරින්නෙම් නම්–

16 මම අවවාද දෙන සමාන ගුරුවරයකු ඇත්තා අත්හරින්නෙම් නම්.

17 මම සමාන ආචාර්යවරයකු ඇත්තා අත්හරින්නෙම් නම්–

18 මම සමාන සිල් ඇත්තා අත්හරින්නෙම් නම්–

19 මම ගිහිවෙම් නම්–

20 මම උපාසකයෙක් වන්නෙම් නම්–

21 මම ආරාමිකයෙකි කෙනෙක් වන්නෙම් නම්-

22 මම සාමණේරයෙක් වන්නෙම් නම්-

23 මම තීර්ථක ශ්‍රාවකයෙක් වන්නෙම් නම්-

24 මම ශාක්‍ය පුත්‍රයෙක් නොවන්නේ නම් යහපතැයි කියයි අඟවයි.

මහණෙනි, මෙසේ දුර්වලකම ප්‍රකාශ කිරීමවේ. සිල් දුරු නොකළේ වේ

25 (මෙහි 5 (ii) සිට 24 දක්වා යෙදීමේදී "අත්හරින්නෙම් නම් යහපති" වෙනුවට "ඉදින් මම අත්හරින්නෙමියි" යොදාගත යුතුයි.)

26 නැවතද වනාහි (මෙහි 5 (ii) සිට 24 දක්වා යෙදීමේදී "අත්හරින්නෙම් නම් යහපති", වෙනුවට "ඉදින් මම අත්හරින්නෙම්දැයි" යොදාගත යුතුයි.)

27 නැවතද වනාහි (මෙහි 5 (ii) සිට 24 දක්වා යෙදීමේදී "අත්හරින්නෙම් නම් යහපත" වෙනුවට "එසේනම් අත්හරින්නෙමියි" යොදාගත යුතුයි.)

28 (නැවතද වනාහි (මෙහි 5 (ii) සිට 24 දක්වා යෙදීමේදී "අත්හරින්නෙම් නම් යහපති" වෙනුවට "එසේනම් මාගේ අත්හැරීම මෙයි" යොදාගත යුතුයි.)

29 (i) නැවතද වනාහි කලකිරුණේ හෝ ඇලුණේ ශ්‍රමණ භාවයෙන් චුතවනු කැමැත්තේ භික්ෂු භාවය පෙළනු ලබන්නේ භික්ෂුබවට ලජ්ජා වන්නේ භික්ෂු බව පිළිකුල් කරන්නේ, ගිහි බව පතන්නේ, උපාසක බව පතන්නේ, ආරාමයෙහි වැඩපල කරන්නට බලාපොරොත්තු වන්නේ, සාමණේර බව පතන්නේ, තීර්ථක බව පතන්නේ, තීර්ථක ශ්‍රාවක බව පතන්නේ, ශ්‍රාවකයෙකු නොවන බව පතන්නේ ශාක්‍යපුත්‍ර නොවන බව පතන්නේ (ii) මව සිහිකරමියි කියයි, අඟවයි. මහණෙනි, මෙසේ දුර්වල බව ප්‍රකාශ කිරීමද ශික්ෂාව බැහැ නොතැබීමද වේ. (iii) පියා සිහිකරමියි කියයි අඟවයි. (මෙහි පහත දක්වෙන වචන අගට "සිහිකරමියි කියයි

අඟවයි" යොදන්න.) සහෝදරයා, නැගණිය; පුතා, දුව, භාර්යාව, නෑයන්, මිත්‍රයන්, ගම, නියම්ගම, කුඹුර, ඉඩම, අමුරන්, රුවන්, ශිල්පය, පෙර කරනලද සිනාව, කථාව, ක්‍රීඩාව සිහි කරමියි කියයි අඟවයි. මෙසේත්, මෙසේද මනාම දුබලකම ප්‍රකාශ කිරීමද සිල් අත්නොහැරීමද වේ.

30 නැවතද මනාකී (මෙහි 29 (i) (ii) යෙදීමේදී "සිහි කරමියි" වෙනුවට "ඇත මා විසින් පෝෂ්‍යය කටයුතුයයි" යොදගත යුතුයි.)

31 මාගේ පියා ඇත හෙතෙම මා විසින් පෝෂ්‍යය කටයුතුයයි කියයි, අඟවයි (මෙහි පහත දක්වෙන එවන අගට "මා විසින් පෝෂ්‍යය කටයුතුයයි කියයි, අඟවයි" යොදන්න) මාගේ සහෝදරයා ඇත හෙතෙම- මාගේ නැගණිය ඇත ඕතොමෝ- මාගේ පුත්‍රයා ඇත හෙතෙම- මාගේ දියණිය ඇත. ඈ- මාගේ භාර්යාව ඇත ඈ- මාගේ නෑයෝ ඇත ඔව්හු- මාගේ මිත්‍රයෝ ඇත- මෙසේත්, මෙසේද දුබල කම ප්‍රකාශ කිරීමද වේ. ශික්ෂාපද අත්නොහැරීමද වේ.

32 නැවතද මනාකී (29 (ii) යෙදීමේදී 'සිහිකරමි" වෙනුවට "ඇත ඈ මා පෝෂ්‍ය කරන්නේය" යොදගත යුතුයි)

33 මාගේ පියා ඇත හෙතෙම (මේ වාක්‍ය අගට "මා පෝෂණය කරන්නේයයි කියයි අඟවයි" යොදන්න ) මගේ සහෝදරයා ඇත. හෙතෙම- මගේ නැගනිය ඇත, ඈ- මගේ දුව ඇත ඈ- මාගේ භාර්යාව ඇත ඈ- මාගේ නෑයෝ ඇත ඔවුහු-මගේ මිත්‍රයෝ ඇත. ඔව්හු- මගේ ගම ඇත-"එයින්ද මා ජීවත්වෙමියි, කියයි අඟවයි" යොදන්න)මගේ නියම්ගම ඇත- මගේ කුඹුර ඇත- මගේ ඉඩම ඇත- මගේ අමුරන් ඇත. රුවන් මට ඇත- මගේ ශිල්පය ඇත- මෙසේත්, මෙසේද දුබල බව ප්‍රකාශ කිරීමද වේ. සිල්ද අත්හැරියේ නොවේ

34 නැවතද මනාකී (29 (i) යොදගත යුතුයි ) දුෂ්කර යැයි කියයි, අඟවයි. පහසු නොවේයයි මේ වාක්‍ය අගට 'කියයි අඟවයි'' යොදන්න) දුකසේ හැසිරෙන්නෙමියි- සුවසේ

නොහැකිරෙමියි- උත්සාහ නොකරමියි- නොහැක්කෙමියි- ශාශා නැකැයි- නොඇලෙමියි- මහණෙනි, මෙසේද මනාකී දුසීලවල බව ප්‍රකාශ කිරීමද ශික්ෂාව අත්හැරීමද වේ

35-46 "මහණෙනි, කෙසේනම් දුසීලකම ප්‍රකාශකිරීමද සිල් අත්හැරීම වේද, මහණෙනි, මේ ශාසනයෙහි මහණෙක් (මෙහි 5, (ii) සිට 24 ඡේද දක්වා "අත් හරින්නෙම් නම්" වෙනුවට "අත්හරින්නෙමිද" "බහානොහැබීම" වෙනුවට "බහානැබීම" යොදාගත යුතුයි.) මහණෙනි, මෙසේද මනාකී දුසීලකම ප්‍රකාශ කිරීමද සිල් අත්හැරීමද වේ.

47 කැමතිද මනාකී (29- (i) යොදාගත යුතුයි.) මට බුදුන්ගෙන් වැඩක් නැතැයි කියයි, අගවයි. (මෙහි 6 සිට 18 දක්වා ඡේදවල "අත්හරින්නෙම් නම්" වෙනුවට "ගෙන් වැඩක් නැත" යොදාගත යුතුයි.) මහණෙනි, මෙසේද මනාකී දුසීලකම ප්‍රකාශ කිරීමද සිල් අත්හැරීමද වේ.

48 කැමතිද මනාකී (29 (i) යොදාගත යුතුයි ) බුදුන් කිනම් ප්‍රයෝජනදැයි කියයි, අගවයි. (මෙහි 6 සිට 18 ඡේදවල "අත්හරින්නෙනම්" වෙනුවට "ගෙන් කිනම් ප්‍රයෝජනද" යොදාගත යුතුයි.

49 කැමතිද මනාකී (29 (i) යොදන්න) බුදුන්ගෙන් මට වැඩක් නැතැයි කියයි. අගවයි. (මෙහි 6 සිට 18 දක්වා ඡේදයන්හි "අත්හරින්නෙම් නම්" වෙනුවට "ගෙන් මට වැඩක් නැත" යොදාගත යුතුයි.)

50 කැමතිද මනාකී (29 (i) යොදන්න) මම බුදුන්ගෙන් මිදුනෙමි කියයි, අගවයි. (6-18 දක්වා ඡේදවල "අත්හරින් නෙම් නම්" වෙනුවට "ගෙන් මිදුනෙමි" යොදාගත යුතුයි.)

51 අනිකුදු යම් බුදුන්ට සමාන නම් ඇති වෙත්නම් හෝ (මේ වචන අගට "සමාන නම් ඇතිවෙත් නම් හෝ" යොදන්න) ධර්මයට- සඞ්ඝයාට- සිල්මලුට- විනයට- ශික්ෂාපදමලුට- ඉගෙනීමට- උපාධ්‍යායයන්ට- ආචාර්යයන්ට- එකට වාසය කරන්නන්ට- ගෝලයින්ට- එකසමාන උපාධ්‍යායයන්ට- එකසමාන ගුරුවරුන්ට- සමාන සිල් රකින්නන්ට- මිතුරන්ට- උපාසක

යන්ට- ආරාමයේ සිටින අයට- සාමණේරයන්ට- තීර්ථකයන්ට- තීර්ථකයන්ගේ ශ්‍රාවකයන්ට- ශ්‍රමණ නොවන්නන්ට- ශාක්‍ය පුත්‍ර නොවන්නන්ට- ඒ ආකාරයෙන් ඒ සලකුණෙන් ඒ කරුණින් කියයි, අඟවයි. මහණෙනි, මෙසේ ශික්ෂා දුර්වලකම් ප්‍රකාශ කිරීමද ශික්ෂාව අත්හැරීමද වේ.

52 මහණෙනි, සිලය කෙසේ අත්නොහැරියේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම යම් ආකාරයකින් යම් සලකුණකින් යම් කරුණකින් සිල් අත්හලේ වේද, ඒ ආකාරයෙන් ඒ සලකුණෙන්, ඒ කරුණින් පිස්සෙක් සිල් අත්හරිසිද සිල් අත්නොහැරියේ වෙයි (මෙහි පහත දක්වන ඕනෑ අගට "සිල් අත්නොහැරියේ වෙයි." යෙදේන) පිස්සෙකු ලඟ සිල් අත්හරීද- විසුරුණු සිත් ඇත්තෙක් සිල් අත්හරිසිද- විසුරුණු සිත් ඇති අනෙකෙකු ලඟ සිල් අත්හරිසිද- වේදනාව කින් පෙළුණෙක් සිල් අත්හරිසිද- වේදනාවෙන් පෙළුණෙකු ලඟ සිල් අත්හරිසිද- දෙවියෙකු සමීපයේ සිල් අත්හරීද- තිරිසන්ගත සතකු ඉදිරියෙහි සිල් අත්හලේද- අශීලාචාරයෙකු ඉදිරියේ සිල් අත්හලේද මෙතෙමේ නොපිළිගනීද- අශීලාචාරයකු විසින් උසස් අයෙකු සමීපයේ සිල් අත්හරීද ඔහුද නොපිළිගනීද- උසස් අයෙකු උසස් අයෙකු සමීපයේ සිල් අත්හලේද මෙතෙමේ නොපිළිගනීද- අශීලාචාරයෙකු අශීලාචාරයෙකු සමීපයේ සිල් අත්හරීද මෙතෙමේද නොපිළිගනීද- ක්‍රීඩා පිණිස සිල් අත්හරීද- ශබ්දය පිණිස සිල් අත් හරීද- නොඅස්වනු කැමැත්තේ අස්වයි- අස්වනු කැමැත්තෙන් නොඅස්වයි- නුවණ නැත්තෙකුට අස්වයිද- ඥාණවන්තාට නොඅස්වයි. සියල්ල හෝ නොඅස්වයිද සිල් අත්නොහලේ වේ. මහණෙනි, මෙසේ මහණ සිල් අත් නොහැරියේ වේ.

53 "මෛථුන ධර්මය නම් යම් ඒ වැරදි ධර්මයක් ඇද්ද, ගම්වූන්ට අයිති දෙයක් ඇද්ද, නීච ධර්මයක් ඇද්ද, නපුරු ආශ්‍රය කෙලේද, ලාමක දෙයක් කොම ඇත්තේද, දෙදෙනෙකුගේ රහස් එක්වීමක් වේද, මේ මෛථුන ධර්මය වේ.

54 සේවනය කරයි යනු යමෙක් ස්ත්‍රී නිමිත්තෙන් පුරුෂ නිමිත්ත පුරුෂ ලිංගයෙන් ස්ත්‍රී ලිංගය යටත්පිරිසෙයින් තල ඇටක් පමණකුදු ඇතුල් කරවයිද මේ සේවනය ප්‍රවිෂ්ට කරයි නම් වේ.

55 "යටත්පිරිසෙයින් තිරිසන්ගත ගැහැණු සතෙකු සමගද," යනු තිරිසන්ගත ස්ත්‍රියකු සමගද මෛථුන ධර්මය සේවනය කොට ශ්‍රමණයෙකු නොවන බවටයේ. ශාක්‍යපුත්‍ර නොවන බවටයේ. මනුෂ්‍ය ස්ත්‍රියකු ගැන කියනුම කවරේද? එහෙයින් යටත්පිරිසෙයින් තිරිසන්ගත ගැහැණු සතෙකු සමගය කියයුතු.

56 "පැරදුණේ වේ" යනු යම්සේ පුරුෂයෙක් තෙම හිස සිඳුණේ ඒ ශරීරයෙන් ජීවත්වීමට නොහැක්කේද, මහණ තෙම එසේම මෛථුන ධර්මයෙහි හැසිර ශ්‍රමණ නොවූයේත් ශාක්‍ය පුත්‍ර නොවූයේත් වේ. එහෙයින් පැරදුණේ වේ.

57 "එක්විමට නුසුදුසුය" යනු එක්වීම නම් එකට විනය කර්මය, එකට උදෙසීම, සමාන සිල් ඇති බව, මේ එකට විසීමයි. එය ඔහු සමග නැත, එහෙයින් එක්වීමට නුසුදුසුයයි කියනු ලැබේ.

58 "ස්ත්‍රීහු තුන්දෙනෙකි. මනුෂ්‍ය ස්ත්‍රිය අමනුෂ්‍ය ස්ත්‍රිය තිරිසන් ස්ත්‍රිය යන තුන්දෙනයි. ස්ත්‍රී පුරුෂ නිමිති දෙකම ඇති ස්ත්‍රීහු තුන්දෙනෙකි. මනුෂ්‍ය, අමනුෂ්‍ය, තිරිසන් යනුයි. නපුංසකයෝ තුන්දෙනෙකි. මනුෂ්‍ය, අමනුෂ්‍ය තිරිසන් යනුයි. පුරුෂයෝ තුන්දෙනෙකි. මනුෂ්‍ය, අමනුෂ්‍ය, තිරිසන් යනුයි.

59 මනුෂ්‍ය ස්ත්‍රියකගේ (ii) මල මාර්ගය මූත්‍ර මාර්ගය කට යන මාර්ග තුනෙහි මෛථුන ධර්මය සේවනය කරන්නාට පාරාජිකා පාපය වේ. (iii) අමනුෂ්‍ය ස්ත්‍රියකගේ (මෙහි (ii) තිරිසන්ගත ස්ත්‍රියකගේ (මෙහි (ii) මනුෂ්‍යවූ ස්ත්‍රී පුරුෂ නිමිති දෙකම ඇත්තෙකුගේ (මෙහි (ii) අමනුෂ්‍යවූ ස්ත්‍රී පුරුෂ නිමිති දෙකම ඇත්තෙකුගේ (මෙහි (ii) තිරිසන්ගතවූ ස්ත්‍රී පුරුෂ නිමිති දෙකම ඇත්තෙකුගේ (මෙහි (ii) මනුෂ්‍ය නපුංසකයෙකුගේ (iv) මල මාර්ගය කට යන මාර්ග දෙකෙහි මෛථුන සේවනය කරන්නාහට පාරාජිකා පාපය වේ. අමනුෂ්‍ය නපුංසකයකුගේ (මෙහි (iii) තිරිසන්ගත නපුංසක

කෙකුගේ (මෙහි (iii) මනුෂ්‍ය පුරුෂයෙකුගේ (මෙහි (iii) අමනුෂ්‍ය පුරුෂයෙකුගේ (මෙහි (iii) තිරිසන්ගත පුරුෂයෙකුගේ (මෙහි (iii)

60 (i) භික්ෂුවට මෛථුන කිරීමේ සිතක් උපන් කල්හි මනුෂ්‍ය ස්ත්‍රියකගේ (ii) මල මාර්ගයේ (iii) පුරුෂ නිමිත්ත ඇතුල් කරන්නාට පාරාජිකා පාපය වේ. (iv) (මෙහි (i) යොදන්න) මූත්‍ර මාර්ගයේ( (iii) යොදන්න)(මෙහි (i) යොදන්න) කටේහි (මෙහි (iii) යොදන්න) මේ ඡේදයේ "මනුෂ්‍ය" වෙනුවට "අමනුෂ්‍ය" කියා යොදගත යුතුයි.) (මේ ඡේදයේ "මනුෂ්‍ය" වෙනුවට "තිරිසන්" යොද ගත යුතුයි ) (මේ ඡේදයේ "මනුෂ්‍ය ස්ත්‍රියකගේ" වෙනුවට "මනුෂ්‍යවූ ස්ත්‍රී පුරුෂ නිමිති ඇත්තෙකුගේ" යොදගත යුතුයි.) මෙහි 'මනුෂ්‍ය ස්ත්‍රියකගේ' වෙනුවට 'අමනුෂ්‍යවූ ස්ත්‍රී පුරුෂ නිමිති ඇත්තෙකුගේ' යන්න යොදන්න) 'මනුෂ්‍ය ස්ත්‍රියකගේ' වෙනුවට 'තිරිසන්ගත ස්ත්‍රී පුරුෂ නිමිති ඇත්තෙකුගේ' යොදගත යුතුයි )

61 භික්ෂුවට මෛථුන කරණ සිත උපන් කල්හි මනුෂ්‍ය නපුංසකයෙකුගේ (මෙහි 59 (ii) යොදන්න)

62 භික්ෂූන්ට විරුද්ධ කරුවෝ මනුෂ්‍ය ස්ත්‍රියක් භික්ෂුව සමීපයට ගෙනැවිත් මල මාර්ගයෙන් පුරුෂ නිමිත්ත උඩ හිඳුවත්. හෙතෙම ඉදින් ඇතුල් කිරීම ඉවසයිද, ඇතුල්වීම ඉවසයි. තිබීම ඉවසයිද, ගැනීම ඉවසයිද පාරාජිකා පාපය වේ.

63 භික්ෂූන්ට විරුද්ධකරුවෝ මනුෂ්‍ය ස්ත්‍රියක් භික්ෂුව සමීපයට ගෙනැවිත් මල මාර්ගයෙන් පුරුෂ නිමිත්ත උඩ හිඳුවත්. හෙතෙම ඉදින් ඇතුල්කිරීම නොඉවසයිද, ඇතුල් වීම ඉවසයිද, තිබීම ඉවසයිද, ගැනීම ඉවසයිද පාරාජිකා පාපය වේ.

64 භික්ෂූන්ට විරුද්ධකරුවෝ මනුෂ්‍ය ස්ත්‍රියක් භික්ෂුවක් සමීපයට ගෙනැවිත් මල මාර්ගයෙන් පුරුෂ නිමිත්ත උඩ හිඳුවත්. හෙතෙම ඉදින් ඇතුල්කිරීම නොඉවසයිද, ඇතුල් වීම නොඉවසයිද, තිබීම ඉවසයි ගැනීම ඉවසයි. පාරාජිකා පාපය වේ.

65 භික්ෂුත්ව විරුද්ධකරුවෝ මනුෂ්‍ය ස්ත්‍රියක් භික්ෂුවක් සමීපයට ගෙනැවිත් මල මාර්ගයෙන් පුරුෂ නිමිත්ත උඩ හිඳුවත්. එසතෙම ඉඳින් ඇතුල් කිරීම නොඉවසයිද, ඇතුල් පිවීම නොඉවසයිද, සිටීම නොඉවසයිද, ගැනීම ඉවසයිද පාරාජිකා වේ.

66 භික්ෂුත්ව විරුද්ධකරුවෝ මනුෂ්‍ය ස්ත්‍රියක් භික්ෂුවක් සමීපයට ගෙනැවිත් මල මාර්ගයෙන් පුරුෂ නිමිත්ත උඩ හිඳුවත් එසතෙම ඉඳින් ඇතුල් කිරීම නොඉවසයිද, ඇතුල් පිවීම නොඉවසයිද, සිටීම නොඉවසයිද, ගැනීම නොඉවසයිද ඇවැත් නොවේ.

67-71 (මෙහි 62 – 66 ඡේදවල "මල" යනු වෙනුවට "මුඛ" යනු යොදන්න.)

72-76 (මෙහි 62-66 ඡේදවල "මල" වෙනුවට "කටින්" යනු යොදන්න )

77-91 (මෙහි 62-76 ඡේදවල "මනුෂ්‍ය ස්ත්‍රියක්" වෙනුවට "නොනිඳ සිටින මනුෂ්‍ය ස්ත්‍රියක්" යොදා ගත යුතුයි.)

(මෙතැන් සිට ඡේද 15 න් 15 ට ඡේද 62-76 යෙදීමේදී "මනුෂ්‍ය ස්ත්‍රියක්" වෙනුවට යෙදිය යුතු වචනය සඳහන් කරනු ලැබේ.)

92-106 'මනුෂ්‍ය ස්ත්‍රියක්' වෙනුවට 'නිදිගත් ස්ත්‍රියක්' යොදාගත යුතුයි,)

107-121 මත්වූ ස්ත්‍රියක්
122-136 උමතුවූ ස්ත්‍රියක්
137-151 විශේෂයෙන් මත්වූ ස්ත්‍රියක්
152-166 මැරුණු නොදිරුණු ස්ත්‍රියක්-
167-181 මැරුණු බොහෝසෙයින් නොදිරුණු ස්ත්‍රියක්-
182-197 මැරී බොහෝසේ දිරාගිය ස්ත්‍රියක-

("පාරාජිකා වේ" වෙනුවට "ථුල්ලසි නම් ඇවත වේ" යන්න යොදා ගතයුතුයි.)

198 – 212 අමනුෂ්‍ය ස්ත්‍රියක්-
213 – 227 තිරිසන්ගත ස්ත්‍රියක්-

228 – 242 මනුෂ්‍ය ස්ත්‍රී නිමිති පුරුෂ නිමිති ඇති ස්ත්‍රියක්-

243 – 257 අමනුෂ්‍ය ස්ත්‍රී නිමිති පුරුෂ නිමිති ඇති ස්ත්‍රියක්-

258-272 තිරිසන්ගත ස්ත්‍රී පුරුෂ නිමිති ඇති ස්ත්‍රියක්-

273 – 287 තිරිසන්ගත නොනිදා සිටින ස්ත්‍රී පුරුෂ නිමිති ඇති ස්ත්‍රියක්-

(මෙහි "පාරාජික පාපය" වෙනුවට "ථුලසී නම් ඇවත වේ" යොදන්න.)

288 - 303 මනුෂ්‍ය නපුංසකයෙක්-

304 – 318 අමනුෂ්‍ය නපුංසකයෙක්-

319 – 333 තිරිසන්ගත නපුංසකයෙක්-

334 – 343 (මෙහි 62 – 66 ද, 72 – 76 යෙදීමේදී 'මනුෂ්‍ය ස්ත්‍රියක්' වෙනුවට 'මනුෂ්‍ය පුරුෂයෙකු' යොදන්න.

344 – 353 අමනුෂ්‍ය පුරුෂයෙකු-

354 – 363 තිරිසන්ගත පුරුෂයෙකු-

364 – 374 (මෙහි 62 - 76 ජේද යෙදීමේදී මැරුණු "මලම්ගියෙන්" වෙනුවට "වැසුණේ නොවැසූ මලම්ගියෙන්, මුත්‍රමාර්ගයෙන්, කටින්, නොවැසුනාහු විසින් වැසුනහුට, වැසුනහු විසින් වැසුනහුට, නොවැසුනහු විසින් නොවැසුනහුට-"

375 – 385 (මෙහි 62 - 76 ජේද යෙදීමේදී "මනුෂ්‍ය ස්ත්‍රියක්" වෙනුවට මෙහි පහත දක්වන වචන යොදගත යුතුයි.)

386 – 396 නිදිගත් මනුෂ්‍ය ස්ත්‍රියක්-

397 – 407 මත්වූ ස්ත්‍රියක්-

408 – 418 විශේෂයෙන් මත්වූ ස්ත්‍රියක්-

419 – 429 මැරුණු නොදිරූ ස්ත්‍රියක්-

430 - 440 මැරුණු බොහෝ නොදිරූ ස්ත්‍රියක්-

441 - 451 මළ බොහෝසෙයින් දිරූ ස්ත්‍රියක්-

452 - 462 අමනුෂ්‍ය ස්ත්‍රියක්-

463 - 473 තිරිසන්ගත ස්ත්‍රියක්-

474 - 484 මිනිස් පුරුෂ ස්ත්‍රීනිමිති ඇත්තෙක්-

485-495 නොමිනිස් මිනිස් පුරුෂ ස්ත්‍රී නිමිති ඇත්තෙක්-

496 - 506 තිරිසන් මිනිස් නොමිනිස් නිමිති ඇත්තෙක්-

507 - 521 (මෙහි 62 - 76 ඡේදවල "පුරුෂ නිමිත්ත උඩ සිඳුවත්" වෙනුවට "වැසූ හෝ නොවැසූ පුරුෂ නිමිත්ත උඩ ඉඳගනීත්ද, නොවැසූ - වැසූ - වැසූ වැසූ - නොවැසූ නොවැසූ' යෙදිය යුතුයි )

522-536 (මෙහි 507-521 යෙදීමේදී "මනුෂ්‍ය ස්ත්‍රියක්" වෙනුවට "නොනිදා සිටින ස්ත්‍රියක්" යන්න යොදන්න )

537-551 "මනුෂ්‍යස්ත්‍රියක්" වෙනුවට "නිදිගත්ස්ත්‍රියක්")

551-565 ("මනුෂ්‍ය සත්‍රියක්" වෙනුවට "මත්වූ ස්ත්‍රියක්")

566-580 ("මනුෂ්‍ය සත්‍රියක්" වෙනුවට "බොහෝ මත්වූ ස්ත්‍රියක්")

581-595 ("මනුෂ්‍ය සත්‍රියක්" වෙනුවට "උමතුවූ සත්‍රියක්")

696 - 610 ("මනුෂ්‍ය ස්ත්‍රියක්" වෙනුවට "විශේෂයෙන් මත්වූ ස්ත්‍රියක්")

611 - 625 (මෙහි 507 - 521 යෙදීමේදී "මනුෂ්‍ය ස්ත්‍රියක්" වෙනුවට "මෙහි පහත දක්වන වචන ඒ ඒ ඡේද කාණ්ඩවලට යොදන්න.

"මිනිස් නපුංසකයෙක්"

626 - 640 "නොමිනිස් නපුංසකයෙක්"

641 - 655 "තිරිසන්ගත නපුංසකයෙක්"

656 - 670 "මිනිස් පුරුෂයෙක්"

671 - 685 "නොමිනිස් පුරුෂයෙක්"

686 - 700 "තිරිසන්ගත පුරුෂයෙක්"

701 (රජවරුන්ගේ සතුරෝ, සොරුන්ගේ සතුරෝ, ධූර්තයන්ගේ සතුරෝ, පසුව පලන සොරු, සහ පදඳ සොඳු කමයේම ජේද යොදාගත යුතුයි.)

මගින් මග ප්‍රවේශ කරයිද, පාරාජිකා ඇවැත්වේ. මගින් නොමග ප්‍රවේශ කරයිද පාරාජිකා ඇවැත්වේ. නොමගින් මග ප්‍රවේශ කරයිද පාරාජිකා ඇවැත්වේ. නොමගින් නොමග ප්‍රවේශ කරයිද ථුල්ලසි වේ.

702 භික්ෂුවක් නිදිගත් භික්ෂුවක් කෙරෙහි වරදවා පිළිපදිනාවිට පිබිදියේ ඉවසාද දෙදෙනාම දඬුවම් ලැබිය යුතුය. පිබිදියේ නොඉවසයිද දූෂකයාට දඬුවම් කළයුතුය. භික්ෂුවක් නිදිගත් සාමණේරයෙකු කෙරෙහි වරදවාද, පිබිදියේ ඉවසයිද දෙදෙනාටම දඬුවම් කළයුතුය. පිබිදියේ නොඉවසයිද දූෂකයාට දඬුවම් කළයුතුය.

703 සාමණේර කෙනෙක් නිදිගත් භික්ෂුව කෙරෙහි වරදවා පිළිපදීද, පිබිදියේ ඉවසයිද දෙදෙනාටම දඬුවම් කළයුතුය. පිබිදියේ නොඉවසයිද දූෂකයාට දඬුවම් කළයුතුය. සාමණේර කෙනෙක් නිදිගත් සාමණේරයෙකු කෙරෙහි වරදවයිද, පිබිදියේ ඉවසයිද, දෙදෙනාම නෑසිය යුතුය (මහණකමින් නෙරපිය යුතුයි.) පිබිදියේ නොඉවසයිද දූෂකයාට දඬුවම් කළයුතුය. නොදන්නාහට, නොඉවසන්නාහට, උමතුවූවහුට, සිත් පිත් නැත්තාට, වේදනාවෙන් පෙළෙන්නාට ආදි කර්මිකයාට ඇවැත් නොවේ.

(සන්ථත බණ වර නිමි.)

---

## 5 මිශ්‍ර කථා

1 (i) ඒ කාලයෙහි එක්තරා භික්ෂුනමක් මැදිරියක සමග
(ii) මෛථුන ධර්මයෙහි යෙදුනේය. ඔහුට සැකයක් ඇතිවිය.
(iii) භාග්‍යවතුන් වහන්සේ විසින් ශික්ෂාපදයක් පනවන ලදී.

කිමෙක්ද, ඔබ පාරාජිකා පාපයට පැමුණුනෙම්ද?" භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකෙළේය. "මහණෙනි, ඔබ පාරාජිකා ඇවතට පැමිණියෙහිය."

2 එකල්හි වනාහි විශාලාමහනුවර බොහෝ වජ්ජිපුත්‍රක භික්ෂූහු සිල් බැහැනොතබා දුර්වලබව ප්‍රකාශනොකොට මෛථුන ධර්මය සේවනය කළාහුය. ඔවුන්ට සැකයක් පහළවීය. භාග්‍යවතුන් වහන්සේ විසින් ශික්ෂාපද පණවන ලදී. කිමෙක්ද, පාරාජිකා පාපයට පැමිණියාහුද, භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. "මහණෙනි, තෙපි පාරාජිකා පාපයට පැමිණියාහුය."

3 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් 'මෙසේ මට ඇවැත් නොවන්නේයයි' සිතමින් යෙදී මෛථුන ධර්මය සේවනය කෙළේය. ඔහුට සැකයක් ඇතිවිය (මෙහි) 1 (iii)

4 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් 'මෙසේ මට ඇවැත් නොවන්නේයයි' වස්ත්‍ර හැඳීම මෛථුන ධර්මය සේවනය කෙළේය. ඔහුට සැකයක් ඇතිවිය. (මෙහි) 1 (iii)

5 (i) එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් 'මෙසේ මට ඇවැත් නොවන්නේයයි' (ii) කුසතණ හැඳ (මෙහි 1 (ii) (iii)

6 (මෙහි 5 (i) යොදන්න.) වැහැරි සිවුරු හැඳ (මෙහි 1 (ii) (iii)

7 (මෙහි 5 (i) පතුරු සිවුරු හැඳ (මෙහි 1 (ii) (iii)

8 (මෙහි 5 (i) කෙසකස් වලින් වියූ වස්ත්‍රයක් හැඳ (මෙහි 1 (ii) (iii)

9 (මෙහි 5 (i) සතුන්ගේ කෙඳිවලින් වියූ වස්ත්‍ර හැඳ (මෙහි 1 (ii) (iii)

10 (මෙහි 5 (1) බකමූහුණු පිහාටු ඇඳුමක් හැඳ (මෙහි 1 (ii) (iii)

11 (මෙහි 5 (1) අඳුන් දිවි සමක් හැඳ (මෙහි 1 (ii) (iil)

12 එකල්හි වනාහි එක්තරා පිඬු පිණිස යන භික්ෂුවක් පුටුවක හොත් ගැණු ළමයකු දැක කාමයෙහි ඇලුනේ ඇඟිල්ල සත්‍රීලිඟයට ඇතුල් කෙළේය. ඕ තොමෝ කළුරිය

කළේය. ඔහුට සැකයක් ඇතිවිය. භාග්‍යවතුන්වහන්සේ විසින් ශික්ෂාපදයක් පනවන ලදී. කිමෙක්ද? මම පාරාජිකාපත්තියට පැමුණුනෙම්ද? භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළේය. "මහණ, ඔබ පාරාජිකාවට නොපැමිණියෙහිය. සංඝාදිසෙස ඇවතට පැමිණියෙහිය."

13 එකල්හි වනාහි එක්තරා තරුණයෙක් උත්පලවර්ණා භික්ෂුණිය සමග පිළිබඳ සිත් ඇත්තේ විය. ඉක්බිති ඒ තරුණ තෙමේ උත්පලවර්ණා භික්ෂුණිය ගමට පිඬු පිණිස වැදි කල්හි කාමරයට වැද සැඟවී සිටියේය. උත්පලවර්ණා භික්ෂුණිය පසුබත් වේලෙහි පිණ්ඩපාතයෙන් නැවතුනේ පය පිසදමා කාමරයට ඇතුල්ව ඇඳෙහි හිඳගත්තාය. ඉක්බිති ඒ තරුණතෙම උත්පලවර්ණා භික්ෂුණිය ඔසවාගෙන දූෂණය කෙළේය. උත්පලවර්ණා භික්ෂුණිය භික්ෂුණීන්ට මේ කාරණය දැන්වූවාය. භික්ෂුණීහු භික්ෂූන්ට කීවාහුය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය දැන්වූවාහුය. "මහණෙනි, සතුටු නොවන්නීට ඇවැත් නැත"

14 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක්හට ස්ත්‍රීලිංගයක් ඇතිවිය. භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. "මහණෙනි, ඒ උපාධ්‍යායන්ම, ඒ උපසම්පදාවම, ඒ වස්ම භික්ෂුණීන් අතර ගණන්ගන්නට අවසර දෙමි. යම් ඇවැතක් භික්ෂූන්ට භික්ෂුණීන් සහ සමානද ඒ ඇවැත් භික්ෂුණීන් සමීපයෙහි රකින්ට අනුදනිමි. යම් ඇවැතක් භික්ෂූන්ට භික්ෂුණීන් සමග අසමානද' ඒ ඇවැතින් ඇවැත් නොවේ.

15 එකල්හි වනාහි එක්තරා භික්ෂුණියක් හට පුරුෂ ලිංගයක් පහළවූයේය. භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. "මහණෙනි, ඒ උපාධ්‍යායන් වහන්සේම, ඒ උපසම්පදාවම, ඒ වස්ම භික්ෂූන් සමග ගණින්නට සුදුසුය. යම් ඇවැත් කෙනෙක් භික්ෂුණීන්ට භික්ෂූන් හා සමානද ඒ ඇවැත්වලින් ඇවැත් නොවේ.

16 (i) එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් 'මෙයේ මම ඇවැත් නොවන්නේයයි' (ii) මම සමග (මෙහි 1 (ii) (iii) )

17 (මෙහි 16 යොදන්න. "මම සමග" වෙනුවට "දුව සමග" යොදන්න)

18 (මෙහි 16 යොදන්න "මව සමග" වෙනුවට "නංගී සමග" යොදන්න)

19 එකල්හි එක්තරා භික්ෂුවක් පෙර බිරිඳ සමග මෛථුන ධර්මය සේවනය කළේය. (මෙහි 1 (ii) (iii) )

20 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් නැමෙන පිටක් ඇත්තේය. හෙතෙම නොඇලීමෙන් යුක්තවූයේ තමාගේ රහසග කටින් ගත්තේය. ඔහුට සැකයක් විය. "මහණ ඔබ පාරාජිකා ඇවතට පැමුණුනෙහිය."

21 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් එල්ලෙන පුරුෂ නිමිති ඇත්තේවිය. හෙතෙම නොඇලීමෙන් පෙළෙන තමාගේ රහස් අවයවය මල මාර්ගයෙහි ඇතුල් කළේය. ඔහුට සැකයක්විය. "මහණ, ඔබ පාරාජිකාවට පැමුණුනෙහිය"

22 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ශරීරයක් දුටුවේය. ඒ ශරීරයෙහි ස්ත්‍රී නිමිත්ත සමීපයෙහි වණයක් විය. හෙතෙම 'මෙසේ මම ඇවැත් නොවන්නේයයි' නිමිත්තෙහි නිමිත්ත ඇතුල්කරවා වණයෙන් පිට කළේය. ඔහුට සැකයක් විය. "මහණ, තෝ පාරාජිකා ඇවතට පැමුණුනෙහිය."

23 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ශරීරයක් දුටුවේය. ඒ ශරීරයෙහි අඞ්ගජාතය ලඟ වණයක් විය. හෙතෙම 'මම මෙසේ ඇවැත් නොවන්නේයයි' වණයෙන් පුරුෂ අවයවය යවා නිමිත්තෙන් එළියට ගත්තේය ඔහුට සැකයක් ඇතිවිය. "මහණ, ඔබ පාරාජිකා ඇවිතට පැමුණුනෙහිය.

24 "ඒකාලයෙහි වනාහි එක්තරා භික්ෂුවක් කාමයෙහි ගිජුවූයේ ඇඳ චිත්‍රයක නිමිත්ත පුරුෂ නිමිත්තෙන් තද කොළේය. ඔහුට සැකයක් පහළවිය. "මහණ පාරාජිකා ඇවත නොවේ දුකුලා ඇවැත්වේ."

25 ඒ කාලයෙහි වනාහි එක්තරා භික්ෂුවක් කාමයෙහි ගිජුවූයේ ලී බෝනික්කෙකුගේ රහස් අවයවය පුරුෂ නිමිත්තෙන් ස්පර්ශ කළේය. ඔහුට සැකයක් ඇතිවිය. "මහණ, පාරාජිකා ඇවැත නොවේ. දුකුලා නම් ඇවැත් වේ."

26 ඒ කාලයෙහි වනාහි සුන්දර නම් භික්ෂුවක් රජගහ නුවරින් පැවිදිවූයේ වීථියෙහි යයි. එක්තරා ස්ත්‍රියක් "ස්වාමීනී, මොහොතක් නවතින්න. වඳින්නෙමියි කීමය. ඕ තොමෝ වඳිමින් අඳනය ඔසවා කටින් පුරුෂ නිමිත්ත අල්වා ගත්තාය. ඔහුට සැකයක් විය. "මහණ, තොප ඉවසුයෙහිද?" "භාග්‍යවතුන් වහන්ස, මම නොඉවසුයෙමියි." කීවේය. "මහණ, නොඉවසන්නාට ඇවැත් නොවේ "

27 එකල්හි වනාහි එක්තරා ස්ත්‍රියක් භික්ෂුවක් දැක "ස්වාමීනි, එනු මැනව මෛථුන ධර්ම සේවනය කරන්නැයි කීමය." "නැගිනිය, නොහැක. එය අකැපයයි කීවේය." "ස්වාමීනි, එනුමැනව මම ක්‍රියා කරන්නෙමි. ඔබ ක්‍රියා නො කරන්න. මෙසේ ඔබට ඇවැත් නැතැයි" කීවාය. ඒ මහණ එසේ කළේය. ඔහුට සැකයක් පහළවිය. "මහණ, ඔබ පාරාජිකා ආපත්තියට පැමිණුනෙහිය."

28 (27 වෙනි ඡේදයේ "කරන්නෙමි" යන්නට "නො කරන්නෙමි." කියාද "නොකරන්න" යන්නට "කරන්න" කියාද වෙනස් කර යොදාගතයුතු.)

29 (27 ඡේදයේ "මම ක්‍රියා කරන්නෙමි. ඔබ ක්‍රියා නොකරන්න " යන්නට "ඇතුළේ හප්පා පිටත පිට කරන්න " කියා වෙනස්කර යොදාගතයුතුයි.)

30 (27 වෙනි ඡේදයේ "මම ක්‍රියා කරන්නෙමි. ඔබ ක්‍රියා නොකරන්න." යන්නට "පිටත හප්පා ඇතුළේ පිට කරන්න " කියා වෙනස්කර යොදාගතයුතුයි.

31 ඒ කාලයෙහි වනාහි එක්තරා භික්ෂුවක් සොහොනට ගොස් නොදිරූ ශරීරයක් දැක එට මෛථුන ධර්මයෙහි හැසුරුණේය ඔහුට සැකයක් විය. "මහණ, ඔබ පාරාජිකා ඇවැතට අසුවූයෙහිය."

32 (31 සොඳන්න. "නොදිරූ" යන්න "බොහෝසේ නොදිරූ" කියා මේතාක්කර සොඳගත යුතුයි )

33 (31 සොඳන්න. "නොදිරූ" යන්නට "බොහෝසේ දිරූ" කියා මේතාක්කර සොඳගතයුතුයි )

34 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් සොහොනට ගොස් හිස සිඳුන මළකඳක් දැක වස්ත්‍රයෙන් වැසූ තමෙහි රහස් අවයවය ස්පර්ශ කරමින් ඇතුල් කෙළේය. ඔහුට සැකයක් ඇතිවිය. "මහණ, ඔබ පාරාජිකා ඇවතට පැමිණුනෙහිය."

35 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් සොහොනට ගොස් සිඳුනු හිසක් දැක වස්ත්‍රයකින් වැසූතමෙහි පුරුෂ නිමිති ස්පර්ශ නොකර ඇතුල් කෙළේය. ඔහුට සැකයක් පහළවිය. "මහණ, පාරාජිකා ඇවත නොවේ. දුකුලා නම් ඇවැත්වේ;

36 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් එක්තරා ස්ත්‍රියක් සමග ඇලුම සහගතසිත් ඇත්තේවේ. ඕ තොමෝ කළුරිය කළාය. සොහොනෙහි දමන ලද්දීය. ඇට විසුරුණාහු වෙත් ඉක්බිති ඒ මහණතෙම සොහොනට ගොස් ඇට එකතුකොට පුරුෂ නිමිත්තෙන් ස්ත්‍රී අවයවය පිළිවෙළ කෙළේය ඔහුට සැකයක් විය. "මහණ, ඔබට පාරාජිකා ආපත්තිය නොවේ. දුකුලා නම් ඇවතවේ."

37 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් නාගමාණවිකාවක් සමග මෛථුන ධර්මය සේවනය කෙළේය. ඔහුට සැකයක් පහළවිය. "මහණ, ඔබ පාරාජිකා ඇවතට අනුවූයේය."

38 (37 සොඳන්න. "නාගමාණවිකාවක්" යන්නට "යක්ෂණියක්" කියා මේතාක්කර සොඳගත යුතුයි.)

39 (37 සොඳන්න. "නාගමාණවිකාවක්" යන්නට "ප්‍රේතියක්" කියා මෙසේ කරන්න.)

40 (37 සොඳන්න. "නාගමාණවිකාවක්" යන්නට "නපුංසකයෙකු" කියා මෙසේ කරන්න.)

41 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් නසනලද ඉඳුරන් ඇත්තේ විය. හෙතෙම "මම සැපක් හෝ දුකක් හෝ නොදනිමි මට ඇවැත් නොවන්නේයයි" මෛථුන ධර්මයෙහි හැසුරුණේය. භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය දන්වූවාහුය "මහණෙනි, ඒ හිස් පුරුෂයා දත්තේ හෝ නොදත්තේ හෝ පාරාජිකා ඇවැතට පැමිණුණේය."

42 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ස්ත්‍රියකට මෛථුන ධර්මයෙහි හැසිරෙමියි ස්පර්ශකළ කෙණෙහි පසුතැවිලි විය. ඔහුට සැකයක් පහළවිය. "මහණ, පාරාජිකා ඇවත නොවේ. සංඝාදිසෙස ඇවතවේ"

43 (i) එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් භද්දිය රට ජාතිය වනයෙහි දවල් වාසය පිණිස ගොස් වැද හොත්තේවේ. ඔහුගේ අවයව වාතයෙන් තදවූයේ වේ. එක්තරා ස්ත්‍රියක් දැක පුරුෂ නිමිත්තෙහි හිඳගෙන කැමතිතාක් උපක්‍රම කොට ගියාය. භික්ෂූහු තෙත්වීම දැක භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළහ. (ii) "මහණෙනි, කරුණු පසකින් රහස් අවයවය කම්හ්‍ය වෙයි. ආශාවෙන්ද, මලතිසාද, මූත්‍රතිසාද, වාතයෙන්ද, කුඹා දලඹු වර්ගයේ සතුන් දෂ්ට කිරීමෙන්ද යන මෙයිනි. මහණෙනි, මේ ආකාරපසින් පුරුෂ නිමිත්ත කම්හ්‍ය වේ. යම් හෙයකින් මේ භික්ෂුවගේ ලිඬගය කම්හ්‍ය වේද, මහණෙනි, ඒව හෙතු නැත. අවකාශ නැත. මහණෙනි, හෙතෙම රහත් භික්ෂුවයි. මහණෙනි, ඒ භික්ෂුවට ඇවැත් නැත.

44 (i) එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් සැවැත් නුවර අන්ධ වනයෙහි දවල් වාසයට ගියේ වැද හොත්තේවේ. (ii) එක්තරා ගොපලු ස්ත්‍රියක් දැක (iii) ලිඬගයෙහි වාඩි වූවාය. ඒ මහණතෙම ඇතුල්කිරීම ඉවසුවේය ඇතුල්වීම ඉවසුවේය. තිබීම ඉවසුවේය, ගැනීම ඉවසුවේය. ඔහුට සැකයක් විය "මහණ ඔබ පාරාජිකා ඇවතට පැමිණුනෙහිය.

45 (මෙහි 44 (i) යොදන්න) එක්තරා එළුවන් රකින්නියක් දැක (මෙහි 44, (iii) )

46 (මෙහි 44 (i) සොයන්න) දරගෙනෙන්නියක් දැක, (මෙහි 44 (iii) )

47 (මෙහි 44 (i) සොයන්න) ගොම්ගෙනෙන්නියක් දැක (මෙහි 44 (iii) )

48 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් විශාලා නුවර මහාවනයෙහි දවල් වාසයට ගියේ වැද හොත්තේ විය. එක්තරා ස්ත්‍රියක් දැක ලිංගයෙහි හිඳ ඇතිතාක් උපක්‍රම කොට කිව්වුව සිනාසෙමින් සිටියාය. ඒ මහණතෙම පිබිදී ඒ ස්ත්‍රියට "මේ වැඩේ කළේ ඔබදැයි" ඇසීය. "එසේය, මාගේ වැඩක්යයි" කීවාය. ඔහුට සැක සිතුනේය. (භාග්‍යවතුන් වහන්සේට මේ දැන්වීය.) "මහණ, ඔබ ඉවසුවෙහිදැයි" ඇසූසේක. "භාග්‍යවතුන්වහන්ස, මම නොදැනිමි." "මහණ, නොදන්නාහට ඇවැත් නැත."

49 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් විශාලා නුවර මහා වනයෙහි දවල් වාසයට ගියේ ගසකට හේත්තුවී වැද හොත්තේවී. එක්තරා ස්ත්‍රියක් දැක ලිංගයෙහි වාඩිවූවාය. ඒ මහණ වහා නැගිට්ටේය. ඔහුට සැකයක් විය. (ii) "මහණ, ඔබ ඉවසුවෙහිද?" "භාග්‍යවතුන් වහන්ස, මම නොඉවසුයෙමි" "මහණ නොඉවසන්නාට ඇවැත් නැතැයි" වදාළේය.

50 (මෙහි 49 සොයන්න. "වහා නැගිට්ටේය." යන්නට "පෑගී මැටුණේය." කියා වෙනස් කර යොදා ගතයුතුයි.)

51 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් විශාලා නුවර මහා වනයෙහි කූටාගාර ශාලාවෙහි දවල් වාසය කිරීමට පැමිණියේ, දොරහැර වැද හොත්තේවේ. ඔහුගේ අඟම වාතයෙන් තදවූවාහුමෙන්. එකල්හි වනාහි විහාරය බලන බොහෝ ස්ත්‍රීහු සුවඳද මල්ද රැගෙන විහාරයට ගියෝය. ඉක්බිති ඒ ස්ත්‍රීහු ඒ භික්ෂුව දැක ලිංගයෙහි වාඩිවී ඇතිතාක් උපක්‍රමයෙන් ඒකාන්තයෙන් මේ තෙමේ උතුම් පුරුෂ-යෙකැයි කියා සුවඳද මල්ද පවමා ගියාහුය. භික්ෂූහු තෙත් වූමහු දැක භාග්‍යවතුන් වහන්සේට මේ සැලකලාහුය. (මෙහි 49 (ii) සොයන්න) මහණෙනි, දවල් නිදන්නහු විසින් දොර වසා නිදන්නට කියමි."

52 එකල්හි වනාහි භරුකච්ඡ දේශවාසී එක්තරා භික්ෂුවක් සිහිනෙන් පෙර බිරිඳව මෛථුන ධම්යෙහි හැසිර මම ශ්‍රමණයෙක් නොවෙමි. සිවුරු හරින්නෙමියි. භරුකච්ඡ රටට යන්නේ, අතරමග ආයුෂ්මත් උපාලි තෙරුන් දුටු මේ කාරණය සැලකළේය. ආයුෂ්මත් උපාලි තෙමේ "ඇවැත්නි, සිහිනෙන් ඇවැත් නැතැයි කීයේය."

53 එකල්හි වනාහි රජගහනුවර සුපබ්බා නම් උපාසිකාවක් හිස් ශ්‍රද්ධාවන්තියක් වෙයි. (ii) ඕ තොමෝ යමෙක් මෛථුන ධම්ය දේද ඕ තොමෝ අග්‍රදානය දෙන්නීයයි, මෙබඳු දෘෂ්ටියක් ඇත්තී වෙයි. ඕ තොමෝ භික්ෂුවක් දුටු "ස්වාමීනි, වඩින්න. මෛථුන ධම්ය සේවනය කරන්නැයි" කීවාය. "නැගණිය, නොසුදුසුය. මෙය නැපහැසැයි" කීයේය. (iii) "ස්වාමීනි, වඩිනුමැනව. දෙකලවා අතරෙහි ගටන්න මෙසේ ඔබට ඇවැත් නොවන්නේයයි" කීවාය. ඒ භික්ෂුව එසේ කළේය. ඔහුට සැකයක් පහළවිය. "මහණ, පාරාජිකා ඇවත නොවේ, සංඝාදිසෙසස ඇවතවේ."

54 53, i, ii, හා iii දෙකලවා අතරෙහි යන්නට බුරියෙහි (මෙහි 53 (ii) සොදන්න) "බුරිය" යන්නට "බඩේ" කියා වෙනස්කර යොදාගන්න.)

55 (මෙහි 54 "බුරියේ" වෙනුව "කිහිල්ලේ" යොදන්න)

56 (මෙහි 54 "බුරියෙහි" වෙනුවට "බෙල්ලෙහි" යොදන්න.)

57 (මෙහි 54 "බුරියෙහි" වෙනුවට "කන් සිදුරෙහි" යොදන්න.)

58 (මෙහි 54 "බුරියෙහි" වෙනුවට "කෙස් මැටියෙහි" යොදන්න )

59 (මෙහි 54 "බුරියෙහි" වෙනුවට "ඇඟිලි අතරෙහි" යොදන්න.)

60 (මෙහි 54 රජගහ යන්නට සැවැත් කියාද, සුපබ්බා වෙනුවට සඩා කියාද, බුරියෙහි යන්නට කලවා අතරෙහි කියාද වෙනස්කර යොදාගත යුතුය.)

61 (මෙහි 59 රජගහ, පුබ්බාබුරියෙහි සහ ඇතැම් ශැමැත්, කඩා, අතින් උපක්‍රමයෙන් මුදවන්නෙමි කියා වෙනස්කර සොදගත යුතුයි.)

62 එකල්හි වනාහි විශාලා නුවර ලිච්ඡවි කුමාරයෝ භික්ෂුවක් ගෙන භික්ෂුණියකට මැරදීදමූවාහුය. දෙදෙනාම ඉවසූහ. දෙදෙනාම නැසිය (පැරදිය) යුතුය. දෙදෙනාම නො ඉවසූවාහු දෙදෙනාටම ඇවැත් නැත.

63 (මෙහි 62 "භික්ෂුණියකට" වෙනුවට "ශික්ෂමාණියකට" සොදන්න.)

64 (මෙහි 62 "භික්ෂුණියකට" වෙනුවට "සාමණේරියකට" සොදන්න.)

65 (මෙහි 62 "භික්ෂුණියකට" වෙනුවට "වේශ්‍යාවකට" "නපුංසකයෙකුට" "ගෘහිණියකට" කියා වෙනස්කර සොදගත යුතුයි.)

66 (62 මෙහි "භික්ෂුණියකට" යන්න වෙනුවට "භික්ෂු එක් ගෙණ ඔවුනොවුන්" කියා වෙනස්කරගත යුතුයි.)

67 එකල්හි වනාහි එක්තරා මහළු පැවිදි භික්ෂුවක් පෙර බිරිඳ දක්නට ගියේය. ඕ තොමෝ "ස්වාමීනි, එන්න සිවුරු හරින්නැයි අල්වාගත්තීය. ඒ භික්ෂුව ආපසු එන්නේ උඩු කුරුව වැටුණේය. ඕ තොමෝ මතුවී ලිඟයෙහි හිඳිමිය. ඔහුට සැකයක් පහළ විය. (මෙහි 49 (ii) සොදන්න)

68 එකල් වනාහි එක්තරා භික්ෂුවක් කැළේ වාසය කරයි. මුව පැටවෙක් උන්මිහන්ගේ මුත්‍රාකරණ තැනට විත් මුත්‍ර බොන්නේ ලිඟය කටින් බැහැගත්තේය. ඒ භික්ෂුව ඉවසුවේය. ඔහුට සැකයක් විය. භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ ප්‍රකාශ කරළීය. "මහණ, ඔබ පාරාජිකා ඇවතට පැමුණුනේය."

(ප්‍රථම පාරාජිකාව නිමි.)

## 6 අදත්තාදාන පාරාජික ශික්ෂාපදය

1 එකල්හි වනාහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ රජගහ නුවර ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කරණ සේක. එකල්හි වනාහි සහළුවූ භක්තිමත්වූ බොහෝ භික්ෂූහු ඉසිගිලි පර්වත පාර්ශ්වයෙහි තණකොළ ශාඛාවලින් පැල් සාදා වස් වැසුවාහුය. කුඹල් කරුවෙකුගේ පුත්‍රවූ ආයුෂ්මත් ධනිය තෙමේද තණ පැලක් සාදා වස් විසුයේය. ඉක්බිති වස් විසූ ඒ භික්ෂූහු තුන්මස් ඇවෑමෙන් තණ පැල් කඩාදමා තණද ලීද තැන්පත් කොට තබා තැනින් තැන ඇවිදීමට ගියාහුය. කුඹල්කරුවෙකුගේ පුත්‍රවූ ආයුෂ්මත් ධනිය තෙමේද එහිම වස් විසුයේය. හිම වැටෙන කාලයේද ග්‍රීෂ්ම කාලයේද එහිම විය. (ii) කුඹල්කරු පුත්‍රවූ ආයුෂ්මත් ධනිය ගමට පිඬු පිණිස වැඩියේ තණකොළ ගෙනෙන, දර ගෙනෙන ස්ත්‍රීහු තණ පැල බිඳ තණද ලීද ගෙනගියාහුය. (iii) දෙවනුවත් කුම්භකාර පුත්‍රවූ ආයුෂ්මත් ධනිය තෙමේ තණද ලීද එකතු කොට තණ පැලක් සෑදුවේය. දෙවනුවත් (මෙහි (ii) තුන්වෙනුවත් කුම්භකාර පුත්‍රවූ ආයුෂ්මත් ධනිය තෙමේ තණද ලීද එකතුකොට තණ පැලක් සෑදුවේය. තුන්වෙනුවත් (මෙහි (ii)

2 ඉක්බිති කුම්භකාර පුත්‍රවූ ආයුෂ්මත් ධනියට මෙබඳු සිතක් විය. 'තණ අදින දර අදින ස්ත්‍රීහු තුන්වේනි වරත් මගේ තණපැල කඩා තණද ලීද ගෙනගියාහුය. මම වනාහි මනාසේ උගත් ස්වකීය ආචාර්යයන්ගේ කුම්භකාර කර්මයෙහි පිරිසිදු උගත් ශිල්ප ඇත්තේනම් මම මැටි පාගා මැටියෙන් කළ පැලක් කරන්නේනම් නම් යෙහෙකැයි' සිතුවේය. ඉක්බිති කුම්භකාර පුත්‍රවූ ආයුෂ්මත් ධනිය තෙමේ තෙමේම මැටි පාගා මැටියෙන්ම කළ කාමරයක් කොට තණද දරද ගොමද එකතුකොට ඒ කාමරය පිලිස්සුවේය. ඒ කාමරය ලස්සනද දැකීමට ප්‍රිය, සතුට, උපදවන, රතුපාට වූවක් විය. ඉඳුගොවුවන් යම්සේද එබඳුය. කිංකිණී යන ශබ්දය යම්සේද ඒ කුටියේ ශබ්දය එසේවිය.

3 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බොහෝ භික්ෂූන් සමග ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ ලක්ෂණ' දැක්මට ප්‍රිය, සතුටු උපදවන, රතුපාට ඒ කාමරය දැක්සේක. දැක භික්ෂූන්ට කථා කළ සේක "මහණෙනි, ලක්ෂණ, දැකීමට ප්‍රිය සතුටු උපදවන රතුපාට ඉඳුගොවුමන්පාට ඇති අර කුමක්ද? ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැළ කළාහුය. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ නින්දා කළ සේක "මහණෙනි, ඒ හිස් පුරුෂයාට නොගැලපෙන, නොසුදුසු ශ්‍රමණ භාවයට අනුගත නොවන අකැප නොකට යුතු නුසුදුස්සකි. මහණෙනි, කෙසේ නම් ඒ හිස් මිනිසා මැටියෙන්ම කළ කාමරයක් කරන්නේද? කෙසේ නම් ඒ හිස් පුරුෂයාට සතුන් කෙරෙහි දයාවක් අනුකම්පාවක් නොමෙනෙසීමක් වන්නේද? මහණෙනි, යව් ඒ කාමරය කඩව්, මතු පරම්පරාව සතුන් කෙරෙහි විපතකට නොපැමිණේවා. මහණෙනි, සියල්ල මැටිවූ කාමරයක් නොකටයුතුයි. යමෙක් කරන්නේ නම් දුකුලා ඇවැත් වේ". 'ස්වාමීනි, එසේ යැයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට පිළිතුරුදී ඒ කාමරය යම් තැනෙක්හිද, එහි පැමිණියාහුය. පැමිණ, ඒ කාමරය කැඩුවාහුය. ඉක්බිති කුඹල්කරු පුත්‍රවූ ආයුෂ්මත් ධනිය, ඒ භික්ෂූන්ට "ඇවැත්නි, කුමක් නිසා තෙපි මාගේ කාමරය කැඩුවාහුදැයි" ඇසුයේය. "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ කැඩෙව් සේක" "ඇවැත්නි, ඉදින් ධර්ම ස්වාමී තෙමේ කඩවයි නම් කඩවියයි" කීයේය.

4 ඉක්බිති කුම්භකාර පුත්‍රවූ ආයුෂ්මත් ධනියට මේ සිත විය (ii) ගමට වැඩ පිණිස ගිය මාගේ කුටිය තුන් වෙනි වර දක්වා තණ ගෙනෙන්නියෝ දර ගෙනෙන්නියෝ කඩා දමා තණද දරද ගෙන ගියාහුය. මා විසින් සියල්ලෙන් මැටිවූ කාමරයක් කරණ ලද්දේමද, එයද භාග්‍යවතුන් වහන්සේ විසින් කඩා දම්මවන ලදී. (iii) ලී වඩුවෙකි මාගේ මිත්‍රවූ ගණන් ලියන්නෙක් ඇත. මම ලී වඩුවෙකි ගණන් ලියන්නාගෙන් ලී ඉල්වා ලෑලි ගෙන කාමරයක් කරන්නෙම් නම් යහපතැයි' සිතීය. ඉක්බිති කුම්භකාර පුත්‍රවූ ආයුෂ්මත්

ධනිය තෙමේ ලී මඬුවෙහි ගණන් ලියන්නා යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ, ලී මඬුවෙහි ගණන් ලියන්නාට මෙසේ කීවේය." ඇවැත්නි, (මෙහි (ii) මට ලී දෙන්න. ලැලි ගැසූ කාමරයක් සාදාගන්නට වුවමනායයි" කීයේය. "මම ආයුෂ්මතුන්වහන්සේට සම්බන්ධ ලී දෙන්නෙම් නම්, එබඳු ලී මා ලඟ නැත. ස්වාමීනි, නුවර කැඩුම් බිඳුම් සෑදීමට හදිසි අවස්ථාවට ගැනීමට තැබූ ලී ඇත්තේය. ඉදින් ඒවා රජ තෙමේ දෙන්නේ නම් ගෙන්වාගන්න, ස්වාමීනි"යි කීවේය. "ඇවැත්නි, රජු විසින් දෙනලදී."

5 ඉක්බිති ලී මඬුවෙහි ගණන් තබන්නා මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ ධර්මචාරීය සමව හැසිරෙන්නෝය බ්‍රහ්මචාරීය, ඇත්ත කියන්නෝය, සිල්වත්ය, යහපත්ය, රජුද මොවුන්ට පැහැදුණේය. නොදෙන ලද්දක් දුන්නේයයි කියන්නට නොසුදුසුයයි" සිතා කුම්භකාර පුත්‍රවූ ආයුෂ්මත් ධනියට, "ස්වාමීනි ගෙනයව්යයි" කීවේය.

ඉක්බිති කුම්භකාර පුත්‍රවූ ආයුෂ්මත් ධනිය ඒ ලී කෑලිවලට කප්පවා කරත්තයකින් පිටත් කරවා ලී බිත්ති යොදා කාමරයක් සෑදුවේය

6 ඉක්බිති මගධ රටේ මහාමාත්‍ය වස්සකාර බ්‍රාහ්මණ තෙමේ රජගහනුවර කම්මාන්ත කරමින් ලඟින් යන්නේ ලීමඬුවෙහි ගණන් තබන්නා යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ලී මඬුවෙහි ගණන් තබන්නාට, "එම්බා ගණකය, නුවර ප්‍රතිසංස්කරණය පිණිස හදිසියක් පිණිස තැබූ යම් ඒ රජුට අයත් ලී වෙත්ද, ඒ ලී කොහිදැයි" ඇසීය. "ස්වාමීනි, ඒ ලී රජු විසින් කුඹල්කරුගේ පුත්‍රවූ ධනිය, ආයුෂ්මතුන්ට දෙන ලද්දේයයි" කීයේය.

7 ඉක්බිති මගධ මහාමාත්‍ය වස්සකාර තෙමේ නොසතුටු විය. රජු නුවර ප්‍රතිසංස්කරණය සඳහා හදිසියකට තැබූ රජුට අයත් ලී කෙසේ නම් කුම්භකාර පුත්‍රවූ ධනියට දෙන්නේද? ඉක්බිති මගධ මහාමාත්‍යවූ වස්සකාර බ්‍රාහ්මණ තෙමේ මගධ රට සෙනිය බිම්බිසාර රජු යම්

තැනෙකත්හිද එහි පැමිණියේය. පැමිණ, මගධ රජ සේනිය බිම්බිසාර රජුට "දෙවයන් වහන්ස, රජු විසින් නුවර ප්‍රතිසංස්කරණය පිණිස හදිසියකට ගැනීම පිණිස තබන ලද ලී කුම්භකාර පුත්‍රවූ ධනියට දුන්නේය යනු ඇත්තද?" "කවරෙක් මෙසේ කීයේද?" "රජතුමනි, ලී මඩුවෙහි ගණන් තබන්නායයි" කීයේය. "එමුණ, එසේ වී නම් ලී මඩුවෙහි ගණන් තබන්නා ගෙන්නවයි" කීයේය. ඉක්බිති මගධ මහාමාත්‍යවූ වස්සකාරතෙමේ ලී මඩුවෙහි ගණන් තබන්නා මාංචු ලෑමට අණ කෙළේය. ආයුෂ්මත් කුම්භකාර පුත්‍ර ධනිය තෙමේ බැඳගෙන යන්නාවූ ලී මඩුවෙහි ගණන් තබන්නා දැක ලී මඩුවෙහි ගණන් තබන්නාට "ඇවැත්නි, ඔබ කුමක් නිසා බැඳගෙන යන්නේදැයි" ඇසීය. "ස්වාමීනි, ඔවුන්ගේ ලී නිසායි" කීයේය. "ඇවැත්නි, යන්න මමත් එන්නෙමියි කීයේය." "ස්වාමීනි, මා මරන්නට පෙර එනු මැනවයි" කීයේය.

8 ඉක්බිති කුඹල් කරුගේ පුත්‍රවූ ආයුෂ්මත් ධනිය තෙමේ මගධ රජ සේනිය බිම්බිසාර රජුගේ රජගෙය යම් තැනෙකත්හිද එහි පැමිණියේය. පැමිණ, පැනවූ අස්නෙහි වැඩහුන් සේක. ඉක්බිති මගධ රජ සේනිය බිම්බිසාර රජ කුඹල්කරු පුත්‍ර ධනිය යම් තැනෙකත්හිද එහි පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් කුම්භකාර පුත්‍ර ධනියට වැඳ එකත් පසෙක සිටියේය. එකත් පසෙක සිටි මගධ රජ සේනිය බිම්බිසාර රජ කුම්භකාර පුත්‍ර ආයුෂ්මත් ධනියට, 'ස්වාමීනි, නුවර ප්‍රතිසංස්කාරණයට හදිසියක් පිණිස තබන ලද රජුගේ ලී ආයුෂ්මතුන් වහන්සේට දුන්නේය, යනු ඇත්ත දැයි" ඇසීය. "මහරජ, එසේය."

9 'ස්වාමීනි, අපි වනාහි රජවරු වෙමු. බොහෝ වැඩ බොහෝ කටයුතු ඇත්තෝය. දුන් දේද සිහි තබා නොගනිමු. ස්වාමීනි, එසේ නම් සිහි කරන්නැයි" කීවේය "මහරජ, අභිෂෙක කළ මුල් කාලයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට තණ, දර, දිය දෙන ලදී. ගනිත්වායි දුන්නෙමි යයි මෙබඳු වචනයක් කීවා, සිහි කරන්නෙහිද?" "ස්වාමීනි

මම සිහිකරමි ලජ්ජා ඇති සැක ඇතිකරණ, ශික්ෂාකාමී, ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහ. ඔවුන්ට ස්වල්ප මාත්‍රවූ කුකුසක් උපදින්නේය. මා විසින් ඒ සඳහා කියන ලදී. එයද කැලේ අයිතියක් නැත්තෙකු ගැනය, ස්වාමීනි, ඔබ ඒ ස්වල්පයෙන් සුදුස් ලී ගෙනයන්ට සිතූ සේකිය. මා ඇත තොප රටේ වාසය කරණ ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ සොරස් නම් මරන්නෝද, බඳින්නෝද, පිටුවහල් කරන්නෝද? ස්වාමිනි, සත්‍ය. නැවතද මෙබන්දක් නො කරාවායි'' කීයේය.

10 මනුෂ්‍යයෝ නොසතුටු වචන කියති. දොස් නගති. අවකම්බු කරත් මේ ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ පවට බිය නැත. දුශ්ශීලය, බොරු කියන්නෝය. මොවුන් වනාහි 'ධර්මයෙහි හැසිරෙන්නාහුය, සමව හැසිරෙන්නාහ බ්‍රහ්මචාරීය ඇත්ත කියන්නාහු සිල්වත්ය යහපත්යයි' ප්‍රතිඥා කරත්, මොවුන්ට ශ්‍රමණ භාවයක් නැත. මොවුන්ට බ්‍රහ්ම බවක් නැත. මොවුන්ගේ ශ්‍රමණ භාවය නැති විය. මොවුන්ගේ බ්‍රහ්මභාවය නැතිවිය. මොවුන්ට ශ්‍රමණභාවයක් කොයින්ද? මොවුන්ට බ්‍රහ්මභාවයක් කොයින්ද? මොවුන් ශ්‍රමණ භාවයෙන් පහවූවාහුය. මොවුන් බ්‍රහ්ම භාවයෙන් පහවූවාහුය. මොවුහු රජුන්ද වංචාකරත්, අනික් මිනිසුන් ගැන කියනුම කවරේද? භික්ෂූහු නොසතුටු බස් කියන්නාවූ දොස් නගන්නාවූ අසතුට ප්‍රකාශ කරන්නාවූ මිනිසුන්ගේ වචන ඇසූහුය. යම් ඒ භික්ෂු කෙනෙක් අල්පේච්ඡවූවාහුද, ලද දෙයින් සතුටුවූවාහුද සිල්වත්ද, සැක ඇත්තාහුද, හික්මෙනු කැමැත්තාහුද, ඔව්හු නොසතුටු බස් කියත්. දොස් නගත්, විරුඬ වචන කියත්, අසතුට ප්‍රකාශ කරත්. කුම්භකාර පුත්‍රවූ ආයුෂ්මත් ධනිය කෙසේ නම් රජහුගේ නොදුන් ලී ගන්නේද' කියායි ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය ප්‍රකාශ කළාහුය.

11 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ සිද්ධියෙහි භික්ෂුසංඝයා රැස්කරවා කුම්භකාර පුත්‍රවූ ආයුෂ්මත්

ධනිය අතින් 'ධනිය, ඔබ රජුගේ නුදුන් ලී ගත්තේ ඇත්ත දැයි" ඇසූසේක. "භාග්‍යවතුන්වහන්ස, ඇත්තය." භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළේය "හිස් පුරුෂය, නොසුදුසු නොගැලපෙන ශ්‍රමණභාවයට නොඅයත් අකැප නොකටයුත්තක් කරණලදී. හිස් පුරුෂය, කෙසේ නම් තෙපි නුදුන් රජුගේ ලී ගත්තෙහිද? (ii) හිස් පුරුෂය, මෙය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිස පැහැදුනවුන්ගේ වැඩි පැහැදීම පිණිස නොපිණිවයි. නැවතද, හිස් පුරුෂය, මෙය නොපැහැදුනවුන්ගේ නොපැහැදීම පිණිස පැහැදුනාවූ සමහරුන්ගේ කලකිරීම පිණිස වන්නේයයි' වදාළසේක.

12 එකල්හි වනාහි පැරණි නඩු ඇසූ මහාමාත්‍යයෙක් භික්ෂූන් කෙරෙහි පැවිදිවූයේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි සිටියේ වේ, ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂුව ගෙන් "මහණ, කීයකින් මගධරාජ සේනිය බිම්බිසාර රජ තෙමේ සොරෙකු ගෙන නසයිද, බඳියිද, පිටුවහල් කරයිදැයි" ඇසූසේක. පාදයකින් (භාගවතුකවක් හතරෙන් පංගුවකින්) හෝ පාදයක් වටිනා දෙයකිනිදු (හිරෙයය.) එකල්හි වනාහි රජගහ නුවර පාදයක් මසු පහක් වේ" ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ කුම්භකාර පුත්‍රවූ ආයුෂ්මත් ධනියට නොයෙක් ආකාරයෙන් නින්දා කොට (මෙහි ප්‍රථම පාරාජිකා ශික්ෂාපදයේ සුදින්න බණවරෙහි 31 ඡේදයේ අවසානයේ "නැහැල්ලු නොවූ" යන තැන සිට ඡේදය අවසානයට' යොදන්න )

13 "යම්කිසි භික්ෂුවක් සම්බඳ නුදුන්දෙය ගැනීම් කොට රජවරු සොරෙකු අල්වා සොරෙකි, මෝඩයෙකි, මුළාවූවෙකි, ගත්තෙකැයි මරන්නාහු නම් හෝ බඳින්නාහු නම්, රටින් පිටකරන්නාහු නම්, නුදුන් සොරකම්නැයි කියන ලද්දක් ගනීද, එබඳු නුදුන් දෙයක් ගන්නාවූ මේ මහණ තෙමේද පාරාජිකා වේ. (පැරදුණේය ) අසංවාසය නුසුදුසුය."

භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේද මේ ශික්ෂාපදය පනවන ලද්දේ වේ.

14 එකල්හි වනාහි ඡබ්බග්ගිය භික්ෂූහු රෙදි අපුල්ලන්නන් රෙදි වනන තැනට ගොස් රෙදි පොට්ටනියක් සොරකම් කරගෙන අත්සලට ගෙන ගොස් බෙදූහුය.

භික්ෂූන් වහන්සේලා "ඇවැත්නි, තෙපි මහණින් ඇත්තෝය- තොපට බොහෝ සිවුරු ලැබුණෝයයි" මෙසේ කීවාහුය. "ඇවැත්නි, අපට සිය කොයින්ද? දූන් අපි රෙදි වතනා තැනට ගොස් රෙදි පොට්ටනියක් සොරාගතිමුයි" කීහුය. "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් ශික්ෂාපදය පනවන ලද්දේ නොවේද? ඇවැත්නි, තෙපි කුමක් හෙයින් රෙදි පොට්ටනියක් සොරකම් කරන්නහුදයි" ඇසූහ. "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් ශික්ෂාපද පනවන ලද්දේ ඇත්තේය. එහෙද ගමෙහිය, අරණ්‍යයෙහි නොවේ." "ඇවැත්නි, නොගැලපෙන, නුසුදුසු ශ්‍රමණ භාවයට නොගැලපෙන අකැප නොකටයුත්ත නුසුදුසුය. එය එසේ නොවේද? ඇවැත්නි, කෙසේ නම් තෙපි රෙදිපොට්ටනි සොරකම් කරන්නහුද? ඇවැත්නි, මෙය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිසත් පැහැදුනවුන්ගේ වැඩිපැහැදීම පිණිසත් නොවේ. ඇවැත්නි, තවත නොපැහැදුනවුන්ගේ නොපැහැදීම පිණිස පැහැදුන ඇතැම් කෙනෙකුගේ වෙනස්වීම පිණිස වේ.

15 ඉක්බිති ඒ භික්ෂූහු ඡබ්බග්ගිය භික්ෂූන්ව නොයෙක් ආකාරයෙන් නින්දා කොට භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ සිද්ධියෙහි භික්ෂුසඞ්ඝයා රැස්කරවා, 'මහණෙනි, තෙපි රෙදි වතන තැනට ගොස් රෙදිපොට්ටනියක් ගෙනාවහුයයි කියන්නෙහි ඇත්තදයි'' ඇසීය. "භාග්‍යවතුන්වහන්ස, ඇත්තය.'' භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ නින්දා කළසේක. "හිස් පුරුෂවරුනි, නොගැලපෙන, නුසුදුසු ශ්‍රමණ භාවයට නොගැලපෙන, අකැප නොකටයුත්තක් කළාහුය. හිස් පුරුෂයෙනි, තෙපි කෙසේ නම් රෙදි වතන තැනට ගොස් රෙදි පොට්ටනියක් සොරකම් කළාහුද, හිස් පුරුෂයෙනි, මෙය (මෙහි 11 ඡේදයේ (ii) යෙදෙන්න ) "ඒ භික්ෂුම' වෙනුවට "ඒ භික්ෂූන් යයෙදනාට'' යොදාගත යුතුයි )

"යම්කිසි භික්ෂුවක් ගමින් හෝ අරණ්‍යයෙන් හෝ නුදුන්, සොරකමකැයි කියන ලද්දක් ගනීද, යම්බඳු නුදුන් දෙය ගැනීමකට රජවරු සොරෙකු අල්වා 'සොරෙකි, මෝඩයෙකි,

මුලාවූවෙහි, ගත්තෙහියැයි' මරන්නම් හෝ බඳින්නාහු නම් හෝ රටින් පිටකරන්නාහු නම් එබඳු නුදුන් දෙයක් ගත්තාවූ මේ මහණතෙමේද පාරාජිකා වේ, ආශ්‍රයට නුසුදුසුවේ.

---

# 7 පදභාජනීය

1 (1 පාරාජිකයෙහි සන්ථත බණ වරේ 56. 57 ඡේද සොයන්න.)

2 ''ගමනම්'' එක කුටියක් ඇති ගම, කුටි දෙකක් ඇති ගම කුටි තුනක් ඇති ගම, කුටි සතරක් ඇති ගම, මිනිසුන් සහිත ගම, මිනිසුන් නැති ගම, තාප්පයකින් වටකළ ගම, තාප්පයකින් වට නොකළ ගම තැන් තැන්වල ගෙවල් දෙක තුන කළ ගම යනුයි.

යම්කිසි වෙළඳුන්ගේ කරත්ත සමූහයක් සතර මාසයකට වඩා නැවතී සිටි යම් ගමක් වේද, එයද ගමයයි කියනලැබේ. ගමේ අවට නම් තාප්පයකින් වටකරණ ලද ගමක දොර සවි කරණ කණුව ළඟ සිටි මධ්‍යම පුරුෂයෙකු ගැසූ ගලක් වැටෙන දුර ප්‍රමාණයවේද එය හෝ තාප්පයකින් වට නොකරණලද ගමක අන්තිම ගෙවල් ළඟ සිටි මධ්‍යම පුරුෂයෙකු ගැසූ ගලක් වැටෙන තැනද යනුයි. අරණ්‍යය නම් ගමත් ගම් අවටත් හැර ඉන් එපිට වේ.

3 ''නොදෙන ලද්ද'' නම් යමක් නොදෙන ලද්දේද අත් නොහරින ලද්දේද, පරිත්‍යාග නොකරණ ලද්දේද, රක්නා ලද්දේද, ප්‍රවේසම් කරණ ලද්දේද, මමත්වය කරණ ලද්දේද, අනුන් අයත් වූයේද මෙය නොදුන් දේ නම්.

සොරකමියයි කියන ලද යන අර්ථයෙහි සොර සිතය, ගන්නා සිතය.

''ගන්නේය'' යනු ගන්නේය, ගෙනයන්නේය, යටකොට ගන්නේය, (ගන්නා දෙයක) ඉරියව්ව වෙනස් කරන්නේය, තැනින් තුරන් කරන්නේය, සලකුණ ඉක්මවන්නේය, යම් බඳු යනු පාදයක් හෝ පාදයක් වටිනාකමක් හෝ පාදයට වඩා වටිනාවූ, දේයක් හෝ යනුයි.

4 "රජමරු" නම්, මුළු පෘථිවියෙහි රජය, ප්‍රදෙශ රජය, පළාත් රජය, ගම් රජය, නොහොත් මහාමාත්‍යය, අණ දෙන්නාය, මොවුහු රජමරු නම්.

5 "සොරා" නම් යමෙක් මසු පසක් හෝ මසු පසකට වඩා හෝ වටිනාකම් ඇති නුදුන් දෙයක් සොර සිතින් ගනීද, මේ තෙමේ සොරා නම්.

6 හිංසා කරන්නාහු නම් යමෙක් අතින් හෝ පයින් හෝ කසයෙන් හෝ වේවැලින් හෝ තුණ්හුලස්ම දෙකට පලකළ දණ්ඩකින් හෝ හිංසා කරන්නේය යනුයි.

7 බඳින්නාහු නම් රැහැණින් බැඳීමෙන් හෝ හැකිල්ලෙන් බැඳීමෙන් හෝ ගෙයක සිරකර තැබීමෙන් හෝ නගරයක හෝ ගමක හෝ නියම්ගමක සිරකර තැබීම හෝ පුරුෂයෙකු ආරක්ෂාවට තැබීම හෝ කරන්නාය.

8 "රටින් පිටුවහල් කරන්නාහු" නම් යනු ගමින් හෝ නියම්ගමින් හෝ නුවරින් හෝ ජනපදයෙන් හෝ ජනපද ප්‍රදෙශයෙන් හෝ පිටුවහල් කරන්නේය

9 සොරෙකි, මෝඩයෙකි, මොනාකියා ගත්තෙකැයි මේ අමනාම්බුවකි. එබඳු යන මෙහි පාදයක් හෝ පාදයක් වටිනා දෙයක් හෝ පාදයකට වඩා වටිනා දෙයක් හෝ ගන්නේ යන මෙහි ගනු ලබන්නේ ගෙනයනු ලබන්නේ, සගවාගන්නේ, ඉරියව්ව වෙනස් කරන්නේ, ස්ථානයෙන් දුරුකරන්නේ, සලකුණ ඉක්මවන්නේ, මේ තෙමේ යනු මුල් දෙස ගැන කියනු ලැබේ.

10 "පැරදුනේවේ" යනු යමෙක් නම් ඉදුනු කොළය නැටියෙන් මිදුණේ නිල්බව පිණිස නොසුදුසුද, එසේම මහණ තෙම නුදුන් මසු පසක් හෝ මසු පසක් වටිනා දෙයක් හෝ මසු පසකට වඩා වටිනා දෙයක් හෝ සොරසිතින් ගෙන ශ්‍රමණයෙක් නොවේ. ශාක්‍යපුත්‍රයෙක් නොවේ. එහෙයින් පාරාජිකා වූයේයි කියනු ලැබේ.

11 "ආශ්‍රයට නොසුදුසුවූයේ" යනු ආශ්‍රය නම් එකට කර්ම කිරීම, එකට පොත් කීම, එක සමාන හික්මීම, මේ ආශ්‍රය නම් වේ එය ඔහු සමග නැත්තේයි එහෙයින් ආශ්‍රය නැතැයි කියනු ලැබේ.

12 බිම පිහිටි, ගොඩ පිහිටි, අහස පිහිටි, හිස්තැන පිහිටි, ජලයෙහි පිහිටි, නැවෙහි පිහිටි, වාහනයෙහි පිහිටි, ගෙනයන බරෙහි පිහිටි, ආරාමයෙහි පිහිටි, විහාරයෙහි පිහිටි, කුඹුරෙහි පිහිටි, වත්තෙහි පිහිටි, ගමෙහි පිහිටි, කැලයෙහි පිහිටි, ජලය, දැහැටි කූරු, වෘක්ෂය, ගෙනයනලද්ද, ලඟ තබනලද්ද, තීරුබද්ද නොගෙවීම, ප්‍රාණයක්, පා නැත්තෙක්, ඔත්තුකාරයා, ආරක්ෂකයා, නියම කිරීම, සලකුණ, ඇඟවීම යන මේ පදවල විස්තර දතයුතුය.

13 "බිම පිහිටි" යනු බඩුව බිම තබන ලද්දේ වේ. වළලූවේ වැසුනේ වේ. බිම පිහිටි බඩුවක් සොරකම් කරන්නෙමියි සොරසිතින් ඇත්තේ දෙවැන්නෙකු සොයයිද උදැල්ලක් හෝ කූඩයක් හෝ සොයයි හෝ යයි දුකුළා ඇවැත් වේ. එහිවූ ලියක් හෝ වැලක් හෝ කපයි නම්, දුකුළා ඇවැත් වේ. පස් හාරයි හෝ ඉවත් කරයි හෝ ගොඩ දමයි හෝ දුකුළා වේ. බඩු තිබෙන සැළිය අල්ලයිද දුකුළා වේ. සොලවයිද ථුලසී වේ. තැනින් ඉවත්කරයිද, පාරාජිකා පාපය වේ.

14 තමන්ගේ භාජනයක් ඇතුල් කරවා මසුරන් පසක් හෝ මසු පහකට වඩා හෝ වටිනා දෙයක් සොර සිතින් අල්ලයිද දුකුළා ඇවැත් වේ. සොලවයිද ථුලසී ඇවැත් වේ. තමාගේ භාජනයට හෝ දමාගනීද, මිට හෝ ගලවයිද, පාරාජිකා පාපය වේ. නූලෙහි ඇමුණූ බඩුවක් හෝ ගෙඩියක් හෝ බෙල්ලේ බඳින නූලක් හෝ ඉඟටියෙ බඳින නූලක් හෝ සළුවක් හෝ හිස් වෙළුමක් හෝ සොර සිතින් අල්ලයිද දුකුළා පාපය වේ. සොලවයි, ථුලසී පාපය වේ. කොණින් අල්වාගෙන උඩට ඔසවයි, ථුලසී පාපය වේ ගසමින් බැහැර කරයි. ථුලසී වේ.

15 යමෙක් පිරිසෙයින් තෙලයක් පමණකුදු සැලියේ කටින් ඉස්සුයේද පාරාජිකා වේ. ගිතෙල් හෝ තලතෙල් හෝ, මීපැණි හෝ උක්පැණි හෝ මසුපසක් හෝ මසු පහකට වඩා හෝ වටිනා තෙල් පැණි ආදියක් සොර සිතින් එක් ප්‍රයොගයකින් බොයිද, පාරාජිකාපත්ති වේ. එහිම ඒ භාජනය බිඳිනම් හෝ අත්හරියි හෝ දවයි හෝ පාවිච්චි නොකරයි හෝ දුකුලා පාපය වේ

16 ගොඩ පිහිටි යනු, බඩුමක් ගොඩතබන ලද්දේ වේ. ගොඩ පිහිටි බඩුව සොරකම් කරමියි සොර සිත් ඇත්තේ දෙවැන්නෙක් හෝ සොයයිද, යෙයිද දුකුලා පාපය වේ. ස්පර්ශ කරයිද දුකුලා පාපය වේ සොලවමයි ථුලසි පාපයවේ. තැනින් වෙන්කරයි පාරාජිකා වේ. අහස පිහිටි බඩුවක් නම් අහසට නින්නේවේද, මොණරෙක් හෝ උකුස්සෙක් හෝ වටුවෙක් හෝ සළුවක් හෝ වෙළුමක් හෝ අමුරණක් හෝ කැබෙල්ලක් වැටේද ආකාශයෙහි පිහිටි බඩුව සොරකම් කරන්නෙමියි, සොර සිත් ඇත්තේ දෙවැන්නෙක් සොයා යයි, දුකුලා පාපය වේ. ගමන කරයිද දුකුලා පාපය වේ. අල්ලයිද දුකුලා පාපය වේ. සොලවමයි ථුලසි පාපය වේ. තැනින් තුරන් කරයිද පාරාජිකා වේ.

17 හිස්තැන පිහිටි බඩුමක් යනු, බඩුවක් එලිම්ඝනෙහි තිබුනේ වේද, ඇඳෙහි හෝ පුටුවෙහි හෝ සිවුරු ලියෙහි හෝ සිවුරු මැලෙහි හෝ බිත්ති ඇනයෙහි හෝ නාගදන්තයෙහි හෝ ගසෙහි හෝ එල්ලන ලද්දේ වේද, යටත් පිරිසෙයින් පාත්‍ර පසුම්බියෙහි හෝ ඇති අවකාශ ස්ථානයෙහි පිහිටි බඩුවක් සොරකම් කරමියි සොර සිතින් දෙවැන්නෙක් සොයයිද, යෙයිද, දුකුලා ඇවත වේ. ආමර්ශනය කරයි දුකුලා ඇවැත් වේ. සොලවමයි ථුලසි පාපය වේ. ස්ථානයෙන් පිට කරයි පාරාජිකා ඇවත වේ.

18 ජලයෙහි පිහිටි බඩුවක් ජලයෙහි දමනලද්දේ වේද, ජලයෙහි පිහිටි බඩුවක් සොරකම් කරන්නෙමියි සොර සිතින් දෙවැන්නෙක් හෝ සොයයිද යෙයිද, දුකුලා ඇවැත් වේ. කිමිදෙයි හෝ මිතුවෙයි හෝ දුකුලා ඇවැත් වේ. අල්ලයිද දුකුලා වේ. සොලවමයි ථුලසි වේ තැනින් තොරකරයි පාරාජිකා ඇවත වේ. එහි පහළවූ උපුල් හෝ රත්පියුම් හෝ සුදුපියුම් හෝ නෙළුම් අල හෝ මසුන් හෝ කැසුබුවන් හෝ යන මසු පසක් හෝ මසු පසට වඩා වැඩිය හෝ වටිනාදෙයක් සොරසිතින් අල්ලාද දුකුලා ඇවැත් වේ. සොලවාද ථුලසි වේ. තිබෙන තැනින් වෙන්කොට ගනීද පාරාජිකා වේ.

19 නැව් නම් යමකින් එගොඩ යෙයිද (ii) නැවෙහි තිබුණු බඩුවක් නැවෙහි දමන ලද්දේ වේද, නැවෙහි තිබුණු බඩුවක් සොර සිතින් ගන්නෙමැයි සොර සිත් ඇත්තේ දෙවැන්නෙකු ‘සොයා යයිද, දුකුළා වේ. අල්ලයිද දුකුළා ඇවැත් වේ. සොලවයිද ථුලසි ඇවැත් වේ. තිබුණු තැනින් සොලවයිද පාරාජිකා වේ. නැව ගෙනයමියි සොර සිතින් දෙවැන්නෙකු හෝ සොයයිද යයිද දුකුළා ඇවැත් වේ අල්ලයිද දුකුළා ඇවැත් වේ. සොලවයිද ථුලසි ඇවැත් වේ. බැඳුම ලිහයිද දුකුළා ඇවැත් වේ (iii) බැඳුම ලිහා අල්ලයිද දුකුළා ඇවැත් වේ සොලවයිද ථුලසි ඇවැත් වේ. උඩ හෝ යට හෝ සරස හෝ යටත් පිරිසෙයින් කෙසගක් පමණකුදු සොලවයිද, පාරාජිකාපත්ති වේ.

20 යානය නම් උසුලන වාහනය රථය, කරත්තය දෝලා පැල්ලැක්කියි. වාහනයෙහි (මෙහි 19 (ii) (නැවෙහි) යන්නට ‘වාහනයෙහි’ කියා යොදන්න) මෙතන්තර තැනින් වෙන්කොට ගනීද පාරාජිකා වේ.

21 බර නම් හිසේවූ බරක්, පිටෙහිවූ බරක්, උකුලෙහිවූ බරක්, එල්ලෙන බරක් යනාදියයි. හිසෙහිවූ බරක් සොර සිතින් අල්ලයිද දුකුළා ඇවැත් වේ. සොලවයිද ථුලසි ඇවැත් වේ. උරසාකරවා ගනීද පාරාජිකා ආපත්ති වේ. කරෙහිවූ බර සොර සිතින් අල්ලයිද දුකුළා ඇවැත් වේ. සොලවයිද ථුලසි ඇවැත් වේ ඉනට බාව ගනීද පාරාජිකාපත්ති වේ. ඉනෙහි බර සොරසිතින් අල්ලයිද දුකුළා ඇවැත් වේ. සොලවයිද ථුලසි ඇවැත් වේ. අතින් ගනීද පාරාජිකාපත්ති වේ. අතෙහිවූ බර සොර සිතින් බිමින් ගනීද පාරාජිකාපත්ති වේ.

22 ආරාමය නම් ගෙඩි මල් හටගන්නා ගස් ඇති වතු, ගෙඩි හටගන්නා ගස් ඇති වතු, යනුයි. ආරාමයෙහි පිහිටි බඩු ආරාමයෙහි සතර පැත්තෙන්ම දමන ලද්දේ වේ. බිම පිහිටි ගොඩ පිහිටි, අහසෙහි පිහිටි බඩුවක් සොරසිතින් ගන්නෙමියි සොර සිතින් දෙවැන්නෙකු හෝ සොයයිද යයිද දුකුළා ඇවැත් වේ. අල්වයිද දුකුළා ඇවැත් වේ සොලවයිද ථුලසි

ඇමැත් වේ. තිබූ තැනින් ඈත් කරයිද පාරාජිකා වේ. එහි උපන් මූලක් හෝ පොත්තක් හෝ කොළයක් හෝ මලක් හෝ ගෙඩියක් හෝ මිදු පසක් වටින්නේද, ඊට මිලා හෝ වටින්නේද හොර සිතින් අල්වයිද දුකුලා ඇමැත් වේ. සොලවයිද ථුලසි ඇමැත් වේ තැනින් ඉවත් කරයිද පාරාජිකා වේ. ආරාමය කොට මට අයත් යයි චෝදකරයිද දුකුලා ඇමැත් වේ. අයිතිකාරයාට සැක උපදවයිද ථුලසි ඇමැත් වේ. හිමියා 'මට අයත් නැතැයි' (පසුව) අයිතිය අත්හරියිද පාරාජිකා වේ. නඩු විසඳන්නෝ ස්වාමියා පරදීද පාරාජිකා වේ. නඩුකියන්නෝ තමින් පරදීද ථුලසි වේ.

23 විහාරයෙහි පිහිටි බඩුවක් විහාරයෙහි බිම, ගොඩ, ආකාශයෙහි හෝ අහස යන සතර තැන දමන ලද්දේ වේද, විහාරයෙහි පිහිටි බඩුවක් සොරකම් කරන්නෙමියි සොර සිතින් දෙවැන්නෙකු හෝ සොයයිද යයිද දුකුලා ඇමැත් වේ. අල්වයිද දුකුලා ඇමැත් වේ. සොලවයිද ථුලසි ඇමැත් වේ තිබූ තැනින් සොලවයිද පාරාජිකා වේ. විහාරය නඩු කියයිද දුකුලා ඇමැත් වේ. ස්වාමියාට සැක උපදවාද ථුලසි වේ. හිමියා 'මගේ නොවේයයි' (පසුව) අයිතිය අත්හරීද (අයිතිය නැත් අය) පාරාජිකාපත්තිය වේ. ධර්මයෙහි හැසිරෙන්නෝ (නඩුව) පරදීද ථුලසි ඇමත් වේ.

24 කුඹුර නම් යම් තැනෙක්හි සප්තවිධ ධාන්‍ය හෝ මුං මෑ ආදිය හෝ පහළ වේද, එය කුඹුර නමි. කුඹුරෙහි පිහිටි බඩුවක් කොතැනක අහසේ බිම ගොඩ අවකාශ ස්ථානයෙහි දමන ලද්දේ වේද, කුඹුරෙහි පිහිටි බඩුවක් සොරසිතින් ගන්නෙමියි දෙවැන්නෙකු හෝ සොයා යයිද, දුකුලා ඇමැත් වේ. අල්ලයිද දුකුලා ඇමැත් වේ සොලවයිද ථුලසි ඇමැත් වේ. තැනින් පිට කරවයිද පාරාජිකා ඇවත වේ. එහි උපන් මිදු පසක් හෝ ඊට සමානව වටිනා ධාන්‍ය හෝ මෑ ආදිය හෝ සොර සිතින් අල්ලයිද, දුකුලා ඇමැත් වේ, සොලවයිද ථුලසි ඇමැත් වේ. තැනින් අස් කරයිද, පාරාජිකා වේ. කුඹුරට නඩු කියයිද දුකුලා ඇමැත් වේ. ස්වාමියාට විමති උපදවයිද

ථුලසි ඇවැත්වේ. ස්වාමියා මට නොවේයයි අයිතිය අත්හරිද පාරාජිකාවේ. නඩු කියන්නේ අයිතිකාරයා පරදිද පාරාජිකාපත්ති වේ. ධර්මයෙහි හැසිරෙන්නේ පරදිද ථුලසි ඇවැත්වේ. උලක් හෝ රැහැනක් හෝ වැටක් හෝ සීමා එක් යොදද දුකුලා ඇවැත්වේ. එක් ප්‍රයොගයක් නො ආ කල්හි ථුලසි වේ. ඒ ප්‍රයොගය ආ කල්හි පාරාජිකා ඇවතවේ.

25 ආරාම නම් මල් වත්ත හෝ පත්සල් වත්ත යන දෙකයි. වත්තෙහිවූ බඩුවක් වත්තෙහි බිම හෝ ගොඩ අහසෙහි හෝ අවකාශස්ථානයෙහි යන සතර ස්ථානයෙහි තබන ලද්දේවේ. වත්තෙහිවූ බඩුවක් සොර සිතින් ගන්නෙමියි සොරසිත් ඇත්තේ දෙවැන්නෙක් සොයයිද, යයිද දුකුලා ඇවැත්වේ. අල්වයිද දුකුලා ඇවැත්වේ. සොලවයිද ථුලසිවේ තැනින් අත්හරයිද පාරාජිකාවේ වත්තට නඩු කියයිද දුකුලා ඇවැත්වේ ස්වාමියාට සැක උපදවාද ථුලසි ඇවැත්වේ. අයිතිකරු මට නොවේයයි අයිතිය අත්හරිද, පාරාජිකාවේ නඩු කියන්නේ අයිතිකරු පරදවාද පාරාජිකාවේ. නඩුකියන්නේ පරදිද ථුලසි ඇවැත්වේ. උලක් හෝ මැලක් හෝ වැටක් හෝ ප්‍රාකාරයක් හෝ යොදද දුකුලා ඇවැත්වේ. එක් ප්‍රයෝගයක් නා කල්හි ථුලසි ඇවැත්වේ. ඒ ප්‍රයෝගය ආකල්හි පාරාජිකා ඇවතවේ.

26 ගමෙහි පිහිටි බඩුවක් බිම හෝ ගොඩ හෝ අහසෙහි හෝ අවකාශ ස්ථානයක හෝ තබන ලද්දේ වේද, (ii) ගමෙහිවූ බඩුවක් සොරසිතින් ගන්නෙමියි සොරසිත් ඇත්තේ දෙවැන්නෙක් හෝ සොයයිද යයිද දුකුලා ඇවැත් වේ. අල්වයිද දුකුලා ඇවැත්වේ. සොලවයිද ථුලසි ඇවැත්වේ. තිබූ තැනින් අත්හරයිද පාරාජිකා වේ.

27 කැලෑව නම් යමක් මිනිසුන් විසින් අයිතිකර ගන්නා ලද්දේවේද, එය කැලෑව නම් වේ කැලයෙහි තිබුණු බඩුවක් කැලෑවෙහි බිම හෝ ගොඩ හෝ අහසෙහි හෝ අවකාශස්ථානය යන සතර තැනින් එකක තබන ලද්දේ වේද, (මේ 20 (ii) ගමෙහි යන්නට කැලයෙහි කියා වෙනස්

නොව සොදගතයුතුයි)එහි උපන් දරලියක් හෝ මැලක් හෝ තෘණ හෝ මසුරන් පසක් හෝ මසුරන් පසට වැඩියෙන් හෝ වටිනා දෙයක් සොරසිතින් අල්වයිද දුකුළා ඇවැත්වේ. සොලවයිද ථුලසි ඇවැත්වේ. තැනින් වෙන්කරයිද පාරාජිකා වේ.

28 ජලය නම් භාජනයක තිබුනේ හෝ වේද පොකු-ණක තිබුනේ හෝ වේද, විලක තිබුනේ හෝ වේද, සොර සිතින් අල්වයිද දුකුළා ඇවැත්වේ. තැනින් සොලවයිද ථුලසි ඇවැත්වේ. තැනින් වෙන් කරයිද පාරාජිකා වේ. තමාගේ භාජනයට දමා මසු පසක් වටිනා හෝ මසු පසකට වඩා වටිනා හෝ ජලය සොර සිතින් අල්වයි නම් දුකුළා ඇවැත් වේ. සොලවයිද ථුලසි ඇවැත්වේ. තමාගේ භාජනයට දමුවේවේද, පාරාජිකාපත්තියවේ. සීමාව සිඳිනම් දුකුළා ඇවැත්වේ සීමාව සිඳ මසු පසක් හෝ මසු පසට වැඩියෙන් හෝ වටිනාකම ඇති ජලයක් නික්මවයිද පාරාජිකා වේ. මස්සකට වැඩියෙන් හෝ මස්සකට අඩුවෙන් හෝ පිටකරවයිද ථුලසි ඇවැත් වේ. මස්සක් හෝ මස්සකට අඩුවෙන් හෝ වටිනා ජලය නික්මවයිද, දුකුළා ඇවැත්වේ.

29 දැහැටි නම් සිඳිනලද හෝ නොසිඳිනලද හෝ දැහැටි අතුයි. මසු පසක් හෝ මසු පසකට වැඩිවූ වටිනාකමක් ඇති දැහැටි සොර සිතින් ගනීද, දුකුළා ඇවැත්වේ සොලවයිද ථුලසි වේ තිබුණු තැනින් වෙන්කරයිද පාරාජිකාවේ,

30 කැලෑවට ප්‍රධාන වෘක්ෂය නම් මිනුෂ්‍යයන්ට අයත්වූ වක් වේද, පාවිච්චි කරණ ගසක් වේද, සොර සිතින් කපාද පහරක් පහරක් පාසා දුකුළා ඇවැත්වේ. එක් පහරක්වත් නොවැදුන කල්හි ථුලසි ඇවැත්වේ. ඒ පහරවල් වැදුන කල්හි පාරාජිකාවේ

31 වෙන කෙනෙකුට ගෙනයන බඩුවක් සොර සිතින් අල්වයිද දුකුළා ඇවැත් වේ සොලවයිද ථුලසි වේ. තැනින් වෙන් කරයිද පාරාජිකා වේ බඩු ගෙනයන්නා සමග ගෙන යන්නෙමියි පළමුවන පාදය උක්මවයිද ථුලසි වේ දෙවෙනි පාදය උක්මවයිද දුකුළාවේ මසු පසක්, හෝ මසු පසකට වඩා හෝ වටිනා වැටුන බඩුව සොර සිතින් අල්වයිද දුකුළා වේ. සොලවයිද ථුලසිවේ. තැනින් තොර කෙරේද, පාරාජිකාවේ.

32 සමීපයෙහි දමනලද බඩුව උපනිධි නම් වේ. 'මට බඩුව දෙවයි' කියන්නේ 'මම නොගත්තෙමියි' කියයිද දුකුලා වේ. ස්වාමියාට සැක උපදවාද ථුලසි වේ. අයිතිකාරයා මට නොදෙන්නේ යයි සිතා අයිතිය අත්හරීද පාරාජිකා වේ. නඩු කියන්නේ ස්වාමියා පරදවයිද පාරාජිකා වේ. නඩු කියන්නේ පරදීද ථුලසි වේ.

33 අයබදු හැරීම නම් පමිත කොටසක හෝ කොටු පලක හෝ ගම්දොරක හෝ මෙහි ආ තැනැත්තාගෙන් අයබදු ගතයුතුයයි රජු විසින් තබනලද්දේ වේ. එහි මසු පසක් හෝ මසු පසකට වඩා හෝ වටිනා බඩුවක් අයබදු නොගෙවා සොර සිතින් අල්වයිද, දුකුලා ඇවැත් වේ. සොලවයිද ථුලසි වේ. බදු ගෙවියයුතු තැන පියවරක් ඉක්මවයිද ථුලසි වේ. දෙවෙනි පාදය ඉක්මවයිද, පාරාජිකා වේ. බද්දට අසුවූයේ බද්දෙන් පිටකරයිද, පාරාජිකා වේ. බදුබර උසුලයිද දුකුලා ඇවැත් වේ.

34 ප්‍රාණියෙකු නම් තිරිසන් ප්‍රාණියෙකු කියනු ලැබේ. සොරසිතින් අතින් අල්ලයිද, දුකුලා වේ. සොලවයිද ථුලසි වේ. තැනින් තොර කරයිද, පාරාජිකා වේ. පා නැත්තෝ නම් සර්පයින් හා මත්ස්‍යයෝයි. මසු පසක් හෝ මසු පසකට වඩා වටිනා ඒ සතකු සොරසිතින් අතගාද දුකුලා ඇවැත් වේ. සොලවාද ථුලසි වේ. තැනින් මෙත් කෙරේද පාරාජිකා වේ.

35 දෙපා ඇත්තෝ නම් මනුෂ්‍යයන් හා පක්ෂීන් ඇත්-තෝය. සොර සිතින් අල්වයිද දුකුලා වේ.. සොලවයිද ථුලසි වේ. තැනින් තොර කරයිද පාරාජිකා වේ. පයින් ගෙනයන්නෙමියි පළමු වෙනි පාදය ඉක්මවයිද ථුලසි වේ. දෙවෙනි පාදය ඉක්මවයිද පාරාජිකා වේ.

36 සිවුපා ඇත්තෝ නම් ඇත්, අශ්, ඔටු, ගෝණුන්, කොටළු ආදී සත්‍ය සියළු සිවුපාජාතීහුය සොරසිතින් අල්වයිද දුකුලා වේ සොලවයිද ථුලසි වේ. තැනින් මෙත් කරයිද, පාරාජිකා වේ. පයින් ගෙනයමියි පළමුවෙනි පාදය ඉක්මවයිද ථුලසි වේ දෙවෙනි පාදය ඉක්මවද ථුලසි වේ තුන්වෙනි පාදය ඉක්මවද ථුලසි වේ සතරවෙනි පාදය ඉක්මවයිද පාරාජිකා වේ.

37 බොහෝ පා ඇත්තෝ නම් හෝනුළු පත්තෑ ගොළුබු ආදීහුය මසු පසක් හෝ මසු පසකට වඩා හෝ වටිනා ඒ සතෙකු සොර සිතින් අල්වයිද දුකුලා වේ.

සොලවයිද ථුලසි වේ. තැනින් වෙනස් කරයිද පාරාජිකා වේ. පයින් ගෙනයන්නෙමියි ඇත්කරයිද පියක් පියක් පාසා ථුලසි වේ. අන්තිම පාදය ඉක්මවාද පාරාජිකාවේ.

38 ඔත්තුකාරයා නම් බඩුවක් රහසින් සොයයිද ඔහුයි. යම්කිසි තැනක් ඇත්තෙකුට ඒ බඩුව සොරකම් කරවයි කියාද දුකුලාවේ. හෙතෙම ඒ බඩුව සොරකම් කරයිද දෙදෙනාටම පාරාජිකා වේ.

39 ප්‍රවේශමට තැබූ බඩුවක් ප්‍රවේශම් කරන්නෝ මිත්‍රයක් හෝ මිත්‍රකාට සිටා හෝ මවිත්තෙන් සොරසිතින් අල්වයිද දුකුලා වේ. සොලවයිද ථුලසි වේ. තුබුණු තැනින් ඉවත් කරයිද පාරාජිකාවේ

40 ඇගැවීමෙන් කරණ සොරකම නම් බොහෝදෙනා එක්කොට එකෙක් බඩුවක් සොරකම් කරයි. සියලු දෙනාට පාරාජිකා ඇවත වේ.

41 ලකුණු කිරීම නම් පෙරබත, පසු බත, රෑ දවල් දැයි කියා වේලා අඳුන්වා දීමයි ඒ සලකුණෙන් ඒ බඩුව සොරකම් කරවයි කියයි නම් දුකුලාවේ, ඒ සලකුණෙන් ඒ බඩුව සොරකම් කරයිද, දෙදෙනාටම පාරාජිකා ඇවතවේ. ඒ වේලාවට කලින් හෝ පසුව ඒ බඩුව සොරකම් කරයිද පළමු මැණ්නාට ඇවැත් නොවේ. සොරකම් කළහුට පාරාජිකා වේ.

42 ලකුණක් කිම නම් ඇස හෝ කසන්නෙමි බැම හෝ ඔසවන්නෙමි. හිස හෝ ඔසවන්නෙමි. ඒ සලකුණෙන් ඒ බඩුව සොරාගනුවයි සලකුණක් කියයි. දුකුලා වේ. ඒ සලකුණෙන් ඒ බඩුව සොරකම් කරයිද, දෙන්නාටම පාරාජිකා වේ, ඒ නිමිත්තට පෙර හෝ පසුව හෝ ඒ බඩුව සොරකම් කරයිද පළමුමැණ්නාට ඇවැත් නොවේ. සොරකම් කළහුට පාරාජිකා වේ.

43 මේනම් බඩුවක් සොරකම් කරවයි භික්ෂුවක් භික්ෂුවකට අණකරයි. දුකුලාවේ, ඔහු එය සිතමින් එය සොරකම් කරයි. දෙදෙනාටම පාරාජිකාවේ. මෙනම් බඩුවක් සොරකම් කරවයි භික්ෂුවක් භික්ෂුවක් හට අණ කරයි. දුකුලා වේ. ඔහු එය සිතමින් අනිකක් සොරකම් කරයි. පළමු

වැන්නාට ඇවැත් නොවේ. සොරකම් කළහුට පාරාජිකා ඇවැත වේ. මෙනම් බඩුවක් සොරකම් කරවයි භික්ෂුවක් භික්ෂුවක්හට අණ කරයි. දුකුලා වේ. ඔහු අනිකෙක්හු සිතමින් එය සොරා ගනියි. දෙදෙනාටම පාරාජිකා ඇවැත වේ. භික්ෂුවක් භික්ෂුවක් හට මෙනම් බඩුවක් සොරකම් කරවයි අණ කරයි. හෙතෙම අනිකක් සිතා ගනිමින් අනිකක් සොරකම් කරයි. පළමුවැන්නාට ඇවැත් නොවේ. සොරාට පාරාජිකා වේ.

44 (i) භික්ෂුවක්, අසවල් තැනැත්තාට කියව. ඒ අසවල් තැනැත්තේ අසවල් තැනැත්තාට කියාවා. අසවල් තැනැත්තේ අසවල් බඩුව සොරකම් කරාවායි භික්ෂුවකට අණ කරයි. දුකුලා වේ. (ii) හෙතෙම අනෙකාට කියයි. දුකුලා වේ. සොරකම් කරන්නා පිළිගනී. පළමු වැන්නාට ථුලස්ස ඇවැත්වේ. හෙතෙම ඒ බඩුව සොරකම් කරයි. සියල්ලන්ට පාරාජිකා ඇවැත්වේ. (මෙයි (i)) හෙතෙම අනිකෙකු අණවයි. දුකුලාමේ සොරා පිළිගනී දුකුලා වේ. හෙතෙම ඒ බඩුව සොරකම් කරයි. පළමුවැන්නාට ඇවැත් නොවේ. නියම කළහුටද සොරාටද පාරාජිකා ඇවැත්වේ.

45 මෙනම් බඩුවක් සොරකම් කරවයි. භික්ෂුවක් භික්ෂුවකට අණකරයි. දුකුලා වේ. හෙතෙම ගොස් නැවත ආපසු එයි, ඒ බඩුව සොරකම් කරන්ට මට නොහැකියි කියායි. හෙතෙම යම් දවසක හැකිවූයේ නම් එදා ගන්නුවයි. පසුව අණකරයි. දුකුලා වේ. හෙතෙම ඒ බඩුව සොරකම් කරයි. දෙදෙනාටම පාරාජිකා ඇවැත වේ. මෙනම් බඩුවක් සොරකම් කරවයි. භික්ෂුවක් භික්ෂුවක්හට අණකරයි. දුකුලා වේ. හෙතෙම අණ කොට පසු තැවුනේ සොරකම් නොකරවයි නොකියයි. හෙතෙම ඒ බඩුව සොරකම් කරයි. දෙදෙනාටම පාරාජිකා වේ. භික්ෂුව භික්ෂුවක්හට මෙනම් බඩුවක් සොර-කම් කරවයි නියම කරයි. දුකුලා වේ. හෙතෙම අණවා පසු තැවුනේ එපායයි කියයි. හෙතෙම මම ඔබ විසින් අණ ලද්දෙමියි ඒ බඩුව සොරකම් කරයි. පළමු වැන්නාට ඇවැත්

නොවේ. සොරාට පාරාජිකා ඇවැත්වේ. අසමල් බඩුම සොර-කම් කරමයි. භික්ෂුවක් භික්ෂුවක්හට නියම කරයි. දුකුලාවේ. ඔහුතෙම අණකර පසු තැවුණේ සොරකම් නොකරවයි, කියයි. ඔහුතෙම යහපතැයි ඇත් වෙයි. දෙදෙනාටම ඇවැත් නොවේ.

46 පස් ආකාරයකින් තුදුන්දේ ගන්නාහට පාරාජිකා ඇවැත්වේ. අනුන් අයත්ද, අනුන් අයත්ය යන දැනුම, මස්සක් හෝ මස්සකට වැඩි හෝ වටිනා බඩුවක්වීම, සොර සිතක් එළඹ සිටීම අල්වයි. දුකුලාවේ. සොලවයි. ථුලසීවේ. තැනින් ඉවත් කරයි. පාරාජිකාවේ.

47 ක්‍රම පසකින් තුදුන් දෙය ගන්නාහට ථුලසි ඇවැත් වේ. අනුන්ට අයත්ය යන හැඟීම ඇත්තේද, මස්සකට වඩා හෝ මස්සකට අඩු හෝ සැහැල්ලු පිරිකරක්වේද, සොර සිත ඇත්තේ වේද, එය අල්වයිද දුකුලාවේ. සොලවයිද දුකුලා ඇවැත්වේ. තැනින් සොලවයිද ථුලසීවේ.

48 ක්‍රම පසකින් තුදුන්දේ ගන්නාහට දුකුලා ඇවැත් වේ අනුන්ට අයත්වේද, අනුන්ට අයත්ය යන හැඟීම ඇත්තේවේද, මස්සක් හෝ මස්සකට අඩුවෙන් හෝ වටිනා සැහැල්ලු පිරිකරක්වේද, සොරසිත ඉදිරිපත්වූයේ වේද, අල්වයිද දුකුලා ඇවැත්වේ. සොලවයිද දුකුලා ඇවතවේ. තැනින් සොලවයිද දුකුලා ඇවතවේ.

49 ක්‍රම සයකින් තුදුන්දෙය ගන්නාහට පාරාජිකා ඇවතවේ. තමන්ගේ නොවේය. යන හැඟීම ඇත්තේද, විශ්වාසයකින් ගන්නේ නොවේද, තාවකාලිකව ගන්නේ නොවේද, මසුපසක් හෝ මසුපසකට වැඩියෙන් හෝ වටිනා පිරිකරක්වේද. සොරසිත ඉදිරිපත්වූයේ වේද, අල්වයිද, දුකුලා ඇවැත්වේ සොලවයිද, ථුලසි ඇවැත්වේ. තැනින් අස් කරයිද පාරාජිකාවේ.

50 සය ක්‍රමයකින් තුදුන්දෙය ගන්නාහට ථුලසි ඇවැත්වේ. තමන්ගේ නොවේය, යන හැඟීම ඇත්තේවේද විශ්වාසයෙන් නොගන්නේය යන හැඟීම ඇත්තේද, තාවකාලිකව නොවේද, මස්සකට වඩා හෝ මසුපසකට අඩු හෝ

වේද, සොරසිත ඉදිරිපත්වූයේද, අල්වයිද, දුකුලා ඇවැත් වේ සොලවයිද දුකුලා ඇවැත් වේ. තැනින් අත්හරයිද ථුලසී ඇවැත් වේ

51 ක්‍රම සයකින් නුදුන් දේ ගන්නාහට දුකුලා ඇවැත් වේ. තමන්ගේය යන අදහස් නැත්තේ වේද, විශ්වාසයට නොගන්නේ වේද, තාවකාලික නොවේද, මස්සක් හෝ මස්සකට අඩු හෝ ලාභ පිරිකරක් වේද, සොරසිත ඉදිරිපත්වූයේ වේද, අල්වයිද, දුකුලා ඇවැත් වේ. සොලවයිද දුකුලා ඇවැත් වේ. තැනින් අත්හරයිද, දුකුලා ඇවැත් වේ.

52 ක්‍රම පසකින් නුදුන් දෙය ගන්නාහට දුකුලා ඇවැත් වේ. අනුන්ට අයත් නොවේද, අනුන් අයත්ය යන හැඟීම් ඇත්තේද, මසු පසක් හෝ ඊට වැඩි හෝ වටිනා පිරිකරක් වේද, සොරසිත ඉදිරිපත්වූයේ වේද, අල්වයිද, දුකුලා ඇවැත් වේ සොලවයිද දුකුලා ඇවැත් වේ. තැනින් අත්හරයිද දුකුලා ඇවැත් වේ.

53 ක්‍රම පසකින් නුදුන් දෙය ගන්නාහට දුකුලා ඇවැත් වේ. අනුනට අයත් නොවේද, අනුන්ට අයත්ය යන හැඟීම් ඇත්තේද, නොවටිනා පිරිකරක් වේද, මස්සකට වඩා හෝ අඩ් මස්සකට අඩු වේද, සොර සිත වේද, අල්වයිද, දුකුලා ඇවැත් වේ. සොලවයිද දුකුලා ඇවැත් වේ. තැනින් අත්හරයිද දුකුලා ඇවැත් වේ.

54 ක්‍රම පසකින් නුදුන් දෙය ගන්නාහට දුකුලා ඇවැත් වේ. අනුන්ට අයත් නොවේද, අනුන්ට අයත්ය යන හැඟීම් ඇත්තේ වේද, නොවටිනා පිරිකරක් වේද, මස්සක් හෝ මස්සකට අඩු අගය වේද, සොරසිතද ඉදිරිපත්වූයේ වේද, අල්වයිද, දුකුලා ඇවැත් වේ. සොලවයිද, දුකුලා ඇවැත් වේ තිබූ තැනින් අත්හරයිද, දුකුලා ඇවැත් වේ තමන්ගේය යන හැඟීම් ඇත්තාහටද, විශ්වාසයෙන් ගැනීම්වද, තාවකාලිකව ගැනීම්වද, අමනුෂ්‍යයන්ට අයත් දේ ගැනීමේහිද, තිරිසනුන්ට අයත් දේ ගැනීමේහිද, පාංශුකූලය යන අදහසින් පිවද, පිස්සාවද, සිහිනැති නැතැත්තාවද, වේදනාවෙන් පෙළෙන්නාවද, ඒ මැරුද්ද මුලින්ම කළහටද, ඇවැත් නොවේ.

(නුදුන් දෙය ගැනීමේ මුල් බණ වරයි.)

# 8 මිශ්‍ර කථා

1 එකල්හි වනාහි සම්බහුල භික්ෂූහු රෙදි වනන තැනට ගොස් රෙදි පෙට්ටිවලින් සොරකම් කළාහුය. භාග්‍යවතුන් වහන්සේ ශික්ෂා පදයක් නියම කරණ ලදී. කිමෙක්ද පාරාජිකා ඇවතට පැමිණියෙම්දැයි සැකයක් ඇතිවිය. භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. "මහණෙනි, තොපි පාරාජිකා ඇවතට පැමිණියාහුය."

2 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් රෙදි වනන තැනට ගොස් මිල වටිනා වස්ත්‍රයක් දැක සොරසිත ඉපදවූයේය. ඔහුට සැකයක් පහළවිය. 'කිමෙක්ද, මම පාරාජිකා ඇවතට අසුවූයේදැයි' කියායි. භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළේය. "මහණ සිත ඇතිවූ පමණින් ඇවැත් නොවේ."

3 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් රෙදි වනන තැනට ගොස් මහත් වටිනා වස්ත්‍රයක් දැක අතින් ඇල්ලූවේය, ඔහුට සැකයක් පහළවිය. 'කිමෙක්ද, මම පාරාජිකා ඇවතට අසුවූයෙම්දැයි' කියායි. "මහණ, පාරාජිකා ඇවැත් නොවේ දුකුලා ඇවැත් වේ."

4 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් රෙදි වනන තැනට පැමිණ වටිනා වස්ත්‍රයක් දැක සොර සිතින් සෙලවීය. ඔහුට සැකයක් පහළවිය. 'කිමෙක්ද, මම පාරජිකාවූයෙම්හිදැයි' කියායි. "මහණ පාරාජිකා ඇවත නොවේ ථුල්ලසි ඇවැත්වේ.'

5 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් රෙදි වනන තැනට ගොස් වටිනා වස්ත්‍රයක් දැක සොර සිතින් තිබූතැනින් ඇත්කෙළේය. ඔහුට සැකයක් පහළවිය. "මහණ, ඔබ පාරාජිකා ඇවතට අසුවූයෙහිය."

6 එකල්හි වනාහි එක්තරා පිණ්ඩපාතයේ සිටින භික්ෂුවක් මහත් උතුරු සළුවක් දැක සොර සිත ඉපදවීය. සොර සිතින් ඇල්ලූවේය. සොර සිතින් සෙලවූයේය. සොරසිතින් තැනින් ඉවත් කළේය. ඔහුට සැකයක් විය. "මහණ, ඔබ පාරාජිකා ඇවතට අසුවූයෙහිය."

7 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් දවල් බඩුවක් දැක රාත්‍රියෙහි සොරකම් කරන්නෙමැයි සිතාගත්තේය. හෙතෙම එය සිතමින් එය සොරෙන් ගත්තේය, එයයි සිතමින් අනිකක් ගත්තේය. අනිකක්ය සිතා එය ගත්තේය අනිකක්ය සිතා අනිකක් ගත්තේය. ඔහුට සැකයක් පහළවිය. "මහණ, ඔබ පාරාජිකා ඇවතට පැමිණියෙහිය."

8 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් බඩුවක් රාත්‍රියෙහි සොරකම් කරන්නෙමියි දවල් සලකුණක් කර ගියේය. හෙතෙම එය යන අදහසින් තමන්ගේ බඩුවක් සොරකම් කළේය. ඔහුට සැක පහළවිය. "මහණ, පාරාජිකාවට නොපැමිණියෙහිය. දුකුලා ඇවැත් වේ"

9 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් බඩුවක් ගෙන යන්නාවූ අනිකෙකුගේ හිසෙහිවූ බර සොර සිතින් ඇල්ලුවේය. සොරසිතින් සෙලවූයේය සොරසිතින් කරෙහි තැබූයේය. කරෙහිවූ බර සොරසිතින් ඇල්ලීය. සොරසිතින් සෙලවූයේය සොරසිතින් උකුලට ගත්තේය. උකුලෙහි බර අතින් ඇල්ලුවේය සොරසිතින් සෙලවූයේය. සොරසිතින් අතින් අල්වා ගත්තේය. අතෙහිවූ බර සොරසිතින් බිම තැබුවේය. සොරසිතින් බිමින් අරගත්තේය. ඔහුට සැකයක් පහළවිය. "මහණ, ඔබ පාරාජිකා ඇවතට පැමිණියෙහිය."

10 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් අවකාශ ස්ථානයෙහි සිවුරක් එලා විහාරයට ඇතුල්වූයේය. අනික් භික්ෂුනමක් මේ සිවුර නැතිනොවේවායි ඇකුළුවේය. හෙතෙම පිටවී අවුත් "ඇවැත්නි, මගේ සිවුර කවුරුන් විසින් සොරකම් කළේදැයි" ඒ භික්ෂුවගෙන් ඇසීය. හෙතෙම "මා විසින් ගෙනෙනලද්දයි" කීයේය. 'ඔබ ශ්‍රමණයෙක් නොවේයයි" කියා එය ගත්තේය ඔහුට සැකයක් පහළවිය. භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළේය. 'මහණ ඔබ කිනම් සිතක් ඇත්තෙහිද?' "භාග්‍යවතුන් වහන්ස, මම ව්‍යවහාර මාත්‍රයක් ඇතැයි කීවේය" "මහණ, කථා ව්‍යවහාරය ලෙසට ඇවැත් නැතැයි" වදාළසේක.

11 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් පුටුවක සිවුරක් දමා, පුටුවේ හිඳගන්නා පිරිකර දමා, පුටුවක් උඩ පාත්‍රය දමා, විහාරයට ඇතුල්විය. අනික් භික්ෂුවක් මේ පාත්‍රය නොනසීවායි තැන්පත් කෙළේය, හෙතෙම නික්මී අවුත් "ඇවැත්නි, මගේ පාත්‍රය ගත්තෙහිදැයි" ඒ භික්ෂුවගෙන් ඇසීය. හෙතෙම 'මා විසින් ගෙන තබන ලදැයි' කීවේය. හෙතෙම 'ඔබ ශ්‍රමණයෙක් නොවෙහියයි' ගත්තේය. ඔහුට සැකයක් විය. 'මහණ, කථාවේ හැටියට ඇවැත් නොවේ.''

12 එකල්හි වනාහි එක්තරා භික්ෂුණියක් වැටක සිවුරක් වනා විහාරයට ඇතුල්විය. එක්තරා භික්ෂුණියක් මේ සිවුර නැතිනොවේවායි අකුලා තැබුවාය. ඕතොමෝ නික්මී ඒ භික්ෂුණියගෙන් "ආර්‍ය්‍යාවෙනි, මාගේ සිවුර කවරෙකු විසින් ගත්තේදැයි" ඇසීය. ඕතොමෝ 'මා විසින් ගන්නා ලදැයි' කීවාය. 'ඔබ භික්ෂුණියක් නොවෙහියයි' කියා එය ගත්තීය. ඇට සැකයක් විය. ඉක්බිති භික්ෂුණීහු භික්ෂූන්ට මේ කාරණය කිවූහුය. භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට කථා කළසේක. "මහණෙනි, කථාවේ හැටියට ඇවැත් නොවේ."

13 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් සුළිහුළඟකින් උඩට ඔසවාහලද සළුවක් අයිතිකාරුවන්ට දෙන්නෙමියි අල්වා ගත්තේය. අයිතිකාරුවෝ, 'ඔබ ශ්‍රමණයෙක් නොවෙහියයි' ඒ භික්ෂුවට චෝදනා කළාහුය. ඔහුට සැකයක් පහළවිය. "මහණ, ඔබ කිනම් සිතක් ඇත්තෙහිදැයි" ඇසීය. භාග්‍යවතුන් වහන්ස, මම සොර සිත් නැත්තෙමියි" කීයේය. 'සොර සිතක් නැත්තාට ඇවැත් නැත '

14 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් සුළිහුළඟකින් ඔසවනලද හිස්වෙළුමක් පෙර හිමියෝ දකිත්යයි සොර සිතින් අල්වා ගත්තේය. ස්වාමීනු ' ඔබ ශ්‍රමණයෙක් නොවෙහියයි'' ඒ භික්ෂුවට චෝදනා කළාහුය. ඔහුට සැකයක් විය. "මහණ, ඔබ පාරාජිකා වූයෙහියයි" වදාළසේක.

15 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් සොහොනට ගොස් සම නොසිඳුනු ශරීරයක තිබුණ පාංශුකූල වස්ත්‍රය ගත්තේය.

ඒ ශරීරයෙහි ප්‍රේතයෙක් අධිගෘහිත වූයේ වේ. ඉක්බිති ඒ ප්‍රේතතෙම ඒ භික්ෂුවට 'ස්වාමීනි, මාගේ වස්ත්‍රය නොගන්නැයි'' කීයේය. ඒ මහණතෙම නොගෙන ගියේය. ඉක්බිති ඒ ශරීරය නැගිට ඒ භික්ෂුව පසුපස ගියේය. ඉක්බිති ඒ භික්ෂුව විහාරයට ඇතුල්වී දොර වසා ගත්තේය. ඉක්බිති ඒ ශරීරය එහිම වැටුණේය. ඔහුට සැකයක් ඇතිවිය. "මහණ පාරාජිකා ඇවත නොවේ. මහණෙනි, සම නොසිඳුන ශරීරය වැසූ වස්ත්‍රය නොගත යුතුයි. යමෙක් ගන්නේනම් දුකුළා ඇවැත්වේ."

16 එක් කාලයක එක්තරා භික්ෂුවක් සංඝයාගේ සිවුරු බෙදන කල්හි සොරසිතින් සිට්ටුවක් පෙරළා සිවුරක් ගත්තේය. ඔහුට සැකයක් විය. "මහණ, ඔබ පාරාජිකා ඇවතට පැමිණියෙහිය."

17 එකල්හි වනාහි ආයුෂ්මත් ආනන්දතෙමේ ගිනි තපින ගෙහි එක්තරා භික්ෂුවකගේ තනිපට සිවුරක් තමාගේ යයි හඟිමින් හැඳගත්තේය. ඉක්බිති ඒ මහණතෙම ආයුෂ්මත් ආනන්දට "ඇවැත්නි, ආනන්දය, කුමක් හෙයින් මාගේ තනිපට සිවුර හැන්දෙහිදැයි" ඇසීය. "ඇවැත්නි, මාගේයයි සිතාමෙමි." භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළාහුය. 'මහණෙනි, තමාගේය යන හැඟීම් ඇත්තාහට ඇවැත් නොවේ.''

18 එකල්හි වනාහි බොහෝ භික්ෂූහු ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නාහු සිංහයෙකු විසින් මරණ ලද මසක් දැක පිස කැවාහුය. ඔවුන්ට සැකයක් ඇතිවිය. "මහණෙනි, සිංහයන් මැරූ මසෙහි ඇවැත් නැත."

19 එකල්හි වනාහි බොහෝ භික්ෂූහු ගිජ්ඣකූට පර්වතයෙන් බස්නාහු ව්‍යාඝ්‍රයෙකු මැරූ මසක් දැක, කොටියෙකු මැරූ මසක් දැක, වලසෙකු මැරූ මසක් දැක, මාකයෙකු මැරූ මසක් දැක පිස කැවාහුය. ඔවුන්ට සැකයක් විය "මහණෙනි, තිරිසනුන්ට අයත් දෙය ගැන ඇවැත් නොවේ"

20 එකල් වනාහි එක්තරා භික්ෂුවක් සංඝයාට දානය බෙදන කල්හි අනිකෙකුගේ කොටසක් දෙමැයි වසාවාගෙනා ගත්තේය. ඔහුට සැකයක් විය. "මහණ, පාරාජිකා නොවේ දැන දැන බොරු කීමේ පචිති ඇවැත වේ"

21 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් සංඝයාට කැවිලි බෙදන කල්හි, කැවුම් බෙදන කල්හි, උක් බෙදන කල්හි අනිකෙකුට කොටසක් දෙවයි බොරුවට ගත්තේය ඔහුට සැකයක් ඇතිවිය. "මහණ පාරාජිකා ඇවත නොවේ දැන දැන බොරු කීමෙහි පචිති ඇවැත වේ"

21 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් දුර්භික්ෂයෙහි බත් විකුණන තැනට ගොස් පාත්‍රා පුරා බත් සොරාගත්තේය. ඔහුට සැකයක් ඇතිවිය. "මහණ, ඔබ පාරාජිකා වූයෙහිය"

23 එකල්හි වනාහි දුර්භික්ෂයෙහි එක්තරා භික්ෂුවක් මස් පිස විකුණන තැනට ගොස් පාත්‍රා පුරවා මස් සොරකම් කර්ගෙන ගියේය. ඔහුට සැකයක් ඇතිවිය. "මහණ, ඔබ පාරාජිකා ඇවතට අසුවූයෙහිය.

24 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් දුර්භික්ෂ කාලයෙහි කැවිලි විකුණන තැනට ගොස් පාත්‍රා පුරා සොර සිතින් කැවිලි ගත්තේය. පාත්‍රා පුරා සොර සිතින්-හකුරු ගෙනාවේය පාත්‍රා පුරා අග්ගලා සොර සිතින් ගෙනාවේය. ඔහුට සැකයක් පහළවිය. "මහණ, ඔබ පාරාජිකා ඇවතට පැමිණියෙහිය."

25 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් දවල් පිරිකරක් දුන රාත්‍රියෙහි සොරකම් කරන්නෙමියි සලකුණක් කළේය. හෙතෙම එය සිහිකරමින් එය ගත්තේය. එය සගිමින් අනිකක් සොරකම් කළේය. අනිකක් සිතමින් එය ගත්තේය අනිකක් සිතමින් අනිකක් ගත්තේය. ඔහුට සැකයක් පහළවිය. "මහණ, ඔබ පාරාජිකා ඇවතට පැමිණියෙහිය.

26 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් දවල් පිරිකරක් දුන රාත්‍රියෙහි සොරකම් කරන්නෙමියි සළකුණක් කළේය,

හෙතෙම එසේයැයි සිතන්නේ තමාගේ පිරිකර ගත්තේය. ඔහුට සැකයක් පහළවිය. "මහණ, පාරාජිකා ඇවැත් නොවේ. දුකුලා ඇවැත් වේ."

27 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් පුටුවෙහි පසුම්බියක් දැක මෙය ගත්තොත් පාරාජිකා වේයැයි සිතා පුටුවත් සමග මාරුකොට ගත්තේය. ඔහුට සැකයක් පහළවිය. "මහණ, ඔබ පාරාජිකා ඇවතට අසුවූයෙහිය."

28 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් සංඝයාගේ බුදිරියක් සොරසිතින් ගත්තේය. ඔහුට සැකයක් ඇතිවිය. "මහණ, ඔබ පාරාජිකා වූයෙහිය."

29 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් සිවුරු දණ්ඩෙහි සිවුරක් සොර සිතින් ගත්තේය. ඔහුට සැකයක් විය. "මහණ, ඔබ පාරාජිකා වූයෙහිය."

30 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් විහාරයෙහි සිවුරක් සොරකම්කොට මෙයින් නික්මෙන්නේ පාරාජිකා වෙයැයි විහාරයෙන් නොනික්මුණේය. භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැළ කළාහුය. "මහණෙනි, ඒ හිස් පුරුෂයා නික්මෙන්නේ හෝ නොනික්මෙන්නේ හෝ පාරාජිකා ඇවත වේ."

31 එකල්හි වනාහි භික්ෂූන් දෙනමක් යහළුවෝ වෙත්. එක් භික්ෂුවක් ගමට පිඩු පිණිස නික්මුණේය. දෙවෙනි භික්ෂුව සංඝයාට කැවිලි බෙදන කල්හි යහළුවාගේ කොටස ගෙන ඔහු විශ්වාස කරන්නේ අනුභව කෙළේය. හෙතෙම දැන ඔහුට "ඔබ ශ්‍රමණයෙක් නොවෙහි" චෝදනා කෙළේය. ඔහුට සැකයක් විය භාග්‍යවතුන්සේට මේ කාරණය සැළ කෙළේය. "මහණ, ඔබ කිනම් සිතක් ඇත්තෙහිද?" "භාග්‍යවතුන් වහන්ස, මම විශ්වාසයෙන් ගත්තෙමි." "මහණ, විශ්වාසයෙන් ගැනීමෙහි ඇවැත් නැත."

32 එකල්හි වනාහි බොහෝ භික්ෂූහු සිවුරු මැඩ කරත්. සංඝයාට කෑ යුතු දේ බෙදන කල්හි යහළුවන්ගේ කොටස් ගෙන තැබූවාහු වෙත්. අන්‍යවූ භික්ෂුවක් එක්තරා භික්ෂුවකගේ කොටස තමන්ගේය කියා සිතමින් අනුභව කෙළේය.

ගෙනෙමි දූත ශ්‍රමණයෙක් නොවේයයි චෝදනා කළේය. ඔහුට සැකයක් පහළවිය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළේය. "මහණ, ඔබ කිනම් සිතක් ඇත්තෙහිදැයි" ඇසීය. "භාග්‍යවතුන් වහන්ස, මම මගේය යන හැඟීම් ඇත්තෙමිය" "තමන්ගේය යන හැඟීම ඇත්තාහට ඇවැත් නැත."

33 එකල්හි වනාහි බොහෝ භික්ෂූහු සිවුරු මැඩගරත්. සංඝයාට කැවිලි බෙදන කල්හි එක්තරා භික්ෂුවක් පාත්‍රයෙන් අයිති භික්ෂුවකගේ කොටසක් ගෙන තැබුයේ වේ. පාත්‍රය අයිති භික්ෂුව තමාගේයයි සිතමින් අනුභව කෙළේය ගෙනෙමි දූත, ශ්‍රමණයෙක් නොවේයයි ඔහුට අවමන් කෙළේය. ඔහුට සැකයක් පහළ විය. භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැල කෙළේය. "මහණ, ඔබ කිනම් සිතක් ඇත්තෙහිද? භාග්‍යවතුන් වහන්ස, මම මගේය යන හැඟීම් ඇත්තෙමියි කීයේය. "මහණ, තමාගේය යන සැක ඇත්තාට ඇවැත් නොවේ."

34 එකල්හි වනාහි අඹ සොරු අඹ හෙළා පොට්ටනියක් බැඳ රැගෙන ගියාහුය. හිමිවරු ඒ සොරුන් ලුහුබැන්දාහුය. සොරු අයිතිකරුවන් දැක පොදිය හෙළා ගියාහුය. භික්ෂූහු පාංශුකූල සංඥාවෙන් පිළිගෙන වැළඳුම්හුය. අයිතිකරුවෝ ඒ භික්ෂූන්ට "තෙපි ශ්‍රමණයෝ නොවෙත්යයි" චෝදනා කළාහුය. ඔවුන්ට සැකයක් පහළ විය. භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය "මහණෙනි, තෙපි කිනම් සිත් ඇත්තාහුද?" "භාග්‍යවතුන් වහන්ස, අපි පාංශුකූල හැඟීම ඇත්තෝ වෙමු." "මහණෙනි, පාංශුකූලය යන හැඟීම් ඇත්තාහට ඇවැත් නොවේ,"

35 එකල්හි වනාහි ජම්බු සොරු, රටදෙල් සොරු, කොස් සොරු, තල්ගෙඩි සොරු, උක්සොරු, තිඹිරි සොරු, තිඹිරි කඩා පොදියක් බැඳ ගෙනගියාහුය. (මෙහි ජම්බු කඩා ආදි වශයෙන් යොදන) අයිතිකරුවෝ ඒ සොරු ලුහුබැඳ ගියාහුය. සොරු සවාමිවරු දැක බඩු පොදි හෙළා ගියාහුය. භික්ෂූහු පාංශුකූල සංඥාවෙන් පිළිගෙන්ව,

මැලඳුම්හුය, අයිතිකරුවෝ ඒ භික්ෂූන්ට "තෙපි ශ්‍රමණයෝ සොරාවන්නාහුයයි" "චෝදනා කළාහුය. ඔවුන්ට සැකයක් වූයේය. "මහණෙනි, පාංශුකූල සංඥාවෙන් ගන්නාහට ඇවැත් නොවේ.

36 එකල්හි වනාහි අඹසොරු අඹ සෙලා පොදියක් බැඳ ගෙන ගියාහුය. ස්වාමිවරු ඒ සොරු ලුහුබැඳ ගියාහුය. සොරු අයිති කරුවන් දැක පොදිය හෙළා ගියාහුය. භික්ෂූහු අභිමුඛයෙහි අයිතිකරුවන් දකින්නයයි සොරසිතින් අනුභව කළාහුය. අයිතිකාරුවන් ඒ භික්ෂූන්ට "තෙපි ශ්‍රමණයෝ සොරාවන්නාහුයයි" චෝදනා කළාහුය. ඔවුන්ට සැකයක් ඇති විය "මහණෙනි, තෙපි පාරාජිකා ඇවැතට පැමිණියාහුය."

37 එකල්හි වනාහි (මෙහි 35 වෙනි ඡේදයේ 'පාංශුකූල සංඥාවෙන්' යන්නට 'සොර සිතින්' කියාද 'පාංශුකූල නැගීම ඇත්නාව ඇවැත් නොවේ' යන්නට "මහණෙනි, තෙපි පාරාජිකා ඇවැතට පත්වූහයි" කියාද වෙනස් කළ යුතුයි.)

38 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් සංඝයාගේ අඹ සොර සිතින් ගත්තේය. සංඝයාගේ ජම්බු, සංඝයාගේ රට දෙල්, සංඝයාගේ කොස්, සංඝයාගේ තල්ගෙඩි, සංඝයාගේ උක්, සංඝයාගේ තිඹිරි සොර සිතින් ගත්තේය. ඔහුට සැකයක් පහළ විය. "මහණ, ඔබ පාරාජිකා ඇවැතට පත්වූයෙහිය."

39 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් මල්වත්තට ගොස් මසු පසක් වටිනා කඩනලද මලක් සොර සිතින් පැහැර ගත්තේය. ඔහුට සැකයක් පහළවිය. "මහණ, ඔබ පාරාජිකාවූයෙහිය."

40 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් (මෙහි 39 යේ "කඩනලද මලක්" යන්නට "මලක් කඩා" කියා වෙනස්කර යෙදගත යුතුයි )

41 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ගමට යන්නේ අන්‍යවූ භික්ෂුවකට "ඇවැත්නි, තොපගේ උපස්ථායක කුලයට

ගෙයි ඔබ කීවොත් කියන්නෙමියි" කීයේය. හෙතෙම ගෙයි එක් සළුවක් ගෙන්වාගෙන තමන් වැළඳ ගත්තේය. හෙතෙම දැන ඔහුට ඔබ ශ්‍රමණයෙක් නොවෙහියයි චෝදනා කෙළේය. ඔහුට සැකයක් පහළ විය "මහණ, පාරාජිකා නොවූයේය. මහණෙනි, 'ඔබ කීවොත් කියන්නෙමියි' නොකිව යුතුය. යමෙක් කියා නම් දුකුළා ඇවැත් වේ."

42 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ගමට යයි. අනික් භික්ෂුවක් ඒ භික්ෂුවට "ඇවැත්නි, මගේ උපස්ථායක කුලයට මා විසින් කියන ලද්දේයයි යනු මැනවයි" කීයේය. හෙතෙම ගොස් සළු දෙකක් ගෙන්වා එකක් තමා විසින් පාවිච්චි කෙළේය. එකක් ඒ භික්ෂුවට දුන්නේය. හෙතෙම දැන "ඔබ ශ්‍රමණයෙක් නොවෙහියි"යි චෝදනා කෙළේය. ඔහුට සැකයක් විය. "මහණ, පාරාජිකා ඇවැත් නොවේ. මහණෙනි, කියන ලද්දේයයි නොකිව යුතුය. යමෙක් කියන්නේ නම් දුකුළා ඇවැත් වේ.

43 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ගමට යන්නේ, එක්තරා භික්ෂුවකට 'ඇවැත්නි, තොපගේ උපස්ථායක කුලයට ගොස් ඔබ විසින් කියනලද්දේයයි කියමියි" කීයේය. හෙතෙමේද "මා විසින් කියන ලද්දේයයි කියනු මැනවයි" කීයේය. හෙතෙම ගොස් ලාකඩ පමණ ගිතෙල්ද, තලගුළිද, සකල්ද ගෙන්වාගෙන තමන් අනුභව කෙළේය. හෙතෙම "ඔබ ශ්‍රමණයෙක් නොවෙහියයි" චෝදනා කෙළේය. ඔහුට සැකයක් ඇතිවිය. "මහණ, පාරාජිකා ඇවැත් නොවේ. මහණෙනි, යමෙකු විසින් කියන ලද්දේයයි නොකිව යුතුය. කියන ලද්දේයයි කියමියි නොකිව යුතුය. යමෙක් කියන්නේද, දුකුළා වේ."

44 එකල්හි වනාහි එක්තරා පුරුෂයෙක් වටිනා මැණිකක් රැගෙන එක්තරා භික්ෂුවක් සමග මග මැදියට බැස්සේ වේ. ඉක්බිති ඒ පුරුෂතෙම බදු අයකරණ තැන දැක ඒ භික්ෂුව නොදැනුවත්වම පසුම්බියේ මැණිකක් දමා බදු අයකරණ තැන ඉක්මවා ගොස් ගත්තේය. ඔහුට සැකයක් පහළවිය. "මහණ, ඔබට කිනම් සිතක් ඇතිවූයේදැයි" ඇසීය. "භාග්‍යවතුන් වහන්ස, මම නොදත්තෙමියි" පිළිතුරු දුන්නේය. "මහණ, නොදන්නාහට ඇවැත් නැත."

45 එකල්හි වනාහි එක්තරා පුරුෂයෙක් වටිනා මැණි කක් ගෙන එක්තරා භික්ෂුවක් සමග මහාමාර්ගයෙහි බැස්සේ වේ. ඉක්බිති ඒ පුරුෂතෙම බදු ගෙවන තැන් දැක ලඟබවු බවක් අඟවා තමාගේ බඩු ඒ භික්ෂුවට දුන්නේය. ඉක්බිති ඒ පුරුෂතෙම බදු අයකරණ තැන ඉක්මවා ඒ භික්ෂුවට "ස්වාමීනි, මට අසතීපානක් නැත. මාගේ බඩු සොඳින් දෙනු මැනවයි" කීයේය. "ඇවැත්නි, කෙසේ කුමක් හෙයින් මෙබන්දක් කොළෙහිදැයි" ඇසීය ඉක්බිති ඒ පුරුෂතෙම ඒ භික්ෂුවට මේ කාරණය සැලකෙළේය ඔහුට සැකයක් පහළවිය. "මහණ, නොදන්නාහට ඇවැත් නැතැයි කීයේය."

46 "එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් වෙළඳ සමූහයක් සමග මහමාර්ගයෙහි බැස්සේ වේ. එක්තරා පුරුෂයෙක් ඒ භික්ෂුවට කැමිබිම්වලින් සංග්‍රහකොට බදුගන්නා තැන දැක වටිනා මැණිකක් ඒ භික්ෂුවට දුන්නේය. "ස්වාමීනි, මේ මැණික බදු අයකරණ තැනින් ඉක්මවනු මැනවයි" කීයේයි. ඉක්බිති ඒ භික්ෂුතෙම ඒ මැණික බදුගන්නා තැන ඉක්ම වූයේය, ඔහුට සැක විය, "මහණ, ඔබ පාරාජිකා වූවෙහිය."

47 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් කොණ්ඩුවකට අසුවූ ඌරෙකු කලින් අයිතිකරුවෝ දකින්නයි කාරුණ්‍ය සිතින් මුදාහැරියේය ඔහුට සැකයක් ඇති විය." "මහණ, පාරාජිකාවූයෙහිය"

48 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් කොණ්ඩුවක බැඳුණු මුවෙකු කාරුණ්‍යයෙන් මුදාහැරියේය, ඔහුට සැකයක් ඇතිවිය. "මහණ, ඔබ පාරාජිකා ඇවැතට අසුවූයෙහිය,

49 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් කොණ්ඩුවෙහි බැඳුනු මුවෙකු පූර්වයෙහි අයිතිකරුවෝ දකිත්වායි' සොර සිතින් මුදා හැරියේය. ඔහුට සැකයක් ඇතිවිය "මහණ, ඔබ පාරාජිකා ඇවැතට අසුවූයෙහිය, කොණ්ඩුවෙහි බැඳුනු මුවුන් පෙර අයිති කරුවෝ දකිත්වායි කාරුණ්‍යයෙන් මුදා හැරියේය. ඔහුට සැකයක් පහළ විය. "මහණ, ඔබ පාරාජිකා ඇවැතට අසුවූයෙහිය."

50 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් රථයෙක්හි බඩුවක් දුටු මෙයින් ගත්තේ පාරාජිකා වන්නෙමියි තැකී සෞනස්සෙනට පෙරලාදමාගත්තේය. ඔහුට සැකයක් ඇතිවිය. "මහණ, ඔබ පාරාජිකා වූයෙහියයි" වදාළසේක.

51 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් උකුස්සෙකු විසින් ඔසවාගත් මස්වැදැල්ලක් අයිති කරුවන්ට දෙන්නෙමියි අල්වාගත්තේය. හිමියෝ ඒ භික්ෂුවට "ඔබ ශ්‍රමණයෙක් නොවෙහියි" චෝදනා කළාහුය. ඔහුට සැකයක් ඇතිවිය. "මහණෙනි, සොර සිතක් නැත්තාහට ඇවැත් නැත."

52 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් උකුස්සෙකු විසින් ඔසවනලද මස්වැදැල්ලක් පෙරඅයිතිකරුවෝ දකිත්වායි සොරසිතින් ගත්තේය. අයිතිකරුවෝ ඒ භික්ෂුවට ඔබ ශ්‍රමණයෙක් නොවෙහියි චෝදනා කළාහුය. ඔහුට සැකයක් ඇතිවිය. "මහණ, ඔබ පාරාජිකා වූයෙහිය.

53 එකල්හි වනාහි මිනිස්සු පහුරක් බැඳ අචිරවතී ගඟෙන් එගොඩවෙත්. බැමි සිඳුනු කල්හි ලී විසුරුණාහුය. භික්ෂූහු පාංශුකූල සංඥාවෙන් එගොඩට ගත්හ. අයිතිකරුවෝ ඒ භික්ෂූන්ට තෙපි පැවිද්දෝ නොවනුයයි චෝදනා කළාහුය. ඔවුනට සැකයක් ඇතිවිය. "මහණෙනි, පාංශුකූල සංඥා ඇත්තාහට ඇවැත් නැත."

54 එකල්හි මිනිස්සු පහුරක් බැඳ අචිරවතී ගඟින් එතරවෙති. බැමි කැඩුණු කල්හි ලී විසුරුණාහුය. භික්ෂූහු පෙර හිමියෝ දකිත්වායි සොරසිත් ඇත්තාහු එගොඩට ගත්හ. අයිතිකරුවෝ ඒ භික්ෂූන්ට "තෙපි ශ්‍රමණයෝ නොවනුයයි" චෝදනා කළාහුය. ඔවුනට සැකයක් පහළවිය. "මහණෙනි, තෙපි පාරාජිකා ඇවතට පැමිණියාහුය."

55 එකල්හි වනාහි එක්තරා ගොපල්ලෙක් ගසෙක්හි සළුවක් එල්වා මලපහ කරන්නට ගියේය. එක්තරා භික්ෂුවක් පාංශුකූල සංඥාවෙන් ගත්තේය. ඉක්බිති ඒ ගොපාලක තෙම ඔබ ශ්‍රමණයෙක් නොවෙහියි චෝදනා කළාහුය. ඔහුට සැකයක් පහළවිය. "මහණ, පාංශුකූල සංඥා ඇත්තාට ඇවැත් නොවේ.

56 එකල්හි වනාහි ගඟකින් එතෙරවෙන එක්තරා භික්ෂුවකගේ කකුලෙහි රැඳවුණුගේ අතින් මිදුනු සළුවක් පටලැවුණේවේ. ඒ මහණ තෙමේ අයිතිකරුවන්ට දෙමියි යන සිතින් ගත්තේය. අයිතිකරුවෝ ඔබ ශ්‍රමණයෙක් නොවෙහියයි. ඒ භික්ෂුවට චෝදනා කළාහුය. ඔහුට සැකයක් විය. “මහණ, සොර සිතක් නැත්තාට ඇවැත් නැත.”

57 එකල්හි වනාහි ගඟකින් එතෙරවන එක්තරා භික්ෂුවකගේ කකුලෙහි රැඳවුණුගේ අතින් මිදී ගිය වස්ත්‍රයක් පටලැවුණේවේ. ඒ මහණතෙම පෙර අයිතිකරුවෝ දකිත්යයි, සොරසිතින් අල්වා ගත්තේය. අයිතිකරුවෝ ඔබ ශ්‍රමණයෙක් නොවෙහියයි චෝදනා කළාහුය. ඔහුට සැකයක් පහළ විය. “මහණ, ඔබ පාරාජිකා ඇවතට පැමිණියෙහිය.”

58 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ගිතෙල් කළයක් දැක ටිකටික පානය කළේය. ඔහුට සැකයක් ඇතිවිය “මහණ පාරාජිකා නොවේ. දුකුලා ඇවැත්වේ.”

59 එකල්හි වනාහි බොහෝ භික්ෂූහු බඩුවක් සොරකම් කරන්නෙමියි නිශ්චයකොට ගියාහුය. එක්කෙනෙක් බඩුව සොරකම් කළේය. ඔව්හු “අපි පාරාජිකාවූවෝ නොවෙමු. යමෙක් සොරකම් කළේද හෙතෙම පාරාජිකාවූයේයයි” කීහුය. භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැළකළාහුය “මහණෙනි, තෙපි පාරාජිකා වූවාහුය.”

60 එකල්හි වනාහි බොහෝ භික්ෂූහු භික්ෂුවකට නියම කොට බඩුයක් සොරකම්කොට බෙදුවාහුය. ඔවුන් විසින් බෙදනු ලබන කල්හි එක් කොටසකට මසු පහක් සම්පූර්ණ විය. ඔව්හු මෙසේ කීවාහුය. ‘අපි පාරාජිකා නොවිමුයයි. භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැළකළාහුය. “මහණෙනි, තෙපි පාරාජිකාවූවාහුය.”

61 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් සැවැත් නුවර දුර්භික්ෂයෙහිදී වෙළෙන්දකුගේ සහල් මිටක් සොරසිතින් ගත්තේය. ඔහුට සැකයක් පහළවිය. ‘මහණ, ඔබ පාරාජිකා ඇවතට පැමිණියෙහිය.”

62 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් සැවැත් නුවර දුර්භික්ෂයකදී මෙලෙක්දෙකුගේ මුං මිටක්, මෑ මිටක්, තල මිටක්, සොරසිත් ඇත්තේ සොරකම් කෙළේය. ඔහුට සැකයක් පහළවිය. "මහණ ඔබ පාරාජිකාවූයෙහිය."

63 එකල්හි වනාහි සැවැත්නුවර අන්ධවනයෙහි සොරු දෙනකු මරා මස්කා ඉතිරි කරිය සඟවා ගියාහුය. භික්ෂූහු පාංශුකූල සංඥාවෙන් ගෙන්වාගෙන වැළඳූහ. සොරු "තෙපි පැවිද්දෝ නොවූහුයයි" චෝදනා කළාහුය. ඔවුන්ට සැකයක් ඇතිවිය. "මහණෙනි, පාංශුකූල හැඟීම ඇත්තාහට ඇවැත් නොවේ."

64 (මෙහි 63 ඡේදයේ 'දෙනකු' යන්නට 'ඌරකු' කියා වෙනස්කර යොදගත යුතුයි)

65 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් තණකොළ වත්තම ගොස් කපන ලද මසු පසක් වටිනා තණකොළ සොරසිතින් ගත්තේය. ඔහුට සැකයක් ඇතිවිය. "මහණ, ඔබ පාරාජිකා ඇවතට පැමිණියෙහිය."

66 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් තණකොළ වත්තට ගොස් මසු පසක් වටිනා තණකොළ කපා සොරසිතින් ගත්තේය. ඔහුට සැකයක් ඇතිවිය. "මහණ, ඔබ පාරාජිකා ඇවතට පැමිණියෙහිය."

67 එකල්හි වනාහි ආගන්තුක භික්ෂූහු සංඝයාගේ අඹ බෙදා අනුභව කළාහුය. ආවාසිකවූ භික්ෂූහු "තෙපි ශ්‍රමණයෝ නොවූහුයයි" ඒ භික්ෂූන්ට චෝදනා කළාහුය. ඔවුන්ට සැකයක් ඇතිවිය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළාහු "මහණෙනි, තෙපි කිනම් සිතක් ඇත්තාහුදැයි" ඇසූසේක. "භාග්‍යවතුන් වහන්ස, අපි අනුභවය පිණිස ගත්තෙමු" "මහණෙනි, අනුභවය පිණිස ගැනීමෙහි ඇවැත් නැත."

68 එකල්හි වනාහි ආගන්තුක භික්ෂූහු සංඝයාගේ ජම්බු සංඝයාගේ රඹ දෙල්, සංඝයාගේ කොස්, සංඝයාගේ තල්, සංඝයාගේ උක් සංඝයාගේ තිඹිරි, බෙදා අනුභව

කළාහුය. ආවාසයෙහිවූ භික්ෂූහු ඒ භික්ෂූන්ට "තෙපි ශ්‍රමණයෝ නොවහූයයි" චෝදනා කළාහුය, ඔවුන්ට සැකයක් විය. "මහණෙනි, අනුභවයට ගැනීමෙහි ඇවැත් නැත."

69 එකල්හි වනාහි අඹ රකින්නෝ භික්ෂූන්ට අඹ ගෙඩි දෙත් (ii) භික්ෂූහු මේ අධිපතියෝ ආරක්ෂා කරන්ට සුදුස්සෝය, දෙන්ට නොසුදුස්සෝයයි සැක කරමින් නොපිළිගනිත් භාග්‍යවතුන් වහන්සේට මේ සැල් කළාහුය. "මහණෙනි, රකින්නා දීමෙහි ඇවැත් නැත."

70 එකල්හි වනාහි ජම්බු රකින්නෝ, රටදෙල් රකින්නෝ, කොස් රකින්නෝ, තල් රකින්නෝ, උක් රකින්නෝ, තිඹිරි රකින්නෝ භික්ෂූන්ට ජම්බු, රටදෙල්, කොස්, තල්, උක්, තිඹිරි දෙත්. (මෙහි 69 (ii))

71 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් සංඝයාගේ ලී තාවකාලිකව රැගෙන තමන්ගේ කාමරයෙහි බිත්තියට තැබුවේය, භික්ෂූහු "ඔබ ශ්‍රමණයෙක් නොවෙහියයි" ඒ භික්ෂුවට චෝදනා කළාහුය. ඔහුට සැකයක් ඇතිවිය. භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළේය. "මහණ ඔබ කිනම් සිතක් ඇත්තෙහිදැයි' ඇසීය. භාග්‍යවතුන් වහන්ස, මම තාවකාලික හැඟීම් ඇත්තෙමි. "මහණ, තාවකාලිකයෙහි ඇවැත් නැත."

72 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් සංඝයාගේ ජලය සොරසිතින් ගත්තේය සංඝයාගේ මැටි සොරසිතින් ගත්තේය, සංඝයාගේ රැස්කළ තණකොළ සොරසිතින් ගත්තේය. (ii) ඔහුට සැකයක් පහළවිය. "මහණ, ඔබ පාරාජිකා ඇවැතට පැමිණියෙහිය"

73 එකල වනාහි එක්තරා භික්ෂුවක් සංඝයාගේ රැස්කළ තණකොළ සොරසිතින් දැවූයේය ඔහුට සැකයක් ඇතිවිය "මහණ, පාරාජිකා ඇවැත නොවේ. දුකුළා ඇවැත වේ"

74 එකල වනාහි එක්තරා භික්ෂුවක් සංඝයාගේ ඇඳක් සොරසිතින් ගත්තේය. (මෙහි 72 (ii))

75 එකල වනාහි එක්තරා භික්ෂුවක් සංඝයාගේ පුටුවක්, සංඝයාගේ ගුදිරියක්, මෙට්ටයක් සංඝයාගේ දෙරපලුවක්, සංඝයාගේ ජනේලයක් සංඝයාගේ වක්වූ වහලේ ලීයක් සොරහිත් ඇත්තේ ගත්තේය. (මෙහි 72 (ii)

76 එකල වනාහි භික්ෂූහු එක්තරා උපාසකයකුගේ විහාරයෙහි පාවිච්චියට තිබුනු සෙනසුනක් අන්තැනක තබා පාවිච්චි කරත් ඉක්බිති ඒ උපාසකතෙමේ කෙසේ නම් පින්වතුන්වහන්සේලා අන්තැනෙක්හි පාවිච්චිය පිණිස වූවක් අන්තැනක පාවිච්චි කරත්දැයි බනියි, දොස් කියයි, නොසතුටු බස් කියයි, භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. 'මහණෙනි, අන්තැනෙක්හි පාවිච්චියට ගතයුතු දෙය අන්තැනකදී පාවිච්චි නොකළයුතුය. යමෙක් පාවිච්චි කෙළේනම් දුකුලා ඇවැත්වේ"

77 එකල වනාහි භික්ෂූහු පොහොයගෙහි ඕබිමතා නිසීදනය ගෙනයන්නෙම් සැකකරන්නාහු බිම හිඳිත්, අව යෙදද, සිවුරුද පස් තැවරුණාහුවෙත්, භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැල කළාහුය 'මහණෙනි, තාවකාලිකව ගෙනයන්නට අවසර දෙමි"

78 එකල වනාහි චම්පා නුවර ථුල්ලනන්ද භික්ෂුණිය ගේ අතවැසි භික්ෂුණිය ථුල්ලනන්ද භික්ෂුණියගේ උපස්ථායක ගෙදරට ගොස් "අපේ ආර්යාව තෙලවුලයාගුවක් බොන්නට කැමතියයි, පිසවා ගෙනගොස් ඈ එය පාවිච්චි කළාය, ඕතොමෝ දැන "ඔබ ශ්‍රමණියක් නොවෙහියයි" ඇට චෝදනා කළාය, ඇයට සැකයක් පහළවිය, ඉක්බිති ඒ භික්ෂුණිය භික්ෂුන්ට මේ කාරණය සැලකළාය භික්ෂුණීහු භික්ෂූන්ට සැල කළාහුය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. 'මහණෙනි, පාරාජිකා ඇවැත නොවේ. දැන දැන බොරු කී බැවින් පචිති ඇවතවේ"

79 එකල වනාහි රජගහනුවර ථුල්ලනන්ද භික්ෂුණිය ගේ අතවැසි භික්ෂුණියක් ථුල්ලනන්ද භික්ෂුණියගේ උපස්ථායක ගෙදරට ගොස් "අපේ ආර්යාව ඉතා රස කැවුමක් කන්ට කැමැත්තීයයි" පිසවාගෙනැවිත් ඈ අනුභව කළාය.

මි නොමේ? දැන ඇට "ඔබ ශ්‍රමණියක් නොවෙමියැයි" චෝදනා කළේය. ඇට සැකයක් පහළවිය. "මහණෙනි, පාරාජිකා ඇවත නොවේ දැන දැන බොරු කීමෙහි පචිති ඇවතවේ"

80 එකල්හි වනාහි විශාලානුවර ආයුෂ්මත් අජ්ජුකගේ උපස්ථායකවූ ගෘහපතියෙකුට දරුවන් දෙදෙනෙක් වෙත්. පුත්‍රයාද, නෑගණියගේ පුතාද යන දෙදෙනායි, ඉක්බිති ඒ ගෘහපතිතෙම ආයුෂ්මත් අජ්ජුකට 'මේ දරුවන් දෙදෙනා අතුරෙන් යමෙක් ශ්‍රද්ධාවත්ද, පැහැදුනේවේද, ස්වාමීනි, මේ ඉඩම ඔහුටයැයි කියවයි'' කීයේය. එකල්හි වනාහි ඒ ගෘහපතිගේ නෑගණියගේ පුත්‍රයා ශ්‍රද්ධාවත්වේ පැහැදුනේවේ ඉක්බිති ආයුෂ්මත් අජ්ජුක තෙමේ ''ඒ ඉඩම ඒ දරුවාට යයි'' කීයේය. හෙතෙම ඒ මස්තුවෙන් ගෘහජීවිතය සවත් ගත්තේය. දන් දීමටද පිළිවෙළ කළේය. ඉක්බිති ඒ ගෘහපතියාගේ පුත්‍රතෙමේ ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට "ස්වාමීනි, ආනන්ද ස්ථවිරයන්වහන්ස, කිමෙක්ද, පියාගේ දායාදය පුතාද, බෑනාදයි" ඇසීය. 'ඇවැත්නි, පියාගේ දායාදය, පුතායයි'' කීයේය ''ස්වාමීනි, මේ ආයස්වූ අජ්ජුක තෙමේ අපගේ මස්තුව අප දෙදෙනාගෙන් නෑනෙකුටයයි'' කියයි."ඇවැත් ආයුෂ්මත් අජ්ජුක තෙමේ ශ්‍රමණයෙක් නොවේ." ''ඉක්බිති ආයුෂ්මත් අජ්ජුක තෙමේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට ''ආයුෂ්මත් ආනන්ද මට තීන්දුවක් දෙමයි'' කීයේය. එකල්හි වනාහි ආයුෂ්මත් උපාලිද ආයුෂ්මත් අජ්ජුකගේ පක්ෂයෙහි විය. ඉක්බිති ආයුෂ්මත් උපාලි ආයුෂ්මත් ආනන්දට "ආනන්දය, යම් ස්වාමියෙකු විසින් මේ අවකාශය අසවලාට යයි කියනු ලද්දේද එය ඔහුට කියයි'' නම් හෙතෙම කිමෙක්ද වරදකට පැමිණේද?'' "ස්වාමීනි, කිසිවරදකට නොපැමිණෙයි. යටත් පිරිසෙයින් දුකුලාවක් වත් නොවේ. ඇවැත්නි, මේ ආයුෂ්මත් අජ්ජුක තෙමේ ස්වාමියා විසින් මේ අවකාශය මෙනම් නැකැත්තාටයයි කියන ලද්දේ "ඔහුට කීයේය. "ඇවැත්නි, ආයුෂ්මත් අජ්ජුකට ඇවැත් නොවේ."

81 එකල්හි බරණැස් නුවර ආයුෂ්මත් පිළින්දි වච්ඡගේ උපස්ථායක කුලයක් සොරුන් විසින් නසන ලද්දේවේ.

දරුවන් දෙදෙනෙක්ද ගෙනගියාහුමය. ඉක්බිති ආයුෂ්මත් පිළින්දිවච්ඡ ස්වාමී ඒ දරුවන් සෘද්ධියෙන් ගෙනැවිත් ප්‍රාසාදයෙහි තැබූසේක. මිනිස්සු ඒ දරුවන් දැක පිළින්දිවච්ඡ ආයුෂ්මතුන්ගේ මෙබඳු ආනුභාව ඇති සෘද්ධිමතැයි ආයුෂ්මත් පිළින්දිවච්ඡ තෙරහි පැහැදුනාහ. භික්ෂූහු කෙසේ නම් පිළින්දිවච්ඡ තෙමේ සොරුන් විසින් ගෙනයන ලද දරුවන් ගෙන එන්නේදැයි දොස් නගත්, අවමන් කරත්. භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. "මහණෙනි, සෘද්ධිමතුන්ගේ ඍද්ධිබලයෙහි ඇවැත් නොවේ."

82 එකල්හි වනාහි පණ්ඩුකද කපිලද යන භික්ෂු දෙනමක් සහළුවමින්, එක් නමක් ගාමිකයෙහි වාසය කරත්. එක්නමක් කොසඹෑවෙහි වාසය කරයි. ඉක්බිති ගාමිකයෙන් කොසඹෑවට යන අතරමග භික්ෂුව ගඟින් එතරවන කල්හි ඌරන් මරන්නන්ගේ අතින් ගැලවී ගිය මස් තෙල් ගුලියක් පයෙහි පට ලැවුණේය. ඒ භික්ෂුව අයිතිකරුවන්ට දෙන්නෙමියි අල්වාගත්තේය. අයිතිකරුවෝ ඒ භික්ෂුවට "ඔබ ශ්‍රමණයෙක් නොවෙතියයි" චෝදනා කළාහ. එතරවූ එක්තරා ගොපලු ස්ත්‍රියක් එය දැක "ස්වාමීනි, එන්න මෛථුන ධර්මයෙහි යෙදෙමු" කීවාය. හෙතෙම ස්වභාවයෙන්ම මම ශ්‍රමණයෙක් නොවෙමියි. ඈ සමග මෛථුන ධර්මයෙහි යෙදී කොසඹෑ නුවරට ගොස් භික්ෂූන්ට මේ කාරණය සැලකළේය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. "මහණෙනි, නුදුන්දේ ගැනීමෙ පාරාජිකාවට ඇවැත් නැත. මෛථුන ධර්මයෙහි යෙදීම නිසා පාරාජිකා ඇවතවේ."

83 එකල්හි වනාහි සාගලනුවර ආයුෂ්මත් දල්හික තෙරුන්ගේ ශිෂ්‍යවූ භික්ෂුවක් සිවුරු හරින්නට ආශාවූයේ වෙළෙන්දෙකුගේ හිස්වෙළුමක් සොරකම් කොට ආයුෂ්මත් දල්හික තෙරුන්ට "ස්වාමීනි, මම ශ්‍රමණයෙක් නොවෙමි සිවුරු හරින්නෙමියි" කීයේය. "ඇවැත්නි, තොප විසින් කුමක් කරණ ලද්දේදැයි" ඇසීය. හෙතෙමේ ඒ කාරණය සැලකළේ. ගෙන්වාගෙන තක්සේරු කෙළේය. එය තක්සේරු

කරද්දී මිසුපසක ද්විතාකමක් නොවීය. "ඇවැත්නි, පාරාජිකා ඇවිත නොවේදැයි" බම් කථාව කළේය. ඒ මිගණ තෙම සස්නෙහි ඇළුනේය.

(දෙවෙනි පාරාජිකාව නිමි)

---

## 9 මනුස්ස විග්ගහ පාරාජික ශික්ෂාපදය

1 එකල්හි වනාහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විශාලාමහනුවර කූටාගාර ශාලාවෙහි වාසය කරන්නේක. ඒ කාලයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට නොයෙක් ආකාරයෙන් අශුභ කථා වදාරණසේක. අශුභය. බැදුමින් ගුණ කියනසේක. අශුභ භාවනාවෙහි ගුණ කියන සේක. ඈදශී පෙන්වමින් අශුභ සමාපත්ති ලැබීමෙහි ගුණ වදාරණසේක. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ "මහණෙනි, මම අඩමසක් තනිව වාසය කරන්නට කැමැත්තෙමි. පිණ්ඩපාත ගෙන එන කෙනෙකු හැර කිසිවෙකු නොඑළඹිය යුතුය"යි ඇමතූසේක.

2 "ස්වාමිනි, එසේයයි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරුදී භාග්‍යවතුන් වහන්සේ වෙත පිණ්ඩපාතය ගෙන යන්නහු හැර කිසිවෙක් නොපැමිණෙති. භික්ෂූහු (ii) භාග්‍යවතුන් වහන්සේ වනාහි නොයෙක් ආකාරයෙන් අශුභ කථා කරති, අශුභයෙහි ගුණ කියති අශුභ භාවනාවෙහි ගුණ කියති, පෙන්වමින් අශුභ සමාපත්තියෙහි ගුණ කියති කියා ඔව්හු නොයෙක් ආකාර මිශ්‍රව අශුභ භාවනාවෙහි යෙදී වාසය කරත් ඔව්හු තමාගේ ශරීරයෙන් දුක්වෙත් ලජ්ජා වෙත්. පිළිකුල් වෙත්.

3 (i) යම්සේ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ තරුණ වූයේ තරුණකමින් යුක්තවූයේ ලක්ෂණව කැමැත්තේ නෑමෙන (පිරිසිදුවූ නාව පසු) සර්ප කුණක් හෝ බලු කුණක් හෝ, මිනිස් කුණක් හෝ බෙල්ලෙහි එල්ලෙන කල්හි පිළිකුල් වන්නේය. ලජ්ජා වන්නේය. ඉවත් කරන්නේය. එසේම ඒ භික්ෂූහු සවකීය ශරීරයෙන් පිළිකුල් වන්නාහු, ලජ්ජා වන්නාහු, ඉවත්කරන්ට සිතන්නාහු,

තමාද තමාගේ ජීවිතය තොරකර ගනියි. එකිනෙකාද දිවි තොරකර ගනිත් මිගලණ්ඩික නම්වූ ශ්‍රමණවේශධාරියා වෙත පැමිණ "ඇවැත්නි, අපගේ දිවි තොරකරන් සේක් නම් යහපත. තොපට මේ පාත්‍ර සිවුරු වන්නේයයි" මෙසේ කියත් ඉක්බිති මිගලණ්ඩික නම් ශ්‍රමණවේශධාරියා පාත්‍ර සිවුරු ලද්දේ (ii) බොහෝ භික්ෂූන් මරා ලේ තැවරුණු කඩුව ගෙන වග්ගුමුදා නම් ගඟ යම් තැනෙක්හිද එහි පැමිණියේය

4 ඉක්බිති ලේ තැවරුණ කඩුව සෝදන්නාවූ මිගලණ්ඩික නම් ශ්‍රමණවේශධාරියාට සැකයක් ඇතිවිය. පසුතැවිල්ලක් ඇතිවිය 'ඒකාන්තයෙන් මටවූයේ අලාභයෙක. ඒකාන්තයෙන් මට ලාභයක් නොවේ. ඒකාන්තයෙන් මේ මිනිසත් බව දුකසේ ලබන ලදී. මා විසින් ඒකාන්තයෙන් සුමගේ නොලබන ලදී. මා විසින් ඒකාන්තයෙන් බොහෝ අකුසල් රැස්කරණ ලදී. සම්බුදුවූ මම සිල්වත් යහපත් සවභාම ඇති භික්ෂූහු මැරූයෙම්ද එහෙයිනි.'

5 ඉක්බිති එක්තරා මාර පිරිසට අයත් දෙවතාවෙක් නොබිඳෙන ජලය මතුපිටින් විත් මිගලණ්ඩික නම් ශ්‍රමණවේශධාරියාට, "සත්පුරුෂය, යහපත යහපත, සත්පුරුෂය තට ලාභයෙක. සත්පුරුෂය, තොප විසින් යහපත්තොට මනුෂ්‍ය ජීවිතය ලබන ලදී. සම්බුදුවූ ඔබ සංසාරය තරණය නොකළවුන් ජීවිතයෙන් තොර කෙළෙහිය. තොප විසින් බොහෝ පින් රැස්කරණ ලදීයයි" කීයේය. ඉක්බිති මිගලණ්ඩික නම් ශ්‍රමණවේශධාරියා 'මට ලාභයක්ලු, මා විසින් යහපත් ලැබීමක් ලබන ලදලු සසරින් එගොඩ නොගියවුන් ජීවිතයෙන් තොර කළෙම්ද මා විසින් බොහෝ පින් රැස්කෙළේලුයි' තියුණු කඩුව ගෙන විහාරෙන් විහාරයට පිරිවෙණෙන් පිරිවෙණට ගොස "එතරනුවූයේ කවරෙක්ද? කවරෙකු එතර කෙරෙම් දැයි" කීයයි. එහි යම් ඒ කෙලෙස් පහවූ භික්ෂූහු වෙත්ද, ඔවුන්ට ඒ වේලාවෙහි බියක්වූයේය. තැති ගැනීමක් වූයේය. ලොම් කෙළින් සිටීමක් ඇතිවිය. යම් ඒ භික්ෂූ කෙනෙක් රහත්වූවාහුද, ඔවුන්ට ඒ අවස්ථාවේ බියක් නොවිය. තැති ගැනීමක් නොවිය. ලොම් කෙළින් සිටීමක් නොවිය.

6 ඉක්බිති මිගලණ්ඩික නම් ශ්‍රමණවේශධාරියා (ii) එක් භික්ෂුනමක් එක් දවසින් දිවි තොර කෙළේය. භික්ෂූන් දෙනමක් එක් දවසකින් දිවි තොර කෙළේය. භික්ෂූන් තුන් නමක්ද එක දවසින් දිවි තොර කෙළේය. භික්ෂූන් හතර නමක්ද එක දවසකින් දිවි තොර කෙළේය. භික්ෂූන් පස් නමක්, භික්ෂූන් දස නමක්, භික්ෂූන් විසි නමක්, භික්ෂූන් තිස් නමක්, භික්ෂූන් හතලිස් නමක්, භික්ෂූන් පනස් නමක්, භික්ෂූන් සැට නමක් ජීවිතයෙන් තොර කෙළේය.

7 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ අඩමස අවසානයෙහි පිළිසඳුම්වතින් නැගිසිටියේ ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට ආමන්ත්‍රණය කළසේක "ආනන්දය, කිමෙක්ද? භික්ෂු සංඝයා තුනීවූවාක් මෙන් පෙනේයයි" ස්වාමීනි, එසේමය. භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට නොයෙක් ආකාරයෙන් අශුභ කථාව කියනසේක. අශුභ කොටස්වල වණ්ණනාව කියනසේක. අශුභ භාවනාවෙහි ගුණ කියනසේක. ආදරයකොට පෙරව පෙරවා අශුභ සම්පත්තියෙහි ගුණ කියයි. ස්වාමීනි, ඒ භික්ෂූහු (මෙහි 3 (ii) 3 (i) සහ 6 (ii) සොයන්න) "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ යම්සේ මේ භික්ෂු සංඝයා දැන පිහිටන්නේද එබඳු අනික් ක්‍රමයක් දේශනා කරනසේක්වා."

8 "ආනන්දය, එසේනම් යම් පමණ භික්ෂූහු විශාලා නුවර ඇසුරුකොට වසත්ද, ඒ සියල්ලෝ උපස්ථාන ශාලාවට රැස්කරවයි" වදාළසේක. "ස්වාමීනි, එසේයයි' ආයුෂ්මත් ආනන්දතෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිතුරුදී යම්තාක් භික්ෂූහු විශාලානුවර වසත්ද, ඒ සියල්ලෝ උපස්ථාන ශාලාවට රැස්කරවා, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, සංඝයා රැස්කරවන ලදී. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ යම්කට කල් දනීවායි' කීයේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ උපස්ථාන ශාලාව යම් තැනෙක්හිද එහි පැමිණිසේක. පැමිණ පණවන ලද අස්නෙහි වැඩසිටිසේක. වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක.

9 "මහණෙනි, මේ ආනාපාන සමාධිය වඩන ලද්දේ වැඩි වශයෙන් කරණලද්දේ (ii) ශාන්තද වේ, ප්‍රණීතද වේ මධුරවේ. සැපවිහාර ඇත්තේවේ. උපනුපන් ලාමක අකුශල ධර්මයන් ක්‍රමයෙන් අතුරුදහන් වෙයි. සන්සිඳුවයි. (iii) මහණෙනි, ග්‍රීෂ්ම කාලයෙහි අන්තිම මාසයෙහි අපාලෙවෙන් නැගි ධූලි රැසිය මහත්වූ අකාලයෙහිවූ මේඝයක් ක්‍රමයෙන් නැති කරයිද, සන් සිඳුවයිද, මහණෙනි, එසේම පුරුදු කරණ ලද බහුල වශයෙන් කරණ ලද ආනාපාන සති සමාධිය (මෙහි (ii) යෝදන්න) මහණෙනි, කෙසේ වඩන ලද කෙසේ වැඩි වශයෙන් මිසින් කරණ ලද ආනාපාන සති සමාධිය ශාන්තවේද ප්‍රණීතවේද, මධුරවේද, සැප විහාර ඇත්තේද උපනුපන් ලාමක අකුශල ධර්මයන් ක්‍රමයෙන් අතුරුදහන් වෙයිද සංසිඳෙයිද"?

10 "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කැලය කට ගියේ හෝ ගසක් මුලකට ගියේ හෝ හිස් ගෙයකට ගියේ හෝ පලක් බැඳගෙන ශරීරය ඍජුව තබා සිහිය ප්‍රමුඛව තබාගෙන වාඩිවෙයි. හෙතෙම සිහි ඇතිව ආශ්වාස කරයි. සිහි ඇතිව ප්‍රශ්වාස කරයි. දික්ව ආශ්වාස කරන්නේ දික්ව (ii) ආශ්වාස කරමියි දනියි. (iii) දික්ව ප්‍රශ්වාස කරන්නේ දික්ව (iv) ප්‍රශ්වාස කරමියි දනියි (v) කොටව ආශ්වාස කරන්නේ කොටව (මෙහි (i!) කොටව ප්‍රශ්වාස කරන්නේ කොටව (මෙහි (iv) සියලු ආශ්වාස කාය මුල මැද අග ප්‍රකට කරමින් (මෙහි (ii) සියලු ප්‍රශ්වාසයන් මුල මැද අග වශයෙන් ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරයි. කාය සංස්කාර සංසිඳුවමින් (මෙහි (ii) කාය සංස්කාර සංසිඳුවමින් (මෙහි (iv) ප්‍රීතිය ප්‍රකට කරමින් (මෙහි (ii) ප්‍රීතිය ප්‍රකට කරමින් (මෙහි (iv) සැප ප්‍රකට කරමින් (මෙහි ii) සැප ප්‍රකට කරමින් (මෙහි iv) වේදනා සංඥ ප්‍රකට කරමින් (මෙහි (ii) වේදනා සංඥ ප්‍රකට කරමින් (මෙහි (iv) සංඥව එක්ව යෙදුන වේදනාව යටපත් කරමින් (මෙහි (ii) සංඥව එක්වයෙදුන වේදනාව යටපත් කරමින් (මෙහි (iv) සිත ප්‍රකටව දන්නේ (මෙහි (ii) සිත ප්‍රකටව දන්නේ (මෙහි (iv) සිත සතුටු කරවමින් (මෙහි (ii) සිත

සතුටු කරවමින් (මෙහි (iv) අරමුණෙහි සිත සමව තබමින් නීවරණ වලින් සිත මුදවමින්, අනිත්‍යය අනුව බලමින්, නොඇලීම අනුව බලමින්, නිවණ අනුව බලමින්, විදර්ශනා ඥානය බලමින්, ආශ්වාස කරයි. විදර්ශනා මාර්ගය අනුව බලමින් ප්‍රශ්වාස කරයි. මහණෙනි, මෙසේ භාවිත කරණ ලද මෙසේ බහුල වශයෙන් කරණලද ආනාපාන සමාධිය ශාන්තද ප්‍රණීතද, මිශ්‍රදවේ, සැප වාසය ඇත්තේද වේ. උපන්නාවූ ලාමක අකුසල ධර්මයන් ක්‍රමයෙන් අතුරුදහන් කරවයි. සංසිඳුවයි.

11 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි, මේ කාරණයෙහි භික්ෂු සංඝයා රැස්කරවා "මහණෙනි, මහණ කෙනෙක් තමාද තමාම මරා ගනිති එකිනෙකාද මරා ගනිත්. මිගලණ්ඩික නම් ශ්‍රමණවේශධාරියා වෙත පැමිණ (ii) "ඇවැත්නි, අප දිවියෙන් තොරකරනු මැනව, තොපට මාගේ පාත්‍රා සිවුරු වන්නේයයි (iii) මෙසේ කියන්නේ ඇත්තදැයි" ඇසූසේක. "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය." භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ නින්දා කළසේක. "මහණෙනි, ඒ භික්ෂූන්ට නුසුදුසුවූ අනුලෝම නොවූ, නොගැලපෙන ශ්‍රමණභාවයට යහපත් නොවූ අකැප, නොකටයුත්තක් කළාහුයයි කියන්නේ ඇත්තේද? මහණෙනි, කෙසේ නම් ඒ භික්ෂූහු තමා විසින්ද තමාගේ දිවි තොරකරන්නාහුද, එකිනෙකාද දිවි තොරකර ගනිද්ද, මිගලණ්ඩික නම් ශ්‍රමණවේශධාරියා වෙත පැමිණ (මෙහි (ii) මෙසේ කියත්. මහණෙනි, මෙය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිස (මෙහි 2 පාරාජිකයෙහි 4 ඡේදයේ (ii) මෙය යන තැන සිට යොදන්න) මෙසේද වනාහි මේ ශික්ෂාපදය උදෙසව්.

"යම්කිසි භික්ෂුවක් දැන දැන මනුෂ්‍ය ශරීරයක් ජීවිතයෙන් තොරකරයිද ආයුධ මෙයින් මරා ගනීවායි ආයුධ සොයා ලන සොයයිද මේද ආශ්‍රයට නුසුදුසු පාරාජිකා වූයේවේ" මෙසේද වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට ශික්ෂාපදය පණවන ලදී.

12 එකල්හි වනාහි එක්තරා උපාසකයෙක් ගිලන්වූයේ වේ. ඔහුගේ භාර්යාතොමෝ මනාරූ ඇත්තී, දැකුම්කළුවූවා,

සතුට ගෙනදෙන්නියක් මේ. සවග භික්ෂූහු ඒ ස්ත්‍රිය කෙරෙහි ආදරයෙන් බැඳුනාහුය. ඉක්බිති සවග භික්ෂූන්ට ඇවැත්නි, ඉදින් ඒ උපාසක තෙමේ ජීවත්වන්නේද, අපි ඒ ස්ත්‍රිය නොලබන්නෙමු ඇවැත්නි, දැන් අපි ඒ උපාසකයාට මරණයෙහි ගුණ කියමුයි" සවග භික්ෂූන්ට මේ සිතවිය.

13 ඉක්බිති සවග භික්ෂූහු ඒ උපාසක තෙමේ යම් තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ ඒ උපාසකයාට "උපාසකය, (ii) ඔබ කරණ ලද යහපත ඇත්තෙහිය. කරණ ලද කුසල් ඇත්තෙහිය, කරණලද භය දුරුකිරීම් ඇත්තෙහිය. නොකරණ ලද පවු ඇත්තෙහිය, නොකරණ ලද රෞද්‍ර කම් ඇත්තෙහිය, නොකරණ ලද කපුරු දෙය ඇත්තෙහිය, ඔබ විසින් යහපතක් කරණ ලදී. ඔබ විසින් පාපයක් නොකරණලදී ඔබට මේ ලාමක කපුරු ජීවිතයෙන් කිනම් ප්‍රයෝජනද? තොපට ජීවත්වීමට වඩා මරණය ශ්‍රේෂ්ඨයයි" කීවාහුය. "ඔබ මෙයින් කළුරිය කොට ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදින්නෙහිය. එහි දිව්‍යමය වූ පස්කම් සැපයෙන් සතුටුව යුක්තව පිරිවරන් කෙළිය" (iii)

14 ඉක්බිති ඒ උපාසක තෙමේ ආර්යයෝ ඇත්තන්ම කීවාහුය. මෙහි මනාසි (මෙහි 13 (ii) යොදන්න. "ඔබ" වෙනුවට "තුඹ" යොදන්න) සෙතෙමේ අයහපත් වූ ආහාර අනුභව කෙළේය. අයහපත් වූ කෑ යුතු දෙය කෑයේය. අයහපත් වූ රස විඳ යුතු දේ රස වින්දේය. අයහපත් වූ මතුර බීවේය. අයහපත් භෝජන බුදිනා, අයහපත් කෑම කනා, අයහපත් රස විඳිනා, අයහපත් මතුර බොනා ඔහුගේ ලෙඩය උත්සන්න විය. හෙතෙම ඒ අසනීපයෙන්ම කළුරිය කෙළේය.

15 ඔහුගේ භාර්යාතොමෝ (ii) "මේ ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ සිල් නැත්තාහ, දුශ්ශීලයෝය, බොරු කියන්නාහුය. මොවුහු 'ධර්මචාරීය, ධාර්මික පැවතුම් ඇත්තාහ. බඹසර ඇත්තාහ. සත්‍ය කියන්නාහ. සීලවන්තය, යහපත්ය' කියා, [illegible] (ii) මොවුන්ට ශ්‍රමණ භාවයක් නැත. මොවුන්ට බ්‍රහ්මචාරී බවක් නැත, මොවුන්ගේ ශ්‍රමණ භාවය නැති

විය, මොවුන්ගේ බ්‍රහ්ම භාවය නැති විය, මොවුන්ට ශ්‍රමණ භාවයක් කොයින්ද? මොවුන්ට බ්‍රහ්ම භාවයක් කොයින්ද? මොවුහු ශ්‍රමණ භාවයෙන් පහවූවාහ මොවුහු බ්‍රහ්ම බැවින් පහවූවාහ. (iv) මොවුහු මගේ ස්වාමියාට මරණයෙහි ගුණ කිවාහුය, මොවුන් විසින් මගේ ස්වාමියා මරණ ලදී."

16 සෙසු මනුෂ්‍යයෝද, (මෙහි 15 (ii) නොසතුටු බස් කියත්. දොස් කියත්. නොසතුට ප්‍රකාශ කරත්. (මෙහි 15 (iii) මොවුහු උපාසකයෙකුට මරණයෙහි ගුණ කිවාහුය. මොවුන් විසින් උපාසකයෙකු මරණ ලද්දේයයි කිවාහුය.

17 භික්ෂූහු නොසතුටු බස් කියන, දොස් කියන, නොසතුට ප්‍රකාශ කරණ ඒ මනුෂ්‍යයන්ගේ වචන ඇසූහ යම් ඒ භික්ෂු කෙනෙක් අල්පේච්ඡද ඔවුහු නොසතුටු බස් කියත්, දොස් කියත්, නොසතුට ප්‍රකාශ කරත්, කෙසේ නම් සවග භික්ෂූහු උපාසකයෙකුට මරණයෙහි ගුණ කියත්දැයි? ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැල කළාහුය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ සිද්ධියෙහි—

'යම්කිසි මහණෙක් දැන දැන මනුෂ්‍ය ශරීරයක් ජීවිතයෙන් තොර කරන්නේද (ii) ඔහු සමීපයෙහි (මෙයින් මැරෙතීවායි සිතා) ආයුධ කැබිත්තක් හෝ කරන්නේද, මරණයෙහි ගුණය හෝ කියන්නේද, (මරණයෙහි සතුටු කරවයිද) (iii) එම්බා පුරුෂය, තොපට මේ පවිටු කපුරු ජීවිතයෙන් කිනම් ප්‍රයෝජනයක්ද, තොපට ජීවත්වීමට වඩා මියෙල් නම් යහපතැයි" (මෙහි (ii)) මෙසේ සිත ඇත්තේ සිතේ අදහස් ඇත්තේ නොයෙක් ආකාරයෙන් මරණයෙහි ගුණ කියයිද, මරණයෙහි සමාදන් කරවයිද මේද පැරදුනේ වේ. ආශ්‍රයට නුසුදුසු කෙනෙවි.

## 10 පදභාජනීය

1 යමෙක් වනාහි යනු (මෙහි 1 පාරාජිකයෙහි සන්ථත බඤ්ඤවරේ 56 ඡේදය සොයන්න) "සඤ්චිච්ච" යනු දැනගෙන "මරමි" යි දන්නේ, අදුනන්නේ, සිතා, දුරුකර ඉක්මවීමයි

2 මනුෂ්‍ය ශරීරය නම් මවු කුස තම පළමුවෙනි සිතක් පහළ වූයේද, මුල් සිතක් පහළවූයේද, මැරෙන කාලය දක්වා මේ අතරෙහිවූ මේතෙම මනුෂ්‍ය ශරීරය නම් වේ.

3 ජීවිතයෙන් තොරකරන්නේය යනු ජීවිතේන්ද්‍රිය සිඳීම වළක්වයි. පරම්පරාව විනාශ කරයි. ඔහු සමීපයෙහි ආයුධ තැබීමක් හෝ කරන්නේය යනු කඩුවක් හෝ, බයිනෙත්තුවක් හෝ බෝලයක් හෝ, පොල්ලක් හෝ, ගලක් හෝ ආයුධයක් හෝ විසයක් හෝ මැලක් හෝ යනුයි.

4 මරණයෙහි ගුණ කියන්නේය යනු ජීවිතයෙහි දෝෂය දක්වයි. මරණයෙහි ගුණය කියයි.

5 මරණයෙහි හෝ සමාදන් කරවයි යනු ආයුධයක් හෝ ගෙනෙව, විසයක් හෝ කව, රැහැනින් හෝ එල්ලී කළුරිය කරවයි කියයි.

6 එම්බා පුරුෂය, යනු මෙය ආලපන වචනයකි.

7 තොපගේ මේ පවිටු කාදුරු ජීවිතයෙන් කිනම් ප්‍රයෝජනයක්දැයි පවිටු ජීවිතය නම් පොහොසතුන්ගේ ජීවිතයට වඩා දිළිඳුන්ගේ ජීවිතය ලාමකය, ධනවතුන්ගේ ජීවිතයට සමාන කරණ කල ධනය නැත්තන්ගේ ජීවිතය ලාමකය. දෙවියන්ගේ ජීවිතයට සමාන කරණ කල මනුෂ්‍යයන්ගේ ජීවිතය ලාමකය.

8 දුකයේ ජීවත්වීම නම් අත සිඳුනහුගේ පා සිඳුනහුගේ අත් පා, සිඳුනහුගේ කණ, සිඳුනහුගේ නාසය, සිඳුනහුගේ කණ, නාසය, සිඳුනහුගේ මේ ලාමක කමින් මේ දුඃඛ ජීවිතයෙන් ජීවත්වීමට වඩා තොපට මරණය යහපත් යයි කියයි.

9 තමාගේ සිත හා මනස ඇත්තේ යනු යම් කිසි සිතක් වේද එය මනස නම්වේ. යම් මනසක් වේද එය සිතවේ.

10 සිතේ අදහස යනු මරණ හැඟීම, මරණ සිතිවිල්ල මරණ අදහස යනුයි.

11 නොයෙක් ආකාරයෙන් යනු උසස් පහත් ක්‍රම වලින් යනුයි.

13 "මරණයෙහි ගුණ හෝ වර්ණනා කරන්නේය" යනු ජීවිතයෙහි දොෂය දක්වමින්, මරණයෙහි ගුණය කියා, ඔබ මින් කළුරිය කළේ ශරීරය බිඳීමෙන් මරණින් මතු යහපත් සුගති ලෝකයෙහි උපදින්නෙහිය. එහි දිව්‍යමය වූ පංචකාම සම්පත්තියෙන් යුක්තවූයේ පිරිවරන්නෙහිය.

13 "මරණයෙහි හෝ සමාදපන් කරමයි" යනු ආයුධයක් හෝ ගෙනෙව, විෂ හෝ කම, රැහැනින් හෝ එල්ලී කළුරිය කරව, දියෙහි ගිලී හෝ දුක්දෙක නැසෙව හෝ ප්‍රපාතයක හෝ වැටෙවයි යනුයි. මේද යනු පෙර පාරාජිකාවේ කීසේ යයි.

14 "පැරදුනේවේ" යනු යම්සේ මහත් ගලක් දෙපළුව බිඳුනාහු ගලපන්ට නොහැක්කේ වේද එසේම [illegible] දැන දැන මිනිස් ශරීරයක් ජීවිතයෙන් තොරකර ශ්‍රමණ භාවයෙන් නුසුදුස්සෙක් වේ, ශාක්‍යපුත්‍ර භාවයෙන් නුසුදුස්සෙක් වේ. එහෙයින් පාරාජිකා වේයයි කියනු ලැබේ.

15 "ආශ්‍රයට සුදුසු නොවේය" යනු සංවාසය නම් එකට සංඝ කර්ම, එකට පෙළගැසීම, සමාන ශික්ෂාව, මේ සංවාස නම් වේ. එය ඔහු සමග නැත, එහෙයින් ආශ්‍රයට නුසුදුසු යයි කියනු ලැබේ.

16 කයෙන්, සිතින්, දූතයා විසින්, දූත පරම්පරාවෙන්, නියම කරන ලද දූතයා විසින්, ගිය ආපසු ආ දූතයා විසින් රහසිගත නොවූ රහසිගතය යන හැඟීම් ඇති, රහසිගතවූ රහසිගත නොවූ හැඟීම් ඇති, රහසිගත නොවූ රහසිගත නොවූ හැඟීම් ඇති, රහසිගතවූ රහසිගත හැඟීම් ඇති කයින් වර්ණනා කරමයි, වචනයෙන් වර්ණනා කරමයි, කයින් වචනයෙන් වර්ණනා කරමයි. දූතයා ලවා වර්ණනා කරමයි ලිපියෙන් වර්ණනා කරමයි, පොරුවල ලෙස්සුවන ගල්ල, ලග තැබීම, අබගෙන, රූපය තැබීම, ශබ්දය තැබීම, ගන්ධය තැබීම, රසය තැබීම, ස්පර්ශය තැබීම, ධර්මය තැබීම, කීම, අනුශාසනා කිරීම, සලකුණු කීම, නිමිති කීම යන මේ ක්‍රමයන්හිද දත යුතුයි.

17 "තනේ" යනු ශරීරයෙන් හෝ ශරීරය පිළිබඳ දෙයකින් හෝ දමාගැසීමෙන් හෝයි.

18 "සිතා" යනු, සිතා තා නියම කරයි. මෙසේ විදුව, මෙසේ ගසව, මෙසේ මරවයි යෙදී.

19 (i) මෙනම ඇත්තා මරවයි භික්ෂුවක් භික්ෂුවකට නියම කරයිද දුකුලා ඇවැත් වේ. (ii) හෙතෙම ඔහු සිතා ත් ඔහු මරයි, දෙදෙනාටම පාරාජිකා ඇවැත් වේ.

20 (මෙහි 19 (i) හෙතෙම එය සිතමින් අනිකෙකු මරයි. මූලිකයාට ඇවැත් නොවේ. මැරූවහුට පාරාජිකා ඇවැත් වේ.

21 (මෙහි 19 (i) හෙතෙම අනිකෙකු සිතන්නේ ඔහු මරයි. දෙදෙනාටම පාරාජිකා ඇවැත වේ.

22 (මෙහි 19 (i) හෙතෙම අනිකෙකු සිතන්නේ අනිකෙකු ජීවිතයෙන් තොරකරයි. මූලිකයාට ඇවැත් නොවේ. මැරූවහුට පාරාජිකා ඇවැත් වේ.

23 (i) භික්ෂුවක් භික්ෂුවකට අසවලාට කියව, අසවලා අසවලාට කියවා අසවලා අසවලාම මරවායි අණ කරයිද දුකුලා ඇවැත් වේ. (ii) හෙතෙම අනෙයාට කියයි, දුකුලා ඇවැත් වේ. මරන්නා පිළිගනී. මූලිකයාට ථුල්ලස ඇවැත් වේ. හෙතෙම ඔහු මරයි, සියල්ලන්ට පාරාජිකා ඇවැත් වේ.

24 (මෙහි 23 (i) හෙතෙම අනිකෙකුට අණවයි. දුකුලා ඇවැත් වේ. මරන්නා පිළිගනී. මූලිකයාට ථුල්ලස ඇවැත් වේ. අණවන්නාටද මරන්නාටද පාරාජිකා ඇවැත් වේ

25 (i) භික්ෂුවක් භික්ෂුවකට අසවලා මරවයි අණ කරයිද දුකුලා ඇවැත් වේ. (ii) හෙතෙම ගොස් මම ඔහු මරන්නට නොහැක්කෙමියි හැරී එයි. හෙතෙම යම් දවසක හැක්කේ නම් එද ඔහු මරවයි කියා නියම කරයිද දුකුලා ඇවැත් වේ, හෙතෙම ඔහු මරයි, දෙදෙනාටම පාරාජිකා ඇවැත් වේ.

26 (මෙහි 25 (i) හෙතෙම අණවා පසුතැවුණේ නොමරවයි නොකියයි. ඔහු මරයි දෙදෙනාටම පාරාජිකා ඇවැත් වේ.

27 (මෙහි 25 (i) හෙතෙම අණවා පසුතැවුණේ නොමරවයි අස්වයි, එහෙත් හෙතෙම තා විසින් නියම කරණ ලද්දේයයි මරයි. මූලිකාට ඇවැත් නොවේ. මරන්නාට පාරාජිකා ඇවැත් වේ.

28 (මෙහි 25 (i) හෙතෙම අණවා පසුතැවිලිව නොමරණයයි දන්වයි. හෙතෙම යහපතැයි ඇත්වෙයි. දෙදෙනාටම ඇවැත් නොවේ.

29 අභිමුඛයෙහිවූ තැනැත්තා අනභිමුඛයෙහි සහ හැඟීම ඇතිව 'මේනම් ඇත්තේ මැරුණේ මන්නේයයි' කථාකරයි. දුකුලා ඇවැත් වේ. අනභිමුඛයෙහිවූ තැනැත්තා අභිමුඛයෙහිවූ ලෙස 'අසෝ අසවලා මැරුණෝ මන්නේයයි' කථා කරයි. දුකුලා ඇවැත් වේ. අභිමුඛයෙහි වූයේ, අනභිමුඛයෙහිවූ හැඟීම් ඇතිව අසෝ අසවලා මැරුණෝ මන්නේයයි කථා කරයි. දුකුලා ඇවැත් වේ. අනභිමුඛයෙහි නොවූයේ අනභිමුඛයෙහි නොවූ අදහස් ඇතිව 'අසෝ අසවලා මැරුණෝ මන්නේයයි' කථා කරයි. දුකුලා ඇවැත් වේ

30 "කායින් වර්ණනා කරයි" යනු යමෙකු මෙසේ මරයි නම් හෙතෙම ධනය හෝ ලබයි. කීර්තිය හෝ ලබයි. ස්වර්ගයට හෝ යයි කියා කායින් විකාරයක් පෙන්වයි (ii) දුකුලා ඇවැත් වේ ඒ විකාරයෙන් මරන්නෙමියි දුක්වූ වේදනාවක් උපදවයි. ථුලසි ඇවැත් වේ මැරේද පාරාජිකා ඇවැත් වේ.

31 'වචනයෙන් විස්තර කිරීම'' නම් යමෙකු මෙසේ මරයිද ධනය හෝ ලබයි. කීර්තිය හෝ ලබයි. ස්වර්ගයට හෝ යන්නේයයි වචනයෙන් කීමද (මෙහි 30 (ii) ඡේදය යොදන්න)

32 කායින් හා වචනයෙන් විස්තර කිරීම නම් යමෙකු මෙසේ මරයිද, ධනය හෝ ලබයි. කීර්තිය හෝ ලබයි ස්වර්ගයට හෝ යන්නේයයි කායින්ද විකාරයක් අඟවයි. වචනයෙන්ද කියයි. (මෙහි 30 (ii) ඡේදය යොදන්න.)

33 "දූතයෙකු ලවා විස්තර කිරීම" නම් දූතයාට පණිවුඩයක් කියයි යමෙකු මෙසේ මරයි නම් (ii) හෙතෙම ධනය හෝ ලබන්නේය කීර්තියත් හෝ ලබන්නේය. ස්වර්ගයට හෝ යන්නේයයි (iii) කියයි දුකුලා ඇවැත් වේ දූතයාගේ පණිවුඩය අසා මරන්නෙමියි (iv) දුක් වේදනාවක් උපදවයි ථුලසි ඇවැත් වේ. මැරේද පාරාජිකා වේ.

34 ලිපියෙන් විස්තර කරයි යනු යමෙක් මෙසේ මරයිද (මෙහි 33 (ii) අකුරින් අකුරට දුකුළා ඇවැත් වේ. ලියුම් දුන මැරෙන් නම්හි (මෙහි 33 (iv)

35 "බොරුවල" නම් වැටී මැරෙන්නේයයි මිනිසෙකු නිසා වළක් සාරයි. දුකුළා ඇවැත් වේ. (ii) වැටුනු කල්හි යම් කිසිවෙක් වැටී මැරේවායි ඒසම නොසොයා වළක් සාරයිද දුකුළා ඇවැත් වේ. මිනිසෙක් එහි වැටේද දුකුළා ඇවැත් වේ. වැටුන කල්හි (මෙහි 33 (iv)

36 යක්ෂයෙක් හෝ ප්‍රේතයෙක් හෝ තිරිසන්ගතයෙක් මිනිස් ශරීරයක් හෝ එහි වැටේද දුකුළා ඇවැත් වේ. වැටුන කල්හි දුක් වේදනාවක් උපදීද දුකුළා ඇවැත් වේ, මැරෙයිද ථුල්ලස් ඇවැත් වේ. තිරිසන්ගත සත්වයෙක් එහි වැටේද දුකුළා ඇවැත් වේ, වැටුන කල්හි දුක් වේදනාවක් උපදීද දුකුළා ඇවැත් වේ. මැරෙයිද පචිති ඇවැත් වේ.

37 හේත්තුවන පුවරුව නම්- හේත්තුවන පුවරුවෙහි ආයුධයක් හෝ තබයිද, විෂ හෝ තවරයිද, දුර්වල හෝ කරයිද, වැටී මැරෙන්නේයයි, වළක් හෝ දුක්දෙන තැනක හෝ ප්‍රපාතයක හෝ තබයිද දුකුළා ඇවැත් වේ. ආයුධයකින් හෝ විෂයකින් හෝ වැටීමකින් හෝ (මෙහි 33 (iv)

38 සමීපයෙහි තැබීම නම්- කඩුවක් හෝ ඊහිලත්තුවක් හෝ අඩයටියක් හෝ පොල්ලක් හෝ ගලක් හෝ ආයුධයක් හෝ විෂක් හෝ වැලක් හෝ මෙයින් මැරේවායි එලමින් තබයිද දුකුළා ඇවැත් වේ. ඉන් මරන් නම්හි (මෙහි 33 (iv)

39 බෙහෙත් නම්- ගිතෙල් හෝ වෙඬරු හෝ තලතෙල් හෝ මී හෝ මීපැණි හෝ මෙය රස විඳමින් මැරෙන් නම්හි දෙයි. දුකුළා ඇවැත් වේ, එය රස විඳි කල්හි මෙහි (33 (iv)

40 රූප ඉදිරියට ගෙන තැබීම නම්- මෙය දැක තැති ගැනී මැරේවායි නොමනාප රූපයක් එලවා තබයි. දුකුළා ඇවැත් වේ එය දැක ත්‍රස්තවේද ථුල්ලස් ඇවැත් වේ මැරේද, පාරාජිකා වේ. මෙය දැක නොලැබුනහු විසින් සුසුම්ලා මැරේ යයි, මනාප රූපයක් එල්වා තබයිද (ii) ථුල්ලස් ඇවැත් වේ. මැරෙයිද පාරාජිකා වේ.

41 ශබ්දය ඉදිරිපත් කිරීම නම්- භයානකවූ භය අරමුණු ඇත්තාවූ මෙන් අසා තැතිගනී මැරේමැයි නොමනාප ශබ්දයක් ඉදිරිපත් කරයි. දුකුලා ඇමැත් වේ ඒ ශබ්දය අසා තැතිගනීද (මෙහි 40 (ii) මෙන් අසා කොලැබීමෙන් විඳලී මැරෙන්නේයයිද ප්‍රේම කටයුතු සිතව මිදින ශබ්දයක් ඉදිරිපත් කරයි, දුකුලා ඇමැත්වේ. එය අසා කොලැබීමෙන් මියලෙයි (මෙහි 40 (ii)

42 ගඳ ඉදිරිපත් කිරීම නම් පිළිකුල් කටයුතු අප්‍රියවූ නොමනා ගඳක් එලවයි. මෙය ආඝ්‍රාණය කොට පිළිකුල් බැවින්, අප්‍රිය බැවින් මැරේමැයි කියයි. දුකුලා ඇමැත්වේ. එය ආඝ්‍රාණය කළ කල්හි පිළිකුල් බැවින්, අප්‍රිය බැවින් දුක් වෙදනාවක් උපදී. (මෙහි 40 (ii) මෙය ආඝ්‍රාණය කොට කොලැබීමෙන් විඳලී මැරෙන්නේයයි යහපත් ගඳක් ඉදිරිපත් කරයිද, දුකුලා ඇමැත්වේ. එය ආඝ්‍රාණය කොට කොලැබීමෙන් මියලෙයි (මෙහි 40 (ii)

43 රස ඉදිරිපත් කිරීම නම්- මෙය රස විඳ පිළිකුල් බැවින් අප්‍රිය බැවින් මැරෙන්නේයයි පිළිකුල්වූ අප්‍රියවූ රසයක් ඉදිරිපත් කරයි. දුකුලා ඇමැත්වේ. එය රසවින්ද කල්හි පිළිකුල් බැවින් අප්‍රිය බැවින් දුක් වෙදනාවක් උපදී. (මෙහි 40 (ii) මෙය රසවිඳ කොලැබීමෙන් විඳලී මැරෙන්නේ ප්‍රිය රසයක් ඉදිරිපත් කරයි. දුකුලා ඇමැත්වේ. එය රසවිඳ කොලැබීමෙන් මියලෙයි. (මෙහි 40 (ii)

44 ස්පර්ශය ඉදිරිපත් කිරීම නම් මින් ස්පර්ශ කරමින් මැරෙන්නේමයි දුක් දෙන ස්පර්ශ ඇති කෲර ස්පර්ශ ඇති අයහපත් ස්පර්ශයක් ඉදිරිපත් කරයි. දුකුලා ඇමැත්වේ. ඉන් ස්පර්ශ කළහුව (මෙහි 33 (iv) මින් ස්පර්ශ කළේ කොලැබ විඳලී මැරෙන්නේයයි යහපත් ස්පර්ශයක් ඉදිරිපත් කරයි. දුකුලා ඇමැත්වේ. ඉන් ස්පර්ශ කළේ කොලැබීමෙන් මිය ලෙයි. (මෙහි 40 (ii)

45 ධර්මය ඉදිරිපත් කිරීම නම්- මෙය අසා තිරිසන් මැරෙන් [illegible] ෂවිකළහුව කරන දුක්දෙන කථා කියයි. දුකුලා ඇමැත්වේ. එය අසා තැතිගනී. (මෙහි 40 (ii) යහපත් ක්‍රියා

ඇත්තාහට මෙසේ අසා දිව්‍ය සැපට ඇලී කළුරිය කරන්නේ නම් ස්වර්ග සැප කියයි. දුකුළා ඇවැත්වේ. එය අසා ඇලී මැරෙන්නේනම්යි (මෙහි 33 (iv)

46 කීම- නම් විචාළුකල්හි මෙසේ මරනුයි. යමෙක් මෙසේ මරයිද හෙතෙම ධනය හෝ ලබයි. කීර්තිය හෝ ලබයි. දිව්‍ය ලෝකයට හෝ යයි කියා විචාළු කල්හි කියයි. දුකුළා ඇවැත් වේ ඒ කීමෙන් මරන්නේ නම්යි (මෙහි 33 (iv)

47 අනුශාසනාව නම් යමෙක් මෙසේ මරානම් හෙතෙම ධනය හෝ ලබයි, යසස හෝ ලබයි ස්වර්ගයට හෝ යයි නොවිචාරණ ලද්දේ කියයිද, දුකුළා ඇවැත්වේ. ඒ අනුශාසනාවෙන් මරන්නේනම්යි (මෙහි 33 (iv)

48 ලකුණු කිරීම- ඔහුට පෙර හෝ ඔහුට පසු හෝ රූ හෝ දමල් හෝ ඒ ලකුණින් ඔහු මරමියි ලකුණක් කෙරේද, දුකුළා ඇවැත්වේ. ඒ සලකුණින් ඔහු මරයිද දෙදෙනාටම පාරාජිකා ඇවැත්වේ. එය ලකුණට පෙර හෝ පසු හෝ ඔහු මරයිද පළමු මැත්තාට ඇවැත් නොවේ. මැරැවිහුට පාරාජිකා ඇවැත්වේ.

49 නිමිති කිරීම- නම් ඇස හෝ හසන්නෙමි. බැම හෝ ඔසවන්නෙමි. හිස හෝ ඔසවන්නෙමි. ඒ කරුණින් ඔහු මරවයි. නිමිත්තක් කරයි. දුකුළා ඇවැත්වේ. ඒ කරුණින් ඔහු මරයි. දෙදෙනාටම පාරාජිකා ඇවැත්වේ. ඒ නිමිත්තට පෙර හෝ පසුව ඔහු මරයි. පළමුමැත්තාට ඇවැත් නොවේ. මැරැවහුට පාරාජිකා ඇවැත්වේ. නොසිතා නොදන්නාහට ම ,, අදහස නැත්තාහට, උමතුවූවහුට, මුලින් වරදකළ තැනැත්තාට ඇවැත් නොවේ. මිනිස් ශරීරය නැතිකිරීමෙන් පාරාජිකාවේ. (මුල් බණවරයි )

## 11 දෙවෙනි බණවර

1 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ලෙඩවූයේ වේ; භික්ෂූහු ඔහුට කරුණාවෙන් මරණයෙහි ගුණ වණිනා කළාහුය. ඒ මහණතෙම කළුරිය කොළේය. (ii) ඔවුන්ට සැකයක් පහළවිය. කිමෙක්ද? "අපි පාරාජිකා වූවමුදැයි

කීහ. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. (iii) මහණ, නොපි පාරාජිකා ඇවතට පැමිණියාහුය.

2 එකල්හි මහාහි එක්තරා පිඩු පිණිස හැසිරෙන භික්ෂුවක් මාසිකමවකගේ පුටුවක පෙරද්දක්හි වැසූ දරුවෙකු උඩ වාඩිවූයේ එයින් දරුවා මළේය. (මෙහි 1 (ii) මහණ, පාරාජිකා ඇවත නොවේ. මහණෙනි, නොසා නොබලා අස්නෙක්හි වාඩිනොවිය යුතුයි. යමෙක් වාඩිවේ නම් දුකුලා ඇවැත්වේ.

3 එකල්හි මහාහි එක්තරා භික්ෂුවක් දානශාලාමෙහි ඇතුළෙහි අසුනක් පනවන්නේ මෝල් එසවූ කල්හි එක් මෝලක් අල්වා ගත්තේය. දෙවැනි මෝල පෙරලී එක්තරා දරුවෙකු මත වැටුනේය. හෙතෙම කළුරිය කළේය (මෙහි 1 (ii) ) (ii) "මහණ, ඔබට කිනම් සිතක් ඇතිවූයෙහිද?" "භාග්‍යවතුන් වහන්ස, මා නොදැනය." "මහණ, නොසිතා කළදේට ඇවැත් නැත.

4 එකල්හි මහාහි එක්තරා භික්ෂුවක් දානශාලාමෙහි ඇතුළෙහි අස්නක් පනවන්නේ මංගෙඩියක් හැපී වැටුණේය එක්තරා දරුවෙකු මත වැටී මළේය. (මෙහි 1 (ii) සහ 3 (ii) )

5 එකල්හි වහාහි පියාද පුත්‍රයාද භික්ෂූන් කෙරෙහි පැවිදිවූවාහුමෙත්. කල් දැන්වූ කල්හි "ස්වාමීනි වඩින්න, භුඹවහන්සේ සංඝයා වදින්නැයි කියා පිටින් අල්වා පහත් කෙළේය. හෙතෙම වැටී කළුරිය කළේය. (ii) (මෙහි 1 (ii) සහ 3 (iii) )

6 (i) එකල්හි වහාහි පියා සහ පුත්‍රයා භික්ෂූන් අතර පැවිදිවූවාහුමෙත්. කල් දැන්වූ කල්හි පුත්‍රයා පියාට "ස්වාමීනි යන්න ඔබ සංඝයා වදින්නැයි" කියා මරණ අදහසින් පිටින් අල්වා පහත් කෙළේය. (ii) හෙතෙම වැටී කළුරිය කළේය. (මෙහි 1 (ii) ) මහණ, ඔබ පාරාජිකාවූයෙහිය.

7 (මෙහි 6 (i) ) හෙතෙම වැටී කළුරිය නොකෙළේය. (මෙහි 1 (ii) ) මහණ, පාරාජිකා ඇවත නොවේ. ථුලසි ඇවැත්වේ.

8 (i) එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් වළඳද්දී මස් ඇටබෙල්ලෙක් උගුරෙහි රැඳුණේය (ii) එක්තරා මහණෙක් ඒ භික්ෂුවගේ බෙල්ලට පහරක් දුන්නේය. ලේ සහිත මස වැටුණේය. ඒ මහණතෙම කළිරිය කෙළේය (මෙහි 1 (ii)) මහණ, මරණ අදහසක් නැත්තාහට ඇවැත් නොවේ

9 (මෙහි 8 (i)) (ii) එක්තරා මහණෙක් මරණ අදහසින් බෙල්ලට පහරක් දුන්නේය. ලේ සහිත මස වැටුණේය. (iii) ඒ මහණතෙම කළිරිය කෙළේය. (මෙහි 1 (ii)) මහණ, ඔබ පාරාජිකා ඇවතට පැමිණියෙහිය.

10 (මෙහි 8 (i) සහ 9 (ii) ඒ මහණතෙම කළිරිය නොකෙළේය. (මෙහි 1 (ii)) මහණ, පාරාජිකා ඇවත නොවේ. ථුලසි ඇවතවේ.

11 එකල්හි වනාහි එක්තරා පිඬු සිඟීම හැසිරෙන භික්ෂුවක් විෂමිශ්‍ර පිණ්ඩපාතයක් ලැබ ආපසු ගෙනවුත් භික්ෂූන්ට ප්‍රථම කොටස වශයෙන් දුන්නේය ඒ භික්ෂූහු කළිරිය කළාහුය. (මෙහි 1 (ii)) "මහණ, ඔබ කිනම් සිතක් ඇත්තෙහිද්දැයි" ඇසූසේක. "භාග්‍යවතුන් වහන්ස, මම නොදනිමියි" කීයේය. "මහණ, නොදන්නාහට ඇවැත් නොවේ."

12 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් පරීක්ෂාකරණ අදහසින් එක්තරා භික්ෂුවකට විසක් දුන්නේය. ඒ මහණතෙම කළිරිය කෙළේය. (මෙහි 1 (ii)) "මහණ, ඔබ කිනම් අදහසක් ඇත්තෙහිද්දැයි" ඇසූසේක. "භාග්‍යවතුන් වහන්ස, මම පරීක්ෂාකරණ අදහස ඇතියෙමි. මහණ පාරාජිකා ඇවැත් නොවේ ථුලසි ඇවැත්වේ.

13 එකල්හි වනාහි අලවුරට භික්ෂූහු විහාර ඉඩමක් සකස්කරති, එක්තරා භික්ෂුවක් යට හාගසමින් ගලක් උඩට ඔසවති උඩ සිටි භික්ෂුවගෙන් අත ඇරුණු ගල යට සිටි භික්ෂුව මත වැටුණේය. ඒ මහණ තෙමේ කළිරිය කළේය (මෙහි 1 (ii)) (ii) මහණ නොදැන කළෙද්ව ඇවැත් නැත

14 එකල්හි වනාහි අලවුරට භික්ෂූහු විහාර ඉඩමක් කරන්නාහු එක්තරා භික්ෂුවක් යට සිට ගලක් ඔසවති. උඩ

සිටි මහණතෙමේ මරණ අදහසින් යට සිටි භික්ෂුව මත හෙළ ගසලීය. (ii) ඒ භික්ෂුව කළුරිය කෙළේය. (මෙහි 1 (ii)) මහණ, පාරාජිකා වෙයි.

15 (මෙහි 15 (i)) ඒ භික්ෂුව කළුරිය නොකෙළේය. (මෙහි 1 (ii)) "මහණ පාරාජිකා ඇවැත නොවේ. ථුල්ලච්චය ඇවැත්වේ"

16 (i) එකල්හි එක්තරා අලවු නුවර වැසි භික්ෂූහු විහාරයකට බිත්තියක් බඳිත්, එක්තරා භික්ෂුවක් යට සිට ගඩොල් උඩට දෙයි (ii) උඩ සිටි භික්ෂුව විසින් නොපුරුදුකොට ගත් ගඩොල් යට සිටි භික්ෂුවගේ හිසමත වැටුණේය. ඒ මහණතෙම කළුරිය කෙළේය. (මෙහි 1 (ii)) භික්ෂුව නොදැනවූ බැවින් ඇවැත් නැත.

17 (i) (මෙහි 17 (ii)) උඩ සිටි මහණතෙම මරණ අදහසින් යට සිටි භික්ෂුවගේ මුදුනෙහි ගඩොලක් හෙළුයේය. (ii) ඒ මහණතෙම කළුරිය කෙළේය. (මෙහි 1 (ii)) "මහණ ඔබ පාරාජිකා වෙයි.

18 (මෙහි 18 (ii) ඒ භික්ෂුව කළුරිය නොකෙළේය. (මෙහි 1 (ii)) "මහණ, පාරාජිකා ඇවැත නොවේ. ථුල්ලච්චය ඇවැත්වේ."

19 (i) එකල්හි එක්තරා අලවුරට වැසි භික්ෂූහු අළුත් කර්මාන්තයක් කරති. එක්තරා භික්ෂුවක් යටට වී වැලක් උඩට දෙමින් සිටියේය. උඩ සිටි භික්ෂුව විසින් එසේ දුන් වැල අල්ලාගත් වැල යට සිටි භික්ෂුව මත වැටුණේය. ඒ භික්ෂුව කළුරිය කෙළේය. (මෙහි 1 (ii)) සහ 14 (ii))

20 (i) එකල්හි එක්තරා අලවිරට භික්ෂූහු අළුත් කර්මාන්තයක් කරත්. එක්තරා භික්ෂුවක් යට සිට වැලක් උඩට ඉස්සුවේය. උඩ සිටි භික්ෂු තෙමේ යට සිටි භික්ෂුව මරණ අදහසින් ඔහු මත වැල හෙළුවේය. (ii) ඒ භික්ෂුව කළුරිය කෙළේය. (මෙහි 1 (ii) "මහණ, ඔබ පාරාජිකා වෙයි.

21 (මෙහි 21 (i) ඒ භික්ෂුව කළුරිය නොකෙළේය, (මෙහි 1 (ii) මහණ, පාරාජිකා ඇවැත් නොවේ. ථුල්ලච්චය ඇවැත්වේ.

22 එකල්හි වනාහි අලවු රට භික්ෂූහු නව කර්මාන්ත කෙරෙත්. එක්තරා භික්ෂුවක් යට සිට ගොඩැල්ලක් (මක්වූ පරාලය) උඩට දැම්මේය. උඩ සිට භික්ෂුව නරියම අල්වා නොගත් ගොඩැල්ල යට සිටි භික්ෂුව මත වැටුණේය. ඒ භික්ෂුව කළුරිය කළේය (සෙසු 1 (ii) සහ 14 (ii) ) මහණ නොදැන කළ වරදට ඇවැත් නොවේ

23 (i) එකල්හි වනාහි අලවු රට වැසි භික්ෂූහු නව කර්මාන්ත කෙරෙති. එක්තරා භික්ෂුවක් යට සිටියේ ගොඩැල්ල උඩට ඉස්සුවේය උඩ සිටි භික්ෂු කෙනෙකු මරණ අදහස ඇත්තේ යට සිටි භික්ෂුව මත ගොඩැල්ල හෙළුවේය (ii) ඒ භික්ෂුව කළුරිය කෙළේය. (සෙසු 1 (ii)–(iii) "මහණ, ඔබ පාරාජිකාවෙහි"

24 (සෙසු 24 (i) ඒ භික්ෂුව කළුරිය නොකෙළේය. (සෙසු 1 (ii) "මහණ, පාරාජිකා නොවේ. ථුල්ලච්චය ඇවැත් වේ.

25 එකල වනාහි අලවු රට භික්ෂූහු නව කර්මාන්ත කරන්නාහු වැසි බඳිත්. එක්තරා භික්ෂුවක් එක්තරා භික්ෂුවකට "ඇවැත්නි, මෙතන සිට බඳිනු මැනවි" කීයේය. හෙතෙම එහි සිට බඳින්නේ වැටී කළුරිය කෙළේය. (සෙසු 1 (ii) )–(ii) "මහණ, ඔබ කිනම් සිතක් ඇත්තෙහි දැයි' ඇසීය. "භාග්‍යවතුන් වහන්ස, මම මරණ සිත නැත්තෙමි.' (ii) "මහණ, මරණ අදහසක් නැත්තාට ඇවැත් නොවේ.

26 (i) එකල්හි වනාහි අලවු රට භික්ෂූහු නව කර්මාන්ත කරන්නාහු වැල්ලක් බඳිත් එක්තරා භික්ෂුවක් මරණ අදහසින් එක්තරා භික්ෂුවකට "ඇවැත්නි, මෙහි සිට බඳුවයි" කීයේය (ii) හෙතෙම එහි සිට බඳින්නේ පෙරළී මළේය. (සෙසු 1 (iii)

27 (සෙසු 27 (i) ) හෙතෙම පෙරළී නොමළේය. (සෙසු 1 (ii) "මහණ, පාරාජිකා ඇවැත් නොවේ. ථුල්ලච්ච ඇවැත් වේ.

28 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් විහාරය වසා බසියි. එක්තරා භික්ෂුවක් ඒ භික්ෂුවට 'ඇවැත්නි, මෙතනින් බසුවයි' කීයේය. (ii) හෙතෙම එතනින් බසින්නේ පෙරළී කළුරිය කෙළේය. (සෙසු 1 (ii) සහ 25 (ii)

29 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් විහාරය වහළ බසී. එක්තරා භික්ෂුවක් ඒ භික්ෂුවට ඇමැත්තී, මෙහින් බසිවායි මරණ අදහසින් තියේය. හෙතෙම එතැනින් බසින්නේ (ii) පෙරළී මළේය. (මෙහි 1 (ii) ) පාරාජිකා ඇවැත්වේ.

30 (මෙහි 30 (i) ) පෙරළී නොමළේය. (මෙහි 1 (i) ) මහණ, පාරාජිකා ඇවැත් නොවේ. ථුලසී ඇවැත්වේ.

31 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ශාසනයෙහි නොඇල්මෙන් ගිජ්ඣකූට පර්වතයට නැගී ප්‍රපාතයේ පනින්නේ එක්තරා කුළුපොත්තෙකු මත වැටී එහින් කුළුපොත්තා මැරුණේය. (මෙහි 1 (ii) "මහණ, පාරාජිකා ඇවැත නොවේ මහණෙනි, තමන් නොපැනිය යුතුයි. යමෙක් පනින්නේ නම් දුකුලා ඇවැත්වේ."

32 එකල්හි වනාහි ඡබ්බග්ගිය භික්ෂූහු ගිජුකුළු පව්වට නැගී ක්‍රීඩා පිණිස ගලක් හෙළූහ. එක්තරා ගොපල්ලෙකුට වැදී මැරුණේය. (මෙහි 1 (ii) "මහණෙනි, පාරාජිකා ඇවැත නොවේ. මහණෙනි, ක්‍රීඩා පිණිස ගල් නොපෙරළිය යුතුය. යමෙක් පෙරලා නම් දුකුලා ඇවැත්වේ."

33 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ගිලන් වූයේවේ. භික්ෂූහු ඔහුට දුම් අල්ලා බාදිය හැංවූහ. ඒ භික්ෂුව කළුරිය කළේය. (මෙහි 1 (ii) සහ 25 (ii)

34 (i) එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ලෙඩවූයේ වේ. භික්ෂූහු ඔහු මරණ අදහසින් දුම් අල්ලා බාදිය හැංවූහ. (ii) ඒ මහණතෙම කළුරිය කළේය. (මෙහි 1 (ii) සහ 1 (iii).

35 (මෙහි 35 (i) ඒ භික්ෂුව කළුරිය නොකළේය. (මෙහි 1 (ii) "මහණෙනි, පාරාජිකා ඇවැත් නොවේ."

36 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක්හට හිස කැක්කුමක් ඇතිවිය භික්ෂූහු ඔහුට නස්‍යයක් දුන්නාහුය. ඒ භික්ෂුව කළුරිය කළේය. (මෙහි 1 (ii) සහ 25 ii) මහණෙනි, මරණ අදහසක් නැත්තාට ඇවැත් නැත.

37 (i) එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් හට තීව්‍ර කැක්කුමක් ඇතිවිය. භික්ෂූහු ඔහු මරණ අදහසින් නස්‍ය කර්මයක් දුන්හාහ (ii) ඒ භික්ෂුව කලුරිය කළේය. (මෙහි 1 ii) 'මහණෙනි, ඔබලා පාරාජිකා ඇවැත්තට පැමිණිය යුතුයි.

38 (මෙහි 38 (i) ) ඒ භික්ෂුව කළුරිය නොකෙළේය. (මෙහි 1 (ii) 'මහණ, පාරාජිකා ඇවැත් නොවේ. ථුල්ලච්චය ඇවැත් වේ ''

39 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ලෙඩවූයේය. භික්ෂූහු ඔහු පිරිකූහ. ඒ භික්ෂුව කලුරිය කෙළේය. (මෙහි 1 (ii) සහ 25 (ii)

40 (i) එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ලෙඩවූයේ වේ. භික්ෂූහු ඔහු මරණ අදහසින් පිරිකූහ. (ii) ඒ භික්ෂුව කළුරිය කෙළේය. (මෙහි 1 (ii) (iii)

41 (මෙහි 41(i)) ඒ භික්ෂුව කළුරිය නොකෙළේය. (මෙහි 1 (ii) (ii) ''මහණ, පාරාජිකා ඇවැත් නොවේ ථුල්ලච්චය ඇවැත් වේ

42 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ලෙඩවූයේ වේ. භික්ෂූහු ඔහු නැවූවාහ. ඒ මහණ කළුරිය කෙළේය. (මෙහි 1 (ii) සහ 25 (ii)

43 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ලෙඩවූයේ වේ භික්ෂූහු ඔහු මරණ අදහසින් නැවූවාහ. (ii) ඒ මහණ කළුරිය කෙළේය. (මෙහි 1 (ii) ) මහණෙනි, ඔබලා පාරාජිකා වූවහුය.

44 (මෙහි 44 (i) ඒ භික්ෂුව කළුරිය නොකෙළේය. (මෙහි 1 (ii) ''මහණෙනි, පාරාජිකා ඇවැත් නොවේ ථුල්ලච්චය ඇවැත් වේ

45 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ලෙඩවූයේ වේ. භික්ෂූහු ඔහුට ඉසල් ගැල්ලුවාහුය. ඒ භික්ෂුව කළුරිය නොකෙළේය. (මෙහි 1 (ii) සහ 25 (ii)

46 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ලෙඩවූයේ වේ. භික්ෂූහු ඔහු මරණ අදහස් ඇත්තාහු කෙල් ගැල්වූහ. (ii) ඒ භික්ෂුව කළුරිය කළේය. (මෙහි 1 (ii) "ඔබලා පාරාජිකාවූහුය."

47 (මෙහි 47 (i)) ඒ භික්ෂුව කළුරිය නොකළේය. (මෙහි 1 (ii)) 'මහණෙ, පාරාජිකා ඇවැත් නොවේ. ථුල්ලස් ඇවැත් වේ."

48 (i) එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ලෙඩවූයේ වේ. භික්ෂූහු ඔහු නැගිට්ටෙව්වාහුය. (ii) එයින් ඒ භික්ෂුව කළුරිය කළේය. (මෙහි (ii))

49 (මෙහි 49 (i)) මරණ අදහසින් ඒ භික්ෂුව කළුරිය නොකළේය. (මෙහි 1 (ii) සහ 25 (ii) මහණෙනි, පාරාජිකා ඇවැත් නොවේ. ථුල්ලස් ඇවැත් වේ."

50 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ලෙඩවූයේ වේ. භික්ෂූහු ඔහු බිම හෙළූහ. ඒ භික්ෂුව මළේය. (මෙහි 1 (ii) සහ 25 (ii))

51 (i) එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ලෙඩවූයේය. භික්ෂූහු ඔහු මරණ අදහසින් බිම හෙළූහ. (ii) ඒ මහණතෙම කළුරිය කළේය. (මෙහි 1 (ii) (iii))

52 (මෙහි 52 (i) ඒ මහණ කළුරිය නොකළේය. (මෙහි 1 (ii) "මහණෙ, පාරාජිකා ඇවැත නොවේ. ථුල්ලස් ඇවැත වේ."

53 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ලෙඩවූයේය. භික්ෂූහු ඔහුට ආහාර දුන්නාහ. ඒ භික්ෂුව කළුරිය කළේය. (මෙහි 1 (ii) සහ 25 (ii))

54 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ලෙඩවූයේ වේ. භික්ෂූහු මරණ අදහසින් ඔහුට ආහාර දුන්හ. (ii) ඒ මහණතෙම කළුරිය කළේය. (මෙහි 1 (ii) (iii))

55 (මෙහි 55 (i) ඒ මහණතෙම කළුරිය නොකළේය. (මෙහි 1 (ii) (24, ii) මහණෙනි, පාරාජිකා ඇවැත් නොවේ, ථුල්ලස් ඇවැත්වේ."

56 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ලෙඩවූයේ වේ. භික්ෂූහු ඔහුට බීමක් දුන්හ. ඒ මහණ තෙම කළුරිය කළේය. (මෙහි 1 (ii) සහ 25 (ii)

57 (i) එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ලෙඩවූයේ වේ. භික්ෂූහු ඔහුට මරණ අදහසින් බීමක් දුන්හ. (ii) ඒ මහණතෙම කළුරිය කෙළේය. (මෙහි 1 (ii) (iii)

58 (මෙහි 58 (i) ඒ මහණතෙම නොමළේය. (මෙහි 1 (ii) "මහණෙනි, පාරාජිකා ඇවැත් නොවේ. ථුලසි ඇවැත්වේ."

59 එකල්හි වනාහි සැමියා පිටරට ගිය එක්තරා ස්ත්‍රියක් සොරසැමියෙකුගෙන් ගර්භනීවූවාය. ඕතොමෝ කුලූපග භික්ෂුවකට "ආර්යයන් වහන්ස, ගැබ හෙළන බෙහෙතක් දැනමැනවි" කීවාය. 'නැගණිය යහපතැයි' ඇට ගැබ වැටෙන බෙහෙතක් දුන්නේය. දරුවා මළේය. (මෙහි 1 (ii)(iii)

60 එකල්හි වනාහි එක්තරා පුරුෂයෙකුට භාර්යාවරු දෙදෙනෙක් වෙත්. එකියක් වඳ. එකියක් වදන්නීය. වඳ ස්ත්‍රී කුලූපග භික්ෂුවක් කට "ස්වාමිනි, ඉදින් ඇ වදයි නම් සියළු වස්තුව අධිපති වන්නීය. ආර්යයන් වහන්සේ ඇගේ ගැබ හෙළීම දැනුවයි" කීයේය. 'නැගනිය යහපතැයි' ඇට ගැබ හෙළීමක් දුන්නේය. දරුවා මළේය. මව නොමළාය (මෙහි 1 (ii) මහණ, පාරාජිකා වේ.

61 (මෙහි 61 ඡේදයේ මව මළාය, දරුවා නොමළේය ථුලසි ඇවැත්වේ කියා වෙනස්කර යොදාගත යුතුයි )

62 (මෙහි 61 ඡේදයේ දෙදෙනාම මළාහුය. පාරාජිකා ඇවත වේ කියා වෙනස්කර යොදා ගත යුතුයි.)

63 (මෙහි 61 ඡේදයේ දෙදෙනාම නොමළාහුය. ථුලසි ඇවත වේ කියා වෙනස්කර යොදාගත යුතුයි.)

64 එකල්හි වනාහි එක්තරා ගර්භනී ස්ත්‍රියක් කුලූපග භික්ෂුවකට "ආර්යයන්වහන්ස, දැන් ගැබ හෙළීමක් දැනුවයි" කීවාය. 'නැගනිය, එසේ නම් මොඩිකරයි' කීයේය. ඕතොමෝ මොඩිකර ගර්භය හෙළුවාය. (මෙහි 1 (ii) (iii)

65 එකල්හි වනාහි එක්තරා ගර්භනී ස්ත්‍රියක් කුලූපග භික්ෂුවකට "ආයුෂ්මතුන් වහන්ස, දූන් ගැබ් හෙළීමක් දනුමැයි" කීවාය. 'නැගනිය එසේනම් කළමනවයි' කීයේය. ඕතොමෝ ගර්භය හෙළුවාය. මෙහි 1 (ii) (iii)

66 එකල්හි වනාහි එක්තරා වඳ ස්ත්‍රියක් කුලූපග භික්ෂුවකට "ආයුෂ්මතුන් වහන්ස, දූන් සමිහින් මා වදන් හෙනම්ද එබඳු බෙහෙතක් දනුමැයි" කීවාය. 'නැගනිය, එසේ නැයි' ඇය බෙහෙතක් දුන්නේය. ඕතොමෝ මැරුණාය. (මෙහි 1 (ii) මහණ, පාරාජිකා ඇවත නොවේ. දුකුළා ඇවැත්වේ.

67 එකල්හි වනාහි එක්තරා දරුවෙක් ඇති ස්ත්‍රියක් කුලූපග භික්ෂුවකට "ආයුෂ්මතුන් වහන්ස, සමිහින් මම නො වදම්ද එබඳු බෙහෙතක් දනුමැයි" කීවාය. නැගණිය, එසේ නැයි ඇය බෙහෙතක් දුන්නේය. ඕතොමෝ කළුරිය කළාය. (මෙහි 1 (ii) "මහණ, පාරාජිකා ඇවැත්නොවේ. දුකුළා ඇවැත්වේ."

68 එකල්හි වනාහි සවග භික්ෂූහු සප්තදශ (17) වර්ගයට අයත් භික්ෂුවකට ඇඟිල්ලෙන් කිති කැවීමෙන් සිනහ ඇති කළාහුය ඒ භික්ෂුව බියවන්නේ ආශ්වාස නොහැකිව මළේය. (මෙහි 1 (ii) මහණෙනි, පාරාජිකා ඇවැත නොවේ.

69 එකල්හි වනාහි සප්තදශ වර්ගයට අයත් භික්ෂූහු සවග භික්ෂූන්ට අයත් භික්ෂුවක් සංඝකර්මයක් කරන්නෙමුයි යටකොට මැරූහ. (මෙහි 1 (ii) මහණෙනි, පාරාජිකා ඇවැත් නොවේ.

70 එකල්හි වනාහි එක්තරා මන්ත්‍රගුරුකම් කරන භික්ෂුවක් යක්ෂයෙකු මැරීය. (මෙහි 1 (ii) මහණ පාරාජිකා ඇවැත් නොවේ, ථුලසි ඇවැත්වේ.

71 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් දරුණු යක්ෂයන් වසන තැනකට යැවූයේය යක්ෂයෝ ඔහු මැරූහ. (මෙහි 1 (ii) සහ 15 (ii)

72 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් [illegible] ආදනය ඇ[illegible]යක් අනාමු භික්ෂුවක් දරුණු යකුන් ඇති තැනකට යැවූයේය, (ii) යක්ෂයෝ ඔහු මැරූහ, (මෙහි 1 (ii) (iii)

73 (මෙහි 71 (i) ඔහු යක්ෂයෝ මැරූහුය, (මෙහි 1 (ii) මිනිස් පාරාජිකා ඇවැත් නොවේ, ථුලසී ඇවැත්වේ.

74 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් අනෙක් භික්ෂුවක් වල් මෘගයන් සිටිනා කාන්තාරයකට යැවීය. වල් මෘගයෝ ඔහු ජීවිතක්ෂයට පැමිණවූහුය, (මෙහි 1 (ii) සහ 25 (ii)

75 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් මරණ සිත් ඇත්තේ අනෙක් භික්ෂුවක් වල් මෘගයන් සිටිනා කාන්තාරයකට යැවූයේය. වල් මෘගයෝ ඔහු ජීවිතයෙන් තොර කළාහුය. (මෙහි 1 (ii) ) 'මිනිස්, පාරාජිකා ඇවැත් වේ. ඔහු ජීවිතයෙන් තොර නොකළාහුය ථුලසී ඇවැත්වේ"

76 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් අනික් භික්ෂුනමක් සොරුන් සිටිනා කාන්තාරයකට යැවූයේය සොරු ජීවිතක්ෂයට පැමිණවූහ (මෙහි 1 (ii) සහ 25 (ii)

77 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් මරණ අදහසින් සොරුන් සිටිනා කාන්තාරයකට යැවූයේය ඔහු සොරු මැරූහ. (මෙහි 1 (ii) (iii) ඔහු සොරු නොමැරූහ ථුලසී ඇවැත්වේ.

78 (i) (මෙහි 78 (i) ඔහු සොරු නොමැරූහ (මෙහි 1 (ii) මිනිස්, පාරාජිකා ඇවැත් නොවේ. ථුලසී ඇවැත්වේ

79 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ඔහුය සිතමින් ඔහු මැරුවේය. (මෙහි 1 (ii) (iii)

80 එකල්හි වනාහි එක් භික්ෂුවක් ඔහුය සිතමින් අනිකෙකු ජීවිතයෙන් තොර කෙළේය (මෙහි 1 (ii) (iii)

81 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් අනිකෙකුය සිතමින් ඔහු මැරුවේය (මෙහි 1 (ii) (iii)

82 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් අනිකෙකුය සිතමින් අනිකෙකු ජීවිතයෙන් තොර කෙළේය (මෙහි 1 (ii) (iii)

83 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් අමනුෂ්‍යයෙකු විසින් ගන්නා ලද්දේවේ. එක්තරා භික්ෂුවක් ඔහුට පහරක් දුන්නේය. ඒ මහණතෙම කළුරිය කෙළේය. (මෙහි 1 (ii) සහ 25 (ii)

84 (i) එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් අමනුෂ්‍ය-යෙකු විසින් අල්වා ගත්තේය එක්තරා භික්ෂුවක් මරණ අදහසින් ඒ භික්ෂුවට පහරක් දුන්නේය. (ii) ඒ මහණ තෙම කළුරිය කෙළේය. (මෙහි 1 (ii) (iii)

84 (මෙහි 83 (i) ඒ මිනිසා තෙමේ කළුරිය නොකෙළේය. මෙහි 1 (ii) ) (ii) "මහණ, පාරාජිකා ඇවැත් නොවේ. ථුල්ලසි ඇවැත්වේ.

85 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් දහපන් නම් ඇත්තෙකුට දිව්‍යලෝක කථාව කීයේය හෙතෙම ඒ කථාවෙහි ඇලුණේ කළුරිය කළේය. (මෙහි 1 (ii) සහ 25 (ii) )

86 (i) එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් මරණ අදහසින් ගසපත් ක්‍රියා ඇත්තෙකුට දිව්‍යලෝක කථාව කීයේය. (ii) හෙතෙම ඒ කථාවෙහි ඇලුණේ මැරුණේය. (මෙහි 1 (ii) සහ 1 (iii) )

87 (මෙහි 86 (i) හෙතෙම ඒ කථාවෙහි ඇලුණේ කළුරිය නොකෙළේය. (මෙහි 1 (ii) 84 (ii) 'මහණ, පාරාජිකා ඇවැත් නොවේ ථුල්ලසි ඇවැත්වේ.

88 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් නරක දුකෙහි සිටියකුට නරකයෙහි ලක්ෂණ කථා කීයේය හෙතෙම ත්‍රස්තව කළුරිය කළේය. (මෙහි 1 (ii) සහ 25 (ii)

89 (i) එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් මරණ අදහසින් නරක දුකෙහි සිටියකුට අපාය කථා කීයේය. (ii) හෙතෙම ත්‍රස්තව කළුරිය කළේය. (මෙහි 1 (ii) (iii)

90 (මෙහි 89 (i) හෙතෙම තැතිගැනී කළුරිය නොකෙළේය. (මෙහි 1 (ii) "මහණ, පාරාජිකා ඇවැත් නොවේ.

91 (i) එකල්හි වනාහි අලවු නුවර වැසි භික්ෂූහු අළුත් කර්මාන්තයක් කරන්නාහු ගස් කපත්. එක්තරා භික්ෂුවක් එක්තරා භික්ෂුවකට, "මහණ, මෙහි සිට සිඳුව"යි කීයේය, (ii) ඔහු එහි සිට සිදින්නේ යටවී මළේය. (මෙහි 1 (ii) සහ 25 (ii) )

92 (මෙහි 91 (i) "මරණ අදහසින්"යයි කියා යොදා ගත යුතුයි ) මෙහි 1 (ii) (iii)

93 (මෙහි 91 (i) ගස වැටී නොමළේය. (මෙහි 1 (ii) 'මහණ, පාරාජිකා ඇවැත් නොවේ. ථුල්ලසි ඇවැත් වේ.

94 එකල්හි වනාහි සමග භික්ෂූහු වනයකට ගිනි දුන්හ. මිනිස්සු දැවී කාලක්‍රියා කළාහුය. (මෙහි 1 (ii) සහ 26 (ii) )

95 (i) එකල්හි වනාහි සමග භික්ෂූහු මරණ අදහසින් වනයකට ගිනි දුන්හ. (ii) මිනිස්සු දැවී මළාහ (මෙහි 1 (ii) (iii)

96 (මෙහි 95 (i) මිනිස්සු දැවී කළුරිය නොකළාහ. (මෙහි 1 (ii) මහණෙනි, පාරාජිකා ඇවැත් නොවේ, ථුල්ලසි ඇවැත් වේ.

97 (i) එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් මධන සථානයට ගොස් සොරුන් මරන්නාට "ඇවැත්නි, මොහු වෙහෙස නොකරව්, එක පහරකින්ම මරව්යි" කීයේය. (ii) "ස්වාමීනි, යහපතැයි," එක පහරින්ම මැරුවේය. (මෙහි 1 (ii) (iii)

98 (97 (i) "මම ඔබගේ කීම නොකරමියි" ඔහු මැරුවේය, (මෙහි 1 (ii) මහණ, පාරාජිකා ඇවැත් නොවේ දුකුලා ඇවැත් වේ.

99 එකල්හි වනාහි එක්තරා පුරුෂයෙක් කුල ගෙයක අත් පා සිඳින ලද්දේ ඥාතීන් විසින් වටකර ගන්නා ලද්දේ විය, එක්තරා භික්ෂුවක් ඒ මනුෂ්‍යයන්ගෙන් "ඇවැත්නි, මොහුගේ මරණය කැමති වන්නහු දැයි" ඇසීය, 'ස්වාමීනි, එසේය, කැමැත්තෙමුයි" කීවාහුය, "එසේ නම් මෝරු පොවායි කීයේය, ඔව්හු ඔහුට මෝරු පෙවූහ, හෙතෙම මළේය, (මෙහි 1 (ii) (iii)

100 එකල්හි වනාහි එක්තරා පුරුෂයෙක් කුලගෙයක අත් පා සිදුනේ ඥාතීන් විසින් වටකරණ ලද්දේ විය. එක්තරා භික්ෂුණියක් ඒ මිනිසුන්ට "ඇවැත්නි, මොහුගේ මරණය කැමැත්තාහු දැයි" ඇසීය. "ආර්යාවෙනි, කැමැත් තෙමියි' කීහුය. "එසේ වී නම් "ලොණසෝවීරක අරිෂ්ටය පොවව්' කීවාය. ඔව්හු ඔහුට ලොණසෝවීරකය පෙවූහ. හෙතෙම කළුරිය කළේය. ඇට සැකයක් ඇතිවිය ඉක්බිති ඒ භික්ෂුණිය භික්ෂූන්ට මේ කාරණය සැලකළාය.

භික්ෂුණීහු භික්ෂූන්ට මේ කාරණය දැන්වූහ. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. "මහණෙනි, ඒ භික්ෂුණී තොමෝ පාරාජිකා ඇවැතට පැමිණියාය."

(තුන්වෙනි පාරාජිකාව නිමි.)

---

# 12 උත්තරිමනුස්ස ධම්මපාරාජික

## ශික්ෂාපදය

1 එකල්හි වනාහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විශාලා නුවර මහාවනයෙහි කූටාගාර ශාලාවෙහි වාසය කරණසේක. එකල්හි වනාහි බොහෝ දැකපුරුදු භක්තිමත් භික්ෂූහු වග්ගුමුදා ගංතෙරවුරෙහි වස්වැසූහ. එකල්හි වනාහි වැදූරම් දුර්භික්ෂයක් වී. (ii) ජීවත්වෙත්දෝ නොවෙත්දෝයි සැක ඇත්තෝ සිටවූ ක්‍රමයෙන් ජීවත්වීම විය. බොල්වූ ඇට ඇති, ඇස්වැස්ස විය. පිඬු සිඟා යෑමෙන් ජීවත්වීමක් තව නොහැකි විය. (iii) ඉක්බිති ඒ භික්ෂූන්ට "දැන් වැදූරම් දුර්භික්ෂයකි. (මෙහි (ii)) අපි කිනම් උපායකින් සමගිව සතුටින් විවාද නොකරමින් සුවසේ වස් වසමුද ආහාරයෙන් ක්ලාන්ත නොවෙමුදැයි" මේ සිත විය.

2 ඇතැම් කෙනෙක් "ඇවැත්නි, එසේනම් අපි ගිහීන් ගේ කම්කටයුතුවලට ගුරුකරුකම් දෙමු. මෙසේවූ කල්හි ඔවුන් අපට දීමට සිතන්නාහුය. මෙසේ අපි සමගිවූවෝහු සතුටුවූවෝහු විවාද නොකරන්නාහු, පහසුවෙන් වස් වසන්නෙමු. පිණ්ඩපාතයෙන් වෙහෙසට පත් නොවෙමු"යි. කීවාහුය ඇතැම් කෙනෙක් "ඇවැත්නි, ගිහියන්ට කම්කටයුතු විධිවිධාන කිරීමෙන් වැඩක් නැත. එසේනම්, ඇවැත්නි, අපි ගිහීන්ගේ පණිවුඩ ගෙනයමු. (ii) මෙසේ ඇති කල්හි ඔව්හු අපට දියයුතු කොට සිතන්නාහ. සමගිව සතුටු සිත් ඇතිව විවාද නොකරමින් සුවසේ වස්වසන්නෙමු. ආහාරයෙන් පීඩා නොවන්නෙමුයි," (iii) කීවාහුය. ඇතැමෙක් මෙසේ කීවාහුය. "ඇවැත්නි, වැඩක් නැත. ගිහීන්ගේ කම්කටයුතු කම් නියම කිරීමෙන්

ගිහීන්ගේ පණිවුඩ ගෙන යාමෙන් කිනම් ප්‍රයෝජන ඇද්ද? අපි දැන් ගිහියන්ට අප අතරෙන් උත්තරි මනුෂ්‍ය ධර්මයන්ගේ ගුණ කියමු. අසවල් මහණතෙම ප්‍රථමධ්‍යාන ලාභීය. අසවල් මහණතෙම ද්විතීය ධ්‍යාන ලාභීය. අසවල් භික්ෂුව තෘතීය ධ්‍යාන ලාභීය. අසවල් භික්ෂුතෙම සතරවෙනි ධ්‍යාන ලාභීය. අසවල් භික්ෂුතෙම සෝවාන්ය. අසවල් භික්ෂුතෙම සකෘදාගාමීය, අසවල් භික්ෂුතෙම අනාගාමීය, අසවල් භික්ෂුතෙම රහත්යයි, අසවල් භික්ෂුතෙම ත්‍රිවිද්‍යා දත්තේය, අසවල් භික්ෂුතෙම ෂඩ් අභිඥා ප්‍රාප්තයයි" කියාපි (මෙහි (ii)) ඇවැත්නි, අප අතරෙන්, යමෙක් ගිහීන්ට ඔවුනොවුන්ගේ උත්තරි මනුෂ්‍යධර්මයාගේ ගුණ කියාද, එයම ශ්‍රේෂ්ඨයයි ඉක්බිති ඒ භික්ෂූහු ගිහීන්ට උත්තරි මනුෂ්‍ය ධර්මයාගේ ගුණ කීවාහුය,

3 ඉක්බිති ඒ මිනිස්සු 'ඒකාන්තයෙන් අපට ලාභයක, ඒකාන්තයෙන් අපට හොඳ ලැබීමකි, යම් බඳුවූ අපට මෙබඳු භික්ෂූහු වසට පැමිණියාහුද, යම්සේ මොවුහු සිල්වත්ය ගුණපත් සවභාව ඇත්තෝද එහෙයිති.'

ඔව්හු යම් අහරක් භික්ෂූන්ට දෙත්ද, ඔව්හු එබඳු ආහාර තුමූ නොකත්. (ii) මවුපියන්ට නොදෙත්, අඹුදරුවන්ට නොදෙත්, දාස මැඩකරු පුරුෂයන්ට නොදෙත්, මිත්‍ර අමාත්‍යයන්ට නොදෙත්, නෑසහලේ නෑයන්ට නොදෙති. (iii) යම් අහරක් භික්ෂූන්ට දෙත්ද එබඳු කෑයුතු දේ. රස විඳිය යුතු දේ. බීමව ගතයුතු දේ. රස නොවිඳිති, නොබොති, (මෙහි (ii).)

4 ඉක්බිති ඒ භික්ෂූහු වර්ණවත්වූවාහු (ii) සහසත් ඉන්ද්‍රි-යයන් ඇත්තාහු, පැහැදුන මුහුනේ පැව ඇත්තාහු, පැහැදුන සිවි වර්ණය ඇත්තාහු වූහ. (iii) වස් වැසූ භික්ෂූන් භාග්‍යවතුන් වහන්සේ දකින්ට එළඹීම පුරුද්දක්මය. ඉක්බිති ඒ භික්ෂූහු වස් වැසුවාහු තුන් මාසයකට පසු සෙනසුන හකුළා තබා පාත්‍ර සිවුරු ගෙන විශාලානුවර යම් තැනෙක්හිද එහි ගියහ. පිළිවෙළින් විශාලා නුවර කූටාගාර ශාලාව යම් තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේගේ වැද එකත්පසෙක සිටියාහුය. එකල්හි [illegible]

දිශාවන්හි වස්වැසූ භික්ෂූහු කෘශවූවාහු මෙන්. රූක්ෂ වූවාහු දුර්වර්ණවූවාහු, පඬුවන් ශරීර ඇත්තාහු. නහර මතුවූ අවයව ඇත්තාහු වූහ.

5 වග්ගුමුදා තීරයේ සිටි භික්ෂූහු වර්ණවත්වූවාහු (බලනු 4 (ii) ) ආගන්තුක භික්ෂූන් සමග සතුටුවීම යන මේ භාග්‍යවත් බුදුවරුන් විසින් පුරුදු කරණ ලදී. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වග්ගුමුදා තීරිය භික්ෂූන්ගෙන් "මහණෙනි, කිමෙක්ද? ප්‍රියද, යැපීම පහසුවේද, කිමෙක්ද? (ii) සමගිවූවාහු, සතුටුවූවාහු, විවාද නොකරන්නාහු, සුවසේ වස්විසුවාහුද, ආහාරයෙන් ක්ලාන්ත නොවූවාහුදැයි" ඇසූසේක. (iii) "භාග්‍යවතුන් වහන්ස, සැපය, යැපීම පහසුය, ස්වාමීනි, අපි සමගිවූවාහු, සතුටුවූවාහු, විවාද නොකරන්නාහු, සුවසේ වස්විසුවෙමු. ආහාරයෙන් ක්ලාන්ත නොවූවෙමුයි" කීවාහුය.

6 දැන දැනත් තථාගතවරු විචාරත්, දැන දැනත් තථාගතවරු නොවිචාරත්, කල් දැන විචාරත්, කල් දැන නොවිචාරත් තථාගතවරයෝ වැඩක් නැතිව නොවිචාරත්, වැඩක් නැති දෙයෙහි තථාගතවරයන් වහන්සේගේ මැලැක්ම වේ. කරුණු දෙකකින් තථාගත බුදුවරු භික්ෂූන්ගෙන් විචාරත්. බණ හෝ කියන්නෙමි. ශ්‍රාවකයන්ට ශික්ෂාපද හෝ පනවන්නෙමි යන දෙකෙනි.

7 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වග්ගුමුදාතීරිය භික්ෂූන්ට "මහණෙනි, තෙපි කෙසේ (බලනු 5 (ii) ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. "මහණෙනි, කිමෙක්ද? තෙපි සත්‍යයෙන් සත්කාර ගත්තාහුද? 'භාග්‍යවතුන් වහන්ස, අසත්‍යයෙන් යැයි' කීවාහුය භාග්‍යවත් බුද්ධරජාණන් වහන්සේ ගර්හාකළ සේක;" "හිස් පුරුෂයෙනි නොගැලපෙන, ශාසනයට නොපැහැසෙන නොසුදුසු ශ්‍රමණ භාවයට අයත් නැති අකැප නොකටයුත්තක් කරණ ලදී හිස්පුරුෂයෙනි, තොපි කුමක් හෙයින් බඩ නිසා ගිහීන්ට ඔවුනොවුන්ගේ උත්තරි මනුෂ්‍ය ධර්මයේ ගුණ කීවාහුද? හිස් පුරුෂයෙනි, තොප විසින් තියුණු ගෙරි

කපන කැත්තෙන් බඩ පලාගැනීම යහපත, බඩ නිසා ඔවුනොවුන්ගේ උත්තරි මනුෂ්‍ය ධර්මයාගේ ගුණය වණිනා නොකරන්නේය ඊට හේතු කවරේද? හිස් පුරුෂයෙනි, එසේ කළේ නම් ඒ හේතුවෙන් මරණයට හෝ මරණ සමාන දුකකට පැමිණෙන්නේය. ඒ හේතුවෙන් ශරීරයාගේ බිඳීමෙන් මතු සැප නැති, දුර්ගති ඇති, විරුඬව වැටෙනා නරකයෙහි නූපදින්නේය. හිස් පුරුෂයෙනි, මෙසේ කිරීමෙන් මේ හේතුකොටගෙන ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැප නැති, දුර්ගති ඇති, විරුඬව වැටෙන නරකයෙහි උපදින්නේය. හිස් පුරුෂයිනි, මෙය (ii) නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිස පැහැදුනවුන්ගේ වැඩි පැහැදීම පිණිස නොවේ. හිස් පුරුෂයිනි නැවත මෙය නොපැහැදුනවුන්ගේ නොපැහැදීම පිණිස පැහැදුනවුන් සමහරුන්ගේ වෙනස් බව පිණිස වේ.

8 ''මහණෙනි, මහසොරු පස්දෙනෙක් ලෝකයෙහි ඇත්තාහු විද්‍යමාන වෙත්. කිනම් පස්දෙනෙක්ද යත්. මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් සොරකුට මෙබඳු සිතක් වේ. 'කවදා නම් මම සියයකින් හෝ දහසකින් හෝ පිරිවරණ ලද්දේ (මිනිසුන්ට) හිංසා කරන්නේ, මරමින්නේ, කපන්නේ, කපවන්නේ, පිසන්නේ, පිසවන්නේ, ගම් නියම් ගම් රාජධානීන්හි ඇවිදින්නෙම්ද' කියායි. හෙතෙම මතු කාලයක සියයකින් හෝ දහසකින් හෝ පිරිවරණ ලද්දේ හිංසාකරන්නේ මරමින්නේ කපන්නේ කපවන්නේ පිසන්නේ පිසවන්නේ ගම් නියම්ගම් රාජධානීන්හි ඇවිදියි. එපරිද්දෙන්ම මේ ශාසනයෙහි ඇතැම් පාප භික්ෂුවකට මේ අදහස වෙයි. කවදානම් මම සියයකින් හෝ දහසකින් හෝ පිරිවරණ ලදුව ගම් නියම්ගම් රාජධානීන්හි ගිහි පැවිද්දන් විසින් සත්කාර කරණ ලද්දේ ගරුකරණ ලද්දේ සලකන ලද්දේ පුදන ලද්දේ චාරිකාවෙහි හැසිර සිවුරු පිඩු සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබන්නෙම්ද' කියායි. හෙතෙම මතු කාලයක සියයකින් හෝ දහසකින් හෝ පිරිවරණ ලද්දේ ගිහිපැවිද්දන් විසින් සත්කාරකරණ ලද්දේ ගම් නියම්ගම් රාජධානීවල සිවුරු, පිඩු, සෙනසුන්, ගිලන්පස, බෙහෙත්, පිරිකර ලබමින් හැසිරෙයි. මහණෙනි, මේ පළමුවෙනි මහසොරා ලෝකයෙහි ඇත. විද්‍යමාන වේ.

9 "මහණෙනි, නැවතද මේ ලෝකයෙහි ඇතැම් පවිටු භික්ෂුවක් තථාගතයන් වහන්සේ විසින් දෙශනාකරණ ලද ධර්ම විනය ඉගෙන තමන් අවබොධකරගත් බව අඟවයි. මහණෙනි, මේ දෙවෙනි මහාඝොර ලෝකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්.

10 "මහණෙනි, නැවතද මේ ලෝකයෙහි ඇතැම් පවිටු භික්ෂුවක් පිරිසිදු බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙන පිරිසිදු බ්‍රහ්මචාරියෙකුට බොරුවට චෝදනා කරයිද, මහණෙනි, මේ තුන්වෙනි මහා ඝොර ලෝකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්.

11 "මහණෙනි, නැවතද මේ ලෝකයෙහි ඇතැම් පවිටු භික්ෂුවක් සංඝයාගේ යම් ඒ ගරු බඩු වෙත්ද ගරු පිරිකර වෙත්ද, එනම් ආරාමය, ආරාම භූමිය, විහාරය, විහාර භූමිය, ඇඳ, පුටුව බුදිරීය, මෙට්ටය, ලෝහ සැළිය ලෝහ සැව්විය, ලෝහ කලය, ලෝහ කටාරම, වෑය, පොරෝ කෙණ්ඩිය, උදැල්ල, නියන ලනු, හුණ මුදුනණ, සැවැන්දරා, තණ, මැටි ලී බඩු, මැටිබඩු යන මේවායින් ගිහියන්ට සංග්‍රහ කරයිද, පොළඹවයිද මහණෙනි, මේ සතරවෙනි මහාඝොර ලොකයෙහි ඇත්තාහ විද්‍යමාන වෙත්.

12 "මහණෙනි, යමෙක් නැත්තාවූ නොවූ මනුෂ්‍ය ධර්මයට උසස් දෙය තමා තුළ ඇතැයි උසස්කොට කථා කරයිද, මාරයන් සහිත බ්‍රහ්මයන් සහිත දෙවියන් සහිත ලෝකයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත ප්‍රජාවෙහි මේ ලොකුම ලොකු සොරා ඊට හේතු කවරේද? මහණෙනි, සොප විසින් සොරසිතින් රටවැසියාගේ ආහාර අනුභව කරණලදී.

13 "යමෙක් තමා තුළ අන් පරිද්දෙකින් ඇත්තාවූ ස්වභාවයක් අන් පරිද්දෙකින් උසස්කොට ප්‍රකාශ කෙරේද වංචාකොට සොරකමින් අනුභව කරණ ඔහුගේ ඒ හැසිරීම වැද්දාගේ කපටිකම මෙනි. කහවරදිකඩක් බෙල්ලේ බඳිනාලද අසංවරවූ ලාමක ස්වභාව ඇති බොහෝවූ කාෂාවකණ්ඨ නම් ඒ පව්වෝ පවිටු කර්මයන්ගෙන් නරකයෙහි උපදිත්.

14 ''සංවර නැත්තාවූ දුශ්ශීලයෙකුමේ. රටවැසියාගේ යම් ආහාරයක් අනුභව කරයිද, රත්වූ ගිනි සිළක්වැනි ලෝහ ගුලියක් අනුභව කරනලද්දේ යහපතැයි'' වදාළ සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වග්ගුමුදා තීරය භික්ෂූන්ට නොයෙක් ආකාරයෙන් ගර්හාකොට (මෙහි 1 පාරාජිකයෙහි සුදින්න බණවරේ 31 ඡේදය අවසාන කොටසේ ''සැහැල්ලු නොවූ පැවැත්මෙහි'' යන තැන සිට යොදන්න )

15 මහණෙනි, මෙසේද මතු මේ ශික්ෂාපදය දේශනා කරව්

(i) යම්කිසි භික්ෂුවක් තමාතුළ ඇතැයි නොදන්නේම ක්ලේශ ප්‍රහාණයෙහි දක්ෂවූ පිරිසිදු ඥාන දැකීම (ධ්‍යානාදී) උතුරු මිනිස්දම් තමා කෙරෙහි ඇතැයි හඟවා 'මෙම කාරණයෙක් මා කෙරෙහි ඇතැයි දනිමි මේ කාරණයෙන් දකිමියි' කියා හැසුරුනේද ඒ හි කාලයෙන් අන්‍ය කාලයක්හි විචාරණු ලබන්නේ හෝ නොලබන්නේ හෝ ඒ කාලයෙහිම පාරාජිකාවට පත්වූයේ විශුද්ධිය කැමැත්තේ ඇවැත්ති, උතුරු මිනිස්දම් මා කෙරෙහි ඇතැයි නොදන්නෙම් නොදක්නෙම් මෙසේ ඇතැයි කීමි හිස්වූ බොරු කීමියි මෙසේ A කියාද මේ මහණද පාරාජිකාවට පත්වූයේ සිල්වතුන් හා එක්වීම නැත්තේවේ (ii)--

භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට මෙසේද මේ ශික්ෂාපදය පණවන ලදී.

16 එකල්හි වනාහි බොහෝ භික්ෂූහු (ii) නොදක්නා ලද්දෙහි දක්නා ලද්දේය යන හැඟීම් ඇත්තාහු, නොපැමිණෙන ලද්දෙහි පැමිණියේය යන හැඟීම් ඇත්තාහු අවබෝධ නොකරන ලද්දෙහි අවබෝධ කෙළෙමු යන හැඟීම් ඇත්තාහු, ප්‍රත්‍යක්ෂ නොකරන ලද්දෙහි ප්‍රත්‍යක්ෂ කරන ලද්දේය යන හැඟීම් ඇත්තාහු ලබන ලද්දේය යන අධික මානයෙන් අර්හත්වය ප්‍රකාශ (iii) කළාහුය. ඔවුන්ට මතු කාලයෙක රාගය පිණිසද සිත නැමෙයි ද්වේෂය පිණිසද සිත නැමෙයි, මෝහය පිණිසද නැමෙයි, ඔවුන්ට සැකයක්

ඇතිවිය. (iv) භාග්‍යවතුන් වහන්සේ විසින් ශික්ෂාපද පනවන ලදී. අපිද නොදක්නා ලද්දෙහි දක්නෙමු යන හැඟීම් ඇත්තෙමු නොපැමිණෙන ලද්දෙහි පැමිණෙන ලද්දෙමු යන හැඟීම් ඇත්තෙමු, අවබෝධ නොකරණ ලද්දෙහි අවබෝධ කෙළෙමු යන හැඟීම් ඇත්තෙමු ප්‍රත්‍යක්ෂ නොකරණ ලද්දෙහි ප්‍රත්‍යක්ෂ කෙළෙමු යන හැඟීම් ඇත්තෙමු, අධික මාන්නයෙන් අර්හත්වය ප්‍රකාශ කෙළෙමු, (iii) කිමෙක්ද? අපි පාරාජිකා ඇවතට පැමිණියෙමුදැයි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට මේ කාරණය දැන්වූහ.

17 ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. "ආනන්දය, ඒ භික්ෂූහු (මෙහි 16 (ii) කෙරෙත්දැයි" ඇසූසේක ඔවුන්ගේ මේ ප්‍රකාශ කිරීම ඇවතට කාරණ නොවේ, මහණෙනි, මෙයේද වනාහි මේ ශික්ෂා පදය දේශනා කරව්, (මෙහි 15 ඡේදයේ i ශික්ෂාපදය (4) මේ ලකුණ ඇති තැනට "අධිමානය හැර" යන්න ඇතිව යොදන්න.)

---

## 13 පදභාජනීය හා ශුද්ධිකය

1 යමෙක් වනාහි යනු - භික්ෂු යනු - (මෙහි 1 පාරාජිකයෙහි පදභාජනීය කොටසේ 1-8 ඡේද යොදන්න.) "නොදන්නේ" යනු නැති කොට, - නොපෙනෙන, 'මේ කුසල ධර්මය ඇත්තේයි කුසල ධර්මය තමන් කෙරෙහි ඇති බව නොදක්නා නොදන්නා යනුයි.

2 'මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්ම'ය යනු, ධ්‍යාන, අර්හත්වය, සිතේ එකාග්‍රතාව, සමවැදීම, රූපාරූප ලෝකෝත්තර දර්ශන, මාර්ග වැඩීම, ඵලය දැකීම, කෙලෙස් නැතිකිරීම නීවරණ නැතිබව සිත හිස් ගෙහි (විවේකයෙහි) ඇලීම යනුයි. තමන් කෙරෙහි ඇතිකොට යනු- ඒ කුසලධර්ම තමා කෙරෙහි හෝ පමුණුවයි, තමන් ඒ කුසල ධර්මයන්හි පමුණුවයි.

3 'නුවණ'' යනු- ත්‍රිවිද්‍යාව, දැකීම යනු- යම් නුවණක් වේද එය දැකීමයි, යම් දැකීමක් වේද එය නුවණයි.

"කියන්නේය'' යනු ස්ත්‍රියකට හෝ පුරුෂයකුට හෝ ගිහියකුට හෝ පැවිද්දෙකුට හෝ දැනුම් දෙයි,

4 " මෙසේ දනිමි, මෙසේ දකිමියි" යනු මේ ධර්ම මම දනිමි. මේ ධර්ම මම දකිමි. මට මේ ධර්මයෝ ඇත. මා කෙරෙහි මේ ධර්මයෝ පෙනෙත්, මේ ධර්මයන් කෙරෙහි මමද පෙනී සිටින්නෙමි

5 ඊට මෑත කාලයක" යනු- යම් මොහොතක ලබා- ගත්තේ වේද ඒ මොහොත, ඒ ක්ෂණය, ඒ ස්වල්ප කාලය ඉක්මවූ කල්හි යනුයි.

6 "විමසනු ලබන කල්හි" යනු- යම් වස්තුවක් ප්‍රතිඥා කරණ ලද්දේ වේද, ඒ වස්තුමෙහිලා විචාරණ කල්හි තොප විසින් කුමක් ලබන ලද්දේද, කුමකැයි කියා තොප විසින් බලන ලද්දේද, කවදා තොප විසින් ලබන ලද්දේද, කොහිදී තොප විසින් අවබෝධ කරණ ලද්දේද, තොප විසින් මේ කවර නම් ක්ලේශයන් නැති කරණ ලදද, ඔබ කිනම් ධර්මයන් ලැබුවෙක්දැයි විචාරයි යනාදියි.

7 "නොවිචාරනු ලබන්නේ" යනු- කිසිවෙකු විසින් නොකියනු ලබන්නේ යනුයි.

8 "පැමුණුනේ" යනු- පවිටු බලාපොරොත්තු ඇත්තේ කැමැත්ත සවයාව කොට ඇත්තේ නැති නොවූ මිනිස ධර්මයන්ට වඩා උතුම් ධර්ම කියාද පාරාජිකා ඇවතට පැමුණුනේ වේ.

9 "පිරිසිදුකම බලාපොරොත්තු වන්නේ" යනු- ගිහි හෝ වනු කැමැත්තේ උපාසකයකු හෝ වනු කැමැත්තේ ආරාමයේ නියුක්ත සේවකයකු හෝ වනු කැමැත්තේ, "සාමණේරයෙකු හෝ වනු කැමැත්තේ" යනුයි.

10 ඇවැත්නි මෙසේ නොදන්නේ දනිමියි කීවෙමි, නොදක්නේ දකිමියි කීවෙමි යනු මම මේ ධර්ම නොදනිමි. මම මේ ධර්ම නොදකිමි මට මේ ධර්ම නැත. මා කෙරෙහි මේ ධර්මයෝ නොපෙනෙත්, මම මේ ධර්මයන් කෙරෙහි නොපෙනෙන්නෙමි යනුයි.

11 "හිස් බොරු කීවෙමි" යනු- මා විසින් කියන ලද්දේ හිස් දෙයකි. මා විසින් කියන ලද්දේ මුසාවකි. මා විසින් කියන ලද්දේ නොවූ දෙයකි, මා විසින් නොදන්නා බැවින් කියන ලදී. යනුයි

අධික මාන්නයෙන් තොරව යනු- අධිමානය අත්හැර යනුයි.

12 "මේද" යනු- පෙරකී දෙය ගෙන කියනු ලැබේ. පාරාජිකා වූයේවේ යනු- යම්සේ නම් තල්ගසක් මුදුනින් සිඳිනා ලද්දේ නැවත ලියලා වැඩීමට නුසුදුසුද, එසේම මහණතෙම පවිටු අදහස් ඇත්තේ නැමැත්ත සවභාවම නොව ඇත්තේ නැති නොවූ, මිනුෂ්‍ය ධර්මයට ඔබ්බා උතුම් ධර්ම කියා ශ්‍රමණයෙක් නොවේ. ශාක්‍ය පුත්‍රයෙක් නොවේ. එහෙයින් පාරාජිකාවූයේයයි කියනු ලැබේ.

13 "සහම්වාසයට නොගැලපේ" යනු- සංවාසය නම් එකම ක්‍රියා කිරීම, එකට පෙලහිම, සමානව ශික්ෂිත බවමේ සංවාසය නම් වේ. එය ඔහු සමඟ නැත, එහෙයින් සහම්වාසයට නොගැලපේයයි කියනු ලැබේ. (මෙහි 2 ඡේදය)

14 "ධ්‍යානය" යනු- පළමුවෙනි, දෙවෙනි, තුන්වෙනි සහ සතරවෙනි ධ්‍යානයි.

"රහත් බව" යනු- රාග ද්වේෂ මෝහයන්ගෙන් නිද්-බැවින් කීස් බව බලා සිඳීම, රාගාදී නිමිති නොගෙන සිඳීම, රාග දෙස මෝහ ප්‍රාර්ථනා නොගෙන සිඳීම යනුයි.

"සමවැදීම" නම - රාගාදිය ශූන්‍ය වශයෙන් බලා සමවැදීම නිමිති නොගෙන සමවැදීම, ප්‍රාර්ථනා නොගෙන සමවැදීම යනුයි.

'ඤාණ' යනු- විද්‍යා තුන යනුයි.

15 "මාර්ගය වැඩීම" යනු සතිපට්ඨාන සතරය, සම්‍යක් ප්‍රධාන සතරය, සෘද්ධිපාද සතරය, ඉන්ද්‍රිය සතරය බල සතරය බොජ්ඣඞ්ග සතරය ආර්‍ය අෂ්ටාංගික මාර්ගය යනුයි.

"ඵල ප්‍රත්‍යක්ෂ කිරීම" යනු- සෝවාන් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම, සකෘදාගාමි ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම, අනාගාමි ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම රහත් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම යනුයි

16 "කෙලෙසුන් නැතිකිරීම" යනු- රාගය නැතිකිරීම, තරහ නැතිකිරීම, මුලාව නැතිකිරීම යනුයි. පහවූ නීවරණ සිත ඇත්තාව යනු රාගයෙන් සිත ආවරණ නොවූ බවය, තරහෙන් සිත ආවරණය නොවූ බවය, මුලාවෙන් සිත ආවරණය නොවූ බවය යනුයි.

17 "සිත්ගෙහි (විවේකයෙහි) ඇලීම" නම් පළමුවෙනි ධ්‍යානයෙන් සිත්ගෙයි ඇලීමයි. දෙවෙනි ධ්‍යානයෙන් සිත්ගෙයි ඇලීමයි. තුන්වෙනි ධ්‍යානයෙන් සිත්ගෙයි ඇලීමයි. සතරවෙනි ධ්‍යානයෙන් සිත්ගෙයි ඇලීමයි.

(i) "තුන් ආකාරයකින් ප්‍රථම ධ්‍යානයට සමවැදුනෙමි" යනු දැන දැන බොරු කියන්නාට පාරාජිකා ඇවැත වේ. මුලින්ම ඒ පුද්ගලයාට බොරු කියන්නෙමි යන මේ සිත වේ. කියන්නාට බොරු කියමියි මේ සිත වේ. කීමහුට මා විසින් බොරු කියන ලද්දේයයි සිත වේ

(ii) "ක්‍රම සතරකින් ප්‍රථම ධ්‍යානයට පැමුණුනෙමි" යනු දැන දැන බොරු කියන්නාට පාරාජිකා ඇවැත වේ. ඔහුට පෙරම බොරු කියන්නෙමි යන සිත ඇත්තේය. කියන්නාට බොරු කියමියි කියා සිත වේ. කීහුට දෘෂ්ටිය වැරදීමෙන් තබා බොරුවක් කියන ලදීයයි සිත වේ.

(iii) ක්‍රම පසකින් ප්‍රථම ධ්‍යානයට සමවැදුනෙමියි දැන දැන බොරු කියන්නහට පාරාජිකා ඇවැත් වේ. මුලින්ම ඒ පුද්ගලයාට බොරු කියන්නෙමි යන මේ සිත වේ. කියන්නාට බොරු කියමියි මේ සිත වේ. කීහුට මා විසින් දෘෂ්ටිය හා රුචිය වැරදීමෙන් තබා බොරුවක් කියන ලදීයයි මේ සිත වේ

(iv) 'ක්‍රම සයකින් ප්‍රථම ධ්‍යානයට සමවැදුනෙමි" දැන දැන බොරු කියන්නාට පාරාජික ඇවැත වේ. මුලින්ම ඒ පුද්ගලයාට බොරු කියන්නෙමි යන මේ සිත වේ; කියන්නාට බොරු කියමි යන මේ සිත වේ. දෘෂ්ටිය, රුචිය, කැමැත්ත වැරදීමෙන් තබා කීහුට මා විසින් බොරුවක් කියන ලදීයයි සිත වේ

(v) "ක්‍රම සතකින (ii) ප්‍රථම ධ්‍යානයට පැමුණුනෙමියි" දැන දැන බොරු කියන්නාට (iii) පාරාජික ඇවැත වේ. මුලින්ම ඒ පුද්ගලයාට බොරු කියන්නෙමි යන මේ සිතවේ. කියන්නාහට බොරු කියමි මේ සිත වේ. (iv) රුචිය, දෘෂ්ටිය, කැමැත්ත, භාවය වැරදීමෙන් තබා කීහුට මා විසින් බොරුවක් කියන ලදීයයි සිත වේ. (v)

18 ක්‍රම තුනකින් ප්‍රථම ධ්‍යානය ලැබුයේ වෙමියි (මෙහි 17(v) ii iii යොදන්න) ක්‍රම සතරකින් ප්‍රථම ධ්‍යානය ලැබුයේ වෙමියි (මෙහි 17 (v) ii iii හා දෘෂ්ටිය මැරදීමේ තබා) යන්නද යොදන්න ක්‍රම පසකින් ප්‍රථම ධ්‍යානය ලැබුයේ වෙමියි (මෙහි 17 (v) ii iii හා දෘෂ්ටිය මැරදීමේ තබා, කැමැත්ත මැරදීමේ තබා යනු යොදන්න. ක්‍රම සයකින් ප්‍රථම ධ්‍යානය ලැබුයේ වෙමියි (මෙහි 17 (v) ii හා දෘෂ්ටිය මැරදීමේ තබා, කැමැත්ත මැරදීමේ තබා, රුචිය මැරදීමේ තබා යනු යොදන්න.) ක්‍රම යනකින් ප්‍රථම ධ්‍යානය ලැබුයේ වෙමියි, දූන දූන බොරු කියන්නාහුට (මෙහි 17 (v) ඡේදයේ (iii) හා (iv) යොදන්න.) ක්‍රම තුනකින් ප්‍රථම ධ්‍යානය මිසග සෙළෙමියි, මෙහි 17 (v) ඡේදයේ (ii) (iii) යොදන්න) ක්‍රම සතරකින් ප්‍රථම ධ්‍යානය මිසග සෙළෙමියි, (මෙහි 17 (v) ඡේදයේ (ii) (iii) හා දෘෂ්ටිය මැරදීමේ තබා යන්නද යොදන්න) ක්‍රම පසකින් ප්‍රථම ධ්‍යානය මිසග සාළෙමියි, (මෙහි 17 (v) ඡේදයේ (ii) (iii) හා දෘෂ්ටිය මැරදීමේ තබා කැමැත්ත මැරදීමේ තබා යනු යොදන්න.) ක්‍රම සයකින් ප්‍රථම ධ්‍යානය මිසග සාළෙමියි, (මෙහි 17 (v) ඡේදයේ (ii) (iii) හා දෘෂ්ටිය මැරදීමේ තබා, කැමැත්ත මැරදීමේ තබා ස්වභාවය මැරදීමේ තබා යනු යොදන්න ) ක්‍රම සතකින් ප්‍රථම ධ්‍යානය මිසග සාළෙමියි (මෙහි 17 (v) ඡේදයේ (ii) (iii) (iv) යොදන්න.) "ක්‍රම තුනකින් මා විසින් ප්‍රථම ධ්‍යානය මිසග කරණ ලදී. (මෙහි මුල් වාක්‍යය පමණක් වෙනස්කොට ඉලමූ ක්‍රම පස එලෙස්ම යොදාගත යුතුයි ) ද්විතීය ධ්‍යානය, තෘතීය ධ්‍යානය, චතුර් ධ්‍යානය යනු පද යොදාගත යුතුයි )

19 ක්‍රම තුනකින් (රාගයෙන් මෝහයෙන් හිස්වූ බැවින් ශූන්‍යතා විමෝක්ෂය(ii)සම් වැදුනෙමි වෙමි. සමවදිමි. සම වදින ලදියයි දූන දූන බොරු කියන්නාහුට පාරාජිකා ඇවැත් වේ. (iii) (රාගමෝහ නිමිති නැති බැවින්) අනිමිත්ත විමෝක්ෂයට (රාගමෝහ ප්‍රාර්ථනා නැති බැවින්)අප්‍රණිහිත විමෝක්ෂයට සමවැදුනෙමි. සමවදිමි. සමවදින ලදී. අප්‍රණිහිත විමෝක්ෂය ලැබුවෙමි වෙමි. මගතලේ වෙමි.

මා විසින් අප්පණිහිත විමොක්ෂය ප්‍රත්‍යක්ෂ කරන ලද්දේයයි දැන දැන බොරු කියන්නහුට පාරාජිකා ඇවතවේ. (iv) පෙර මහුට බොරු කියන්නෙමියි අදහස වෙයි. කියන්නහු ම කියමියි. අදහස වෙයි. කීමහුට කියන ලද්දේ යයි අදහස වෙයි.

20 ක්‍රම තුනකින් ශූන්‍යතා සමාධියට (මෙහි 10 (ii) ස මැදුනේ වෙමි. සමවදිමි. සමවදිනලදී යයි දැන දැන බොරු කියන්නහුට පාරාජිකා ඇවත වේ. අනිමිත්ත සමාධිය අප්පණිහිත සමාධියට සමවැදුනෙමි. සමවදිමි. සමවදිනලදී. අප්පණිහිත සමාධිය ලැබුමේ වෙමි. වසඟ කළේ වෙමි. මා විසින් අප්පණිහිත සමාධිය ප්‍රත්‍යක්ෂ කරණ ලද්දේයයි දැන දැන බොරු කියන්නහුව පාරාජික ඇවතවේ. (මෙහි 19 iv) )

21 ක්‍රම තුනකින් ශූන්‍යතා සමාපත්තියට (මෙහි 19 (ii) සම වැදුනේ වෙමි. සමවදිමි, සමවදින ලදීයයි දැන දැන බොරු කියන්නහුට පාරාජික ඇවතවේ. අනිමිත්ත සමාපත්තිය අප්පණිහිත සමාපත්තියට සමවැදුනේ වෙමි. සමවදි ,ස මවදින ලදී. අප්පණිහිත සමාපත්තිය ලැබුමේ වෙමි. වසඟ කළේ වෙමි. මා විසින් අප්පණිහිත සමාපත්තිය ප්‍රත්‍යක්ෂ කරණ ලද්දේයයි දැන දැන බොරු කියන්නහුට පාරාජික ඇවත වේ. (මෙහි 19 (iv)

22 ක්‍රම තුනකින් ත්‍රිවිද්‍යා සමවැදුනෙමි. සමවදිමි. සම වදින ලදී. ත්‍රිවිද්‍යාවන් ලැබුවේ වෙමි. වසඟ කළේ වෙමි. මා විසින් ත්‍රි විද්‍යාවන් ප්‍රත්‍යක්ෂ කරණ ලද්දේයයි දැන දැන බොරු කියන්නහුට පාරාජික ඇවතවේ. (මෙහි 19 (iv))

23 ක්‍රම තුනකින් සතර සතිපට්ඨානයන් (මෙහි 19 (ii) සමවැදුනේ වෙමි. සමවදිමි, සමවදින ලදීයයි දැන දැන බොරු කියන්නහුට පාරාජික ඇවතවේ. සතර සම්‍යක් ප්‍රධානයන, සතර ඍද්ධිපාදයන්, සමවැදුනේ වෙමි. සමවදිමි, සමවදින ලදී. සතර ඍද්ධිපාදයන් ලැබුමේ වෙමි. වසඟ කළේ වෙ . මා විසින් සතර ඍද්ධි පාදයන් ප්‍රත්‍යක්ෂ කරණ ලද්දේයයි දැනදැන බොරු කියන්නහුට පාරාජික ඇවතවේ,(මෙහි 1?(iv)

24 ක්‍රම තුනකින් පඤ්චේන්ද්‍රියයන් (මෙහි 19 (ii) සමවැදුනෙම් වෙමි. සමවදිමි, සමවදිනලදීයයි දැන දැන බොරු කියන්නාහට පාරාජිකා ඇවැතවේ පඤ්චබලයන්, සමවැදුනෙම් වෙමි, සමවදිමි, සමවදින ලදී පඤ්චබලයන් ලැබුයේ වෙමි. වශග තලේ වෙමි, මා විසින් පඤ්චබලයන් ප්‍රත්‍යක්ෂ කරණ ලද්දේයයි දැන දැන බොරු කියන්නාහුට පාරාජිකා ඇවැතවේ. (මෙහි 19 (iv) )

25 ක්‍රම තුනකින් සප්ත බොජ්ඣඞ්ගයන් සමවැදුනෙම් වෙමි. සමවදිමි, සමවදින ලදී. සප්තබොජ්ඣඞ්ගයන් ලැබුයේ වෙමි, වශග තලේ වෙමි. මා විසින් සප්ත බොජ්ඣඞ්ගයන් ප්‍රත්‍යක්ෂ කරණ ලද්දේයයි දැන දැන බොරු කියන්නාහුට පාරාජිකා ඇවැතවේ, (මෙහි 19 (iv)

26 ක්‍රම තුනකින් ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය සමවැදුනෙම් වෙමි, සමවදිමි, සමවදින ලදී, ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය ලැබුයේ වෙමි, වශග තලේ වෙමි, මා විසින් ආර්‍ය්‍යඅෂ්ටාංගික මාර්ගය ප්‍රත්‍යක්ෂ කරණ ලද්දේයයි දැන දැන බොරු කියන්නාහුට පාරාජිකා ඇවැත වේ, (මෙහි 19 (iv)

27 ක්‍රමතුනකින් සෝවාන් ඵලය (මෙහි (19 (ii) සකෘදාගාමිඵලය අර්හත්වය සමවැදුනෙම් වෙමි, සමවදිනලදී, අර්හත්වය ලැබුයේවෙමි, වශගතලෙමි, මා විසින් අර්හත්වය ප්‍රත්‍යක්ෂ කරණ ලද්දේයයි දැන දැන බොරු කියන්නාහුට පාරාජිකා ඇවැත වේ, (මෙහි 19 (iv)

28 ක්‍රම තුනකින් මාගේ රාගය දුරුවිය, නික්මුනේය, මිදුනේය, ප්‍රහීනය, ඉවත්විය, මනාකොට ඉවත්වීයයි දැන දැන බොරු කියන්නාහුට පාරාජිකා ඇවැත වේ, (මෙහි 19 (iv)

29 ක්‍රම තුනකින් මාගේ ද්වේෂය (රාග කොටස පරිදිමය) ක්‍රම තුනකින් මාගේ මෝහය (රාග කොටස පරිදිමය) ක්‍රම තුනකින් මාගේ සිත රාගයෙන් (ii) ආවරණය නොකරණ ලදීයයි දැන දැන බොරු කියන්නාහුට පාරාජිකා ඇවැත වේ.

30 ක්‍රම තුනකින් මාගේ සිත ද්වේෂයෙන් (රාගයෙන් පරිදිමය) ක්‍රම තුනකින් මාගේ සිත මෝහයෙන් (රාගයෙන්

පරිදිමය,) පෙරම ඔහුම බොරු කියන්නෙමියි අදහස වෙයි, කියන්නහුම බොරු කියමියි අදහස වෙයි, කීමහුම මා විසින් බොරු කියන ලද්දේයයි අදහස වෙයි.

31 ක්‍රම සතරකින් (මෙහි 28 (ii) ක්‍රම පසකින් (මෙහි 28 (ii) ක්‍රම සයකින් (මෙහි 28 (ii) ක්‍රම සතකින් මාගේ සිත මෝහයෙන් ආවරණය නොකරණ ලද්දේයයි දැන දැන බොරු කියන්නහුට පාරාජිකා ඇවැත වේ. (ii) පෙරම ඔහුට බොරු කියන්නෙමියි අදහස වෙයි. කියන්නහුට බොරු කියන්නෙමියි අදහස වෙයි. කීමහුට බොරු කියන ලද්දේයයි දෘෂ්ටිය වැරදීමේ තබා, කැමැත්ත වැරදීමේ තබා, රුචිය වැරදීමේ තබා, භාවය වැරදීමේ තබා අදහස වෙයි (iii).

(ශුද්ධිකය නිමි)

## 14 ඛණ්ඩ චක්‍රය

1 "තුන් ආකාරයකින් ප්‍රථමධ්‍යානයටද දෙවෙනි ධ්‍යානයටද, සමවැදුනෙම් වෙමි, සමවදිමි සමවදිනලදී. ප්‍රථමධ්‍යානයාගේද, විතීයධ්‍යානයාගේද ලාභීයෙක් වූයෙමි. වසග කළ කෙනෙක් වූයෙමි. ප්‍රථමධ්‍යානයද, විතීයධ්‍යානයද මා විසින් ප්‍රත්‍යක්ෂ කරණ ලදීයයි" දැන දැන බොරු කියන්නහුට පාරාජිකා ඇවැත වේ.

2 (1 ඡේදයේ "දෙවෙනි" වෙනුවට මෙහි "තුන්වැනි" කියා වෙනස්කර යොදාගත යුතුයි.)

3 (1 ඡේදයේ "දෙවෙනි" වෙනුවට මෙහි "සතරවැනි" කියා වෙනස්කර යොදාගත යුතුයි.)

4 තුන් ආකාරයකින් ප්‍රථමධ්‍යානයද රාගවේෂ මෝහයන්ගෙන් හිස්වූ ශූන්‍යතා විමෝක්ෂයද, ප්‍රථමධ්‍යානයද, රාගවේෂ මෝහාදී අරමුණුවලින් වෙන්වූ අනිමිත්ත විමෝක්ෂයද, ප්‍රථමධ්‍යානයද රාගවේෂ මෝහාදී ප්‍රාර්ථනා නැති අප්‍රණිහිත විමෝක්ෂයද සමවැදුනෙමි සමවදිමි. සමවදිනා ලදී. ප්‍රථමධ්‍යානයද රාගාදී ප්‍රාර්ථනා නැති මදිමද, ලැබුමෙක් වෙමි. වසග කළ කෙනෙක් වෙමි ප්‍රථමධ්‍යානයද රාගාදී ප්‍රාර්ථනා නැති මදිමද මා විසින් ප්‍රත්‍යක්ෂ කරණලදීයයි කියන්නහුට පාරාජිකා ඇවැත වේ.

5 (4 ඡේදයේ "මිදීමි" යන්නට මෙහි "එනාගතමි" කියා වෙනස් කර යොදාගත යුතුයි.)

6 (4 වැනි ඡේදයේ "මිදීම" යන්නට මෙහි "සමවැදීමි" කියා වෙනස් කර යොදාගත යුතුයි.)

7 තුන් ආකාරයකින් ප්‍රථමධ්‍යානයටද ත්‍රිවිද්‍යාවන්ටද පැමිණියෙමි. පැමිණෙමි, පැමිණෙන ලදී. ප්‍රථමධ්‍යානයද ත්‍රිවිද්‍යාද ලැබුවෙක් වෙමි වසඟ කෙළේ වෙමි ප්‍රථමධ්‍යානයද ත්‍රිවිද්‍යාද මා විසින් ප්‍රත්‍යක්ෂ කරණ ලදීයයි දැන දැන බොරු කියන්නාහට පාරාජිකා ඇවැතවේ.

8 තුන් ආකාරයකින් ප්‍රථම ධ්‍යානයටද සතරසති පට්ඨානයන්ටද, ප්‍රථම ධ්‍යානයටද සතර සම්‍යක් ප්‍රධානයන්ටද, ප්‍රථම ධ්‍යානයටද සතර ඍද්ධිපාදයන්ටද පැමිණුනෙමි. පැමිණෙමි. පැමිණෙන ලදී ප්‍රථම ධ්‍යානයද, සතර ඍද්ධිපාදද ලැබුවෙමි. වසඟ කෙළේ වෙමි ප්‍රථමධ්‍යානයද සතර ඍද්ධිපාදද මා විසින් ප්‍රත්‍යක්ෂ කරණලදීයයි දැන දැන බොරු කියන්නාට පාරාජිකා ඇවැතවේ,

9 තුන් ආකාරයෙන් ප්‍රථමධ්‍යානයටද පඤ්චඉන්ද්‍රියයන්ටද, ප්‍රථම ධ්‍යානයටද පඤ්ච බලයන්ටද සමවැදුනෙමි. සමවදිමි, සමවදින ලදී ප්‍රථමධ්‍යානයද බලපසද ලැබුයේ වෙමි. වසඟ කෙළෙමි ප්‍රථමධ්‍යානයද පඤ්චබලයද මා විසින් ප්‍රත්‍යක්ෂ කරණ ලදයි දැන දැන බොරු කියන්නාට පාරාජිකා ඇවැතවේ.

10 (9 ඡේදයේ "පඤ්චබලයන්ටට" මෙහි "බොජ්ඣඞ්ගත" කියා වෙනස් කර යොදාගත යුතුයි,)

11 (9 ඡේදයේ "පඤ්චබල" යන්නට මෙහි "ආර්‍ය අෂ්ටාංගික මාර්ගය" කියා වෙනස් කර යොදාගත යුතුයි.

12 ප්‍රථමධ්‍යානයටද සෝවාන් ඵලයටද, ප්‍රථමධ්‍යානයටද, සකෘදාගාමි ඵලයටද, ප්‍රථමධ්‍යානයටද අනාගාමි ඵලයටද, ප්‍රථමධ්‍යානයටද රහත්ඵලයටද පැමිණුනෙමි. පැමිණෙමි, පැමිණෙන ලදී ප්‍රථමධ්‍යානයද අර්හත්වයද ලැබුයේ වෙමි, වසඟ කෙළෙමි, ප්‍රථමධ්‍යානයද රහත් බවද මා විසින් ප්‍රත්‍යක්ෂ කරණ ලදීයයි දැන දැන බොරු කියන්නාහට පාරාජිකා ඇවැතවේ,

(a) 9

13 තුන් ආකාරයකින් ප්‍රථමධ්‍යානයට සමවැදුනෙමි, සමවදිමි සමවදින ලදී. ප්‍රථමධ්‍යානය ලැබුයේවෙමි, වශග කෙළෙමි, ප්‍රථමධ්‍යානය මා විසින් ප්‍රත්‍යක්ෂ කරණ ලදී මාගේ රාගය දුරුකෙළේය, නික්මුණේය, මිදුනේය, ප්‍රහීණය, සංසිඳුනේය, ඉවත් විය, විශෙෂයෙන් ඉවත් විය. (මෙහි 13 ශුද්ධිකයේ 19 (iv)

14 (13 ඡේදයේ "රාගය" යන්නට මෙහි "ද්වෙෂය" යොදාගත යුතුයි.)

15 (13 ඡේදයේ "රාගය" යන්නට මෙහි "මෝහය" යොදාගත යුතුයි.)

16 තුන් ආකාරයකින් ප්‍රථමධ්‍යානයට සමවැදුනේ වෙමි. සමවදිමි, සමවදිනලදී, ප්‍රථමධ්‍යානය ලැබුයේ වෙමි වශග කෙළේ වෙමි, මා විසින් ප්‍රථම ධ්‍යානය ප්‍රත්‍යක්ෂකරණ ලදී. මාගේ සිත රාගයෙන් ආවරණය නොවූයේය, ද්වෙෂයෙන් ආවරණය නොවූයේය, මෝහයෙන් ආවරණය නොවූයේයයි දැන දැන බොරු කියන්නහුට පාරාජිකා ඇවැත වේ. (මෙහි 13 ශුද්ධිකයේ 30 (ii)

(ඛණ්ඩචක්‍රය නිමි.)

---

## 15 බද්ධ චක්‍රය

17 (1 ඡේදයේ "ප්‍රථම ද්විතීයධ්‍යාන" වෙනුවට "තෘතීය චතුර්ථ" කියා වෙනස් කරගත යුතුයි,)

18 (1 ඡේදයේ "ප්‍රථම ද්විතීය" වෙනුවට "ද්විතීය චතුර්ථ" කියා වෙනස්කරගත යුතුයි)

19 (3-16 දක්වා ඡේදවල 'ප්‍රථමධ්‍යාන' වෙනුවට 'ද්විතීයධ්‍යාන කියා වෙනස්කර යොදාගත යුතුයි )

(බද්ධචක්‍රය නිමි )

---

## 16 එකමූලකය

(මෙයේ එක එකක් මුල්කොට චක්‍රයේ පරිවර්තනය කළ යුතුයි )

20 තුන් ආකාරයකින් මාගේ සිත මෝහයෙන්ද ආවරණය නොවූයේය, ප්‍රථමධ්‍යානයමද පැමිණියෙමි, සමවදිමි, සමවදිනලදී මෝහයෙන් මාගේ සිත නොඇසුරුණේය, ප්‍රථමධ්‍යානයද ලැබුවෙමි. මෙසේ සෙ ශ්‍රේෂ්ඨ වීමි. මාගේ සිත මෝහයෙන්ද ආවරණය නොවිය, මා විසින් ප්‍රථමධ්‍යානයමද පැමිණියෙමි, දැන දැන බොරු කියන්නාට පාරාජිකා ඇවැත වේ.

21 තෘතීයධ්‍යානයට, චතුර්ථධ්‍යානයට ශූන්‍යතා විමෝක්ෂයමද, සමවැදීමි, සමවදිමි, සමවැදුනේ වෙමි. මෙසේ හෙයින්ද මාගේ සිත ආවරණය නොවියයි දැන දැන බොරු කියන්නාහු පාරාජිකා ඇවැත සිදුවේ. (මෙහි 126 පිට 19 (iv)) මෙසේ ඔහුට බොරු කියන්නෙමියි අදහසක් වේ. කියන්නාහුට බොරු කියන්නෙමියි අදහසක් වෙයි. කී පසුව මා විසින් බොරු කියන ලද්දේයයි දෘෂ්ටිය වැරදීමේ තබා ක්ෂාන්තිය වැරදීමේ තබා රුචිය වැරදීමේ තබා අදහස වැරදීමේ තබා අදහස් වෙයි

(එකමූලකය නිමි)

---

## 17 සබ්බමූලිකය

(කරුණු දෙකක් මුල්කොට ඇති තුනක් මුල්කොට ඇති සතරක් මුල්කොට ඇති, පසක් මුල්කොට ඇති, සයක් මුල්කොට ඇති, සතක් මුල්කොට ඇති අටක් මුල්කොට ඇති, නමයක් මුල්කොට ඇති, දසයක් මුල්කොට ඇති කොටස්ද පිළිවෙලකරණය යුතුයි. යම්සේ තැබූ පද එක එකක් මුල්කොට ඇතිකරගත යුතුයි.)

22 තුන් ආකාරයකින් ප්‍රථමධ්‍යානයමද ද්විතීය ධ්‍යානයමද තෘතීය ධ්‍යානයමද චතුර්ථ ධ්‍යානයමද ශූන්‍යතා විමෝක්ෂයමද අනිමිත්ත විමෝක්ෂයමද අප්පණිහිත විමෝක්ෂයමද ශූන්‍යතා සමාධියමද අනිමිත්ත සමාධියමද අප්පණිහිත සමාධියමද ශූන්‍යතා සමාපත්තියමද, අනිමිත්ත සමාපත්තියමද, අප්පණිහිත සමාපත්තියමද, ත්‍රිවිද්‍යාද සතර සතිපට්ඨානයන්ද සතර සම්‍යක් ප්‍රධානයන්ද සතර ඍද්ධිපාදයන්ද පංචේන්ද්‍රියයන්ද, පංච බලයන්ද සප්ත බොධ්‍යංගයන්ද ආර්ය අෂ්ටාංගික මාර්ගයද සෝතාපත්ති ඵලයද සකෘදාගාමී ඵලයද, අනාගාමී

ඵලයද සමවැදුණෙමි. සමවදිමි. සමවදිනා ලදී මාගේ රාගයද දෙවෂයද මෝහයද හැරදමූයේය. මිදුණේය, ප්‍රහීනය, සංසිඳුණේය, නඟාදමන ලදී. විෂ්කම්භනය කරන ලදී රාගයෙන්ද මාගේ සිත ආවරණය නොකරණ ලදී. ද්වේෂයෙන්ද මාගේ සිත ආවරණය නොකරණ ලදී මෝහයෙන්ද මාගේ සිත ආවරණය නොකරණ ලදීයයි දැන දැන බොරු කියන්නහුට පාරාජිකා ඇවත සිදුවේ. (මෙහි 126 පිට 19 (iv)

(සබ්බමූලිකය නිමියේය.) (ශුද්ධික වාරකථා නිමි.)

## 18 ප්‍රත්‍යය හා සම්බන්ධ වාර කථා

23 තුන් ආකාරයකින් ප්‍රථම ධ්‍යානයට සම්වැදුණේ වෙමියි කියනු කැමතිව දෙවෙනි ධ්‍යානයට (ii) සම්වැදුණේ වෙමියි දැන දැන බොරු කියන්නහුට අගවන්නහුට පාරාජිකා ඇවැත සිදුවේ. ඇගවීම නොතේරෙනහුට ථුලසි ඇවැත සිදුවේ. (iii) (මෙහි 126 පිට 19 (iv))

(මෙයේ එකක් මුල්කොට ඇති කරුණු විස්තර වූයේද එපරිද්දෙන්ම විස්තර කළයුතුයි.)

24 කරුණු තුනකින් ප්‍රථම ධ්‍යානයටද ද්විතීය ධ්‍යානයටද තෘතීය ධ්‍යානයටද (ii) චතුර්ථ ධ්‍යානයටද ශූන්‍යතා විමෝක්ෂයටද අනිමිත්ත විමෝක්ෂයටද අප්පණිහිත විමෝක්ෂයටද ශූන්‍යතා සමාධියටද අනිමිත්ත සමාධියටද අප්පණිහිත සමාධියටද ශූන්‍යතා සමාපත්තියටද අනිමිත්ත සමාපත්තියටද අප්පණිහිත සමාපත්තියටද ත්‍රිවිද්‍යාවන්ටද සතර සතිපට්ඨානයන්ටද සතර සම්‍යක් ප්‍රධානයන්ටද සතර ඍද්ධිපාදයන්ටද පඤ්චෙන්ද්‍රියයන්ටද පඤ්ච බලයන්ටද සප්ත බොධ්‍යංගයන්ටද ආර්ය අෂ්ටාංගික මාර්ගයටද සෝවාන් ඵලයටද සකෘදාගාමී ඵලයටද අනාගාමී ඵලයටද අර්හත්වයටද සමවැදිමි, සමවදිමි, සමවැදුණෙමි. මාගේ රාගයද (iii) බැහැරවූයේය තුන් ආකාරයකින් ප්‍රථම ධ්‍යානයට සම්වැදුණේ වෙමියි කියනු කැමැත්තේ තෘතීය ධ්‍යානයට සම්වැදුණේ වෙමියි (මෙහි 23 (ii) සහ 24 (ii) දැන දැන බොරු කියන්නහුට අගවන්නහුට පාරාජිකා ඇවැත සිදුවේ නොඅගවන්නහුට ථුලසි ඇවැතවේ. (මෙහි 126 පිට 19 (iv)

25 තුන් ආකාරයකින් විතීයධ්‍යානයට සමවැදුනෙමියි කියනු කැමැත්තේ තෘතීයධ්‍යානයට සමවැදුනෙමියි දැන දැන බොරු කියන්නහුට අගවන්නහුට පාරාජිකා ඇවත සිද්ධවේ. නොඅගවන්නහුට ථුලසි ඇවතවේ. (මෙහි 126 පිට 19 (iv)

26 තුන් ආකාරයකින් විතීයධ්‍යානයට සමවැදුනෙමියි කියනු කැමැත්තේ චතුර්ථධ්‍යානයට (මෙහි 24 (ii) සහ 126 පිට 19 (iv)

27 තුන් ආකාරයකින් විතීයධ්‍යානයට සමවැදුනෙමියි කියනු කැමැත්තේ ප්‍රථම ධ්‍යානයට සමවැදුනෙමියි දැන දැන බොරු කියන්නහුට අගවන්නහුට පාරාජිකා ඇවත සිද්ධවේ. නොඅගවන්නහුට ථුලසි ඇවත සිද්ධවේ. (මෙහි 126 පිට19 (iv)

---

28 තුන් ආකාරයකින් මාගේ සිත මෝහයෙන් වෙන් වූයේයයි කියනුකැමැත්තේ ප්‍රථමධ්‍යානයට (ii)සමවැදුනේයයි දැන දැන බොරු කියන්නහුට අගවන්නහුට පාරාජිකා ඇවත සිද්ධවේ. නොඅගවන්නහුට ථුලසිඇවතවේ (මෙහි 126පිට19(iv)

---

29 තුන් ආකාරයකින් මාගේ සිත මෝහයෙන් වෙන් වූයේයයි කියනු කැමැත්තේ විතීයධ්‍යානයට, තෘතීය ධ්‍යානයට, චතුර්ථධ්‍යානයට (මෙහි 28 (ii) මෙමඟයෙන් මාගේ සිත වෙන්වූයේයයි දැන දැන බොරු කියන්නහුට අගවන්නහුට පාරාජිකා ඇවත සිද්ධවේ. නොඅගවන්නහුට ථුලසි ඇවැත්වේ. (මෙහි 126 පිට 19 (iv)

---

(කාරුණු දෙකක් මුල්කොට ඇති කාරුණු තුනක් මුල්කොට ඇති, සතරක් මුල්කොට ඇති, පසක් මුල්කොට ඇති, සයක් මුල්කොට ඇති, සතක් මුල්කොට ඇති, අටක් මුල්කොට ඇති, නමයක් මුල්කොට ඇති, දශයක් මුල්කොට ඇති, කොටස්ද මේපරිද්දෙන්ම ගලපා ගතයුතුයි.)

---

30 තුන් ආකාරයකින් ප්‍රථම ධ්‍යානයටද විතීය ධ්‍යානයටද තෘතීය ධ්‍යානයටද චතුර්ථ ධ්‍යානයටද (මෙහි 24 (ii) සහ 126 පිට 19 (iv) )

---

31 තුන් ආකාරයකින් ද්විතීය ධ්‍යානයටද, තෘතීය ධ්‍යානයටද, චතුර්ථධ්‍යානයටද, (මෙහි 24 (ii) සහ 126 පිට 19 (iv)

32 තුන් ආකාරයකින් (ii) යමෙක් ඒ විහාරයෙහි වාසය කළේද ඒ භික්ෂුතෙම ප්‍රථම ධ්‍යානයට සම වැදුනේය. සමවැදිසි. සම වදින්නේය. ඒ භික්ෂුතෙම ප්‍රථම ධ්‍යාන ලාභී වූයේය. වශී වූයේය. ඒ භික්ෂුව විසින් ප්‍රථම ධ්‍යානය ප්‍රත්‍යක්ෂ කරණ ලද්දේයයි දැන දැන බොරු කියන්නහුට අඟවන්නහුට ථුලසි ඇවැත්වේ. නොඅඟවන්නහුට දුකුලා ඇවැත්වේ. ඔහුට තලින්ම බොරු කියන්නෙමියි. අදහසක් වෙයි. කියන්නහුට බොරු කියමියි අදහසක්වෙයි. කිවහුට මා විසින් බොරු කියන ලද්දේයයි අදහසක්වෙයි. (iii)

33 සතරාකාරයකින් (මෙහි 32 (ii) ) පස් ආකාරයකින් සයාකාරයකින්, සත් ආකාරයකින් (මෙහි 32 (ii) සහ 126 පිට 19 (iv) )

34 තුන් ආකාරයකින්, යමෙක් තමාගේ ඔබගේ විහාරයෙහි වසිද ඒ භික්ෂුතෙම ද්විතීය ධ්‍යානයට සම්වැදුනේය. සම වදිසි. (ඔහු විසින්) සම වදිනලදී. තෘතීය ධ්‍යානයට, චතුර්ථ ධ්‍යානයට (මෙහි 24 (ii) ) (ii) ඒ භික්ෂුවගේ රාගය ප්‍රහීණය. (මෙහි 24 (ii) සහ 126 පිට 19 (iv)

---

35 තුන් ආකාරයකින්, යමෙක් ඔබගේ විහාරයෙහි විසිද ඒ භික්ෂුව ශූන්‍යාගාරයෙහි ප්‍රථම ධ්‍යානයට, ද්විතීය ධ්‍යානයට, තෘතීය ධ්‍යානයට චතුර්ථ ධ්‍යානයට සම්වැදුනේය සමවදිසි. (ඔහු විසින්) සමවදිනලදී. ඒ භික්ෂුතෙම ශූන්‍යාගාරයෙහි සතරවෙනි ධ්‍යාන ලාභීය වශීය. ඒ භික්ෂුව විසින් ශූන්‍යාගාරයෙහි සතරවෙනි ධ්‍යානය ප්‍රත්‍යක්ෂ කරණලදැයි දැන දැන බොරු කියන්නහුට අඟවන්නහුට ථුලසි ඇවැත සිදුවේ නොඅඟවන්නහුට දුකුලා ඇවැත සිදුවේ. (මෙහි 126 පිට 19 (iv) )

36 තුන් ආකාරයකින්, යමෙක් තෙම ඔබගේ විහාරය පරිභොග කළේද, යමෙක්තෙම ඔබගේ සිවුර පරිභොග කළේද, යමෙක් තෙම ඔබගේ පිණ්ඩපාතය පරිභොග කළේද

යමෙක් තෙම ඔබගේ සේනාසනය පරිභෝග කෙළේද, යමෙක් තෙම ඔබගේ ගිලන්පස බෙහෙත් පිරිකර පරිභෝග කෙළේද, යමෙකු විසින් ඔබගේ විහාරය පරිභෝග කරණ ලදද, යමෙකු විසින් ඔබගේ චීවරය පරිභෝග කරණ ලදද, යමෙකු විසින් ඔබගේ පිණ්ඩපාතය පරිභෝග කරණ ලදද, යමෙකු විසින් ඔබගේ සේනාසනය පරිභෝග කරණ ලදද, යමෙකු විසින් ඔබගේ ගිලන්පස බෙහෙත් පිරිකර පරිභෝග කරණ ලදද, යමෙකුට ඔබ පැමිණ විහාරය දුන්නේද, චීවරය දුන්නේද, පිණ්ඩපාතය දුන්නේද, සේනාසනය දුන්නේද, ගිලන්පස බෙහෙත් පිරිකර දුන්නේද, ඒ භික්ෂුතෙම ශූන්‍යාගාරයෙහි සතරවෙනි ධ්‍යානයට සමවැදුනේය. සමවදියි සම වදිනලදී. ඒ භික්ෂුතෙම ශූන්‍යාගාරයෙහි සතරවෙනි ධ්‍යාන ලාභීය එහි වශීය. ඒ භික්ෂූව විසින් ශූන්‍යාගාරයෙහි සතරවෙනි ධ්‍යානය ප්‍රත්‍යක්ෂ කරණලදීයයි දැන දැන බොරු කියන්නහුට අඟවන්නහුට ථුලසී ඇවැත්වේ. නොඅඟවන්නහුට දුකුලා ඇවැත්වේ. (මෙහි 126 පිට 19 (iv))

(ප්‍රත්‍යය භා සම්බන්ධ වාරකථා නිමි)

---

## 19 අනාපත්ති

අධිමානයෙන් කියන්නාහටද, නොකියෙම් අදහස ඇත්තාටද, නොසන්හුන් සිත් ඇත්තාටද, වේදනාවෙන් පීඩිතයාටද, ආදිකර්මිකයාටද (මුලින් කමිය කළ අයට) ද ඇවැත් නැත.

(උත්තරි මනුස්සධම්ම වනන පෙයයාලය නිමියේය.)

---

## 20 කථාවස්තු

1 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් මා විසින් අව බෝධ කරණ ලද්දේය යන මානයෙන් අභීත්වය ප්‍රකාශ කෙළේය. ඔහුට සැකයක් ඇතිවිය (ii) භාග්‍යවතුන් වහන්සේ ශික්ෂාපද පැනවූයේය. කිමෙක්ද? මම පාරාජිකා ඇවැතට පැමිණියෙම්දැයි කියායි ඉක්බිති ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට ඒ කාරණය සැලකෙළේය (iii) ' භික්ෂුව අවබෝධ කෙළේය යන මානයෙන් ඇවැත් නැතැයි'' දෙසූයේය.

2 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් 'මෙසේ ජනයා මට රහත් සම්භාවනයෙන් ගරුකරත්වායි' බලාපොරොත්තුවක් ඇතිව කාලයෙහි ගමන් කරයි. උන්වහන්සේට ජනයා ගරුකළහ. ඔහුට සැකයක් ඇතිවිය. (මෙහි 1 (ii) "මහණ පාරාජිකා ඇවතට පැමිණියෙහිය. මහණෙනි, සැලකිලි බලාපොරොත්තුවෙන් ඊර්යාවෙහි නොසිටිය යුතුය. යමෙක් එසේ සිටිනම් දුකුලා ඇවැත්වේ.

3 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් 'මෙසේ මට ජනයා ගරු කෙරෙත්වායි' ප්‍රණිධානයෙන් යුතු සිටින හැසිරෙයි. ඔහුට ජනයා ගරු කළහ. (මෙහි 1 (ii) ) "මහණ පාරාජිකා ඇවතට පැමිණියෙහිය මහණෙනි ප්‍රණිධානයෙන් යුතු සිටින නොහැසිරිය යුතුය. යමෙක් හැසිරෙත් නම් දුකුලා ඇවැත්වේ"

4 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් තවත් භික්ෂුවකට "ඇවැත්නි, අපේ උපාධ්‍යායන් වහන්සේගේ සද්ධිවිහාරිකයෝ (අන්තේවාසිකයෝ) යම්තාක් වෙත්ද, සියල්ලෝ රහත් හුයහ" කීයේය (මෙහි 1 (ii) ) "මහණ, ඔබ කිනම් සිතක් ඇතිව කීයෙහිද?" "භාග්‍යවතුන් වහන්ස, මම රහත්ය යන අදහසිනි" "මහණ, පාරාජිකා ඇවත නොවේ, ථුල්ලච්චය ඇවැත්වේ"

5 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් 'මෙසේ ජනයා මට ගරුකරන්නෝයයි' බලාපොරොත්තු ඇතිව සක්මන් කරයි, බලාපොරොත්තු ඇතුව සිටියි, බලාපොරොත්තු ඇතිව හිඳියි බලාපොරොත්තු ඇතිව නිදයි, 'මෙසේ ජනයා මට ගරුකරන්නෝය' කියායි. (මෙහි 1 (ii) ) "මහණ, පාරාජිකා නොවේ මහණෙනි, (සැලකිලි) බලාපොරොත්තු ඇතිව සයනය නොකළ යුතුයි, යමෙක් සයනය නොකෙරේ නම් දුකුලා ඇවැත්වේ"

6 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් එක්තරා මහණකුට මනුෂ්‍ය ධර්මයට වඩා උතුම් ධර්මය කීයේය. හෙතෙමේ "ඇවැත්නි, මගේද සංයෝජන ප්‍රහීණවිය" කීයේය. (මෙහි 1 (ii) ) "මහණ, ඔබ පාරාජිකා ඇවතට පැමිණියෙහිය"

7 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් රහසිගතවූයේ මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මය (රහත් ඵලාදිය ඔහුට

ඇතැයි) කීයැයි. පරසිත් දන්නා භික්ෂූහු ඒ භික්ෂුවට "ඇවැත්නි, මෙබන්දක් නොකියව. මෙය ඔබට නැතැයි කීය" (මෙහි 1 (ii) "මහණ, පාරාජිකා නොවේ, දුකුළා ඇවැත් වේ."

8 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් එක්තරා උපාසකයෙකුට "ඇවැත්නි, ඔබ යම් කෙනෙකු සිවුරු, පිණ්ඩපාත සෙනසුන් ගිලන්පසින් සංග්‍රහ කරයිද, ඒ භික්ෂූ රහත් යි" කීයේය. ගෙනෙමේද සිවුරු, පිණ්ඩපාත සෙනසුන්, ගිලන් පස අන මෙසින් උපස්ථාන කෙළේය, (මෙහි 1 (ii) ) 'මහණ, ඔබ කිනම් සිතක් ඇත්තේදැයි" ඇසීය භාගයවතුන් වහන්ස, මම රහත්භ කීයා කියනු අදහස ඇතිවීමි" "මහණ, පාරාජිකා ඇවැත් නොවේ, ථුල්ලස් ඇවැත්වේ"

9 (i) එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ලෙඩවූයේවී භික්ෂූහු ඔහුට "ආයුෂ්මතුනි, මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මයක් ඇත්තේදැයි ඇසූහ. (ii) "ඇවැත්නි, අගීත්වය ප්‍රකාශ කරන්ට අපහසු නොවේ." (iii) ඔහුට සැකයක් පහළවිය. භාගයවතුන් වහන්සේගේ යම් ඒ ශ්‍රාවක කෙනෙක් ඇද්ද. ඔවුහු මෙසේ කියන්නාහු නම් මම භාගයවතුන් වහන්සේගේ ශ්‍රාවකයෙක් නොවේද? කිමෙක්ද? මම පාරාජිකා ඇවැතට පැමිණියෙම්"දැයි භාගයවතුන් වහන්සේට ඒ කාරණය සැල කළේය. "මහණ, ඔබ කිනම් සිතක් ඇත්තෙහිද?" "භාගය වතුන් වහන්ස, මම රහත්යයි කියනු අදහස නැතිවූයෙමි" "මහණ, රහත්ය කියා නොකී අදහස් ඇත්තාට ඇවැත් නොවේ." (iv)

10 (මෙහි 9 (i) ඇවැත්නි පටන්ගන්නා ලද වීර්‍ය ඇත්තනු විසින් ලෝකෝත්තර ධර්මය උපදවන්ට හැකියකි" කීයේය (මෙහි 9 (iii) )

11 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ලෙඩවූයේය. භික්ෂූහු ඔහුට "ඇවැත්නි, බිය නොවෙව" කීවාහුය. "ඇවැත්නි, මම මරණයට බිය නොවෙමි"යි කීයේය. (මෙහි 9 (iii) )

12 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ලෙඩවූයේය. භික්ෂූහු ඔහුට "ඇවැත්නි, බිය නොවෙවයි" කීහුය. "ඇවැත්නි යමෙක් ඒකාන්තයෙන් පසුතැවිලි වන්නේද, හෙතෙම බිය වන්නේය" කීයේය. (මෙහි 9 (iii))

13 (මෙහි 9 (ii) "ඇවැත්නි, මනාව සැදීමෙන් ධර්මය උපදවන්ට හැකියයි" කීයේය. (මෙහි 9 (iii))

14 (10 වෙනි ඡේදය)

15 (10 වෙනි ඡේදයේ 'පටන්ගන්නා ලද වීර්යය'යන්නට 'හාමුදුරුවෙනි සැදැහැතුන් විසින්' කියා වෙනස්කර සෝදාගත යුතුයි.

16 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් ලෙඩවූයේය. භික්ෂූහු ඔහුට "ඇවැත්නි, කිමෙක්ද? ඉවසිය හැකිද? කිමෙක්ද? යැපිය හැකිදැයි" ඇසීය "ඇවැත්නි, සුළු බලය කිසි කෙනෙක් ඉවසන්නට නොහැකැයි" කීයේය. (මෙහි 9 (iii))

17 (මෙහි 16 ඡේදය සැදීමේදී "සුළු බලයකින්" වෙනුවට 'පෘථග්ජනයා විසින්' සෝදාගත යුතුයි.)

18 එකල්හි වනාහි එක්තරා බමුණෙක් භික්ෂූන්ට ආමන්ත්‍රණය කොට "පින්වත්නි, රහතන් වහන්සේලා වඩින්වායි" කීවේය (ii) ඔවුන්ට සැකයක් පහළවිය. "අපිදු වනාහි රහත් නොවූවමෝය. මේ බ්‍රාහ්මණයෝ අප 'රහතන්' වචනයෙන් ව්‍යවහාර කරති. කිමෙක්ද? අප කෙසේ පිළිපැදිය යුතුදැයි" අදහස් ඇත්තෝවූහ. භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. (iii) "මහණෙනි, ඔබ කිනම් සිතක් ඇත්තෙහිදැයි" ඇසීය. "මහණෙනි, පැහැදීමට කීමෙහි ඇවැත් නැත."

19 එකල්හි වනාහි එක්තරා බමුණෙක් භික්ෂූන්ට ආරාධනාකොට "පින්වත් රහතන් වහන්සේලා වැඩ හිඳිනා සේක්වා, පින්වත් රහතන් වහන්සේලා අනුභව කරණ සේක්වා, පින්වත් රහතන් වහන්සේලා සතුටුවන සේක්වා, පින්වත් රහතන් වහන්සේලා වඩින සේක්වා"යි කීවේය (මෙහි 18 (ii) මේ බ්‍රාහ්මණ තෙමේ, මහණෙනි, පැහැදීමෙන් කීමෙහි ඇවැත් නැත.

20 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් එක්තරා භික්ෂුවක්හට මිනිස් ධර්මයට වඩා උසස් ධර්මය ප්‍රකාශ කරයි. හෙතෙමේද මෙසේ කීයේය. "ඇවැත්නි, මාගේද ආශ්‍රවයෝ ප්‍රහීනයහ. (ii) ඔහුට සැකයක් ඇතිවිය. "මම රහත් නොවෙමි. රහත්ය කියා කීවෙමි. භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැල කළේය, "මහණෙනි, ඔබ පාරාජිකා ඇවතට පැමිණියෙහිය."

21 (මෙහි 20 ඡේදයේ "ආශ්‍රවයෝ ප්‍රහීනයහ." වෙනුවට "මේ ධර්මයෝ ඇත්තාහ." කියා මෙතනත්තර යොදාගත යුතුයි.)

22 (මෙහි 20 ඡේදයේ "ආශ්‍රවයෝ ප්‍රහීනයහ." වෙනුවට ඒ "ධර්මයන්හි පෙනෙන්නෙමි." යොදාගත යුතුයි )

23 එකල්හි වනාහි එක්තරා භික්ෂුවකට නෑයෝ මෙසේ කීවාහුය. "ස්වාමීනි, එනුමැනව, ගිහිගෙයි වසවයි" කියාහ. "ඇවැත්නි, මා වැන්නෙක් ගිහිගෙයි වසන්ට නුසුදුසුයයි" කීයේය. (මෙහි 9 (iii) )

24 (මෙහි 23 යොදන්න. "ගිහිගෙයි වාසය කරන්න" වෙනුවට "කාමයන් ප්‍රයෝජනයට ගන්න" කියාද "ගිහිගෙයි වසන්ට නුසුදුසුයයි. මා විසින් කාමයෝ මඟහැරදුන" යනු යොදාගත යුතුයි

25 එකල්හි වනාහි නෑයෝ එක්තරා භික්ෂුවක්හට "ස්වාමීනි, සස්නෙහි ආශා ඇත්තේදැයි" ඇසූහ "ඇවැත්නි, මම උතුම් ඇලීමෙන් ඇලෙන ලද්දෙමියි" කීයේය (මෙහි 9 (iii) )

26 එකල්හි වනාහි බොහෝ භික්ෂූහු කථාකොට ගෙන එක්තරා ආවාසයෙක්හි "යමෙක් මේ ආවාසයෙන් පළමුවෙන් නික්ම ගියේ නම් අපි ඔහු රහත් කෙනෙකැයි දනිමුයි" යයි ඇසූහ. එක්තරා භික්ෂුවක් "මා රහත් කෙනෙකුයයි දනීවයි" ඒ ආවාසයෙන් පළමුවෙන්ම නික්මුණේය (මෙහි 20 (ii) )

27 (i) එකල්හි වනාහි භාග්‍යවත් බුද්ධරජාණන් වහන්සේ රජගහනුවර ලෙහෙනුන්ට බත් වැටුප් දුන් වේළුවනයෙහි වාසය කරණසේක. එකල්හි වනාහි ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙමේද ආයුෂ්මත් මුගලන් ස්ථවිර තෙමේද ගිජුකුළු පව්වෙහි වාසය කරත්. ඉක්බිති ආයුෂ්මත් මහ මුගලන් තෙමේ පෙරවරුයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන-

ආයුෂ්මත් ලක්ඛණ තෙමේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණ ආයුෂ්මත් ලක්ඛණයන්ට "ඇවැත්නි, ලක්ඛණ, එන්න රජගහ නුවරට පිඩු පිණිස යමුයි" කීයේය "ඇවැත්නි, එසේ යයි" ආයුෂ්මත් ලක්ඛණ තෙමේ ආයුෂ්මත් මහා මුගලන් තෙරුන්ට ප්‍රතිවචන දුන්නේය. ඉක්බිති ආයුෂ්මත් මහා මුගලන් තෙර තෙමේ ගිජුකුළු පව්වෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයක්හි සිනා පහළ කෙළේය.

28 ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ තෙමේ ආයුෂ්මත් මහා මුගලන් තෙරුන්ට "ඇවැත්නි මුගලන, සිනා පහළ කිරීමට හේතු කවරේද කාරණා කවරේදැයි" ඇසීය. "ඇවැත්නි, ලක්ඛණ මේ ප්‍රශ්නයට නොකල්ය. භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහිදී මා හට මේ ප්‍රශ්නය අසවයි" කීයේය

29 ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණද ආයුෂ්මත් මුගලන් තෙරද රජගහනුවර පිඩු පිණිස හැසිර බතින් පසු පිණ්ඩපාතයෙන් වැළකුණාහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියාහු. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියාහු. එකත්පසෙක සිටි ආයුෂ්මත් ලක්ඛණ තෙමේ ආයුෂ්මත් මහා මුගලන් තෙරුන් ගෙන් 'ආයුෂ්මත් මහාමුගලන් තෙමේ මෙහි ගිජුකුළු පව්වෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයක සිනා පහළ කෙළේය ඇවැත්නි, මොග්ගල්ලානය, සිනා පහළ කිරීමට හේතු කවරේද කාරණ කවරේදැයි" ඇසීය

30 "ඇවැත්නි, මම මෙහි ගිජුකුළු පව්වෙන් බසින්නේ අහසින් යන ඇටසැකිල්ලක් දුටිමි ඒ ඇටසැකිල්ල යන ගිජුලිහිණියෝද කවුඩෝද උකුස්සෝද ලුහුබැඳ ලුහුබැඳ ඉල ඇට අතරින් විදිත්. ඒ ඇටසැකිල්ලද හැඬුම් හඬ නගයි (ii) ඇවැත්නි, ඒ මට මෙසේ සිත්විය ඒකාන්තයෙන් පුදුමය. සිත්වන ඒකාන්තයෙන් පෙර නොවූවිරූ මෙවැනි සත්ත්වයකුත් සිටින්නේද යන මේ සිතවිය මෙබඳු යක්ෂයෙකුත් සිටින්නේද යන සිතවිය මෙබඳු ජීවිතයකුත් ඇත්තේද යන සිතවිය." "ආයුෂ්මත් මහමුගලන් තෙමේ මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මය කියයි" භික්ෂූහු දොස් කියන්නට වන්හ. විශේෂයෙන් දොස් කියන්නට පටන් කොයේක් අයුරින් දොස් කියන්නට වන්හ.

31 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමන්ත්‍රණය කළසේක "මහණෙනි, ශ්‍රාවකයෝ ඒකාන්තයෙන් ඇස් උපදවා ගෙන වාසය කරත්. මහණෙනි, ශ්‍රාවකයෝ ඒකාන්තයෙන් ඤාණ උපදවා වාසය කරත්. යම් කාරණයකින් ශ්‍රාවකයෙක් මෙබඳු දෙයක් දනීද, දකීද සාක්ෂි හෝ කරන්නේද එසේමැයි. මහණෙනි, මා විසින්ද මේ සත්වතෙම කලින් දක්නාලදී. එසේවුවත් ප්‍රකාශ නොකෙළෙමි. මම්ද මෙය ප්‍රකාශ කළෙම් නම් අන්‍යයෝ මාගේ වචනය නොඅදහන්නාහුය. යමෙක් මගේ වචනය නොඅදහන්නාහු නම් ඔවුන්ට එය බොහෝ කලක් අහිත පිණිස දුක් පිණිස වන්නේය. (එහෙයිනි.)

32 "මහණෙනි, මේ සත්ව තෙමේම මේ රජගහනුවරම හරක් මරන්නෙක් විය. හෙතෙම ඒ ක්‍රියාවේ විපාකයෙන් බොහෝ වර්ෂ ගණනක් බොහෝ වර්ෂ සිය ගණනක් බොහෝ වර්ෂ දහස් ගණනක් නරකයෙහි පැසී ඒ කර්මයේම ඉතිරි විපාකයෙන් මෙබඳු ආත්ම භාවයක් ලැබීමින් විඳියි. මහණෙනි, මුගලන් කීයේ ඇත්තකි මහණෙනි මුගලන්ට අමුත්තක් නැතැයි" වදාළසේක.

33-38 (මෙහි 27-32 ඡේදයෙහි මෙන් "ඇටසැකිල්ලක්" වෙනුවට "මස් පෙත්තක්" කියා වෙනස්කර යොදාගතයුතුයි.)

39-44 (ඡේද මෙන් ඡේද සමයෙන් සැටි සටහන් කිරීමේදී "ඇට සැකිල්ලක් වෙනුවට යෙදියයුතු වචන පසුව දක්වනු ලැබේ.) 'මස් ගුලියක්" කියා.

45-50 "සම් නැති පුරුෂයෙකු" "පෙර බැටළුවන් මැරූවෙකි"

51-56 "කඩු වැනි ලොම් ඇති මහත් පුරුෂයෙකු" "ඌරන් මැරූවෙක්."

57-62 xi "බසිතොත්තු වැනි ලොම් ඇති පුරුෂයෙකු" "මුවන් මැරූවෙකි"

63-68 "ඊතල වැනි ලොම් ඇති. පුරුෂයෙකු" "පෙර උල්පලින් ඇන සතුන් මැරූවෙකි."

69-74 "ඉඳිකටුවැනි ලොම් ඇතිසියාද ඔහුගේ ඒ ඉඳිකටු උඩට විද වෙමින් ඔහුගේ ශරීරයෙහිම වැදෙත්. "පෙර ඔහු සතුන්ට හිංසාකළ රියැදුරෙකි."

76-80 "ඉඳිකටුවැනි ලොම් ඇත්තෙක්ද, ඔහුගේ ඒ ඉඳිකටු හිසට ඇතුල්වී කටින් පිටවෙති. කටට ඇතුල්වී පපුවෙන් පිටවෙති. පපුවට ඇතුල්වී බඩෙන් පිටවෙත්. බඩින් ඇතුල්වී කලවාවලින් පිටවෙත්. කලවාවලින් ඇතුල්වී කෙණ්ඩාවලින් පිටවෙත්. කෙණ්ඩාවලින් ඇතුල්වී සතුල්වලින් පිටවෙත්. "පෙර ඔහු තියුණු උල්වලින් සතුන්ට පීඩා කළ කෙනෙකි."

81-86 "කලගෙඩියක් පමණ අණ්ඩකෝෂයක් ඇති පුරුෂයෙකු කෙසේනම් ඇවිදින්නේද ඒ අණ්ඩකෝෂය පිට උඩ දමාගෙනයි. හිඳ ගන්නේද ඒ අණ්ඩකෝෂය උඩ ඉඳගනියි. එය ගිජුලිහිණියෝද කපුටෝද උකුස්සෝද ලුහුබැඳ ලුහුබැඳ වටකරති කොටා අනිති. "පෙර ගේලොම් සීමෙකි"

87-92 "අශුචි වළෙක්හි හිස දක්වා එරුණු පුරුෂයෙකු" (vi) "පෙර තඩු වියළුවෙකි."

93-98 "දෑතින් අශුචි ගෙන අශුචි වළෙක්හි හිස සහිතව එරුණු පුරුෂයෙකු" (iv) "දුෂ්ට බ්‍රාහ්මණයෙක්විය. කෙසේනම් කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි සංඝයාට දන්වා ආරාධනාකොට ඔරු අශුචියෙන් පුරවා "අනේ පින්වත්නි, කැමතියාක් අනුභව කරවයිද ගෙනයමයිද" කියේය

99-104 "සමනැති ස්ත්‍රියක්" "පෙර ස්වාමියා ඉක්මවා හැසුරුනියකි"

105-110 ගඳගහන විරූප ස්ත්‍රියක් "පෙර නිමිති කෙදුරෙකි."

111-116 "පැසෙන්නාවූ තොත් ශරීර ඇති, අඟුරු මගුරුමත ස්ත්‍රියකු" මිනිසෙකි, ඒ ස්ත්‍රිය කාලිඟු රජුගේ අග්‍රමෙහෙසිය වූවාය. ඕතොමෝ ඊර්ෂ්‍යාවෙන් වැඩූනා විරූප ස්ත්‍රියක මත අගුරු සබල කෙළුවාය

117-122 "හිසනැති මිලුම්තියක්" ඔහුගේ පපුවෙහි ඇස්ද කටක්ද ඇත්තේය. "පෙර හාරිකනම් සොරුන් මැරුවෙකි"

123-128 "අහසින් යන භික්ෂුවක් කිසා චිවස්තරද, ඔහුගේ හැදෑව සිවුරද ගිනිගෙනය, දැවෙමිනිය, ගිනිදැල් සහිතය, පාත්‍රයද, ගිනිගෙනය, දැවෙමිනිය. ගිනිදැල් සහිතය,

පටියද ගිනිගෙනය දුවෙමින් ය. ගිනිදැල් සහිතය, ශරීරයද ගිනිගෙනය දුවමින්ය ගිනිදැල් සහිතය" මෙසේ කාශ්‍යප බුදුන්ගේ ශාසනයෙහි දුශ්ශීල භික්ෂුවක් වූයේය."

129-134 (123-128 "භික්ෂුවක්" වෙනුවට "භික්ෂුණියක්")

135-140 "උපසම්පදාවට ශික්ෂමානාවක්" 141-146 "සාමණේරයෙක්")

147-152 "සාමණේරියක්"

162 ඉක්බිති ආයුෂ්මත් මහමුගලන් තෙරුන් වහන්සේ භික්ෂූන් ඇමතූසේක (ii) "ඇවැත්නි, යම් තැනක මේ තපෝද නදිය ගලාබසිද, ඒ විල පැහැදිලි ජලය ඇත්තේය. සිසිල් ජලය ඇත්තේය. මිහිරි ජලය ඇත්තේය. පිරිසිදුය යහපත් තොටුපලවල් ඇත්තේය සිත් කලුය බොහෝ මත්ස්‍ය කැස්බෑ ඇත්තේය. රථවරෝද ප්‍රමාණ පියුම් පිපෙති" (iii) භික්ෂූහු නොසතුටුබස් කියන්නට වන්හ. දොස් නගන්නට පටන් ගත්හ. නින්දා කරන්නට වන්හ. කුමක් හෙයින් ආයුෂ්මත් මහමුගලන් තෙමේ මෙසේ කියයිද. (මෙහි (ii) ) ආයුෂ්මත් මුගලන් තෙමේ මනුෂ්‍ය ධර්මයට වඩා උතුම් ධර්මය කියයි. භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. (මෙහි (ii) ) "ඇවැත්නි" වෙනුවට "මහණෙනි" යොදන්න) මහණෙනි, තවද මේ තපෝදාව මහා නරක දෙකක අතරින් එයි එහෙයින් මේ තපෝදාව උෂ්ණ භාවයෙන් ගලාඑයි මහණෙනි, මුගලන් තෙමේ සත්‍යයක් කීයේය මහමුගලන්ට ඇවැත් නැත.

153 එකල්හි වනාහි සේනිය බිම්බිසාර මගධ රජතෙමේ ලිච්ඡවීන් සමග යුධ කරන්නේ පැරදුනේ වී ඉක්බිති රජ තෙමේ සේනාව පසුබස්වා ලිච්ඡවීන් පැරදවූයේය. යුධයෙහි රජුම ලිච්ඡවීන් පැරදූයේයයි රජ බෙරහඬ නගති. ඉක්බිති ආයුෂ්මත් මහමුගලන් තෙමේ භික්ෂූන්ට "ඇවැත්නි, ලිච්ඡවීන් විසින් රජු පරදවන ලද්දේයයි" කීයේය. භික්ෂූහු නින්දා කරත්, දොස්නගත්, නොසතුට ප්‍රකාශ කරත්. "ආයුෂ්මත් මහමුගලන් තෙමේ කුමක් හෙයින් ලිච්ඡවීන් විසින් රජු පරදවන ලද්දේයයි කියයිද? යුධයෙහිද රජු දිනුවේයයි ජයබෙර හඬනගයි ආයුෂ්මත් මහමුගලන් තෙමේ මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්ම කියයි" කියා භාග්‍යවතුන් වහන්සේට සැල කළාහුය. "මහණෙනි, මුලින් ලිච්ඡවීන් විසින් රජු පරදවන

ලදී. ඉක්බිති රජතෙම පස්නාම පසුබස්ම, ලිච්ඡවීන් පරාජය කෙළේය. මහණෙනි, මුගලන් තෙමේ ඇත්තක් කීයේය. මුගලන්ට ඇවැත් නැත."

154 ඉක්බිති ආයුෂ්මත් මහමුගලන් තෙමේ "ඇවැත්නි, මෙහි මම සප්පිනිකා ගඟ අද්දර අනාංජවූ ධ්‍යාන සමාධියට පැමිණියේ බැස එගොඩවන ඇතුන්ගේද ශබ්ද කරණ කොස්වාලිහිණින්ගේද ශබ්ද ඇසුයෙමි." භික්ෂූහු නින්දා කරත්. දොස් නගත්. නොසතුටු බස් කියත් 'කෙසේ නම් ආයුෂ්මත් මහමුගලන් තෙමේ එසේවූ ධ්‍යාන සමාධියට සම වැදුණේ ශබ්ද අසයිද, ආයුෂ්මත් මහමුගලන් තෙමේ මනුෂ්‍ය ධර්මයට වඩා උතුම් ධර්මයක් කියයි" භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. "මහණෙනි, මේ සමාධිය ඇත. එයද අපිරිසිදුය. මහණෙනි, මුගලන් ඇත්තක් කීයේය. මහණෙනි, මුගලන්ට ඇවැත් නැත."

155 ඉක්බිති ආයුෂ්මත් සෝභිත තෙමේ භික්ෂූන් අමතා "ඇවැත්නි, මම පන්සියයක් කල්ප සිහිකරමියි" කීයේය. භික්ෂූහු නින්දා කරත්. දොස් නගත්, නොසතුටු ප්‍රකාශ කරත්, කෙසේ නම් ආයුෂ්මත් සෝභිත තෙමේ 'ඇවැත්නි, මම පන්සියයක් කල්ප සිහි කරමියි' මෙසේ කියයිද? ආයුෂ්මත් සෝභිත තෙමේ මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ධර්මය කියාය"යයි භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළෝය. 'මහණෙනි, මේ ඤාණය සෝභිතට තිබේ. එහෙත් එක් ජාතියකවම සෝභිත ඇත්තක් කීයේය. මහණෙනි, සෝභිතට ඇවැත් නැත"

(සතරවන පාරාජිකය නිමියේය.)

"ආයුෂ්මත්නි, සතර පාරාජිකා ධර්මය දේශනා කරණලදී. යම් භික්ෂුවක් එක්තරා එක්තරා පාරාජිකාවකට පැමිණ භික්ෂූන් සමග සංවාසයක් නොලබයිද, පාරාජිකාවූ පසුවත් පෙර ගිහියකු මෙන් භික්ෂූන් හා සංවාසයට සුදුසු නොවේ. ආයුෂ්මතුන් ඒ සතර පාරාජිකා ධර්මය විචාරමි. කිමෙක්ද? මෙහි පිරිසිදුද? දෙවනුවත් විචාරමි. කිමෙක්ද? මෙහි පිරිසිදුද? තුන්වනවරත් විචාරමි. කිමෙක්ද? මෙහි පිරිසිදුද? ආයුෂ්මත්හු පිරිසිදුය. එහෙයින් නිශ්ශබ්දය, ඒ පිරිසිදුකම මෙසේ දරමි."

(පාරාජිකා නිමි)

# 2. සංඝාදිසෙස දහතුන.

---

ආයුෂ්මත්වරුනි, මේ තෙළෙස් සංඝාදිසෙෂ ධර්මයෝ ප්‍රකාශයට පැමිණෙත්.

---

## 1. සංඝාදිසෙසය

1 (i) ඒ කාලයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර අනේපිඬු මහ සිටාණන් විසින් කරවා පිළිගන්වන ලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක. (ii) ඒ කාලයෙහි වනාහි ආයුෂ්මත්වූ සෙය්‍යසක නම් ස්ථවිරයන් වහන්සේ විසුරුණාවූ සිතින් බ්‍රහ්මචරියාව පුරති. හෙතෙම එයින් (iii) කෘශ බවට පැමිණියේ දුර්වර්ණවූයේ පඬුවන් පැහැය ඇතිවූයේ ඉල්පී නහර වැල් ඇති ශරීරයෙන් යුක්තවූයේ විය. (iv) ආයුෂ්මත්වූ උදායි ස්ථවිර තෙමේ (v) කෘශවූද රූක්ෂ බවට පත්වූකාවූද දුර්වර්ණවූද පඬුවන් පැහැ ඇත්තාවූද ශරීරයෙහි ඉල්පී ගිය නහරවැල් ඇත්තාවූද (v) සෙය්‍යසක තෙරුන් දැක්කේය දැක ආයුෂ්මත් සෙය්‍යසක ස්ථවිරයන් වහන්සේට මෙසේ ප්‍රකාශ කළේය.

2 "ඇවැත් සෙය්‍යසකයෙනි, නුඹ කුමක් හෙයින් (ii) කෘශවූයෙහිද? රළුවූයෙහිද? දුර්වර්ණ වූයෙහිද? තවගත් පඬුවන් පැහැය ඇතිවූයෙහිද? ඉල්පී ගිය නහරවැලින් යුක්තවූ ශරීරය ඇත්තෙහිද? (iii) ආයුෂ්මත් සෙය්‍යසකයෙනි, නුඹ කුමක් හෙයින් අනභිරතව බ්‍රහ්මචරියාව පුරන්නෙහිද?" "ඇවැත්නි, එසේ යයි" කීයේය. ආයුෂ්මත් සෙය්‍යසක ස්ථවිරයෙනි, එසේනම් ඇතිතාක් අනුභව කරව, ඇතිතාක් පානය කරම, ඇතිතාක් ස්නානය කරව, ඇතිතාක් අනුභව කොට, ඇතිතාක් පානයකොට, ඇතිතාක් ස්නානය කොට යම් කලෙක තොප අනභිරතියක් (විසුරුණු සිතක්) ඇතිවන්නේද තොපගේ සිත රාගයෙන් මඩනා ලද්දේද, එකල්හි අතින් ක්‍රියාකොට ශුක්ලමෝචනය කරව" (a) 10

"ඇවැත්නි, කිමෙක්ද? එසේකිරීම සුදුසුද?" "ඇවැත්නි, එසේය, මමද එසේ කරමි."

3 එකල්හි වනාහි ආයුෂ්මත් සෙය්‍යසක ස්ථවිර තෙමේ ඇතිතාක් අනුභව කෙළේය. ඇතිතාක් නිදාගත්තේය. ඇතිතාක් කෑවේය. ඇතිතාක් අනුභව කොට, ඇතිතාක් පානය කොට, ඇතිතාක් ස්නානය කොට, යම් කලෙක විපුරුණු සිතක් උපන්නේද සිත රාගයෙන් මඩනා ලද්දේද එකල්හි අතින් ක්‍රියා කොට ශුක්ල මෝචනය කරයි. එකල්හි ආයුෂ්මත් සෙය්‍යසක ස්ථවිරයන් වහන්සේ ඊට පසුව වර්ණවත් විය. පිනාවා ගිය ඉඳුරන් ඇත්තේ විය. පැහැපත් මුහුණක් ඇත්තේ විය. පැහැපත් ශරීර වර්ණයද ඇත්තේ විය. එකල්හි ආයුෂ්මත් සෙය්‍යසක ස්ථවිරයන් වහන්සේගේ යහළු භික්ෂූහු ඇවැත්වූ සෙය්‍යසක ස්ථවිරයන් වහන්සේට මෙසේ ප්‍රකාශ කළහ.

4 "ඇවැත් සෙය්‍යසක ස්ථවිරයෙනි, ඔබ මීට පෙර (මෙහි 1 (ii)) ඒ ඔබ දැන් වනාහි වර්ණයෙන්ද පිනාගිය ඉඳුරන්ගෙන්ද ප්‍රසන්නවූ මුහුණින්ද ප්‍රසන්නවූ ශරීර වර්ණයෙන්ද යුක්තය. ඇවැත්වූ සෙය්‍යසක ස්ථවිරයෙනි, කිමෙක්ද? ඔබ බෙහෙතක් කරන්නෙහිද?" 'ආයුෂ්මතුනි, මම බෙහෙතක් නොකරමි. එතකුදු වුවත් මම ඇතිතාක් අනුභව කරමි, ඇතිතාක් පානය කරමි, ඇතිතාක් ස්නානය කරමි, ඇතිතාක් අනුභව කොට, ඇතිතාක් පානය කොට, ඇතිතාක් ස්නානය කොට, යම් කලෙක මට විපුරුණු සිතක් ඇතිවූයෙහි නම් රාගයෙන් සිත මැඩගනී නම් එකල්හි අතින් ක්‍රියා කොට ශුක්ල මෝචනය කරමියි" කීයේය.

5 "කිමෙක්ද, ආයුෂ්මත් සෙය්‍යසක ස්ථවිරයෙනි, නුඹ යම් අතකින් ශ්‍රද්ධාවෙන් දෙනලද දෙය අනුභව කරන්නෙහිය. ඒ අතින්ම ක්‍රියා කොට ශුක්ල මෝචනය කරන්නෙහිද?" "ඇවැත්නි, එසේයයි" කීයේය. අල්පේච්ඡවූ යම්බඳු භික්ෂූහු වෙත්ද උන්වහන්සේලා කෙසේ නම් ආයුෂ්මත් සෙය්‍යසක

ස්ථවිරයන් වහන්සේ අතින් ක්‍රියා කොට ශුක්ල මෝචනය කරන්නේදැයි දොස් කීවාහුය. නොසතුට ප්‍රකාශ කළාහුය. නොසතුටු වචන ප්‍රකාශ කළාහුය.

6 (i) එකල්හි ඒ භික්ෂූන් වහන්සේලා ආයුෂ්මත් සෙය්‍යසක ස්ථවිරයන්ට නොයෙක් පරිද්දෙන් ගරහා මේ කාරණය භාග්‍යවතුන් වහන්සේට සැල කළාහුය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ හේතුවෙහි මේ සිද්ධියෙහි භික්ෂු සංඝයා රැස්කරවා ආයුෂ්මත් සෙය්‍යසක ස්ථවිරයන් විචාළේය. "සෙය්‍යසකයෙනි, තෝ අතින් ක්‍රියාකොට ශුක්ල මෝචනය කෙළෙහිය යනු සැබෑද?" "භාග්‍යවතුන් වහන්ස, සැබෑයි" කීයේය. (ii) භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළසේක "හිස් පුරුෂය, නුසුදුසුවූද අනුලෝම නොවූද ප්‍රති-රූප නොවූද අශ්‍රමණකවූද අකැපවූද නොකටයුතුවූද දෙයක් කෙළෙහිය. (iii) හිස් පුරුෂය, තෝ කෙසේනම් අතින් ක්‍රියාකොට ශුක්ල පිට කෙළෙහිද? (iv) (මෙහි 2. 3i (iii) (25 පිට) v මා විසින් නොයෙක් ක්‍රමයෙන් රාගය නැතිකිරීම පිණිස ධර්ම දේශනා කරන ලද්දේ නොවේද? මදය දුරු කිරීම පිණිස, කෙලෙස් පිපාසා සංසිඳුවීම පිණිස, ඇලුම නැසීම පිණිස, සසර සිඳීම පිණිස, තෘෂ්ණාව නැතිකිරීම පිණිස නොඇලීම පිණිස නැතිකිරීම පිණිස නිවන් පිණිස ධර්මදේශනා කරනලද්දේ නොවේද? (vi) හිස් පුරුෂය, මා විසින් නොයෙක් ක්‍රමයෙන් කාමයන්ගේ ප්‍රහාණය කියන ලද්දේ නොවේද? කාම සංඥාවන්ගේ දුරුකිරීම කියන ලද්දේ නොවේද? කාම පිපාසයන්ගේ හැරදැමීම කියන ලද්දේ නොවේද? කාම විතර්කයන්ගේ නැතිකිරීම කියන ලද්දේ නොවේද? කාම පරිදාහයන්ගේ සංසිඳුවීම කියන ලද්දේ නොවේද? හිස් පුරුෂය, (මෙහි 2. 30 (v) "ඇමැත්ති" දක්වා යුතුයි)

7 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සෙය්‍යසකයාහට නොයෙක් ක්‍රමයෙන් ගරහා, (මෙහි 2. 32 (i) (ii) යොදන්න) පිටකරණ චේතනා ඇති ශුක්ල මෝචනය කිරීමෙන් සංඝාදිසේස ආපත්තිය වේයයි. භාග්‍යවතුන් වහන්සේ මෙසේද භික්ෂූන්ට මේ ශික්ෂාපදය පැනවූසේක.

8 එකල්හි වනාහි භික්ෂූන් වහන්සේලා ප්‍රණීත භෝජන අනුභව නොකොට මුලාවූ සිහියෙන් හා ප්‍රඥාවෙන් තොරව නිදාව බැස ගනිත් මුලාවූ සිහිය ඇති ප්‍රඥාවෙන් තොරව නිදාව බැසගත්තාවූ ඔවුන්ට සිහිනෙන් ශුක්ල පිටවෙයි ඔවුන්ට සැකයක් ඇතිවිය. "චේතනා සහිත ශුක්ල මෝචනය කිරීමෙන් සංඝාදිසේස ඇවැත හටගනියි භාග්‍යවතුන් වහන්සේ විසින් ශික්ෂා පදයක් පනවන ලද්දේය. අපටද සිහිනෙන් ශුක්ල මෝචනය වෙයි. මෙහි චේතනා ලැබීමක් ඇත්තේද? කිමෙක්ද? අපි සංඝාදිසේස ඇවැතට පැමිණියේ දැයි" කියයි. භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැල කළාහුය. මහණෙනි, මෙහි චේතනාවක් ඇත්තේය. ඒ අරමුණ ඇස් ඉදිරිපිට නැත. මහණෙනි, මෙයද මේ ශික්ෂා පදය උදෙසාවී. සිහිනෙන් හැර පිටකිරීමේ චේතනා ඇතිව ශුක්‍ර මෝචනය කිරීමෙන් සංඝාදිසේස ඇවැත් වෙයි.

9 "චේතනාව ඇත්තේ යනු" දන්නේ විශේෂයෙන්ම දන්නේ ක්‍රියාකොට පනකිරීමයි. "ශුක්ල" යනු දශ ශුක්‍රයෝයි. එනම් නිල් පාටවූද, කහ පාටවූද, ලේ පාටවූද, සුදු පාටවූද, ගිතෙල් පාටවූද, දිය වැනිවූද, තෙල් වැනිවූද, කිරි වැනිවූද, දධි වැනිවූද, වෙඬරු වැනිවූද යනු දශ ශුක්‍රයෝයි "පෙලීම" යනු ස්ථානයෙන් චුතකිරීමයි. "අඤ්ඤත්‍ර සුපිනන්තා" යනු සිහිනෙන් හැර යනුයි. "සංඝාදිසේසෝ" යනු (ii) සංඝ තෙමේම ඒ ඇවැතට පිරිවෙස් දෙයි. මූලද භාගයෙහි මානත් දෙයි. අවසාන භාගයෙහි අබ්භානය කරයි. ඒ අන්‍යයෝ බොහෝ නොවූද, එක පුද්ගලයෙක් නොවූද සංඝයා සහිතව කළයුතු නිසා සංඝාදිසේස නම් වේ. ඒ ඇවැත් සමූහයට මේ නාමයකි. එහෙයින්ද සංඝාදිසේස කියනලදී

10 තමාගේ අත් ආදී රූපයෙහි, පිටත්හිවූ අත් ආදී රූපයෙහි තමාගේ හෝ පිට අයගේ යන දෙආකාර රූපයෙහි අහසෙහි උකුල සෙලවීමෙන් මෝචනය කෙරේද,

(මෙහි පහත දක්වන වචන අගට "මෝචනය කෙරේද" යොදගත යුතුයි)

රාගය උදවු විෂමින්- ශුක්ල උද්මූ විෂමෙන්- මූත්‍ර වැඩිවූ කල්හි- වාතය උපන් කල්හි- දලඹු ආදීන්ගේ ස්පර්ශය ඇති කල්හි- නීරෝග බව පිණිස- සැප පිණිස- බෙහෙත් පිණිස- දීම පිණිස- පින් පිණිස- යාග පිණිස- ස්වර්ගය පිණිස- බීජ පිණිස- විමංසනය පිණිස- අලංකාරය පිණිස- නිල් පැහැයෙන්- කහ පැහැයෙන්- ලේ පැහැයෙන්- සුදු පැහැයෙන්- කිතෙල් වැනිව- දිය වැනිව- තෙල් වැනිව- කිරි වැනිව- දී වැනිව- වෙඩරු වැනිව- යන ආකාරවලිනි.

11 "තමා කෙරෙහි රූපයෙහි" යනු ස්වර්ණාදිය විසින් තමාගේයයි ගන්නා ලද රූපයෙහි වේ. "පිටත්හිවූ රූපයෙහි" යනු පිටත්හිවූ ස්වර්ණාදිය විසින් ගන්නා ලද හෝ නොගන්නා ලද රූපයෙහි වේ. "තමා තුළහෝ පිටත රූපයෙහි" යනු ඒ දෙකෙහිම වේ. "ආකාශයෙහි උකුල සොලවන්නේ" යනු ආකාශයෙහි වැයම් කරන්නාහුගේ ලිංගය ක්‍රියාවට යොග්‍ය වෙයි. (මේ වාක්‍ය අගට "ලිංගය ක්‍රියාවට යොග්‍ය වෙයි" යොදන්න) රාගයෙන් උදවුවිෂමින් යනු රාගයෙන් පීඩිතවූවහුගේ- ශුක්ල උදවිවූ කල්හි යනු වර්චස් වලින් පීඩිතවූවහුගේ- මූත්‍ර පිරුණු කල්හි- යනු මූත්‍ර මල වලින් බරවූ කල්හි- 'වාතයෙන් තදවූ කල්හි' යනු වාතයෙන් පීඩිතවූවහුගේ- දලඹුවන් දෂ්ට කළ කල්හි යනු දලඹු ආදීන් දෂ්ට කිරීමෙන්- ලිංගය "ක්‍රියාවට යොග්‍ය වෙයි. නිරෝග බව පිණිස" යනු නිරෝගී වෙමියි සිතායි සැප පිණිස යනු සැප වේදනා උපදවමියි සිතායි, බෙහෙත් පිණිස යනු බෙහෙතක් වන්නේයයි සිතායි. දීම පිණිස යනු දනක් දෙන්නෙමියි සිතායි, පින් පිණිස යනු පින් ඇතිවන්නේයයි සිතායි, යාග පිණිස යනු යාග පිණිස වන්නේයයි සිතායි, ස්වර්ගය පිණිස යනු ස්වර්ගයට යන්නෙමියි සිතායි, බීජ පිණිස යනු බීජයක් වන්නේයයි සිතායි, දුනගනු පිණිස යනු නීලාදී වර්ණ බලමියි සිතාය ක්‍රීඩා පිණිස යනු ක්‍රීඩා අදහස් ඇතුවය.

12 තමාගේ රූපයෙහි සිතසිද, ක්‍රියා කෙරේද, පිට කෙරේද සංඝාදිසෙස ඇවැත්වේ. පිටත රූපයෙහි සිතසිද

ක්‍රියා කෙරේද පිට කෙරේද සංසාදියෙහි ඇවැත් වේ. තමන්ගේ හෝ පිවත්සිවූ රූපයෙහි (මේ වාක්‍ය අගට "චේතනා සහිතවූයේ උපක්‍රම කෙරේද, මෝචනය කෙරේද සංසාදියෙහි ඇවැත්වේ" යනයෙහි උකුල සෙලවීමෙන්- රාගයෙන් උදම්වීමෙන්- අශුචි බරවීමෙන්- මුත්‍ර බරවීමෙන්- වාතය හැදවීමෙන්- දළඹුවන් දෂ්ට කිරීමෙන්- නිරෝගි බැව් පිණිස- සැප පිණිස- බෙහෙත් පිණිස- දානය පිණිස- පින් පිණිස- යාග පිණිස- සවර්ගය පිණිස- බීජ පිණිස- විමසා බැලිම පිණිස- ක්‍රීඩා පිණිස- නීලවණ් බැව් බැලිම පිණිසද, තනවන් බැව් බැලීම පිණිසද, ලෙහෙවන් බැව් බැලීම පිණිසද, සුදුවන් බැව් බැලිම පිණිසද ගිතෙල්වන් බැව් බැලිම පිණිසද, දියවන් බැව් බැලිම පිණිසද, තෙල්වන් බැව් බැලිම පිණිසද, කිරිවන් බැව් බැලිම පිණිසද, දීවන් බැව් බැලිම පිණිසද, ජෙඩරුවන් බැව් බැලිම පිණිසද, චේතනා සහිතවූයේ උපක්‍රම කෙරේද, මෝචනය කෙරේද, සංසාදියෙහි ඇවැත්වේ.

---

1 (මෙහි 1-16 ඡේදවල වාක්‍ය අගට "චේතනා සහිතවූයේ උපක්‍රම කෙරේද, මෝචනය කෙරේද සංසාදියෙහි ඇවැත් වේ." යෙදිය යුතුයි.) නිරෝගි බැව් පිණිසද සැප පිණිසද නිරෝගි බැව්ද බෙහෙත්ද පිණිස- නිරෝගි බැව්ද පිංද පිණිස- නිරෝගි බැව්ද යාගද පිණිස- නිරෝගි බැව්ද සවර්ගයද පිණිස- නිරෝගි බැව්ද බීජද පිණිස- නිරෝගි බැව්ද විමංසනයද පිණිස- නිරෝගි බැව්ද අලංකාරයද පිණිස-

(එකමූලක ඛණ්ඩ චක්කය නිමි)

---

2 සැපද බෙහෙත්ද පිණිස- සැපද දානද පිණිස- සැපද පිංද පිණිස- සැපද යාගද පිණිස- සැපද සවර්ගයද පිණිස- සැපද බීජද පිණිස- සැපද පරීක්ෂාකිරීමද පිණිස- සැපද අලංකාරයද පිණිස- සැපද නිරෝගි බැව්ද පිණිස -

එකමූලක බද්ධ චක්කය සංක්ෂෙපයෙනි

---

3 අලංකාරයද නිරෝගි බැව්ද පිණිස- චෛතන්‍ය සහිතව අලංකාරයද සැපද පිණිස- අලංකාරයද බෙහෙත්ද පිණිස-අලංකාරයද දීමද පිණිස-අලංකාරයද යාගද පිණිස- අලංකාරයද සවර්ගයද පිණිස- අලංකාරයද බීජද පිණිස- අලංකාරයද පරීක්ෂා කිරීම්ද පිණිස-

එකමූලක චක්ක පෙය්‍යාලය නිමි.

---

4 නිරෝගි බැව්ද සැපද බෙහෙත්ද පිණිස- නිරෝගි බැව්ද සැපද අලංකාරයද පිණිස-

විමූලක ඛණ්ඩ චක්කයයි.

---

5 සැපද බෙහෙත්ද දානද පිණිස- සැපද බෙහෙත්ද අලංකාරයද පිණිස- සැපද බෙහෙත්ද නිරෝගි බැව්ද පිණිස-

දුමූලක ඛණ්ඩ චක්කය සංක්ෂෙපයෙනි.

---

6 විෂසිමද නිරෝගි බැව්ද අලංකාරයද පිණිස- විෂසිමද අලංකාරයද සැපද පිණිස- විෂසිමද අලංකාරයද බීජද පිණිස-

තිමූලකය නිමි.

---

ත්‍රිමූලිකයද චතුමූලිකයද පංචමූලිකයද ෂට්මූලිකයද සත්තමූලිකයද අටක්වූ මූලිකයද නවයක්වූ මූලිකයද මෙසේ විස්තර කළ යුතුයි.

7 නිරෝගි බැව්ද සැපද බෙහෙත්ද දීමද පිංද යාගද සවර්ගයද බීජද විමංසනයද සැරසීම්ද පිණිස-

සබ්බමූලක චක්ක පෙය්‍යාලය නිමි.

---

8 නීලවණී බැව් බැලීමද කහවත් බැව් බැලීමද පිණිස- නීලවණී බැව් බැලීමද ලෙහෙවත් බැව් බැලීමද පිණිස- නීලවණී බැව් බැලීමද සුදුවත් බැව් බැලීමද පිණිස නීලවණී බැව් බැලීමද ගිතෙල්වත් බැව් බැලීමද පිණිස- නීලවණී බැව් බැලීමද දියවත් බැව් බැලීමද පිණිස- නීලවණී බැව්

බැලීමද තෙල්වන් බැව් බැලීමද පිණිස- තිල්වන් බැව් බැලීමද- කිරිවන් බැව් බැලීමද පිණිස- තිල්වන් බැව් බැලීමද දීවන් බැව් බැලීමද පිණිස- නීලමණි බැව් බැලීමද වෙඩරුවන් බැව් බැලීමද පිණිස-

එකමූලක ඛණ්ඩචක්කය නිමි.

---

9 කහවන් බැව් බැලීමද ලෙහෙවන් බැව් බැලීමද පිණිස-කහවන් බැව් බැලීමද සුදුවන් බැව් බැලීමද පිණිස- කහවන් බැව් බැලීමද ගිතෙල්වන් බැව් බැලීමද පිණිස- කහවන් බැව් බැලීමද දියමන් බැව් බැලීමද පිණිස-කහවන් බැව් බැලීමද තෙල්වන් බැව් බැලීමද පිණිස- කහවන් බැව් බැලීමද කිරිවන් බැව් බැලීමද පිණිස- කහවන් බැව් බැලීමද දීවන් බැව් බැලීමද පිණිස- කහවන් බැව් බැලීමද වෙඩරුවන් බැව් බැලීමද පිණිස- කහවන් බැව් බැලීමද නීලමණි බැව් බැලීමද පිණිස-.

ඒකමූලක බද්ධචක්‍රය නිමි.

---

මූලය සංක්ෂෙපලක්ෂණයි,

10 වෙඩරුවන් බැව් බැලීමද නීලමණි බැව් බැලීමද පිණිස- වෙඩරුවන් බැව් බැලීමද කහවන් බැව් බැලීමද පිණිස- වෙඩරුවන් බැව් බැලීමද ලෙහෙවන් බැව් බැලීමද පිණිස- වෙඩරුවන් බැව් බැලීමද සුදුවන් බැව් බැලීමද පිණිස-වෙඩරුවන් බැව් බැලීමද ගිතෙල්වන් බැව් බැලීමද පිණිස- වෙඩරුවන් බැව් බැලීමද දියමන් බැව් බැලීමද වෙඩරුවන් බැව් බැලීමද තෙල්වන් බැලීමද වෙඩරුවන් බැව් බැලීමද කිරිවන් බැව් බැලීමද වෙඩරුවන් බැව් බැලීමද දීවන් බැව් බැලීමද පිණිස චේතනාව සහිත වූයේ උපක්‍රම කෙරේද මෛත්‍රවතය කෙරේද සංඝාදිසේස ඇවැත්වේ.

ඒකමූලකය නිමි.

---

11 නීලමණි බැව් බැලීමද කහවන් බැව් බැලීමද ලෙහෙවන් බැව් බැලීමද පිණිස- නීලමණි බැව් බැලීමද

කහවන් බැව් බැලීමද සුදුවන් බැව් බැලීමද පිණිස- නීලවණ් බැව් බැලීමද කහවන් බැව් බැලීමද මෙඩරුවන් බැව් බැලීමද පිණිස-

ද්විමූලක ඛණ්ඩචක්කයයි.

---

12 කහවන් බැව් බැලීමද ලෙහෙවන් බැව් බැලීමද, සුදුවන් බැව් බැලීමද පිණිස- කහවන් බැව් බැලීමද ලෙහෙවන් බැව් බැලීමද මෙඩරුවන් බැව් බැලීම පිණිසද- කහවන් බැව් බැලීමද ලෙහෙවන් බැව් බැලීමද නීලවණ් බැව් බැලීම පිණිසද,-

ද්විමූලක බද්ධචක්කයයි.

---

13 දිවන් බැව් බැලීමද මෙඩරුවන් බැව් බැලීමද නීලවණ් බැව් බැලීමද පිණිස- දිවන් බැව් බැලීමද මෙඩරුවන් බැව් බැලීමද කිරිවන් බැව් බැලීමද පිණිස-,

ද්විමූලකය නිමි.

---

14 (ත්‍රි මූලිකයද, චතුමූලිකයද, පංචමූලිකයද, ෂට් මූලිකයද සප්ත මූලිකයද, අෂ්ටමූලිකයද නව මූලිකයද මෙසේ විස්තර කටයුතුයි )

නීලවණ් බැව් බැලීමද කහවන් බැව් බැලීමද ලෙහෙවන් බැව් බැලීමද සුදුවන් බැව් බැලීමද ගිතෙල්වන් බැව් බැලීමද, දියවන් බැව් බැලීමද, තෙල්වන් බැව් බැලීමද, කිරිවන් බැව් බැලීමද, දිවන් බැව් බැලීමද, මෙඩරුවන් බැව් බැලීමද පිණිසද.

සබ්බ මූලක එක්කපෙය්‍යාලය නිමි

---

15 නිරෝගි බැව් පිණිසද, නීලවණ් බැව් පිණිසද, නිරෝගි බැව් පිණිසද, සැප පිණිසද, නිල් බැව් පිණිසද, කහවන් බැව් පිණිසද, නිරෝගි බැව් පිණිසද, සැප පිණිසද, සබෙහෙත් පිණිසද, තිල්වන් බැව් පිණිසද, කහවන් බැව් පිණිසද, ලෙහෙවන් බැව් පිණිසද.

උභතොවඩ්ඪනක මෙසේම දතයුතුයි

---

16 ආරෝග්‍යය පිණිසද සැප පිණිසද බෙහෙත් පිණිසද දූත පිණිසද, පිං පිණිසද, යාග පිණිසද, සවගීය පිණිසද, බීජ පිණිසද, විමංසනය පිණිසද, ක්‍රීඩා පිණිසද, නීල වණී පිණිසද, කහවන් පිණිසද, ලෙහෙවන් පිණිසද, සුදුවන් පිණිසද, ගිතෙල්වන් පිණිසද, දියවන් පිණිසද, තෙල්වන් පිණිසද, කිරිවන් පිණිසද, දීවන් පිණිසද, මෙඬරුවන් පිණිසද, චේතනා සහිතව උපක්‍රම කෙරේද මෝචනය කෙරේද, සංඝාදිසේස ඇවැත් වේ.

මිස්සක වග්ගය නිමි.

---

1 නිල්වන් ශුක්‍ර මෝචනය කරන්නෙමියි සිතාද උපක්‍රම කෙරේද කහවන් ශුක්ල මෝචනය කෙරේද? සංඝාදිසේස ඇවැත්වේ.

2 (මෙහි 1 ඡේදය යෙදීමේදී 'කහවන්' වෙනුවට මෙහි දක්වන වචන යොදන්න.) 'සුදුවන්' 'ගිතෙල්වන්' 'දියවන්' 'තෙල්වන්' 'කිරිවන්' 'දීවන්' 'මෙඬරුවන්'

3 කහවන් ශුක්‍ර මෝචනය කරන්නෙමියි සිතාද උපක්‍රම කෙරේද ලෙහෙවන් ශුක්‍ර මෝචනය කෙරේද සංඝාදිසේස ඇවැත්වේ.

4–11 (මෙහි 3 ඡේදයේ 'ලෙහෙවන්' වෙනුවට මෙහි දක්වන වචන යොදන්න ) 'සුදුවන්' 'ගිතෙල්වන්' 'දියවන් තෙල්වන් කිරිවන් දීවන් මෙඬරුවන් නිල්වන්.

බද්ධචක්‍රයයි. සංඛිත්ත මූලයයි.

---

12 මෙඬරුවන් ශුක්‍ර මෝචනය කරන්නෙමියි සිතාද, උපක්‍රම කෙරේද නිල්වන් ශුක්‍ර මෝචනය කෙරේද, සංඝාදිසේස ඇවැත්වේ.

13–20 (මෙහි 12 ඡේදයේ 'නිල්වන්' වෙනුවට මෙහි දක්වන වචන යොදන්න ) 'කහවන්' 'ලෙහෙවන්' 'සුදුවන්' 'ගිතෙල්වන්' 'දියවන්' 'තෙල්වන්' 'කිරිවන්' 'දීවන්'

කුච්ඡි චක්‍රයයි.

---

21 කහවන් ශුක්‍ර මෝචනය කරන්නෙමියි සිතාද උප-ක්‍රම කෙරේද? නිල්වන් ශුක්‍ර මෝචනය කෙරේද සංඝාදි-සේස ඇවැත් වේ.

22-29 (මෙහි 21 ඡේදයේ 'නිල්වන්' වෙනුවට මෙහි දක්වන වචන යොදන්න.) 'ලෙහෙවන්' 'සුදුවන්' 'ගිතෙල්වන්' 'දියවන්' 'තෙල්වන්' 'කිරිවන්' 'දීවන්' 'මේඩරුවන්' 'නිල්වන්'

පිට්ඨිචක්‍රයාගේ ප්‍රථම ගමනයි.

---

30 'ලෙහෙවන් ශුක්‍ර මෝචනය කරන්නෙමියි සිතාද' උපක්‍රම කෙරේද, කහවන් ශුක්‍ර මෝචනය කෙරේද, සං-ඝාදිසේස ඇවැත්වේ.

31-38 (මෙහි 30 ඡේදයේ 'කහවන්' වෙනුවට මෙහි දක්වන වචන යොදන්න ) 'සුදුවන්' 'ගිතෙල්වන්' 'දියවන්' 'තෙල්වන්' 'කිරිවන්' 'දීවන්' 'මේඩරුවන්' 'නිල්වන්' 'කහවන්'

පිට්ඨිචක්‍රයාගේ දෙවෙනි ගමනයි.

---

39 සුදුවන් ශුක්‍ර මෝචනය කරන්නෙමියි සිතාද උපක්‍රම කෙරේද ලෙහෙවන් ශුක්‍ර මෝචනය කෙරේද, සංඝාදිසේස ඇවැත්වේ.

40-47 (මෙහි 39 ඡේදයේ 'ලෙහෙවන්' වෙනුවට මෙහි දක්වන වචන යොදන්න ) ගිතෙල්වන්, දියවන්, තෙල්වන්, කිරිවන්, දීවන්, මේඩරුවන්, නිල්වන්, කහවන්, ලෙහෙවන්,

පිට්ඨි චක්‍රයාගේ තුන්වන ගමනයි.

---

48. ගිතෙල්වන් ශුක්‍ර මෝචනය කරන්නෙමියි. සිතාද උපක්‍රම කෙරේද සුදුවන් ශුක්‍ර මෝචනය කෙරේද සංඝාදිසේස ඇවැත්වේ

49-56 (මෙහි 48 ඡේදයේ 'සුදුවන්'' වෙනුවට මෙහි දක්වන වචන යොදන්න ) දියවන්- තෙල්වන්- කිරිවන්- දීවන්- මේඩරුවන්- නිල්වන්- කහවන්-ලෙහෙවන්-සුදුවන්-

පිට්ඨි චක්‍රයාගේ සතරවෙනි ගමනයි.

---

57. දියවන් ශුක්‍ර මෝචනය කරන්නෙමියි. සිතාද උපක්‍රම කෙරේද ගිතෙල්වන් ශුක්‍ර මෝචනය කෙරේද සංඝාදිසේස ඇවැත්වේ

58-65 (මෙහි 57 ඡේදයේ "ගිතෙල්වන්" වෙනුවට මෙහි දක්වන වචන යොදන්න.) තෙල්වන්- කිරිවන්- දීවන්- වෙඬරුවන්- නිල්වන්- කහවන්- ලෙහෙවන්- සුදුවන්- ගිතෙල්වන්-

පිටයි චක්‍රාංගයේ පස්වෙනි ගමනයි.

66 තෙල්වන් ශුක්‍ර මෝචනය කරන්නෙමියි. සිතාද උපක්‍රම කෙරේද දියවන් ශුක්‍ර මෝචනය කෙරේද, සංඝාදිසේස ඇවැත්වේ

67-74 (මෙහි 66 ඡේදයේ "දියවන්" වෙනුවට මෙහි දක්වන වචන යොදන්න.) කිරිවන්- දීවන්- වෙඬරුවන් - නිල්වන්-කහවන්-, ලේවන් සුදුවන්-ගිතෙල්වන්-දියවන්-

පිටයි චක්‍රාංගයේ සවැනි ගමනයි

---

75 කිරිවන් ශුක්‍ර මෝචනය කරන්නෙමියි. සිතාද උපක්‍රම කෙරේද තෙල්වන් ශුක්‍ර මෝචනය කෙරේද සංඝාදිසේස ඇවැත්වේ

76-83 (මෙහි 75 ඡේදයේ "තෙල්වන්" වෙනුවට මෙහි දක්වන වචන යොදන්න.) දීවන්- වෙඬරුවන්- නිල්වන්- කහවන්- ලේවන්- සුදුවන්- ගිතෙල්වන්- දියවන්- තෙල්වන්

පිටයි චක්‍රාංගයේ සත්වන ගමනයි.

---

84 දීවන් ශුක්‍ර මෝචනය කරන්නෙමියි. සිතාද උපක්‍රම කෙරේද කිරිවන් ශුක්‍ර මෝචනය කෙරේද සංඝාදිසේස ඇවැත්වේ.

85-92 (මෙහි 84 ඡේදයේ "කිරිවන්" වෙනුවට මෙහි දක්වන වචන යොදන්න.) වෙඬරුවන්- නිල්වන්- කහවන්- ලේවන්-සුදුවන්- ගිතෙල්වන්- දියවන්- තෙල්වන්- කිරිවන්-

පිටයි චක්‍රාංගයේ අටවෙනි ගමනයි

---

93 වෙඬරුවන් ශුක්‍ර මෝචනය කරන්නෙමියි, සිතා ද උපක්‍රම කෙරේද දීවන් ශුක්‍ර මෝචනය කෙරේද සංඝාදිසේස ඇවැත් වේ.

94-101 (මෙහි 93 ඡේදයේ "දීවන්" වෙනුවට මෙහි දැක්වෙන වචන යොදන්න.) නිල්වන්- කහවන්- ලේවන්- සුදුවන්- මෝරුවන්- දියවන් - තෙල්වන්- කිරිවන්-

පිට්ඨි චක්‍රයාගේ නමවන ගමනයි.

---

102 නිල්වන් ශුක්‍ර මෝචනය කරන්නෙමියි. සිතා ද උපක්‍රම කෙරේද වෙඬරුවන් ශුක්‍ර මෝචනය කෙරේද සංඝාදිසේස ඇවැත් වේ.

103-110 (මෙහි 102 ඡේදයේ "වෙඬරුවන්" වෙනුවට මෙහි දැක්වෙන වචන යොදන්න.) කහවන්- ලේවන්- සුදුවන්- මෝරුවන්- දියවන්- තෙල්වන්- කිරිවන්- දීවන්-

පිට්ඨි චක්‍රයාගේ දසවැනි ගමනයි.

පිට්ඨි චක්‍රය නිමි.

---

111 සිතා ද උපක්‍රම කෙරේද මෝචනය කෙරේද සංඝාදිසේස ඇවැත් වේ. සිතා ද උපක්‍රම කෙරේද මෝචනය නොකෙරේද ථුලසි ඇවැත් වේ. සිතා ද උපක්‍රම නොකෙරේද මෝචනය නොකෙරේද ඇවැත් නොවේ. සිතා ද උපක්‍රම නොකෙරේද මෝචනය නොකෙරේද ඇවැත් නොවේ. නොසිතා ද උපක්‍රම කෙරේද මෝචනය කෙරේද ඇවැත් නොවේ. නොසිතා ද උපක්‍රම කෙරේද මෝචනය නොකෙරේද ඇවැත් නොවේ. නොසිතා ද උපක්‍රම නොකෙරේද මෝචනය කෙරේද ඇවැත් නොවේ. නොසිතා ද උපක්‍රම නොකෙරේද මෝචනය නොකෙරේද ඇවැත් නොවේ.

112 සිහින දකින්නහුවද, මිදීමෙ අදහසක් නැත්තහුවද, උමතු වූ ඇත්තහුවද, සිත විසුරුණු තැනැත්තහුවද, වේදනාවෙන් පෙළෙන්නහුවද, ආදි කම්මිකයාවද, ඇවැත් නොවේ

113 සිහිනෙන් මෝචනය වීමෙහිද අදහසක් නොමැතිව මෝචනය කිරීමෙන්ද උම්මත්තකයාගේ මෝචනයෙන්ද

විසුරුණාවූ සිත් ඇත්තහුගේ මෝචනයද වේදනාවෙන් පෙළෙන්නහුගේ මෝචනයද ආදිකර්මිකයාගේ මෝචනයද සංඝාදිශේෂ ඇවැත් පිණිස නොවේ. සිහින දකින්නහුවද මලමූත්‍ර කරන්නහුවද විතක්ක ඇත්තහුටද උණුදියෙන් නාන්නහුවද බෙහෙත් කරන්නහුවද කැසීම් ඇත්තහුවද මස්නී මාගී ජඞ්ගා මාගී සහ මෙහි උපක්‍රම කරන්නහුවද සාමණේරයාවද නිදන්නහුවද මිටින් රහස්ග පීඩනය කරන්නහුවද අනෙකෙහි සට්ටම්පනයෙහිද කාය බද්ධ කරන්නහුවද ස්ත්‍රී රහස්ග බලන්නහුවද කවුළුවකින් ගමන්නහුවද දියෙහි සෙල්ලම් කරන්නහුවද පුප්ඵාවලිය කොකුණු මැලිතලා මඩ මගුරු මිටි ආසක ලෙස මේ ස්ථානයන්හිදී ඇතිවන මෝචනයාගේ ඇවැත් විස්තර මෙතැන් පටන් කියනු ලැබේ.

---

## 2 කථා

1 එසමයෙහි වනාහි එක්තරා භික්ෂුවකට නිදන කල්හි ශුක්‍ර පහවිය. (ii) ඔහුට සැකයක් ඇතිවිය. 'කිමෙක්ද? මම සංඝාදිශේෂ ඇවතට පැමිණියෙම්දැයි කියායි'' එකල්හි ඒ භික්ෂූන් වහන්සේ මේ කාරණය භාග්‍යවතුන් වහන්සේට සැල කෙළේය. (iii). මහණ, සිහිනෙන් වන පහවීමෙහි ඇවැත් නැත්තේයයි වදාළහ.

2 එකල්හි වනාහි එක්තරා භික්ෂුවකට මල පහකරන කල්හි ශුක්‍ර පහවිය. (මෙහි 1 (ii) ) "මහණ, තොපි එය සිතින් ශුක්‍රය තෙළෙහිද?" "භාග්‍යවතුන් වහන්ස, මට එම කිරීමේ අදහසක් නොවීය." (1) 'මහණ, පිට කිරීමේ අදහසක් නැත්තහුට ඇවැත් සිදුනොවේ "

3 එකල්හි වනාහි එක්තරා භික්ෂුවකට මූත්‍ර කරනවිට ශුක්‍රපිටවිය. (මෙහි 1 (ii) සහ 2 (ii)

4 ඒ කාලයෙහි වනාහි රාග සිතිවිල්ලක් ඇති භික්ෂුවකට ශුක්‍ර පිටවිය. (මෙහි 1 (ii) ) "මහණ, රාග සිතිවිල්ල ඇත්තහුට ඇවැත් සිදුනොවේ "

5 එකල්හි වනාහි උණුදිය නාන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර පිටවිය (මෙහි 1 ii))

6 එකල්හි වනාහි උණුදිය නාන්නාවූ එක්තරා භික්ෂුවකට පිටකිරීමේ අදහස ඇතිව ශුක්‍ර පිටවිය. (මෙහි 1 (ii) ) "මහණ, තෝ සංඝාදිසේසය ඇවැතට පැමිණියේයයි" වදාළහ. (iii)

7 එසමයෙහි වනාහි පිටකිරීමේ අදහසක් ඇති උණුදිය නාන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර පිටනොවිය. (මෙහි 1 (ii) "මහණ, සංඝාදිසේස ඇවැත් නොවේ. ථුලසී ඇවැත් වන්නේයයි" වදාළහ.

8 එකල්හි වනාහි එක්තරා භික්ෂුවකගේ ලිංගයෙහි වණයක් විය. බෙහෙත් ගල්වන කල්හි ශුක්‍ර පිටවිය. (මෙහි 1 (ii) සහ 2 (ii)

9 (i) එකල්හි වනාහි එක්තරා භික්ෂුවකගේ ලිංගයෙහි වණයක් විය. පිටකිරීමේ අදහස ඇතිව බෙහෙත් ගල්වන ඔහුට ශුක්‍ර පිටවිය. (මෙහි 1 (ii) සහ 6 (ii)

10 (මෙහි 9 (i) ඔහුට ශුක්‍ර පිට නොවිය. (මෙහි 1 (ii) සහ 7 (ii)

11 එකල්හි වනාහි එක්තරා භික්ෂුවකට අණ්ඩය කසන කල්හි ශුක්‍ර පිටවිය. (මෙහි 1 (ii) සහ 2 (il)

12 (i) එකල්හි වනාහි එක්තරා භික්ෂුවකට ශුක්‍ර පිට කිරීමේ අදහසින් යුක්තව අණ්ඩය කසන කල්හි (ii) ශුක්‍ර පිටවිය. (මෙහි 1 (ii) සහ 6 (ii)

13 (මෙහි 12 (i) ශුක්‍ර පිටනොවිය. (මෙහි 1 (ii) සහ 7 (ii)

14 එකල්හි වනාහි මාර්ගයෙහි ගමන් කරන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍රපිටවිය. (මෙහි 1 (2) සහ 2 (2)

15 (1) එකල්හි වනාහි පිට කිරීමේ අදහස් ඇතිව මාර්ගයෙහි යන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර (ii) පිටවිය. (මෙහි 1 (ii) සහ 6 (ii)

16 (මෙහි 15 (i) ) ශුක්‍ර පිට නොවිය. (මෙහි 1 (ii) සහ 7 (ii)

17 එසමයෙහි වනාහි මත්තිය ගෙණ මූත්‍ර පහකරන් නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර පිටවිය. (මෙහි 1 (ii) සහ 2 (ii)

18 (i) එකල්හි වනාහි පිටකිරීමේ අදහස් ඇතිව මත්තිය ගෙණ මූත්‍ර පහකරන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර (ii) පිට විය. (මෙහි 1 (ii) සහ 6 (ii)

19 (මෙහි 18 (i), 1 (ii) සහ 7 (ii) පිටනොවිය

20 එකල්හි වනාහි ගිනිහල් ගෙයිදී බඩපිටේ තවන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර පිටවිය. (මෙහි 1 (ii) සහ 2 (ii)

21 එකල්හි වනාහි ගිනිහල්ගෙහි උපාධ්‍යායයන්ගේ පිට පිරිමැදීම කරන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර පිටවිය. (මෙහි 1 (ii) සහ 2 (ii)

22 (i) එකල්හි වනාහි ගිනිහල්ගෙහි පිටකිරීමේ අදහස් ඇතිව උපාධ්‍යායයන්ගේ පිට පිරිමැදීම කරන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර (ii) මෝචනය විය. (මෙහි 1 (ii) සහ 6 (ii)

23 (මෙහි 22 (i) පිට නොවිය. (මෙහි 1 (ii) සහ 7 (ii)

24 එකල්හි වනාහි (සවතිය) කලවා සට්ටනය කරන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර පිටවිය. (මෙහි 1 (ii) සහ 2(ii)

25 (i) එකල්හි වනාහි පිටකිරීමේ අදහස් ඇතිව කලවා සට්ටනය කරන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර (ii) පිටවිය. (මෙහි 1 (ii) සහ 2 (ii)

26 (මෙහි 25 (1) පිට නොවිය. (මෙහි 1 (ii) සහ 7 (ii)

27 එකල්හි වනාහි මෝචනය කිරීමේ අදහසක ඇතිව එක්තරා භික්ෂුවක් එක් සාමණේර නමකට මෙසේ කීය. "ඇවැත් සාමණේරය, තෝ මෙහි එව, මගේ ලිංගය අල්වා ගනුමැයි" කීයේයි. හෙතෙම ඔහුගේ ලිංගය අල්වා ගත්තේය, ඔහුට ශුක්‍ර පිටවිය. (මෙහි 1 (ii) සහ 6 (ii)

28 එසමයෙහි වනාහි එක්තරා භික්ෂුවක් නිදන්නාවූ සාමණේර නමකගේ ලිංගය අල්වා ගත්තේය. ඔහුට ශුක්‍ර පිටවිය. (මෙහි 1 (ii) මෙතෙක්, සංඝාදිසේසය ඇවැත් නොවේ. දුකුලා ඇවැත් වන්නේයයි" වදාළහ.

29 (i) එසමයෙහි වනාහි පිටකිරීමේ අදහස් ඇතිව ලිංගය කලවාවල පීඩනය කරන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර (ii) පිටවිය. (මෙහි 1 (ii) සහ 6 (ii)

30 (මෙහි 29 (i) පිට නොවිය. (මෙහි 1 (ii) සහ 7 (ii)

31 (i) එකල්හි වනාහි මෝචනය කිරීමේ අදහස් ඇතිව ලිංගය මිටින් පීඩනය කරන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර (ii) පිටවිය. (මෙහි 1 (ii) සහ 6 (ii) )

32 (මෙහි 31 (i) පිට නොවිය. (මෙහි 1 (ii) සහ 7 (ii) )

33 (i) එසමයෙහි වනාහි පිට කිරීමේ අදහස් ඇතිව අවකාශයෙහි උකුල සොලවන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර (ii) පිටවිය. (මෙහි 1 (ii) සහ 6 (ii) )

34 (මෙහි 33 (i) පිටනොවිය. (මෙහි 1 (ii) සහ 7 (ii) )

35 එසමයෙහි වනාහි කය ප්‍රාණවත් කරන්නාවූ එක් තරා භික්ෂුවකට ශුක්‍ර පිටවිය. (මෙහි 1 (ii) සහ 2 (ii) )

36 (i) එසමයෙහි වනාහි මෝචනය කිරීමේ අදහස් ඇතිව කය ප්‍රාණවත් කරන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර (ii) පිට විය (මෙහි 1 (ii) සහ 6 (ii) )

37 (මෙහි 36 (i) ) පිටනොවිය. (මෙහි 1 (ii) සහ 7 (ii) )

38 එසමයෙහි වනාහි එක්තරා භික්ෂුවක් රාගයෙන් රත්වූයේ ස්ත්‍රියකගේ යෝනියක් සිතින් අදහස් කෙළේය. ඔහුට ශුක්‍ර පිට විය. (මෙහි 1 (ii) ) "මහණෙනි, සංඝාදිසේස ඇවැත් නොවේ මහණෙනි, රාගයෙන් රත්වූ සිතින් ස්ත්‍රියකගේ යෝනිය සිතින් නොසිතිය යුතුය. යමෙක් සිතන්නේ නම් දුකුළා ඇවැත් වන්නේයයි වදාළහ

39 (i) එකල්හි වනාහි පිට කිරීමේ අදහසින් ලිංගය යතුරු සිදුරකට ප්‍රවේශ කරන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර මෝචනය (ii) විය. (මෙහි 1 (ii) සහ 6 (ii) )

40 (මෙහි 39 (i) ) නොවිය. (මෙහි 1 (ii) සහ 7 (ii) )

41 (i) එකල්හි වනාහි පිට කිරීමේ අදහස් ඇතිව ලී කෑල්ලකින් ලිංගය සට්ටනය කරන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර (ii) පිට විය. (මෙහි 1 (ii) සහ 6 (ii) )

42 (මෙහි 41 (i) ) පිට නොවිය. (මෙහි 1 (ii) සහ 7 (ii) )

43 එකල්හි වනාහි සැඩ පහරෙහි නාන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර පිට විය. (මෙහි 1 (ii) සහ 2 (ii)

44 (i) එසමයෙහි වනාහි පිට කිරීමේ අදහස් ඇතිව සැඩ පහරෙහි නාන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර (ii) පිට විය. (මෙහි 1 (ii) සහ 6 (ii)

45 (මෙහි 44 (i) පිට නොවිය. (මෙහි 1 (ii) සහ 7 (ii) )

46 එසමයෙහි වනාහි දියකෙළින්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර පිට විය. (මෙහි 1 (ii) සහ 2 (ii)

47 (i) එසමයෙහි වනාහි පිට කිරීමේ අදහස් ඇතිව දිය කෙළින්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර (ii) පිට විය. මෙහි 1 (ii) සහ 6 (ii) )

48 (මෙහි 47 (i) පිට නොවිය. (මෙහි 1 (ii) සහ 7 (ii) )

49 එසමයෙහි වනාහි දියෙහි දුවන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර පිට විය. (මෙහි 1 (ii) සහ 2 (ii) )

50 (i) එසමයෙහි වනාහි පිට කිරීමේ අදහස් ඇතිව දියෙහි දුවන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර (ii) පිට විය. (මෙහි 1 (ii) සහ 6 (ii) )

51 (මෙහි 50 (i) ) පිට නොවිය. (මෙහි 1 (ii) ) සහ 7 (ii) )

52 එසමයෙහි වනාහි මල්ගොමුවෙහි ක්‍රීඩා කරන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර පිට විය. (මෙහි 1 (ii) සහ 2 (ii) )

53 (i) එසමයෙහි වනාහි පිට කරණ අදහස් ඇතිව මල් ගොමුවෙහි ක්‍රීඩා කරන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර (ii) පිට විය. (මෙහි 1 (ii) සහ 6 (ii) )

54 (මෙහි 53 (i) ) පිට නොවිය. (මෙහි 1 (ii) සහ 7 (ii) )

55 එකල්හි වනාහි නෙළුම්විලෙහි දුවන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර පිට විය. (මෙහි 1 (ii) සහ 2 (ii) )

56 (1) එසමයෙහි වනාහි මෝචන අදහස් ඇතිව නෙළුම් විලෙහි දුවන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර (ii) පිට විය. (මෙහි 1 (ii) සහ 6 (ii) )

57 (මෙහි 56 (1) ) පිට නොවිය. (මෙහි 1 (ii) සහ 7 (ii) )

58 (i) එසමයෙහි එකානි පිපිකිරීමේ අදහස් ඇතිව ලිංගය වැල්ලෙහි ප්‍රවේශ කරන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර (ii) සනවිය. (මෙහි 1 (ii) සහ 6 (ii) )

59 (මෙහි 58 (1) )පිට නොවිය. (මෙහි 1 (ii) සහ 7 (ii) )

60 (i) එසමයෙහි එකානි මෝචන අදහස් ඇතිව ලිංගය මඩෙහි ප්‍රවේශ කරන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර (ii) පිටවිය. (මෙහි 1 (ii) සහ 6 (ii) )

61 (මෙහි 60 (1) ) පිටනොවිය. (මෙහි 1 (ii) සහ 7 (ii) )

62 එසමයෙහි එකානි ලිංගයට දිය ඉසින්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර පිට විය. (මෙහි 1 (ii) සහ 2 (ii) )

63 (i) එසමයෙහි එකානි පිටකරණ අදහස් ඇතිව ලිංගයට දිය ඉසින්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර (ii) පිට විය. (මෙහි 1 (ii) සහ 6 (ii) )

64 (මෙහි 63 (i) ) පිටනොවිය. මෙහි 1 (ii) සහ 7 (ii) )

65 (i) එකල්හි එකානි මෝචන අදහස් ඇතිව ලිංගය සයනෙහි ගටන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර (ii) පිට විය. (මෙහි 1 (ii) සහ 6 (ii) )

66 (මෙහි 65 (i) ) පිටනොවිය. (මෙහි 1 (ii) සහ 7 (ii) )

67 (i) එසමයෙහි එකානි මෝචන අදහස් ඇතිව ලිංගය ඇඟිලිමුලින් ගටන්නාවූ එක්තරා භික්ෂුවකට ශුක්‍ර (ii) පිට විය. (මෙහි 1 (ii) සහ 6 (ii) )

68 (මෙහි 67 (i) පිටනොවිය. කිමෙක්ද? මම සංඝාදිසේස ඇවතට පැමිණියේදැයි ඔහුට සැකයක් උපණ. මේ කාරණය භාග්‍යවතුන් වහන්සේට සැලකළහ. "මහණ, සංඝාදිසේස ඇවැත් නොවේ. ථුලසි ඇවැත් වන්නේයි" වදාළහ.

(ප්‍රථම සංඝාදිසේසය නිමි.)

---

## 2. සංඝාදිසේසය.

1 එසමයෙහි එකානි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවන නම්වූ අනේපිඬු සිටුහු විසින් කරවූලද ආරාමයෙහි වැඩවසනසේක. එකල්හි එකානි ආයුෂ්මත්වූ උදායී ස්ථවිර තෙමේ වනයෙහි වසයි. ඒ ආයුෂ්මත්හුගේ විහාරය විශිෂ්ටවූයේද දර්ශනීයවූයේද සතුට

ගෙන දෙන්නේ වෙයි. මැද කාමරයක් ඇත්තේ කෝප්පය රවුම් ශාලාවකින් යුක්තවූයේ වෙයි. මනාකොට පණවනලද ඇඳ පුටු ආදියෙන් ගුදිරි හා මෙට්ටාදියෙන්ද යුක්තවෙයි. පරිභොග කටයුතු පාණීයමගීයන්ගෙන් යුක්තවූයේද මනාකොට ඔප මට්ටම් කරන පිරිවෙන් ශාලාවලින්ද යුක්තවිය. බොහෝ මනුෂ්‍යයෝ ආයුෂ්මත් උදායි ස්ථවිරයන්ගේ විහාරය බැලීමට එන්නාහුය.

2 එක්තරා බ්‍රාහ්මණයෙක්ද භාර්යාවක් සමග උදායි ස්ථවිරයන් වහන්සේ යම් තැනකද එතැනට එළඹියේය. එසේ එළඹ, ආයුෂ්මත් උදායි ස්ථවිරයන්ට මෙසේ කීයේය. "අපි භවත්වූ උදායි ස්ථවිරයන්ගේ විහාරය බැලීමට කැමැත්තෙමුයි" කීයේය. "බ්‍රාහ්මණය, එසේනම් බලවයි" කියා යතුර ගෙණ අගුල ගලවා දොර ජනෙල් ඇර විහාරයට ප්‍රවිෂ්ට විය. ඒ බ්‍රාහ්මණයාද ආයුෂ්මත් උදායි ස්ථවිරයන්ගේ පිටුපසින් ගියේය, ඒ බැමිණිද බ්‍රාහ්මණයාගේ පිටුපසින් ගියාය. එකල්හි වනාහි ආයුෂ්මත්වූ උදායි ස්ථවිරයන් වහන්සේ ඇතැම් ජනෙල් විවෘත කරන්නේ ඇතැම් ජනෙල් වසන්නේ ගර්භයට පිවිස පිටුපසින් අවුත් ඒ බැමිණියගේ අඟපසඟ පරාමර්ශනය කෙළේය. එකල්හි ඒ බ්‍රාහ්මණතෙම ආයුෂ්මත් උදායි ස්ථවිරයන් සමග කැවත සතුටු වී ගියේය. එකල්හි බ්‍රාහ්මණයා සතුටුවූයේ සතුටු වචන පහළ කෙළේය.

3 "ශාක්‍යපුත්‍රවූද උදාර භාවයෙන් යුක්තවූද මේ ශ්‍රමණයන් විහාරශාලා මෙබඳු විහාරයක්හි වාසය කෙරේද්ද, භවත් උදායි ස්ථවිරයන් වහන්සේද මහත්වූයේ මෙබඳු ආරණ්‍යයෙහි වාසය කෙරේයයි" කීයේයි. මෙසේ කී කල්හි ඒ බැමිණී ඒ බ්‍රාහ්මණයාට මෙසේ කීවාය. "ඔහුගේ මහත් බව කුමක්ද? හුඹ වනාහි මාගේ අඟපසඟ යම් පරිද්දකින් පරාමර්ශනය කරන්නේද, එපරිද්දෙන්ම උදායි ශ්‍රමණයාද මාගේ අඟපසඟ පරාමර්ශනය කෙළේයයි" කීවාය. එකල්හි වනාහි ඒ බ්‍රාහ්මණ තෙම (ii) නොසතුටු බස කීයේය. දොස් නැගුවේය. නොසතුටු ප්‍රකාශ කළේය. (iii) "ශාක්‍යපුත්‍රවූ මේ ශ්‍රමණයෝ අලජ්ජීයෝය. දුශ්ශීලයෝය, බොරු කියන්නෝය, මොවුන් වනාහි ධර්මචාරීහුයයිද සමචාරීහු

යෙහිද, බ්‍රහ්මචාරීහුයෙහිද, සත්‍යවාදීහුයෙහිද ශීලවන්තයෝයෙහිද, කල්‍යාණධර්ම ඇත්තෝයෙහිද. ප්‍රතිඥ කෙරෙත් මොවුන්ට වනාහි ශ්‍රමණ බවක් නැත්තේය. මොවුන්ට ශ්‍රේෂ්ඨ බවක් නැත්තේය මොවුන්ගේ ශ්‍රමණ බව නටුයේය මොවුන්ගේ ශ්‍රේෂ්ඨ බව නටුයේය මොවුන්ට ශ්‍රමණ බවක් කොයින්ද? මොවුන්ට ශ්‍රේෂ්ඨ බවක් කොයින්ද? මොවුන් ශ්‍රමණ බැවින් පහවූවෝය. මොවුන් ශ්‍රේෂ්ඨබැවින් පහවූවාහුය (iv) උදායි ශ්‍රමණ තෙමේ කෙසේ නම් මගේ භාර්‍යාවගේ අගපසග පරාමර්ශනය කෙළේද? ගෘහ ස්වාමිදූන් විසින්ද කුල කුමරියන් විසින්ද කුල දූන් විසින්ද, කුල ලේලියන් විසින්ද, කුල දාසීන් විසින්ද, ආරාමයකට හෝ විහාරයකට හෝ යාමට නො හැකිය. ඉදින් වනාහි කුල ස්ත්‍රීන් විසින්ද කුල දූන් විසින්ද කුල කුමරියන් විසින්ද, කුල ලේලියන් විසින්ද, කුල දාසීන් විසින්ද, ආරාමයකට හෝ විහාරයකට යන්නාහු නම් ඔවුන් ශාක්‍යපුත්‍රවූ ශ්‍රමණයෝ දූෂ්‍ය කරන්නාහුයයි'' කියති. භික්ෂූන් වහන්සේලා වනාහි දෙස් කියන්නාවූද' නොසතුට ප්‍රකාශ කරන්නාවූද නොසතුටු වචන කියන්නාවූද ඒ බ්‍රාහ්මණයාගේ කියමන් ඇසූවාහුය. යම්බඳු අල්පේච්ඡ භික්ෂූන් වහන්සේලා වෙත්ද, උන්වහන්සේලාත් (මෙහි 3 (ii) ) කෙසේ නම් ආයුෂ්මත් උදායි තෙමේ ස්ත්‍රියක් සමග කාය සංසර්ගයට පැමිණියේදැයි'' කියති.

4 (i) ඉක්බිති ඒ භික්ෂූන් වහන්සේලා මේ කාරණය භාග්‍යවතුන් වහන්සේට සැලකළාහුය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ සිද්ධියෙහි භික්ෂු සංඝයා රැස් කරවා (ii) ආයුෂ්මත් උදායි ස්ථවිරයන්ගෙන් විචාළේය. "උදායි තෝ වනාහි ස්ත්‍රියක් සමග කාය සංසර්ගයට පැමිණියේය යනු සැබෑදැයි?'' 'භාග්‍යවතුන් වහන්ස, සැබවයි'' කීයේය. (iii) භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළ සේක. "හිස් පුරුෂය, නුසුදුසුවූද ශාසනයට අනුලෝම නොවූද සුදුසු නොවූද අකැප්වූද නොකටයුත්තක් කෙළෙහිදැයි'' කියාති. (iv) හිස් පුරුෂය, තෝ වනාහි කෙසේ නම් ස්ත්‍රියක් සමග කාය සංසර්ගයට පැමිණියෙහිද? හිස් පුරුෂය, මා විසින් නොයෙක් ක්‍රමයෙන් නොඇලීම පිණිස ධර්මය

දේශනා කරන ලද්දේ නොවේද? ඒ ධර්මය සරාගය පිණිස නොවන්නේය. (1 සංඝාදිසේසයේ 4 (ii)) කාම දැවිලි සංසිඳීම කියන ලද්දේ නොවේද? හිස් පුරුෂය, මේ කාරණය අප්‍රසන්න වූවන්ගේ පැහැදීමටද හේතු නොවන්නේය. (මෙහි 2 පාරාජිකයේ 4 ඡේදයේ(ii)"මෙය" යන තැන සිට යොදන්න.)

6 "මහණෙනි, මෙසේද මේ ශික්ෂාපදය උදෙසව් ය භික්ෂුවක් වනාහි රාගයෙන් බැසගන්නා ලද්දේ පෙරළුනාවූ සිතින් යුක්තව මිනිස් ස්ත්‍රිය සමග කාය සංසර්ගයට පැමිණෙන්නේද අතින් අල්වා ගැණීම හෝ කේශ කලාපයෙන් අල්වාගැණීම හෝ අනික් මොනත් දෙයකින් අඟපසඟ ඇල්ලීමක් කෙරේ නම්, ඒ භික්ෂුවට සංඝාදිසේස ඇවැත වන්නේයයි' වදාළසේක.

6 "යමෙක් වනාහි" යනු (මෙහි 1 පාරාජිකයේ පදභාජනීයේ 1ඡේදය)භික්ෂුවක් යන මේ අර්ථයෙහි අදහස්කරනලද භික්ෂුවයි."පිළිබඳ සිත් ඇත්තේ" යනු රාගයෙන් යුක්තවූයේ බලාපොරොත්තු සහිතවූයේ පිළිබඳ සිත් ඇත්තේ යනුයි. "පෙරලීම" යනු රාග චේතනාවෙන් විපරීතවූනාවූද ද්වේෂයෙන් විපරීතවූද මෝහයෙන් විපරීතවූද සිත යනුයි එතකුදු වුවත් මේ අර්ථයෙහි අදහස් කරන ලද්දේ රාගයෙන් රත්වූ පෙරලුනාවූ සිතයි. "ස්ත්‍රිය" නම් මනුෂ්‍ය ස්ත්‍රියක් යනුයි. යක්ෂණියක් නොවෙයි. ප්‍රේතියක් නොවෙයි. තිරිසන්ගත ධේනුවක්ද නොවෙයි. එවත් පිරිසයින් එදවස උපන්නාවූද දැරියක් සමග හෝ වියයුතුයි. "ශරීර ස්පර්ශයට පැමිණෙන්නේද" ඒ වැරදි හැසිරීම කියනලදී. "අත" නම් මැණික්කටුවේ පටන් නිය අග දක්වා යනුයි. "කොණ්ඩය" නම් නූල් මිශ්‍රවූ හෝ මල් මිශ්‍රවූ හෝ කහවණු මල් මිශ්‍රවූ හෝ සවණී මිශ්‍රවූ හෝ තුඹුමැල් මිශ්‍රවූ ඇමුණු මැණික් මිශ්‍රවූ හෝ කෙස් මැටියයි. "අවයවය" නම් අතක් කෙස් මැටියක් හැර අවශේෂ අංගයෝයි. (ii) ඇල්ලීම, අතගෑම, තද කිරීම, එසවීම, අල්වාගෙන සිටීම, බසවාගෙන සිටීම, ඇදීම: තැඹිත තැ–න ඇදීම, තදින් අල්වා ගැනීම, නැවත නැවත තදින් අල්වාගැනීම, ස්පර්ශ කරයිද (iii) ඇල්මීම නම් ඇල්ලීම මාත්‍රයයි.

"අතගෑම" නම් එහා මෙහා සෙලවීම කිරීමයි. "ඕමසනය" නම් යටට නැමීමයි. "උම්මසනය" නම් උඩට එසවීමයි. "ඕලංඝනය" නම් යටට පහත් කිරීමයි. "උල්ලංඝනය" නම් උඩට එසවීමයි. 'ආකඩ්ඪනය' නම් ළඟට ඇදීමයි. 'පතිකඩ්ඪනය' නම් එහාට කිරීමයි. 'අභිනිග්ගණ්හනය' නම් අංගය ගෙණ පෙළීමයි. 'අභිනිප්පීළනය' නම් කිසිවෙකු සමග පෙළීම කිරීමයි. 'ගහණය' නම් ගැණීම මාත්‍රයයි. 'ඡුපනය' නම් ස්පර්ශ කිරීම මාත්‍රයයි. 'සංඝාදිසේස' යනු (මෙහි 1 සංඝාදිසේසයේ 9 ඡේදයේ ii) එහින්ද සංඝාදිසේසය (කියනලදී.

7 ස්ත්‍රියක් වේද ස්ත්‍රියක යන හැඟීමකුත් ඇතිවේද, (ii) රාගයෙන් රත්වූයේත් වේද, භික්ෂුවකුත් වේද, ඒ භික්ෂුව ස්ත්‍රියගේ කයින් කය ඇල්ලීම අතගෑම කෙරේද, (iii) සංඝාදිසේස ඇවැත්වේ. ස්ත්‍රියකුත් වේද, (1 සංඝාදිසේසයේ 9 ඡේදයේ ii) වෙමතිකයෙකුත් වේද, (මෙහි 6 (ii) ගැණීම ස්පර්ශ කිරීම කෙරේද, ථුලසි ඇවැත් වේ. පණ්ඩක යන හැඟීමකුත් වේද, (මෙහි 6 (ii) ගණිද ස්පර්ශ කෙරේද ථුලසි ඇවැත්වේ. ස්ත්‍රියකුත් වේද, පුරුෂ සංඥා ඇත්තේ (මෙහි 6 (ii) ) ගැණීම ස්පර්ශකිරීමක් කෙරේද, ථුලසි ඇවැත්වේ. ස්ත්‍රීවශීනව අයත් වේද, තිරිසන්ගත හැඟීමකුත් වේද, (මෙහි 6 (ii) ) ගැණීම ස්පර්ශකිරීම යනාදිය කෙරේ නම් ථුලසි ඇවැත්වේ.

8 පණ්ඩකයෙකුත් වේද, පණ්ඩකයෙකු යන හැඟීම ඇත්තේත් වේද, (ii) රාගය මඩනා සිත් ඇත්තේද භික්ෂුවකුත් වේද, ඒ භික්ෂුව පණ්ඩකයාගේ කයින් කය ආමර්ශන පරාමර්ශනාදිය කෙරේද, (iii) ගණිද, ස්පර්ශය කෙරේද, (iii) ථුලසි ඇවැත් වේ. (iv) පණ්ඩකයෙකුත් වේද, (මෙහි(ii) ) ගණිද ස්පර්ශය කෙරේද, දුක්කට ඇවැත්වේ. (iv) පණ්ඩකයෙකුත් වේද, පුරුෂ සංඥා ඇත්තේ (මෙහි (ii) (iii) ) පණ්ඩකයෙකුත් වේද, තිරිසන්ගත, හැඟීම ඇත්තේ (මෙහි (ii) (iii) ) පණ්ඩකයෙකුත් වේද ස්ත්‍රියක් යන සංඥා ඇත්තේද (මෙහි (ii) (මෙහි (iii) )

9 පුරුෂයකු වේද පුරුෂයෙක් යැයි හැඟීම් ඇත්තේ (ii) රාගයෙන් මඩනා ලද සිත් ඇත්තේ භික්ෂුවකුත් වේද, ඔහු පුරුෂයාගේ කයින් කය ආමර්ශන පරාමර්ශන කෙරේද, ගණිද ස්පර්ශ කෙරේද දුක්කට ඇවැත්වේ.

10-18 (මේ ඡේද ගැනීමේදී ඒ ඒ ඡේද සැදීමට 'පුරුෂයෙක්' වෙනුවට 'වෙම්තීන පුරුෂයෙක් වේද' 'පුරුෂයෙකුත් වේද' 'තිරිසන්ගත හැඟීම් ඇත්තේද' 'පුරුෂයෙකුත් වේද' ස්ත්‍රී සංඥ ඇත්තේද පුරුෂයෙකුත් වේද පණ්ඩක සංඥ ඇත්තේද තිරිසන් ගතිකයෙකුත් වේද' තිරිසන්ගත සංඥම ඇත්තේද' තිරච්ඡානගතිකයෙක් වේද, වෙම්තිකයෙකුත් වේද'' ''තිරිසන්ගතිකයෙක් වේද, ස්ත්‍රී සංඥම ඇත්තේද'' ''තිරිසන්ගතිකයෙක් වේද පණ්ඩක සංඥම ඇත්තේද'' 'තිරිසන් ගතිකයෙක් වේද පුරුෂ සංඥම ඇත්තේද'' යනු යොදන්න.) (එකමූලිකයි.)

19 ස්ත්‍රීවරු දෙදෙනෙක් වෙත්ද, ස්ත්‍රීවරු දෙන්නෙක යැයි සංඥම ඇත්තේද (ii) රාගයෙන් මඩනා ලද සිත් ඇත්තේද, භික්ෂුවකුත් වේද ඔහු ස්ත්‍රීන් දෙන්නාගේ කයින් කය ආමර්ශන පරාමර්ශන කෙරේද (මෙහි 7 (ii) ගණිද ස්පර්ශ කෙරේද (iii) සංඝාදිසේස ඇවැත් දෙකකට පැමිණේ.

20 ස්ත්‍රීන් දෙන්නෙක් වෙත්ද ස්ත්‍රීන් දෙදෙනා පිළිබඳව සැකසහිතවූයේ (මෙහි 19 (ii) ) (iii) ථුල්ලච්ච ඇවැත් දෙකකට පැමිණේ. (iii)

21 ස්ත්‍රීන් දෙන්නෙක් වෙත්ද ස්ත්‍රීන් දෙදෙනා කෙරෙහි පණ්ඩක සංඥ ඇත්තේද (මෙහි 19 (ii) (iii)

22 (මෙහි 21 ඡේදය සෑදීමේදී ''පණ්ඩක සංඥම'' වෙනුවට මෙහි දක්වන වචන යොදන්න.) පුරුෂ සංඥම-තිරිසන් ගත සංඥම-

23 පණ්ඩකයෝ දෙදෙනෙක් වෙත්ද පණ්ඩකයන් දෙදෙනා පිළිබඳව පණ්ඩකයන් යැයි හැඟීම් ඇත්තේ රාගයෙන් මඩනාලද සිත් ඇත්තේ භික්ෂුවකුත් වේද ඔහු පණ්ඩකයන් දෙදෙනාගේ කයින් කය ආමර්ශන පරාමර්ශනය කෙරේද- (මෙහි 7 (ii)) ගණිද ස්පර්ශ කෙරේද(ii)ථුල්ලච්ච ඇවැත් දෙකකට පැමිණේ.

24 පණ්ඩකයෝ දෙන්නෙක් වෙත්ද පණ්ඩකයන් දෙන්නා පිළිබඳව සැකසහිතවූයේ (මෙහි 19 (ii)) පුරුෂ සංඥව ඇත්තේ- තිරිසන් ගත සංඥව ඇත්තේ- ස්ත්‍රී සංඥව ඇත්තේ රාග සහිතවූමිය භික්ෂුවද ඒ පණ්ඩකයන් දෙන්නාගේ කයින් කය ආමර්ශන පරාමර්ශන කෙරේද දුකුළා ඇවැත් දෙකක්වේ

25 (මෙහි 23 ඡේදය සෑදීමේදී "පණ්ඩක" වෙනුවට මෙහි දක්වන වචන යොදන්න) තිරිසන්ගත සංඥව- ස්ත්‍රී සංඥව- දුකුළා ඇවැත් දෙකකට පැමිණේ

26 පුරුෂයෝ දෙන්නෙක් වෙත්ද පුරුෂයන් දෙන්නා පිළිබඳව පුරුෂ සංඥව ඇත්තේ රාගයෙන් රත්වූයේ භික්ෂුව කුත් වේද ඔහු පුරුෂයන් දෙදෙනාගේ කයින් කය ආමර්ශන පරාමර්ශන කෙරේද (මෙහි 7 (ii)) ගණිද ස්පර්ශ කෙරේද දුකුළා ඇවැත් දෙකකට පැමිණේ

27 පුරුෂයෝ දෙන්නෙක් වෙත්ද පුරුෂයන් දෙන්නා පිළිබඳව සැකසහිතවූයේ (මෙහි 7 (ii))

28 (මෙහි 26 ඡේදය සෑදීමේදී 'පුරුෂසංඥව වෙනුවට තිරිසන්ගත සංඥව- ස්ත්‍රී සංඥව- පණ්ඩක සංඥව- ආමර්ශන පරාමර්ශන කෙරේද (මෙහි 7 (ii)) ගණිද ස්පර්ශ කෙරේද (ii) දුකුළා ඇවැත් දෙකකට පැමිණේ

29 තිරිසන්ගත්තයෝ දෙන්නෙක් වෙත්ද තිරිසන්ගතික දෙදෙනා කෙරෙහි තිරිසන්ගත සංඥ ඇත්තේ භික්ෂුවද ඒ තිරිසන්ගතිකයන් දෙදෙනාගේ කයින් කය ආමර්ශන පරාමර්ශන කෙරේද 28 (ii) තිරිසන්ගතිකයෝ දෙදෙනෙක් වෙත්ද තිරිසන්ගතික දෙදෙනා කෙරෙහි සැක සහිත වූයේ 7 (ii) සහ 28 (ii)

30 මෙහි 29 ඡේදයේ "තිරිසන්ගත සංඥ" වෙනුවට මෙහි දක්වන වචන යෙදිය යුතුයි.) ස්ත්‍රී සංඥව- පණ්ඩක සංඥව-පුරුෂ සංඥව-

31 (i) ස්ත්‍රියෙකුත් වේද පණ්ඩකයෙකුත් වේද දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥව ඇත්තේ මෙහි (7 (ii)) සංඝාදිසේස දුකුළා ඇවැත්වේ.

32 ස්ත්‍රියකුත් වේද පණ්ඩකයෙකුත් වේද දෙදෙනා කෙරෙහි සැකසහිතවූයේ මෙහි 7 (2) ථුල්ලසීයෙන් දුකුළා යෙන් ඇවැත්වේ

33 (මෙහි 31 (i) සෑදීමේදී "ස්ත්‍රීසංඥව ' වෙනුවට මෙහි දක්වන වචන යොදන්න.) පණ්ඩකසංඥ –(ථුල්ලසි ඇවැත්

දෙනාගම පැමිණේ- ස්ත්‍රී පුරුෂ සංඥාව- ථුල්ලච්චයෙන් දුකුලා ඇවැත්වේ-) "තිරිසන්ගත සංඥා" ථුල්ලච්චයෙන් දුකුලා ඇවැත්වේ.

34 ස්ත්‍රියෙකුත් වේද පුරුෂයෙකුත් වේද දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥාව (මෙහි 7 (ii)) - (ii) සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත්වේ (iii)

35 ස්ත්‍රියෙකුත් වේද පුරුෂයෙකුත් වේද දෙදෙනා සැකසහිත වූයේ(මෙහි 7 (ii)) ථුල්ලච්චයෙන් දුකුලා ඇවැත්වේ.

36 (මෙහි 34 ඡේදයේ "ස්ත්‍රී සංඥාව" වෙනුවට මෙහි දක්වන වචනද "සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත්වේ" වෙනුවට "ථුල්ලච්චයෙන් දුකුලා ඇවැත්වේ" යොදන්න) පණ්ඩක සංඥාව- පුරුෂ සංඥාව- තිරශ්චානගත සංඥාව-

37 ස්ත්‍රියෙකුත් වේද තිරිසන් ගතිකයෙකුත් වේද දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥාව ඇත්තේ (මෙහි 7 (ii) සහ 34 (ii)

38 ස්ත්‍රියෙකුත් වේද, තිරිසන් ගතියෙකුත් වේද, දෙදෙනා කෙරෙහි සැක සහිතවූයේ පණ්ඩක සංඥාව ඇත්තේ (මෙහි 7 (ii) මෙහි දක්වන වචන යොදගත යුතුයි)- පුරුෂ සංඥාව, තිරිසන් ගතික සංඥාව, ථුල්ලච්චයෙන් දුකුලා ඇවැත්වේ.

39 පණ්ඩකයෙකුත් වේද, පුරුෂයෙකුත් වේද, දෙදෙනා කෙරෙහි පණ්ඩක සංඥාව ඇත්තේ (මෙහි 7 (ii)) ථුල්ලච්චයෙන් දුකුලා ඇවැත්වේ

40 පණ්ඩකයෙකුත් වේද, පුරුෂයෙකුත් වේද, දෙදෙනා කෙරෙහි සැක සහිතවූයේ (මෙහි 39 ඡේදයේ 'පණ්ඩක සංඥාව වෙනුවට මෙහි දක්වන වචන යොදන්න.) පුරුෂ සංඥාව, තිරශ්චානගත සංඥාව, ස්ත්‍රී සංඥාව,

41 පණ්ඩකයෙකුත් වේද, තිරශ්චානගතයෙකුත් වේද, දෙදෙනා කෙරෙහි පණ්ඩක සංඥාව ඇත්තේ (මෙහි 7 (ii)) ථුල්ලච්චයෙන් දුකුලා ඇවැත්වේ.

42 පණ්ඩකයෙකුත් වේද, තිරච්ඡානගතියෙකුත් වේද, දෙදෙනා කෙරෙහි සැකසහිතවූයේ (මෙහි 41 ඡේදයේ 'පණ්ඩක සංඥාව' වෙනුවට මෙහි දක්වන වචන යොදන්න) පුරුෂ සංඥාව, තිරිසන්ගත සංඥාව, ස්ත්‍රී සංඥාව, දුකුළා ඇවැත් දෙකකට පැමිණේ.

43 පුරුෂයෙකුත් වේද, තිරිසන්ගතියෙකුත් වේද, දෙදෙනා කෙරෙහි පුරුෂ සංඥාව ඇත්තේ (මෙහි 7 (ii) ) දුකුළා ඇවැත් දෙකකට පැමිණේ.

44 පුරුෂයෙකුත් වේද, තිරිසන්ගතිකයෙකුත් වේද, දෙදෙනා කෙරෙහි සැක සහිතවූයේ (මෙහි 43 ඡේදයේ 'පුරුෂ සංඥාව' වෙනුවට මෙහි දක්වන වචන යොදන්න.) තිරිසන්ගත සංඥාව, ස්ත්‍රී සංඥාව, පණ්ඩක සංඥාව, දුකුළා ඇවැත් දෙකකට පැමිණේ.

ද්විමූලිකයයි.

45 ස්ත්‍රියකුත් වේද ස්ත්‍රී යන සංඥාවක් ඇත්තේද (මෙහි 7 (ii) ) ථුලසි ඇවැත්වේ.

46 ස්ත්‍රීන් දෙදෙනෙක් වෙත්ද, ස්ත්‍රීන් දෙදෙනා කෙරෙහි ස්ත්‍රීසංඥා ඇත්තේ (මෙහි 7 (ii)) ථුලසි ඇවැත් දෙකකට පැමිණේ.

47 ස්ත්‍රියකුත් වේද පණ්ඩකයෙකුත් වේද ඒ දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥා ඇත්තේ (මෙහි 7 (ii) ථුලසියෙන් දුකුළා ඇවැත්වේ.

48 ස්ත්‍රියකුත් වේද ස්ත්‍රී සංඥාව ඇත්තේද (මෙහි 7(ii) ) ථුලසි ඇවැත්වේ.

49 ස්ත්‍රීන් දෙදෙනෙක් වෙත්ද, ස්ත්‍රීන් දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥාව ඇත්තේ (මෙහි 7 (ii) ) ථුලසි ඇවැත් දෙකකට පැමිණේ.

50 ස්ත්‍රියකුත් වේද, පණ්ඩකයෙකුත් වේද, දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥා ඇත්තේ (මෙහි 7 (ii) ථුලසියෙන් දුකුළා ඇවැත්වේ.

51 ස්ත්‍රියකුත් වේද ස්ත්‍රී සංඥාව ඇත්තේද (මෙහි 7 (ii) )දුකුලා ඇවැත්වේ.

52 ස්ත්‍රීන් දෙදෙනෙක් වෙත්ද ස්ත්‍රීන් දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥා ඇත්තේ (මෙහි 7 (ii) )දුකුලා ඇවැත් දෙකකට පැමිණේ.

53 ස්ත්‍රියකුත් වෙත්ද ස්ත්‍රී සංඥා ඇත්තේද(මෙහි 7 (ii)) දුකුලා ඇවැත්වේ.

54 ස්ත්‍රීන් දෙදෙනෙක් වෙත්ද ස්ත්‍රීන් දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥා ඇත්තේ (මෙහි 7 (ii) ) දුකුලා ඇවැත් දෙකකට පැමිණේ.

55 ස්ත්‍රියකුත් වේද පණ්ඩකයකුත් වේද දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥා ඇත්තේ (මෙහි 7 (ii) දුකුලා ඇවැත්වේ

56 ස්ත්‍රියකුත්වේද ස්ත්‍රී සංඥා ඇත්තේ (ii) රාගයෙන් රත්වූ භික්ෂුවකුත්වේද ඔහු ස්ත්‍රියගේ නිමිතියෙන් කාය පිළිබඳ ආමිශීක කෙරේද (iii) දුකුලා ඇවැත්වේ.

57 ස්ත්‍රීන් දෙදෙනෙක් වෙත්ද ස්ත්‍රීන් දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥාව ඇත්තේ (මෙහි 56(ii) ) දුකුලා ඇවැත් දෙකකට පැමිණෙයි.

58 ස්ත්‍රියකුත්වේද පණ්ඩකයෙකුත් වේද දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥාව ඇත්තෙ (මෙහි 56 (ii) (iii)

59 ස්ත්‍රියකුත්වේද ස්ත්‍රී සංඥාව ඇත්තේ (ii) රාගයෙන් රත්වූ භික්ෂුවක්වේද ඔහු ස්ත්‍රියගේ නිමිතියෙන් නිමිතිය ආමිශීක කෙරේද (iii) දුකුලා ඇවැත්වේ (iv)

60 ස්ත්‍රීන් දෙදෙනෙක්වේද ස්ත්‍රීන් දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥාව ඇත්තේ (මෙහි 59 (ii) (ii) ) දුකුලා ඇවැත් දෙකකට පැමිණේ.

61 ස්ත්‍රියකුත්වේද පණ්ඩකයෙකුත්වේද දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥාව ඇත්තේ (මෙහි 59 (ii) සහ ( 60 (ii) )

භික්ඛුපෙය්‍යාලය නිමියි.

62 ස්ත්‍රියකුත්වේද ස්ත්‍රී සංඥා ඇත්තේ (ii) රාගයෙන් රත්වූයේ ස්ත්‍රිය (iii) භික්ෂුවගේ කයින් කය ස්පර්ශ කෙරේද අතගෑම කෙරේද, යටට සද කෙරේද, උඩට ඔසවාද, සද කිරීම එසවීම කෙරේද, මෙහාට ඇදීම එහාට ඇදීම කෙරේද, අභිනිග්ගණ්හන අභිනිප්පීලන කෙරේද, ස්පර්ශ කෙරේද සේවනය කිරීමේ අදහස ඇත්තේ කයින් ව්‍යායාම කෙරේද ස්පර්ශය දැනගණීද (iv) සංඝාදිසේස ඇවැත්වේ.

63 ස්ත්‍රීන් දෙදෙනෙක්මෙන්ද ස්ත්‍රීන් දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥා ඇත්තේ (ii) රාගයෙන් රත්වූයේ ස්ත්‍රීහු (මෙහි 62 (iii) ) සංඝාදිසේස දෙකකට පැමිණේ.

64 ස්ත්‍රියකුත්වේද පණ්ඩකයෙකුත්වේද දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥාව ඇත්තේ (62 (ii) (iii) ) සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත්වේ.

65 ස්ත්‍රියකුත්වේද ස්ත්‍රී සංඥාව ඇත්තේ (ii) රාගයෙන් රත්වූයේ ස්ත්‍රිය (iii) (මෙහි 62 (iii) ථුලසි ඇවැත්වේ.

66 ස්ත්‍රීන් දෙදෙනෙක්මෙත්ද ස්ත්‍රීන් දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥාව ඇත්තේ රත්වූයේ ස්ත්‍රීහු ඒ භික්ෂුමයේ (මෙහි 62 (iii) ) ථුලසි ඇවැත් දෙකකට පැමිණේ.

67 ස්ත්‍රියකුත්වේද පණ්ඩකයෙකුත්වේද දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥා ඇත්තේ (මෙහි 62 (ii) (iii) ) ථුලසියෙන් දුකුලා ඇවැත්වේ.

68 ස්ත්‍රියකුත්වේද ස්ත්‍රී සංඥාව ඇත්තේ රාගයෙන් රත්වූයේ ස්ත්‍රිය (මෙහි 62 (iii) ) ථුලසි ඇවැත්වේ.

69 ස්ත්‍රීන් දෙදෙනෙක්මෙද ස්ත්‍රීන් දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥාව ඇත්තේ රාගයෙන් රත්වූයේ ස්ත්‍රීහුද ඒ (මෙහි 62 (iii) ) ථුලසි ඇවැත් දෙකකට පැමිණේ.

70 ස්ත්‍රියකුත්වේද පණ්ඩකයෙකුත්වේද දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥාව ඇත්තේ රාගයෙන් රත්වූයේ ඒ දෙදෙනා (මෙහි 62 (iii) ) ථුලසියෙන් දුකුලා ඇවැත්වේ.

71 ස්ත්‍රියකුත්වේද ස්ත්‍රී සංඥාව ඇත්තේ රාගයෙන් රත්වූයේ ස්ත්‍රිය (මෙහි 62 (iii) ) දුකුලා ඇවැත්වේ.

72 ස්ත්‍රීහු දෙදෙනෙක් වෙත්ද ස්ත්‍රීන් දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥාව ඇත්තේ රාගයෙන් රත්වූයේ ස්ත්‍රීහුද (මෙහි 62 (iii) ) දුකුළා ඇවැත් දෙකකට පැමිණේ.

73 ස්ත්‍රියකුත් වේද පණ්ඩකයෙකුත් වේද දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥාව ඇත්තේ රාගයෙන් රත්වූයේ ඔවුන් දෙදෙනා (මෙහි 62 (iii) ) දුකුළා ඇවැත් දෙකකට පැමිණේ.

74 ස්ත්‍රියකුත් වේද, ස්ත්‍රී සංඥාව ඇත්තේ රාගයෙන් රත්වූයේ ඒ ස්ත්‍රිය (ii) භික්ෂුවගේ ශරීරයෙන් තන ඇමිණීම කෙරේද, සේවනය අදහස් ඇත්තේ කයින් ව්‍යායාම කෙරේද, ස්පර්ශය දැනගණීද, (iii) දුකුළා ඇවැත් වේ.

75 ස්ත්‍රීහු දෙදෙනෙක් වෙත්ද, ස්ත්‍රීන් දෙදෙනා, කෙරෙහි ස්ත්‍රී සංඥාව ඇත්තේ රාගයෙන් රත්වූයේ ස්ත්‍රීහුද (මෙහි 74 (ii) යෙදිය යුතු) දුකුළා ඇවැත් දෙකකට පැමිණේ.

76 ස්ත්‍රියකුත් වේද, පණ්ඩකයෙකුත් වේද, දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥාව ඇත්තේ රාගයෙන් රත්වූයේ දෙදෙනා (මෙහි 74 (ii) දුකුළා ඇවැත් දෙකකට පැමිණේ.

77 ස්ත්‍රියකුත් වේද, ස්ත්‍රී සංඥාව ඇත්තේ රාගයෙන් රත්වූයේ ස්ත්‍රිය (මෙහි 74 (ii) දුකුළා ඇවැත් වේ.

78 ස්ත්‍රීහු දෙදෙනෙක් වෙත්ද, ස්ත්‍රීන් දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥාව ඇත්තේ රාගයෙන් රත්වූයේ ස්ත්‍රීහුද (මෙහි 74 (ii) දුකුළා ඇවැත් දෙකකට පැමිණේ

79 ස්ත්‍රියෙකුත් වේද, පණ්ඩකයෙකුත් වේද, දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥාව ඇත්තේ රාගයෙන් රත්වූයේ දෙදෙනා (මෙහි 74 (ii) දුකුළා ඇවැත් දෙකකට පැමිණේ.

80 ස්ත්‍රියකුත් වේද, ස්ත්‍රී සංඥා ඇත්තේ රාගයෙන් රත්වූයේ ස්ත්‍රිය (මෙහි 74 (ii) දුකුළා ඇවැත් වේ.

81 ස්ත්‍රීහු දෙදෙනෙක් වෙත්ද, ස්ත්‍රීන් දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥාව ඇත්තේ රාගයෙන් රත්වූයේ ස්ත්‍රීහුද (ii) ඒ භික්ෂුවගේ ශරීරයෙන් ශරීරය ඇමිණීම කෙරේද, සේවනය අදහස් ඇත්තේ කයින් ව්‍යායාම කෙරේද, ස්පර්ශය දැන ගණීද. (iii) දුකුළා ඇවැත් දෙකකට පැමිණේ.

82 ස්ත්‍රියකුත් වේද, පණ්ඩකයෙකුත් වේද දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥා ඇත්තේ රාගයෙන් රත්වූයේ ඒ දෙදෙනා (මෙහි 81 (ii) දුකුලා ඇවැත් දෙකකම පැමිණේ.

83 සේවන අදහස් ඇත්තේ කයින් ව්‍යායාම කෙරේද, ස්පර්ශය දැන ගණීද සංඝාදිසේස ඇවැත්වේ. සේවන අදහස් ඇත්තේ කයින් ව්‍යායාම කෙරේද, ස්පර්ශය දැන නොගණීද, දුකුලා ඇවැත්වේ. සේවන අදහස් ඇත්තේ කයින් ව්‍යායාම නොකෙරේද, ස්පර්ශය දැන නොගණීද, ඇවැත් නොවේ. සේවන අදහස් ඇත්තේ කයින් ව්‍යායාම නොකෙරේද, ස්පර්ශය දැන නොගණීද ඇවැත් නොවේ.

84 මිදීමේ අදහස් ඇත්තේ කයින් ව්‍යායාම කෙරේද, ස්පර්ශය දැනගණීද, ඇවැත් නොවේ. මිදීමේ අදහස් ඇත්තේ කයින් ව්‍යායාම කෙරේද, ස්පර්ශය දැන නොගණීද, ඇවැත් නොවේ. මිදීමේ අදහස් ඇත්තේ කයින් ව්‍යායාම නොකෙරේද, ස්පර්ශය දැනගණීද ඇවැත් නොවේ. මිදීමේ අදහස් ඇත්තේ කයින් ව්‍යායාම නොකෙරේද, ස්පර්ශය දැන නොගණීද, ඇවැත් නොවේ. සංඥාව නැත්තාහුටද සිහි නැත්තාහුටද නොදන්නාහුටද ඉවසීම නැත්තාහුටද උමතුවූවහුටද විසුරුණාවූ සිත් ඇත්තාහුටද වේදනාවෙන් පෙළෙන්නාහුටද ආදිකර්මිකයාටද ඇවැත් නොවේ.

85 මව කෙරෙහිද, දුව කෙරෙහිද, සහෝදරිය කෙරෙහිද, භාර්‍යාව කෙරෙහිද, යක්ෂිණිය කෙරෙහිද, පණ්ඩකයා කෙරෙහිද, නිදියාහු කෙරෙහිද, මළාහු කෙරෙහිද, තිරිසන් ගතිකයා කෙරෙහිද, දාරුරූපය කෙරෙහිද, චිත්‍රරූපය කෙරෙහිද, පෙළීමෙහිද, පෙලවීමෙහිද, මාර්ගයෙහිද වෘක්ෂයෙහිද, නැවෙහිද, බන්ධනයෙහිද, දණ්ඩෙහිද, පාත්‍රයෙහිද, වැදීමෙහිද ව්‍යායාමයෙහිද, ස්පර්ශ නොකිරීමෙහිද සිදුවන ඇවැත් මෙතැන් පටන් විස්තරවේ.

## 2 කථා

1. එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් මව කෙරෙහි මාතෘ ප්‍රේමයෙන් ආමර්ශනය කෙළේය. (ii) ඔහුට කුකුසක් ඇතිවිය. කිමෙක්ද? මම සංඝාදිසේස ඇවතට

පැමිණියේද කියායි. භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහු, “තමර අදහස කිමෙක්දැයි” විචාළසේක. ‘ස්වාමීනි, මාතු ප්‍රේමයෙනැයි” කීවේය. “මහණ, සංඝාදිසේස ඇවැත් නොවේ. දුකුලා ඇවැත් වේයයි” වදාළසේක. (iii)

2 එසමයෙහි එක්තරා භික්ෂුවක් දුව පිතු ප්‍රේමයෙන් ආලිංගනය කෙළේය. (මෙහි 1 (ii) යොදන්න. පිතු ප්‍රේමයෙන් යනු වෙනසයි )

3 සහෝදරියක් සහෝදර ප්‍රේමයෙන් ආලිංගනය කෙළේය. ඔහුට සැකයක් උපණ. “මහණ, සංඝාදිසේස ඇවැත් නොවේ, දුකුලා ඇවැත් වන්නේය”යි වදාළසේක.

4 එසමයෙහි වනාහි එක්තරා භික්ෂුවක් පුරාණ දුතිකාව සමග කාය සංසර්ගයට පැමිණියාහුය. ඔහුට සැකයක් ඇතිවිය. “මහණ තෝ සංඝාදිසේස ඇවැතට පැමිණියේයයි” වදාළහ.

5 එසමයෙහි වනාහි එක්තරා භික්ෂුවක් යක්ෂිණියක් සමග කාය සංසර්ගයට පැමිණියාහුය. ඔහුට සැකයක් උපණ. “මහණ, සංඝාදිසේස ඇවැත් නොවේ. ථුලසි ඇවැත් වන්නේයයි” වදාළහ.

6 එසමයෙහි වනාහි එක්තරා භික්ෂුවක් පණ්ඩකයෙකු සහ කාය සංසර්ගයට පැමිණියාහුය. ඔහුට සැකයක් උපණ. මහණ, සංඝාදිසේස ඇවැත් නොවේ. ථුලසි ඇවැත්යයි වදාළහ.

7 එසමයෙහි වනාහි එක්තරා භික්ෂුවක් නිදාගත් ස්ත්‍රියක් සහ කාය සංසර්ගයට පැමිණියාහුය. ඔහුට සැකයක් උපණ. “මහණ, තෝ සංඝාදිසේස ඇවැතට පැමිණියේයයි” වදාළසේක.

8 එසමයෙහි වනාහි එක්තරා භික්ෂුවක් මළ ස්ත්‍රියක සහ කාය සංසර්ගයට පැමිණියේය. ඔහුට සැකයක් උපණ “මහණ සංඝාදිසේස ඇවැත් නොවේ. ථුලසි ඇවැත්යයි” වදාළහ.

9 එසමයෙහි වනාහි එක්තරා භික්ෂුවක් තිරිසන්ගත ස්ත්‍රියක සමග කාය සංසර්ගයට පැමිණියාහුය. ඔහුට සැකයක් උපන්නේය. “මහණ සංඝාදිසේස ඇවැත් නොවේ. දුකුලා ඇවැත්යයි” වදාළහ.

10 එසමයෙහි වනාහි එක්තරා භික්ෂුවක් ලීයෙන් කරන ලද ස්ත්‍රී රූපයක් සමග කාය සංසර්ගයට පැමිණියාහුය. ඔහුට සැකයක් උපණ. "මහණ, සංඝාදිශේස ඇවැත් නොවේ දුකුලා ඇවැත්යයි වදාළහ

11 එසමයෙහි වනාහි ස්ත්‍රීහු බොහෝ දෙනෙක් එක්තරා භික්ෂුවක් පෙළා අතින් අත ගෙනාවාහුය. ඔහුට සැකයක් උපණ. "මහණ, තෝ ඉවසූයෙහිද?" භාග්‍යවතුන් වහන්ස, මම නොඉවසීමි. "මහණ, නොඉවසන්නහුට ඇවැත් නැත්තේයයි" වදාළසේක.

12 එසමයෙහි වනාහි එක්තරා භික්ෂුවක් ස්ත්‍රියක් නැගී සංක්‍රමණ වාහනයක් රාගයෙන් රත්වූයේ සෙලෙව්වේය. ඔහුට සැකයක් උපණ. "මහණ, සංඝාදිශේස ඇවැත් නොවේ දුකුලා ඇවැත්යයි" වදාළහ.

13 එසමයෙහි වනාහි එක්තරා භික්ෂුවක් ඉදිරිපිට මාගීයෙහි එන ස්ත්‍රියකු දැක රාගයෙන් රත්වූයේ උරහිසෙන් පහරක් ගැසීය. ඔහුට සැකයක් උපණ. "මහණ, තෝ සංඝාදිශේස ඇවැතට පැමිණියෙහියයි" වදාළසේක.

14 එසමයෙහි වනාහි එක්තරා භික්ෂුවක් ස්ත්‍රියක් නැගී ගසක් රාගයෙන් රත්වූයේ සෙලෙව්වේය ඔහුට සැකයක් උපණ. "මහණ, සංඝාදිශේස ඇවැත් නොවේ. දුකුලා ඇවැත් යයි" වදාළහ.

15 එසමයෙහි වනාහි එක්තරා භික්ෂුවක් ස්ත්‍රියක් නැගී නැවක් රාගයෙන් රත්වූයේ සෙලෙව්වේය. ඔහුට සැකයක් උපණ. "මහණ, සංඝාදිශේස ඇවැත් නොවේ. ථුලසි ඇවැත් යයි" වදාළහ

16 එසමයෙහි වනාහි එක්තරා භික්ෂුවක් ස්ත්‍රියක් ගත් වැලක් රාගයෙන් රත්වූයේ ඇදැරගත්තේය. ඔහුට සැකයක් උපණ "මහණ, සංඝාදිශේස ඇවැත් නොවේ. ථුලසි ඇවැත්යයි" වදාළසේක.

17 ස්ත්‍රියක් ගත් දණ්ඩක් (16 ඡේදය මෙනි.)

18 එසමයෙහි වනාහි එක්තරා භික්ෂුවක් රාගයෙන් රත්වූයේ ස්ත්‍රියකු පාත්‍රයෙන් පැවරීමක් කෙළේය. ඔහුට සැකයක් උපණ. "මහණ, සංඝාදිශේස ඇවැත් නොවේ ථුලසි ඇවැත්යයි" වදාළහ.

19 එසමයෙහි වනාහි එක්තරා භික්ෂුවක් රාගයෙන් රත්වූයේ වදිනු ලබන ස්ත්‍රියකගේ පාදයක් එසවීය. ඔහුට සැකයක් උපන, මහණ, තෝ සංඝාදිසේස ඇවැත්තම පැමිණියෙහියයි වදාළහ.

20 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් තෙමේ ස්ත්‍රියක් ගණිමියි වැයම්කොට ස්පර්ශ නොකළේය. ඔහුට සැකයක් උපන "මහණ, සංඝාදිසේස ඇවැත් නොවේ. දුකුළා ඇවැත්යයි" වදාළහ.

(දෙවෙනි සංඝාදිසේසය නිමි)

---

## 3 සංඝාදිසේසය

1 (මෙහි 1 (i) සොයන්න.) එකල්හි වනාහි ආයුෂ්මත් උදායී ස්ථවිර තෙමේ වනයෙහි වාසය කරයි. ඒ ආයුෂ්මතුන්ගේ විහාරය විශිෂ්ට ශෝභාවයෙන් යුක්තවූයේ දර්ශනීයවූයේ ප්‍රසාද ජනකද වෙයි. එසමයෙහි වනාහි බොහෝවූ ස්ත්‍රීහු විහාරය බලනු කැමැතිව ආරාමයට ගියාහුය. එකල්හි ඒ ස්ත්‍රීහු ආයුෂ්මත්වූ උදායී ස්ථවිරයන් වහන්සේ යම්තැනකද එතැනට එළඹියාහුය. එළඹ ආයුෂ්මත් උදායී ස්ථවිරයන්ට මෙසේ කීවාහුය. "ස්වාමීන් වහන්ස, අපි ආර්යයන් වහන්සේගේ විහාරය බැලීමට කැමැත්තෙමුයි" කීහ.

2 එකල්හි ආයුෂ්මත් උදායී ස්ථවිර තෙමේ ඒ ස්ත්‍රීන්ට විහාරය පෙන්වා ඒ ස්ත්‍රීන්ගේ මල මාර්ග මූත්‍ර මාර්ගයන්ගේ නාම කියයි. ගුණද නුගුණද කියයි. ඉල්ලයි. විශේෂයෙන් ඉල්ලයි. විචාරයි. නැවත විචාරයි. කියයි. අනුශාසනා කරයි ආක්‍රොශ කෙරෙයි. යම් බඳුවූ ඒ ස්ත්‍රීහු වෙත්ද, ඔවුන්, භය නැතිව කොරාටික ගති ඇතිව ලැජ්ජා නැතිව ආයුෂ්මත්වූ උදායී ස්ථවිරයන් සමග සිනාසීමද උසස් ශබ්දයෙන් කථාකිරීමද මහසිනාසීමද, කවටකම් කිරීමද, කෙරෙත්, ලැජ්ජාව ඇති යම් ස්ත්‍රීහු වෙත්ද ඔවුන් එතැනින් පිටව භික්ෂූන්ට දොස් කියන්නට වන්හ "ස්වාමීනි, මේ වනාහි නුසුදුසුය. නොහැලපේය. ස්වාමියා විසින්ද මෙසේ කියන්නාහු

නම් අපි නොකැමැත්තෙමු. ආයුෂ්මත්වූ උදායි ස්ථවිරයන් විසින් කිසෙලු කියමින්ද සතුටුවෙමුද" කියායි යම්බඳු අල්පේච්ඡ භික්ෂූහු වෙත්ද උන්වහන්සේලා දොස් කියත්. අසතුට ප්‍රකාශ කරත් නොසතුට අඟවන වචන කියත්. "කෙසේ නම් ආයුෂ්මත් උදායි ස්ථවිරයෝ ස්ත්‍රීයකට අසභ්‍ය කථාවන් කියත්ද?" යනුයි. එකල්හි ඒ භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය.

3 එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ සිද්ධියෙහි භික්ෂු සංඝයා රැස්කරවා ආයුෂ්මත්වූ උදායි ස්ථවිරයන් අතින් "උදායි, නුඹ ස්ත්‍රීයකට අසභ්‍ය කථාවන් කීයේ යනු සැබෑද?" "භාග්‍යවතුන් වහන්ස, සැබෑය." භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගැරහූසේක. "හිස් පුරුෂය, නොමනාවූද ශාසනයට අනුලෝම නොවූද නුසුදුසුවූද ශ්‍රමණයන්ට නොගැලපෙන අකැපවූද නොකළයුතු වූ වචන පාවිච්චි කෙළෙහිද? හිස් පුරුෂය, තෝ වනාහි ස්ත්‍රියක් හා අසභ්‍ය වචන කෙසේ නම් කියන්නෙහිද? හිස් පුරුෂය, මා විසින් නොයෙක් ක්‍රමයෙන් නොඇලීම පිණිස ධර්ම දේශනා කරන ලදී. රාගය පිණිස දේශනා නොකරණලදී.

"කාම දැවිලි සංසිඳවීම කියන ලද්දේ නොවේද හිස් පුරුෂය, මේ කාරණය නොපැහැදියන්ගේ පැහැදීම පිණිස නොවේ (මෙහි 1 සුදින්න බණවරේ 30 (v) ඡේදය බලන්න.) මහණෙනි, මෙසේද මේ ශික්ෂාපදය උදෙසව්.

4 "යම් භික්ෂුවක් රාගයෙන් බැසගන්නා ලද්දේ පෙරළුණාවූ සිතින් යුක්තව තරුණයෙක් තරුණියක් හා මෛථුනය පිළිබඳ කථාකරන්නාක් මෙන් ස්ත්‍රියක් හා අසභ්‍ය වචන යහන නැර දක්වන්නේ නම් සංඝාදිසේස ඇවැත් වන්නේයයි කියයි."

5 'යමෙක් වනාහි" යනු "භික්ෂුව" යනු (මෙහි 1 පාරාජිකයේ (1-2) ඡේද බලන්න) 'රාගයෙන් බැසගත්" යනු රාගයෙන් රත්වූයේ බලාපොරොත්තු සහිත වූයේ පිළිබඳ සිත් ඇත්තේ යනුයි. "පෙරළුනාවූ" යනු රාගයෙන් රත්වූ

සිත පෙරළෙන්නේයි. ද්වේෂයෙන් දූෂිතවූ සිතද පෙරළෙන්නේයි. මෝහයෙන් මුලාවූ" සිතද පෙරළෙන්නේයි. "එතකුදුවුවත් මේ අර්ථයෙහි පෙරළුනු" නම් රාගයෙන් රත්වූ සිත අදහස් කරනු ලැබේ. (ii) "ස්ත්‍රිය" නම් මනුෂ්‍ය ස්ත්‍රියක් යනුයි. යක්ෂිනියක් නොවෙයි. ප්‍රේතියක්ද නොවෙයි. තිරිසන් ධේනුවක්ද නොවෙයි. සුභාෂිත දුර්භාෂිත දෙකද සධර්ම අධර්ම දෙකද දැනගැනීමට ප්‍රබලවූ මනුෂ්‍ය ස්ත්‍රියක් වීය යුතුයි (iii) "අසභ්‍ය වචන" නම් මලමාර්ග මූත්‍රමාර්ග මෛථුන ධර්ම සඳහන්වන වචනයෝය. "කියන්නේය" යනු රාග වශයෙන් බැසගෙණ සීමාව ඉක්මවීම යනුයි. "තරුණයෙක් තරුණියකට මෙන්" යනු දහරෙක් දහරියක් සමගද තරුණයෙක් තරුණියක් සමගද කාමභෝගියෙක් කාමභෝගිනියක් සමගද යනුයි. "මෛථුනයෙන් යුක්ත" යනු මෛථුන ධර්මයෙන් යුත් යනුයි.

6 "සංඝාදිසේස යනු" (මෙහි 1 සංඝාදිසේසයේ 9 ඡේදයේ (ii) බලාදක්න) එයින්ද සංඝාදිසේසය කියනලදී. "මාර්ග දෙක" මල මාර්ග මූත්‍ර යනු මාර්ග දෙකයි. "ගුණ කියයි" යන මාර්ග දෙක වර්ණනා ප්‍රශංසා කිරීමයි. "නුගුණ කියයි" යනු දෙමාර්ගය පිළිබඳ පහත්කොට ගර්හා කිරීමයි. "යාචනය කෙමත් ඉල්ලීම" නම් මට දෙව මට දීමට සුදුසුය යනුයි. "ඉල්වයි" යනු තොපගේ මව් කවද පැහැදෙන්නේද තොපගේ පියා කවදා පැහැදෙන්නේද, දෙවියෝ කවදා පැහැදෙන්නෝද කොද වේලාවක් කොද අවසථාවක් ශුභ මුහුර්තයක් කවදා ලැබෙන්නේද, තොපගේ මෛථුන ධර්ම සේවනය කවදා ලැබෙන්නේද කියයි. "ඇසීම" නම් කෙසේ නුඹ ස්වාමියාට දෙන්නේද කෙසේ ඔබ ජාර හිමියාට දෙන්නේද යනුයි. "පිළිවිසීම" යනු මෙසේ තොප ස්වාමියාට දෙන්නෙහිද මෙසේ ජාර හිමියාට දෙන්නෙහිද යනුයි. "කියයි" නම් ඇසීමෙන් කීමයි. මෙසේ දෙව, මෙසේ දෙනකල්හි ස්වාමියාට ප්‍රියවන්නේද මනාපවන්නේද යනුයි. "අනුශාසනා කෙරේ යනු" "නොඅසා කීමයි. මෙසේ දෙව මෙසේ දුන්කල්හි ස්වාමියාට ප්‍රියමනාප වේය යනුයි. "ආක්‍රොශනය" නම්, නිමිති රහිතද ස්ත්‍රීනිමිත්ත අසම්පූර්ණද, ලෙයින් යුක්තද, නිතර මල් වැගිරෙන්නේද වස්ත්‍ර තෙත්වන්නේද පිට නික්මෙන ස්වභාව ඇත්තේද ස්ත්‍රී

පණ්ඩකද පුරුෂයෙකුගේ මෙන් උඩ පිහිටියේද බිඳුනාවූ මල මාර්ග මූත්‍ර මාර්ග ඇත්තේද, ස්ත්‍රී නිමිති පුරුෂ නිමිති දෙකම ඇත්තේද යනාදී වශයෙන් ආක්‍රොශ කිරීමයි.

7 “ස්ත්‍රියක්වේද ස්ත්‍රී සංඥා ඇත්තියක්වේද (ii) රාගයෙන් රත්වූ භික්‍ෂුව ඒ ස්ත්‍රියගේ (iii) මල මාර්ග මූත්‍ර මාර්ග ආදියෙහි ගුණ කියාද අගුණ කියාද ඉල්වාද නොඉල්වාද අසාද නොඅසාද අනුශාසනා කෙරේද ආක්‍රොශ කෙරේද (iv) සංඝාදිසේස ඇවැත්වේ.

8 ස්ත්‍රීන් දෙන්නෙක් වෙත්ද ස්ත්‍රීන් දෙන්නා කෙරෙහි ස්ත්‍රී සංඥාව ඇත්තේ (ii) රාගයෙන් රත්වූ භික්‍ෂුව ඒ ස්ත්‍රීන් දෙදෙනාගේ(iii) (මෙහි 7 (iii)සංඝාදිසේස දෙකකට පැමිණේ.

9 ස්ත්‍රියකුත් වේද, පණ්ඩකයෙකුත් වේද දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥාව ඇත්තේ (මෙහි 8 (ii) 7 (iii) ) සංඝාදිසේසයෙන් දුකුළා ඇවැත්වේ.

10 ස්ත්‍රියකුත්වේද, ස්ත්‍රී සංඥා ඇත්තේද (ii) රාගයෙන් රත්වූ භික්‍ෂුව ඒ ස්ත්‍රියගේ (iii) මල මාර්ග මූත්‍ර මාර්ග හැර ඉහටියෙන් පහල දණ හිසෙන් උඩ (iv) ගුණ කියාද අගුණ කියාද ඉල්වාද, නොඉල්වාද, අසාද, නොඅසාද, අනුශාසනා කෙරේද, ආක්‍රොශ කෙරේද (v) ථුලසි ඇවැත්වේ.

11 ස්ත්‍රීන් දෙදෙනෙක් වෙත්ද ස්ත්‍රීන් දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥා ඇත්තේ (ii) රාගයෙන් රත්වූ භික්‍ෂුව ඒ ස්ත්‍රීන් දෙදෙනාගේ (මෙහි 10 (iii) (iv) ) ථුලසි ඇවැත් දෙකකට පැමිණේ.

12 ස්ත්‍රියකුත්වේද, පණ්ඩකයෙකුත් වේද ඒ දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥා ඇත්තේ (ii) රාගයෙන් (මෙහි 10 (iii) (iv) ථුලසියෙන් දුකුළා ඇවැත්වේ.

13 ස්ත්‍රියක්වේද ස්ත්‍රී සංඥාව ඇත්තේද (මෙහි 10 (ii)) —(ii) ඉහටියෙන් ඉහළත් දණ මඩලෙන් පහළත් (මෙහි 10 (iv) ) දුකුළා ඇවැත්වේ.

14 ස්ත්‍රීන් දෙදෙනෙකු වේද ස්ත්‍රීන් දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥාව ඇත්තේ (මෙහි 11 (ii) 13 (ii) සහ 10(iv) දුකුලං ඇවැත් දෙකකට පැමිණේ.

15 ස්ත්‍රියකුත්වේද පණ්ඩකයෙකුත්වේද දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥා ඇත්තේ (මෙහි 11 (ii) 13 (ii) සහ 10 (iv) දුකුලා ඇවැත් දෙකකට පැමිණේ.

16 ස්ත්‍රියකුත්වේද, ස්ත්‍රී සංඥාව ඇත්තේ (මෙහි 10 (ii) කාය පිළිබඳ දූෂයෙහි (මෙහි 10 (iv) දුකුලං ඇවැත්වේ.

17 ස්ත්‍රීන් දෙදෙනෙකු වේද ස්ත්‍රීන් දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥා ඇත්තේ (මෙහි 11 (ii) කාය පිළිබඳ දූෂයෙහි (මෙහි 10 (iv) දුකුලං ඇවැත් දෙකකට පැමිණේ

18 ස්ත්‍රියකුත්වේද පණ්ඩකයෙකුත් වේද දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥා ඇත්තේ (මෙහි 11 (ii) කාය පිළිබඳ දූෂයෙහි (මෙහි 10 (ii) දුකුලං ඇවැත් දෙකකට පැමිණේ.

19 අසීතුවා සජ්ඣායනය කරන්නහුටද, පෙළ කියන්නහුටද, අනුශාසනා කරන්නහුටද, උමතුවූවහුටද; ආදිකර්මිකයාටද, ඇවැත් නොවේ.

ලේවත්වූද, රළුලොම ඇත්තාවූද, රළු ලොමින් ගැවසීගත්තාවූද, කඳලොම ඇත්තාවූද, දික් ලොම් ඇත්තාවූද මාංශීය ඇවුරුම්වූද ශුඩාව ඇත්තාවූද, අශුද්ධකය, දෙන්නාවූද, කාමරාගයෙහි සෙදුනාවූද ස්ත්‍රී කථා පිළිබඳ ඇවැත් මින්පසු විස්තරවේ.

## කථා

1 එසමයෙහි වනාහි එක්තරා ස්ත්‍රියක් අලුත් රතු කම්-බිලියක් පොරවන ලද්දීය. (ii) එක්තරා භික්ෂුවක් රාගයෙන් රත්වූයේ ඒ ස්ත්‍රියට මෙසේ කීය (iii) "නැගණිය, තොපට ලෙමෙහිකගේ දුහී කියායි" ඕතොමෝ දූන නොගත්තාය. "ආයනීයෙනි, එසේය, අළුත් රතු කම්බිලියක්යයි" කීවාය. (iv) ඒ භික්ෂුවට සැකයක් ඇතිවිය. කිමෙක්ද, මම සංඝාදිසේස ඇවැතට පැමිණියේදැයි කියායි. (v) "මහණ, සංඝාදිසේස ඇවැත් නොවේ. දුකුලං ඇවැත්යයි" වදාළහ.

2 එසමයෙහි වනාහි එක්තරා ස්ත්‍රියක් රළු කම්බිලි යක් පෙරෙව්වාය. (මෙහි 1 (ii) 'නැගණිය, තිට බොහෝ ලොම් ඇත්තේ දැයි'' කීහයි. ඇ දූන නොගත්තාය. 'ආයසී පුත්‍රය, රළු කම්බිලියක්යයි' කීවාය. (මෙහි 1 (iv) සහ 1 (v))

3 එසමයෙහි වනාහි එක්තරා ස්ත්‍රියක් අලුත ගොතන ලද කම්බිලියක් පොරවන ලද්දීය. (මෙහි 1 (ii) "නැගණිය, රළු ලොම්ත් හැවසී ගත්තේදැයි'' කීහයි. ඇ දූන නොගත්තාය. "ආයසී පුත්‍රය, ලොම් මෘදු කම්බිලියක්යයි'' කීවාය. (මෙහි 1 (iv) සහ 1 (v)

4 එසමයෙහි වනාහි එක්තරා ස්ත්‍රියක් තද කම්බිලියක් පොරමින ලද්දීය. (මෙහි 1 (ii) "නැගණිය, නොපි තද ලොම් ඇත්තීදැයි'' කීහයි. ඇ දූන නොගත්තාය "ආයසී පුත්‍රය, එසේය, තද ලොම් ඇති කම්බිලියක්යයි'' කීවාය (මෙහි 1 (iv) සහ 1 (v)

5 එකල්හි වනාහි එක්තරා ස්ත්‍රියක් දික් ලොම් ඇති කම්බිලියක් පෙරෙව්වාය. (මෙහි 1 (ii) නැගණිය, නොපට දික් ලොම් ඇත්තේද? කීහයි. ඇ දූන නොගත්තාය. "ආයසී පුත්‍රය, එසේය දික් ලොම් ඇති කම්බිලියක්යයි'' කීවාය. (මෙහි 1 (iv) (v)

6 එසමයෙහි වනාහි එක්තරා ස්ත්‍රියක් නෙතක් වපුරා එයි. මෙහි 1 (ii) "නැගණිය, නොපි වපුළේද'' කීහයි. ඇ දූන නොගත්තාය. "ආයසී පුත්‍රය එසේය දෙවනු වැපිරීමක් නොවේයයි' කීවාය. (මෙහි 1 (iv) (v)

7 එසමයෙහි වනාහි එක්තරා භික්ෂුවක් මාර්ගයෙහි පරිබ්‍රාජිකාවක් දූක රාගයෙන් රත්වූයේ ඒ පරිබ්‍රාජිකාවට මෙසේ කීය. "නැගණිය, කිමෙක්ද? මාර්ගය ඇවුරුණේ වේදැයි'' කීහයි. ඇ දූන නොගත්තාය. "මහණ, එසේය යමි යි'' කීවාය. (මෙහි 1 (ii) මහණ, සංඝාදිසේස ඇවැත් නොවේ. ථුලසි ඇවැත්යයි'' වදළහ.

8 එසමයෙහි වනාහි එක්තරා භික්ෂුවක් රාගයෙන් රත්වූයේ එක් ස්ත්‍රියකට මෙසේ කීය. "නැගණිය, තී ශ්‍රද්ධා ඇත්තියක්වෙහිද? තී යමක් ස්වාමියාට දෙන්නෙහිද, අපට

නොදන්නෙහිද?" කීයෑයි. "ස්වාමිනි, කිමෙක්ද? මෛථුන ධර්මයද?" (මෙහි 1 (iv) ) මහණ, තෝ සංඝාදිසේස ඇවතට පැමිණියේයයි" වදාළහ.

9 එසමයෙහි වනාහි (මෙහි 1 (ii) "නැඟණිය, තී සැදැහැ ඇත්තෙහිද එසේ නම් යම්බඳුවූ අග්‍ර දානයක් වේද ඒ අගට නොදන්නෙහිද?" කීයෑයි ස්වාමිනි, කවර අග්‍ර දානයක්ද?" "මෛථුන ධර්මයයි" කීය (මෙහි 1 (iv) 'මහණ, ඔබ සංඝාදිසේස ඇවැතට පැමිණියෙහියයි" වදාළහ.

10-12 එසමයෙහි වනාහි එක්තරා ස්ත්‍රියක් යම්කිසි කර්මාන්තයක් කරයි. (මෙහි 1 (ii) "නැඟණිය, සිටුව. මම කරමියි කීයෑයි." "නැඟණිය, සිදුව" "නැඟණිය, නොව" ඈ දූත නොගත්තාය. මෙහි 1 (iv) "මහණ, සංඝාදිසේස ඇවැත් නොවේ. දුකුලා ඇවැත්යයි" වදාළහ.

(තුන්වන සංඝාදිසේසය නිමි.)

---

## 4 සංඝාදිසේසය

1 (මෙහි 1 සංඝාදිසේසයේ 1 (ii) සොදන්න) එසමයෙහි වනාහි ආයුෂ්මත්වූ උදායි ස්ථවිරයන් වහන්සේ සැවැත්නුවර කුලුපග භික්ෂුවක් වෙති. බොහෝවූ කුලයන් කරා එළඹෙති. එකල්හි වනාහි ස්වාමියා මළ විශිෂ්ට රූ ඇත්තාවූද දර්ශනීයවූද සැනැදීම් ඇතිකරන්නාවූද එක්තරා ස්ත්‍රියක්විය. එකල්හි ආයුෂ්මත් උදායි ස්ථවිරයන් වහන්සේ පෙරවරු කාලයෙහි ඇඳ පොරවා පාත්‍ර සිවුරු ගෙණ ඒ ස්ත්‍රියගේ ගෙය යම් තැනකද එතැනට එළඹියේය. එළඹ පණවන ලද අස්නෙහි හුන්නේය. එකල්හි ඒ ස්ත්‍රී තොමෝ උදායි ස්ථවිරයන් වහන්සේ යම් තැනකද එතැනට එළඹියා. එළඹ ආයුෂ්මත්වූ උදායි ස්ථවිරයන් වහන්සේට මනාකොට වැඳ එකත්පසක හුන්නාය එකත්පසක හුන්නාවූ ඒ ස්ත්‍රියට ආයුෂ්මත්වූ උදායි ස්ථවිරයන් වහන්සේ දැහැමි කථාවෙන් කරුණු දැක්විය. එහි සමාදන් කරවිය. එහි තෙද ගැන්විය. එහිම සතුටු කෙළේය.

2 එකල්හි ඒ ස්ත්‍රී තොමෝ ආයුෂ්මත්වූ උදායි ස්ථවිරයන් විසින් දැහැමි කථාවෙන් කරුණු දක්වූවා සමාදන් කරවූවා තෙද ගැන්වූවා සතුටුවූවා ආයුෂ්මත් උදායි ස්ථවිරයන්ට මෙසේ කීවාය. "ස්වාමීන් වහන්ස, ඔබවහන්සේට යමකින් ප්‍රයෝජන ඇත්තේ නම් ඒ මට කියනු මැනව. යම් බඳුවූ සිවුරු පිණ්ඩපාත සේනාසන, ගිලන්පස, බෙහෙත් පිරිකර යන යමින් ඇද්ද එය ආර්යයන් වහන්සේට දීමට අපි බලසම්පන්නවෙමු." "නැඟණිය, අපට සිවුරු පිණ්ඩපාත සේනාසන, ගිලන්පස, බෙහෙත් යන මෙය දුර්ලභ නොවේ. එනමුදුවුවත් අපට යමක් දුර්ලභද එය දෙවයි" කීයේය. "ස්වාමීන්වහන්ස, ඒ කුමක්ද?" "මෛථුන ධර්මයයි" "ස්වාමීනි, එය උවමනාද?" "නැඟණිය, උවමනායයි' කීය. "ස්වාමීන් වහන්ස, එවිනි" ඇතුළට පිවිස වස්ත්‍රය හැර ඇඳෙහි උඩුකුරුව හොවිය.

3 එකල්හි ආයුෂ්මත්වූ උදායි ස්ථවිරයන් වහන්සේ ඒ ස්ත්‍රී යම් තැනකද එතැනට එළඹියේය. එළඹ මෙනාකාර ලාමකවූ දුර්ගන්ධවූ දෙයක් කවරෙක් ස්පර්ශ කරන්නේදැයි" කෙළ ගසා ගියේය. එකල්හි ඒ ස්ත්‍රී (ii) දොස් කීවාය. නොසතුට පළකළාය. අසතුටු මැදුන් පළකළාය. "ශාක්‍ය පුත්‍රවූ මේ ශ්‍රමණයෝ අලජ්ජීහුය. දුශ්ශීලයෝය, බොරු කියන්නෝය. මොවුන් වනාහි ධර්මචාරීහුයයිද සමචාරීහුයයිද, බ්‍රහ්මචාරීහුයයිද සත්‍යවාදීහුයයිද ශීලවන්තයෝ යයිද කළණදම් ඇත්තෝයයිද ප්‍රතිඥා කරත් මොවුන්ට ශ්‍රමණ බවක් නැත්තේය. මොවුන්ට ශ්‍රේෂ්ඨ බවක් නැත්තේය. මොවුන් ශ්‍රමණ බැවින් නටුවාහුය. ශ්‍රේෂ්ඨ බවින් නටුවාහුය. මොවුන්ට ශ්‍රමණ බවක් කොයින්ද? මොවුන්ට ශ්‍රේෂ්ඨ බවක් කොයින්ද? මොවුන් ශ්‍රමණ බවින් පහවූවාහුය. මොවුන් ශ්‍රේෂ්ඨ බවින් පහවූවාහුය (iii) කෙසේ නම් උදායි ශ්‍රමණයා මගෙන් තමාම මෛථුන ධර්මය යාඥකොට කවරෙක් නම් 'මේ ලාමකවූ දුර්ගන්ධය ආමර්ශනය කරන්නේදැයි' කෙළි ගසා ගියේද? මාගේ ලාමක බව කුමක්ද? මගේ දුර්ගන්ධය කුමක්ද? මම කවරකුට කවරක් නිසා හීනවෙම්ද?"

4 අන් ස්ත්‍රීහුද (මෙහි 3 (ii) කෙසේ නම් උදායී ශ්‍රමණයා තෙමේම මෛථුන ධර්මය යාඥා කොට මෑට මේ ලාමකවූ දුර්ගන්ධ කවරෙක් ස්පර්ශ කරන්නේදැයි දොස ගසා ගියේද? මෑගේ ලාමකවූයේ කුමක්ද? මෑගේ දුර්ගන්ධවූයේ කුමක්ද? මෝතොමෝ කවරෙකුට කුමක් නිසා භයවන්නීද?"

5 භික්ෂූන් වහන්සේලා දොස් කියන්නාවූද නොසතුට ප්‍රකාශ කරන්නාවූද අසතුටු වචන කියන්නාවූද ඒ ස්ත්‍රීන්ගේ ශබ්දය ඇසූහුය. යම්බඳුවූ අල්පේච්ඡ භික්ෂූහු වෙත්ද, උන් වහන්සේලා දොස් කීහුය. නොසතුටු වචන කීහුය, අසතුටු ප්‍රකාශ කළාහුය. "ආයුෂ්මත් උදායී ස්ථවිරයෝ කෙසේ නම් ස්ත්‍රියක් හමුවෙහි තමහට උවමනා කාමපරිචරියාවෙහි, මෛථුන ධර්මයෙන් උපස්ථාන කිරීමේ ගුණ කියත්ද?"

6 එකල්හි ඒ භික්ෂූන් වහන්සේලා මේ කාරණය භාග්‍යවතුන් වහන්සේට සැලකළාහුය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ සිද්ධියෙහි භික්ෂු සංඝයා රැස් කරවා ආයුෂ්මත් උදායී ස්ථවිරයන් විචාළසේක. "උදායී තෝ ස්ත්‍රියක් හමුවෙහි තමන්ට වුවමනා කාමයෙන් උපස්ථාන කිරීම පිළිබඳව ගුණ කීයෙහි යනු සැබෑද?" "භාග්‍යවතුන් වහන්ස, සැබෑමැයි" කීයේය. භාග්‍යවත් බුදුන් වහන්සේ ගර්හා කළසේක. "හිස් පුරුෂය, නුසුදුසුවූද අනුලෝම නොවූද ප්‍රතිරූප නොවූද ශ්‍රමණ භාවයට නොගැලපෙන්නාවූද අකැප වූද නොකටයුතු දෙයක් කෙළෙහිය. හිස් පුරුෂය, තෝ වනාහි කෙසේ නම් ස්ත්‍රියක් හමුවෙහි තමන් කැමැති කාම සේවනය ගැන ගුණ කියන්නෙහිද? (මෙහි සුදින්න බණවරෙහි 25 පිටේ 31 (iii) බලන්න) හිස් පුරුෂය, මේ කාරණය අප්‍රසන්නවූවන්ගේ පැහැදීම පිණිස නොවන්නේය. මහණෙනි, මෙසේද මේ ශික්ෂාපදය උදෙසව්.

7 'යම් භික්ෂුවක් රාගයෙන් බැසගන්නා ලද්දේ පෙරළුණාවූ සිතින් යුක්තව ස්ත්‍රියක් හමුවෙහි තමහට කාමයෙන් උපස්ථාන කිරීමෙහි ගුණ කියන්නේද, නැගණිය, යම්බඳුවූ ස්ත්‍රියක් සිල්වත්වූද, කල්‍යාණධර්ම ඇත්තාවූද, බ්‍රහ්මචරියාව

ඇත්තාවූද මා වැන්නෙකුට මෙවුන්දම්හි සලකන්නාහු නම් ඒ අග්‍රයයි මෛථුනය පිළිබඳ අදහසින් කියන්නේ නම් සංඝාදිසේස ඇවැත්වේ.''

8 ''යම් ඒ යනු භික්ෂුව'' යනු (1 පාරාජිකයේ පදභාජනියේ 1-2 ඡේද) ''බැසගත්තේ නම්'' රාගයෙන් රත්වූ අපේක්ෂාව පිළිබඳ සිත් ඇත්තනුයි. ''පෙරළුනේ'' යනු රාගයෙන් රත්වූ සිත පෙරළුනේ නම් වේ. ද්වේෂයෙන් දූෂිත සිතද මෝහයෙන් මුලාවූ සිතද පෙරළුනේයි. එසේකුදුවුවත් ද අපි මෙහි අදහස් කරන ලද පෙරළීම නම් රාගයෙන් රත්වූ සිතයි. 'ස්ත්‍රිය' නම් (මෙහි 3 සංඝාදිසයේ 5 (ii) යොදන්න) 'ස්ත්‍රියක සමීපයෙහි' යනු ස්ත්‍රියකට හිට්වූව ස්ත්‍රියකට තුදුරුව යනුයි. 'තමහට කැමිති' යනු තමන්ගේ කැමැත්තයි. තමන් නිසා තමන්ගේ අදහසට තමන්ගේ හැසිරීමට යනුයි. 'මෙය උසස්ය' යනු මේ අග්‍රයි. මේ ශ්‍රේෂ්ඨයි. මේ ප්‍රමුඛයි. මේ උත්තමයි. මේ ප්‍රවරය යනුයි. 'යම් එකියක්' යනු ක්ෂත්‍රියවූ හෝ බ්‍රාහ්මණවූ හෝ වෛශ්‍යවූ හෝ ශුද්‍රවූ හෝ කැනැත්තියක් යනුයි. 'මා වැනි' යනු ක්ෂත්‍රියවූ හෝ බ්‍රාහ්මණවූ හෝ වෛශ්‍යවූ හෝ ශුද්‍රවූ හෝ මා වැන්නෙකු යනුයි. 'සිල් ඇති' යනු සතුන් මැරීමෙන් වැලකුනාවූද, සොරකම් කිරීමෙන් වැලකුනාවූද, බොරු කීමෙන් වැලකුනාවූද සිල්වතෙක් යනුයි 'ශ්‍රේෂ්ඨ හැසිරීම් ඇති' යනු මෛථුන ධර්මයෙන් වැලකුනාවූ කෙනෙකි. 'කල්‍යාණ ධර්ම' නම් ඒ සීලයෙන්ද ඒ බ්‍රහ්මචරියාවෙන්ද කල්‍යාණ ධර්ම ඇත්තෙක් වෙයි 'මේ ධර්මයෙන්' යනු මෛථුන ධර්මයෙන් යනුයි. 'පිරිවරන්නේ' යනු අභිරමණය යනුයි. 'මෛථුනයෙන් යුත්' යනු මෛථුන ධර්මය සහිත යනුයි 'සංඝාදිසේස' යනු (මෙහි 1 සංඝාදිසේසයේ 6 (ii) යොදන්න.)

9 ස්ත්‍රියකුක් වේද, ස්ත්‍රී සංඥා ඇත්තේද (ii) රාගයෙන් රත්වූ භික්ෂුව ඒ ස්ත්‍රියගේ සමීපයෙහි තමහට කාමයෙන් උපස්ථාන කිරීමෙහි ගුණ කියාද, සංඝාදිසේස ඇවැත් වේ.

10 ස්ත්‍රීන් දෙදෙනෙක් වේද, ස්ත්‍රීන් දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥාව ඇත්තේ (ii) රාගයෙන් රත්වූද භික්ෂුව ඒ

ස්ත්‍රිය මෙදෙදනාගේ සමීපයෙහි තමන් කැමැති කැසිරීම පිළි බඳ (iii) ගුණ කියාද සංඝාදිසේස ඇවැත් දෙකකට පැමිණේ.

11 ස්ත්‍රිසතුන් වේද, පණ්ඩකයෙකුත් වේද, දෙදෙනා කෙරෙහි ස්ත්‍රී සංඥම ඇත්නම් (මෙහි 10 (ii) ) ගුණ කියයිද, සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත්වේ.

12 සිවුරු, පිණ්ඩපාත, සෙනසුන්, ගිලන්පස, බෙහෙත්, පිරිකරවලින් උපස්ථාන කරමියි කියන්නහුවිද, උම්මත්තක යාවිද, ආදි කර්මිකයාවිද, ඇවැත් නොවේ.

## කථා

1 එසමයෙහි වනාහි එක්තරා වඳ ස්ත්‍රියක් කුලුපග භික්ෂුවකට මෙසේ කීය. “ස්වාමීනි, මම කෙසේ නම් වදන්නේද?” කීයයි. “නැගණිය, එසේවී නම් අග්‍රදානය දෙවයි” කීය. “ස්වාමීන්වහන්ස, අග්‍රදානය කුමක්ද?” “මෛථුන ධර්මයයි.” (ii) ඔහුට සැකයක් ඇතිවීය. භාග්‍යවතුන් වහන්සේට මේය සැලකළේය. (iii) “මහණ, තෝ සංඝාදිසේස ඇවැතට පැමිණියෙහියයි” වදාළසේක.

2 එසමයෙහි වනාහි එක්තරා වැදුවාවූ ස්ත්‍රියක් කුලුපග භික්ෂුවකට මෙසේ කීවාය. ‘ස්වාමීන් වහන්ස, මම කෙසේ නම් පුත්‍රයෙකු ලබන්නේද?” කියායි “(ii) නැගණිය, එසේ වීනම් අග්‍රදානය දෙවයි” කීය. “ස්වාමීන් වහන්ස අග්‍රදානය කුමක්ද?” ‘මෛථුන ධර්මයයි.’ (iii) (මෙහි 1 (ii) යොදන්න ) තෝ සංඝාදිසේස ඇවැතට පැමිණියෙහියයි වදාළසේක.

3 එසමයෙහි වනාහි එක්තරා ස්ත්‍රියක් කුලූපග භික්ෂුවකට මෙසේ කීවාය “ස්වාමීන් වහන්ස, මම කෙසේ න ස්වාමියාට ප්‍රිය වන්නෙම්දැයි” කියායි. (මෙහි 2 (ii) හා 1 (ii) “මහණ, තෝ සංඝාදිසේස ඇවැතට පැමිණියෙ යයි” වදාළහ.

4 එසමයෙහි වනාහි එක්තරා ස්ත්‍රියක් කුලූපග භික්ෂුවකට මෙසේ කීවාය. “ස්වාමීනි, මම කෙසේ නම් වාසනා- වන්තියක් වන්නෙම් දැයි” විචාළාය.” (මෙහි 2 (ii) හා 1 (ii) “මහණ තෝ සංඝාදිසේස ඇවැතට පැමිණියෙහියයි” වදාළ .

5 එසමයෙහි වනාහි එක්තරා ස්ත්‍රියක් කුලූපග භික්ෂුව-කට මෙසේ කීවාය. "ස්වාමීනි, මම ආර්යයන් වහන්සේට කවර දෙයක් දෙන්නෙම්දැයි" කීහයි. (මෙහි 2 (ii) සහ 1 (ii) "මහණ, තෝ සඞ්ඝාදිසේස ඇවැතට පැමිණියෙහියයි" වදාළහ.

6 එසමයෙහි වනාහි එක්තරා ස්ත්‍රියක් කුලූපග භික්ෂුව-කට මෙසේ)කීවාය. ස්වාමීනි, මම ආර්යයන් වහන්සේට කවර දෙයකින් උපස්ථාන කරන්නෙම්ද?" කීහයි. (මෙහි 2 (ii) සහ 1 (ii) "මහණ, තෝ සඞ්ඝාදිසේස ඇවැතට පැමිණි-යෙහියයි" වදාළහ.

7 එසමයෙහි වනාහි එක්තරා ස්ත්‍රියක් කුලූපග භික්ෂුව-කට මෙසේ කීවාය. "ස්වාමීන් වහන්ස, මම කෙසේ නම් සුගතියට යන්නෙම්ද?" කීහයි. (මෙහි 2 (ii) සහ 1 (ii) මහණ, තෝ සඞ්ඝාදිසේස ඇවැතට පැමිණියෙහියයි වදාළහ.

(සතරවන සඞ්ඝාදිසේසය නිමි.)

---

## 5 සංඝාදිසේසය

1 (මෙහි 1 සංඝාදිසේසයේ 1 (i) සොයන්න.) එකල්හි වනාහි ආයුෂ්මත්වූ උදායී ස්ථවිරතෙම සැවැත්නුවර කුලූපග භික්ෂුවක් වෙයි. බොහෝවූ කුලයන් කරා එළඹෙයි. යම්තැනක භාර්යාවක් නැති කුමාරයෙක් හෝ ස්වාමියෙක් නැති කුමරියක් හෝ දකීද එකල්හි කුමාරයාගේ මවුපියන් හමුවෙහි කුමරියගේ ගුණ කියන්නාහුය. "අසවල් කුලයෙහි කුමරි තොමෝ විශිෂ්ට රූ ඇත්තීය. දර්ශනීයය. ප්‍රාසාදිකය. පණ්ඩිතය. දක්ෂය. ඥානවන්තය. ව්‍යක්තය. අලස නැත්තීය. ඒ කුමාරිකාව මේ කුමාරයාට සුදුසුයි" කීහයි. ඒ මවුපියෝ මෙසේකියත්. "ස්වාමීන් වහන්ස ඔවුන්වනාහි අපි කාගේ කවුද කියා නොදන්නෙමු. ස්වාමීනි, ඉදින් ආර්යයන් වහන්සේ ඒ කුමරිය ගෙනෙන්නේ නම් හෝ දෙන්නේ සම කුමරියගේ මවුපියන් හමුවෙහි "අසවල් කුලයාගේ කුමාර-තෙම විශිෂ්ට රූ ඇත්තේය දර්ශනීයය, ප්‍රාසාදිකය, පණ්ඩිතය,

මනුෂ්‍යත්වය, ඥාණවිපාකය, දක්ෂය, අනලසය, මේ කුමරිය ඒ කුමාරයාට සුදුසුයයි" ගුණ කියති. ඔවුහු මෙසේ කියත්. "ස්වාමීන් වහන්ස, ඔවුන් කාගේ කවුදැයි අපි නොදන්නෙමු. කුමරියට කිසිවට කුමක් ඇත්තේද ස්වාමීන් වහන්ස, ඉදින් ආය්‍යයන් වහන්සේ ඉල්වන්නේ නම් අපි මේ කුමරිය ඒ කුමාරයාට දෙමුයි" කියති. මේ ක්‍රමයෙන් ආවාහද කෙරෙති. විවාහයෝද කෙරෙති. නැකැත් දවස්ද කියති.

2 එසමයෙහි වනාහි එක්තරා පැරණි ගණකයෙකුගේ භාර්යාමිතගේ දුවක් විශිෂ්ට රූ ඇත්තීය. දර්ශනීය විය. ප්‍රාසාදිකවිය. පිට ගමක ආජීවක ශ්‍රාවකයෝ අවුත් ඒ ගණකී නම් ස්ත්‍රියට මෙසේ කීවාහුය. "මේ කුමරිය අපගේ කුමරෙකුට දෙන්නෙහිද" කියායි ඕ තොමෝ මෙසේ කීවාය. (ii) "මම තුඹලා කාගේ කවුදැයි නොදන්නෙමි. මෑ මිතා මාගේ එකම දුවණියයි. පිටගමකටද යායුතුය. ඒ නිසා මම නොදෙමියි" කීවාය. (iii) මනුෂ්‍යයෝ ඒ ආජීවක සව්වන්ට මෙසේ කීවාහුය. "ආය්‍යීවූ ඔබ වහන්සේලා කවරක් සඳහා ආවාහුදැයි" කියායි. "ආය්‍යීවූ අපි මෙහි අපගේ කුමාරයෙකුට ගණකී නම් ස්ත්‍රීගේ දුව ඉල්ලුයෙමු. ඕ තොමෝ මෙසේ කීවාය. "ආය්‍යීවූ ඔබ වහන්සේලා කුමක් නිසා ඒ ගණකීගේ දුව ඉල්ලුයෙහිද? ආය්‍යීවූ උදායී ස්ථවිරයන්ට කියයුතු නොවේද? ආය්‍යීවූ උදායි ස්ථවිරයන්ට දෙනු ලබන්නේයයි" කීවාහුය.

3 එකල්හි ඒ ආජීවක සව්වෝ ආයුෂ්මත් උදායි ස්ථවිරයන් වහන්සේ යම් තැනකද එතැනට එළඹියාහුය. එළඹ ආයුෂ්මත් උදායි ස්ථවිරයන්ට මෙසේ කීවාහුය. "ස්වාමීන් වහන්ස මෙහිවූ අපි අපගේ කුමාරයෙකුට අසවල් ගණකී නම් නැකැත්තියගේ දුව ඉල්ලුයෙමු. ඕ තොමෝ මෙසේ කීය. (මෙහි 2 (ii) ) ස්වාමීන් වහන්ස, ආය්‍යයන් වහන්සේ ඒ ගණකීගේ දුව අපගේ කුමාරයාට දෙන්නට සලස්වන්නේ නම් ඉතා යහපත්යයි", කීහ.

4 එකල්හි ආයුෂ්මත්වූ උදායි ස්ථවිරයන් වහන්සේ ඒ ගණකී යම් තැනෙකද එතැනට එළඹියේය එළඹ ඒ ගණකියට මෙසේ කීහ. "කවරක් නිසා මොවුන්ට දුව නොදෙන්නෙහි දැයි" ඇසීය. "ආර්යයන් වහන්ස, මම මහාණි මොවුන් කාගේ කවුද කියා නොදනිමි. මේද මාගේ එකම දූවණියයි. පිටගම කමද යායුතුය. ඒ නිසා නොදෙන්නෙමියි" කීය. "මම මොවුන් දනිමි. මොවුන්ට දෙවයි" කීය. "ස්වාමීන් වහන්ස, ඉදින් ආර්යයන් වහන්සේ දන්නාම් දෙමියි" කීවාය.

5 එකල්හි ඒ ගණකී තොමෝ ඒ ආජීවකයන්ට දුව දුන්නාය එකල්හි ඒ ආජීවක ශ්‍රාවකයෝ ඒ කුමරිය පමුණුවා මසක්ම ස්ත්‍රී පරිභෝගයෙන් පරිභෝග කළාහුය. ඊට පසුව දාසී පරිභොගයෙන් පරිභෝග කරත්. එකල්හි ඒ කුමාරිකා තොමෝ මවගේ හමුවට දූතයෙක් යැවීය. (ii) "මම මහාණි දිළිඳුවූවා දුකට පත්වූවා සැපයක් නොලදිමි. මසක් පමණක් මා ස්ත්‍රී පරිභෝගයෙන් පරිභෝග කළාහුය. ඊට පසුව දාස පරිභෝගයෙන් පරිභෝග කරත්. මගේ මව මෙහි එත්වා, අවුත් මා ගෙණයේත්වායි" කීයායි (iii)

6 එකල්හි ඒ ගණකී තොමෝ ඒ ආජීවක සව්වෝ යම් තැනෙකද එතැනට එළඹියාය. එළඹ ඒ ආජීවක සව්වන්ට මෙසේ කීවාය. "ආර්යයන් වහන්සේලා මේ කුමරිය දාසී පරිභෝගයෙන් පරිභෝග නොකරව, ස්ත්‍රී පරිභෝගයෙන් මේ කුමරිය පරිභෝග කරවයි" කීවායි. ඔවුහු මෙසේ කීවාහුය "තොපට අප සමග ගණුදෙනුවක් නැත්තේය. අපට ශ්‍රමණයෙකු සමග ගණුදෙනුවක් ඇත්තේය. තොපි යව්, අපි ඒ දනිමුයයි" කීහ.

7 එකල්හි ඒ ගණකී තොමෝ ඒ ආජීවක සව්වන් සමග නොපැහැදී නැවත සැවැත් නුවරටම ගියාය. දෙවනුවත් ඒ කුමරිය මව හමුවට දූතයෙකු යැවීය. (මෙහි 5 (ii) ) එකල්හි ඒ ගණකී තොමෝ ආයුෂ්මත් උදායි ස්ථවිරයන් වහන්සේ යම් තැනකද එතැනට එළඹියාය. එළඹ ආයුෂ්මත් උදායි ස්ථවිරයන්ට මෙසේ කීවාය. (iii) "ස්වාමීන් වහන්ස, මගේ ඒ කුමරිය දිළිඳුවූවා දුකට පැමිණියාමැයි.

සැපක් නොලබයි. මසක් පමණක් ඇය ස්නුෂා පරිභෝගයෙන් පරිභෝග කළාහුය. ඊට පසුව දැසි පරිභෝගයෙන් පරිභෝග කරත්. ස්වාමීන් වහන්ස, ආර්යයන් වහන්සේ කුමරිය දැසි පරිභෝගයෙන් පරිභෝග නොකරවයි කියනු මැනව. මේ කුමරිය ස්නුෂා පරිභෝගයෙන් පරිභෝග කරවයිද කියනු මැනව."

8 එකල්හි ආයුෂ්මත් උදායි ස්ථවිරයන් වහන්සේ ඒ ආජීවක සව්වෝ යම්තැනෙකද එතැනට එළඹියාහුය. එළඹ ඒ ආජීවක සව්වන්ට මෙසේ කීය, "ආර්යවූ මේ කුමරිය දැසි පරිභෝගයෙන් පරිභෝග නොකරව්, මේ කුමරිය ස්නුෂා පරිභෝගයෙන් පරිභෝග කරව්යයි' කීයේයි. ඔවුන් මෙසේ කීහුය "අපට තොප සමග ගණුදෙනුවක් නැත්තේය. අපට ගණුදෙනුව ඇත්තේ ගණකිය සමගයි. ශ්‍රමණයන් විසින් මෙබඳු කටයුතුවල නොයෙදිය යුතුය. යෙදෙන්නේ නම් ශ්‍රමණයා අශ්‍රමණයෙක් වන්නේය. තොපි යව, අපි ඒ දනිමුයයි" කීවාහුය.

9 එකල්හි ආයුෂ්මත් උදායි ස්ථවිරතෙම ඒ ආජීවක සව්වන් සමග නොපැහැදුනේ සැවැත් නුවරට ආපසු ගියේය. ඒ කුමරිය තුන්වෙනි වරටත් මව හමුවට දූතයෙකු යැවීය. (මෙහි 5 (ii) දෙවනුවත් ඒ ගණකී තොමෝ ආයුෂ්මත්වූ උදායි ස්ථවිරයන්වහන්සේ යම්තැනෙකද එතැනට එළඹියාය. එළඹ ආයුෂ්මත් උදායි ස්ථවිරයන්ට මෙසේ කීවාය. (මෙහි 7 (iii) ඒ ආජීවක සව්වන් විසින් පළමු වතාවේම නොපහදවන ලදහ. "තොපි යව, මම නොයෙමියි" කීය.

10 එකල්හි ඒ ගණකී තොමෝ දොස් කීවාය, (ii) නොසතුට ප්‍රකාශ කළාය නොසතුටු බවත කීවාය. (iii) ආර්යවූ උදායි ස්ථවිරතෙමේ එසේම දිළිඳුවේවා. ආර්යවූ උදායි ස්ථවිරතෙමේ එසේම දුකට පැමිණේවා. ආර්යවූ උදායි ස්ථවිරතෙමේ සැප නොලබාවා. මගේ කුමරිය යමසේ දිළිඳුවූවාද, දුකට පැමිණියාද, සැප නොලැබුවාද, එසේම උදායි ස්ථවිරයන්ටත් වේවා. ලාමකවූ ස්වාමියාගෙන් ලාමකවූ හිමියෙක් ලබන ලද්දේද එසේමයි. ඒ කුමරියද දොස් කීවාය.

(මෙහි (ii) ලාමක හිමියෙකු ලැබුවෙමිද, ලාමක ස්වාමියෙකු සමග එක්වූයෙමිද, එසේම උදායි ස්ථවිරතෙමේද සැප නොලබාවා. දුකට පැමිණේවායි" කීහයි. "අප ස්ත්‍රීහුද හිමියන් සමග අසන්තෝෂව දුකින් වසත්ද, එසේම උදායි ස්ථවිරතෙමේද දුකින් වාසය කෙරේවා, උදායි ස්ථවිරතෙමේද සැප නොලබාවා යම් ස්ත්‍රීවරු නැදිමයිලන් හා ස්වාමියන් සමග සන්තෝෂයෙන් වෙසෙත්ද එසේම ආයාචිවූ උදායි තෙමේද සන්තෝෂයෙන් වෙසේවායිද ලාභ ලබාවායි" කීවාහුය.

11 භික්ෂූන් වහන්සේලා දෝෂාරෝපනය කරණ ඇතැම් ස්ත්‍රීන්ගේද ආයාචනය කරනු ලබන්නාවූ ඇතැම් ස්ත්‍රීන්ගේද වචන ඇසුවාහුය, යම්බඳු අල්පේච්ඡ භික්ෂූහු වෙත්ද, උන්වහන්සේලා බොහෝසේ දොස් කියන්නට වන්හ. නො සතුට ප්‍රකාශ කරන්නට වන්හ. නොසතුටු වචන කියන්නට වන්හ" කෙසේ නම් ආයුෂ්මත් උදායි ස්ථවිරතෙමේ සංචරණ භාවයට පැමිණෙන්නේද?" කීහයි. (ii) එකල්හි ඒ භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැල කළාහුය. (iii)

12 (i) එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ සිද්ධියෙහි භික්ෂු සංඝයා රැස්කරවා ආයුෂ්මත් උදායි ස්ථවිරයන් අතින් විචාළේය (ii) "උදායි තෝ මෙසේ ගිහියන්ගේ පණිවුඩාදිය ගෙන හැසිරෙන බවට පැමිණෙන්නෙහිය යනු සැබෑද" කීහයි "භාග්‍යවතුන් වහන්ස, සැබෑයි" කීය. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළසේක. (iii) හිස් පුරුෂය, තෝ කෙසේ නම් කුලයන්ගේ පණිවිඩ හුවමාරු කරමින් හැසිරීමට පැමිණෙන්නෙහිද, හිස් පුරුෂය, මෙය අප්‍රසන්න වූවන්ගේ පැහැදීමට හෝ හේතු නොවන්නේය. (මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v) ) මහණෙනි, මෙසේද වනාහි මේ ශික්ෂාපදය උදෙසව්.

13 "යම් භික්ෂුවක් මනාසි ස්ත්‍රියගේ අදහස පුරුෂයාට හෝ පුරුෂයාගේ අදහස ස්ත්‍රියට හෝ කියන්නේ ස්ත්‍රියට

නිතර භාෂිත භාවයෙන් හෝ පුරුෂයන්ට සොරැම් භාමයෙන් අදහස් ගෙනයමින් හැසිරීමට පැමිණෙන්නේද සංඝාදිසේස වේ. ''භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේද මේ ශික්ෂාපදය භික්ෂූන් වහන්සේලාට පණවන ලද්දේ මෙසී.

14 එසමයෙහි වනාහි බොහෝවූ ස්ත්‍රී ධූර්තයෝ උය- නෙහි හැසිරෙන්නාවූ එක්තරා වෙශ්‍යාඞ්ගනාවකට දූතයෙකු ඇරියාහුය. ''මෙහි එව! උයනෙහි ඉඳුරන් පිනවන්නෙමු ය''යි කියායි. ඕතොමෝ මෙසේ කීවාය. (ii) ''මම වනාහි තොපි කාගේ කවුරුන්ද යන බව නොදනිමි. මමද බොහෝවූ බඩු ඇතිව බොහෝ පරිවාර ඇත්තියක් වෙමි නුවරින් පිටද යා යුතුය. මම නොයෙන්නෙමියි'' කීවාය. (iii) එකල්හි ඒ දූතතෙම ඒ ධූර්තකයින්ට මේ කාරණය සැල කෙළේය. මෙසේ කීකල්හි එක්තරා පුරුෂයෙක් ඒ ධූර්තකයින්ට මෙසේ කීය. ''ආයුෂ්මත් තොපි කවරක් නිසා මේ වේශ්‍යාවම් ශොක කරන්නහුද? ආයුෂ්මත් උදායි ස්ථවිරයින්ට කියයුතු නොවේද? ආයුෂ්මත් උදායි ස්ථවිරතෙමේ පිවත් කරන්නේ යයි'' කීය. මෙසේ කී කල්හි එක්තරා උපාසක යෙක් ඒ පුරුෂයාට මෙසේ කීය. ''ආයුෂ්මතෙම මෙසේ නොකියාවා, ශාක්‍ය පුත්‍රවූ ශ්‍රමණයින්ට මෙබඳු දේ කිරීමට නොවටින්නේය. ආයුෂ්මත්වූ උදායි ස්ථවිරයන් තෙමේ නොක- රන්නේයයි'' කීය. මෙසේ කී කල්හි කරයිද නොකරයිද කියා ඔට්ටු ඇල්ලුවාහුය.

15 එකල්හි ධූර්තකයෝ ආයුෂ්මත් උදායි ස්ථවිරයන් වහන්සේ යම් තැනෙකද එතැනට එළඹියාහුය. එළඹ ආයුෂ්මත්වූ උදායි ස්ථවිරයන්ට මෙසේ කීහුය. ''ස්වාමීන් වහන්ස, මෙහිවූ අපි උයනෙහි කාමපරිචර්යාද පිණිස අසවල් වේශ්‍යාඞ්ගනාවට පණිවිඩයක් ඇරියෙමු. මෙහි එව, උයනෙහි කාම පරිචර්යාව කරන්නෙමුයි'' කියායි ඕතොමෝ මෙසේ කීවාය. (මෙහි 14 (ii) ; ''ස්වාමීන් වහන්ස, ආයුෂ්මත් වහන්සේ ඒ වේශ්‍යාව ගොදවාවා, ඒ පිණිස ඇයැදිමියි'' කීය.

16 එකල්හි ආයුෂ්මත්වූ උදායි ස්ථවිරයන් වහන්සේ ඒ වෙශ්‍යාව යම් තැනකද එතැනට එළඹියේය. එළඹ, ඒ වෙශ්‍යාවට මෙසේ කීය. "ඔවුන් ලඟට කුමක් නිසා නොයන්නෙහිද?" "ආර්යයන් වහන්ස, ඔවුන් කාගේ කවුරුද කියා මම නොදන්නෙමි. මමද බොහෝවූ බඩු හා පිරිකරද ඇත්තියක් වෙමි. කුමරින් පිළිද යායුතුය. මම නොයන්නෙමියි" කීවාය. "ඔවුන් ලඟට යව, මම ඔවුන් දනිමියි" කීය. "ස්වාමීනි වහන්ස, ආර්යයන් වහන්සේ ඉදින් දන්නේ නම් යමියි" කීවාය. එකල්හි ඒ ධූර්තකයෝ ඒ වෙශ්‍යාව ගෙණ උයනට ගියාහුය.

17 එකල්හි ඒ උපාසක තෙම නින්දා කරයි, නොසතුටු ප්‍රකාශ කරයි, නොසතුටු වචන කියයි. "කෙසේ නම් ආර්යවූ උදායි ස්ථවිරතෙමේ ගිහියන්ගේ අදහස් හුවමාරුවට පැමිණියේද" භික්ෂූන් වහන්සේලා නින්දා කරන්නාවූද දොස් කියන්නාවූද නොසතුටුවූන්සේ කියන්නාවූද ඒ උපාසකයාගේ කියමන් ඇසූවාහුය. යම්බඳු අල්පෙච්ඡ භික්ෂූන් වහන්සේලා වෙත්ද, උන්වහන්සේලාද නින්දා කළාහුය. දොස් කීවාහුය, නොසතුටු ප්‍රකාශ කළාහුය "කෙසේ නම් ආයුෂ්මත් උදායි ස්ථවිරතෙමේ එකෙණෙහි අදහස් හුවමාරුවට පැමිණියේදයි" කියති.

18 (මෙහි 11 (ii) හා 12 (i)) උදායි තෝ වනාහි ගිහියන්ගේ අදහස් හුවමාරුවට පැමිණියාහු යනු සැබෑද?" "භාග්‍යවතුන් වහන්ස, සැබෑවයි" කීය. භාග්‍යවත් බුද්ධරජාණන් වහන්සේ ගැරහූසේක." හිස් පුරුෂය, තෝ කෙසේ නම් එකෙණෙහි අදහස් හුවමාරුවට පැමිණියෙහිද? හිස් පුරුෂය මෙය නොපැහැදියන්ගේ පැහැදීම පිණිස නොවන්නේය. (මෙහි (1) පාරාජිකයේ සුදින්න බණවර 30 (v)) මහණෙනි, මෙසේද වනාහි මේ ශික්ෂාපදය උදෙසව්.

19 "යම් භික්ෂුවක් වනාහි පුරුෂයාගේ අදහස ස්ත්‍රියට කියමින් හෝ ස්ත්‍රියගේ අදහස පුරුෂයාට කියමින් හෝ භාර්යාභාවය පිණිස හෝ ජාරසැමිභාවය පිණිස හෝ යම් පිරිසකින් එකෙණෙහි සංසර්ගයට කැමති දෙදෙනෙකුන්ගේ අදහස් කීමට පැමිණෙන්නේද, සංඝාදිසේස ඇවැත්වන්නේ යයි" කියති.

20 'යම් ඒ යනු "භික්ෂුවක්" යනු (මෙහි 1 පාරාජිකාවේ පදභාජනීයේ 1-2) "අදහස් ගෙනයාමට පැමිණේයි" යනු ස්ත්‍රිය විසින් හෝ මෙහෙයන ලද්දේ පුරුෂයාගේ සමීපට යන්නේද, පුරුෂයා විසින් හෝ මෙහෙයන ලද්දේ ස්ත්‍රිය සමීපට යන්නේද යනුයි. "පුරුෂ හැඟීම ස්ත්‍රියට" යනු පුරුෂයාගේ අදහස ස්ත්‍රියට ආරෝචනය කිරීමයි 'ස්ත්‍රී අදහස පුරුෂයාට" යනු ස්ත්‍රියගේ අදහස පුරුෂයාට ආරෝචනය කිරීමයි. "භාර්‍යා බැව්හි" යනු භාර්‍යාවකගේ වේ යනුයි. 'ජාරසැමිබැව්හි' යනු ජාරස්වාමියෙක් වේ යනුයි. "යටත්පිරිසෙයින් ක්ෂණයකින්" යනු මොහොතකින් මත්තෙහි යනුයි. "සංඝාදිසෙසය" යනු (මෙහි 1 සංඝාදිසේසයේ 9 (ii)) "දශ ස්ත්‍රීහු" නම් මාතුරක්ඛිතාව, පිතු රක්ඛිතාව, මාතු පිතුරක්ඛිතාව, භාතු රක්ඛිතාව, භගිනී රක්ඛිතාව, ඤාති රක්ඛිතාව, ගොත්ත රක්ඛිතාව, ධම්ම රක්ඛිතාව, සාරක්ඛාව, සපරිදණ්ඩාව යනුයි.

21 "දශ භාර්‍යාවෝ නම්: ධනක්කීතාවද, ඡන්දවාසිනීද, භෝගවාසිනීද, පටවාසිනීද, ඕදපත්තකිනීද, ඕභතචුම්බටාද, දාසීභාර්‍යාද, කම්මකාරී භාර්‍යාද, ධජාහටාද, මුහුත්තිකාද, යනුයි. "මාතුරක්ඛිතාව" නම් මව විසින් (ii) ආරක්ෂාකෙරේද, ගෝපනය කෙරේද, බලපවත්වාද සවකීය වසඟෙහි පමුණුවාද, එබඳු තැනැත්තියයි (iii) "පිතුරක්ඛිතාව" නම් පියා විසින් (මෙහි (ii) 'මාතාපිතුරක්ඛිතාව' නම් මවුපියන් විසින් (මෙහි (ii) 'භාතුරක්ඛිතාව' නම් සහෝදරයා විසින් (මෙහි (ii) 'භගිනීරක්ඛිතා' නම් සහෝදරිය විසින් (මෙහි (ii) 'ඤාති රක්ඛිතාව' නම් නෑයන් විසින් (මෙහි (ii)) 'ගොත්තරක්ඛිතාව' නම් සවකීය ගෝත්‍රය විසින් (මෙහි (ii)) 'ධම්මරක්ඛිතා' නම් සහධර්මිකයන් විසින් (මෙහි (ii))

22 "සාරක්ඛාව" නම් මූ මගේයයි ගර්භයෙහිම සිත්ගන්නා තැනැත්තියයි. යටත් පිරිසෙයින් මල්වැලක් කරලූයේද මතොමෝ සාරක්ඛා නම්වේ. "සපරිදණ්ඩා" නම් යමෙක් අසවල් ස්ත්‍රිය ලඟට ගියේ නම් මෙතෙක් දඬුවමයයි කිසිවකු විසින් දඬ තැබූ ස්ත්‍රියයි.

23 "ධනක්කීතා" නම් ධනය නියමකොට 'වැසෙම්' තැනැත්තියයි. ඡන්දවාසිනී නම් ප්‍රියඹූයේ ප්‍රිය මායෙන්

වැසෙව් තැනැත්තියයි. "භොගවාසිනී" නම් භොගදී 'වැසෙව්' තැනැත්තියයි. "පටවාසිනී" නම් වස්ත්‍රදී 'වැසෙව්' තැනැත්තියයි. "ඔදපත්තකිනී" නම් අත බඳුනක් ආමර්ශනය කොට 'වැසෙව්' තැනැත්තියයි. "ඔභට චුම්බටා" නම් හිස්හුඹුළු ඉවත්කර 'වැසෙව්' තැනැත්තියයි" දාසි නම් දාසි ඔමෙන් භාර්යා ඔවත් ඇති තැනැත්තියයි "කම්මකාරී" නම් වැඩ කරන්නාවූත් භාර්යාවූත් තැනැත්තියයි. "ධජාහටා" නම් කොඩි ඔසවාගෙණ ගොස් පැහැරගත් තැනැත්තියයි. "මුහුත්තිකා" නම් එකෙණෙහි ගත් තැනැත්තියයි.

24 පුරුෂයා භික්ෂුවක් යවයි. "සවාමීන් වහන්සේ යව, අසවල් මාතු රක්ඛිතාවට කියනු මැනව. අසවල් තැනැත්තාගේ ධනක්කීතා භාර්යාව වේයයි" කියව. (ii) පිළිගණීද, විමසාද ආපසු පණිවුඩය ගෙනේද සංඝාදිසේස ඇවැත්වේ. (iii)

25-32 (24 ඡේදයෙහි මෙහි දක්වන වචන "මාතු" වෙනුවට යොදාගත යුතුයි.) පිතු- මාතුපිතු- භාතු- භගිනී- ඤාති- ගොත්ත- ධම්ම- සාරක්ඛාවට- සපරිදණ්ඩාවට-

තිකෂප පදයෝයි.

---

33 පුරුෂතෙම භික්ෂුවක් යවයි. "සවාමීනි යව. අසවල් නම් ඇති මාතුරක්ඛිත ස්ත්‍රීයටද පිතුරක්ඛිත ස්ත්‍රීයටද කියව. (ii) අසවල් තැනැත්තාගේ ධනක්කීත භාර්යාවෝ වව්යයි" කියයි. පිළිගණීද, විමසාද, ආපසු පණිවුඩය ගෙනේද සංඝාදිසේස ඇවැත්වේ. (iii)

34-41 (මෙහි 33 ඡේදයේ "මාතු" "පිතු" වෙනුවට මෙහි දක්වන වචන යොදාගත යුතුයි ) භාතු- භගිනී- ඤාති- ගොත්ත- ධම්ම- සාරක්ඛාවටද- සපරිදණ්ඩාවටද-

ඛණ්ඩ චක්කයයි.

---

42 පුරුෂතෙම භික්ෂුවක් යවයි "සවාමීනි, යව, අසවල් නම් ඇති පිතු රක්ඛිතාවටද මාතා පිතු රක්ඛිතාවටද කියව. (මෙහි 33 (ii) )

(43–50) (මෙහි 42 ඡේදයේ "මාතුපිතු" වෙනුවට මේ වචන යොදන්න) භාතු - භගිණී - ඤාති - ගොත්ත - ධම්ම - සාරක්ඛා - සපරිදණ්ඩාවද

51 පුරුෂයා භික්ෂුව යවයි. 'ස්වාමීනි යම් අසවල් නම් ඇති පිතු රක්ඛිතාවද, මාතු පිතු රක්ඛිතාවද, කියව.' (මෙහි 33 (ii) )

බද්ධ චක්කයයි

---

මූලසංඛිත්තය.

52 (i) පුරුෂයා භික්ෂුව යවයි. "ස්වාමීනි, යව අසවල් නම් ඇති සපරිදණ්ඩාවද මාතු රක්ඛිතාවද කියව. (මෙහි 33 (ii) )

53–60 (මෙහි 52 ඡේදයේ "මාතු" වෙනුවට මේ වචන යොදන්න.) පිතු- මාතා පිතු- භාතු- භගිණී- ඤාති- ගොත්ත- ධම්ම- සාරක්ඛා

එක මූලිකය නිමි.

---

61 දුමූලිකයද ත්‍රිමූලිකයද නව මූලිකය දක්වා මෙසේ කළ යුතුයි.

මේ දස මූලිකයයි.

---

62 (i) පුරුෂයා භික්ෂුව යවයි. "ස්වාමීනි, යව අසවල් නම් ඇති මාතු රක්ඛිතාවද පිතු රක්ඛිතාවද මාතා පිතු රක්ඛිතාවද භාතු රක්ඛිතාවද භගිනි රක්ඛිතාවද ඤාති රක්ඛිතාවද ගොත්ත රක්ඛිතාවද ධම්ම රක්ඛිතාවද සාරක්ඛාවද සපරිදණ්ඩාවද කියව (ii) අසවල් තැනැත්තාහුගේ ධනක්කීත භාර්‍යාවෝ වව්යයි" කියයි. පිළිගනීද මීමාංසාද ආපසු පණිවුඩය ගෙනේද සංඝාදිසේස ඇවැත් වේ.

ධනක්කීත ත්‍රි චක්‍රය නිමි.

---

63 පුරුෂයෙක් භික්ෂුව යවයි. "ස්වාමීනි, යව අසවල් නම් ඇති මාතු රක්ඛිතාවට කියව. අසවල් තැනැත්තහුගේ ඡන්දවාසිනී භාර්‍යාව වේවයි කියයි" (මෙහි 24 (ii)

64-71 (මෙහි 63 ඡේදයේ "ඡන්දවාසිනී" වෙනුවට මේ වචන යොදාගත යුතුයි.) භෝගවාසිනීද, පටවාසිනීද, ඕදපත්තකිනීද, ඔභතචුම්බටාද, දාසීභාරියාද, කම්මකාරී භාරියාද, ධජාහටාද, මුහුත්තිකාද,

72-79 (මෙහි 64-71 ඡේදවල 'මාතු' වෙනුවට මේ වචන යොදාගත යුතුයි.) පිතු- මාතා පිතු- භාතු- භගිනී- ඤාති- ගොත්ත- ධම්ම- සාරක්ඛාවට- සපරිදණ්ඩාවටද

නික්ඛේප පදයෝයි

---

80 (i) පුරුෂයා භික්ෂුව යවයි. "ස්වාමීනි, යව අසවල් නම් ඇති මාතුරක්ඛිතාවටද පිතු රක්ඛිතාවටද කියව. (ii) අසවල් තැනැත්තාහුගේ මුහුත්තිකා භාර්යාවෝවේවා යයි කියායි. පිළිගනීද, විමසාද, පණිවුඩය ආපසු ගෙනේද සංඝාදිසේස ඇවැත් වේ.

81-88 (මෙහි 80 ඡේදයේ "පිතු" වෙනුවට 64 ඡේදයේ මාතු පිතු රක්ඛිතාවටද- යනාදි වචන "සපරිදණ්ඩාවටද" දක්වා යොදන්න )

සංක්ෂේපයෙන් ඛණ්ඩ චක්කය නිමි.

---

89 පුරුෂයෙකු භික්ෂුව යවයි. "ස්වාමීනි, යව. අසවල් තැනැත්තියට පිතුරක්ඛිතාවටද මාතා පිතු රක්ඛිතාවටද කියව. අසවල් තැනැත්තාහුගේ මුහුත්තිකා භාර්යාවෝවේවා යයි කියායි. පිළිගනීද, විමසාද, පණිවුඩය ආපසු ගෙනේද සංඝාදිසේස ඇවැත් වේ.

90-97 (මෙහි 89 ඡේදයේ "මාතා පිතු" වෙනුවට මේ වචන යොදාගත යුතුයි.) භගිනී- ඤාති- ගොත්ත- ධම්ම- සාරක්ඛා සපරිදණ්ඩාවටද-මාතු රක්ඛිතාවටද යනුවෙනි.

බද්ධ චක්කයයි.

---

### මූලසංඛිතකය.

98 පුරුෂයෙක් භික්ෂුව යවයි. "ස්වාමිනී, යව; අසවල් නම් ඇති සපරිදණ්ඩාවද මාතුරක්ඛිතාවද කියව. අසවල් තැනැත්තහුට මුහුත්තිකා භාර්‍ය්‍යාවෝවේව යයි" කියයි. (ii) පිළිගනීද, විමසාද පණිවුඩය ඇපසු ගෙනේද සංඝාදිසේස ඇවැත් වේ. (iii)

99-106 මෙහි 98 ඡේදයේ 'මාතු" වෙනුවට මේ වචන යොදන්න.) පිතු-මාතා පිතු - භාතු-භගිනී -ඤාති- ගොත්ත ධම්ම-සාරක්ඛා

ඒක මූලිකය නිමි.

---

විමූලිකාදීහුද මෙසේම කළ යුතුයි. මේ දස මූලිකයයි.

---

107 (මෙහි 62 (i) යොදන්න) අසවල් තැනැත්තහුට මුහුත්තිකා භාර්‍ය්‍යාවෝවේවයයි කියයි. (ii) පිළිගණීද, විමසාද පණිවුඩය ඇපසු ගෙනේද සංඝාදිසේස ඇවැත් වේ.

මුහුත්තිකා සත් චක්‍රය නිමි.

---

108 පුරුෂයෙක් භික්ෂුව යවයි. "ස්වාමිනී, යව. අසවල් නම් ඇති මාතුරක්ඛිතාවට කියව. අසවල් තැනැත්තහුට ධනක්කීතා භාර්‍ය්‍යාවෝවේව යයි" කියයි, (ii) පිළිගණීද විමසාද, පච්චාහරණ කෙරේද සංඝාදිසේස ඇවැත් වේ.

109-116 (මෙහි 108 ඡේදයේ "ධනක්කීතා" වෙනුවට මේ වචන යොදන්න) ඡන්දවාසිනී, භොගවාසිනී-පටවාසිනී ඕදපත්තකිනී, ඔභට චුම්බටා - දාසී- කම්මකාරී-ධජාහටාද මුහුත්තිකාද

නික්ෂේප පදයෝයි.

---

117 පුරුෂයෙක් භික්ෂුව යවයි. "ස්වාමිනී, යව. අසවල් තැනැත්තියට මාතුරක්ඛිතාවට කියව. අසවල් අයට ධනක්කීතාවූද, ඡන්දවාසිනීවූද භාර්‍ය්‍යාවෝවේව යයි" කියයි. (ii) පිළිගණීද, විමසාද, පච්චාහරණ කෙරේද සංඝාදිසේස ඇවැත් වේ. (iii)

118-125 (මෙහි 117 ඡේදයේ "ඡන්දවාසිනීවූ" යනුවට මේ වචන යොදන්න) භොගවාසිනීවූද-පටවාසිනීවූද-ඕදපත්තකිනීවූද- ඕභතචුම්බටාද- දාසී- කම්මකාරී- ධජාහටාද- මුහුත්තිකාද-

ඛණ්ඩ චක්කයයි.

---

126 පුරුෂතෙම භික්ෂුව යවයි. "සවාමීනි, මම. අසවල් නම් ඇති මාතුරක්ඛිතාවට කියමි. අසවල් නැතැත්තහුට ඡන්දවාසිනීවූද භොගවාසිනීවූද භාර්‍ය්‍යාවෙව්වයයි කියායි, (මෙහි 117 (ii)

127-128 (මෙහි 126 ඡේදයේ "භොගවාසිනීවූද" යනුවට මේ වචනය යොදන්න.) මුහුත්තිකාද, ධනක්කීතාද

බද්ධ චක්‍රයයි.

---

සංක්ෂෙප මූලයයි.

129 පුරුෂතෙම භික්ෂුව යවයි. "සවාමීනි, මම. අසවල් නම් ඇති මාතුරක්ඛිතාවට කියව. අසවල් නැතැත්තහුට මුහුත්තිකාවූද ධනක්කීතාවූද භාර්‍ය්‍යාවෙව්වයයි" කියායි. මෙහි 117 (ii)

130-131 (මෙහි 129 ඡේදයේ "ධනක්කීතාවූද" යනුවට මේ වචන යොදන්න.) ඡන්දවාසිනීවූද - ධජාහටාවූද-

ඒකමූලිකය නිමි.

---

132 ද්විමූලිකාදියද මෙසේම කළයුතුයි.

---

දසමූලිකයයි.

133 පුරුෂතෙම භික්ෂුව යවයි. "සවාමීනි මම අසවල් නම් ඇති මාතුරක්ඛිතාවට කියව. අසවල් නැතැත්තහුට ධනක්කීතාවූද ඡන්දවාසිනීවූ, භොගවාසිනීවූද, පටවාසිනීවූද, ඕදපත්තකිනීවූද, ඕභතචුම්බටාවූද, දාසී භරියාවූද, කම්මකාරීභරියාවූද, ධජාහටාවූද, මුහුත්තිකාවූද, භාර්‍ය්‍යාවෙව්වයයි කියායි. (මෙහි 117 (ii)

මාතුරක්ඛිතා චක්‍රය නිමි.

134 පුරුෂයෙකු භික්ෂුව යවයි, "ස්වාමීනි, මම අසවල් නම් ඇති පිතු රක්ඛිතාවට කියමි. අසවල් තැනැත්තහුට ධනක්කීත භාර්යාවේවයයි" කියයි. (මෙහි 117 (ii)

135 (මෙහි 134 ඡේදයේ "පිතුරක්ඛිතාවට" වෙනුවට මේ වචන යොදගත යුතුයි.) මාතුරක්ඛිතාවට-භාතුරක්ඛිතාවට-භගිණී රක්ඛිතාවට-ඤාතිරක්ඛිතාවට - ගොත්තරක්ඛිතාවට- ධම්මරක්ඛිතාවට-, සාරක්ඛාවට- සපරිදණ්ඩාවට-

136 පුරුෂයෙකු භික්ෂුව යවයි. "ස්වාමීනි, මම. අසවල් නම් ඇති සපරිදණ්ඩාවට කියමි, අසවල් තැනැත්තහුට ඡන්දවාසිනී භාර්යාවේවයයි" කියයි. (මෙහි 117 (ii)

137 (මෙහි 136 ඡේදයේ 'ඡන්දවාසිනී" වෙනුවට මේ වචන යොදගත යුතුයි ) භොගවාසිනී-පටවාසිනී- ඕදපත්තකිණී- ඔභතචුම්බටා- දාසිකම්මකාරී- ධජාහටා- මුහුත්තිකා-
නික්ඛේප පදයෝයි.

---

138 පුරුෂයෙකු භික්ෂුව යවයි. "ස්වාමීනි, මම. අසවල් තැනැත්තහු සපරිදණ්ඩාවට කියමි. අසවල් තැනැත්තහුට ධනක්කීතවද ඡන්දවාසිනීවූද, භාර්යාවේවයයි" කියයි. (මෙහි 117 (ii)

(මේ ආකාරයෙන් "භොගවාසිනීද" වෙනුවට ඉහත මෙහි වචන යොදගත යුතුයි,)

ඛණ්ඩ චක්කයයි

---

139 පුරුෂයෙකු භික්ෂුව යවයි "ස්වාමීනි, මම. අසවල් තැනැත්තියට සපරිදණ්ඩාවට කියමි. අසවල් තැනැත්තහුට ඡන්දවාසිනීවූද, භොගවාසිනීවූද, භාර්යාවේවයයි" කියයි. (මෙහි 117 (ii)

140 (මෙහි 139 ඡේදයේ "භොගවාසිනීවූද" වෙනුවට මේ වචන යොදන්න. මුහුත්තිකා - ධනක්කීතා-
බද්ධ චක්කයයි.

මූල සංඛිත්තය.

---

141 පුරුෂතෙම භික්ෂුව යවයි. "ස්වාමීනි, යව. අසවල් න ඇති සපරිදණ්ඩාවට කියව. අසවල් නැනැත්තහුට මුහුත්තිකාද ධනක්කීතාද භාර්‍ය්‍යාවෙක් වේවයි" කියායි. (මෙහි 117 (ii)

142 (මෙහි 141 ඡේදයේ "ධනක්කීතාද" වෙනුවට මේ වචන යෙදිය යුතුයි.) ඡන්දවාසිනී- ධජාහටාද-

ඒක මූලිකයයි.

---

143 විමූලිකය සමග නවමූලිකය දක්වා මෙසේම කළ යුතුයි.

මේ දස මූලිකයයි.

---

144 පුරුෂතෙම භික්ෂුව යවයි. "ස්වාමීනි, යව. අසවල් නම් ඇති සපරිදණ්ඩාවට කියව. අසවල් නැනැත්තහුට ධනක්කීතාවූද ඡන්දවාසිනීවූද, භෝගවාසිනීවූ- පටවාසිනීවූ- ඕදපත්තකිනීවූ- ඕභතචුම්භටාවූ- දාසි භාර්‍ය්‍යාවූ- කම්මකාරී භාර්‍ය්‍යාවූ- ධජාහටාවූ- මුහුත්තිකාවූ- භාර්‍ය්‍යාවෝවේවයයි කියායි. (මෙහි117(ii)

(සපරිදණ්ඩා වස්තුය නිමි)

---

145 පුරුෂතෙම භික්ෂුව යවයි. "ස්වාමීනි, යව. අසවල් නම් ඇති මාතුරක්ඛිතාවට කියව, අසවල් නැනැත්තහුට ධනක්කීතා භාර්‍ය්‍යාවේවයයි" කියායි. (මෙහි 117 (ii)

146 පුරුෂතෙම භික්ෂුව යවයි. "ස්වාමීනි, යව. අසවල් නම් ඇති මාතුරක්ඛිතාවට පිතුරක්ඛිතාවට කියව (ii) අසවල්නැනැත්තහුට ධනක්කීත ඡන්දවාසිනී භාර්‍ය්‍යාවෝ යයි" කියායි. (මෙහි 117 (ii) )

1 47 පුරුෂතෙම භික්ෂුව යවයි. 'ස්වාමීනි, යව. අසවල් න ඇති මාතුරක්ඛිතාවට පිතුරක්ඛිතාවට මාතාපිතුරක්ඛිතාවට කියව. නැනැත්තහුට ධනක්කීතා ඡන්දවාසිනී භෝගවාසිනී භාර්‍ය්‍යාවෝවේවයයි කියායි. (මෙහි 117 (ii)
(මෙසේ උභතෝ වඩ්ඪනය කළ යුතුයි,)

148 පුරුෂතෙම භික්ෂුව යවයි. "ස්වාමීනි, යම. අසවල් නම් ඇති - මාතුරක්ඛිතාවට - පිතුරක්ඛිතාවට - මාතාපිතුරක්ඛිතාවට - භාතුරක්ඛිතාවට - භගිණීරක්ඛිතාවට - ඤාතිරක්ඛිතාවට - ගොත්තරක්ඛිතාවට - ධම්මරක්ඛිතාවට - සාරක්ඛාවට - සපරිදණ්ඩාවට කියනු. අසවල් තැනැත්තහුට ධනක්කීතා - ඡන්දවාසිනී - භොගවාසිනී - පටවාසිනී - ඕදපත්තකිණී - ඕභතචුම්බටා - දාසී භරියා - කම්මකාරී භරියා - ධජාහටා - මුහුත්තිකා - භාර්යාවෝ වෙත්වයි" කියයි. (මෙහි 117 (ii)

(ඉහත ඡේදවල "පුරුෂතෙම භික්ෂුව යවයි" ආදී වචනවල පුරුෂතෙම වෙනුවට මෙහි දක්වන වචන යොදන්න.)

149 පුරුෂයාගේ මව් - පුරුෂයාගේ පියා - පුරුෂයාගේ මවුපියෝ - පුරුෂයාගේ සහෝදරයා - පුරුෂයාගේ සහෝදරී - පුරුෂයාගේ නෑයෝ - පුරුෂයාගේ ගෝත්‍රිකයෝ - පුරුෂයාගේ සසධාර්මිකයෝ විස්තර කළ යුතුයි උභතො මිශ්‍රය යන මේ ඡේද පෙර පරිද්දෙන් එසේම විස්තර කටයුතුයි.)

(ඉහත ඡේදවල 'පුරුෂතෙම' වෙනුවට මේ වචන යෙදීමෙන් ඡේද සෑදිය යුතුයි )

150 මාතුරක්ඛිතාවගේ මව - පිතුරක්ඛිතාවගේ පියා - (මෙහි 117 (ii) )

151 මාතුරක්ඛිතාවගේ මව භික්ෂුව යවයි. "ස්වාමීනි යම. අසවල් තැනැත්තියට කියව අසවල් තැනැත්තහුට ධනක්කීතාද ඡන්දවාසිනීද, ධනක්කීතාද භොගවාසීද,. ධනක්කීතාද මුහුත්තිකාද භාර්යාවෙව්වයි" කියයි පිළිගණීද විමසාද පණිවුඩය ආපසු ගෙනේද සංඝාදිසේස ඇවැත් වේ.

ඛණ්ඩචක්කයයි.

---

152 මාතුරක්ඛිතාවගේ මව භික්ෂුව යවයි, "ස්වාමීනි යම. අසවල් තැනැත්තියට කියව. අසවල් තැනැත්තහුට ඡන්දවාසිනීද භෝගවාසිනීද, ඡන්දවාසිනීද ධනක්කීතාද, ඡන්දවාසිනීද මුහුත්තිකාද, ඡන්දවාසිනීද ධනක්කීතාද භාර්යාව වේවායි" කියයි. පිළිගණීද විමසාද පණිවුඩය ආපසු ගෙනේද සංඝාදිසේස ඇවැත්වේ

බද්ධචක්කයයි.

## මූලසංචිතතයයි.

153 මාතුරක්ඛිතාවගේ මවු භික්ෂුව යවයි. "ස්වාමීනි යව. අසවල් තැනැත්තියට කියව අසවල් තැනැත්තාහුට මුහුත්තිකාද ධනක්කීතාද, මුහුත්තිකාද භොගවාසිනීද, මුහුත්තිකාද ඡන්දවාසිනීද, මුහුත්තිකාද ධජාහටාද භාර්‍යා වේවායි" කියයි. පිළිගණීද විමසාද පණිවුඩය ඇපසු ගෙණේද සංඝාදිශේෂ ඇවැත්වේ.

ඒකමූලිකය නිමි.

---

(මෙසේ විමූලිකය පටන් නව මූලිකය දක්වා කළයුතුයි. මේ දස මූලිකයයි )

154 මාතුරක්ඛිතාවගේ මව භික්ෂුව යවයි. "ස්වාමීනි යව. අසවල් තැනැත්තාහුට කියව. අසවල් තැනැත්තාහුට ධනක්කීතාද, ඡන්දවාසිනීද භෝගවාසිනීද පටවාසිනීද ඕදපත්තකිණීද ඔභතචුම්බටාද දාසී භරියාද කම්මකාරී භරියාද ධජාහටාද මුහුත්තිකාද යන භාර්‍යාවෝ වේවායි" කියයි. (ii)පිළිගණීද විමසාද පණිවුඩය ඇපසු ගෙණේද සංඝාදිශේෂ ඇවැත්වේ.

මාතුරක්ඛිතය නිමි.

---

155 මාතාපිතුරක්ඛිතාවගේ මවුපියෝ–භාතුරක්ඛිතාවගේ සහෝදරයා– භගිනීරක්ඛිතාවගේ සහෝදරී- ඤාතිරක්ඛිතාවගේ නෑයෝ- ගොත්තරක්ඛිතාවගේ ගෝත්‍රිකයෝ- ධම්මරක්ඛිතාවගේ සධාර්මිකයෝ- සාරක්ඛාවගේ ආරක්ෂකයා යම්තැනකද හෙතෙම සපරිදණ්ඩාවගේ දඬුතැබූ පුද්ගලයා යම්තැනකද සපරිදණ්ඩාව විසින් යමෙකුට දඬු තැබුයේද හෙතෙම භික්ෂුව යවයි "ස්වාමීනි, අසවල් තැනැත්තාහුට කියව. අසවල්ලාට ධනක්කීතා භාර්‍යාව වේවායි" කියයි.(මෙහි 154 ii)

නික්ෂේප පදයෝයි.

---

156 සපරිදණ්ඩාව විසින් යමෙකුට දඬු තබන ලද්දේද හෙතෙම භික්ෂුව යවයි "ස්වාමීනි, යව අසවල් තැනැත්තියට කියව. අසවල් තැනැත්තාහුට ධනක්කීතාද ඡන්දවාසිනීද භාර්‍යා වේවායි" කියයි. පිළිගණීද විමසාද පණිවුඩය ඇපසු ගෙණේද සංඝාදිශේෂ ඇවැත්වේ.

ඛණ්ඩචක්කයයි.

157 (මෙහි 151 ඡේදයේ "ඡන්දවාසිනීද" වෙනුවට මේ වචන යොදන්න) භොගවාසිනීද-මුහුත්තිකාද-

158 සපරිදණ්ඩාව විසින් යමෙකුට දඩ තැබුවේද ඒ තෙමේ භික්ෂුව යවයි "ස්වාමිනී යව. අසවල් තැනැත්තියට කියව. අසවල් තැනැත්තිය ඡන්දවාසිනීද භෝගවාසිනීද වේවායි" කියායි. (ii) පිළිගණීද විමසාද පණිවුඩය ආපසු ගෙණේද සංඝාදිසේස ඇවැත්වේ.

159 (මෙහි 158 ඡේදයේ 'භෝගවාසිනී' වෙනුවට මේ වචන යොදන්න) මුහුත්තිකාද- ධනක්කීතාද-

බද්ධ වණ්ණනයයි.

---

160 සපරිදණ්ඩාව විසින් යමෙකුට දඩ තබන ලද්දේද ඒ තෙමේ භික්ෂුව යවයි. "ස්වාමිනී යව. අසවල් තැනැත්තියට කියව. අසවල් තැනැත්තිය මුහුත්තිකාද ධනක්කීතාද භාර්යාවේවායි" කියයි. (මෙහි 158 (ii) )

161 (මෙහි 160 ඡේදයේ "ධනක්කීතා" වෙනුවට මේ වචන යොදන්න) 'ඡන්දවාසිනීද- ධජාහටාද භාර්යා වේවායි' කියායි. පිළිගණීද විමසාද පණිවුඩය ආපසු ගෙණේද සංඝාදිසේස ඇවැත්වේ.

ඒකමූලිකය නිමි.

---

162 (විමූලිකය පටන් නවමූලිකය දක්වා මෙසේ කළ යුතුයි)

මේ දසමූලිකයයි.

---

163 සපරිදණ්ඩාව විසින් යමෙකුට දඩ තබන ලද්දේද ඒ තෙමේ භික්ෂුව යවයි "ස්වාමිනී යව. අසවල් තැනැත්තියට කියව. අසවල් තැනැත්තිය ධනක්කීතාද ඡන්දවාසිනීද භෝගවාසිනීද පටවාසිනීද, ඔදපත්තකිනීද, ඔභටචුම්බටාද, දාසී භරියාද, කම්මකාරී භරියාද, ධජාහටාද, මුහුත්තිකාද යන භාර්යාවේවායි" කියායි. (ii) පිළිගණීද විමසාද පණිවුඩය ආපසු ගෙණේද සංඝාදිසේස ඇවැත්වේ.

දණ්ඩඨපිත වණ්ණනයයි.

---

164 මාතුරක්ඛිතා තොමෝ භික්ෂුව යවයි. "ස්වාමිනී, යව. අසවල් නැනැත්තිය කියව. අසවල් නැනැත්තහුට (මම) ධනක්කීතා භාර්‍යා වන්නෙමියි" කියයි. (මෙහි 158 (ii)

165 (මෙහි 159 ඡේදයේ 'ධනක්කීතා' වෙනුවට මේ වචන යොදන්න.) ඡන්දවාසිනී- භොගවාසිනී- පටවාසිනී- ඕදපත්තකිනී- ඕභතචුම්බටා- දාසී භරියා- කම්මකාරී භරියා- ධජාහටා- මුහුත්තිකා යනුයි.

### නික්ෂේප පදයෝයි.

---

166 මාතුරක්ඛිතා තොමෝ භික්ෂුව යවයි (ii) "ස්වාමිනී යව. අසවල් නැනැත්තහුට කියව. අසවල් නැනැත්තහුට (මම) ධනක්කීතාද ඡන්දවාසිනීද භාර්‍යා වන්නෙමියයි" කියයි. (මෙහි 158 (ii)

167 (මෙහි 166 ඡේදයේ "ඡන්දවාසිනීද" වෙනුවට මේ වචන යොදන්න) භෝගවාසිනීද- මුහුත්තිකාද-

### ඛණ්ඩ චක්‍රයයි.

---

168 (i) මාතුරක්ඛිතා තොමෝ භික්ෂුව යවයි. "ස්වාමිනී යව. අසවල් නැනැත්තහුට කියව. (ii) අසවල් නැනැත්තහුට (මම) ඡන්දවාසිනීද, භොගවාසිනීද, භාර්‍යා වන්නෙමියයි කියයි (මෙහි 158(ii) )

169 (මෙහි 168 ඡේදයේ "භොගවාසිනීද" වෙනුවට මේ වචන යොදන්න.) මුහුත්තිකාද-ධනක්කීතාද

### බද්ධ චක්කයයි.

---

### මූලසංඛිත්තය.

170 (මෙහි166 (i)7 අසවල් නැනැත්තහුට මුහුත්තිකාද ධනක්කීතාද, භාර්‍යා වෙමියි කියයි. (මෙහි 158 (ii) )

171 (මෙහි 170 ඡේදයේ "ධනක්කීතාද" වෙනුවට මේ වචන යොදන්න.) ඡන්දවාසින්ද, ධජාහටාද- 158 (ii)

172 (විමූලිකාදියද මෙසේම කළයුතුයි. මේ දසමූලිකයයි)

173 මාතුරක්ඛිතා තොමෝ භික්ෂුව යවයි. (මෙහි 166 ii)

මාතුරක්ඛිතා චක්කය නිමි.

---

174 පිතුරක්ඛිතා තොමෝ භික්ෂුව යවයි. මාතා-පිතුරක්ඛිතා තොමෝ-භාතුරක්ඛිතා තොමෝ-භගිනීරක්ඛිතා තොමෝ-ඤාතිරක්ඛිතා තොමෝ-ගොත්තරක්ඛිතා තොමෝ-ධම්මරක්ඛිතා තොමෝ-සාරක්ඛා තොමෝ-සපරිදණ්ඩා තොමෝ-භික්ෂුව-යවයි. "ස්වාමීනි, යව. අසවල් තැනැත්තහුට කියව. අසවල් තැනැත්තහුට ධනක්කීතා භාර්‍යාව වන්නෙමියි" කියයි. (මෙහි 158 (ii))

175 සපරිදණ්ඩා තොමෝ භික්ෂුව යවයි. "ස්වාමීනි, යව. අසවල් තැනැත්තහුට කියව. අසවල් තැනැත්තහුට ඡන්දවාසිනීද භෝගවාසිනීද පටවාසිනීද ඕදපත්තකිනීද ඕභතචුම්බටාද දාසී භරියාද කම්මකාරී භරියාද ධජාහටාද මුහුත්තිකාද යන භාර්‍යාවෙමියි" කියයි. (මෙහි 158 (ii)) (නික්ෂේප පදයෝයි)

176 සපරිදණ්ඩා තොමෝ භික්ෂුව යවයි. "ස්වාමීනි, යව. අසවල් තැනැත්තහුට කියව. අසවල් තැනැත්තහුට ධනක්කීතාද ඡන්දවාසිනීද භාර්‍යා වන්නෙමියි" කියයි (මෙහි 158 (ii))

177 (මෙහි 176 ජේදයේ "ඡන්දවාසිනීද" වෙනුවට "මුහුත්තිකාද" යොදන්න.)

ඛණ්ඩ චක්කයයි.

---

178 සපරිදණ්ඩා තොමෝ භික්ෂුව යවයි. "ස්වාමීනි, යව. අසවල් තැනැත්තහුට කියව. අසවල් තැනැත්තහුට ඡන්දවාසිනීද භෝගවාසිනීද භාර්‍යාවෙමියි" කියයි. (මෙහි 158 (ii))

179 (මෙහි 178 ජේදයේ "භෝගවාසිනීද" වෙනුවට "මුහුත්තිකාද," "ධනක්කීතාද" යොදන්න.)

මූලසඞ්ඛිත්තය.

---

180 සපරිදණ්ඩා තොමෝ භික්ෂුව යවයි "ස්වාමීනි, යව. අසවල් තැනැත්තහුට කියව. අසවල් තැනැත්තහුට මුහුත්තිකාද, ධනක්කීතාද භාර්‍යා වන්නෙමියි" කියයි. (මෙහි 158 (ii))

181 (මෙහි 180 ඡේදයේ "ධනක්කීතාද" වෙනුවට 'ඡන්දවාසිනීද' "ධජාහටාද" යොදනු.)

182 (විමූලිකාදියද, මෙසේම කළයුතුයි) මේ දසමූලිකයයි.

183 සපරිදණ්ඩාවෝ භික්ෂුව යවති. ස්වාමීනි යව, අසවල් තැනැත්තහුට කියව. අසවල් තැනැත්තහුට ධනක්කීතාද, ඡන්දවාසිනීද, භෝගවාසිනීද, පටවාසිනීද, ඕදපත්තකිණීද, ඔභතචුම්බටාද, දාසි භාර්යාද කම්මකාරී භාර්යාද ධජාහටාද, මුහුත්තිකාද යන භාර්‍ය්‍යා වෙමියි කියායි. (මෙහි 158 (ii) )

සපරිදණ්ඩා චක්‍රයයි.

සියලු චක්‍රපෙය්‍යාලය නිමි

---

184 පිළිගණීද, විමසාද, පණිවුඩය ආපසු ගෙණේද, සංඝාදිසේස ඇවැත්වේ. පිළිගණීද, විමසාද, පණිවුඩය ආපසු නොගෙණේද ථුල්ලසී ඇවැත් වේ. පිළිගණීද නොවිමසාද, පණිවුඩය ආපසු ගෙණේද, ථුල්ලසී ඇවැත්වේ. පිළිගණීද, නොවිමසාද පණිවුඩය ආපසු නොගෙණේද, දුකුලා ඇවැත්වේ. නොපිළිගණීද විමසාද, පණිවුඩය ආපසු ගෙණේද, ථුල්ලසී ඇවැත්වේ. නොපිළිගණීද, විමසාද, පණිවුඩය ආපසු නොගෙණේද, දුකුලා ඇවැත්වේ. නොපිළිගණීද, නොවිමසාද, පණිවුඩය ආපසු ගෙණේද, දුකුලා ඇවැත්වේ නොපිළිගණීද, නොවිමසාද, පණිවුඩය ආපසු නොගෙණේද, ඇවැත් නැත්තේය.

185 පුරුෂතෙමේ බොහෝවූ භික්ෂූන්ට අණවුම් කරයි. "ස්වාමීන් වහන්සේලා යව්. අසවල් ස්ත්‍රිය විමසව්යයි කියායි. සියල්ලෝම පිළිගණිත්ද, සියල්ලෝම විමසත්ද, සියල්ලෝම පණිවුඩය ආපසු ගෙණෙත්ද, සියල්ලන්ටම සංඝාදිසේස ඇවැත් වේ. පුරුෂයා බොහෝවූ භික්ෂූන්ට අණවුම් කරයි. ස්වාමීන් වහන්සේලා යව්. අසවල් ස්ත්‍රිය විමංසනය කරව් සියල්ලෝම පිළිගණිත්ද, සියල්ලෝ විමසත්ද, සියල්ලෝම පණිවුඩය ආපසු ගෙණෙත්ද, සියල්ලන්ටම සංඝාදිසේස ඇවැත්වේ පුරුෂ තෙමේ බොහෝ භික්ෂූන්ට නියම කරයි. "ස්වාමීන් වහන්සේලා

යනු මැනව. අසවල් ස්ත්‍රිය විමසවයි" කියායි සියල්ලෝම පිළිගණිත්. එතෙක් ලවා විමසවා සියල්ලෝම පණිවුඩය ගෙනෙත්. සියල්ලන්ටම සංඝාදිසේස ඇවැත් වේ

186 පුරුෂතෙම බොහෝවූ භික්ෂූන්ට නියම කරයි. "ස්වාමීන් වහන්සේලා යනු මැනව. අසවල් ස්ත්‍රිය විමසවයි" කියායි. සියල්ලෝම පිළිගණිත්ද එතෙක් පණිවුඩය ආපසු ගෙනෙත්ද, සියල්ලන්ටම සංඝාදිසේස ඇවැත් වේ. පුරුෂතෙම භික්ෂුවට නියම කරයි. (ii) "ස්වාමීනි, යව. අසවල් ස්ත්‍රිය විමසවයි" කියායි. පිළිගනීද විමසාද අතැවැස්සෙක් පණිවුඩය ආපසු ගෙනේද සංඝාදිසේස ඇවැත් වේ පුරුෂයා භික්ෂුවට නියම කරයි, "ස්වාමීනි, යව. අසවල් ස්ත්‍රිය විමසවයි" කියායි. පිළිගනීද, අතැවැස්සෙකු ලවා විමසවා තෙමේ පණිවුඩය ආපසු ගෙනේද සංඝාදිසේස ඇවැත් වේ. පුරුෂයා, භික්ෂුවට නියම කරයි, 'ස්වාමීනි, යව, අසවල් ස්ත්‍රිය විමසවයි" කියායි. පිළිගනීද අතැවැසි-යෙකු ලවා විමසාද අතැවැසියෙකු ලවා විමසවා පණිවුඩය ආපසු ගෙනේද දෙදෙනාටම ථුල්ලසි ඇවැත් වේ.

187 යන්නේ සම්පාදනය කරන්නේද එන්නේ බොරු කියන්නේද, කරන්නේද ථුල්ලසි ඇවැත්වේ. යන්නේ බොරු කියන්නේද, එන්නේ සම්පාදනය කෙරේද ථුල්ලසි ඇවැත්වේ. යන්නේ සම්පාදනය කෙරේද එන්නේ සම්පාදනය කෙරේද සංඝාදිසේස ඇවැත්වේ. යන්නේ බොරු කියන්නේද එන්නේ බොරු කියන්නේද ඇවැත් නොවේ. සංඝයාට හෝ චෛත්‍යයකට හෝ ගිලනෙකුට හෝ උපස්ථාන කිරීම ආදී පණිවුඩයකට යන්නේ ඇවැත් නොවේ. උමතුවූවහුට ආදිකර්මිකයාටද ඇවැත් නොවේ.

## කථා

1 (i) එසමයෙහි වනාහි එක්තරා පුරුෂයෙක් එක්තරා භික්ෂුවකට නියම කෙළේය. "ස්වාමීනි, යව. අසවල් ස්ත්‍රිය විමසවයි" කියායි. මෙතෙම ගොස් අසවල් ස්ත්‍රිය කොහිදැයි මිනිසුන් විචාළේය. (ii) 'ස්වාමීනි, නිදියයි කීය. (iii) ඔහුට සැකයක් උපණ. කිමෙක්ද මම සංඝාදිසේස ඇවැතට

පැමිණියෙම්දැයි සිතයි. මේ කාරණය භාග්‍යවතුන් වහන්සේට සැලකළහ. "මහණ, සංඝාදිසේස ඇවැත් නොවේ. දුකුළා ඇවැත්යයි" වදාළහ.

2 (මෙහි 1 (i) ස්වාමිනි මිලායයි කියා. (මෙහි 1 (iii) )

3 (මෙහි 1 (i) ස්වාමිනි, නික්මුණායයි කියා. (මෙහි 1(iii) )

4 (මෙහි 1 (i) ස්වාමිනි, ස්ත්‍රියක් නැතැයි කියා. (මෙහි 1 (iii) )

5 (මෙහි 1 (i) ස්වාමිනි; පණ්ඩක ස්ත්‍රියක් යයි කියා. (මෙහි 1 (iii) )

6 එක්සමයෙක්හි වනාහි එක්තරා ස්ත්‍රියක් ස්වාමියා සමග දබරකොට මවගේ ගෙට ගියාය. කුලූපග භික්ෂුවක් ඇ සමග සමගිකිරීම වශයෙන් පිළිසඳර කථා කෙළේය. ඔහුට සැකයක් උපණ. "මහණ, පුරුෂයා අත්හැර දැමීමට කථා කළෙහිද?" "ස්වාමිනි, නැත." "මහණ, එසේ නම් ඇවැත් නොවේ."

7 එක්සමයෙක්හි වනාහි එක්තරා භික්ෂුවක් පණ්ඩක-යෙකු සමග සැසිරීමට පැමිණියේය. ඔහුට සැකයක් උපණ. කිමෙක්ද මම සංඝාදිසේස ඇවැතට පැමිණියෙම්දැයි සිතයි. භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළහ. "මහණ, සංඝාදිසේස ඇවැත් නොවේ. ථුල්ලසි ඇවැත් යයි" වදාළහ.

(පස්වෙනි සංඝාදිසේසය නිමි.)

---

## 6 සංඝාදිසේසය

1 ඒ කාලයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම්වූ වේළුවනාරාමයෙහි වැඩ වෙසෙන සේක. එසමයෙහි වනාහි අලවිරට භික්ෂූහු තමන් ඉල්වාගන්නා ලද උපකරණ වලින් දායකයන් නැතිව තමන් උදෙසා ප්‍රමාණයක් නැති කුටි කරන්නාහුය. ඒ කුටි නිමාවට නොපැමිණෙන්නාය. ඒ භික්ෂූන් වහන්සේලා බොහෝ වශයෙන් ඉල්ලමින් බොහෝ වශයෙන් ඇඟවීමෙන්

මාංසය කෙරෙත්. (ii) පුරුෂයෙකු දෙම. අත් උදව් දෙමි, ගොනෙකු දෙමි, කරත්තයක් දෙමි, මැසක් දෙමි, පොරොවක් දෙමි, කෙටේරියක් දෙමි. උදැල්ලක් දෙමි, නියනක් දෙමි, මැල් දෙමි. උණදඬු දෙමි, මුදුතණ, බබුස්තණ ආදිය දෙමි, තණ මැටි දෙමයි (iii) ඉල්වීමෙන් මිනුෂ්‍යයෝ උපද්‍රව බවට පැමිණියාහු ඇඟවීමෙන් පෙළුණාහු භික්ෂූන් දැක තැතිගනිත්. බයින් ත්‍රස්ත වේ. පලායෙත්. අන් මඟකින් යත්, මුහුණ අත්, අනෙකටද හරවත්, දොරවල්ද වසත්, භික්ෂූන් යනු හැඟීම් ඇතිව දෙනුන් දැකද (iv) පලායත්.

2 එකල්හි ආයුෂ්මත්වූ මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ රජගහනුවර වස්වැසූ සේක් අලව් නුවර යම් ස්ථානයකද එතැනට වැඩිසේක. පිළිවෙළින් අලව් නුවර -ටම වැඩිසේක. එකල්හි ආයුෂ්මත්වූ මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ අලව් නුවර අග්ගාලව චෛත්‍ය නම් ආරාමයෙහි වැඩවාසය කරති, එකල්හි මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ පෙරවරු කාලයෙහි ඇඳ පොරවා පා සිවුරු ගෙණ අලව් නුවරට පිඬු පිණිස පිවිසියේක. ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් දැක භයවූවාහුද, තැති ගත්තාහුද, අන් ස්ථානයකට පලාගත්තාහුද අන් දිශාවකට මුහුණ හරවත්තාහුද, දොරවල් වසන්නාහුද, මිනුෂ්‍යයෝ දක්නා ලදහ.

3 එකල්හි ආයුෂ්මත්වූ මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ අලව් නුවර පිඬු පිණිස හැසිර පසුබත් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැලකුණේ භික්ෂූන් ඇමතූසේක "ආයුෂ්මත්වරුනි, මේ අලව් නුවර මීට පෙර සුලභවූ භික්ෂාව ඇත්තේ පිණ්ඩපාතයෙන් සුලභවූයේ පිඬු සිඟා යැපීමට හැකිවිය. දැන් වනාහි මේ අලව් නුවර භික්ෂාව දුර්ලභය. දුර්ලභවූයෙන් පිඬු ලැබිය යුතුය. පිඬු සිඟා යැපීම පහසු නොවන්නේය. ආයුෂ්මත්වරුනි, මේ අලව් නුවර වෙසෙන්නන් දුර්භික්ෂවීද පිඬු නොලැබීද පිඬු සිඟීමෙන් දිවි පැවැත්වීම නොකළ හැකිද හේතුව කවරේද, මීට ප්‍රත්‍යය කවරේද,

4 එකල්හි ඒ භික්ෂූන් වහන්සේලා ආයුෂ්මත්වූ මහා කාශ්‍යපස්ථවිරයන්ට මේ කාරණය සැලකළාහුය. එකල්හි

භාග්‍යවතුන්වහන්සේ රජගහනුවර කැමැතිතාක් වාසයකොට අලව් නුවර යම් තැනක ද එතැනට චාරිකා පිණිස නික්මියේක. පිළිවෙලින් චාරිකාවෙහි වැඩමවන්නේ අලව් නුවරට පැමිණිසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ අලව් නුවර අග්ගාලව චේතිය නම් විහාරයෙහි වැඩවසන සේක, එකල්හි ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනක ද එතැනට එළඹියේය. එළඹ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ ආයුෂ්මත්වූ මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැල කළසේක.

5 එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ ප්‍රකරණයෙහි භික්ෂු සංඝයා රැස්කරවා අලව් නුවර භික්ෂූන් ගෙන් “මහණෙනි, තෙපි ඉල්වා ගන්නාලද උපකරණවලින් දායක යන් නැතිව තමන් පිණිස අප්‍රමාණිකවූ කුටි කරන්නාහු සැබෑද? ඒ කුටිද නිශ්චාමව නොපැමිණෙන්නාහු (මෙහි 1 (ii) ඉල්ලීම් බහුලකොට ඇගවීම් බහුලව වාසය කරව්ද? (මෙහි 1 (iii) පලායන්නේය යනු සැබෑදැයි” විචාළ සේක. භාග්‍යවතුන් වහන්ස, සැබවයි” කීහ.

6 භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළ සේක. (මෙහි 1 සංඝාදිසේසයේ (6 ii)) “හිස් පුරුෂයෙනි, තෙපි කෙසේ නම් ඉල්වාගන්නා ලද උපකරණයන්ගෙන් දායකයින් නැතිව ප්‍රමාණයක් නැතිව තමන් පිණිස නොතිමෙන්නාවූ කුටිකාවක් කෙරෙද්ද? ඒ තෙපි ඉල්වීම් බහුලකොට කැගවීම් බහුල කොට (මෙහි 1 (ii) ඉල්වමින් වාසය කරන්නාහුද? හිස් පුරුෂයෙනි, මෙය (මෙහි 1 පාරාජිකායේ සුදින්න භාණවාරේ (30 v)) ගර්හාකොට දැහැමි කථාකොට භික්ෂූන් ඇමතූසේක.

7 “මහණෙනි, පෙරවූ දෙයක් කියමි. සහෝදර සෘෂිවරු දෙදෙනෙක් ගංගා නම් ගඟ ඇසුරුකොට වාසය කළාහුය. මහණෙනි, එකල්හි මණිකණ්ඨ නම් නාගරාජයා ගංගා නම් ගඟ එතර බාලසෘෂිවරයා යම් තැනක ද එතැනට එළඹියේය.

එළඹ, බාල සාමිවරයා දරණ පොට සතකින් වෙළා හිස මුදුනෙහි මහත්වූ පෙණයක් කොට සිටියේය. මහණෙනි, එකල්හි බාල සාමීතෙම නාගයාට බියෙන් කෘශවූයේ රූක්ෂවූයේ දුර්වර්ණවූයේ හට්ගත් පඬුවන් පැහැ ඇතිවූයේ ඉල්පීගිය නහරවැල් ඇත්තේද විය. මහණෙනි, කෘශවූද රළුවූද දුර්වර්ණවූද පඬුවන් පැහැ ඇත්තාවූද ඉල්පී ගිය නහර වැල් ඇත්තාවූද බාල සාමිවරයා වැඩිමහල් සාමිවරයා දුටුයේය.

8 "පින්වතාණෙනි, මෙහි මණිකණ්ඨ නාගරාජයා ගංගා නම් ගඟින් නැග මා යම් තැනකද එතැනට එළඹියේය එළඹ මා සත්වරක් දරණවැලින් වෙළා හිස මුදුනෙහි මහත්වූ පෙණයක් කොට සිටියි. "මම ඒ පින්විත් නාගයාට බියවූයේ කෘශවූයේ දුර්වර්ණවූයේ පඬුවන් පැහැ ඇත්තේ ඉල්පීගිය නහරවැල් ඇත්තෙම්මි" කීය. 'පින්වතානොපි ඒ නාගයාගේ නොඒම කැමති වන්නේද?'' "පින්වත, මම ඒ නාගයාගේ නොඒම කැමැති වෙමි." "පින්වත, තෝ නාගයාගේ කිසිවක් දක්නෙහිද?'' "පින්වත, මම ඒ නාගයාගේ බොටුවෙනි පැළඳි මැණිකක් දක්නෙමි" "පින්වත එසේ වීනම් තෝ මැණික ඉල්ලව, පින්වත මැණික මට දෙව. මැණිකෙන් මට ප්‍රයෝජන ඇත්තේය"යි කියාය.

9 "මහණෙනි, එකල්හි මණිකණ්ඨ නාගරාජයා ගංගා නම් ගඟින් නැග බාල සාමිවරයා යම් තැනකද එතැනට එළඹියේය. එළඹ, එකත්පසෙක සිටියේය. මහණෙනි, එකත්පසෙක හුන්නාවූ මණිකණ්ඨ නාගරාජයාට බාල සාමිවරයා මෙසේ කීය. (ii) "පින්වත, මට මැණික දෙව, මට මැණිකෙන් ප්‍රයෝජන ඇතැයි" කීය, (iii) මහණෙනි, එකල්හි මණිකණ්ඨ නාගරාජයා භික්ෂුවට මැණිකෙන් ප්‍රයෝජන ඇත (iv) කියා මැණික ඉල්වන්නේයයි වහාම ගියේය. මහණෙනි, දෙවෙනි වරටත් මණිකණ්ඨ නාගරාජයා ගංගා නම් ගඟින් එතරව බාල සාමිවරයා යම් තැනකද එතැනට එළඹියේය. මහණෙනි, බාල සාමිවරයා එන්නාවූ නාගරාජයා ඇතදීම දුටුයේය. දුටු මණිකණ්ඨ

නාගරජහට මෙසේ කීයේය, මෙහි (ii) (iii) එහිම නැවතු ණේය මහණෙනි තුන්වෙනි වරටත් මිණිකණ්ඨ නාගරජයා ගංගානම් ගඟින් එතෙර වෙයි. මහණෙනි බාල සෘෂිවරයා ගංගා නම් ගඟින් එතරවන්නාවූ මිණිකණ්ඨ නාගරජහු දුටුවේය දැක මණිකණ්ඨ නාගරජහට මෙසේ කීය. (මෙහි (ii) මහණෙනි එකල්හි මිණිකණ්ඨ නාගරජතෙම කණිෂ්ඨ සෘෂිවරයාට ගාථාවක් කීය. "මට මේ මැණික නිසා ප්‍රණීතවූද බොහෝවූද කෑම්බීම උපදී. තොපි බොහෝ කොට ඉල්වන්නේ නමුදු එය නොදෙන්නෙමි. තොපගේ ආශ්‍රමයටද මම නොයන්නෙමි, කඩුවක් ගත් තරුණ පුරුෂ යෙකුට බියවන්නේ යමසේද මැණික ඉල්වීම නිසා මමද බියපත් වෙමි. බොහෝ කොට ඉල්වන්නේ නමුදු මැණික තොපට නොදෙමි. තොපගේ ආශ්‍රමයටද මම නොයෙමියි" කීය.

10 "මහණෙනි, එකල්හි මිණිකණ්ඨ නාගරාජයා භික්ෂු වට මැණිකෙන් ප්‍රයෝජන ඇතැයි භික්ෂුව මැණික ඉල්ලයි" කියා ගියේය. එකල්හි ගියේමිය. නැවත නාවේය මහණෙනි, එකල්හි බාල සෘෂිවරයා ඒ නාගයාගේ නොදැකී මෙන් (ii) බොහෝකොට කෘශවූයේය. රූක්ෂවූයේය. රූක්ෂ වූයේ දුර්වර්ණවූයේ පඬුවන් පැහැ ඇත්තේ ඉල්පිහිය නහර වැල් ඇත්තේද විය (iii) මහණෙනි, බොහෝකොට (ii) කෘශ වූද කළුවූද දුර්වර්ණවූද පඬුවන් පැහැ ඇතිවූ ඉල්පිහිය නහර වැල් ඇත්තාවූද (4) කණිෂ්ඨ සෘෂිවරයා වැඩිමහලු සෘෂි තෙම දැක්කේය දැක බාල සෘෂිවරයාට මෙසේ කීය "තෝ කුමක් නිසා බොහෝ කෙසිහි (මෙහි (ii) ) දැයි" ඇසීය '.පින්වත, මම දර්ශණීයවූ ඒ නාගයාගේ නොදැකීමෙන් බොහෝකොට (මෙහි (ii) ) වීමියි කීයේය. මහණෙනි, එකල්හි වැඩිමහල් සෘෂිතෙම බාල සෘෂිවරයාට ගාථාවක් කීය.

"යමෙකුට ප්‍රිය බව දන්නේ නම් ඒ දෙය නොඉල් ලිය යුතුය. බොහෝකොට ඉල්ලීමෙන් දෙස් ඇතිවෙයි බ්‍රාහ්මණයා විසින් නාග මැණික ඉල්ලන ලද්දේ ඒ නාගයා දැකීමට නොහැකිවීය."

"මහණෙනි, තිරිසන්ගත සත්වයන්ට පවා ඉල්ලීම අමනාප පිණිස වන්නේය. ඇඟවීමද අමනාප පිණිස වන්නේ. මනුෂ්‍ය වූවන්ට අමනාප වන්නේය යනු කුමට කියවිද?"

11 "මහණෙනි, පෙරවූ දෙයක් කියමි. එක්තරා භික්ෂුවක් හිමවත පාර්ශවයෙහි එක්තරා වනලැහැබක වාසය කරයි. මහණෙනි, ඒ වනලැහැබට නුදුරුව පහත් ප්‍රදේශයක කුඩා විලක් විය. මහණෙනි, එකල්හි බොහෝවූ කුරුළු සමූහයා ඒ කුඩා විලෙහි දහවල් ගොදුරු ගෙණ සවස් කාලයට ඒ වන ලැහැබෙහි විසීමට එයි. මහණෙනි, එකල්හි ඒ භික්ෂුව ඒ කුරුළු සමූහයාගේ ශබ්දයෙන් කරදරයට පැමිණ 'මා යම් තැනකද එතැනට එළඹියේය. එළඹ මා මනාකොට වැඳ එකත්පසක හුන්නේය.

12 එකත්පසක හුන්නාවූ ඒ භික්ෂුවට මහණෙනි, මම මෙසේ කීවෙමි. "මහණ, කිම, යැපෙන්නේද ඉරියව් හොඳින් පවත්නේද සවල්පවූ ක්ලාන්ත ඇත්තේද, දුර සිට ආමේ ක්ලාන්ත බවක් නොවීද?" "භාග්‍යවතුන් වහන්ස ඉවසිය හැකියි. භාග්‍යවතුන් වහන්ස, සුවසේ යැපෙමි "ස්වාමීන් වහන්ස, දුරසිට ආයේ සවල්ප වෙහෙසද වෙමි. ස්වාමීන් වහන්ස, හිමවත පාර්ශවයෙහි මහා වනලැහැබක් ඇත. ස්වාමීන් වහන්ස, ඒ වනලැහැබට නුදුරුව පහත් ප්‍රදේශයක කුඩා විලක් වෙයි. ස්වාමීනි, බොහෝවූ කුරුළු සමූහයා ඒ විලෙහි දහවල් ගොදුරු ගෙණ සවස් කාලයෙහි ඒ වන ලැහැබට විසීමට පැමිණෙයි "භාග්‍යවතුන් වහන්ස, ඒ කුරුළු සමූහයාගේ ශබ්දයෙන් කරදරවී මම මෙහි ආමෙමියි" කීය "මහණ, තෝ ඒ කුරුළු සමූහයාගේ නොඊම කැමතිවන්නෙහි දැයි' ඇසීය. "භාග්‍යවතුන් වහන්ස, මම ඒ කුරුළු සමූහයාගේ නොඊම කැමතිවෙමියි' කීය.

13 "මහණ එසේවී නම් තෝ එහි ගොස් ඒ වන ලැහැබට වැද රාත්‍රිය පිළිබඳ ප්‍රථම යාමයෙහි (ii) තුන් වරක් ශබ්ද පතුරුවමින් 'භවත් කුරුල්ලෙනි මාගේ වචනය අසත්වා! මේ වනයෙහි වාසයට පැමිණියාවූ යම් පමණ කුරුල්ලෝ වෙත්ද එක එකා එක එක පියාපතක් මට දෙත්වා මට පියාපතින් ප්‍රයෝජන ඇතැයි' කියායි (iii) රාත්‍රියේ මධ්‍යම යාමයෙහිද (මෙසේ (ii) රාත්‍රියේ පශ්චිම යාමයෙහිද (මෙසේ (ii)

14 "මහණෙනි, එකල්හි ඒ භික්ෂුව එහි ගොස් ඒ වන ලැහැබට වැද (iv) 'පින්වත් කුරුල්ලෙනි මාගේ වචනය අසව්. මේ වනලැහැබෙහි වාසයට පැමිණියාවූ යම් පමණ කුරුල්ලෝ වෙත්ද ඔවුහු එක එකා එක එක පියාපත බිම දෙත්වායි' තුන්විටක් ශබ්ද කළාහුය. (v) රාත්‍රිය පිළිබඳ මධ්‍යම යාමයෙහිද (මෙහි (iv) රාත්‍රිය පිළිබඳ පශ්චිම යාමයෙහිද (මෙහි (iv)

15 "මහණෙනි, එකල්හි කුරුළු සමූහයා භික්ෂුවට පියාපත් වලින් ප්‍රයෝජන ඇතැයි භික්ෂුව පියාපත් ඉල්වන්නේයයි" කියා ඒ වනලැහැබින් නික්මෝය. නොඑන පරිද්දෙන්ම නික්ම ගියාහුය නැවත නාවාහුය මහණෙනි, ඒ තිරශ්චීන සත්වයින්ට පවා ඉල්ලීම අමනාපවිය වූවමනායයි ඇඟවීම අමනාප විය. මනුෂ්‍යවූවන්ට කියනුම කිම?"

16 "මහණෙනි, පෙරවූ දෙයක් කියමි රට්ඨපාල කුලපුත්‍රයාගේ පියා රට්ඨපාල කුලපුත්‍රයාට මේ ගාථාවෙන් කීය.

> "රට්ඨපාල කුලපුත්‍රය, බොහෝවූ ජනයෝ මා කරා එළඹ නොයෙක් දෑ ඉල්මත්. ඔවුන් කවුරුද කියා නොදනිමි. කුමක් හෙයින් නොම මගෙන් නොඉල්වන්නහුද? ඉල්වන තැනැත්තා අප්‍රිය වෙයි. ඉල්වන්නහුට නොදෙන්නාද අප්‍රිය වෙයි. ඒ නිසා මම නොඉල්ලමි. ඒ නිසා මා අප්‍රිය නොවේවා."

"මහණෙනි, ඒ රට්ඨපාල කුලපුත්‍රතෙම ස්වකීය පියාට මෙසේ කීයයි "ජනතෙම ජනයාට කෙසේ නොකියන්නේද?" "මහණෙනි, ගිහියන් විසින් භෝගයෝ දුකසේ ලැබිය යුතුය. ලැබුවාවූ දෙයද දුකසේ රැකිය යුතුය."

17 "කිම් පුරුෂයෙනි, මෙතැන්හි වනාහි නොම භෝගයන් දුකසේ ලබන්නහුද, දුකසේ රැකිය යුතු භෝගයන්හි යාචන බහුල භාවයෙන් හා ඇඟවීම් බහුල භාවයෙන් යුක්තව වාසය කරව්ද? පුරුෂයෙකු දෙව, කාන්තාවක් දෙව, ගොනෙකු දෙව්, කරත්තයක් දෙව්, වැයක් දෙව්, පොරවක් දෙව් කෙටේරියක් දෙව, උදැල්ලක් දෙව කියතක් දෙව, වැල් දෙව, හුණගස් දෙව, මුදප්පබ්බජාදි තෘණ දෙව, මැටි

දෙමසි සිඟන්නාහුද, හිස් පුරුෂයෙනි, මෙ මෙසෙයි (මෙහි 1 පාරාජිකයේ සුදින්නගේ බණවරේ 30 (v) සොයන්න) මහණෙනි, මෙසේද මේ ශික්ෂාපදය උදෙසව්

18 'අස්වාමිකව තමා පිණිස ඉල්වාගන්නා ලද උපකරණයන්ගෙන් කුටියක් කරන්නාවූ භික්ෂුව විසින් ප්‍රමාණිකව කළයුතුයි. එහි මේ ප්‍රමාණයයි. දිගින් සුගත් වියතින් දොළොස් වියතක් වියයුතුයි පළලින් ඇතුළත සත් වියතක් වියයුතුයි. වස්තු දේශනාවටද භික්ෂූන් කැඳවිය යුතුයි ඒ භික්ෂූන් විසින් උපද්‍රව නැති අවට ඉඩකඩ සලකා වස්තුදේශනාය කළයුතුයි. ඉදින් භික්ෂුව උපද්‍රව සහිත වස්තුවෙහි ඉඩකඩ නැතිකොට තමන් උදෙසා කුටියක් කරන්නේ නම් වස්තුදේශනාව භික්ෂූන් හෝ නොකැඳවන්නේ නම් ප්‍රමාණය හෝ ඉක්මවන්නේ නම් සංඝාදිසේස ඇවැත්වේ

19 'තමන් යාච්ඤා කළ' යනු තමා විසින් ඉල්වාගන්නා ලද්දේයි. පුරුෂයෙක්ද, අත් උදව්වද, ගොනෙක්ද, කරත්තයක්ද, වෑයක්ද, පොරොවක්ද, කොඩිරියක්ද, උදැල්ලක්ද, නියනක්ද, වැලක්ද හුණගසක්ද, මුදුතණද, බබුස්තණද, තණද, මැටිද වේ.

"කුටිනම්" පිටපැත්තේ සුදුහුණු ගා ඇතුල්පැත්තේ සුදුහුණු හෝ ඇතුළත පිටත සුදුහුණු ගා කරන කුටියි. "කරවන" තහු විසින් යනු කරන්නේ හෝ කරවන්නේ හෝ යනුයි. "ස්වාමික" යනු ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ගිහියෙක් හෝ පැවිද්දෙක් හෝ යන ගම්හිමි ස්වාමියෙක් විය යුතුයි. "තමා උදෙසා" යනු තමා පිණිස යනුයි. ප්‍රමාණවත්ව කළ යුතුයි මේ එහි ප්‍රමාණයයි දිගින් බුදුන්ගේ වියතින් දොළොස් වියතකි යනු පිටස්තර ප්‍රමාණයයි සරසින් සත් අතරක් යනු ඇතුළත ප්‍රමාණයයි

20 "ඒ කුටිකාරකතෙමේ ඉඩම් සෑම කිරීමට භික්ෂූන් කැඳවිය යුතුය" යනු භික්ෂුව විසින් කුටි භූමිය ශුද්ධකොට සංඝයා කරා එළඹ සිවුර ඒකාංශකොට මැඩිමහලු භික්ෂූන්ගේ පාමුල උක්කුටිකව හිඳ ඇඳිලි බැඳගෙණ මෙසේ කියයුතුයි. 'ස්වාමීනි වහන්ස, මම ස්වාමියෙකු නැතිව තමන් පිණිස ඉල්වාගන්නාලද උපකරණවලින් කුටියක් කරනු කැමැත්තේ

ස්වාමීනි, ඒ මම සංඝයාගේ කුටිවත්ථු බැලීමට යාඥාකරමි. දෙවනුවත් යාඥා කළයුතුයි. තුන්වෙනුවත් යාඥා කළයුතුයි. ඉදින් සියලු සංඝයා කුටිවත්ථු බැලීමට උත්සාහවත් වන්නේද සියලු සංඝයා ලවා බැලවියයුතුයි. සියලු සංඝයා කුටිවත්ථු බැලීමට උත්සාහවත් නොවන්නේ නම් එසේවූ ඉඩකඩ දැනීමට ව්‍යක්තවූද ප්‍රබලවූද යම් භික්ෂූහු වෙත්ද, උන්වහන්සේලාට යාඥාකොට සම්මතකරවාගත යුතුයි මෙසේද සම්මතකරවාගතයුතුයි. ව්‍යක්තවූද ප්‍රබලවූද භික්ෂූන්ට සංඝතෙම දැන්වියයුතුයි. 'ස්වාමීන් වහන්ස, සංඝතෙම මාගේ වචනය අසාවා! මේ අසවල් භික්ෂුව අස්වාමිකවූ තමා නිසා කුටියක් ඉල්වාගන්නාලද උපකරණයන්ගෙන් කරනු කැමැත්තේයි. හෙතෙම සංඝයාගෙන් කුටි ඉඩම් බැලීම් යාඥාකරයි'

21 ඉදින් සංඝයාට කල් ඇත්තේ නම්, සංඝතෙම මෙනම් මෙනම් භික්ෂූන් වහන්සේලා කුටිවත්ථු බැලීමට සම්මත කරන්නේය. මේ ඥප්තිමයි. 'ස්වාමීනි, සංඝතෙම මාගේ වචනය අසාවා! මේ අසවල් භික්ෂුව අස්වාමිකවූද තමා පිණිසවූද කුටියක් ඉල්වා ගන්නාලද උපකරණයන්ගෙන් කරනු කැමැත්තේවයි. හෙතෙම සංඝයාගේ කුටිවත්ථු බැලීම් යාඥාකරයි. සංඝතෙම අසවල් භික්ෂුව කුටිවත්ථුව බැලීමට අසවල් අසවල් භික්ෂූන් සම්මතකරයි. යම්බඳුවූ ආයුෂ්මතුන් වහන්සේලා අසවල් අසවල් භික්ෂූන් මේ භික්ෂුවගේ කුටිවත්ථු බැලීමට සම්මත කිරීම කැමති වන්නේද හෙතෙම නිශ්ශබ්ද වියයුතුය. යමෙක් නොකැමැති වන්නේ නම් හෙතෙම කියන්නේය. ඒ මහාණි සංඝ සම්මුතිය වේ. අසවල් භික්ෂූන් අසවල් භික්ෂුවගේ කුටිවත්ථු බැලීමට සම්මත කරණලදී. සංඝයා කැමැත්තේවී එසේහෙයින් තුෂ්ණීභාවය විය. මෙය මෙසේ දරමියි, කියායි. ඔවුන් විසින් සම්මතවූ භික්ෂූන් විසින් එහි ගොස් කුටිවත්ථුව බැලිය යුතුයි. උපද්‍රව ඇති බව හා උපද්‍රව නැති බවද උපචාර සහිත බව හා අනුපචාර බවද දැනගතයුතුයි

22 ඉදින් උපද්‍රව සහිත වන්නේ නම් අනුපචාරද වන්නේ නම් 'මෙහි නොකළයුතුයයි' කියයුතුයි. ඉදින්

උපද්‍රව නොවන්නේ නම් උපචාරද වේ නම් අනාරම්භයයිද සපරික්කමණයයිද සංඝයාට කියයුතුයි. ඒ කුටිකාර භික්ෂු- විසින් සංඝයා කරා එළඹ තනිපට සිවුර ඒකාංශ කොට වැඩිමහලු භික්ෂූන්ගේ පාවැඳ උක්කුටිකව හිඳ ඇඳිලි බැඳගෙන මෙසේ කියයුතුයි. 'ස්වාමිනි, මම ඉල්ලා ගන්නාලද උපකරණවලින් අස්වාමිකවූද අත්තුද්දේසකවූද කුටියක් කරනු කැමැත්තෙමි. ස්වාමිනි, ඒ මම කුටිවත්‍ථු දේසනාවට සංඝයා යාඥා කරමි. දෙවනුවත් යාඥා කළයුතුයි. තුන්වෙනුවත් යාඥා කළයුතුයි.' ව්‍යක්තවූද ප්‍රබලවූද භික්ෂූන් විසින් සංඝයාට දැන්විය යුතුයි. (ii) 'ස්වාමීන් වහන්ස, සංඝයා මාගේ වචනය අසනසේක්වා! අසවල් භික්ෂුව අස්වාමිකවූද අත්තුද්දෙසකවූද කුටියක් ඉල්ලා ගන්නාලද උපකරණයන්ගෙන් කරනු කැමැතිවෙයි හෙතෙම කුටිවත්‍ථු දේසනාවට සංඝයා යාඥා කරයි. (iii) ඉදින් සංඝයා මේ නම් භික්ෂුවගේ කුටිවත්‍ථු දේසනාව කරන්නේ නම් මේ ඊට පැමිණි කාලයයි. මේ දැන්වීම වන්නේය. (මෙයි (ii)) සංඝතෙම අසවල් භික්ෂුවගේ කුටිවත්‍ථු දේසනාව කෙරේද සම්බන්ධවූ ආයුෂ්මතුන් වහන්සේලා අසවල් භික්ෂුවගේ කුටිවත්‍ථු දේසනාව කැමැති වන්නේ නම් තුෂ්ණීම්භාවයෙන් සිටියයුතුය. යමෙක් නො කැමැති වන්නේ නම් හෙතෙම කියයුතුයි. අසවල් භික්ෂුවගේ කුටිවත්‍ථු දේසනාව සංඝයාගේ කැමැත්තෙන් කරන ලද්දේය. එහෙයින් එය දරමිනි. තුෂ්ණීම්භූත වියයුතුයි.'

23 "උම්දුරු" නම් කුඩා කුහුඹු මකියන්ගේ ආශ්‍රය ස්ථානයක් වෙයි. වේයන් ලගින තැනක් වෙයි. මීයන්ගේ හෝ ලගින තැනක් වේ. සර්පයින්ගේ හෝ වාසස්ථානයක් හෝ වෙයි ගෝනුස්සන්ගේ හෝ ලගින තැනක් වෙයි. පත්තෑයන්ගේ හෝ ලගින තැනක් වෙයි. හස්තීන්ගේ හෝ ලගින තැනක් වෙයි. අශ්වයන් සිංහයින්ගේ හෝ වාසස්ථානයක් වෙයි. ව්‍යාඝ්‍රයින්ගේ හෝ වාසස්ථානයක් වෙයි. දිවියන්ගේ හෝ වාසස්ථානයක් වෙයි. වලසුන්ගේ හෝ වාසස්ථානයක් වෙයි. කළු හිස් මීලුහුන්ගේ හෝ වාසස්ථානයක් වෙයි යම් කවර හෝ තිරිසන්ගත සතුන්ගේ ආහාර ප්‍රදේශ හෝ වාසස්ථානයක් වෙයි. වී ආදී හෝ මුං ආදී ධාන්‍ය

චෙයි පිපුරණ තැනකට සම්පව හෝ පොරුණ්ට දඹුමම කරණ තැනක් හෝ දිවස් හුල තබන තැනක් හෝ වෙයි. සොහොනක් හෝ වෙයි. සොහොන ආශ්‍රිතවූවක් හෝ වෙයි උයන් නිශ්‍රිතවූවක් හෝ වෙයි. රාජවස්තු නිශ්‍රිතවූවක් හෝ වෙයි. හස්ති ශාලා නිශ්‍රිතවූවක් හෝ වෙයි. අශ්වල නිශ්‍රිතවූවක් හෝ වෙයි. බන්ධනාගාර නිශ්‍රිතවූවක් හෝ වෙයි. සුරාශාලා නිශ්‍රිතවූවක් හෝ වෙයි. සිස්ගයා දමන කොටස නිශ්‍රිත තැනක් හෝ වෙයි. වීථි නිශ්‍රිත තැනක් හෝ වෙයි. සතරමංසන්ධි නිශ්‍රිත තැනක් හෝ වෙයි. සභා නිශ්‍රිත තැනක් හෝ වෙයි. හැසිරීම් නිශ්‍රිත තැනක් හෝ වෙයි. මේ උපද්‍රව සහිත නම් වේ. ඉඩකඩ නැති යනු ගොනුන් දෙදෙනකු බැඳලද කරත්තයක් අනුව යාමට නොහැක්කේද, හිණිමගක සිටගෙන ගෙයක් සෙවිලි කිරීමට නොහැකිද, මේ අපරික්කමණ නම් වේ.

24 "අනාරම්භ" නම්:- කුඹි මැසි වශීසන්ගේ ලගින තැනක් හෝ නොවේද නාම් ඊම් කරන විශීයක් ඇසුරු කොට හෝ නොවේද, මේ අනාරම්භ නම් වේ. සපරික්කමන නම් ගොනුන් යෙදූ රථයක් අනුව යාමට හැක්කේවේද හාත්පස හිණිමගක සිට සෙවිලි කිරීමට හැක්කේද මේය සපරික්කමන නම් වේ.

25 "තමන් සෑදූ කොල්" නම් තෙමේ සාදකොට (මෙහි 29 ඡේදය) වෙයි. "කුටි" නම් ඇතුල ආලෙප කළ හෝ පිටත ආලෙපකළ හෝ වේද ඇතුලත පිටත ආලෙපකළ හෝ වේද එයයි. "කරෙය්‍ය" යනු කරයි. හෝ කරවයි යනු හෝ වෙයි.

26 "වස්තු දෙසීමට භික්ෂූන් හෝ නොකැඳවයි. ප්‍රමාණය හෝ ඉක්මවයි. යනු සදැස්සී දූතිය සාමීනයක් කුටිමැද්දුව නොදෙසා දිගින් හෝ පළලින් යටත් පිරිසෙයින් කෙසගක් පමණකුදු ඉක්මවා, කරයි. හෝ කරවයිද, ඒ සෑම ප්‍රයෝගයකදීම දුකුලා ඇවැත්වේ

27 එක පිඩක් නොඑලවූ කල්හි ථුල්ලස් ඇවැත්වේ. ඒ පිඩ මැලුවූකල්හි සංඝාදිසේස ඇවැත්වේ. සංඝාදිසේස යනු (මෙහි 1 සංඝාදිසේසය ( 9 – ii ) බලනු.) භික්ෂුව දෙශනා

නොකල කුටි වස්තු ඇති උපද්‍රව සහිතවූද අනුපචාරවූද කුටියක් කෙරේ නම් සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත් දෙකකට පැමිණේ.

28 "භික්ෂුව නොදෙසූ වත්ථුවෙහි උපද්‍රව සහිතවූ උපචාර සහිතවූ කුටියක් කෙරේ නම් සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත්වේ භික්ෂුව නොදෙසූ වත්ථුවෙහි උපද්‍රව නැත්තාවූ අනුපචාරවූ කුටියක් කෙරේ නම් සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත්වේ. භික්ෂුව නොදෙසූ වත්ථුවෙහි අනුපචාරවූ උපද්‍රව නැත්තාවූ කුටියක් කෙරේ නම් සංඝාදිසේස ඇවැත්වේ.

29 භික්ෂුව දේශිත වත්ථුවෙහි උපද්‍රව සහිතවූ අනුපචාරවූ කුටියක් කෙරේ නම් දුකුලා ඇවැත් දෙකකට පැමිණේ. භික්ෂුව දේශිත වත්ථුවෙහි උපද්‍රව සහිතවූ උපචාර සහිතවූ කුටියක් කෙරේ නම්, දුකුලා ඇවැත්වේ. භික්ෂුව දේශිත වත්ථුවෙහි උපද්‍රව නැත්තාවූ අනුපචාරවූ කුටියක් කෙරේ නම් දුකුලා ඇවැත්වේ. භික්ෂුව දේශිත වත්ථුවෙහි උපද්‍රව නැත්තාවූ උපචාර සහිතවූ කුටියක් කෙරේ නම් ඇවැත් නොවේ.

30 භික්ෂුව ප්‍රමාණය ඉක්මවූවාවූ උපද්‍රව සහිතවූ අනුපචාර සහිතවූ කුටියක්කෙරේද සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත් දෙකකට පැමිණේ. භික්ෂුව ප්‍රමාණය ඉක්මවූවාවූ උපද්‍රව සහිතවූ උපචාර සහිතවූ කුටියක් කෙරේද, සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත්වේ. භික්ෂුව ප්‍රමාණාතික්‍රාන්තවූ උපද්‍රව නැත්තාවූ අනුපචාරවූ කුටියක් කෙරේ නම් සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත්වේ. භික්ෂුව ප්‍රමාණය ඉක්මවූවාවූ උපද්‍රව නැත්තාවූ උපචාර සහිතවූ කුටියක් කෙරේ නම් සංඝාදිසේස ඇවැත්වේ. භික්ෂුව ප්‍රමාණයෙන් යුක්තවූ උපද්‍රව සහිතවූ අනුපචාරවූ කුටියක් කෙරේ දුකුලා ඇවැත් දෙකකට පැමිණේ භික්ෂුව ප්‍රමාණයෙන් යුක්තවූ උපද්‍රව සහිතවූ උපචාර සහිතවූ කුටියක් කෙරේ නම් දුකුලා ඇවැත්වේ. භික්ෂුව ප්‍රමාණයෙන් යුක්තවූ උපද්‍රව නැත්තාවූ අනුපචාරවූ කුටියක් කෙරේ නම් දුකුලා ඇවැත්වේ භික්ෂුව ප්‍රමාණයෙන් යුක්තවූ උපද්‍රව නැත්තාවූ උපචාර සහිතවූ කුටියක් කෙරේ නම් ඇවැත් නොවේ.

31 'භික්ෂුව නොදෙසූ වස්තුවෙහි ප්‍රමාණය ඉක්මවාවූ උපද්‍රව සහිතවූ අනුපවාරවූ කුටියක් කෙරේ නම් සංඝාදිසේස දෙකකින් දුකුලා දෙකකට පැමිණේ. භික්ෂුව නොදෙසූ වස්තුවෙහි ප්‍රමාණාතික්‍රාන්තවූ උපද්‍රව සහිතවූ උපවාර සහිතවූ කුටියක් කෙරේ නම් සංඝාදිසේස දෙකකින් දුකුලා වේ. භික්ෂුව නොදෙසූ වස්තුවෙහි ප්‍රමාණාතික්‍රාන්තවූ උපද්‍රව නැත්තාවූ අනුපවාරවූ කුටියක් කෙරේ නම් සංඝාදිසේසයෙන් දුකුලා දෙකකට පැමිණේ. භික්ෂුව නොදෙසූ වස්තුවෙහි ප්‍රමාණාතික්‍රාන්තවූ උපද්‍රව නැත්තාවූ උපවාර සහිතවූ කුටියක් කෙරේ නම් සංඝාදිසේස දෙකකට පැමිණේ.

32 "භික්ෂුව දේශිත වස්තුකවූද ප්‍රමාණිකවූ උපද්‍රව සහිතවූ අනුපවාරවූ කුටියක් කෙරේනම්, දුකුලා ඇවැත් දෙකකට පැමිණේ. භික්ෂුව දේශිත වස්තුකවූ ප්‍රමාණිකවූ උපද්‍රව සහිතවූ උපවාර සහිතවූ කුටියක් කෙරේද දුකුලා ඇවැත් වේ. භික්ෂුව දේශිත වස්තුකවූ පමාණිකවූ උපද්‍රව නැත්තාවූ අනුපවාරවූ කුටියක් කෙරේ නම් දුකුලා ඇවැත්වේ. භික්ෂුව දේශිත වස්තුකවූ ප්‍රමාණිකවූ උපද්‍රව නැත්තාවූ උපවාර සහිතවූ කුටියක් කෙරේ ඇවැත් නොවේ.

33 (i) "භික්ෂුව මම කුටියක් කරමි. සමාදන් කරන්නේ ඔහුට නොදෙසූ වස්තුවෙහි (ii) උපද්‍රව සහිතවූ අනුපවාරවූ කුටියක් කරන්නේ නම් සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත් දෙකකට පැමිණේ. (මෙහි (i) ) උපද්‍රව සහිතවූ උපවාර සහිතවූ කුටියක් කෙරේ නම් සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත්වේ. උපද්‍රව නැත්තාවූ අනුපවාරවූ කුටියක් කෙරේ නම් සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත්වේ. උපද්‍රව නැත්තාවූ උපවාර සහිතවූ කුටියක් කෙරේ නම් සංඝාදිසේස ඇවැත්වේ.

34 (i) "භික්ෂුව මම කුටියක් කරවමි සමාදන් කරවාද ඔහුට දේශිත වස්තුකවූ (ii) උපද්‍රව සහිතවූ අනුපවාරවූ කුටියක් කෙරෙද්ද දුකුලා ඇවැත් දෙකකට පැමිණේ (මෙහි මේ ඡේදයේ (i) ) උපද්‍රව සහිතවූ උපවාර සහිතවූ කුටියක් කෙරේනම් දුකුලා ඇවැත්වේ. උපද්‍රව නැත්තාවූ අනුපවාරවූ කුටියක් කෙරේ නම් දුකුලා ඇවැත්වේ. උපද්‍රව නැත්තාවූ උපවාර සහිතවූ කුටියක් කෙරේ නම් ඇවැත් නොවේ.

35 (i) "භික්ෂුව මට කුටියක් කරවයි. අනුශාසනාකොට යයි. 'ඒ කුටිය ප්‍රමාණයෙන් යුක්ත උපද්‍රව සහිත උපචාර සහිත වියයුතුයයි" කියයි (ii) ඔහුට ප්‍රමාණාතික්‍රාන්තවූ උපද්‍රව සහිත අනුපචාරවූ කුටියක් කරන්නේ නම් ඒ කරන්නවුන්ට ත්‍රිවිධ දුක්කටාපත්තිවේ. (මෙහි (i)) උපද්‍රව සහිතවූ උපචාර සහිතවූ කුටිකරන්නවුන්ට දුකුළා ඇවැත් දෙකක්වේ. (මෙහි (i)) උපද්‍රව රහිතවූ අනුපචාරවූ කුටි කරන්නවුන්ට දුකුළා ඇවැත් දෙකක් වේ. උපද්‍රව රහිතවූ උපචාර සහිතවූ කුටි කරන්නවුන්ට දුකුළා ඇවැත්වේ භික්ෂුව මට කුටියක් කරවයයි සතුටුකොට යයි. ප්‍රමාණිතවූ උපද්‍රව රහිතවූ උපචාර සහිතවූ වේවායි කියයි. ඔහුට ප්‍රමාණිතවූ උපද්‍රව සහිතවූ උපචාර රහිතවූ කුටියක් කරත්. කරන්නවුන්ට දුකුළා ඇවැත් දෙකක් වේ (මෙහි (i)) උපද්‍රව සහිතවූ උපචාර සහිතවූ කුටිකරන්නවුන්ට දුකුළා ඇවැත්වේ. උපද්‍රව සහිතවූ අනුපචාරවූ කුටිකරන්නවුන්ට දුකුළා ඇවැත් වේ (මෙහි (i)) උපද්‍රව රහිතවූ උපචාර සහිතවූ කුටිකරන්නවුන්ට ඇවැත් නොවේ. භික්ෂුව මට කුටියක් කරවයි, අනුශාසනාකොට යයි අනුශාසනා ලැබුවේ, දේශිත වස්තුකවූ ප්‍රමාණිතවූ උපද්‍රව රහිතවූ උපචාර සහිතවූ වේවයි කියයි. ඔහුට අදේශිත වස්තුකවූ ප්‍රමාණාතික්‍රාන්තවූ උපද්‍රව සහිතවූ කුටියක් කරත්. කරන්නවුන්ට දුකුළා සහිතවූද උපචාර ඇවැත් සතරක්වේ. (මෙහි) උපද්‍රව සහිතවූ කුටි කරන්නවුන්ට දුකුළා ඇවැත් තුනක් වේ (මෙහි (i)) උපද්‍රව සහිතවූ අනුපචාරවූ කුටිකරන්නවුන්ට දුකුළා ඇවැත් තුනක් වේ. උපද්‍රව සහිතව උපචාර සහිතව කුටි කරන්නවුන්ට දුකුළා ඇවැත් දෙකක් වේ.

36 (i) "භික්ෂුව මට කුටියක් කරවයි. අනුශාසනාකොට යයි අනුශාසනා කරන ලද්දේද දේශිත වස්තුකවූද ප්‍රමාණිකවූද උපද්‍රව නැත්තාවූද උපචාර සහිතවූද කුටියක් වේවයි කියයි. (ii) ඔහුට දේශිත වස්තුකවූද ප්‍රමාණිකවූද උපද්‍රව සහිතවූද උපචාර සහිතවූද කුටියක් කෙරේද්ද කරන්නවුන්ට දුකුළා ඇවැත් දෙකක්වේ (මෙහි (i)) උපද්‍රව සහිතවූද උපචාර සහිතවූද කුටිකරන්නවුන්ට දුකුළා

ඇවැත් වේ. උපද්‍රව සහිතවද උපචාර සහිතවද කුටි- කරන්නවුන්ට දුකුලා ඇවැත් වේ. උපද්‍රව නැත්තාවූද උපචාර සහිතවූද කුටිකරන්නවුන්ට ඇවැත් නොවේ. භික්ෂුව මට කුටියක් කරවයි. අනුශාසනා නොකොට යයි. ඔහුට අදේසිත වත්ථුකවූද උපද්‍රව සහිතවූද කුටියක් කරත්. ඒ අනුශාසනා නොකොට ගිය භික්ෂුව කුටි කම්ම නොනිමි කල්හි එයි, ඒ භික්ෂුව විසින් ඒ කුටිකාව අනිකෙකුට හෝ දියයුතුයි. බිඳ දමා හෝ නැවත කළයුතුයි. ඉදින් අනිකෙකුට හෝ නොදෙන්නේ නම් බිඳ දමා හෝ නැවැත නොකරන්නේ නම් සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත් දෙකකට පැමිණේ, (මෙහි (i) ) උපද්‍රව සහිතවූද උපචාර සහිතවූද (සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත් වේ. උපද්‍රව සහිතවූද උපචාර රහිතවූද සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත්වේ. උපද්‍රව සහිතවූද උපචාර සහිතවූද සංඝාදිසේස ඇවැත්වේ.

37 (i) භික්ෂුව මට කුටියක් කරවයි අනුශාසනා නොකොට යයි. ඔහුට දේසිත වත්ථුකවූද (ii) උපද්‍රව සහිතවූද අනුපචාරවූද කුටියක් කරත්. ඒ භික්ෂුව නොනිමි කල්හි එයි. ඒ භික්ෂුව විසින් ඒ කුටිය අනිකෙකුට හෝ දියයුතුයි. බිඳ හෝ නැවත කළ යුතුයි. ඉදින් අනිකෙකුට හෝ නොදෙන්නේද බිඳ හෝ නැවත නොකරන්නේද දුකුලා ඇවැත් දෙකකට පැමිණේ. (මෙහි(ii) උපද්‍රව සහිතවූද උපචාර සහිතවූද දුකුලා ඇවැත්වේ. උපද්‍රව රහිතවූද උපචාර රහිතවූද දුකුලා ඇවැත් වේ. උපචාර සහිතවූද උපද්‍රව රහිතවූද ඇවැත් නොවේ.

38 (i) භික්ෂුව මට කුටියක් කරවයි අනුශාසනා නොකොට යයි. ඔහුට ප්‍රමාණාතික්‍රාන්තවූද (ii) උපද්‍රව ඇත්තාවූද අනුපචාර වූද කුටියක් කරත්. නොනිමි කල්හි එයි. ඒ භික්ෂුව විසින් ඒ කුටිය අනිකෙකුට හෝ දියයුතුයි, බිඳ හෝ නැවත කළයුතුයි. ඉදින් අනිකෙකුට හෝ නොදෙන්නේ නම් බිඳ හෝ නැවත නොකරන්නේ නම් සඞ්ඝාදිසේසයෙන් දුකුලා ඇවැත් දෙකකට පැමිණේ.(මෙහි (i)) උපද්‍රව සහිතවූ උපචාර සහිතවූ සඞ්ඝාදිසේසයෙන් දුකුලා ඇවැත්වේ. උපද්‍රව සහිතවූ උපචාර රහිතවූ සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත්වේ. උපද්‍රව සහිතවූ උපචාර සහිතවූ සඞ්ඝාදිසේස ඇවැත්වේ.

39 භික්ෂුව මට කුටියක් කරවයි අනුශාසනා නොකොට යෙයි. ඔහුට ප්‍රමාණිකවූ උපද්‍රව සහිතවූ අනුපචාරවූ කුටියක් කරත් නෙතෙම එය නොනිමි කල්හි එයි. ඒ භික්ෂුව විසින් ඒ කුටිය අනිකෙකුට හෝ දියයුතුයි. බිඳ හෝ නැවත කළයුතුයි. ඉදින් අනිකෙකුට හෝ නොදෙන්නේ නම් බිඳ හෝ නැවත නොකරන්නේ නම් දුකුලා ඇවැත් දෙකකට පැමිණේ. සාරම්භවූ සපරික්කමවූ කුටිකරණයෙහි දුකුලා ඇවැත්වේ. අනාරම්භවූද අපරික්කමවූද දුකුලා ඇවැත්වේ. අනාරම්භවූ සපරික්කමවූ ඇවැත් නොවේ.

40 (i) භික්ෂුව මට කුටියක් කරවයි අනුශාසනා නොකොට යෙයි. ඔහුට අදේශිත වත්ථුකවූ ප්‍රමාණාතික්‍රාන්තවූ (ii) සාරම්භවූ අපරික්කමවූ කුටියක් කරත්. නෙතෙම එය නොනිමි කල්හි එයි. ඒ භික්ෂුව විසින් ඒ කුටිය අනිකෙකුට හෝ දියයුතුය. බිඳ හෝ නැවත කළයුතුය. අනිකෙකුට හෝ නොදෙන්නේ නම් බිඳ හෝ නැවත කරන්නේ නම් සඞ්ඝාදිසේස දෙකින් දුකුලා ඇවැත් දෙකකට පැමිණේ. (මෙහි (i)) සාරම්භවූ සපරික්කමවූ සඞ්ඝාදිසේස දෙකින් දුකුලා ඇවැත්වේ. අනාරම්භවූ අපරික්කමවූ සංඝාදිසේස දෙකින් දුකුලා ඇවැත්වේ. අනාරම්භවූ සපරික්කමවූ සංඝාදිසේස දෙකකට පැමිණේ. භික්ෂුව මට කුටියක් කරවයි අනුශාසනා නොකොට යෙයි. ඔහුට දේශිත වත්ථුකවූ ප්‍රමාණිකවූ සාරම්භකවූ අපරික්කමකවූ කුටියක් කරයි. නෙතෙම එය නොනිමි කල්හි එයි. ඒ භික්ෂුව විසින් ඒ කුටිය අනිකෙකුට හෝ දියයුතුය. බිඳ හෝ නැවත කළයුතුය. අනිකෙකුට හෝ නොදෙන්නේ නම් බිඳ හෝ නැවත නොකරන්නේ නම් දුකුලා ඇවැත් දෙකකට පැමිණේ. සාරම්භකවූ සපරික්කමවූ දුකුලා ඇවැත්වේ. අනාරම්භවූද අපරික්කමවූද දුකුලා ඇවැත්වේ. භික්ෂුව මට කුටියක් කරවයි අනුශාසනා නොකොට යෙයි. ඔහුට දේශිත වත්ථුකවූ ප්‍රමාණිකවූ අනාරම්භවූ සපරික්කමවූ කුටියක් කරත්. ඇවැත් නොවේ.

41 "තමා ආරම්භ නොකොට තමා අවසාන කෙරේද සංඝාදිසේස ඇවැත්වේ. තමන් ආරම්භකොට අනුන් අවසාන

කෙරේද සංඝාදිසේස ඇවැත්වේ. අනුන් ආරම්භකොට තමන් අවසාන කෙරේද, සංඝාදිසේස ඇවැත්වේ. අනුන් ආරම්භකොට අනුන් අවසාන කෙරේද, සංඝාදිසේස ඇවැත් වේ. ලෙනෙහිද, ගුහාවෙහිද, තෘණ කුටියෙහිද, ඇවැත් නොවේ. අනුන්ගේ ප්‍රයෝජනයට මාසාගාරයක් හැර සියලු තන්හිද උම්මත්තකයාටද ආදිකර්මිකයාටද ඇවැත් නොවේ

( (6) කුටිකාර සංඝාදිසේසය නිමි.)

---

## 7 සංඝාදිසේසය

1 ඒ කාලයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ කොසැඹෑ නුවර ඝෝෂිතාරාමයෙහි වැඩවාසය කරන සේක. එකල්හි වනාහි ආයුෂ්මත්වූ ඡන්න ස්ථවිරයන්ගේ උප-ස්ථායක ගෘහපතියෙක් ආයුෂ්මත්වූ ඡන්න ස්ථවිරයන්ට මෙසේ කීය. "ස්වාමිනි, විහාර පිහිටුවන ස්ථානයක් දනුව, ආර්ය්‍යයන් වහන්සේට විහාරයක් කරවන්නෙමියි" කීයේය. එකල්හි ආයුෂ්මත් ඡන්න ස්ථවිරතෙමේ විහාර වස්තුවක් ශෝධනය කරන්නේ එක්තරා චෛත්‍ය සම්මත රුකක් සිඳ වීය. ඒ රුක (ii) ගම්වැසියන් විසින් පුදන්නාවූද නියම්ගම් වැසියන් විසින් පුදන්නාවූ නගර වැසියන් විසින් පුදන්නා වූද ජනපද වැසියන් විසින් පුදන්නාවූද රටවැසියන් විසින් පුදන්නාවූද (iii) රුකක් විය.

2 මනුෂ්‍යයෝ ශාක්‍යපුත්‍රවූ ශ්‍රමණයෝ කෙසේ නම් ග්‍රාම පූජිතවූද නිගම පූජිතවූද නගර පූජිතවූද ජනපද පූජිත වූද රාෂ්ට්‍ර පූජිතවූද චෛත්‍ය නම් රුක සිඳවන්නෝදැයි දොස් කියත්. නොසතුට ප්‍රකාශ කරත්. නොසතුටු වචන කියත්. "ශාක්‍යපුත්‍රවූ ශ්‍රමණ පුත්‍රයෝ එකෙන්ද්‍රිය ඇති ජීවයක් නසන්නාහු යයි කීවාහුය, භික්ෂූන් වහන්සේලා දොස් කියන්නාවූ නොසතුට ප්‍රකාශ කරන්නාවූද නොසතුටු වචන කියන්නාවූද ඒ මනුෂ්‍යයින්ගේ ශබ්දය ඇසූවාහ. යම්බඳු අල්පේච්ඡ භික්ෂූන් වහන්සේලා වෙත්ද, උන්වහන්සේලාද දොස් කථා කරත්. නොසතුට ප්‍රකාශ කරත්. අසතුටු

වචන කථා කරත්. ආයුෂ්මත් ඡන්න ස්ථවිරතෙමෙ කවර හෙයකින් (මෙහි 1 (ii) පූජිත චෛත්‍ය රුක්ඛය විනාශ කෙළේ" දැයි කියති.

3 එකල්හි ඒ භික්ෂූන් වහන්සේලා මේ කාරණය භාග්‍යවතුන් වහන්සේට සැලකළාහුය. "ඡන්නය, තෝ (මෙහි 1(ii)) චෛත්‍ය රුක විනාශ කළේ යනු සැබෑද?" "භාග්‍යවතුන් වහන්ස, සැබව" භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළ සේක. හිස් පුරුෂය තෝ කෙසේ නම් (මෙහි 1 (ii)) චෛත්‍ය රුක විනාශ කෙළෙහිද? හිස් පුරුෂය, මනුෂ්‍යයෝ වෘක්ෂයන්හි සත්වසංඥාව ඇත්තාහ. හිස්පුරුෂය, මේ කාරණය නොපැහැදියන්ගේ පැහැදීමට හේතු නොවන්නේය. (මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v)) මහණෙනි, මෙසේද මේ ශික්ෂාපදය උදෙසව්:-

4 "ගිහියන් ඇතුව තමා පිණිස මහා විහාරයක් කරවන්නාවූ භික්ෂුව විසින් වස්තු දෙසනාවට භික්ෂූන් වහන්සේලා කැඳවිය යුතුය. ඒ භික්ෂූන් විසින් උපද්‍රව නැත්තාවූද ඉඩකඩ සහිතවූද මැත්තුම දෙසිය යුතුය. ඉදින් භික්ෂූන් විසින් උපද්‍රව සහිතවූද ඉඩකඩ සහිතවූද විහාරයක් කරන්නේ නම් වස්තු දෙසනයට භික්ෂූන් හෝ නොකැඳවන්නේ නම් සංඝාදිසේස ඇවැත්වේ.

5 මහල්ලක (මහත්) නම් සස්වාමික විහාරය කියනු ලැබේ. "විහාර නම් සෙවිලි කරන ලද්දාවූ හෝ අවුරන ලද්දාවූ හෝ ඇතුලත හුණුගෑ පිටත හුණු ගෑ යනුයි. "කරවන්නා ලබන්නහු විසින්" යනු කරන්නාවූ හෝ කරවන්නාවූ යනුයි. "ස්වාමියෙකු ඇති" යනු ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ගිහියෙක් හෝ පැවිද්දෙක් හෝ යන අන්කිසි කිසිවෙක් විය යුතුය. "තමා උදෙසා" යනු තමා පිණිස යනුයි.

6 "ඉඩම කැපකිරීමට භික්ෂූන් කැඳ විය යුතුය" යනු. ඒ විහාරය කරවන්නාවූ භික්ෂුව විසින් විහාර වස්තුව ශෝධනය කොට සංඝයාවෙත එළඹ උත්තර සාටකය ඒකාංශ කොට වැඩිමහලු භික්ෂූන්ගේ පා වැඳ උක්කුටිකව හිඳ ඇඳිලි බැඳගෙණ මෙසේ කියයුතුයි. "ස්වාමීන් වහන්ස, මම

සස්වාමිකවූද අත්තුද්දෙසවූද මහාවිහාරයක් කරනු කැමැත්තෙමි, ස්වාමීනි, මම විහාර වස්තු බැලීමට සංඝයා ඉල්වමියි' කියායි. දෙවෙනිවත් යාඥා කළ යුතුයි. තුන්වෙනිවත් යාඥා කළ යුතුයි. ඉදින් සියලු සංඝයාම විහාර වස්තු බැලීමට උත්සාහවත් වන්නේනම් සියලු සංඝයා ලවාම ඕලෝකනය කළ යුතුයි. ඉදින් සියලු සංඝයා විහාර වස්තු බැලීමට උත්සාහවත් නොවන්නේ නම් එහිවූ ව්‍යක්තවූද බලසම්පන්නවූද උවදුරු සැප පහසු ඉඩකඩ තදබද දැනීමට සමර්ථ යම් භික්ෂූන් වහන්සේලා වෙත්ද, උන්වහන්සේලා යාඥාකොට සම්මතය කළ යුතුයි.

7 "මහණෙනි, සම්මතය මෙසේ කළ යුතුයි. ව්‍යක්තවූද, ප්‍රබලවූද භික්ෂුවක් විසින් සංඝයාට දැන්විය යුතුයි. "ස්වාමීනි, සංඝයා මාගේ වචනය අසත්වා, අසවල් භික්ෂුව සස්වාමිකවූද අත්තුද්දෙසවූද මහාවිහාරයක් කරනු කැමැති වෙයි. හෙතෙම විහාර වස්තු බැලීමට සංඝයා යාඥා කරයි. සංඝ තෙම මෙනම් භික්ෂුවගේ විහාර වස්තු බැලීමට අසවල් අසවල් භික්ෂූන් සම්මත කරන්නේය." මේ ඥප්තියයි.

8 "ස්වාමීන් වහන්ස, සංඝයා මාගේ වචනය අසත්වා, මේ අසවල් භික්ෂුව සස්වාමිකවූද තමා පිණිසවූද මහාවිහාරයක් කරනු කැමැති වෙයි. හෙතෙම විහාර වස්තු බැලීමට සංඝයා ඉල්ලයි. සංඝ තෙමේ අසවල් අසවල් භික්ෂූන් මෙනම් භික්ෂුවගේ විහාර වස්තු ඕලෝකනයට නියම කරයි. මෙනම් භික්ෂුවගේ විහාර භූමිය සම්මත කිරීමට මෙනම් මෙනම් භික්ෂූන් සම්මත කිරීම යම් ආයුෂ්මතක් තම-කට කැමති වේනම් හෙතෙම නිශ්ශබ්ද වන්නේය. යමෙක් නොකැමැත්තේ නම් හෙතෙම කියන්නේය.

9 "මේ නම් භික්ෂුවගේ විහාර වස්තුව බැලීමට අසවල් අසවල් භික්ෂූන් සංඝයා විසින් සම්මත කරන ලදහ. සංඝයා කැමති වෙයි. එහෙයින් තුෂ්ණීම් භාවයෙන් කැමැතිවේවා, මෙය එසේ දරමියි කියායි'. ඒ සංඝයා විසින් සම්මත කරන ලද භික්ෂූන් එහි ගොස් විහාර වස්තුව බැලිය යුතුය. උපද්‍රව සහිත බව හා උපද්‍රව නැති බවද ඉඩකඩ සහිත බව

හා ඉඩකඩ නැති බවද දැනගත යුතුයි. ඉදින් උපද්‍රව සහිත වේනම් ඉඩකඩ නැති වේ නම් මෙහි නොකළ යුතුයයි. කිය යුතුය. ඉදින් උපද්‍රව නැත්තේ නම් ඉඩසහිත වේනම් උපද්‍රව නැතැයිද උපචාර සහිතයයිද සංඝයාට දැන්විය යුතුය

10 "ඒ විහාරකාරක භික්ෂුව විසින් සංඝයා කරා එළඹ තනිපට සිවුර ඒකාංශකොට වැඩිමහලු භික්ෂූන්ගේ පා වැද උක්කුටිකව හිඳ ඇඳිලි බැඳගෙණ මෙසේ කියයුතු වන්නේය. "ස්වාමීන් වහන්ස, මම ස්වාමියක් ඇති මා පිණිසවූ මහාවිහාරයක් කරනු කැමැත්තෙමි. ස්වාමීන් වහන්ස, ඒ මම විහාර වස්තු දේශනයට සංඝයා යාඥා කරමි" කියායි. දෙවනුවත් යාඥා කළ යුතුයි තුන්වෙනුවත් යාඥා කළ යුතුයි. ව්‍යක්ත වූද බලසම්පන්නවූද භික්ෂූන් විසින් සංඝයාට දැන්විය යුතුයි. "ස්වාමීන් වහන්ස, සංඝතෙම මාගේ වචනය අසත්වා, මේ අසවල් භික්ෂුව සස්වාමිකවූ අත්තුද්දෙසවූ තමා පිණිස මහා විහාරයක් කරනු කැමැති වෙයි. හෙතෙම විහාර වස්තු දේශනයට සංඝයා යාඥා කරයි. ඉදින් සංඝතෙමේ අසවල් භික්ෂුවගේ විහාරවස්තු දේශනා කරන්නේ නම් මේ ඊට සුදුසු කාලයයි. මේ දැන්වීමයි "ස්වාමීන් වහන්ස, සංඝතෙම මාගේ වචනය අසාවා, මේ අසවල් භික්ෂුව සස්වාමිකවූ අත්තුද්දෙසවූ මහාවිහාරයක් කරනු කැමැති වෙයි. හෙතෙම විහාර වස්තු දේශනයට සංඝයා යාඥා කරයි. සංඝතෙම අසවල් භික්ෂුවගේ විහාර වස්තු දේශනය කෙරේද, අසවල් භික්ෂුවගේ විහාර වස්තු දේශනයට යම් බඳුවූ ආයුෂ්මතුන් වහන්සේලා කැමැති වේද්ද, උන්වහන්සේලා තුෂ්ණීම්භාවයෙන් යුක්ත විය යුතුය. යමෙක් නොකැමැති වන්නේ නම් කිය යුතුය. සංඝයාගේ කැමැත්ත පිට අසවල් භික්ෂුවගේ විහාර වස්තුව සංඝයා විසින් දේශනය කරනලදහ. එහෙයින් තුෂ්ණීම් භාවයෙන් යුක්තව දරමි" කියායි.

11 "සිරිනැර සහිත යනු කෘමීන්ගේ වාසස්ථානය වෙයි. (මෙහි 6 සංඝාදිසේසයේ 23 ඡේදය) හැසිරෙන ස්ථානයක් හෝ වේද, මේ සාරම්භ නම් වේ "ඉඩකඩ නැති" යනු ගොනුන් දෙන්නෙක් යෙදූ කරත්තයක් ගෙණයන්ට නොහැකිද, ඉණිමගක සිට ගෙයක් සෙවිලි කිරීමට නොහැකිද,

එය අපරික්කමන නම් වේ. අනාරම්භ නම් කෘමීන්ගේ වාසස්ථානයක් නොවේද, (මෙහි 6 සංඝාදිසේසයේ 24) ඔවුන් හැසිරෙන ස්ථානයක් හෝ නොවන්නේද ඒ අනාරම්භ නම් වේ.

"සපරික්කමන" නම් කියන ලද කරත්තයක් යා හැකි නම් නිශ්‍රේණිමගක සිට සෙවිලි කිරීමට නොහැකි නම් ඒ සපරික්රමන නම්. "මහල්ලක" නම් සස්වාමික විහාරය කියනු ලැබේ. "විහාර" නම් ඇතුලත හුණුගාන ලද පිටත හුණුගාන ලද ඇතුලත පිටත හුණුගාන ලද යනුයි. "කාරවන්නේ" යනු කරන්නේ හෝ කරවන්නේ යනුයි. "වස්තු දේශනාවට භික්ෂූන් හෝ නොකැඳවන්නේය." යනු දැක්කී දුතිය සම්මෙන විහාරවස්තු දේශනය නොකොට කරන්නේ නම් හෝ කරවන්නේ නම් එකී එකී ප්‍රයෝගයෙහි දුකුලා වන්නේය. එක් පිඩක් නොගත් කල්හි ථුලසි ඇවැත් වන්නේය. එක් පිඩක් ගත් කල්හි සංඝාදිසේස වන්නේය. "සංඝාදිසේස" නම් (මෙහි 1 සංඝාදිසේසයේ 9 ඡේදයේ (ii) යොදන්න) එහින්ද සංඝාදිසේසය කියනු ලැබේ,

12 භික්ෂුව අදේසිත වස්තුකවූද උපද්‍රව සහිතවූද අනුප වාරවූ විහාරයක් කරන්නේ නම් සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත් දෙකකට පැමිණේ.

13 භික්ෂුව අදෙසිත වස්තුකවූද සාරම්භවූ සපරික්කමවූ විහාරයක් කරයි නම් සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත්වේ.

14 භික්ෂුව අදේසිත වස්තුකවූ උපද්‍රව නැත්තාවූ අනුප වාරවූ විහාරයක් කෙරේ නම් සඞඝාදිසේසයෙන් දුකුලා ඇවැත් වේ.

15 භික්ෂුව අදේසිත වස්තුකවූ අනාරම්භවූ සපරිකක-මනවූ විහාරයක් කෙරේ නම් සංඝාදිසේස ඇවැත්වේ.

16 භික්ෂුව දේසිත වස්තුක සාරම්භ සපරිකකමන අප-රිකකමන විහාරයක් කෙරේ නම් දුකුලා ඇවැත් දෙකකට පැමිණෙත්.

17 භික්ෂුව දේසිත වස්තුකවූද සාරම්භවූද සපරිකක මනවූද විහාරයක් කෙරේ නම් දුකුලා ඇවැත්වේ.

18 භික්ෂුව දේශිත වස්තුකවූද අනාරම්භවූද අපරික්ඛමණවූද විහාරයක් කෙරේනම් දුකුලා ඇවැත්වේ.

19 භික්ෂුව දේශිත වස්තුකවූද අනාරම්භවූද සපරික්ඛමණවූද විහාරයක් කෙරේ නම ඇවැත් නොවේ.

20 (i) භික්ෂුව මට විහාරයක් කරවයි අනුශාසනා කරයි. ඔහුට (ii) අදේශිත වස්තුකවූ සාරම්භවූද අපරික්ඛමණවූ (iii) විහාරයක් කෙරේද්ද (iv) සංඝාදිසේසයෙන් දුකුලා දෙකට පැමිණේ, (මෙහි (i) සාරම්භවූ සපරික්ඛමණවූ (මෙහි (iii) සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත්වේ. අනාරම්භවූ අපරික්ඛමණවූ සඞඝාදිසේසයෙන් දුකුලා ඇවැත්වේ. අනාරම්භවූ සපරික්ඛමණවූ සංඝාදිසේස ඇවැත්වේ.

21 (i) භික්ෂුව මට විහාරයක් කරවයි අනුශාසනා කරයි, ඔහුට (ii) දේශිත වස්තුක සාරම්භ අපරික්ඛමණ (iii) විහාරයක් කරයි (iv) දුකුලා ඇවැත් දෙකකට පැමිණේ. (මෙහි (i) සාරම්භවූ සපරික්ඛමණවූ (මෙහි iii) දුකුලා ඇවැත්වේ. අනාරම්භවූ අපරික්ඛමණවූ දුකුලා ඇවැත්වේ. අනාරම්භවූ සපරික්ඛමණවූ විහාරයක් කෙරේනම් ඇවැත් නොවේ.

22 (i) භික්ෂුව මට විහාරයක් කරවයි අනුශාසනා නොකරයි. දේශිතවස්තුක වේවා, අනාරම්භ වේවා, සපරික්ඛමණ වේවයි අනුශාසනා නොකරයි. (ii) ඔහුට අදේශිත වස්තුකවූ සාරම්භවූ සපරික්ඛමණවූ (iii) විහාරයක් කරත්. (iv) සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත් දෙකකට පැමිණේ. (මෙහි (i) සාරම්භවූ සපරික්ඛමණවූ (මෙහි (iii) ) සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත්වේ. අනාරම්භවූ අපරික්ඛමණවූ (මෙහි (iii) සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත්වේ. අනාරම්භවූ සපරික්ඛමණවූ (මෙහි (iii) සංඝාදිසේස ඇවැත්වේ.

23 (i) භික්ෂුව මට විහාරයක් කරවයි අනුශාසනා නොකරයි. දේශිත වස්තුකවේවා අනාරම්භ වේවා සපරික්ඛමණ වේවා කියා අනුශාසනා නොකරයි. (ii) ඔහුට දේශිත වස්තුකවූ සාරම්භවූ අපරික්ඛමණවූ විහාරයක් කෙරේනම් දුකුලා ඇවැත් දෙකකට පැමිණේ (මෙහි (i) )සාරම්භවූ සපරික්ඛමණවූ (21 ඡේදයේ (iii)') දුකුලා ඇවැත්වේ· අනාරම්භවූ අපරික්ඛමණවූ (21 ඡේදයේ (iii) ) දුකුලා ඇවැත්වේ. අනාරම්භවූ සපරික්ඛමණවූ විහාරයක් කෙරේනම් ඇවැත් නොවේ.

24 (i) භික්ෂුව මට විහාරයක් කරවමියි අනුශාසනා කොට යයි. අනුශාසනා කරන්නේද (ii) දේශිත වස්තුකවේවා, අනාරම්භවේවා සපරික්කමන වේවයි කියායි. (iii) ඔහුට අදේශිත වස්තුකවූ සාරම්භවූ අපරික්කමනවූ විහාරයක් කරයි. ඔහු මට අදේශිත වස්තුකවූ සාරම්භවූ අපරික්කමනවූ විහාරයක් කරයි යැයි අසයි. ඒ භික්ෂුව විසින් තෙමේ හෝ යායුතුය. දූතයෙක් හෝ යැවිය යුතුය දේශිත වස්තුක වේවා, අනාරම්භ වේවා. සපරික්කමන වේවයි කියායි. ඉදින් තෙමේ හෝ නොයන්නේ නම් දූතයෙක් හෝ නොයන්නේ නම් දුකුලා ඇවැත්වේ. (මෙහි (i)) දේශිත වස්තුකදවේවා අනාරම්භද වේවා, දේශිත වස්තුකද වේවා, සපරික්කමනද වේවා දේශිත වස්තුකද වේවයි කියායි. ඉදින් තෙමේ හෝ නොයන්නේ නම් දූතයෙක් හෝ නොයවන්නේ නම් දුකුලා ඇවැත්වේ.

25 (i) භික්ෂුව මට විහාරයක් කරවයි අනුශාසනා කොට යයි. අනුශාසනා කරන්නේද (ii) දේශිත වස්තුකද වේවා, අනාරම්භද වේවා, සපරික්කමනද වේවයි කියායි. ඔහුට දේශිත වස්තුකවූ සාරම්භවූ අපරික්කමනවූ විහාරයක් කෙරේද කෙතෙම මට දේශිත වස්තුක සාරම්භවූ අපරික්කමනවූ විහාරයක් කෙරේයයි අසාද ඒ භික්ෂුව තෙමේ හෝ යායුතුය. දූතයෙක් හෝ යැවිය යුතුය. අනාරම්භද වේවා, සපරික්කමන වේවයි කියායි. (මේ ඡේදයේ (i)) අනාරම්භ වේවා සපරික්කමනද වේවයි කියායි. අනාරම්භවූ සපරික්කමනවූ විහාර කරණයෙහි ඇවැත් නොවේ.

26 (i) භික්ෂුව මට විහාරයක් කරවයි අනුශාසනා කොට යයි. අනුශාසනා කරන්නේද දේශිත වස්තුකද වේවා, අනාරම්භවේවා, සපරික්කමනද වේවයි කියායි (ii) ඔහුට අදේශිත වස්තුකවූ සාරම්භවූ අපරික්කමනවූ විහාරයක් කෙරේ නම් කරන්නවුන්ට දුකුලා තුනක් ඇතිවේ (මෙහි (i)) සාරම්භවූ සපරික්කමනවූ කරන්නවුන්ට දුකුලා ඇවැත් දෙකක්වේ. අනාරම්භවූද අපරික්කමනවූද කරන්නවුන්ට දුකුලා ඇවැත්වේ අනාරම්භවූ සපරික්කමනවූ විහාරයක් කරන්නවුන්ට දුකුලා ඇවැත්වේ. භික්ෂුව මට විහාරයක් කරමියි අනුශාසනා කොට

යයි අනුශාසනා කරත්හෝද දේශිත වස්තුකද වේවා, ආරම්භසහද වේවා සපරික්කමනද වේවයි කියයි. ඔහුට දේශිත වස්තුකවූ සාරම්භවූ අපරික්කමනවූ විහාරයක් කරන්නේ නම් කරන්නවුන්ට දුකුලා ඇවැත් දෙකක්වේ. (මෙහි (i)) සාරම්භවූ සපරික්කමනවූ කරන්නවුන්ට දුකුලා ඇවැත්වේ. අනාරම්භවූ අපරික්කමනවූ කරන්නවුන්ට දුකුලා ඇවැත්වේ. අනාරම්භවූ සපරික්කමනවූ විහාර කරන්නවුන්ට ඇවැත් නොවේ.

27(i) භික්ෂුව මට විහාරයක් කරමයි අනුශාසනා නොකොටයයි, ඔහුට අදේශිත වස්තුකවූ (ii) සාරම්භවූ අපරික්කමනවූ (iii) විහාරයක් කරයි. (iv) ඉදින් ඔහු නොනිමිකල්හි එන්නේ නම් ඒ භික්ෂුව විසින් ඒ විහාරය අන්‍යකෙකුට හෝ දියයුතුය. බිඳ දමා හෝ නැවත කළයුතුය. ඉදින් අන්‍යකෙකුට හෝ නොදෙන්නේ නම් බිඳ දමා හෝ නැවත නොකරන්නේ නම් (v) සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත් දෙකකට පැමිණේ. (මෙහි (i) සාරම්භවූ සපරික්කමනවූ (මෙහි (iii) (iv)) සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත්වේ. අනාරම්භවූද අපරික්කමනවූද සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත්වේ. අනාරම්භවූ සපරික්කමනවූ විහාරයක් කෙරේ නම් සංඝාදිසේස ඇවැත්වේ.

28 (i) භික්ෂුම මට විහාරයක් කරවයි අනුශාසනා නොකොටයයි. ඔහුට දේශිතවස්තුකවූ (ii) සාරම්භවූ අපරික්කමනවූද විහාරයක් කරයි. (iii) හෙතෙම නොනිමිකල්හි එයි. ඒ භික්ෂුව විසින් ඒ විහාරය අන්‍යකෙකුට හෝ දියයුතුය බිඳ දමා හෝ නැවත කළයුතුය. ඉදින් අන්‍යකෙකුට හෝ නොදෙන්නේ නම් බිඳ දමා හෝ නැවත නොකරන්නේ නම් (iv) දුකුලා ඇවැත් දෙකකට පැමිණේ (මෙහි (i)) සාරම්භවූ සපරික්කමනවූ (මෙහි 26 (iii) හා (මෙහි (iii)) දුකුලා ඇවැත්වේ. අනාරම්භවූ අපරික්කමනවූ දුකුලා ඇවැත්වේ. අනාරම්භවූ සපරික්කමනවූ විහාරයක් කෙරේ නම් ඇවැත් නොවේ. තෙමේම කොට තෙමේම අවසාන කෙරේ නම් සංඝාදිසේස ඇවැත්වේ තමා කොට අනුන් අවසාන කෙරේනම් සංඝාදිසේස ඇවැත්වේ. අනුන් කොට තමන් අවසාන කෙරේනම් සංඝාදිසේස ඇවැත්වේ. අනුන් විසින්

කරන ලදුව අනුන් විසින්ම අවසාන කෙරේ නම් සංඝාදිසේස ඇවැත්වේ. ලෙන්ද, ගුහාද, තෘණකුටිද, අනුන් පිණිස කළ වාසාගාරද හැර සියලු තන්හිද උම්මත්තකයාටද ආදිකර්මිකයාටද ඇවැත් නොවේ.

(7 විහාරකාර සංඝාදිසේසය නිමි.)

---

## 8 සංඝාදිසේසය

1 ඒ කාලයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ රජගහනුවර වේළුවන නම්වූ ලෙනෙහුන්ට අභය දුන් ස්ථානයෙහි කළ විහාරයෙහි වැඩවසන සේක. එසමයෙහි මනාසි මල්ලරාජ පුත්‍රවූ දබ්බ නම්වූ ස්ථවිරයන් වහන්සේ උත්පත්තියෙන් සත්වෙනි වයසෙහි රහත් බවට පැමිණියේ වෙයි. ශ්‍රාවකයෙකු විසින් පැමිණිය යුතු යම්කිසිවක් වේද, ඒ සියල්ලට උන්වහන්සේ පැමිණියේ වෙයි. උන්වහන්සේට මත්තෙහි කළයුතු දෙයක් නැත්තේවිය. කරනලද කෘත්‍යයක්හි නැවත කළයුතු දෙයක් නැති විය.

2 එකල්හි මල්ල පුත්‍රවූ ආයුෂ්මත් දබ්බ ස්ථවිරයන් වහන්සේට රහසිගත හුදකලා වාසයෙන් හුන්නාවූ උන් වහන්සේගේ සිතෙහි මෙබඳු විතර්කයක් ඇතිවිය. (ii) මා විසින් උත්පත්තියෙන් සත්වන වයසෙහි රහත් බවට පැමිණියේ වෙයි. ශ්‍රාවකයෙකු විසින් යම්කිසිවකට පැමිණිය යුතුද ඒ සියල්ලට මමද පැමිණියෙමි. මත්තෙහි කළයුතු දෙයක් මට නැත්තේය. කළ දෙය නැවත රැස්කිරීමකුත් නැත්තේය. කිමෙක්ද මම සංඝයාට කිනම් මනාවක් කරන්නෙම්ද කියායි. (iii) එකල්හි මල්ලපුත්‍රවූ දබ්බ ස්ථවිරයන් වහන්සේට මෙබඳු අදහසක් විය (iv) මම සංඝයාට සෙනසුන්ද පනවන්නේ නම් දන් නියම කිරීම්ද කරන්නේ නම් යහපතැයි කියායි.

3 එකල්හි මල්ල පුත්‍රවූ ආයුෂ්මත් දබ්බ ස්ථවිරතෙමේ සවස් කාලයෙහි පල සමවතින් නැගිටියේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට එළඹියේය. එළඹ භාග්‍ය-

වතුන් වහන්සේම වැද එකත්පසක හුන්නේය. එකත් පසෙක හුන්නාවූ මල්ලපුත්‍රවූ ආයුෂ්මත් දබ්බ ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ. "ස්වාමීන් වහන්ස, මෙහි රහසිගත හුදකලා වාසයෙන් හුන්නාවූ මට මෙබඳු සිත පිළිබඳ විතර්කයක් උපන්නේය. (මෙහි 2 (ii) ) ස්වාමීන්වහන්ස, ඒ මට මෙබඳු අදහසක් උපණ(මෙහි 2 (iv) ස්වාමීනි, මම සංඝයාට සෙනසුන් පැනවීමටත් භත්තුද්-දෙසය කිරීමටත් කැමැත්තෙමියි ' කීය. "සාධු, සාධු, දබ්බය. එය ඉතාම යහපත්ය. දබ්බ එසේවීනම් තෝ සංඝයාට සෙනසුන් පැනවීමද බත් නියම කිරීම කරව" "ස්වාමීන් වහන්ස, එසේයයි" මල්ල පුත්‍රවූ ආයුෂ්මත් දබ්බ ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්නේය.

4 එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ සිද්ධියෙහි දැහැමි කථාකොට භික්ෂූන්ට ඇමතූ සේක. "මහණෙනි, එසේ වීනම් සංඝයා මල්ල පුත්‍ර දබ්බ ස්ථවිරයන් සේනාසන පනවන්නහු හා දන් නියම කරන්නහු හැටියට සම්මත කෙරෙත්වා, සම්මත කිරීමද මෙසේ විය යුතුය, "මල්ල පුත්‍ර දබ්බ ස්ථවිරයන් පළමුකොට යැදිය යුතුය. යැදීකොට ව්‍යක්තවූද ප්‍රතිබල සම්පන්නවූද භික්ෂූන් විසින් සංඝයාට දැන්විය යුතුයි. "ස්වාමීනි, සංඝතෙමේ මගේ වචනය අසත්වා, සංඝතෙමේ කාලය පැමිණි කල්හි මල්ල පුත්‍රවූ ආයුෂ්මත් දබ්බ ස්ථවිරයන් සේනාසන පනවන්නාවූද දන් නියම කරන්නාවූ භික්ෂුව හැටියට සම්මත කරන්නේය මේ දැන්වීමයි. සංඝයා මගේ වචනය අසත්වා, සංඝතෙමේ මල්ල පුත්‍ර ආයුෂ්මත් දබ්බ ස්ථවිරයන් වහන්සේ සේනාසන පනවන්නාවූ දන් නියම කරන්නාවූ භික්ෂුව හැටියට සම්මත කරයි. මල්ල පුත්‍රවූ ආයුෂ්මත් දබ්බ ස්ථවිරයන් වහන්සේ සේනාසන පනවන්නාවූද භත්තුද්දෙසය කරන්නාවූ භික්ෂුව හැටියට සම්මත කිරීම යම් ආයුෂ්මතුන් වහන්සේ නමකට කැමැති වන්නේ නම් තුෂ්ණීම්භූතවිය යුතුය. යමෙක් නො කැමැති වන්නේ නම් හෙතෙම ප්‍රකාශ කළ යුතුයි. මල්ල

පුත්‍රවූ ආයුෂ්මත් දබ්බ ස්ථවිරයන් වහන්සේ සෙනසුන් පනවන්නාවූ දන් නියම කරන්නාවූ භික්ෂුව ලෙස සංඝයා විසින් සම්මත කරන ලද්දේ විය. සංඝයාද ඊට කැමැත්තේය. එහෙයින් මෙය තුෂ්ණීම් භාවයෙන් පිළිගනිමි.

5 "මල්ල පුත්‍රවූ ආයුෂ්මත් දබ්බ ස්ථවිරයන් වහන්සේ සම්මතවූයේ ගුණ සභාගවූ මිත්‍ර සන්ථව සභාගවූ භික්ෂූන්ට එකට සෙනසුන් පනවයි. සූත්‍රාන්තික යම් භික්ෂූහු වෙත්ද, ඔවුන්ට එකට සෙනසුන් පනවයි. ඒ ඔවුනොවුන් සූත්‍රාන්ත සංගායනා කරන්නෝ යයි" කියයි. යම්බඳුවූ විනයධර භික්ෂූන් වෙත්ද, උන්වහන්සේට එකට සෙනසුන් පනවයි ඒ උන්වහන්සේලා ඔවුනොවුන් විනය විනිශ්චය කරන්නෝ යයි කියයි. ධර්ම කථිකවූ යම් භික්ෂූහු වෙත්ද, උන්වහන්සේට එකට සෙනසුන් පනවයි, ඒ ඔවුනොවුන් ධර්ම සාකච්ඡා කරන්නෝයයි කියයි. යම් බඳුවූ ධ්‍යානලාභී භික්ෂූහු වෙත්ද, උන්වහන්සේලාට එකට සෙනසුන් පනවයි. ඒ ඔවුනොවුන් නොපෙළෙන්නෝයයි කියයි. යම්බඳුවූ තිරශ්චීන කථා, ඇත්තාවූ මඳ හික්මීම් ඇති භික්ෂූන් වෙසෙත්ද, උන්වහන්සේලාටද එකට සෙනසුන් පනවයි, මේ ආයුෂ්මතුන්ද තිරශ්චීන කථා රතියෙන් වාසය කරතියයි කියයි. නොකල්හි පැමිණෙන යම් බඳුවූ භික්ෂූන් වහන්සේලා වෙත්ද, උන් වහන්සේලාටද තේජොධාතුකසිණයට චතුර්ථධ්‍යාන සමාපත්තියට සමවැදී ඉන් නැගිට ඒ ආලෝකයෙන් සේනාසන පනවයි.

6 එකල්හි මේ කාරණය දන්නාවූ ඇතැම් භික්ෂූන් වහන්සේලා මල්ල පුත්‍ර ආයුෂ්මත් දබ්බ ස්ථවිරයන්ගේ ඍද්ධි ප්‍රාතිහාර්ය බලමුයයි කියා නොකල්හිද එත්. උන්වහන්සේලා මල්ලපුත්‍ර ආයුෂ්මත් දබ්බ ස්ථවිරයන් කරා එළඹ මෙසේ කියත්. "ආයුෂ්මත් දබ්බ ස්ථවිරයනි, අපටද සෙනසුන් පනවමයි" කියයි. උන්වහන්සේලාට ආයුෂ්මත් දබ්බ ස්ථවිරයන් වහන්සේ මෙසේ කියයි. "ආයුෂ්මතුන්වහන්සේලා කවර තැනක කැමැතිද, කොතැන්හි පනවම්ද?" කියයි. උන්වහන්සේලා දැනගෙනම දුරස්ථානයන් පෙන්නුම

කරත්. "ආයුෂ්මත් දබ්බ ස්ථවිරයෙනි, අපට ගිජ්ඣකූට පර්වතයෙහි සෙනසුන් පනවනු මැනව" කියයි "ආයුෂ්මතුනි, අපට චෞර ප්‍රපාතයෙහි සෙනසුන් පනවනු මැනව" කියයි. "ඇවැත්නි, අපට ඉසිගිලි පාර්ශ්වයෙහි කළුගල් තලාවෙහි සෙනසුන් පනවනු මැනව" කියයි. "ඇවැත්නි, අපට වේභාර පාර්ශවයෙහි සත්තපණ්ණි ගුහාවෙහි සෙනසුන් පනවනු මැනව" ඇවැත්නි, අපට ශීත වනයෙහිවූ සප්ප-සොණ්ඩික පබ්භාරයෙහි සෙනසුන් පනවනු මැනව" "ඇවැත්නි, අපට ගෝතම කන්දරයෙහි සෙනසුන් පනවනු මැනව, "ඇවැත්නි, අපට තින්දුකකන්දරයෙහි සෙනසුන් පනවනු මැනව, ඇවැත්නි, අපට තපෝද කන්දරයෙහි සෙන සුන් පනවනු මැනවි. ඇවැත්නි, අපට තපෝදාරාමයෙහි සෙනසුන් පනවනු මැනව. ඇවැත්නි, අපට ජීවකම්බ වන-යෙහි සෙනසුන් පනවනු මැනව. ඇවැත්නි අපට මද්දකුච්ඡි මිගදායෙහි සෙනසුන් පනවනු මැනවයි" කියයි.

7 මල්ල පුත්‍රවූ ආයුෂ්මත් දබ්බ ස්ථවිරයන් වහන්සේ තේජෝ ධාතුවට සමවැද ඇල්වනු ලබන ඇඟිල්ලෙන් යුක්තව ඒ භික්ෂූන්ට පෙරටු පෙරටුව යති. ඒ භික්ෂූන් වහන්සේලා ඒ ආලෝකයෙන්ම මල්ලපුත්‍රවූ ආයුෂ්මත් දබ්බ ස්ථවිරයන් ගේ පිටුපසින් යත්. ඒ භික්ෂූන් වහන්සේලාට මල්ලපුත්‍ර ආයුෂ්මත් දබ්බ ස්ථවිරයන් වහන්සේ මෙසේ සෙනසුන් පනවති මේ ඇඳය, මේ පුටුය, මේ ගුදිරිය, මේ මෙට්ටය, මේ වැසිකිලිය, මේ කැසිකිලිය, මේ පියයුතු පැන්ය, මේ පරි-භෝග කළයුතු පැන්ය, මේ සැරයටිය, මේ සංඝයාගේ කතිකා සටහනයි. මෙකල්හි පැමිණිය යුතුයි. මේ කාලයෙහි නික්මිය යුතුය කියයි. මල්ල පුත්‍ර ආයුෂ්මත් දබ්බ ස්ථවිර යන් වහන්සේ ඒ භික්ෂූන්ට සෙනසුන් පනවා නැවත වේළු-වනාරාමයට ආපසු යති.

8 එසමයෙහි මනාකී මෙත්තිය භුමමජක යන භික්ෂූන් වහන්සේලා නවකයෝද පින් අඩුවූවෝද වෙත්. යම්බඳුවූ නොවටිනා සෙනසුන් සංඝයාට පනවත්ද? ප්‍රණීත නොවූ

බත් කවද්ද, ඒ ඔවුන්ට පැමිණෙත්. එසමයෙහි වනාහි රජගහනුවර මනුෂ්‍යයෝ ස්ථවිර භික්ෂූන්ට නානා සම්භාරයන්ගෙන් යුක්ත පිණ්ඩපාත දීමම කැමැතිවෙත්. ඒ පිණ්ඩපාතය ගිතෙලින් යුක්තද, තෙලින් යුක්තද, ව්‍යඤ්ජනවලින් යුක්තද, වෙත්. මෛත්‍රිය භූම්මජක භික්ෂූන්ට කාඩි හොදි දෙමෙති කොට ඇති සුණුසහල් බත් ප්‍රකෘතිවිධයෙන්ම දෙත්. ඔවුහු පිණ්ඩපාතයෙන් වැලකී පසුබත් කාලයෙහි "ආයුෂ්මත් වරුනි, ඔබ වහන්සේලාට භත්තාග්‍රයෙහිදී කුමක් ලැබුණේ දැයි' ස්ථවිර භික්ෂූන් විචාරත්. ඇතැම් ස්ථවිරයන් වහන්සේලා මෙසේ කියත්. "ඇවැත්නි, අපට ගිතෙල්, තෙල්, ව්‍යඤ්ජනාදිය ලැබුණේයයි" කියති. මෛත්‍රිය භූම්මජක භික්ෂූන් වහන්සේලා මෙසේ කියත්, "ඇවැත්නි, අපට ඒ කිසිවක් නොවීය. ප්‍රකෘතියෙන්ම දෙන් සහිතවූ කාඩිහොදි දෙමෙතිකොට සුණු සහල් බත් පමණක් යයි" කීහ. එසමයෙහි වනාහී කල්‍යාණ භත්තික ගෘහපති තෙමේ සංඝයාට නිති බත් සතරක් දෙයි. හෙතෙම අඹුදරුවන් සහිතව පූජා සත්කාරකොට සංඝයා වළඳවයි. සමහරු බතින් විචාරත්. ඇතැම්හු ව්‍යඤ්ජනයෙන් විචාරත්. ඇතැම්හු තෙලින් විචාරත්. ඇතැම්හු කැවිලිවලින් විචාරත්.

9 එසමයෙහි වනාහි කල්‍යාණ භත්තික ගෘහපතියාගේ ගෙට බත පිණිස මෛත්‍රිය භූම්මජක භික්ෂූන්ට පමුණුවාදීමට සිදුවිය. එකල්හි කල්‍යාණ භත්තික ගෘහපති තෙමේ කිසියම් කටයුත්තක් පිණිස ආරාමයට ගියේය. හෙතෙම මල්ලපුත්‍ර ආයුෂ්මත් දබ්බ ස්ථවිරයන් වහන්සේ යම් තැනකද එතැනට එළඹියේය. එළඹ මල්ලපුත්‍ර ආයුෂ්මත් දබ්බ ස්ථවිරයන් වහන්සේට මනාකොට වැඳ එකත්පසක උන්නේය. එකත් පසක හුන්නාවූ කල්‍යාණ භත්තික ගෘහපතියාට ආයුෂ්මත් දබ්බ ස්ථවිරයන් වහන්සේ දැහැමි කථාවෙන් කරුණු දැක්වීය. සමාදන් කරවීය. තෙද ගැන්වීය. සතුටු කෙළේය. එකල්හි කල්‍යාණ භත්තික ගෘහපති තෙමේ මල්ල පුත්‍ර ආයුෂ්මත් දබ්බ ස්ථවිරයන් විසින් දැහැමි කථාවෙන් කරුණු දැක්වූයේ සමාදන් කරවූයේ තෙද ගැන්වූයේ

සතුටු කරවූයේ මල්ල පුත්‍ර දබ්බ ස්ථවිරයන්ට මෙසේ කීය. "ස්වාමීන් වහන්ස, අපගේ ගෙදර හෙට බත පිණිස කාවරෙකුම් පැවරිදැයි" කීය. "ගෘහපතිය, තොපගේ ගෙදර හෙට බත මෛත්‍රිය, භූම්මජක ස්ථවිර දෙනමට පවරන ලද්දේයයි" කීය. එකල්හි කල්‍යාණ භත්තික ගෘහපතියා නොසතුටු සිත් ඇත්තේ විය. "කෙසේ නම් පාප භික්ෂූන් අපගේ ගෙදර හෙට බත වළඳන්නෝදැයි" කියායි. ගෙට ගොස් දාසියට නියම කෙළේය. "යම්බඳුවූ නී හෙට බත් පිණිස එන්නාවුන්ට ගබඩා ගෙහි අසුන් පනවා කාඩි හොදි දෙවෙනිකොට සුණුසහලේ බතින් වළඳවයි" කියායි "ආර්‍ය්‍ය පුත්‍රය, එසේයයි" කියා ඒ දාසිය කල්‍යාණ භත්තික ගෘහපතියාට පිළිවදන් දුන්නාය.

10 එකල්හි මෛත්‍රිය, භූම්මජක භික්ෂූහු "ඇවැත්නි, අපට ඊයේ මිනාහි කල්‍යාණ භත්තික ගෘහපතියාගේ බතක් පවරන ලදුය. අපට හෙට අඹුදරුවන් සහිත කල්‍යාණ භත්තික ගෘහපතියා වළඳවන්නේය. (එහිදී) සමහරු බතින් අප පුදන්නාහුය. සමහරු කැවිලිවලින් පුදන්නාහුය. සමහරු තෙල්වලින් පුදන්නාහුය. සමහරු ව්‍යඤ්ජනවලින් පුදන්නාහුයයි" කියායි. ඔවුන් ඒ සන්තෝෂයෙන් යුක්තවම සිතේ හැටියට සයනයද නොකළාහුය.

11 එකල්හි මෛත්‍රිය, භූම්මජක භික්ෂූහු පෙරවරු කාලයෙහි ඇඳ පොරවා පාසිවුරු ගෙන කල්‍යාණ භත්තික ගෘහපතියාගේ නිවෙස යම්තැනකද එතැනට එළඹියාහුය. එන්නාවූ මෛත්‍රිය භූම්මජක භික්ෂූන් ඒ දාසිය දුරදීම දුටුවාය. දැක ගබඩා ගෙහි අසුන් පනවා මෛත්‍රිය, භූම්මජක භික්ෂූන්ට මෙසේ කීවාය. "ස්වාමීනි, හිඳගනුමයි" කියායි. එකල්හි මෛත්‍රිය භූම්මජක භික්ෂූන්ට මෙබඳු අදහසක් විය. 'යම් හෙයකින් අපි ගබඩා ගෙහි ආසනවල හිඳවුවාවූද සැක නැතිවම භක්ත සිද්ධිය නොවන්නේයයි' කියායි. එකල්හි ඒ දාසිතොමෝ කාඩි දෙවෙනිකොට ඇති කුඩු සහලේ බත් 'ස්වාමීනි, වළඳවයි" එළවීය. "නැඟණිය, අපි නිච්චා

භත්තිකයෝ වෙමු." "ආයුෂ්මත් මහත්සේලා තිච්ච භත්තික බව දනිමි. එතකුදුවුවත් මම ඊයේ ආයුෂී පුත්‍රයා විසින් කියන ලද පරිදි 'හෙට බත් පිණිස එනු නොවූයේව ගබඩාවෙහි ආසන පනවා, කැඳ දෙමෙතින්කොට කුඩු සහලේ බත් පිළිදවම"යයි කියනු ලදිමි. ස්වාමීනි, පිළිදනු මැනවියි" කීවාය.

12 එකල්හි මෙත්තිය භුම්මජක භික්ෂූන්ට මේ අදහසවිය. 'ඇවැත්නි, ඊයේ වනාහි කල්‍යාණ භත්තික ගෘහපතියා ආරාමයට ගියේය. මල්ලපුත්‍ර දබ්බ ස්ථවිරයන් ලඟ හුන්නේය. සැක නැතිවම මල්ල පුත්‍ර දබ්බ ස්ථවිරයන් විසින් ගෘහපති පුත්‍රයා හමුවෙහි "අපි භේදකරන ලද්දෙමුයයි" කියායි ඔවුහු ඒ දෙමිතයින්ම පුදුසු පරිදි නොමැලදුමාහුය. එකල්හි මෙත්තිය, භුම්මජක භික්ෂූහු පිණ්ඩපාතයෙන් මැලකී පසුබත් කාලයෙහි ආරාමයට ගොස් පා සිවුරු තැන්පත්කොට තබා වේළුවන විහාර පිට දොරටුවෙහි තුෂ්ණීම්භූතවද මිලානික සවභාවයෙන් කුදු සගිතවද හිස පහත්කොටද සිතිවිලි ඇතිවද කිසිවක් නොවැටහෙන්නවූන් මෙන්ද සිදගෙන හුන්නාහුය.

13 එකල්හි මෙත්තියා නම් භික්ෂුණී තොමෝ මෙත්තිය භුම්මජක භික්ෂූන් යම් තැනකද එතැනට එළඹියාය. එළඹ, මෙත්තිය භුම්මජක භික්ෂූන්ට මෙසේ කීවාය. (ii) "ආයුෂ්මත් වහන්සේලාට වඳිමිය"(iii) කියායි. මෙසේ කී කල්හි මෙත්තිය භුම්මජක භික්ෂූහු කථා නොකළාහුය. දෙවෙනි වරත්. (මෙහි (ii) ) කීවාය. තුන්වෙනි වරත්. (මෙහි (ii) ) කීවාය මෙත්තිය භුම්මජක භික්ෂූහු තුන්වෙනි වරවත් කථා නොකළාහුය. 'මම ආයුෂ්මත් වහන්සේලාට කවර වරදක් කෙළෙම්ද? කුමක් නිසා ආයුෂ්මත් වහන්සේලා මා සමග කථා නොකරන්නහුදැයි" කියායි "එසේ නම් නැගෙණිය, තී මල්ල පුත්‍ර දබ්බ ස්ථවිරයන් අප වෙහෙසව පත්කළ බව දන්නෙහිදැයි" ඇසූහ. "ඒ ගැණ ආයුෂ්මත් වහන්ස, මම කුමක් කරම්දැයි" කීවාය. "ඉදින් නැගණිය, කොපි කැමතිවන්නේ නම් අදම භාග්‍යවතුන් වහන්සේ මල්ලපුත්‍ර දබ්බයා පැවිදි බවින් නැසු මෙකු කරණසේක. එසේකරමියි' කියායි "ආයුෂ්මත් වහන්ස, මම කුමක් කරම්ද? මා විසින් කළහැකි දෙය කුමක්දැයි" කීවාය "නැගෙණිය, තී මෙහි එව, භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එතැනට එළඹව. එළඹ, භාග්‍යවතුන් වහන්සේට මෙසේ කියව.

14 (i) "ස්වාමීන් වහන්ස, මේ සුදුසු නොවන්නේය, නොගැලපෙන්නේය ස්වාමීනි, යම් දිශාවක් භයින් තොරද පීඩාවන්ගෙන් තොරද උපද්‍රවයන්ගෙන් තොරද ඒ දිශා තොමෝ භය සහිතය, පීඩා සහිතය, උපද්‍රව සහිතය, යමකින් වැසීම ඇතිවේද එයින්ම ඇවිළීමද ඇතිවේ. දියෙන් ගිනි මැදුනේයයි සිතමි. ආර්යවූ මල්ලපුත්‍ර දබ්බ ස්ථවිරයන් විසින් මම දූෂිත කරන ලද්දේ වෙමියි." කීයාය. (ii) "ආර්යයන් වහන්ස, එසේයයි" කියා මෛත්‍රීය භික්ෂුණී තොමෝ මෛත්‍රිය භූම්මජක භික්ෂූන්ට පිළිවදන්දී භාග්‍ය-වතුන් වහන්සේ යම් තැනෙකද එතනට එළඹියාය. එළඹ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පසක සිටියාය. එකත් පසක සිටියාවූ මෛත්‍රීය භික්ෂුණී තොමෝ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාය. (මෙහි (i))

15 එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙහිදී මේ සිද්ධියෙහිදී භික්ෂු සංඝයා රැස් කරවා ආයුෂ්මත්වූ මල්ල පුත්‍ර දබ්බ ස්ථවිරයන් අතින් විචාළේය. (ii) 'දබ්බය, තෝ මෙබඳු දෙයක් කළෙහිද? මේ භික්ෂුණියගේ කියමන සිහිකරන්නෙහිද?' "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මා දන්නාසේක." (iii) "දෙවෙනි වරත් (මෙහි (ii)) තුන්වෙනි වරත් (මෙහි (ii)) ආයුෂ්මත් මල්ලපුත්‍ර දබ්බ ස්ථවිරයන් වහන්සේට මේ ය් කීසේක "යම්බඳුවූ දෙයක් භික්ෂුණිය කියන්නීද දබ්බය තා එබඳු දෙයක් කෙළේයයි සිහිකරන්නෙහිද?" "ස්වාමීනි, යම්බඳුවූ මා භාග්‍යවතුන් වහන්සේ දන්නාසේකැයි කීය." "දබ්බය, පණ්ඩිතයෝ එපරිද්දෙන් විවෙචනය නොකරති. ඉදින් තා විසින් කරන ලද්දේ නම් කරන ලද්දේයයි කියව, ඉදින් නොකරන ලද්දේ නම් නොකළ බව කියව." "ස්වාමීනි, මා යම් අවස්ථාවක උපන්නේ නම් එතැන් පටන් සිහිනෙනුදු මෛථුන ධර්මසේවනයක් නොමදනිමි. නිදිවර්ජිත කරන්නහු ගැන කියනුම කවරේද?"

16 එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ඇමතූ-සේක "මහණෙනි, එසේවී නම් මෛත්‍රිය භික්ෂුණිය නසව්. (ශාසනයෙන් පහකරව්) මෙය යොදවකලද භික්ෂූන්ද සොය (දකිව්)" භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාරා විහාරයට පිවිසි සේක. එකල්හි ඒ භික්ෂූන් වහන්සේලා මෛත්‍රීය භික්ෂුණිය ශාසනයෙන් පහකළාහුය. එකල්හි මෛත්‍රිය භූම්මජ

භික්ෂූහු ඒ භික්ෂුණිය මෙසේ කීවාහුය. "ඇවැත්නි මෙත්තිය භික්ෂුණිය නොනසව්, ඕ තොමෝ කිසිවරදක් නොකළාය. අපි ඕ තොමෝ කුපිතවූද නොසතුටුවූද වචනවලින් දබ්බ තෙරුන්ට නෙරපන අදහසින් උත්සාහමත් කෙළෙමු. "ඇවැත්නි, කිමෙක්ද? තොපි ආයුෂ්මත් මල්ලපුත්‍ර දබ්බ ස්ථවිරයන්ට අමූලිකවූ පාරාජිකා ධර්මයෙන් චෝදනා කළාහුද?" "ඇවැත්නි, එසේයයි" කීහ. "යම්බඳුවූ අල්පේච්ඡ භික්ෂූහු වෙත්ද උන්වහන්සේලා දොස්කියත් නොසතුටුවෙත්. නොසතුටු වචන කථා කරත් "කෙසේ නම් මෙත්තිය, භුම්මජක භික්ෂූහු ආයුෂ්මත්වූ මල්ල පුත්‍ර දබ්බ ස්ථවිරයන්ට අමූලික පාරාජිකා ධර්මයෙන් චෝදනා කෙරෙත්දැයි" කියති.

17 (i) එකල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ සිද්ධියෙහි මේ හේතුවෙහි භික්ෂු සංඝයා රැස්කරවා භික්ෂූන් අතින් විචාළසේක (iii) "මහණෙනි, තොපි මල්ලපුත්‍ර දබ්බ ස්ථවිරයන්ට අමූලික පාරාජිකා ධර්මයෙන් චෝදනා කළාහුය යනු සැබෑද?" "භාග්‍යවතුන් වහන්ස, සැබෑවයි" කීහ. භාග්‍යවත් බුදුන් වහන්සේ ගර්හා කළසේක. (I සංඝාදිසේසයේ 6 (ii) හිස් පුරුෂයෙනි, තොපි කෙසේ නම් මල්ලපුත්‍ර දබ්බ ස්ථවිරයන්ට අමූලිකවූ පාරාජිකා ධර්මයෙන් චෝදනා කරන්නාහුද? හිස් පුරුෂයිනි, මෙය නොපැහැදියන්ගේ පැහැදීම පිණිස හෝ (මෙහි 2 පාරාජිකයේ 11 ඡේදයේ (ii) 'මෙය' යන තැන සිට යොදනු.) මහණෙනි, එසේද මේ ශික්ෂාපදය උදෙසව්.

18 යම් භික්ෂුවක් ද්වේෂයෙන් දූෂිතවූයේ නොසතුටුවූ සිත් ඇත්තේ, යම ඒ භික්ෂුවක් වේද ඔහු මේ ශාසනයෙන් පහකරන්නෙමියි අමූලික පාරාජිකා ධර්මයෙන් චෝදනා කරන්නේද, ඊට පසුව ඒ විනිශ්චය කරනු ලබන්නේ හෝ විනිශ්චය නොකරනු ලබන්නේ හෝ ඒ අධිකරණය අමූලික බව ඔප්පුවේනම් ඒ චෝදක භික්ෂුහු දොස් ලැබිය යුත්තෝ වන්නාහ. ඔවුන්ට සංඝාදිසේස ඇවැත්ද වේ.

19 "යමෙක් වනාහි" යනු "භික්ෂුවක්" යනු (මෙහි 1 පාරාජිකයේ පදභාජනීයේ 1 2 ඡේද)। මේ අර්ථයෙහි අදහස් කළ භික්ෂුවයි. භික්ෂු යනු අන්‍ය භික්ෂූන් යනුයි. "දුෂ්ටවූයේ,

දූෂිතවූයේ" යනු කුපිතවූද නොසතුටු සිත් ඇත්තාවූද පුව නොවූද සිත තද බවට පැමිණියාවූද භික්ෂුවයි. "නොසතුටු වූයේ" යනු ඒ කෝපයෙනුත් ඒ දොෂයෙනුත් ඒ නොසතුටෙනුත් ඒ නොසැපයෙනුත් ප්‍රීතියක් නොලැබූ තැනැත්තේ වෙයි. "අමූලක" යනු නොදක්නා ලද්දවූද, නො අසන ලද්දවූද සැක නොකරන ලද්දවූද යනුයි "පාරාජිකා ධර්මයකින්" යනු සතර පාරාජිකාවන්ගෙන් එක්තරා එකකින් යනුයි. "සෙවපත් කරන්නේය" යනු චෝදනා කරයි හෝ චෝදනා කරවයි හෝ යනුයි. "ඔහු මේ ශාසනයෙන් බැහැර කරන්නෙම් නම් යහපති" යනු භික්ෂුභාවයෙන් තොරකරන්නෙම්, ශ්‍රමණ ධර්මයෙන් ශීලස්කන්ධයෙන් තොරකරන්නෙම්, තපොගුණයෙන් තොරකරන්නෙම් යනුයි. "ඊට මෑත කාලයක" යනු යම් ක්ෂණයෙක්හි චෝදනා කරන ලද්දේ නම් ඒ ක්ෂණය ඒ අවස්ථාව ඒ මොහොත ඉක්මීගිය කල්හි යනුයි. "විචාරණු ලබන්නේ හෝ" යනු යම් වස්තුවකින් චෝදනා කෙළේද, ඒ වස්තුවෙහි විචාරීමයි. "විචාරණු නොලබන්නේ හෝ" යනු කිසිවෙකු විසින් නොකියන ලද්දේ යනුයි.

"අධිකරණ (නඩු නම්) විවාදාදිකරණ වාද නඩු අනුවාදාදිකරණ දෝෂාරෝපණ නඩු, ආපත්ත්‍යාධිකරණ ඇවැත් නඩු කිච්චාධිකරණ සංඝකර්ම නඩු" යනු සතර අධිකරණයෝය. "භික්ෂුව දෝෂය පිළිගනී" යනු හිස්වූ දෙයක් මා විසින් කියන ලදී. බොරුවක් මා විසින් කියන ලදී. අභූතයක් මා විසින් කියන ලදී. නොදත මා විසින් කියන ලදී යනුයි. "සංඝාදිසේස" යනු (මෙහි 1 සංඝාදිසේසයේ 9 (ii) එයින් සංඝාදිසේස කියන ලදී.

20 පාරාජිකා ධර්මයට පැමිණියේ නොදක්නේ වේද හෙතෙම චෝදනා කරාද මා විසින් පාරාජිකා ධර්මයට පැමිණියා දක්නෙමියි කියා චෝදනා කෙරේද, (ii) අශ්‍රමණයෙක් වූයෙහිය, අශාක්‍ය පුත්‍රයෙක් වූයෙහිය තා සමග පොහොය කර්ම කිරීම හෝ පවාරණ කිරීම හෝ සංඝ කර්ම කිරීම හෝ නැතැයි (iii) කියා නම් වචනයක් වචනයක් පාසා සංඝාදිසේස ඇවැත්වේ.

21 පාරාජිකා ධර්මයට පැමිණියේයයි නොඅසන ලද පුද්ගලයා විසින් පාරාජිකා ධර්මයට පැමිණියේයයි කියාද (මෙහි 20 (ii) චෝදනා කරන්නේ නම් වචනයක් වචනයක් පාසා සංඝාදිසේස ඇවැත්වේ.

22 සැක නොකරන්නහුටද පාරාජිකා ධම්මයට පැමිණියේයයි චෝදනා කෙරේද පාරාජිකා ධම්මයට පැමිණියේයයි මා විසින් සැක කරන ලද්දේ (මෙහි 20 (ii) කියාද වචනයක් වචනයක් පාසා සංඝාදිසේස ඇවැත්වේ.

23 පාරාජිකා ධම්මයට පැමිණෙන්නේ නමුදු ඔහු විසින් නොදක්නාලද්දේ වේද ඔහු පාරාජිකා ධම්මයට පැමිණියේයයි චෝදනා කෙරේද, මා විසින් දක්නාලද්දේයයිද අසන ලද්දේයයිද චෝදනා කෙරේද, (මෙහි 20 (ii) කියායි. ඔහුට වචනයක් වචනයක් පාසා සංඝාදිසේස ඇවැත්වේ.

24 පාරාජිකා ධම්මයට පැමිණියේයයි චෝදනාය නො දක්නා ලද්දේ වෙයි. ඔහුද මා විසින් දක්නාලදී. සැකකරන ලදී. පාරාජිකා ධම්මයට පැමිණියේ වෙහිය. (මෙහි 20 (ii) වචනයක් වචනයක් පාසා සංඝාදිසේස ඇවැත්වේ.

25 (i) යම් පුද්ගලයෙක් පාරාජිකා ධම්මයට පැමිණෙන ලද බව නොදක්නා ලද්දේද (ii) ඔහු පාරාජිකා ධම්මයට පැමිණියේ වෙහිය. මා විසින් දක්නාලදී. අසනලදීයයිද, සැකකරන ලදීයයිද චෝදනා කෙරේද, (මෙහි 20 (ii) ) (iii) වචනයක් වචනයක් පාසා සංඝාදිසේස ඇවැත්වේ. (iv)

26 පාරාජිකා ධම්මට පැමිණියේය කියා නොඇසූ පුද්ගලයාටද අදහසක් වෙයි. ඔහුද මම ඇසුවෙමි. සැක කෙළෙමි කියා චෝදනා කරයි. (මෙහි 20 (ii) මා විසින් අසන ලදි. දකින ලදී. (මෙහි 20 (ii) සහ 25 (iii) )

27 (මෙහි 25 (i) මා විසින් පාරාජිකා ධම්මයට පැමිණියේ යයි මම ඇසීමි මම සැක කෙළෙමි මම දක්නෙමි. (මෙහි 20 (ii) වචනයක් වචනයක් පාසා සංඝාදිසේස ඇවැත්වේ.

28 (මෙහි 25 (i) ) සැක නොකරන ලද්දහුට පාරාජිකා පැමිණියේය කියා අදහසක් වෙයි. ඔහුද මම සැකකෙළෙමි. දක්නෙමියි චෝදනා කරයි. (මෙහි 20 (ii) සහ 25 (iii) )

29 (මෙහි 25 (i) මම සැක කෙළෙමි. දක්නෙමි. (මෙහි 20 (ii) සහ 25 (iii) )

30 මෙහි 25 (i) මම සැක කරමි. දැක්කෙමි. ඇසුවෙමි. පාරාජිකා ධර්මයට පැමිණියේයයි චෝදනා කරයි. (මෙ 2 (ii) සහ 25 (iii)

31 පාරාජිකා ධර්මයට පැමිණියේයයි දක්නා ලද්දහුව ද අදහසක් වෙයි. ඔහුද පාරාජිකා ධර්මයට පැමිණියෙහිය. ඇසුවෙමියි චෝදනා කරයි. (මෙහි 20 (ii) සහ 25 (iii) )

32 පාරාජිකා ධර්මයට පැමිණියේයයි දක්නා ලද්දහුව ද අදහසක් වෙයි. ඔහුද චෝදනා කරයි. පාරාජිකා ධර්මයට පැමිණියේයයි මම සැක කරමියි කියයි. (මෙහි 20(ii) සහ 25(iii) )

33 පාරාජිකා ධර්මයට පැමිණියේයයි මම ඇසුවෙමි. මම සැකකරමියි කියා චෝදනා කරයි. (මෙහි 20 (ii) සහ 25 (iii) )

34 (i) පාරාජිකා ධර්මයට පැමිණියේයයි අසන ලද්දහුව ද අදහසක් වෙයි. (ii) ඔහුද සැකකරන ලද්දේ චෝදනා කරයි. (මෙහි 20 (ii) සහ 25 (iii) )

35 (මෙහි 34 (i) මා විසින් දක්නා ලද්දේ කියාද (මෙහි 20 (ii) සහ 25 (iii) )

36 පාරාජිකා ධර්මයට පැමිණියේ මම දැක්කෙමියි චෝදනා කරයි. (මෙහි 20 (ii) සහ 25 (iii) )

37 පාරාජිකා ධර්මයට පැමිණියේයයි සැක කරන්නහුට ද අදහසක් වෙයි. ඔහුද පාරාජිකා ධර්මයට පැමිණියේ වෙයි යයි මම දැක්කෙමියි චෝදනා කරයි. (මෙහි 20 (ii) සහ 25 (iii))

38 පාරාජිකා ධර්මයට පැමිණියේයයි සැකකරන්නහුට ද අදහසක් වෙයි. ඔහුද පාරාජිකා ධර්මයට පැමිණියේයයි මම දැක්කෙමියි චෝදනාකරයි. (මෙහි 20 (ii) සහ 25 (iii) )

39 පාරාජිකා ධර්මයට පැමිණියේ මම ඇසුවෙමියි චෝදනාකරයි. (මෙහි 20 (ii) සහ 25 (iii) )

40 පාරාජිකා ධර්මයට පැමිණියේ මම දැක්කෙමියි චෝදනා කරයි. මෙහි 20 (ii) සහ 26 (iii) )

41 පාරාජිකා ධර්මයට පැමිණියේ දක්නාලද්දහුව ද අදහසක් වෙයි දැකීමෙහි විමතියක් ඇතිවූයේ දැකීම නොඅදහයි දැකීම සිහිනොකරයි, දැකීමෙහි මුලාවෙයි. (මෙහි 20 (ii) සහ 25 (iii) )

42 පාරාජිකා ධර්මයට පැමිණියේයයි අසන ලද්දහුට ඇසීමෙහි විමතියක් වෙයි. ඇසීම නොඅදහයි, ඇසීම සිහි නොකරයි, ඇසීමෙහි මුළාවෙයි. (මෙහි 20 (ii) සහ 25 (iii) )

43 (i) පාරාජිකා ධර්මයට පැමිණියේයයි සැක කිරීමෙහි විමතියක් වෙයි, සැකකිරීම නොඅදහයි, සැක සිහි නොකරයි, සැකයෙහි මුළාවෙයි. (ii) ඔහුද මම සැක කෙළෙමියි දක්නෙමියි චෝදනා කරයි. (මෙහි 20 (ii) සහ 25 (iii) )

44 (මෙහි 43 (i) ) ඔහුද මම සැක කෙළෙමි, ඇසුවෙමි, චෝදනා කරයි. (මෙහි 20 (ii) සහ 25 (iii) )

45 (මෙහි 43 (i) ) මම පාරාජිකා ධර්මයට පැමිණියේයයි සැක කෙළෙමි, දක්නෙමි, ඇසුවෙමියි චෝදනා කරයි. (මෙහි 20 (ii) සහ 25 (iii) )

46 පාරාජිකා ධර්මයට පැමිණියේ නොදක්නා ලද්දහුට අදහසක් වෙයි. (ii) ඔහුද පාරාජිකා ධර්මයට පැමිණියේවේයයි චෝදනා කරයි. (iii) (මෙහි 20 (ii) සහ 25 (iii) )

47 පාරාජිකා ධර්මයට පැමිණියේයයි නොඅසන ලද්දහුවද අදහසක් වෙයි, (මෙහි 46 (ii) ) (මෙහි 20 (ii) සහ 25 (iii) )

48 පාරාජිකා ධර්මයට පැමිණියේයයි සැක නැත්තහුවද අදහසක් වෙයි. ඔහුද පාරාජිකා ධර්මයට පැමිණියේයයි චෝදනා කරයි. (මෙහි 20 (ii) සහ 25 (iii) )

49 (i) පාරාජිකා ධර්මයට පැමිණියේ නොදුටුවහුවද අදහසක් වෙයි ඔහුද චෝදනා කරයි. (ii) දක්නෙමිය, ඇසුවෙමිය. කියා චෝදනා කරයි. (මෙහි 20 (ii) සහ 25 (iii) )

50 (මෙහි 49 (i) දක්නෙමිය, සැකකෙළෙමිය (මෙහි 20 (ii) සහ 25 (iii) )

51 (මෙහි 49 (i) දක්නෙමිය ඇසුවෙමිය. සැක කෙළෙමිය. පාරාජිකා ධර්මයට පැමිණියෙහි(මෙහි 20 (ii) සහ 25 iii))

52 (i) පාරාජිකා ධර්මයට පැමියේයයි නොඇසුවහුවද අදහසක් වෙයි. ඔහුද චෝදනා කරයි. (ii) ඇසුවෙමිය. සැක කෙළෙමිය (මෙහි 20 (ii) සහ 25 (iii) )

53 (මෙහි 52 (i) ඇසුවෙමිය, දක්නෙමිය (මෙහි 20 (ii) සහ 25 (iii) )

54 (මෙහි 52 (i) ඇසුවෙහිය, සැකකෙළෙහිය, දුක්වෙහිය (මෙහි 20 (ii) සහ 25 (iii) )

55 (i) පාරාජිකා ධර්මයට පැමිණියේයයි සැකකොකළහු-වද අදහසක් වෙයි. (ii) සැක කෙළේය, දුක්කෝයයි චෝදනා කරයි' (මෙහි 20 (ii) සහ 25 (iii) )

56 (මෙහි 52 (i) ) සැකකෙළේය, ඇසුවේයයි චෝදනා කරයි. (මෙහි 20 (ii) සහ 25 (iii) )

57 පාරාජිකා ධර්මයට පැමිණෙහිය, එය සැකකෙළෙහිය දක්නෙහිය, ඇසුවෙහිය (මෙහි 20 (ii) සහ 25 (iii) )

58 (i) පාරාජිකා ධර්මයට පැමිණියේයයි දක්කහුවද අදහසක් වෙයි. (ii) ඔහුද චෝදනා කරයි. ඇසුවෙහිය (මෙහි 20 (ii) සහ 25 (iii) )

59 (මෙහි 58 (i) ඔහුද චෝදනා කරයි. සැකකෙළෙහිය, (මෙහි 20 (ii) සහ 25 (iii) ) පාරාජිකා ධර්මයට පැමිණියෙහිය, අශ්‍රමණයෙක් වෙහිය කියා චෝදනා කරයි. වචනයක් වචනයක් පාසා සංඝාදිශේෂ ඇවැත්වේ.

60 (i) පාරාජිකා ධර්මයට පැමිණියේයයි ඇසූවහුවද අදහසක් වෙයි. ඔහුද චෝදනා කරයි, (මෙහි 20 (ii) සහ 25 (iii) )

61 පාරාජිකා ධර්මයට පැමිණියේයයි සැක කොළහුවද අදහසක් වෙයි ඔහුද චෝදනා කරයි. (ii) දක්නා ලද්දෙහිය. (මෙහි 20 (ii) සහ 25 (iii) )

62 (මෙහි 61 (i) අසන ලද්දෙහිය, (මෙහි 20 (ii) සහ 25 (iii) )

63 පාරාජිකා ධර්මයට පැමිණියේ දක්නා ලද්දේයයි, චෝදනා කරයි. (මෙහි 20 (ii) සහ 25 (iii) )

64 (i) පාරාජිකා ධර්මයට පැමිණියේ දුක්කහුවද අද-හසක් වෙයි. (ii) දැකීමෙහි විමතියක් වෙයි. දැකීම නො අදහයි. දැකීම සිහි නොකරයි. දැකීමෙහි මුළා වෙයි. (මෙහි 20 (ii) 25 (iii) )

65 (මෙහි 64 (i) ඇසීමෙහි විමතියක් වෙයි. ඇසීම නොඅදහයි, ඇසීම සිහිනොකරයි. ඇසීමෙහි මුළා වෙයි (මෙහි 20 (ii) සහ 25 (iii) )

66 (මෙහි 64 (i) සැකයෙහි විමතියක් වෙයි සැකය නොඅදහයි. සැකය සිහි නොකරයි, සැකයෙහි මූලා වෙයි. ඔහුද චෝදනා කරයි. සැක ක්ලේශය, දුක්කෝඨය. (මෙහි 25 (iii))

67 (මෙහි 65 ඡේදය "සැකය" වෙනුවට "සැක ක්ලේශය. දුක්කෝඨය" යොදන්න.)

68 (මෙහි 66 ඡේදයේ "සැකය" වෙනුවට "සැක ක්ලේශය, දුක්කෝඨය, ඇනුවේය" යොදන්න.)

69 අශුද්ධියෙහි ශුද්ධ දෘෂ්ටිමද, ශුද්ධියෙහි අශුද්ධ දෘෂ්ටිමද, අශුද්ධියෙහි අශුද්ධ දෘෂ්ටිමද, ශුද්ධියෙහි ශුද්ධ දෘෂ්ටිමද, යනු සතරක් වෙයි. එක්තරා පාරාජිකාවකට පැමිණි පුද්ගලයා අශුද්ධ වෙයි. ඔහුද ශුද්ධ දෘෂ්ටි ඇත්තේ අවකාශ නොකොට අදහස් පරිදි වචන කියයි. සංඝාදිශේෂයෙන් දුකුලා ඇවැත් වේ.

70 එක්තරා පාරාජිකා ධර්මයකට පැමිණියේ පුද්ගල තෙම අශුද්ධ වෙයි. ඔහුද ශුද්ධවූ දෘෂ්ටි ඇත්තේ අවකාශ කරවා අදහස් පරිදි වචන කියයි. සංඝාදිශේෂ ඇවැත්වේ.

71 එක්තරා පාරාජිකා ධර්මයකට පැමිණි පුද්ගලයා අශුද්ධ වෙයි, ඔහුද ශුද්ධ දෘෂ්ටි ඇත්තේ අවකාශ නො කොට ආක්‍රොශ අදහස් ඇත්තේ වචන කියයි, මුසාවාදයෙහි දුකුලා ඇවැත් වේ.

72 පුද්ගලතෙම එක්තරා පාරාජිකා ධර්මයට පැමිණියේ අශුද්ධ වෙයි, ඔහුද ශුද්ධ දෘෂ්ටි ඇත්තේ අවකාශ කරවා ආක්‍රොශ අදහසින් වචන කියයි. ඒ ආක්‍රොශයෙන් ඇවැත් වේ.

73 පුද්ගලයා එක්තරා පාරාජිකා ධර්මයකට නොපැමි- ණියේ ශුද්ධ වෙයි, ඔහුද අශුද්ධ දෘෂ්ටි ඇත්තේ අවකාශ නොකොට අදහස් පරිදි වචන කීයාද දුකුලා ඇවැත්වේ.

74 පුද්ගලතෙම එක්තරා පාරාජිකා ධර්මයකට නොපැමිණ ශුද්ධ වෙයි. ඔහුද අදෘෂ්ටියෙන් යුක්තවූයේ අවකාශ කරවා අදහස් පරිදී වචන කියයි. ඇවැත් නැත්තේය.

75 පුද්ගලතෙම එක්තරා පාරාජිකා ධර්මයකට නොපැමිණියේ ශුද්ධ වෙයි. ඔහුද අශුද්ධවූ දෘෂ්ටි ඇත්තේ අව නොකොට ආක්‍රොශ කිරීමේ අදහසින් වචන කියයි. මුසාවාදයෙන් දුකුලා ඇවැත්වේ.

76 පුද්ගලයා එක්තරා පාරාජිකා ධර්මයකට නොපැ–ණියේ ශුද්ධ වෙයි ඔහුද අශුද්ධවූ දෘෂ්ටි ඇත්තේ අවකාශ කරවා ආක්‍රොශ කිරීමේ අදහසින් වචන කියයි. ආක්‍රොශයෙන් ඇවැත් වේ.

77 (i) පුද්ගලයා එක්තරා පාරාජිකාවකට පැමිණ අශුද්ධ වෙයි. ඔහුද දෘෂ්ටි ඇත්තේ (ii) අවකාශ නොකොට අදහස් පරිදි වචන කියයි. දුකුලා ඇවැත්වේ.

78 (මෙහි 77 (i) ) අවකාශ කරවා අදහස් පරිදි වචන කියා නම් ඇවැත් නොවේ.

79 (මෙහි 77 (i) ) අනෝකාශ කොට ආක්‍රොශ අභිප්‍රාය–යෙන් (නපුරු වචන කියා බැණීමේ අදහසින්) වචන කියා නම් ආක්‍රොශයෙන් දුකුලා ඇවැත්වේ.

80 (මෙහි 77 (i) ) අවකාශකොට ආක්‍රොශ අදහසින් වචන කියා නම් ඕමසවාද ඇවැත්වේ.

81 (i) පුද්ගලයා එක්තරා පාරාජිකා ධර්මයකට නොපැමිණියේ ශුද්ධ වෙයි. ඔහුද ශුද්ධ දෘෂ්ටි ඇත්තේ (ii) අවකාශ නොකොට අදහස් කළ වචන කියාද සංඝාදිසේසයෙන් දුකුලා ඇවැත්වේ.

82 (මෙහි 81 (i) අවකාශ කරවා අදහස් පරිදි වචන කියාද, සංඝාදිසේස ඇවැත්වේ.

83 (මෙහි 81 (i අවකාශ නොකොට ආක්‍රොශ අද–හසින් වචන කියාද ඒ ආක්‍රොශයෙන් දුකුලා ඇවැත්වේ.

84 (මෙහි 81 (i) අවකාශකොට ආක්‍රොශ කිරීමේ අදහසින් වචන කියාද ඒ ආක්‍රොශයෙන් ඇවැත්වේ,

85 අශුද්ධි දෘෂ්ටි ඇති ශුද්ධ පුද්ගලයාටද, අශුද්ධ දෘෂ්ටි ඇති අශුද්ධ පුද්ගලයාටද, උම්මත්තකයාටද, ආදිකර්මිකයාටද, ඇවැත් නොවේ,

(8 අමූලක සංඝාදිසේසය නිමියේය )

# 9 සංඝාදිසේසය

1 එසමයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම්වූ වේළුවනාරාමයෙහි වැඩ වාසය කරනසේක. එසමයෙහි වනාහි මෙත්තිය භුම්මජක භික්ෂූ දෙනම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නාවූ එළුදෙනකු සමග කාමසේවනය කරන එළුවෙකු දුටුවාහුය. දැක මෙසේ කීවාහුය "ඇවැත්නි, එසේ නම් අපි දබ්බ මල්ලපුත්‍ර ස්ථවිරයන් මේ එළුවා වශයෙන් නම් කරමු මේ එළුදෙන මෙත්තියා භික්ෂුණිය කොට නම් කරමු. අපි මෙසේ ව්‍යවහාර කරමු. 'ඇවැත්නි, අපි මීට පූර්වයෙහි දබ්බ මල්ල පුත්‍ර ස්ථවිරයන් පිළිබඳ කාරණය ඇසීමෙන් කීවෝවෙමු. දැන් වනාහි මෙත්තියා භික්ෂුණිය සමග මරදවා හැසිරීම අප විසින් තුමූම දක්නා ලද්දෝවෙමු

2 "ඔවුහු ඒ එළුවා දබ්බමල්ලපුත්‍ර නම් භික්ෂුව කළාහුය. ඒ එළුදෙන මෙත්තියා නම් භික්ෂුණිය කළාහුය. ඔවුහු භික්ෂූන්ට සැලකළාහුය. "ඇවැත්නි, අපි මීට පෙර ඇසීමෙන් දබ්බ මල්ල පුත්‍රයන් පිළිබඳ කාරණය කීවෝවෙමු. දැන් වනාහි අප විසින්ම මෙත්තියා භික්ෂුණිය සමග මැරදී හැසිරීමෙහි යෙදුන බව දක්නා ලද්දේයයි" කියායි. භික්ෂූහු මෙසේ කීවාහුය. "ඇවැත්නි. මෙසේ නොකියව්. ආයුෂ්මත්වූ දබ්බ මල්ල පුත්‍ර ස්ථවිරයෝ එසේ නොකරන්නෝයි" කියායි

3 එකල්හි ඒ භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ සිද්ධියෙහි භික්ෂු සංඝයා රැස්කරවා ආයුෂ්මත්වූ දබ්බ මල්ල පුත්‍ර ස්ථවිරයන් අතින් විචාළසේක. "(ii) දබ්බය, මේ භික්ෂූන් වහන්සේලා යමක් කියන්නාහු නම් එබන්දක් කළ බව සිහිකරන්නෙහිද?" "ස්වාමීන් වහන්ස, යම්බඳුවූ මා භාග්‍යවතුන් වහන්සේ දන්නාසේක්මැයි" කීය. (iii) භාග්‍යවතුන් වහන්සේ දෙවෙනි වරත් අසා වදාළසේක (මෙහි (ii)) තුන්වෙනි වරත් භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත්වූ දබ්බ මල්ල පුත්‍ර ස්ථවිරයන්ට මෙසේ වදාළසේක. (මෙහි(ii)) "දබ්බය, පණ්ඩිතයෝ මෙපරිද්දෙන් පෙළෙම් නොකරිත්. (සම්පූර්ණ නිරණයකට නොබසිත්) උදින් තොප විසින්

කරන ලද්දේ නම් කරනලද බව කියව. ඉදින් නොකරණ ලද්දේ නම් නොකරණලද බව කියමයි" කීහ." "ස්වාමීනි, මා යම් අවස්ථාවක උපන්නේ නම් එතැන් පටන් සිහිනෙන් හමුදු මෛථුන ධර්ම සේවනයක් කළ බව නොමදනිමි. පිබිද සිටියදී කියනුම කවරේද"යි කියායි.

4 එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ඇමතූසේක. "මහණෙනි, එසේ වීනම් මෙ භික්ෂුණී ගොයා දන ගනුවයි" කියායි. මෙසේ කියා භාග්‍යවතුන් වහන්සේ අසුනෙන් නැගිට විහාරයට පිවිසීසේක.

5 එකල්හි ඒ භික්ෂූන් වහන්සේලා මෛත්තිය භූමමජක භික්ෂූන් සෙව්වාහුය. ඒ භික්ෂූන් විසින් සොයනු ලබන්නාහු හමුවූ මෛත්තිය භූමමජක භික්ෂූන්ගෙන් "ඇවැත්නි, තෙපි කුමක් නිසා ආයුෂ්මත් දබ්බ මල්ලපුත්‍ර ස්ථවිරයන්ට එක්තරා කොටසක අධිකරණයක් පිළිබඳ කිසියම් ස්වල්ප මාත්‍රයක් ගෙන පාරාජිකා ධර්මයෙන් චෝදනා කරන්නාහුදැයි" කියායි. "එසේයි ඇවැත්නියි" කීහ. යම් ඒ අල්පේච්ඡ භික්ෂූහු වෙද්ද දොස් කීහ. උසස්සේ දොස් කීහ. නොසතුට ප්‍රකාශ කළාහ. "කෙසේ නම් මෛත්තිය භූමමජක භික්ෂූහු ආයුෂ්මත් දබ්බ මල්ල පුත්ත ස්ථවිරයන්ට එක්තරා කොටසක අධිකරණයක් පිළිබඳ කිසියම් ස්වල්ප මාත්‍රයක් ගෙන පාරාජිකා ධර්මයෙන් චෝදනා කෙරෙද්ද" කියායි.

6 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැළකළාහ. (මෙහි 1 සංඝාදිසෙසයේ 6 (ii) සහ 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v) සොදන්න) මහණෙනි, තෙපි එක්තරා කොටසක අධිකරණයක් පිළිබඳ කිසියම් ස්වල්ප මාත්‍රයක් ගෙන දබ්බ මල්ල පුත්‍ර ස්ථවිරයන්ට පාරාජිකා ධර්මයෙන් චෝදනා කරන්නාහු යනු සැබෑද?" කියායි. "භාග්‍යවතුන් වහන්ස, සැබව" භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගැරහූසේක. "හිස් පුරුෂයෙනි, තොපි කෙසේනම් මනුෂ්‍ය භාවයෙන් අනික් කොටස් ඇති කමක් පිළිබඳ කිසියම් ලේශ මාත්‍රයක්ගෙන දබ්බ මල්ල පුත්‍ර ස්ථවිරයන්ට පාරාජිකා ධර්මයෙන් චෝදනා කරන්නාහුද? හිස් පුරුෂයෙනි, ෙ

කාරණය (1 පාරාජිකයේ සුදින්න බණ වරෙහි 30 (v) ඇවැත්ති යක්කහැර යොදන්න) මහණෙනි, මෙසේද වනාහි මේ ශික්ෂාපදය උදෙසව්.

7 ''යම් මහණෙක් ඔහු මේ ශාසනයෙන් පහකරන්නේ නම් යෙහෙකැයි කියා ද්වේෂයෙන් දූෂිතවූයේ නොසතුටු සිත් ඇත්තේ මිනුෂ්‍ය භාවයෙන් අනික් කොටස් ඇති නමක් පිළිබඳ කිසියම් සවල්පයක් ගෙණ භික්ෂුවකට පාරාජිකා ධර්මයෙන් චෝදනා කරන්නේද ඊට පසු කාලයෙක්හි කැඳවනු ලබන්නේ හෝ නොකැඳවනු ලබන්නේ හෝ ඒ අධිකරණය මිනුෂ්‍ය භාවයෙන් පිටත් දෙයක්වේද කිසියම් සවල්පයක් ගෙණ කරන ලද්දක් වේද භික්ෂුව දෝෂයෙහි පිහිටාද සංඝාදිසේස ඇවැත් වේ.''

8 ''යම්බඳුවූ යනු ''භික්ෂුව'' යනු (1 පාරාජිකයේ පදභාජනියේ 1–8 යොදන්න) ''භික්ෂුවක්'' යනු අන් භික්ෂුවක් වෙයි. ''ක්‍රොධයෙන් කිපුනේ'' යනු කුපිතවූයේ නොසතුටු සිත් ඇත්තේ නොඇලීම්වූයේ සිත් තැවුල් ඇතියේ තද බවට පැමිණියේ යනුයි. ''ප්‍රීතියෙන් තොරවූයේ'' යනු ඒ කෝපයෙන්ම ඒ දෝෂයෙන්ම ඒ නොසතුටුවෙන්ම ඒ නොඇලීමෙන්ම නොසතුටු බවට පැමිණියේ යනුයි. ''අන් කොටස් ඇතිනමක්'' යනු ඇවැත් වශයෙන් අන් කොටස් ඇති හෝ නම් වශයෙන් අන් කොටස් ඇති හෝ යනුයි.

9 අධිකරණයාගේ අධිකරණ අන්‍යභාගිය (අන්‍යවූ කොටස) කෙසේද? විවාදාධිකරණය අනුවාදාධිකරණයට ආපත්ත්‍යාධිකරණයටද කිච්චාධිකරණයටද අන්‍යභාගියවේ. අනුවාදාධිකරණය ආපත්ත්‍යාධිකරණයටද කිච්චාධිකරණයටද විවාදාධිකරණයටද අන්‍යභාගියවෙයි. ආපත්ත්‍යාධිකරණය කිච්චාධිකරණයටද විවාදාධිකරණයටද අනුවාදාධිකරණයටද අන්‍යභාගියවේ. කිච්චාධිකරණය විවාදාධිකරණයටද අනුවාදාධිකරණයටද අන්‍යභාගියවේ මෙසේ අධිකරණය අධිකරණයට අන්‍යභාගියවේ. කෙසේ නම් අධිකරණය අධිකරණයට තබ්භාගිය (සමාන) වේද? විවාදාධිකරණය විවාදාධිකරණයට තබ්භාගියවේද? අනුවාදාධිකරණය අනුවාදාධිකරණයට තබ්භාගියවේ. ආපත්ත්‍යාකරණය ආපත්ත්‍යාධිකරණයට තබ්භාගියද

වන්නේය. අසදෘශභාගිකද වන්නේය. කෙසේ න ආපත්ත්‍යාධිකරණය ආපත්ත්‍යාධිකරණයට අසදෘශභාගික වන්නේද? මෛථුන ධර්ම පාරාජිකාපත්තිය, අදින්නාදාන පාරාජිකාපත්තියටද මනුෂ්‍ය විග්‍රහ පාරාජිකා පත්තිය උත්තරි මනුෂ්‍ය ධම්ම පාරාජිකා පත්තියටද අසදෘශභාගික වේ. අදින්නාදාන පාරාජිකා පත්තිය මනුෂ්‍ය විග්‍රහ පාරාජිකා පත්තියටද උත්තරිමනුෂ්‍ය ධම්ම පාරාජිකා පත්තිය මෛථුන ධර්ම පාරාජිකා පත්තියටද අසදෘශභාගික වේ. මනුෂ්‍ය විග්‍රහ පාරාජිකා පත්තිය උත්තරිමනුෂ්‍ය ධම්ම පාරාජිකා පත්තියටද මෛථුන ධර්ම පාරාජිකා පත්තිය අදින්නාදාන පාරාජිකා පත්තියටද අසදෘශභාගික වේ. උත්තරි මනුෂ්‍ය ධර්ම පාරාජිකා පත්තිය මෛථුන ධර්මපාරාජිකා පත්තියටද අදින්නාදාන පාරාජිකා පත්තිය මනුෂ්‍ය විග්‍රහ පාරාජිකා පත්තියටද අසදෘශභාගික වේ. මෙසේ ආපත්ත්‍යාධිකරණය ආපත්ත්‍යාධිකරණයට අසදෘශභාගික වේ.

10 කෙසේ නම් ආපත්ත්‍යාධිකරණය ආපත්ත්‍යාධිකරණයට සභාග වන්නේද? මෛථුන ධර්ම පාරාජිකා පත්තිය මෛථුන ධර්ම පාරාජිකා පත්තියට තබ්භාගික වේ. අදින්නාදාන පාරා-ජිකා පත්තිය අදින්නාදාන පාරාජිකා පත්තියට තබ්භාගික වේ මනුෂ්‍ය විග්‍රහ පාරාජිකා පත්තිය මනුෂ්‍ය විග්‍රහ පාරාජිකා පත්තියට තබ්භාගික වේ. උත්තරි මනුෂ්‍ය ධර්ම පාරාජිකා පත්තිය උත්තරි මනුෂ්‍ය ධම්ම පාරාජිකා පත්තියට තබ්භාගික වේ මෙසේ ආපත්ත්‍යාධිකරණය ආපත්ත්‍යාධිකරණයට තබ්භාගික වන්නේය. කිච්චාධිකරණය කිච්චාධිකරණයට තබ්භාගික වේ. එසේ අධිකරණයට අධිකරණය තබ්භාගික වේ.

11 ''සවල්ප මාත්‍රයක්ගෙන'' යනු ලේශය සවල්ප න දශ ලේශයෝය. ජාති ලේශය, නාම ලේශය, ගොත්‍ර ලේශය, ලිංග ලේශය, ආපත්ති ලේශය, පාත්‍ර ලේශය, චීවර ලේශය, උපජ්ඣාය ලේශය, ආචාර්ය ලේශය, සේනාසන ලේශය යනු මොහු වෙත්. ජාති ලේශය නම් පාරාජිකා ධර්මයට පැමිණි බව ක්ෂත්‍රියෙක් දක්නා ලද්දේ වෙයි. අනික් ක්ෂත්‍රියෙක් දැක අනික් ක්ෂත්‍රියෙකුට චෝදනා කරයි.

12 ක්ෂත්‍රියතෙම පාරාජිකා ධර්මයට පැමිණියේ දක්-නෙමි. (ii) අශ්‍රමණයෙක් වෙහිය, අශාක්‍ය පුත්‍රයෙක් වෙහිය,

තොප සමග පොහොය කිරීම හෝ පවාරණ කිරීම හෝ සංඝ කම් කිරීම හෝ නොකැයි කියයි. එවනයක් බවනයක් පාරා සංඝාදිශේෂ ඇවැත්වේ. (iii) )

13 බ්‍රාහමණයෙක් දක්නා ලද්දේවෙයි. (මෙහි 12 (ii) ) වෛශ්‍යයෙක් දක්නා ලද්දේවෙයි. (මෙහි 12 (ii, )

14 පාරාජිකා ධර්මයට පැමිණෙන බව ක්ෂුද්‍රයෙක් දක්නා ලද්දේවෙයි. අනික් ක්ෂුද්‍රයෙක් දුක චොදනා කරයි. ක්ෂුද්‍ර තෙම පාරාජිකා ධර්මයට පැමිණි බව මම දක්නෙමි (මෙහි 12 (ii) )

15 නාම්ලේසය නම් බුද්ධරක්ඛිතතෙම දක්නා ලද්දේ වෙයි (මෙහි 12 (ii) )

16 ධම්මරක්ඛිතයා දක්නා ලද්දේවෙයි. (මෙහි 12 (ii) )

17 සංඝරක්ඛිතයා පාරාජිකා ධර්මයට පැමිණියේ දක්නා ලද්දේවෙයි. අනික් සංඝරක්ඛිතයෙකු දුක සංඝරක්ඛිතතෙම පාරාජිකා ධර්මයට පැමිණි බව මම දක්නෙමියි. චොදනා කරයි. (මෙහි 12 (ii) )

18 ගොතන ලෙසය නම් ගෞතමතෙම දක්නා ලද්දේ වෙයි. (මෙහි 12 (ii) )

19 මෞග්ගල්ලානතෙම දක්නා ලද්දේවෙයි. (මෙහි 12 (ii) )

20 කච්චායනතෙම දක්නා ලද්දේවෙයි. (මෙහි 12 (ii) )

21 වාසිට්ඨතෙම පාරාජිකා ධර්මයට පැමිණියේ දක්නා ලද්දේයයි අනික් වාසිට්ඨයෙකු දුක චොදනාකරයි. වාසිට්ඨයා පාරාජිකා ධර්මයට පැමිණියේය. මා විසින් දක්නාලදිමි. (මෙහි 12 (ii) )

22 ලිංගලේසය නම් දිඝී තැනැත්තේ දක්නා ලද්දේ වෙයි. (මෙහි 12 (ii) )

23 මිටි තැනැත්තේ දක්නා ලද්දේමෙයි (මෙහි 12 (ii) )

24 කාෂ්ණ (කළු) තැනැත්තේ දක්නා ලද්දේමෙයි. (මෙහි 12 (ii) )

25 ඕදාත (සුදුවණ් ඇති) තෙම පාරාජිකා ධර්මයට පැමිණියේ දක්නා ලද්දේයයි, අනික් ඕදාතයෙකු දුක ඕදාතයා පාරාජිකා ධර්මයට පැමිණියේය, (මෙහි 12 (ii) )

26 ආපත්තිලේශය නම් ලහුක (සුලු) ඇවැතකට පැමිණියේ දක්නාලදිමියි පාරාජිකා පත්තියෙන් ඔහුට චෝදනා කරයි. මෙහි 12 (ii) )

27 පත්තලේශය නම් ලෝහ පාත්‍රයක් දරන්නා දක්නා ලද්දේ වෙයි. (මෙහි 12 (ii)

28 මැටි පාත්‍රයක් දරන්නා දක්නාලද්දේ වෙයි. ප්‍රකෘති මැටි පාත්‍රයක් දරන්නා පාරාජිකා පත්ති ධර්මයට පැමිණියේ දක්නා ලද්දේයයි අනික් ප්‍රකෘති මැටි පාත්‍රයක් දරන්නෙකු දැක චෝදනා කරයි. ප්‍රකෘති මැටි පාත්‍රයක් දරන්නා පාරාජිකා පත්ති ධර්මයට පැමිණියේ මම දුටුයෙමි. (මෙහි 12 (ii))

29 චීවර ලේශය නම් පාංශුකූලිකයා දක්නාලද්දේ වෙයි (මෙහි 12 (ii) )

30 ගෘහපති චීවරධරයා පාරාජිකා ධර්මයට පැමිණියේ දක්නා ලදුයි අනික් ගෘහපති චීවර ධරයෙකු දැක පාරාජිකා ධර්මයෙන් චෝදනා කරයි (මෙහි 12 (ii) )

31 උපජ්ඣායලේශය නම්- අසවල් තැනැත්තහුගේ සද්ධිවිහාරිකයා පාරාජිකා ධර්මයට පැමිණි බව දක්නාලදීයයි අනිකෙකුගේ සද්ධිවිහාරිකයෙකු දැක චෝදනා කරයි. අසවල් තැනැත්තහුගේ සද්ධිවිහාරිකයා පාරාජිකා ධර්මයට පැමිණියේය. (මෙහි 12 (ii) )

32 ආචරිය ලේශය නම්- අසවල් තැනැත්තහුගේ අන්තෙවාසිකයා පාරාජිකා ධර්මයට පැමිණි බව දක්නාලදීයයි අන්‍යවූ අසවල් තැනැත්තහුගේ අතවැසියා දැක අසවල් තැනැත්තහුගේ අතවැසියා පාරාජිකා ධර්මයට පැමිණි බව දුටුයෙමි. (මෙහි 12 (ii) )

33 සේනාසන ලේශය නම්- අසවල් තැනැත්තහුගේ සෙනසුනෙහි වසන්නා පාරාජිකා ධර්මයට පැමිණියේ දක්නා ලදීයයි අසවල් තැනැත්තහුගේ සෙනසුන් වාසිකයා දැක අසවල් තැනැත්තහුගේ සෙනසුනෙහි වසන්නා පාරාජිකා පත්තියට පැමිණියේ මම දුටුයෙමියි චෝදනා කරයි. (මෙහි 12 (ii) )

34 "පාරාජිකා ධර්මයෙන්" යනු පාරාජිකා සතරින් එකකින් වේ. "චෝදනා කරයි" යනු චෝදනා කරයි හෝ කරවයි

යනුයි. "තෝහු මේ බඹසරින් වෙන්වන්නෝ නම් ඉතා යහපත" යනු භික්ෂු භාවයෙන් පහකරමි ශ්‍රමණ ධර්මයෙන් පහකරමි ශීලස්කන්ධයෙන් පහකරමි, තපෝ ගුණයෙන් පහකරමි යනුයි "ඉන් මිදීම කාලයෙකි" යනු යම් කාරණයක චෝදනා කරන ලද්දේ වේද, ඒ කාරණය ඒ ලෙස, ඒ [illegible], ඉක්මගිය පසු යනුයි "විචාරණු ලබන්නේ" යනු යම් වස්තුවකින් චෝදනා කරන ලද්දේ වේද, ඒ වස්තුවෙහි විචාරීමයි. "නොවිචාරණු ලබන්නේ" යනු කිසිවෙකු විසින් නොකියනු ලබන්නේ යනුයි. "අධිකරණ" නම් සතර අධිකරණයෝය, විවාදාධිකරණය, අනුවාදාධිකරණය, ආපත්තාධිකරණය කිච්චාධිකරණය යන මේයි.

"කිසියම් සවල්ප මාත්‍රයකට පැමිණියේ" යනු ඒ ලේශයන්ගෙන් එක්තරා ලේශයකට පැමිණ යනුයි. 'භික්ෂුවද දෝෂයෙහි පිහිටියේ වෙයි" යනු මා විසින් තුච්ඡ කොට කියන ලදී, මා විසින් බොරු කියන ලදී, මා විසින් අභූත කියන ලදී. මා නොදැන කියන ලදී "සංඝාදිසේස" නාම (මෙහි 12 (ii) එයින්ද සංඝාදිසේසවේ යනුයි.

34 භික්ෂුව සංඝාදිසේස ඇවැතට පැමිණියේ දක්නේ වේද සංඝාදිසේසයෙහි සංඝාදිසේස යන දෘෂ්ටිය ඇත්තේද (ii) ඔහුද පාරාජිකා පත්තියෙන් චෝදනා කරන්නේද (මෙහි 12 (ii)) එසේද ආපත්තඤ්ඤභාගිය වෙයි. ලේශයවද පැමිණියේ වෙයි වචනයක් වචනයක් පාසා සංඝාදිසේස ඇවැත්වේ (iii)

35 භික්ෂුව සංඝාදිසේස ඇවැතට පැමිණියේ දක්නේ වෙයි සංඝාදිසේසයෙහි ථුල්ලච්චය දෘෂ්ටිය වේද (මෙහි 34 (ii)) පචිති දෘෂ්ටිය වේද පාටිදෙසනීය දෘෂ්ටිය වේද දුක්කට දෘෂ්ටිය වේද, දුබ්භාසිත දෘෂ්ටිය වේද, ඔහුද අශ්‍රමණයෙක් වෙහිය අශාක්‍යපුත්‍රයෙක් වෙහියයි පාරාජිකාපත්තියෙන් චෝදනා කෙරේද (මෙහි 12 (ii)) එසේද ආපත්තඤ්ඤභාගිය වේ. ලේශයවද පැමිණියේ වේ. වචනයක් වචනයක් පාසා සංඝාදිසේස ඇවැත්වේ.

36 භික්ෂුව ථුල්ලච්චයවද, පචිත්තියවද, පාටිදේසනියවද, දුක්කටවද, දුබ්භාසිතයවද පැමිණියේ දක්නා ලදනයි දුබ්භාසිතයෙහි දුබ්භාසිත දෘෂ්ටි ඇත්තේ වේද,

ඔහුද අශ්‍රමණයෙක් වෙහිය අශාක්‍ය පුත්‍රයෙක් වෙහියයි පාරාජිකා ධර්මයෙන් චෝදනා කෙරේද, (මෙහි 12 (ii)) එසේද ආපත්‍යසඤ්ඤාභාගිය වේ. ලේශයෙවද පැමිණියේ වෙයි. වචනයක් වචනයක් පාසා සංඝාදිසේස ඇවැත් වේ. භික්ෂුව දුබ්භාසිතයට පැමිණියේ දුබ්භාසිතයෙහි සංඝාදිසේස දෘෂ්ටි ඇත්තේ වේද (මෙහි 34 (ii)) දුබ්භාසිතයෙහි ථුලසියද පචිතියද පාටිදෙසනීයද, දුක්කට දෘෂ්ටිය වේද ඔහුද පාරාජිකා ධර්මයෙන් චෝදනා කෙරේද, අශ්‍රමණයෙක් වෙහිය, අශාක්‍ය පුත්‍රයෙක් වෙහිය. (ii) තා සමග පොහොය කිරීම හෝ පවාරණ කිරීම හෝ සංඝකර්ම කිරීම හෝ නැතැයි' (iii) කියායි, එසේද ආපත්‍යසඤ්ඤාභාගිය (ඇවැතෙහි අතික් කොටසක්) වේ. ලේශයෙවද පැමිණියේ වේ වචනයක් වචනයක් පාසා සංඝාදිසේස ඇවැත් වේ

37 එකක් එකක් මුල් කරමින් චක්‍රය (ආඥව) බැඳිය යුතුයි. භික්ෂුව සංඝාදිසේස ඇවැතට පැමිණියේ දක්නා වේද සංඝාදිසේසයෙහි සංඝාදිසේස දෘෂ්ටි ඇත්තේ වේද, ඔහුද, පාරාජිකයෙන් චෝදනාකරමාද අශ්‍රමණයෙක් වෙහිය, අශාක්‍ය පුත්‍රයෙක් වෙහිය. 'තා සමග පොහොය කිරීම හෝ සංඝකර්ම කිරීම හෝ නැතැයි' කියායි. එසේද ආපත්‍යසඤ්ඤාභාගියවෙයි ලේශයෙවද පැමිණියේ වෙයි. වචනයක් වචනයක් පාසා සංඝාදිසේස ඇවැත් වේ භික්ෂුව සංඝාදිසේස ඇවැතට පැමිණියේ දක්නා ලද්දේ වේද, සංඝාදිසේසයෙහි ථුලසි දෘෂ්ටි ඇත්තේද. (මෙහි (ii)) පචිති දෘෂ්ටිය ඇත්තේද පාටිදේසනීය දෘෂ්ටිය ඇත්තේද, දුක්කට දෘෂ්ටිය ඇත්තේද, දුබ්භාසිත දෘෂ්ටිය ඇත්තේද, ඔහු අශ්‍රමණයෙක් වූයෙහිය, අශාක්‍ය පුත්‍රයෙක් වූයෙහියයි (මෙහි 36 (ii)) පාරාජිකා ධර්මයෙන් චෝදනා කෙරේද, එසේද ආපත්‍යසඤ්ඤාභාගිය වේ. ලේශයෙවද පැමිණියේ වෙයි වචනයක් වචනයක් පාසා සංඝාදිසේස ඇවැත් වේ. භික්ෂුව ථුලසි ඇවැතට පැමිණියේ දක්නා ලද්දේ වේද ථුලසියෙහි පචිති දෘෂ්ටි ඇත්තේ වේද. (මෙහි 12 (ii)) ථුලසියෙහි පචිති දෘෂ්ටි ඇත්තේ වේද පාටිදේසනීය දෘෂ්ටි ඇත්තේ වේ; දුක්කට දෘෂ්ටි ඇත්තේ වේද, දුබ්භාසිත දෘෂ්ටි ඇත්තේ වේද, සංඝාදිසේස දෘෂ්ටි ඇත්තේ වේද, ඔහු අශ්‍රමණයෙක් වෙහිය, අශාක්‍ය පුත්‍රයෙක් වෙහියයි පාරාජිකා ධර්මයෙන්

චෝදනා කරන්නේද (මෙහි 12 (ii)) එසේද ආපත්‍යඥද භාගිය වේ. ලේශයෙන්ද පැමිණියේ වෙයි. වචනයක් වචනයක් පාසා සංඝාදිසේස ඇවැත් වේ. භික්ෂුව පවිත්‍රයෙකුද පාරිශුද්ධසතියෙකුද, දුක්කටයෙකුද, දුබ්භාසිතයෙකුද පැමිණියේ දක්නාලද්දේ වේද: දුබ්භාසිතයෙහි දුබ්භාසිත දෘෂ්ටි ඇත්තේ වේද (මෙහි 12 (ii)) දුබ්භාසිතයෙහි සංඝාදිසේස දෘෂ්ටි ඇත්තේ වේද, ථුලසි දෘෂ්ටි ඇත්තේ වේද, පචිති දෘෂ්ටි ඇත්තේ වේද, පාටිදේසනීය දෘෂ්ටි ඇත්තේ වේද, දුක්කට දෘෂ් ඇත්තේ වේද, ඔහු අශ්‍රමණයෙක් වෙහිය. අසාක්‍ය පුත්‍රයෙක් වෙහිය. තා සමග පොහොය කිරීම හෝ පවාරණ කිරීම හෝ සංඝකර්ම කිරීම හෝ නැතැයි පාරාජිකා ධර්මයකින් චෝදනා කෙරේද, එසේ ආපත්‍යඥදභාගිය වේ. ලේශයෙන්ද පැමිණියේ වෙයි. වචනයක් වචනයක් පාසා සංඝාදිසේස ඇවැත් වේ. එබඳු සංඥා ඇතිව චෝදනා කරන්නාහු හෝ කරවන්නාහුටද, උම්මත්තකයාටද, ආදිකර්මිකයාටද ඇවැත් නොවේ.

(9 නවවෙනි සංඝාදිසේසය නිමියේය.)

---

## 10. සංඝාදිසේසය.

1 ඒ කාලයෙහි භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම්වූ වේළුවනාරාමයෙහි වැඩවාසය කරණසේක. එකල්හි දේවදත්ත ස්ථවිරතෙම කෝකාලිකද කටමෝරක තිස්සද ඛණ්ඩදේවියගේ පුත්‍ර සමුද්දදත්තද යම් තැනකද එතැනට එළඹියේය. එළඹ, කෝකාලිකටද, කටමෝරකතිස්සටද, ඛණ්ඩ දේවියගේ පුත්‍රවූ සමුද්දදත්තටද මෙසේ කීයේය, "ඇවැත්නි, මෙහි එව්, අපි ශ්‍රමණ භවත් ගෞතමයන්ට (ආඥාව කැඩීම) චක්‍රභේදය නම්වූ සංඝභේදය කරමුයි" කීයේයි. මෙසේ කීකල්හි කෝකාලික තෙමේ දේවදත්තට මෙසේ කීය "ඇවැත්නි, ශ්‍රමණ භවත් ගෞතමතෙමේ මහත් සෘද්ධි ඇත්තෙකි. මහානුභාව ඇත්තෙකි. අපි කෙසේ නම් ශ්‍රමණ භවත් ගෞතමයන්ට චක්‍රභේද නම්වූ සංඝභේදය කරමුදැයි" කීයේයි. ඇවැත්නි, මෙහි එව්. අපි ශ්‍රමණ ගෞතමයන් කරා එළඹ වස්තු පසක් ඉල්ලමු. කෙසේද (ii) 'ස්වාමීනි,

භාග්‍යවතුන් වහන්සේ නොයෙක් පරිද්දෙන් අල්ප වූ පුද්ගලයන්ගේද ලද දෙයින් සතුටුවන පුද්ගලයන්ගේ කෙලෙස් තුනී කරණ පුද්ගලයන්ගේද කෙලෙස් සමපාකරණ පුද්ගලයන්ගේද පැහැදීම් ඇති පුද්ගලයන්ගේද, කෙලෙස් බිඳ දමන පුද්ගලයන්ගේද වීර්‍ය්‍යවන්ත පුද්ගලයන්ගේද ගුණ කියා මෙසේ, ස්වාමීනි, මේ පංච වස්තූන් නොයෙක් ක්‍රමයෙන් අල්පේච්ඡ බවටද, සන්තුෂ්ටි බවටද, සල්ලෙඛ බවටද, පාසාදික බවටද, අපචය බවටද, වීර්‍ය්‍යවන්ත බවටද, හේතුවන්නේය. ස්වාමීන් වහන්ස, භික්ෂූන් වහන්සේලා ජීවිතාන්තය දක්වා ආරණ්‍යකයෝ වෙත්වා, ඒ පිණිස ඇයදිම යමෙක් ග්‍රාමාන්ත සෙනසුන්හි වසන්නේනම් වරදක් කළා වන්නේය. ජීවිතාන්තය දක්වා පිණ්ඩපාතිකයෝ වෙත්වා, යමෙක් ආරාධනා පිළිගන්නේ නම් වරදක් කළා වන්නේය. ජීවිතාන්තය දක්වා පාංශුකූලිකයෝ වෙත්වා. යමෙක් ගෘහපති සිවුරු පිළිගන්නේ නම් වරදක් කළා වන්නේය. ජීවිතාන්තය දක්වා රුක්ඛ මූලිකයෝ වෙත්වා. යමෙක් සෙවිලි කළ ගෙයකට යන්නේ නම් වරදක් කළා වන්නේය. ජීවිතාන්තය දක්වා මත්ස්‍ය මාංශ අනුභව නොකරන්නෝ වෙත්වා. යමෙක් මත්ස්‍ය මාංස කන්නේ නම් වරදක් කළා නම් වන්නේයයි'' කීයේය. (iii) ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මේ කාරණා අනුදන නොවදාරන්නේ නම් අපි මේ පංච වස්තූන් ගෙන් ජනයා අදුන් වන්නෙමුයයි'' කීයේය. ඇත්තේනි, මේ වස්තු පසින් ආඥාව කැඩීම නම් සඞ්ඝ භේදය කිරීමට හැක්කේය. මිනිසුනයෝ වනාහි රූක්ෂ ප්‍රසන්නයෝය.

2 එකල්හි දේවදත්ත තෙමේ පිරිස් සහිතවූයේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේට මනාකොට වැඳ එකත්පසෙක හුන්නේය එකත් පසෙක හුන්නාවූ දේවදත්ත ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.'' (මෙහි 1 (ii)

3 ''දේවදත්තය, නොසෑහේ, කැමති කෙනෙක් නම් ආරණ්‍යකයෝ වෙත්වා, යමෙක් කැමති නම් ගමෙහි වසත්වා, යමෙක් කැමති නම් පිණ්ඩපාතික වෙත්වා, යමෙක් කැමතිනම්

ආරාධනා පිළිගනීවා, යමෙක් කැමැති නම් පාංශුකූලික වේවා, යමෙක් කැමැති නම් ගෘහපති සිවුරු පිළිගණීවා, දේවදත්තය, මා විසින් වෘක්ෂමූල සේනාසන අටමාසයක් තුළ අනුදන්නා ලදහ. නුදුටු-නොඇසූ-සැකයක් නැති මසගෙන් ත්‍රිකෝටි පාරිශුද්ධි මාංශය ද අනුදන්නා ලදහයි' කියායි. එකල්හි දේවදත්ත ස්ථවිරයෝ භාග්‍යවතුන් වහන්සේ මේ පංච වස්තූන් අනුදන නොවදරන්නාහයි සතුටුවූයේ උද්ධනිමත්වූයේ පිරිස සහිතව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ ප්‍රදක්ෂිණා කොට ගියේය

4 එකල්හි දේවදත්ත ස්ථවිරතෙමේ රජගහනුවරට පිවිස පංච වස්තූන්ගෙන් ජනයා හැඳින්වූයේ "ඇවැත්නි අපි ශ්‍රමණ ගෞතමයන් කරා එළඹ ස්තුව පසක් ඉල්ලුවෙමු. (මෙහි 1 (ii) ) ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මේ කාරණා අනුදන නොවදාරති. මේ අපි මේ පංච වස්තූන් සමාදන්ව වසමුයි" කියායි.

5 එහි යම්බඳුවූ ශ්‍රද්ධාව නැත්තාවූද, අප්‍රසන්නවූද, නුවණ නැත්තාවූද, මිනිස්සු වෙත්ද, ඔවුහු මෙසේ කීවාහුය. "මේ ශ්‍රමණයෝ වනාහි ධූතගුණ ඇති සැහැල්ලු පැවතුම් ඇත්තාවූද, ශාක්‍යපුත්‍රයෝය. ශ්‍රමණ ගෞතම තෙමේ බාහුලිකය බහුල භාවය පිණිස සිතායයි" කියායි. "යම්බඳුවූ ශ්‍රද්ධාව ඇත්තාවූද, ප්‍රසන්නවූද, පණ්ඩිතවූද, ඥානවන්තවූද, මිනිස්සු වෙත්ද ඔවුහු මීට දොස් කියත්. නොසතුටු ප්‍රකාශ කරත්, නොසතුටු වචන කියත්. "කෙසේනම් දේවදත්ත ස්ථවිරතෙමේ භාග්‍යවතුන්වහන්සේට චක්‍රභේදය (ආඥා කැඩීම) නම් සංඝ භේදයට උත්සාහ කරන්නේ දැයි" කියායි. භික්ෂූන් වහන්සේලා දොස් කියන්නාවූද, නොසතුටු ප්‍රකාශ කරන්නාවූද නොසතුටු වචන කියන්නාවූද ඒ මිනිසුන්ගේ කියමන් ඇසූහුය. යම්බඳුවූ අල්පේච්ඡ භික්ෂූහු වෙත්ද, උන්වහන්සේලා දොස් කියත්, නොසතුටු ප්‍රකාශ කරත් නොසතුටු වචන කියත්. "කෙසේනම් දේවදත්තය ස්ථවිරතෙමේ භාග්‍යවතුන්වහන්සේගේ සංඝයා අතර චක්‍රභේදය (ආඥා කැඩීම) නම් සංඝ භේදයට උත්සාහ කරන්නේ දැයි" කියායි.

6 එකල්හි ඒ භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැල කළාහුය. (1 සංඝාදිසේසයේ 6 (ii) සොයා දක්නා) "දේවදත්තය, තෝ චක්‍රභේදය (ආඥාව තැබීම) නම් සංඝභේදයට උත්සාහ කරන්නේය යනු සැබෑද?" "භාග්‍යවතුන් වහන්ස, සැබෑව." භාග්‍යවතුන් වහන්සේ ගර්හා කළසේක හිස් පුරුෂය. තෝ කෙසේ නම් චක්‍රභේදය (ආඥාව තැබීම) නම් සංඝභේදයට උත්සාහ කරන්නේද? හිස් පුරුෂය, මේ නොපැහැදියන්ගේ පැහැදීම පිණිස හෝ (1 පාරාජිකයේ සුදින්නකාණ්ඩයේ 10 (v) සොයා දක්නා.) මහණෙනි, මෙසේද මේ ශික්ෂාපදය උදෙසව්.

7 "යම් භික්ෂුවක් සමගි සංඝයාගේ භේදයට උත්සාහ කරන්නේ නම් භේදයට හේතුවන කාරණය හෝ ගෙණ සිටින්නේ නම් භික්ෂූන් විසින් ඒ භික්ෂුවට මෙසේ කියයුතුය. "ආයුෂ්මත් තෙමේ සමගිවූ සංඝයාගේ බිඳීමට උත්සාහ නොකළයුතුය. භේදයට හේතුවන කාරණය හෝ නොගෙණ සිටියයුතුය. ආයුෂ්මත් තෙමේ සංඝයා හා සමගි වේවා. සමගිවූ සංඝයා ඔවුනොවුන් සතුටුවනු ලබන්නේ විවාද නොකරන්නේ, එකට කියාවීම ඇතිව සැපසේ වාසය කරන්නේයි" කියායි මෙසේද භික්ෂූන් විසින් ඒ භික්ෂුවට කියනු ලබන්නේ එසේම ගෙණ සිටින්නේ නම් භික්ෂූන් විසින් ඒ භික්ෂුව ඒ හැර දැමීමට තුන්වෙනි වර දක්වා කියයුතුයි තුන්වෙනි වර දක්වා කියනු ලබන්නේ, ඒ හැර දමන්නේ නම් ඉතා යහපතියි. එය හැර නොදමන්නේ නම් සංඝාදිසේස ඇවැත්වේ."

8 "යම්බඳු යනු භික්ෂු යනු" (මෙහි 1 පාරාජිකයේ පදභාජනියේ 1 - 2 ඡේද සොයා දක්නා.) සමගි සංඝයා නම් සමාන සංවාසිකවූ සමාන සීමාවෙහි සිටියාවූ යනුයි "බිඳවීමට උත්සාහ කරන්නේය" යනු කෙසේ නම් මොවුන් වෙනස්වේවා, භින්න වේවා, වෙන් වේවායි, පක්ෂ සොයාද පිරිස බැඳගනීද සංවිධානය කෙරේද යනුයි "බිඳීමට හේතුවන කාරණය" යනු අටළොස් භේදකර වස්තූන්වේ "සමාදන්ව" යනු ගෙණ යනුයි "දක්වන්නේය" යනු පෙන්නුම් කිරීම යනුයි. "සිටින්නේය" යනු හැර නොදමන්නේ යනුයි. "ඒ මහණතෙම" යනු යම් සංඝ භේදක භික්ෂුවක්

වේද. හෙතෙම යතුයි. "භික්ෂූන් විසින්" යනු අන්‍ය භික්ෂූන් විසින් යනුයි. යමෙක් දකිත්ද, යමෙක් අසත්ද ඔවුන් විසින් කියයුතුයි. ආයුෂ්මත්තෙමේ සංඝභේදය පිණිස උත්සාහ නොකෙරේවා, භේදයට හේතුවන කරුණු ගෝ ගෙණ නොසිටීවා, ආයුෂ්මත්තෙමේ සංඝයා හා සමගි වේවා. සංඝ සමගිය ඇතිකල්හි තුටුවනු ලබන්නේ 'විවාද නොකරන්නේ' එක් කුද්දේශිකව සැපසේ වසන්නේයයි'' කියායි දෙවෙනි වරත් කිය යුතුය. තුන්වෙනි වරත් කිය යුතුය. ඉදින් දුරු කරන්නේ නම් යහපත්වන්නේය ඉදින් දුරු නොකරන්නේ නම් දුකුලා ඇවැත්වේ. ඒ භික්ෂුව සඟ මැදට ගෙණ කියයුතුය 'ආයුෂ්මත් තෙමේ සමගි සංඝයාගේ භේදයට උත්සාහ නොකෙරේවා හේතුවන කරුණු ගෝ ගෙණ නොසිටීවා. ආයුෂ්මත් තෙමේ සංඝයා හා එක්වේවා, සංඝයා සමගිවූයේ තුටුවනු ලබන්නේ විවාද නොකරන්නේ එක්කුද්දේශ ඇත්තේ සැපසේ වසන්නේයයි'' කියායි දෙවනුවත් කියයුතුය. තුන්වෙනුවත් කියයුතුය. ඉදින් හැර දමන්නේ නම් ඒ යහපත් වන්නේය ඉදින් හැර නොදමන්නේ නම් දුකුලා ඇවැත්වේ. භික්ෂූන් විසින් ඒ භික්ෂුවට කියයුතුය. මහණෙනි, මෙසේද කියයුතුය, ව්‍යක්තවූද ප්‍රතිබලවූද භික්ෂූන් විසින් සංඝයාට දැන්විය යුතුයි. 'ස්වාමීනි, සංඝ තෙමේ මාගේ වචනය අසත්වා, මේ අසවල් භික්ෂුව සමගි සංඝයාගේ භේදයට උත්සාහ කරයි. හෙතෙම ඒ කාරණය දුරු නොකරයි. සංඝතෙමේ මෙනම් භික්ෂුවට ඒ කාරණය දුරුකිරීමට කරුණු කියයුතුයි මේ ඊට සුදුසු කාලය වන්නේය මේ දැන්වීමයි 'ස්වාමීන් වහන්ස, මාගේ වචනය අසත්වා. මේ අසවල් භික්ෂුව සමගි සංඝයාගේ භේදයට උත්සාහ කරයි ඔහු ඒ කාරණය දුරු නොකරයි. සංඝතෙමේ ඔහුගේ ඒ කාරණය දුරු කිරීමට අසවල් භික්ෂුවට කරුණු කියන්නේ නම් යෙහෙකි. අසවල් භික්ෂුවට කරුණුකීම ඔහුගේ කරුණු දුරු කිරීමට යහපත් වන්නේය. ඉදින් තුෂ්ණීම්භූත වන්නේ නම් මැනවි. ඉදින් නොකැමැති වන්නේ නම් කියයුතුය.' දෙවනුවත් මේ කාරණය කියමි. තුන්වෙනුවත් මේ කාරණය

කීයේ ද. 'ස්වාමීනි, සංඝ තෙමේ මාගේ වචනය අසත්වා, මේ අසවල් භික්ෂුව සමගි සංඝයාගේ භේදයට උත්සාහ කරයි. මෙතෙමේ ඒ කාරණය දුරු නොකරයි. ඒ කරුණ දුරුකිරීමට සංඝයා මේ නම් භික්ෂුවට කරුණු කියයි. ඒ භික්ෂුවගේ කරුණ හැරදැමීමට අසවල් භික්ෂුවට කරුණු කීම යම් ආයුෂ්මතුන් වහන්සේ නමකට ප්‍රිය ද ඒ තෙනම තුෂ්ණීම්භූත වේවා. ඉදින් යමෙක් නොකැමැති වන්නේ නම් ඔහු කිය යුතුය. සංඝයා විසින් අසවල් භික්ෂුවගේ ඒ කරුණ දුරු කිරීමට කරුණු කියන ලද්දේය. ඒ නිසා සංඝ තෙමේ තුෂ්ණීම්භූත වේවා. මෙසේ මේ ධරමි' කියයි

9 ඥප්තියෙන් දුකුලාවේ. කම්මවාචා දෙකෙන් ථුලසි වේ. කම්මවාචා අවසන්හි සංඝාදිසේස වේ. සංඝාදිසේසයට පැමිණියහුට ඥප්තියෙන් දුකුලාවේ කම්මවාචා දෙකෙන් ථුලසි ආපත්තීහු සංසිඳෙත් සංඝාදිසේස යනු (මෙති 1 සංඝාදිසේසයේ 9 (ii)) එහිත්ද සඞ්ඝාදිසේස වේ යනුයි ධර්ම කර්මයෙහි ධර්ම කර්ම සංඥ ඇත්තේ හැර නොදමාද සඞ්ඝාදිසේස ඇවැත්වේ. ධර්ම කර්මයෙහි විචිකිත්සා වූයේ හැර නොදමාද සඞ්ඝාදිසේස ඇවැත්වේ. ධර්ම කර්මයෙහි අධර්ම කර්ම සංඥ ඇත්තේ හැර නොදමාද, සංඝාදිසේස ඇවැත්වේ. අධර්ම කර්මයෙහි ධර්ම කර්ම සංඥ ඇත්තේ දුකුලා ඇවැත්වේ අධර්ම කර්මයෙහි විචිකිත්සා වූයේ දුකුලා ඇවැත්වේ අධර්ම කර්මයෙහි අධර්මකර්ම සංඥ ඇත්තේ දුකුලා ඇවැත් වේ නොකියනු ලබන්නහුටද, දුරුකරන්නහුටද, උම්මත්තකයාටද, ආදිකර්මිකයාටද ඇවැත් නොවේ

(10 සංඝභේද සංඝාදිසේසය නිමියේය)

## 11 සංඝාදිසේසය

1 ඒ කාලයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ රජගහනුවර කලන්දක නිවාප නම්වූ වේළුවනාරාමයෙහි වාසය කරණසේක. එකල්හි වනාහි දෙවදත්ත ස්ථවිර තෙමේ [illegible] සංඝ භේදයට උත්සාහ කරයි භික්ෂූන් වහන්සේලා මෙසේ කීවාහුය. "දෙවදත්ත ස්ථවිර තෙමේ

අධර්මවාදීය, අවිනයවාදීය, කෙසේ නම් දේවදත්ත ස්ථවිර තෙමේ සමඟි වූ සංඝභේදයට උත්සාහ කරන්නේදැයි" කියායි. එසේත් කී කල්හි කොකාලික කටමෝරක තිස්ස තෙමේද, ඛණ්ඩ දේවියගේ පුත්‍රවූ සමුද්දදත්ත ස්ථවිර තෙමේද ඒ භික්ෂූන් වහන්සේලාට මෙසේ කීහ 'ආයුෂ්මතුන් වහන්සේලා එසේ නොකියව්, දේවදත්ත ස්ථවිර තෙමේ ධර්මවාදී, විනයවාදීයයි කියා නොකියව්. දේවදත්ත ස්ථවිර තෙමේ අපගේ ඡන්දයද රුචියද ගෙණ කියයි. අපගේ අදහස් දැන කියයි. අපටද එය රුචිවන්නේයයි" කීහයි. යම්බඳුවූ අල්පේච්ඡ භික්ෂූහු වෙත්ද උන්වහන්සේලා දොස් කියත් නොසතුට ප්‍රකාශ කරත්. කොපවූ බස් කියත්. "කෙසේ නම් භික්ෂූන් වහන්සේලා සංඝභේදයට උත්සාහ කරන්නාවූ දේවදත්ත ස්ථවිරයන්ට කොටස් වශයෙන් බිඳී, පක්ෂපාත වන්නාහුදැයි" කියායි.

2 එකල්හි ඒ භික්ෂූන් වහන්සේලා මේ කාරණය භාග්‍ය-වතුන් වහන්සේට සැලකළාහුය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙහි මේ සිටියාහි භික්ෂු සංඝයා රැස්කරවා ඒ භික්ෂූන්ගෙන් මෙසේ විචාළසේක 'මහණෙනි, භික්ෂූන් වහන්සේලා සංඝභේදයට උත්සාහ කරන්නාවූ දේවදත්ත ස්ථවිරයන්ට කොටස් වශයෙන් බිඳී පක්ෂපාතීව කථා කරන්නාහු යනු සැබෑද?'' 'භාග්‍යවතුන් වහන්ස, සැබව.'' භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළසේක (මෙහි 1 සඞ්ඝාදිසේසයේ 6 (ii) බලන්න.) 'හිස් පුරුෂයෝ යනු' වියයුතුයි.) මහණෙනි, ඒ හිස්පුරුෂයෝ කෙසේ නම් සංඝ-භේදයට උත්සාහ කරන්නාවූ දේවදත්ත ස්ථවිරයන්ට කොටස්වලට බිදී, පක්ෂපාත වන්නාහුද? මහණෙනි, මෙය අප්‍රසන්නවූවන්ගේ පැහැදීමට හෝ (1 පාරාජිකයේ සුදින්න ඛණ්ඩයේ 30 (v) බලන්න) මහණෙනි, මෙසේද මේ ශික්ෂා පදය උදෙසව්:-

3 "ඒ භික්ෂුවට පක්ෂවාදීවූද, අනුවර්තකවූද භික්ෂූන් වහන්සේලා එක නමක් හෝ දෙනමක් හෝ තුන් නමක් වෙත්ද, උන්වහන්සේලා මෙසේ කියයුතු 'ආයුෂ්මතුන් වහන්සේලා මේ භික්ෂුවට කිසිවක් නොකියව්. මේ භික්ෂුව

ධම්මවාදීය, මේ භික්ෂුව විනය වාදීය, මේ භික්ෂුව අපගේද කැමැත්තත්, රුචියත් අරගෙණ කියයි. දන්නා දෙයම අපට කියයි. අපටද ඒ රුචිවන්නේය' කියයි භික්ෂූන් විසින් ඒ භික්ෂූමට මෙසේ කියයුතුය. 'ආයුෂ්මත් තෙමේ මෙසේ කියාවා, මේ භික්ෂුව ධම්මවාදී නොවේ. මේ භික්ෂුව විනයවාදී නොවේ. ආයුෂ්මතුන්වද සංඝභේදය රුචි නොවේවා, ආයුෂ්මතුන් වහන්සේද සංඝයා හා එකතුවේවා, සමගිවූ සංඝයා තුටුවතු ලබන්නේ විවාද නොකරන්නේ එකම කියමන්නෙ සැපසේ වාසය කරන්නේයයි' කියයි. මෙසේද ඒ භික්ෂූමට භික්ෂූන් වහන්සේලා කියනු ලබන කල්හිත් එසේම පිළිගන්නාහු නම් භික්ෂූන් වහන්සේලා විසින් ඒ භික්ෂූවට තුන්වර දක්වා ඒ බැහැර කිරීමට කාරුණු කියයුතුය. තුන්වර දක්වා කාරුණු කියනු ලබන්නාහු දුරුකරන්නේ නම් ඒ මැනවි. දුරුනොකරන්නේ නම් සංඝාදිසේස ඇවැත වේ."

4 "ඔහුගේම වනාහි" යනු ඒ සංඝභේදක භික්ෂූවගේ අනුවූ භික්ෂූහු වෙත්ද, ඒ භික්ෂූන් වහන්සේලාය. අනුව පවත්නාහු යනු යම්බඳුවූ දෘෂ්ටියක් ඇත්තාහුද, යම්බඳුවූ කැමැත්තක් ඇත්තාහුද, යම්බඳුවූ රුචියක් ඇත්තාහුද ඔවුහුද ඒ දෘෂ්ටියෙහි පිහිටාද, ඒ කැමැත්තෙහි පිහිටාද, ඒ රුචියෙහි පිහිටාද, උන්වහන්සේලාය. "වර්ගවාදකයෝ" යනු ඔහුට ගුණවැනීමට හා පක්ෂවීමට සිටින්නාහු වෙත්. "එක් කෙනෙක් හෝ දෙන්නෙක් හෝ තුන්දෙනෙක්" යනු එක නමක් හෝ දෙනමක් හෝ තුන්නමක් හෝ වෙත්ද, උන්-වහන්සේලා මෙසේ කියන්නාහුය. 'ආයුෂ්මතුන් වහන්සේලා මේ භික්ෂූවට කිසිවක් නොකියව්. මේ භික්ෂුව ධම්මවාදී වන්නේය. මේ භික්ෂුව විනය වාදීවන්නේය. මේ භික්ෂුව අපගේද කැමැත්තත් රුචියත් ගෙණ කියයි. දන්නාදෙය-යක්ම අපට කියයි. අපටද එය රුචිවන්නේයයි' කියයි. "ඒ භික්ෂූහු" යනු යම්බඳුවූ අනුවර්තීවූ භික්ෂූන් වහන්සේලා වෙත්ද උන්වහන්සේලායි. "භික්ෂූන් විසින්" යනු අන් භික්ෂූන් විසින් යමකිසි කෙනෙක් තුමූ දකිත්ද යමෙක් තුමූ අසත්ද, ඔවුන් විසින් කියයුතුය 'ආයුෂ්මතුන් වහන්සේලා මෙසේ නොකියව්.

මේ භික්ෂුව ධර්මවාදී නොවේ. මේ භික්ෂුව විනයවාදී නොවේ. ආයුෂ්මතුන් වහන්සේලාටද සංඝභේදය රුචි නොවේවා. ආයුෂ්මතුන් වහන්සේලාද සංඝයා හා එක්වේවා, සමගිවූ සංඝ තෙමේ තුටුවනු ලබන්නේ, විවාද නොකරන්නේ එක පෙළ හිමි ඇත්තේ සැපසේ වාසය කරන්නේයයි' කියායි. දෙවෙනුවත් කියයුතුය තුන්වෙනුවත් කියයුතුය. ඉදින් දුරු-කරන්නේ නම් ඒ ඉතා යෙහෙක. ඉදින් දුරු නොකරන්නේ නම් දුකුලා ඇවැත්වේ. අසා නොකියත්ද දුකුලා ඇවැත්වේ. ඒ භික්ෂුව සංඝයා මැදට ගෙන කියයුතු වන්නේය. 'ආයුෂ්මතුන් වහන්සේ මෙසේ නොකියනු. මේ භික්ෂුව ධර්මවාදී නොවේ. මේ භික්ෂුව විනයවාදී නොවේ. ආයුෂ්මතුන්ටද සංඝභේදය රුචි නොවේවා, ආයුෂ්මතුන්ද සංඝයා හා එක්වේවා, සමගිවූ සංඝ තෙමේ තුටුවනු ලබන්නේ, විවාද නොකරන්නේ එකුද්දෙස ඇත්තේ සැපසේ වාසය කරන්නේ යයි' කියායි. දෙවනුවත් කියයුතුය. තුන්වෙනුවත් කියයුතුය. ඉදින් දුරු කරන්නේ නම් මැනවි. ඉදින් දුරු නොකරන්නේ නම් දුකුලා ඇවැත්වේ භික්ෂූන් විසින් ඒ භික්ෂුවට කරුණු කියයුතුය.

5 "භාග්‍යවතුනි, මෙසේ කරුණු කියයුතුය. ව්‍යක්තවූද බලසම්පන්නවූද භික්ෂුවක් විසින් සංඝයාට දැන්වියයුතුය. 'ස්වාමීන් වහන්ස, මගේ වචනය අසත්වා. අසවල් අසවල් භික්ෂූහු සංඝභේදයට උත්සාහ කරන්නාවූ අසවල් භික්ෂුවට අනුවර්තකද වර්ගවාදකවද වෙත්. උන්වහන්සේලා ඒ කාරණය හැර නොදමන්නාහ. ඉදින් සංඝයාට කල් ඇත්තේ නම් සංඝ තෙමේ ඒ කාරණය දුරුකිරීමට අසවල් අසවල් භික්ෂූන්ට ඒ වස්තුව දුරුකිරීම පිණිස කියයුතුය. මේ දැන්වීමයි.

6 (i) "ස්වාමීනි, සංඝතෙමේ මගේ වචනය අසාවා! අසවල් අසවල් භික්ෂූහු සංඝභේදයට උත්සාහ කරන්නාවූ අසවල් භික්ෂුවට පක්ෂපාතවූවෝ නොයෙක් වශයෙන් පෙළඹෙත්. ඒ භික්ෂූන් වහන්සේලා ඒ කාරණය හැර නොදමත්, සංඝ තෙමේ අසවල් අසවල් භික්ෂූන්ට ඒ කරුණ දුරුකිරීමට කාරණා කියයි. ඒ කරුණ දුරුකිරීමට අසවල් අසවල් භික්ෂූන්ට සමනුභාෂණය (කීම) කැමැත්තහුගේ තුෂ්ණීම්

කාමයක්හු මනාය. යමෙක් මෙසේ කැමැතිවන්නේ නම් හෙතෙම කිය යුතුය" (ii) දෙවනුවත් මේ කාරණය කියමි. (මෙහි (i)) තුන්වෙනුවත් මේ කාරණය කියමි. (මෙහි (i))

7 ඒ කාරණය දුරුකිරීමට සංඝයා විසින් අසවල් අසවල් භික්ෂූන්ට කරුණු කිය යුතුය. සංඝයාට එය රුචි වන්නේ නම් තුෂ්ණීම්භූත විය යුතුය මෙසේ මේ කාරණය දරමියි කියායි ඤත්තියෙන් දුකුලාවේ කම්ම වාචා දෙකෙන් ථුලසිවේ කම්ම වාචා අවසානයේදී සඞ්ඝාදිසේස ඇවැත්වේ සඞ්ඝාදිසේසයට පැමිණෙන්නහුට ඤත්තියෙන් දුකුලාවේ. කම්මවාචා දෙකෙන් ථුලසිවේ දෙතුන් දෙනෙක් එකතුව කාරණය කියයුතුය සංඝිදවීමේ අදහස ඇතිව ඊට මඩා කරුණු නොකියයුතුය සඞ්ඝාදිසේස යනු (1 සඞ්ඝාදිසේසයේ 9 ii) බලනු) එහින්ද සඞ්ඝාදිසේස කියනු ලැබේ යනුයි

8 "ධර්ම කර්මයෙහි ධර්ම කර්ම සංඥ ඇත්තේ හැර නොදමත් සඞ්ඝාදිසේස ඇවැත්වේ ධර්ම කර්මයෙහි වෙමතිකව හැර නොදමත්ද සඞ්ඝාදිසේස ඇවැත්වේ ධර්ම කර්මයෙහි අධර්ම කර්ම සංඥ ඇත්තේ හැර නොදමත්ද, සඞ්ඝාදිසේස ඇවැත්වේ. අධර්ම කර්මයෙහි ධර්ම කර්ම සංඥ ඇත්තහුට දුකුලා ඇවැත් වේ අධර්ම කර්මයෙහි වෙමතිකහුට දුකුලා ඇවැත්වේ. අධර්ම කර්මයෙහි අධර්ම කර්ම සංඥ ඇත්තහුට දුකුලා ඇවැත්වේ. අසමනුභාසනය (නොකිම) කරන්නවුන්ටද, හැර දමන්නවුන්ටද උම්මත්තකයින්ටද, විපරීත සිත් ඇත්තවුන්ටද වේදනා පීඩිත්තහුටද, ආදි කර්මිකයින්ටද ඇවැත් නොවේ"

(11 අනුවත්තක සඞ්ඝාදිසේසය නිමියේය.)

## 12 සංඝාදිසෙසය

1 ඒ කාලයෙහි භාග්‍යවත් බුද්ධරජාණන් වහන්සේ කොසඹෑ නුවර ඝෝසිතාරාමයෙහි වැඩවාසය කරනසේක. එකල්හි වහාසි ආයුෂ්මත් ඡන්න ස්ථවිරයන් වහන්සේ දුසිරිත් හැසිරෙයි. භික්ෂූහු ඔහුට මෙසේ කීවාහුය. "ආයුෂ්මත් ඡන්න ස්ථවිරයෙනි, මෙබඳු දෙයක් නොකරව. මෙය අකැපය" කියායි. හෙතෙම මෙසේ කියයි. "ඇවැත්නි,

තොපි කවර හෙයකින් මෝ කියයුත්තක් නොව හඟිව්ද? මම තොපට කියන්නෙමි නම් අපගේ බුදුන් අපගේ ධර්මය, අපගේ ආර්ය්‍ය පුත්‍රයන් විසින් චතුරාර්ය්‍ය සත්‍ය ධර්මය අවබෝධ කරන ලද්දේ වෙයි ඒ නිසා ධර්මයද අපගේයයි කියයුතුයි යම්සේ මහා සුළඟක් හමින්නේ පාණ්ඩු පත්‍ර එකතුකොට රැස්කරන්නේද එසේම පර්වතයක සිට ගලා බස්නාවූ දිය දහරාව සෙවෙල් පත්‍රාදිය එකතුකොට රැස්කරන්නේද එපරිද්දෙන්ම නොයෙක් නම් ඇත්තාවූද නොයෙක් ගෝත්‍ර ඇත්තාවූද නොයෙක් ජාති ඇත්තාවූද නොයෙක් කුලවලින් පැවිදිවූවාවූද තොපි එක්රැස්වූවාහුය. ඇවැත්නි, තොපි කුමක් නිසා මට කියයුත්තක් නොව හඟිව්ද, මම තොපට කියන්නේ නම් බුදුන්වහන්සේද අපගේය අපගේ ආර්ය්‍ය පුත්‍රයන් විසින් චතුරාර්ය්‍ය සත්‍යය අවබෝධ කළ නිසා ධර්මයද අපගේයයි" කියායි. යම්බඳුවූ අල්පේච්ඡ භික්ෂූහු වෙත්ද උන්වහන්සේලා නින්දා කරත් නොසතුටු ප්‍රකාශ කරත්, අසතුටු වචන කියත්. "කෙසේනම් ආයුෂ්මත්වූ ඡන්න ස්ථවිරතෙම එක්ව බඹසර හැසිරෙන භික්ෂූන් විසින් කරුණු සහිතව කියනු ලබන්නේ තමන් නොකියයුත්තෙක් කරන්නේදැයි" කියායි.

2 එකල්හි ඒ භික්ෂූන් වහන්සේලා මේ කාරණය භාග්‍යවතුන් වහන්සේට සැලකළාහුය. "ඡන්නය තෝ එක්ව බඹසර හැසිරෙන භික්ෂූන් විසින් කරුණු සහිතව කියනු ලබන්නේ තමන් නොකියයුත්තෙකු කොට සිතන්නේය යනු සැබෑද" 'භාග්‍යවතුන්වහන්ස සැබව.' භාග්‍යවතුන්වහන්සේ ගැරහූ සේක. "හිස් පුරුෂය, තෝ කෙසේ නම් එක්ව බඹසර හැසිරෙන භික්ෂූන් විසින් කරුණු සහිතව කියනු ලබන්නේ තෙමේ නොකියයුත්තෙක් කරන්නෙහිද? හිස් පුරුෂය, මේ කාරණය නොපැහැදියන්ගේ පැහැදීමට හෝ (මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v) යොදන්න) මහණෙනි, මෙසේද මේ ශික්ෂාපදය උදෙසව්

3 "භික්ෂුව වනාහි අකීකරු ස්වභාව ඇත්තේ වේද දේශනාකිරීමට අයත් ශික්ෂාපදයන්හි එක්ව බඹසර හැසිරෙන භික්ෂූන් විසින් කරුණු සහිතව කියනු ලබනු

කල්හි තමන් නොකියයුත්තක් කෙරේද, ආයුෂ්මත්වරුනි, මට යහපතක්වූ හෝ අයහපතක්වූ හෝ කිසිවක් නොකියව්. මම්ද ආයුෂ්මතුන් වහන්සේලාට යහපත්වූ හෝ අයහපත්වූ හෝ කිසිවක් නොකියමි. ආයුෂ්මතුන් වහන්සේලා මට කීමෙන් වළකිව්යයි' කියයි. භික්ෂූන් විසින් ඒ භික්ෂුවට මෙසේ කියයුතු වන්නේය 'ආයුෂ්මත් තෙමේ තමන් නොකියයුත්තෙක් නොකරව. ආයුෂ්මත් තෙමේ තමන් කියයුත්තෙක් කරාවා. ආයුෂ්මත් තෙමේද භික්ෂූන්ට සහධර්මයෙන් කියාවා. භික්ෂූන් වහන්සේලාද ආයුෂ්මතුන්ට සහධර්මයෙන් කියන්නේය. එසේ ඒ භාග්‍යවතුන් වහන්සේගේ පිරිස ඔවුනොවුන්ගේ වචනවලින් ඔවුනොවුන්ගේ නැගිටවීමෙන්ද වඩනා ලද්දේයයි' කියයි. මෙසේ භික්ෂූන් විසින් ඒ භික්ෂුවට කරුණු කියනු ලබන කල්හි එසේම ගෙන සිටින්නේ නම් භික්ෂූන් විසින් ඒ භික්ෂුවට එය දුරුකිරීම පිණිස තුන්වර දක්වා කරුණු කියයුතුය. තුන්වර දක්වාත් කරුණු කියනු ලබන්නේ එය දුරුකරන්නේ නම් මැනවි. දුරු නොකරන්නේ නම් සංඝාදිසේස ඇවැත්වේ."

4 "භික්ෂුව වනාහි අකීකරු ස්වභාව ඇත්තෙක්වේ." යනු දුර්වච වේද, දුර්වචභාවය ඇතිකරන්නාවූ කරුණුවලින් යුක්තවේද, අවවාද නොපිළිගන්නේද, ශිෂ්ටානුකූලව අවවාදය නොපිළිගන්නේද යනුයි.

"පෙළ කීමට අයත්වූ ශික්ෂාපදයන්හි" යනු ප්‍රාතිමෝක්ෂ පරියාපන්නවූ ශික්ෂාපදයන්හි යනුයි. "භික්ෂූන් විසින්" යනු අන්‍ය භික්ෂූන් විසින් යනුයි. "සහධාර්මික" නම් භාග්‍යවතුන් වහන්සේ විසින් පණවන ලද යම්බඳුවූ ශික්ෂාපදයෝ වෙත්ද, එය සහධාර්මික නමි. එයින් කියනු ලබන්නේ තමන් නොකියයුත්තෙක් කෙරේද, ආයුෂ්මතුන් වහන්සේලා මට යහපත්වූද අයහපත්වූද කිසිවක් නොකියව්. මම්ද ආයුෂ්මතුන් වහන්සේලාට යහපත්වූ හෝ අයහපත්වූ හෝ කිසිවක් නොකියමි. ආයුෂ්මතුන් වහන්සේලා මට කීමෙන් වළකිව්යයි' කියයි "ඒ භික්ෂුව" යනු යම්බඳුවූ අකීකරු ස්වභාව ඇති ඔහුයි.

'භික්ෂූන් විසින්'' යනු අන් භික්ෂූන් විසින් යනුයි. යමෙක් දක්නේද, යමෙක් අසන්ද, ඔවුන් විසින් කියයුතුයි. 'ආයුෂ්මත් තෙමේ තමන් නොකියයුත්තක් නොකරවා 'ආයුෂ්මත් තෙමේ තමන් කියයුත්තක් කෙරේවා.' ආයුෂ්මතුන් වහන්සේද සහධර්මයෙන් භික්ෂූන්ට කියාවා. භික්ෂූන් වහන්සේද ආයුෂ්මතුන්ට සහධර්මයෙන් කියත්. එසේකාරයෙන් ඒ භාග්‍යවතුන් වහන්සේගේ පිරිස සම්බඳුවූ ඔවුනොවුන්ගේ වචන මලින්ද ඔවුනොවුන්ගේ නැගිටීමෙන්ද දියුණුවූයේයයි' කියායි. දෙවනුවත් කියයුතුය. තුන්වෙනුවත් කියයුතුයි. ඉදින් දුරුකරන්නේ නම් යහපත් වන්නේය. ඉදින් දුරු නොකරන්නේ නම් දුකුලා ඇවැත්වේ. අසා නොකියද්ද දුකුලා ඇවැත්වේ.

5 ඒ භික්ෂුව සංඝයා මැදට ගෙණ කියයුතුය. 'ආයුෂ්මත් තෙමේ තමන් නොකියයුත්තක් නොකරව. ආයුෂ්මත් තෙමේ තමන් කියයුත්තම කරාවා. ආයුෂ්මතුන් වහන්සේද භික්ෂූන්ට සහධර්මයෙන් කියාවා. භික්ෂූන් වහන්සේලාද ආයුෂ්මතුන්ට සහධර්මයෙන් කියත්. එසේ කියන කල්හි භාග්‍යවතුන් වහන්සේගේ පිරිස සම්බඳු ඔවුනොවුන්ගේ වචනමලියද ඔවුනොවුන්ගේ නැගිටීමෙන්ද දියුණුවන්නේය.' දෙවෙනුවත් කියයුතුයි තුන්වෙනුවත් කියයුතුයි ඉදින් දුරුකරන්නේ නම් යහපත් වන්නේය ඉදින් දුරු නොකරන්නේ නම් දුකුලා ඇවැත්වේ.

6 ඒ භික්ෂුවට කරුණු කියයුතුය. මහණෙනි, මෙසේද ව්‍යක්තවූද බලසම්පන්නවූද භික්ෂූන් විසින් කරුණු කියයුතු වන්නේය. දැන්විය යුතු වන්නේය. 'ස්වාමීනි, සංඝයාතෙම මගේ වචනය අසත්වා, මේ අසවල් භික්ෂුව සහධර්මයෙන් භික්ෂූන් වහන්සේලා කරුණු කියනු ලබන්නේ තමන් නොකියයුත්තක් කරයි. නොහොත් ඒ කාරණය දුරු නොකරයි. සංඝයාතෙම ඒ කාරණය දුරුකිරීමට අසල් භික්ෂුවට කරුණු කියන්නේ නම් ඒ පිණිස සංඝයාට කල් ඇත්තේය.' මේ ඥප්තියි (දැනුම් දීමයි.)

7 (i) ''ස්වාමීනි, සංඝයා මගේ වචනය අසත්වා. මේ අසවල් භික්ෂුව භික්ෂූන් විසින් සහධර්මයෙන් (ශික්ෂාපද අනුව) කරුණු කියනු ලබන්නේ තමන් නොකියයුත්තක් කරයි.

හෙතෙම ඒ කාරණය දුරු නොකරයි. ඒ කාරණය දුරු කිරීමට සංඝයා අසමල් භික්ෂුවට කාරණා කියන්නේද, අසමල් භික්ෂුවට ඒ කාරණ දුරු කිරීමට භික්ෂූන් වහන්සේලා කාරණා කිය යුතුය. ඒ ප්‍රශ්න තුෂ්ණීම් භාවය ඇතිකළ යුතුය. යමෙක් නොනැමැති වන්නේ නම් නොතන්ති කියනුතු වන්නේය." (ii) දෙවනුවත් මේ කාරණය කියයි (මෙහි (i)) තුන්වෙනුවත් මේ කාරණය කියයි. (මෙහි (i))

සංඝයා විසින් අසමල් භික්ෂුව ඒ කාරණ දුරු කිරීමට සංඝයාගේ කැමැත්තෙන් කාරණ කියනු ලද්දේය, ඒ භික්ෂු තුෂ්ණීම් භාවය විය, ඒ දුරා ගැණිමියි කියයි, සදන්තියෙන් දුකුලාවේ, කම්මවාචා දෙකෙන් ථුල්ලච්චය වේ. කම්මවාචා පරිනිෂ්ඨාන කාලයේදී සංඝාදිසේස ඇවැත්වේ, සංඝාදිසේසයට පැමිණීම හුට සදන්තියෙන් දුකුලාවේ. කම්මවාචා දෙකින් ථුල්ලච්චය සංසිදීමට යෙත්. සංඝාදිසේස යනු (මෙහි 1 සංඝාදිසේසයේ 9 (ii) සොයන්න) එසින්ද සංඝාදිසේස වේ යනුයි. ධර්ම නම් කෙහි ධර්ම කර්ම සංඥ ඇත්තේ දුරු නොකෙරේද සංඝාදිසේස ඇවැත්වේ, ධර්ම කර්මයෙහි වෙමතික වූයේ දුරු නොකෙරේද, සංඝාදිසේස ඇවැත්වේ. ධර්ම කර්මයෙහි අධර්ම කර්ම සංඥ ඇත්තේ දුරු නොකෙරේද සංඝාදිසේස ඇවැත්වේ. අධර්ම කර්මයෙහි ධර්ම කර්ම සංඥ ඇත්තේ දුකුලා ඇවැත්වේ. අධර්ම කර්මයෙහි වෙමතික දුකුලා ඇවැත්වේ. අධර්ම කර්මයෙහි අධර්ම කර්ම සංඥ ඇත්තේ දුකුලා ඇවැත්වේ, නොකියන්නාහටද, දුරු කරන්නාහටද, උම්මත්තකයාහටද, ආදිකර්මිකයාහටද ඇවැත් නොවේ.

(12 දුබ්බච සංඝාදිසේසය නිමි)

---

## 13 සංඝාදිසේසය

1 ඒ කාලයෙහි භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ සැවැත් නුවර අනේපිඬු සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එසමයෙහි මහාගිරි කිටාගිරියෙහි දුශ්ශීලවූද ලාමකවූද අස්සජි පුනබ්බසුක නම් භික්ෂූහු ආවාසිකයෝව වෙසෙත්. ඔවුහු මෙබඳුවූ නොකටයුතු කරත්

(ii) මල්ගස් රෝපණය කරත්, රෝපණය කරවත්. දිය ඉසිත් හෝ ඉස්සවත් හෝ, කඩත් හෝ, කඩවත් හෝ, ගොතත් හෝ, ගොතවත් හෝ, නටු එකතු කරත් හෝ, එකතු කරවත් හෝ, දෙපැත්තෙහි මල් නටු තබා කරන මල්මාලා කරත් හෝ, කරවත් හෝ, වඩම් මෙන් මල් කරත් හෝ, කරවත් හෝ, ඉදිකටුනුල් යනාදියෙන් මල් අමුණත් හෝ, අමුණවත් හෝ, මුදුනෙහි මල්කඩ ආකාරයෙන් කරත් හෝ, කරවත් හෝ, කර්ණිකාකාරයෙන් කරත් හෝ, කරවත් හෝ, උරෙහි පළඳනා කාරයෙන් කරත් හෝ, කරවත් හෝ වෙත්. ඔවුහු කුල ස්ත්‍රීන්ට හා කුල ධීතෘන්ටද, කුල කුමරියන්ටද, කුල ලෙහෙළියන්ට හා කුලදැසියන්ටද මල්වැල් එකතුකොට ගෙණ යත්, යවත්, එබඳු මෙන් කළ මල් විතාති ගෙණයත් හෝ, යවත් හෝ, අමුනා කළ මල්දම් ගෙණයත් හෝ, යවත් හෝ, මුදුන් මල් කඩක් සේ කළ මල් ගෙණයත් හෝ, යවත් හෝ, කර්ණිකාකාර කළ මල් ගෙණයත් හෝ, යවත් හෝ, උරෙහි පළඳනා කාරයෙන් කළ මල් ගෙණයත් හෝ, යවත් හෝ වෙත්.

2 ඒ භික්ෂූන් වහන්සේලා කුල ස්ත්‍රීන් සමග, කුලදූන් සමග, කුලකුමරියන් සමග, කුල ලෙහෙළියන් සමග, කුල දැසියන් සමග එක භාජනයෙහි අනුභව කරත්. එක තලියෙහිද බොත්, එක අසුනෙහිද හිඳිත්. එක ඇඳෙහි නිදාගනිත් එක ඇතිරිල්ලෙහි නිදත්, එක පොරෝනායෙහිද නිදත්. එක ඇතිරිල්ලේ එක පොරෝනායෙහි නිදත්. විකාලයෙහි අනුභව කරත්, මද්‍යපානයද කරත්, මල්ගඳවිලවුන් දරත්. නැටීම කරත්, ගායනා කරත්, වාදනය කරත්, ලාසනය කරත්, නටන්නියන්ට අනුව නටත්, නටන්නියන්ට අනුව ගායනය කෙරෙත්, නටන්නියන්ට අනුව වාදනය කෙරෙත්, නටන්නියන්ට අනුව නැටීම කෙරෙත්, ගයන්නියන්ට අනුව නටත්, ගයන්නියන්ට අනුව ගයත්, ගයන්නියන්ට වාදනය කරත්. ගයන්නියන්ට අනුව නැටීම කරත්. වාදනය කරන්නියන්ට අනුව නටත්, වාදනය කරන්නියන්ට අනුව ගයත්, වාදනය කරන්නියන්ට අනුව වාදනය කරත්, වාදනය කරන්නියන්ට අනුව නැටීම කරත්, නැටීම කරන්නියන්ට අනුව

නටත්, නැටීම කරන්නියන්ට අනුව ලාසනය කරත්, ලාසනය කරන්නියන්ට අනුව වාදනය කරත්, ලාසනය කරන්නියන්ට අනුව ලාසනය කරත්. කොටස් අටක් ඇති ලෑල්ලෙහි ක්‍රීඩා කරත්, කොටස් දහයක් ඇති ලෑල්ලෙහි ක්‍රීඩා කරත්, අවකාශයෙහි ක්‍රීඩා කරත්, කට්ටිපැනීම් ක්‍රීඩා කරත්, සන්තික ක්‍රීඩාවෙන් ක්‍රීඩා කරත්, කොණ්ඩු ක්‍රීඩාවෙන්ද ක්‍රීඩා කරත්, කල ක්‍රීඩාවෙන් ක්‍රීඩා කරත්, ලාටුගෑ අතින් ක්‍රීඩා කරත්, පස ඇටින් ක්‍රීඩා කරත්, බට උණ වලින් කල කලාවලින් ක්‍රීඩා කරත්,

3 කුඩා නගුලෙන් ක්‍රීඩා කරත්, පිල්ලම්ගැසීම් ක්‍රීඩා කරත්, සරුංගලයෙන් ක්‍රීඩා කරත්, වැලිමිතිමින් ක්‍රීඩා කරත්, කුඩා රථයෙන් ක්‍රීඩා කරත්, කුඩා දුනුයෙන් ක්‍රීඩා කරත්, අකුරු වලින් ක්‍රීඩා කරත්, සිතේ ඇති අදහසින් ක්‍රීඩා කරත්, කණ කුදු ආදී දොස් පෙන්වා ක්‍රීඩා කරත්, හස්ති නිමිත්ත ශිල්පයෙන් ශික්ෂණය කරත්, අශ්ව නිමිත්ත ශිල්පයෙන් ශික්ෂණය කරත්, රථ නිමිති ශික්ෂණයෙන් ශික්ෂණය කරත්, ධනු නිමිති ශිල්පයෙන් ශික්ෂණය කරත්, ඵරු නිමිති ශිල්පයෙන් ශික්ෂණය කරත්, ඇතුන්ට පෙරටුව දුවත්, අසුන්ට පෙරටුව දුවත්, රථයන්ට පෙරටුව දුවත්, දුවන්නෝ, හොඳුවන්නෝ, ඔසවන්නෝ, අත් පොලසන් දෙන්නෝ, මල්ල යුධ කරන්නෝ, මුට්ඨි යුධ කරන්නෝ, රඟ මැද සංඝාටිය පතුරවා නටන්නියන්ට මෙසේ කියත්. 'නැගණිය, මෙහි නටව' යි කියයි. නලලේ ඇඟිලි දෙත්, විවිධවූ අනාචාරයෙන් හැසිරෙත්.

4 එසමයෙහි වනාහි එක්තරා භික්ෂුවක් කසිරට වස් විසූයේ සැවැත්නුවර යන්නේ කිටාගිරිය යම් ස්ථානයකද එතැනට ගියේය. එකල්හි ඒ භික්ෂුව පෙරවරු කාලයෙහි හැඳපොරවා පාත්‍රසිවුරු ගෙණ ප්‍රසාද එලවන ගමනින් යුක්තවූයේ ඉදිරිය බැලීමෙන් ද, පසු බැලීමෙන් ද, දෙපස බැලීමෙන් ද, අත් පා දිගු හැකිලීමෙන් ද සංවරයෙන් යුක්තවූයේ යටබලා පහළ කළ ඇස් ඇත්තේ කිටාගිරියට පිඬු පිණිස පිවිසියේය. මිනිස්සු ඒ භික්ෂුව දැක මෙසේ කීහුය. "අබලබලයෙක් මොහුද,

භුම්මජකයෙක් මෙත්ද. හාකුපික හාකුපිකාණෝත් මෙත්ද ක මොහු යමාහුද? මේ යන්නාවූ මොහුට කවරෙක් පිණ්ඩපාතය දෙන්නේද, අපගේ ආචාර්යවූ අස්සජි පුනබ්බසුක භික්ෂූන් වහන්සේලා ප්‍රියවූ මෘදුවූ කතා කථාවෙන් සිතසව පෙරදුරිකොට ඇගිරීමෙද වත් හොඹු හැකිලීමක් නැතිව ඇස් හැර බැලීමෙන් පළමුව කථා කෙරෙත්. එබඳු වූවන්ට පිණ්ඩපාතය දියයුතුයයි' කීහයි.

5 කීටාගිරියෙහි පිඩු පිණිස හැසිරෙන්නාවූ ඒ භික්ෂුව එක්තරා උපාසකයෙක් දැක්කේය. දැක ඒ භික්ෂුව යම් තැනක එතැනට එළඹියේය. එළඹ ඒ භික්ෂුවට වැඳ මෙසේ කීය. "ස්වාමීනි, පිණ්ඩපාතය ලැබුනේදැයි" කීයයි "ඇවැත්නි, පිණ්ඩපාතය නොලැබුනේමයයි' කීහයි 'ස්වාමීනි, එනු මැනව්, අපගේ ගෙට යමුයයි" කීය. එකල්හි ඒ උපාසක තෙමේ ඒ භික්ෂුව ගෙට පමුණුවා වළඳවා මෙසේ කීය. "ස්වාමීනි, ආයුෂ්මතුන් වහන්සේ කොහි යන්නේදැයි' කීයයි. "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ දැකීමට සැවැත්නුවර යන්නෙමියි" කීය "ස්වාමීනි, එසේවීනම් මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේට ශ්‍රීපාදයන් වන්දනය කරව්ව. මෙසේද කියනු ලැබේවා, 'ස්වාමීනි, කීටාගිරියෙහි ආවාසයක් වේද එහි වසන අස්සජි පුනබ්බසුක නම්වූ දුශ්ශීල පාප භික්ෂූහු වෙත්තාහුය. ඔවුහු මෙබඳුවූ අනාචාරයෙහි හැසිරෙත්. (මෙහි 1 (ii) 2, 3 බලාදන්න.) (ii) ස්වාමීනි, මීට පළමුව මිනිස්සු ශ්‍රද්ධා ඇත්තෝ වූහ. ප්‍රසන්නයෝ වූහ. දැන් වනාහි අශ්‍රද්ධාවන්තයෝද අප්‍රසන්නයෝද වෙත් සංඝයාට කලින් පැවැත්වූ දාන දුන්නාවූ ඒ දානයෝ සිඳ දමන ලදහ. සුපේශල භික්ෂූන්ගෙන් ගියහ. පාප භික්ෂූහු වසන්නෝය. ස්වාමීන් වහන්ස, "භාග්‍යවතුන් වහන්සේ කීටාගිරියට භික්ෂූන් අරිටිරියෙන් කීටාගිරි ආවාසය මනා කොට පිළිවෙල කරන්නේ නම් ඒ පිණිස අයැදිමි" (iii) කීහයි. "ඇවැත්නි, එසේයයි" කියා ඒ භික්ෂුව ඒ උපාසකහට පිළිවදන් දී සැවැත් නුවර යම්තැනක වේද එතැනට ගියේය.

6 සැවැත් නුවර අනේපිඩු මහසිටුහු විසින් කරවනලද ජේතවනාරාමය යම් තැනකද එහි භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේට හිසනමා වැඳ එකත් පසක හුන්නේය. ආගන්තුක භික්ෂූන් සමග පිළිසඳර කථා කිරීමක් වේද, භාග්‍යවත් බුදුවරයන් වහන්සේලාගේ ආචීර්ණ (පුරුදු) ධර්මයෙකි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂුවට මෙසේ වදාළහ. "මහණ, කිම යැපෙන්නේද? කොහොඳින් ඉරියව් පවත්වන්නේද, ක්ලාන්තයක් නැතිව දුර සිට ආයෙහිද? මහණ, ඔබ කොහි සිට ආයෙහි දැයි" කීයාහ.

7 "භාග්‍යවතුන් වහන්ස, ඉවසිය හැක. භාග්‍යවතුන් වහන්ස, යැපෙන්නට පුළුවන. ස්වාමීනි, ක්ලාන්තයක් නැතිව මම දුරසිට ආයෙමි. ස්වාමීනි, මම කසීරට වස්විසුයේ භාග්‍යවතුන් වහන්සේ දැකීමට සැවැත් නුවරට එන්නේ කීටාගිරිය යම්තැනකද එතැනට පිවිසියෙමි. ස්වාමීනි, එකල්හි මම පෙරවරු කාලයෙහි හැඳ පොරවා පිඩු පිණිස කීටාගිරියට පිවිසියෙමි. ස්වාමීනි, කීටාගිරියෙහි පිඩුපිණිස හැසිරෙන්නාවූ මම එක්තරා උපාසකයෙකු දුටුයෙමි. දුටු මා යම් තැනකද එතැනට ඔහු එළඹියේය, එළඹ මට හිසනමා වැඳ මෙසේ කීය "ස්වාමීනි, පිණ්ඩපාතය ලැබුවාහු දැයි" කීයේය. "ඇවැත්නි, පිණ්ඩපාතය නොලැබුයෙමියි" කීය. "ස්වාමීනි, එන්න අපගේ ගෙදරට යමුයි" කීය. "ස්වාමීනි, එකල්හි ඒ උපාසකයා මා ගෙදරට පමුණුවා දානය වළඳවා මෙසේ කීය. 'ස්වාමීනි, ආර්යයන් වහන්සේ කොහි යන්නාහු දැයි' කීයේය. 'ඇවැත්නි, මම භාග්‍යවතුන්වහන්සේ දැකීමට සැවැත්නුවර යන්නෙමියි' කීය. ස්වාමීනි, එසේ වී නම් මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයන් හිසින් වඳින්න මෙසේද කියනසේක්වා, ස්වාමීනි, කීටාගිරියෙහි ආවාසය දූෂිතවූයේය. අස්සජි පුනබ්බසුක නම්වූ කීටාගිරි ආවාසයෙහි වසන දුශ්ශීල පාප භික්ෂූහු වෙත් ඔවුහු මෙබඳුවූ අනාචාරයන්හි හැසිරෙත් (ඡේද 1(ii) 2,3,5(ii) භාග්‍යවතුන්වහන්ස, මම එහි සිට ආයෙමි." කීය

8 එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ ප්‍රකරණයෙහි භික්ෂු සංඝයා රැස්කරවා භික්ෂූන් අතින් විචාළසේක. "මහණෙනි, කීටාගිරි ආවාසයෙහිවූ අස්සජිපුනබ්බසුක භික්ෂූහු දුශ්ශීල පාපධර්මයයි කියන්නේ සැබෑද? ඔව්හු මෙබඳුවූ අනාචාර කෙරෙත්ද? (මෙහි 1 (ii) 2, 3) මහණෙනි, මෙබඳුවූ මිනුෂ්‍යයෝ පෙර ශ්‍රද්ධා සම්පන්නයෝ වූවාහු ප්‍රසන්-නයෝ වූවාහු වෙත්ද, ඔවුන් දුන් වනාහි අශ්‍රද්ධාවන්තයෝද අප්‍රසන්නයෝද වෙත්. කලින් සංඝයාට මෙබඳුවූ දන් ක්‍රමයෝ ඇතිවූවාහුද එයද දුන් සිඳදමන ලදහ. සුපේශල භික්ෂූන්ගෙන් හිස්වූයේ පාප භික්ෂූහු වෙසෙත්දැයි" කියායි "භාග්‍යවතුන් වහන්ස එය සැබෑවයි" කීහ භාග්‍යවතුන් වහන්සේ එයට ගර්හා කළසේක

9 "මහණෙනි, කෙසේ නම් ඒ හිස් පුරුෂයෝ මෙබඳුවූ අනාචාරයන්හි හැසිරෙත්ද? මෙහි 1 (ii) 2, 3 කොටස් දක්නා) මහණෙනි, මෙය අප්‍රසන්නවූවන්ගේ පැහැදීමට හේතු නොවන්නේය (මෙහි 1 පරාජිකාවේ සුදින්න බණවරේ 30 (v)) ගර්හාකොට දැහැමිකථාවක් කොට සැරියුත් මුගලන් දෙනම ඇමතූසේක

10 "සාරිපුත්‍රය, මෞද්ගල්‍යායනය, තොපි කීටාගිරියට යව්, ගොස් අස්සජි පුනබ්බසුක භික්ෂූන්ට පබ්බාජනීය (ආරාමයෙන් නෙරපීම) කර්මය කරව්. ඔව්හු තොපගේ සද්ධිවිහාරිකයෝය" "ස්වාමීන් වහන්ස, අපි කෙසේ නම් අස්සජි පුනබ්බසුක භික්ෂූන්ට කීටාගිරියෙන් පහවන ලෙස පබ්බාජනීය කර්මය කරමුද? ඒ භික්ෂූහු චණ්ඩය, පරුෂයයි" කීහ. "සාරිපුත්‍රය, එසේ නම් තොපි බොහෝවූ භික්ෂූන් සමග යව්යයි" වදාළහ "ස්වාමීනි, එසේයයි" සැරියුත් මුගලන් සව්වයන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ

11 "මහණෙනි, මෙසේ කළ යුතුයි. පළමුකොට අස්සජි පුනබ්බසුක භික්ෂූන්ට චෝදනා කළ යුතුයි. චෝදනාකොට සිහි කළ යුතුය සිහිකරවා ඇවැත් ඔවුන් පිට පැවරිය යුතුය. එසේකොට ව්‍යක්තවූද භික්ෂූන් විසින්

සංඝයාට දැන්විය යුතුය. 'ස්වාමිනි, සංඝතෙමේ මගේ වචනය අසාවා, මේ අස්සජි පුනබ්බසුක භික්ෂූහු කුලදූෂකයෝය. ලාමක හැසිරීම් ඇත්තෝය මොවුන්ගේ ලාමක හැසිරීම් දක්නට ලැබෙන්නේද අසන්නට ලැබෙන්නේද වෙයි. මොවුන් විසින් කුලදූෂණයද කරනබව දක්නටද අසන්නටද ලැබෙයි සංඝයා අස්සජි පුනබ්බසුක භික්ෂූන් කීටාගිරියෙන් පහකිරීමට පබ්බාජනීය කර්මය කරන්නේද අස්සජි පුනබ්බසුක භික්ෂූන් කීටාගිරියෙහි නොවැසීමට පබ්බාජනීය කර්මය කරන්නේ නම් ඊට සුදුසු කල් ඇත්තේය' මේ දැන්වීමයි.

12 'ස්වාමිනි, සංඝතෙමේ මගේ වචනය අසාවා, මේ අස්සජි පුනබ්බසුක භික්ෂූහු කුල දූෂකයෝය ලාමක හැසිරීම් ඇත්තෝය. මොවුන්ගේ ලාමක හැසිරීම් දක්නටද අසන්නටද ලැබෙයි. මොවුන් විසින් කුල දූෂණය කරන ලද බවද අසන්නට දකින්නට ලැබෙයි. ඒ නිසා අස්සජි පුනබ්බසුක භික්ෂූන් කීටාගිරියෙහි නොවිසිය යුතුයයි කීටාගිරියෙන් පහකිරීමට පබ්බාජනීය කර්මය කරන්නේද, ඊට සඞ්ඝයා කැමති වේවා, ඒ පිණිස සංඝයා තුෂ්ණීම්භූත වන්නේද, මැනවි. යමෙක් නොකැමැති වන්නේ නම් හෙතෙම කිය යුතුය'

13 'දෙවනුවත් මේ කාරණය කියමි. (මෙහි 12 ඡේදය) තුන්වෙනුවත් මේ කාරණය කියමි. (මෙහි 12 ඡේදය) සංඝයා විසින් අස්සජි පුනබ්බසුක භික්ෂූන් කීටාගිරියෙහි නොවැසිය යුතුයයි, අස්සජි පුනබ්බසුක භික්ෂූන් කීටාගිරියෙන් පහකිරීමට පබ්බාජනීය කර්මය කරන ලද්දේය එය සංඝයාගේ කැමැත්ත පරිදියි. ඒ නිසා තුෂ්ණීම්භාවය වීය. එය එසේම දරමියි' කියායි.

14 එකල්හි සැරියුත් මුගලන් දෙනම ප්‍රධාන භික්ෂූන් වහන්සේලා කීටාගිරියට ගොස් අස්සජි පුනබ්බසුක භික්ෂූන්ට කීටාගිරියෙහි නොවිසිය යුතුය. කීටාගිරියෙන් පහවිය යුතුයයි. පබ්බාජනීය කර්මය කළහ. ඔවුන්ට සංඝයා විසින් පබ්බාජනීය කර්මය කරනලද්දේ (ii) මනාකොට නොපවතින්ද

අනුලෝම නොවෙත්ද, ඇවැතින් නිදහස්වීමට නොපිළිපදිද්ද, භික්ෂූන් සමා නොකරද්ද, භික්ෂූන්ට ආක්‍රොශ කරත්ද, පරිභාෂණය කරත්ද ඡන්දගාමිවෙත්ද, දෝසගාමිවෙත්ද මෝහගාමිවෙත්ද, භයගාමිවෙත්ද, ඊට භික්ෂූන් පමුණුවද්ද ඇතැම්හු දිශාවලට යෙත්ද ඇතැම්හු ගිහිබවට පැමිණෙද්ද (iii) යන ආකාර ඇතිවූවාහුය සම්බන්ධවූ අල්පේච්ඡ භික්ෂූහු වෙත්ද, උන්වහන්සේලා දොස් කියත් නොසතුට ප්‍රකාශ කරත්. නොසතුටුවචන කියත්. කෙසේ නම් අස්සජි පුනබ්බසුක භික්ෂූහු සංඝයා විසින් පබ්බාජනීය කර්මය කරන ලද්දෝ (මෙහි (ii)) කියායි. එකල්හි ඒ භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය.

15 මහණෙනි, සංඝයා විසින් පබ්බාජනීය කර්මය කරන ලද අස්සජි පුනබ්බසුක භික්ෂූන් (මෙහි 14 (ii)) සැබෑද?" "භාග්‍යවතුන් වහන්ස, සැබව" භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළසේක. "මහණෙනි, කෙසේ නම් ඒ හිස් පුරුෂයෝ සංඝයා විසින් පබ්බාජනීය කර්මය කරන ලද්දෝ (මෙහි 14 (ii)) දිශාවලට යෙත්ද, සිවුරු හරිද්ද, මහණෙනි. මෙය නොපැහැදුනවුන්ගේ පැහැදීමට හෝ 1 පාරාජිකයේ (සුදින්න කණ්ඩ 30 (v)) මහණෙනි, මෙසේද මේ ශික්ෂා පදය උදෙසව්:-

16 "භික්ෂුව වනාහි එක්තරා ගමක් හෝ නියම් ගමක් හෝ ඇසුරුකොට කුලදූෂකව පාපසමාචාරව වාසය කෙරේද, ඔහුගේ ලාමක හැසිරීම් දක්නට ලැබේද අසන්නට ලැබේද ඔහු විසින් කුලදූෂණය කරන ලද්දේ දක්නට ලැබේද, අසන්නට ලැබේද ඒ භික්ෂුවට භික්ෂූන් විසින් මෙසේ කියයුත්තේ වන්නේය. 'ආයුෂ්මත් තෙමේ කුලදූෂකද වෙයි. ලාමක හැසිරීම් ඇත්තේද වෙයි. ආයුෂ්මතුන්ගේ ලාමක හැසිරීම් දක්නටද අසන්නටද ලැබෙයි. ආයුෂ්මතුන් විසින් කරනලද කුලදූෂණයෝ දක්නටද අසන්නටද ලැබේ. ආයුෂ්මත් තෙමේ මේ ආවාසයෙන් පහවේවා. තොපගේ මෙහි විසීමෙන් කම් නැත.' මෙසේ ඒ භික්ෂුවට භික්ෂූන් විසින් කියනු

ලබන්නේ ඒ භික්ෂුව මෙසේ කියන්නේද වේනම්. 'භික්ෂූන්වහන්සේලා ඡන්දගතියට පැමිණෙන්නෝ වෙති. භික්ෂූහු ද්වේෂ ගාමීද වෙත්. භික්ෂූහු මෝහ ගාමීද වෙත්. භික්ෂූහු භයගාමීද වෙත්. මෙබඳු කරුණුයෙන් ඇතැම් අය පහකරත්. ඇතැම් අය පහ නොකරත්යයි' කියාද, ඒ භික්ෂුවට භික්ෂූන් විසින් මෙසේ කියයුතුය 'ආයුෂ්මත් තෙමේ එසේ නොකියාවා. භික්ෂූහු ඡන්දගාමී නොවෙති. භික්ෂූහු ද්වේෂගාමී නොවෙති. භික්ෂූහු මෝහගාමී නොවෙති. භික්ෂූහු භයගාමී නොවෙති. ආයුෂ්මත් තෙමේ කුලදූෂකය පාපසමාචාරය ආයුෂ්මතුන්ගේ ලාමක හැසිරීම් දක්නාවද අසන්නාවද ඇත. ආයුෂ්මතුන් විසින් කරනලද කුලදූෂණයෝද දකින්නාවද අසන්නාවද ඇත්තාහ. ආයුෂ්මත් තෙමේ මේ ආවාසයෙන් පහවේවා. තොපගේ මෙහි විසීමෙන් කම් නැතැයි' කියායි. මෙසේද භික්ෂූන් විසින් ඒ භික්ෂුවට කියනු ලබන්නේ එසේම ගෙණ සිටින්නේද ඒ භික්ෂුවට භික්ෂූන් විසින් තුන්වෙනවර දක්වා ඒ දුරුකිරීමට කරුණු කියයුතුයි. තුන්වනවර දක්වා කරුණු කියනු ලබන්නේ එය දුරු කරන්නේ නම් යහපත් වන්නේය. ඉදින් දුරු නොකරන්නේ නම් සංඝාදිසේස ඇවැත්වේ."

17 "මහණ තෙමේ වනාහි එක්තරා ගමක් හෝ නියම්ගමක් හෝ යනු ගමද, නියම්ගමද නගරයද, ගමද නියම්ගමද වේ.' 'ඇසුරුකොට වාසය කෙරේ' යනු එහි චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස බෙහෙත් පිරිකර යන මෙහි බැඳුනාහුවෙත්. "කුල" නම් ක්ෂත්‍රිය කුලය, බ්‍රාහ්මණ කුලය, වෛශ්‍ය කුලය, ශුද්‍ර කුලය යන සතර කුලයෝය. "කුලදූෂක" යනු මල්දීමෙන් හෝ ඵලදීමෙන් හෝ සුණුදීමෙන් හෝ මැටිදීමෙන් හෝ දැහැටි දඬුදීමෙන් හෝ හුණගස් දීමෙන් හෝ වෙදකම් කිරීමෙන් හෝ පණිවුඩ ගෙන යාමෙන් හෝ කුලදූෂණය කිරීමයි. "පවිටු හැසිරීම්" යනු මල් ගස් සිටුවන්නේද අනුන් ලවා සිටුවන්නේද දිය ඉසින්නේද ඉස්සවන්නේද කඩන්නේද කඩවන්නේද ගොතන්නේද ගොතවන්නේද යනුයි "පෙනෙත් අසත්" යනු සම්මුඛව ඉදිරිපිට හෝ දකිත්ද යමෙක් අනභිමුඛයෙහි හෝ අසත්ද

යනු "ඔහුගෙන් කලකිරුණු ගෙවල්" යනු පෙරළින් සැදැහැ-යෙන් යුක්තව ඔහු නිසා අශ්‍රද්ධාවන්ත වෙත්ද පැහැදී නො-පැහැදී සිටිත්ද යනුයි. "ඒ මහණ තෙමේ" යනු යම් ඒ කුලදූෂක භික්ෂුවක් වේද ඔහුයි. "භික්ෂූන් විසින්" යනු අන් භික්ෂූන් විසින් යනුයි. යමෙක් තුමූ දකිත්ද, යමෙක් තුමූ අසත්ද ඔවුන් විසින් කියයුතුය. ආයුෂ්මත් තෙමේ කුලදූෂකද පාපසමාචාරද වේ. ආයුෂ්මතුන්ගේ ලාමක හැසිරීම දක්නාවද අසන්නාවද ලැබේ.

18 ආයුෂ්මතුන් විසින් කුලයෝ දූෂ්‍ය කරනලද බව දක්නාවද අසන්නාවද ලැබේ. "ආයුෂ්මත් තෙමේ මේ ආවාසයෙන් යේවා! මෙහි විසීමෙන් නම් නැතැයි" කියයි. මෙසේද ඒ භික්ෂුවට භික්ෂූන් විසින් කියනු ලබන්නේ ඒ භික්ෂුව මෙසේ කියන්නේද "භික්ෂූහු ඡන්දගාමීද වෙත් ද්වේෂගාමීද වෙත්. මෝහගාමීද වෙත්. භයගාමීද වෙත්. මෙබඳු ඇවැත්-වලින් ඇතැම් අය පහකරත්, ඇතැම් අය පහනොකරතැයි" කියයි "ඒ මහණතෙම" යනු යම්බඳුවූ නමක් කරනලද භික්ෂුවකි "භික්ෂූන් විසින්" යනු අන් භික්ෂූන් විසින් යමෙක් තුමූ දකිත්ද යමෙක් තුමූ අසත්ද ඔවුන් විසින් කියයුතුයි "ආයුෂ්මත් තෙමේ එසේ නොකියාවා! භික්ෂූහු ඡන්දගාමී නොවෙත් භික්ෂූහු ද්වේෂගාමී නොවෙත්. භික්ෂූහු මෝහගාමී නොවෙත්. භික්ෂූහු භයගාමී නොවෙත්. ආයුෂ්මත් තෙමේ කුලදූෂකද පාපසමාචාරදවේ. ආයුෂ්මතුන්ගේ පාපී ලාමක හැසිරීම දක්නාවද අසන්නාවද ලැබේ. ආයුෂ්මතුන් විසින් කුලදූෂණය කරනලද බවද දක්නාවද අසන්නාවද ලැබේ. ආයුෂ්මත් තෙමේ මේ ආවාසයෙන් යේවා! තොපගේ මෙහි විසීමෙන් නම් නැත." දෙවෙනුවත් කියයුතුය තුන්වෙනුවත් කියයුතුයි.

19 ඉදින් දුරුකරන්නේ නම් එසේ මැනවි. ඉදින් දුරු නොකරන්නේ නම් දුකුළා ඇවැත්වේ. අසා නොකියන්නෝ දුකුළා ඇවැත්වේ. ඒ භික්ෂුව සංඝ මැදටද ගෙණ කියයුතුය 'ආයුෂ්මතුන් එසේ නොකියව, භික්ෂූහු ඡන්දගාමී නොවෙත්. භික්ෂූහු ද්වේෂගාමී නොවෙත්.

භික්ෂූහු මෝහගාමී නොවෙත්. භික්ෂූහු භයගාමී නොවෙත්. ආයුෂ්මත් තෙමේ කුලදූෂකද පාපසමාචාරද වෙයි. ආයුෂ්මතුන්ගේ ලාමක හැසිරීම් දක්නාවද අසන්නාවද ලැබේ. ආයුෂ්මතුන් විසින් කුලයෝද දූෂණය කරනලද බව දක්නාවද අසන්නාවද ලැබේ. ආයුෂ්මතුන් මේ ආවාසයෙන් බැහැර යේවා! නොපගේ මෙහි විසීමෙන් කම් නැතැයි'' කියයි. දෙවනුවත් කියයුතුය තුන්වෙනුවත් කියයුතුය. ඉදින් දුරු කරන්නේ නම් යහපත් වන්නේය.

20 ඉදින් දුරු නොකරන්නේ නම් දුකුලා ඇවැත් වේ. ඒ භික්ෂුවට සමනුභාසනය (කරුණු කීම) කළ යුතුය. මහණෙනි, මෙසේද සමනුභාසනය කළයුතුවන්නේය ව්‍යක්තවූද බලයට පත්වූද භික්ෂුවක් විසින් සංඝයාට දැන්විය යුතුයි. "ස්වාමීනි, සංඝතෙමේ මාගේ වචනය අසාවා. සංඝයා විසින් පබ්බාජනීය කර්මය කරන ලද මේ අසවල් භික්ෂූ භික්ෂූන්ට ඡන්දගාමීනොවෙත්ද ද්වේෂගාමීනොවෙත්ද මෝහගාමීනොවෙත්ද භයගාමීනොවෙත්ද ඈරදි පමුණුවයි නොහැකිය ඒ කාරණය දුරු නොකරයි. සංඝයා අසවල් භික්ෂුවට ඒ කරුණු දුරු කිරීමට කාරණා කියන්නේ නම් ඒව සුදුසු කල් වන්නේය.'' මෙම දැන්වීමයි.

21 "ස්වාමීනි, සඞ්ඝයාමේ මාගේ වචනය අසාවා, සංඝයා විසින් පබ්බාජනීය කර්මය කරනලද මේ අසවල් භික්ෂුව ඡන්දගාමීනොවෙත්ද ද්වේෂගාමීනොවෙත්ද මෝහගාමීනොවෙත්ද භයගාමීයාවෙත්ද භික්ෂූන්ට දොස් පමුණුවයි. නොහැකිම ඒ කරුණු දුරු නොකරයි සඞ්ඝයා ඒ කරුණු දුරු කිරීමට අසවල් භික්ෂුවට කරුණු කියාමා ඒ දුරුකිරීමට ඒ භික්ෂුවට කරුණු කීම යම් ආයුෂ්මතෙකුට රුචිවේද, හෙතෙම තුෂ්ණීම්භාවය ඇත්තෙක්වේවා, යමෙක් නොකැමැති වන්නේනම් හෙතෙම කියාවා.''

22 දෙවනුවත් මේ කාරණය කියමි (මෙහි 21 ඡේදය) තුන්වෙනුවත් මේ කාරණය කියමි. (මෙහි 1 ඡේදය) ඒ කාරණය දුරුකිරීමට සංඝයා විසින් අසවල් භික්ෂුවට මනා

කොට කියකලද්දට සංඝයා කැමතිවේනම් ඒ පිණිස තුෂ්ණිම්-භූත වෙච්. මෙය එසේ දරමියි කියයි. ඤත්තියෙන් දුකුලා වේ, කම්මවාචා දෙකෙන් ථුලසී වේ. කම්මවාචා අවසාන යේ සංඝාදිසේස ඇවැත්වේ. සංඝාදිසේසයට පැමිණියහුට ඤත්තියෙන් දුකුලා වේ. කම්මවාචා දෙකෙන් ථුලසී සංසිඳීමට යෙත්.

43 "සංඝාදිසේසො" යනු සංඝයාම ඒ ඇවැතට පරිවාස දේද මූලාය පටිකස්සනය කෙරේද මානත්ත දේද අබ්භානය කරාද, බොහෝ අය නොවේද, එක පුද්ගලයෙකුත් නොවේද, එහෙයින් සංඝාදිසේසය කියනුලැබේ ඒ ඇවැත් සමූහයට නාම කර්මයාගේද ව්‍යවහාර කරනු ලැබේ. එයින්ද සංඝාදිසේසය කියනු ලැබේ ධර්ම කර්මයෙහි ධර්ම කර්ම සංඥා ඇත්තේ දුරුකරනා කෙරේද, සංඝාදිසේස ඇවැත්වේ. ධර්ම කර්මයෙහි විමතිකවූයේ දුරුකරනා කෙරේද සංඝාදිසේස ඇවැත් වේ. ධර්ම කර්මයෙහි අධර්ම කර්ම සංඥා ඇත්තේ දුරුකරනා කෙරේද සංඝාදිසේස ඇවැත්වේ. අධර්ම කර්මයෙහි ධර්ම කර්ම සංඥා ඇත්තේ දුකුලා ඇවැත්වේ. අධර්ම කර්මයෙහි විමතිකවූයේ දුකුලා ඇවැත්වේ. අධර්මකර්මයෙහි අධර්මකර්ම සංඥා ඇත්තේ දුකුලා ඇවැත්වේ. කරුණු නොකියන්නහුටද" දුරුකරන්නහුටද, උම්මත්තකයාටද, ආදිකර්මිකයාටද ඇවැත් නොවේ."

(13 කුලදූෂක සංඝාදිසේසය නිමි)

---

"ඇවැත්නි, තෙළෙස් සංඝාදිසේස ධර්මයෝ ප්‍රකාශ කරණ ලදහ. (ඔවුන් අතුරෙන්) කඩකළ කෙණෙහිද පැමි-ණිය යුතු ඇවැත් නව දෙනෙකි. තුන්වෙනි වර කියාදීමෙහි පැමිණියයුතු ඇවැත් සතර දෙනෙකි. භික්ෂුතෙම යම් ඒ සංඝාදිසේසයන් අතුරෙන් එක්තරා ඇවැතකට හෝ පැමිණ යම් පමණ දවස් දැනගෙන් ප්‍රකාශ නොකොට සඟවාද, එපමණ දවස් ඒ භික්ෂුව විසින් නොකැමැත්තෙන්වුවද පිරිවෙස් විසිය යුතුයි. විසන ලද පිරිවෙස් ඇති භික්ෂුව විසින් පිරිවෙස් විසී-මෙන් මත්තෙහි [illegible] රාත්‍රි සයක් භික්ෂූනට බුහුමන් කිරීම පිණිස

පිළිපාදිය යුතුය. පුරණ ලද මානත් ඇති යම් භික්ෂුවක් වේද ඒ මහණතෙම විසතිවග්ගික සංඝයා යම් සීමාවෙක්හි වන්නේද, එහිදී (අබ්භාන නම් කර්මය කොට) ඇතුලත් කළ යුතුයි. විසතිවග්ගික සංඝයා එක් මහණකුගෙන්ද අඩුවූයේ නම් ඒ භික්ෂූහු චෝදනාලත් භික්ෂුව අබ්භාන කර්මවශයෙන් ඇතුලත් කෙරේ (නම් ඒ භික්ෂුතෙමේද ඇතුලත් නො කරණ ලද්දේය ඒ (කර්මය කළ) භික්ෂූහුද නින්දා ලැබිය යුතුය ඒ සංඝාදිසෙසාපත්තියෙහි මේ ප්‍රතිපත්තියයි

"ඒ තෙළෙස් සංඝාදිසේසාපත්තීන්හි ලා ආයුෂ්මතුන් විචාරමි කිම පිරිසිදුවහුද, දෙවනුවත් විචාරමි කිම පිරිසිදුවහුද, තුන්වෙනුවත් විචාරමි. කිම පිරිසිදුවහුද, මෙහි ආයුෂ්මත්හු පිරිසිදුහ. එහෙයින් තුෂ්ණීම්භාවය වෙයි. මේ තුෂ්ණීම්භාවය මෙසේම දරමි"

(සඞ්ඝාදිසේස නිමි.)

# 3 අනියත දෙක

## පළමුවෙනි අනියත ශික්ෂාපදය

1 "ආයුෂ්මත්නි, මේ අනියත ධර්ම දෙක කියවනු පැමිණෙත්" (i) එකල්හි වනාහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර අනේපිඬු මහසිටාණන් විසින් කරවා පූජා කරන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. (ii) එකල්හි වනාහි ආයුෂ්මත් උදායි තෙමේ සැවැත්නුවරට කුළුපගවූයේ විය. බොහෝ ගෘහයන්ට එළඹෙයි. එකල්හි වනාහි ආයුෂ්මත් උදායි තෙරුන්ට උපස්ථාන කරන ගෘහයාගේ කුමාරිකාවක් අනික් ගෘහයක කුමාරයෙකුට දෙනලද්දේ වෙයි. ඉක්බිති ආයුෂ්මත් උදායි තෙමේ පෙරවරු වේලෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන ඒ ගෘහය යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ මෙනම් ඇත්තී කොහිදැයි ඇසුවේය. "ස්වාමීනි, අසවල් ගෘහයෙහි කුමාරයෙකුට දෙන ලද්දීයයි" කීවාහුය. ඒ ගෘහයද ආයුෂ්මත් උදායීගේ උපස්ථායක ගෙයකි.

2 ඉක්බිති ආයුෂ්මත් උදායි තෙමේ ඒ ගෘහය යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ මිනිසුන්ගෙන් මෙනම් ඇත්තී කොහිදැයි ඇසීය. ඔව්හු "ආර්යයන් වහන්ස, ඕතොමෝ කාමරයෙහි සිටින්නීයයි" කීවාහුය. ඉක්බිති ආයුෂ්මත් උදායි තෙමේ ඒ කුමාරිකාව යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ඒ කුමාරිකාව සමග තනිව තනිවූ ඇ සමග රහස් කටයුතුවලට යෝග්‍ය වැසුනු අස්නෙක්හි අවස්ථාවට ගැලපෙනසේ ආදර කථා කරමින්ද ධර්ම සාකච්ඡා කරමින්ද හුන්නේය.

3 ඒ කාලයෙහි වනාහි මිගාර මාතාවූ විශාඛාව ශ්‍රේෂ්ඨ-වැදගත්තියයි සම්මතවූ බොහෝ පුත්‍රයන් බොහෝ මුනුපුරන් නීරෝග පුත්‍රයන් නීරෝග මුනුපුරන් ඇත්තී වෙයි. මිනිසුන්-ගේ යාගයන්හිදී, මංගල්‍යවල උත්සවලදීද, මහජන උත්සව

මලදීද, පළමුවෙන් විශාඛා මිගාර මාතාව මුලදවිති. ඉක්බිති මිගාර මාතා විශාඛා තොමෝ ආරාධනා ලැබ ඒ ගෘහයට ගියා ය. මිගාර මාතා විශාඛා තොමෝ ඒ කුමාරිකාව සමග තනි වූයේ රහස් කටයුතුවලට යෝග්‍ය අස්නෙක්හි හුන් ආයුෂ්මත් උදායි තෙරුන් දුටුවා ය. දැක ආයුෂ්මත් උදායිට 'ස්වාමීනි, ආර්යයන් වහන්සේ ස්ත්‍රියක් සමග තනිවූයේ තනිවූ කටයුතු වලට යෝග්‍යවූ ආසනයෙක්හි සමග හිඳීමක් කෙළේද එය නුසුදුසුය, නොගැළපෙයි ස්වාමීනි, ඒ ධර්මයෙන් ප්‍රයෝජ-නයක් නැත්තෙකු වූවත් මනුෂ්‍යයෝ ශ්‍රද්ධා නැත්තෝ වෙත්. කලකිරෙන්නාහු වෙත්.' ආයුෂ්මත් උදායි තෙමේ මිගාර මාතාවූ විශාඛාව විසින් මෙසේ කියනු ලබන්නේද නොපිළි-ගත්තේය.

4 ඉක්බිති (i) මිගාර මාතාවූ විශාඛා තොමෝ මෙපවත් භික්ෂූන්ට මේ කාරණය සැලකළාය. (ii) ලද දෙයින් සතුටුවූ යම් භික්ෂු කෙනෙක් වෙත්ද ඔව්හු දොස් කියන්ට වන්හ. නුගුණ කියන්නට වන්හ. නොසතුටු වචන පතුරුවන්නට වන්හ "කෙසේ නම් ආයුෂ්මත් උදායි තෙමේ (iii) ස්ත්‍රියක් සමග තනිවූයේ තනිවූවක සමග රහසිගතවූ කටයුතුවලට යෝග්‍යවූ ආසනයෙක්හි හිඳීම (iv) කරන්නේදැයි" කියායි.

5 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. (ii) "උදායි තනිවූ (මෙහි 4 (ii) කරන්නේදැයි" ඇසූසේක. (iii) "භාග්‍යවතුන්වහන්ස, ඇත්තය." භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ නින්දාකළසේක. හිස් පුරුෂය, කෙසේ නම් ඔබ (iv) (මෙහි 4 (iii) කෙළෙහිද,(මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v) )

6 යම් භික්ෂුවක් තෙමේ හුදකලාවූයේ හුදකලාවූ මිනිස් ස්ත්‍රියක් හා සමග වැසුනාවූ මෛථුන සේවනයට යෝග්‍යවූ ආසනයක හිඳීම කෙරේද, ඒ මේ භික්ෂුව ඇදහිය යුතු වචන ඇති උපාසිකාවක් තොමෝ දැක ත්‍රිවිධ ඇවැත් අතුරෙන් එක්තරා ඇවතක්වූ පාරාජිකාවෙන් හෝ සංඝාදිසේසයෙන් හෝ පචිත්තියෙන් හෝ කියා නම් භික්ෂුතෙම හුන් බව

පිළිගන්නේ තුන් ආකාර ආපත්තීන් අතුරින් එකක්වූ පාරාජිකාවෙන් හෝ සංඝාදිසේසයෙන් හෝ පචිත්තියෙන් හෝ කරවිය යුත්තේය. ඇදහිය හැකි වචන ඇති ඒ උපාසිකා තොමෝ යම් ආකාරයකින් කියන්නීද ඒ භික්ෂු තෙම ඒ ආකාරයෙන් කරවිය යුත්තේය. මේ ධර්මයතෙම අනියත නම් වේ ”

7 “යමෙක් වනාහි” යනු භික්ෂු යනු (මෙහි 1 පාරාජිකාවේ පදභාජනියේ 1-2 ඡේද) (ii) “ස්ත්‍රිය” යනු මනුෂ්‍ය ස්ත්‍රියකි යක්ෂණියක් නොවේ, ප්‍රේතියක් නොවේ. තිරිසන් ගතවූවක් නොවේ. (iii) එදින් පිරිසැගින් එදා උපන් දැරියක් ස්ත්‍රිය නම්. වැඩුනියක් ගැන කියනුම කවරේද? (iv) “සමග” යනු එකවිට හුදකලාවූයේ හුදකලාවූවකු “සමග” යනු භික්ෂුද ස්ත්‍රියද යන දෙදෙනායි. “රහසිගතව” යනු (v) ඇසට රහසින්, කනට රහසින් යනුයි “ඇසට රහසින්” යනු ඇස හෝ ගසන කල්හි බැම හෝ ඔසවන කල්හි හිස හෝ ඔසවන කල්හි දකින්නට නොහැකි වේයි. කනට රහසින් නම් ප්‍රකෘති කථාව ඇසෙන්නට නොහැකි වේයි 'වැසුනේ' යනු යම්කිසි ප්‍රාකාරයකින් හෝ දොරපළුවකින් හෝ කැදුරකින් හෝ රෙද්දකින් හෝ මාසකකින් හෝ ගසකින් හෝ කණුවකින් හෝ කැටපතකින් හෝ වැසුනේවේ “ක්‍රියාවට යෝග්‍යවූ” යනු මෛථුන ධර්මය සේවනය කිරීමට හැකිවූ (vi) “හිඳීම කරන්නේය” යනු ස්ත්‍රිය හුන් කල්හි භික්ෂුව ළංව හුන්නේ හෝ හොත්තේ හෝ වේද, භික්ෂුව හුන් කල්හි ස්ත්‍රිය ළංව හුන්නේ හෝ හොත්තේ හෝ වේද, දෙදෙනාම හුන්නෝ හෝ හොත්තෝ හෝ වේද, “ඇදහිය යුතු වචන ඇති” යනු පැමිණි මාර්ග ඵල ඇති අවබෝධ කළගත් චතුරාර්යසත්‍ය ඇත්තාවූ සත්‍ය දත්තාවූ යනුයි ‘උපාසිකාවක්’ නම් බුදුන් දහම් සඟුන් සරණ ගිය තැනැත්තියකි. පාරාජික සංඝාදිසේස පාචිත්තිය යන ත්‍රිවිධ ආපත්තීන් අතුරින් එකක් කියන්නේය හිඳීම පිළිගත්තාවූ භික්ෂුවට පාරාජික සංඝාදිසේස පාචිත්තිය යන තුන්වැදෑරුම් ධර්මයන්ගෙන් එකකින් දඬුවම් කළයුතුය. ඒ ඇදහියයුතු වචන ඇති

උපාසිකා තොමෝ යම් සේ කියාද එසේ ඒ භික්ෂුවට දඬුවම් කළ යුතුය. ඕ තොමෝ ඉදින් 'මා විසින් ආයුෂ්මතා එකා ගේ ස්ත්‍රියක් සමඟ මෛථුන ධර්මය සේවනය කරණු දක්නා ලදී.' (ii) යයි, මෙසේ කියන්නේද, හෙතෙම එය පිළිගනීද ඒ ඇවැතින් (දඬුවම්) කළ යුතුය. (මෙහි (i) "කියන්නේද, හෙතෙම "මම හුන්නේ ඇත්තෙය. මෛථුනධර්මය සේවනය නොකොළෙමියි මෙසේ කියන්නේය. හිඳීම ගැන චෝදනා කටයුතුය. (මෙහි (i) කියන්නේ නම් මෙසේ කියන්නේ නම් මම හුන්නේ නොවෙමි. හොත්තේයයි කියන්නේ නම් හොවීමට චෝදනා කටයුතුය. (මෙහි (i) ස්ත්‍රියක සමඟ මෛථුනයෙහි යෙදෙනු දක්නා ලද්දේයයි කියන්නේද, හෙතෙම ඉදින් මා හොත්තේ නොවෙමි. එනමුදු ඇය ගෙයි සිටියේයයි කියන්නේද චෝදනා නොකළ යුතුය.

8 (මෙහි 7 ඡේදයේ "හුන්නේද" වෙනුවට "හොත්තේ" "හොත්තේද" වෙනුවට "හුන්නේද" යොදත්ත.)

9 (මෙහි 7 ඡේදයේ "මෛථුන ධර්මය සේවනය කරමින්" යන්නට "කාය සංසර්ගයට" කියාද "මෛථුන ධර්මයේ නොයෙදුනෙමි" කියාද වෙනස්කර යොදාගත යුතුයි.)

10 (මෙහි 5 ඡේදයේ මෛථුන ධර්මය සේවනය නොකෙළෙමි" වෙනුවට "කාය සංසර්ගයට නොපැමිණියෙමි" යොදත්ත.)

11 "ස්ත්‍රියකට මෛථුන ධර්මය සේවනය කරන්නේ දක්නා ලදී" යන්නට (ii) "ස්ත්‍රියක් සමඟ තනිවූ එකියක් සමඟ රහසිගතවූ මෛථුන කර්මයට සුදුසු වැසුන අසුනක හුන්නේ මා විසින් දක්නා ලදීයයි" (iii) කියා වෙනස් කොට යොදාගත යුතුයි.)

12 (මෙහි 11 ඡේදයේ (ii)) හෙතෙම එය පිළිගනීද හිඳීමට චෝදනා කටයුතුය. මම වැදහොත්තේ නොවෙමි වාඩිවී සිටියෙමි කියා සම වාඩිවීමට චෝදනා කටයුතුය. මම වැද හොත්තෙන් නොවෙමි, නැගිටසිටියෙමියයි කියා නම් චෝදනා නොකටයුතුය. "අනියත" යනු: පාරාජිකාවට හෝ සංඝාදිසේසයට හෝ පාචිත්තියට හෝ නියමයක් නොවූයේ යනුයි.

13 හැතිම හිඳීමේ ආශ්වාදයට ඡන්දයෙම්මියි යාම පිළිගණී, හිඳීම පිළිගණී, ඇවත පිළිගණී, එක් ඇවතකින් චෝදනා කටයුතුය. යාම පිළිගණී, හිඳීම නොපිළිගණී, ඇවත පිළිගණී, එක් ඇවතකින් චෝදනා කටයුතුය. යාම පිළිගණී හිඳීම පිළිගණී, ඇවත නොපිළිගනී. නොවීමෙන් චෝදනා කටයුතුය. යාම පිළිගනී, හිඳීම නොපිළිගනී, ඇවත නොපිළිගනී චෝදනා නොකටයුතුය.

14 ගමන නොපිළිගනී, හිඳීම පිළිගනී, ඇවත පිළිගනී, ඇවතින් චෝදනා කටයුතුය. යාම නොපිළිගනී හිඳීම නොපිළිගනී, ඇවත පිළිගනී, ඇවතින් චෝදනා කටයුතුය. යාම නොපිළිගනී, හිඳීම පිළිගනී, ඇවත නොපිළිගනී, හිඳීම නිසා චෝදනා කළයුතුය. යාම නොපිළිගනී, හිඳීම නොපිළිගනී ඇවත නොපිළිගනී, චෝදනා නොකටයුතුය

---

## දෙවෙනි අනියතය

1 (පෙම්හි 1 අනියත 1 (i) එකල්හි මානාහි ආයුෂ්මත් උදායි තෙරණම භාග්‍යවතුන් වහන්සේ විසින් තනිවූ ස්ත්‍රියක් සමග රහසිගතාවූයේ මෛථුන ක්‍රියාවට යෝග්‍යවූ ආවරණයවූ අසුනෙක්හි හිඳීම කරන්නට නුසුදුසුයයි ප්‍රතික්ෂෙප කරණ ලදීයයි (ii) තනිවූ ඒ කුමාරිකාව සමගම මෛථුන ක්‍රියාවට යෝග්‍යවූ ආවරණයවූ අස්නෙක්හි අවසථාවට ගැලපෙන ලෙස කථා කරමින්ද බණ කියමින්ද හිඳීම කෙළේය

2 දෙවනුවත් ආරාධනා ලද්දාවූ විශාඛා උපාසිකා තොමෝ ඒ ගෙදරට ගියාය. ආරාධනා ලද්දාවූ මිගාරමාතාවූ විශාඛාව ආයුෂ්මත් උදායි තෙරුන් කුමරිය සමගම තනිව හිටිම දුක ආයුෂ්මත් උදායිව "ස්වාමීනි ආර්යයන් වහන්සේ (ii) හුදකලාවූ ස්ත්‍රියක සමග රහසිගතව හිඳීම කෙළේද, (iii) මෙය නුසුදුසුය. නොගැලපේයයි කීවාය. ස්වාමීනි, (iv) ආර්යයන්වහන්සේ කිසියේත් ඒ ක්‍රියාවට අනමැතිවුවත් මිනුෂ්‍යයෝ ශ්‍රද්ධාව නැත්තෝ වෙත්. අසතුටු

වෙත්. ඒ ජේද නොහි අැසුන් ත් උදයිව විශාඛා මිගාර මාතාව කියනු ලබන කල්හිත් නොපිළිගත්තේය (මෙහි 1 අනියතයේ 4 (i) සහ මෙහි 2 (ii) ) විශාඛාව පිටත්වී භික්ෂූන්ට මේ කාරණය සැලකළාය. (මෙහි 1 අනියතයේ 5 (i) "උදයි ඔබ (මෙහි 2 (ii) 1 අනියතයේ 5 (iii) මෙහි 2 (ii) (මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v) )

3 යම් භික්ෂුවක් හුදකලාවූයේ හුදකලාවූ ස්ත්‍රියක් සමඟ රහසිගතවූ එබඳුවූ අසුනෙක්හි හිඳීම් කෙරේද, ඇද කියයුතු වචන ඇති උපාසිකාවක් තොමෝ ඒ භික්ෂුව දුටු දෙවැදෑරුම් ආපත්තීන් අතුරෙන් එක්තරා සංඝාදිසේසයෙන් හෝ පාචිත්තියෙන් හෝ කියන්නීද භික්ෂුව හිඳීම ප්‍රතිඥාකරන්නේ ත්‍රිප්‍රකාර ආපත්තීන් අතුරෙන් එක්තරා සංඝාදිසේසයෙන් හෝ පචිත්තියෙන් හෝ චෝදනා කළයුත්තේය. ඇදහිය යුතු වචන ඇති ඒ උපාසිකාතොමෝ යම් ආකාරයකින් කියන්නීද ඒ භික්ෂුතෙම ඒ ආකාරයෙන් ප්‍රතිකර්ම කරවිය යුත්තේය. මේ ධර්මයද කීම පරිදි කටයුතු බැවින් අනියතවේ.

4 "ආසනය නොවැසුණේ වේ" යනු ප්‍රතිච්ඡන්න නොවූයේය. ප්‍රාකාරයකින් හෝ දොරපළුවකින් හෝ පැදුරකින් හෝ තෙද්දකින් හෝ වාසුළයකින් හෝ කණුවකින් හෝ කළුවපතකින් යම්කිසිවකින් වැසුනේ වේ.

"මෛථුන කර්මයට නුසුදුසු" යනු මෛථුන ධර්මය සේවනය කරන්ට නොහැකිවේ. ස්ත්‍රියක හා අසභ්‍යපසට යෝග්‍ය වචනයක්ගෙන් කථාකරන්නට හැකිවේ "යම්කිසි එකෙක්" යනු 'භික්ෂු' යනු (මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 1-2) 'එබඳු අසුනෙක' යනු එබඳු අසුනෙක යනුයි. "ස්ත්‍රියක්" (මෙහි 1 අනියතයේ 7 (ii) යනුයෙන් මවත අශ්ශ සත් මවන නපුරු ඇසුරු කළ මවත නපුරු ඇසුරු නොකළ මවත දූෂණයට පත්නොවූ ස්ත්‍රියක් යනුයි" (මෙහි 1 අනියතයේ 7 (iv) (v) "දුටු" යනු බලා යනුයි. දෙවැදෑරුම් ධර්මයන් අතුරෙන් සංඝාදිසේසයෙන් හෝ පාචිත්තියෙන් හෝ එක්තරා එකකින් කියන්නේය. භික්ෂුව හිඳීම පිළි

කයෙන් සංඝාදිසේසයකින් හෝ පාචිත්තියෙන් හෝ එකකින් චෝදනා කළ යුත්තේය. ඒ ඇදහිය යුතු වචන ඇති උපාසිකාව යමකින් කියන්නේද ඉන් ඒ භික්ෂුව චෝදනා කරවිය යුත්තේය.

5 ඕ තොමෝ ඉදින් ආයුෂ්මතුන් වහන්සේ ස්ත්‍රියක් සමග කාය සංසර්ගයට පැමිණෙන්නේ 'මා විසින් දක්නා ලදැයි' මෙසේ කියන්නේද තෙතෙමේද එය පිළිගණීද ඇවතින් කරවිය යුත්තේය. ඕතොමෝ ඉදින් ආයුෂ්මතුන් වහන්සේ ස්ත්‍රියක් සමග මෛථුන ධර්මය සේවනය කරන්නක් දක්නා ලදැයි (ii) තෙතෙම ඉදින් එසේ කියන්නේද (iii) 'මම හුන්නේ ඇත්තය. සංසර්ගයට නොපැමිණුනෙමියි' මෙසේ කියන්නේය. හිඳීමෙන් දඬුවම් කටයුත්තේය. ඕතොමෝ ඉදින් ආයුෂ්මතුන් වහන්සේ ස්ත්‍රියකු සමග හුන්නේ මෛථුන ධර්මය සේවනය කිරීම දක්නා ලද්දේයයි' කියන්නේද තෙතෙම ඉදින් මෙසේ කියන්නේද 'මම හුන්නෙමි නොවෙමි. එතකුදුවුවත් හොත්තෙමියි' කියන්නේය. හිඳීමෙන් දඬුවම් කළ යුතුය. ඕතොමෝ ඉදින් ආයුෂ්මතුන් වහන්සේ හුන් ස්ත්‍රියක හා මෛථුන ධර්මය සේවනය කරන්නේ දුටිමියි' කියන්නේද, තෙතෙම ඉදින් 'මම හුන්නේ නොවෙමි, එසේවුවත් හිටගෙන සිටියෙමියි' කියන්නේද චෝදනා නොකට යුත්තේය.

6 ඕතොමෝ ඉදින් 'මා විසින් ආයුෂ්මතුන් වහන්සේ හුන්නේ ස්ත්‍රියක් සමග කාය සංසර්ගයට පැමිණියේ දක්නා ලද්දෙමියි' කියන්නේද, තෙතෙම එය පිළිගණීද ඇවතින් චෝදනා කළයුත්තේය. (මෙහි 5 (ii)) වැදහොත්තේ ඇත්තය. එසේවුවත් කාය සංසර්ගයට නොපැමිණියෙමියි වැදහොවීමෙන් චෝදනා කටයුතුය. (මෙහි 5 (ii)) 'මම වැදහොත්තේ නොවෙමි එතකුදු වුවත් හුන්නේයයි' කීකල හිඳීමෙන් චෝදනා කටයුතුය (මෙහි 5 (ii)) 'මම වැදහොත්තේ නොවෙමි එතකුදු වුවත් සිටියේයයි' කීකල චෝදනා නොකටයුතුය.

7 ඉදින් ඕතොමෝ ඉඳගත් ආයුෂ්මතුන් වහන්සේ ඉඳගත් ස්ත්‍රියකට කපුරු ඇසුරුකළ වචන මලින් කියන්නේ

මා විසින් අසන ලද්දේයයි' කියන්නේද, හෙතෙමේද එය පිළිගනීද ඇවතින් චෝදනා කටයුතුය. ඔහොමෝ ඉදින් ආයුෂ්මතුන් වහන්සේ ඉදගත් ස්ත්‍රියකට කපුර ඇසුරු කළ වචන වලින් කියන්නාවූ වචන අසන ලද්දීයයි කියන්නේද, හෙතෙම ඉදින් එසේ කියන්නේ නම් මම ඉඳගෙන සිටි බව ඇත්තය, එතකුදුවූවත් කපුර ඇසුරු කළ වචන වලින් කථා නොකෙළෙමියි' කිදීමෙන් චෝදනා කළයුතුය. (මෙහි 5 (ii) ) මම ඉදගත්තේ නොවෙමි. එතකුදුවූවත් හොත් තෙමියයි' කීකල නොවීමෙන් චෝදනා කටයුතුය (මෙහි 5 (ii) ) මම ඉදගත්තේ නොවෙමි එතකුදුවූවත් සිටියෙමියයි' කියන්නේය. චෝදනා නොකළ යුතුය

8 ඔහොමෝ ඉදින් 'මා විසින් ආයුෂ්මතුන් වහන්සේ වැදහොත්තේ ස්ත්‍රියකට කපුර ඇසුරු කළ වචන වලින් කියද්දී ඇසුයෙමියි කියන්නේද, (ii) හෙතෙමේද එය පිළිගනීද ඇවතින් චෝදනා කටයුතුය. (මෙහි 5 (ii) ) වැදහොත්තේ ඇත්තය. කපුර ඇසුරු කළ වචන වලින් කථා නොකෙළෙමි. වැදහොවීමෙන් චෝදනා කළයුතුය (මෙහි 5 (ii) ) 'මම හොත්තේ නොවෙමි. එතකුදු වූවත් හුන්නේය. කිදීමෙන් චෝදනා කටයුතුය (මෙහි 5 (ii) ) 'මම හොත්තේ නොවෙමි. එතකුදු වූවත් සිටියේවෙමියි කීකල චෝදනා නොකළ යුතුය.

9 (i)ඔහොමෝ ඉදින් 'ආයුෂ්මතුන් වහන්සේ තනිවූ ස්ත්‍රියක් සමග හුදකලාව රහසිගතව හුන්නේ මා විසින් අසන ලදීයයි' කියන්නේද (ii) හෙතෙමේ එය පිළිගනීද කිදීමෙන් චෝදනා කළ යුතුය. (මෙහි 5 (ii )) 'මම හුන්නේ නොවෙමි. එතකුදුවුවත් වැදහොත්තේවෙමියි වැදහොවීමට චෝදනා කට යුතුය' (මෙහි 5 (ii) ) 'මම හුන්නේ නොවෙමි.' එතකුදුවුවත් සිටියේවෙමියි කීකල චෝදනා නොකටයුතුය.

10 (i) ඔහොමෝ ඉදින් මා විසින් ආයුෂ්මතුන් වහන්සේ තනිවූ ස්ත්‍රියක් සමග හුදකලාව රහසිගතව හුන්නේයයි කියන්නේය. (ii) හෙතෙම එය පිළිගනීද නොවීමට චෝදනා කටයුතුය. (මෙහි (i) 'මම හොත්තේ නොවෙමි' එතකුදු

වුවත් හුන්නේවෙමියි' කී කල නොපිළිමින් චෝදනා කටයුතුය. (මෙහි (i) 'මම නොහුන්නේ නොවෙමි. එතකුදු වුවත් සිටියෙමි යයි' කියන්නේය. චෝදනා නොකට යුතුය. "මේද" යනු පෙරවූ දෙය ගෙන කියනු ලැබේ. "නියත තැන" යනු සංඝාදිශේෂ හෝ පාචිත්තිය හෝ කිසි නියමයක් නැත.

11 (මෙහි 1 අනියතයේ 10, 11, ඡේද යොදන්න )

12 ආයුෂ්මත්වරුනි, අනියත ධර්ම දෙක ප්‍රකාශ කරණ ලදී. (මෙහි සතරවන පාරාජිකාව අවසානයේ 155 ඡේදයේ ඇති 'කිමෙක්ද මෙහි පිරිසිදුද' යන තැන සිට යොදන්න (144 පිට)

---

# 4 නිසගි පචිති තිස

---

## 1 පළමුවෙනි කඨින ශික්ෂාපදය

"ආයුෂ්මත්නි, මේ තිසක්වූ නිසගිපචිති ශික්ෂාපදයෝ පාළිය මගයෙන් කීමට අවසරාව සැලසේ."

1 එකල්හි මහාසි භාග්‍යවත් බුද්ධරජාණන් වහන්සේ විශාලා නුවර ගෞතමක චෛත්‍ය ස්ථානයෙහි වාසය කරණ සේක. එකල්හි භාග්‍යවතුන් විසින් තුන් සිවුරට අවසර දෙන ලද්දේවේ. සවග භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ විසින් තුන් සිවුර පනවා වදාළසේකැයි අනික් තුන් සිවුරකින් ගමට වදිත්. අනික් තුන් සිවුරකින් ආරාමයෙහි සිටිති. අනික් තුන් සිවුරකින් නෑමට බසිත්. යම් ඒ භික්ෂූ කෙනෙක් සැහැල්ලු පැවතුම් ඇත්තාහුද ඔව්හු නුගුණ කියත්. දොස් කියත්. නුසුදුසු වචන කියත්. "කෙසේ නම් සවග භික්ෂූහු වැඩිපුර සිවුරු දරත්දැයි" කියති.

2 ඉක්බිති ඒ භික්ෂූහු (ii) භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ හේතුවෙහි මේ සිද්ධියෙහි (iii) භික්ෂු සංඝයා රැස්කරවා, සවග භික්ෂූන්ගෙන් විචාළසේක. "මහණෙනි, තෙපි වැඩිපුර සිවුරු දරන්නෙය යනු ඇත්තද?" "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය."

3 භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගැරහූසේක. හිස්පුරුෂයිනි තෙපි කෙසේ නම් වැඩිපුර සිවුරක් දරන්නහුද? හිස්පුරුෂයෙනි, මෙය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිසත් (මෙහි 1 පාරාජිකයේ සුදින්න ඛණ්ඩයේ 30 (v) මහණෙනි, මෙසේ මේ ශික්ෂාපදය දේශනා කරව්.

4 “යම් කිසි භික්ෂුවක් වැඩිපුර සිවුරක් දරන්නේද, නිසග්ගි පචිත්ති වේ. (ii) භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට මෙසේ මේ ශික්ෂාපදයද පණවන ලද්දේ වේ. (iii) (මතු ශික්ෂාපද අගට මේ වාක්‍ය යෙදිය යුතුයි.)

5 එකල්හි වනාහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට වැඩිපුර සිවුරක් ලැබුනේ වේ. ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ ඒ සිවුර ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට දෙනු කැමැත්තේ විය. ආයුෂ්මත් සැරියුත් තෙරතෙමේ සාකෙත නුවර වාසය කරයි. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට මේ අදහස විය. භාග්‍යවතුන් විසින් වැඩිපුර සිවුරක් නොදැරිය යුතුයයි ශික්ෂාපදයක් පනවන ලදී. “මට මේ වැඩිපුර සිවුරක්ද ඇතිවිය. මමද මේ සිවුර ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට දෙනු කැමැත්තෙමි. ආයුෂ්මත් සැරියුත්තෙර තෙමේද සාකෙත නුවරවසයි. මා විසින් කෙසේ පිළිපැදිය යුතුද්දැයි” මේ සිතවිය. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන්ට මේ කාරණය සැලකළේය.

6 “ආනන්දය, සැරියුත් තෙමේ කොපමණ කලෙකින් එන්නේද?” ‘භාග්‍යවතුන් වහන්ස දවස් නවයකින් හෝ දසයකින් යයි’ කීයේය. (i) ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ සිද්ධියෙහි දැහැමි කථාකොට භික්ෂූන්ට කථාකළසේක (ii) “මහණෙනි දසදවසක් සීමාකොට වැඩිපුර සිවුරක් දැරිය යුතුය මහණෙනි, මෙසේ වනාහි මේ ශික්ෂාපදය දේශනා කළ යුත්තේය.

7 ‘මහණෙනි, විසින් සිවුරකොට නිමාරවූ කල්හි කඨිනයේ බල නැතිවූ කල්හි දසදවසක් සීමාකොට වැඩිපුර සිවුරක් දැරිය යුතුය. එය ඉක්මවන්නාහට නිසග්ගි පචිත්ති වේ.”

8 (i) “සිවුරකොට නිමිකල්හි” යනු භික්ෂුවගේ සිවුර මැසීමෙන් අවසන් කළේවේද, නැතිවූයේ හෝ, වෙයක් විසින් කනලද්දේ හෝ දැවුනේ හෝ, සිවුරගැන ආශාව හෝ නැතිවූයේද, යනුයි (ii) “කඨිනය උදුරාකල්හි” යනු මාතෘකා

අටින් එක්තරා මාතෘකාවකින් කඨින බලය ඇති කාලසීමාව අවසන් කරණ ලද්දේ, සඞ්ඝයා විසින් හෝ අතරෙහි එසේම බලය අවසන් කරවන ලද්දේද වේ යනුයි. (iii) "දසදවසක් සීමාකොට" යනු දසදවස් සීමාව සිහිකරගතයුතුය යනුයි. ''වැඩිපුර සිවුර'' නම් අධිෂ්ඨාන නොකළ අත්නොහළ යනුයි. සිවුරකුම සිවුරුහය අතරින් පවරුදීමට සුදුසු අන්තිම සිවුරයි. එය ඉක්මවන්නාහට නිස්සග්ගිවීයනු එකොළොස් වෙනි අරුණ නැගෙන කල්හි නිස්සග්ගිවේ. 'අතිතිය නැතිවේ.' සඞ්ඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට හෝ භාර දියයුතුයි.

9 ''මහණෙනි, මෙසේ වනාහි අත්හළ යුතුය. ඒ භික්ෂුව විසින (ii)මහාසි සඞ්ඝයාවෙත පැමිණ තනිපට සිවුර ඒකාංශ කොට පොරවා වැඩි භික්ෂූන්ගේ පාවැද උක්කුටුක-යෙන් හිඳගෙන, ඇඳිලි බැඳ (iii) 'ස්වාමීනි, මාගේ මේ සිවුරට දසදවස ඉක්ම ගියේය. නිස්සග්ගිවිය. මම මෙය සඞ්ඝයාට භාරදෙමියි'' මෙසේ කිවයුතුය. භාරදී ඇවැත් දෙසියයුතුයි. (iv)උගත් දක්ෂ භික්ෂුවක විසින් ඇවත භාරගතයුතුයි. අත්හළ සිවුර දියයුතුයි.

10 ''සංඝ තෙමේ මා කියන්නක් අසාවා. මේ සිවුර මෙනම භික්ෂුවට නිස්සග්ගි විය. සංඝයාට භාරදෙන ලදී. ඉදින් සංඝයාට කල් පැමිණ තිබේනම් සංඝයා මේ සිවුර මෙනම භික්ෂුවට දෙන්නේය.

11 (මේ 9 ඡේදය සෝදන්න. "සංඝයාවෙත පැමිණ" වෙනුවට ''බොහෝ භික්ෂූන් වෙත පැමිණ'' යොදාගතයුතුය.)

12 (i) ''ආයුෂ්මත්හු මා කියන්නක් අසත්වා. මේ සිවුර මෙනම භික්ෂුවට නිස්සග්ගිවිය. ආයුෂ්මත්වරුන්ට භාරදෙනලදී. ඉදින් ආයුෂ්මතුන්ට කාලය පැමිණ තිබේනම් ආයුෂ්මත්හු මේ සිවුර මෙනම භික්ෂුවට දෙන්නාහුය. (ii) 'ඒ භික්ෂුව විසින් එක් භික්ෂුවක් වෙත පැමිණ තනිපට සිවුර ඒකාංශකොට උක්කුටුකයෙන් හිඳගෙන ඇඳිලි බැඳගෙන ''ඇවැත්නි, සිවුර දසදවසක් ඉක්ම ගියේය. නිස්සග්ගිවිය මම මෙය ආයුෂ්මතුන්ට භාරදෙමියි'' අත්හැර ඇවැත් දෙසියයුතුයි ඒ භික්ෂුව විසින් ඇවැත් පිළිගතයුතුය අත්හළ මේ සිවුර ආයුෂ්මතුන්ට දෙමියි අත්හළ සිවුර දියයුතුයි.

13 දසදවස ඉක්මුනු කල්හි ඉක්මවන ලද්දේය යන හැඟීම් ඇත්තාට නිසගිපචිති වේ. දසදවස ඉක්මීදැයි සැක ඇත්තේ නිසගිපචිති වේ. දසදවස ඉක්මුණු කල්හි නොඉක්මුණේය. යන හැඟීම් ඇත්තාහට නිසගිපචිති වේ. අධිෂ්ඨාන නොකළ කල්හි අධිෂ්ඨාන කළේය, යන හැඟීම් ඇත්තාහටද, බාරනුදුන් කල්හි බාරදුන්නේය, යන අදහස ඇත්තාටද, නොවිසඳු කල්හි විසඳුවේය, යන හැඟීම් ඇත්තාහටද, නැති නොවූ කල්හි නැති වූයේය, යන අදහස් ඇත්තාහටද විනාශ නොවූ කල්හි විනාශවූයේය, යන අදහස ඇති කල්හිද, නොදැවුණු කල්හි දැවුණේය, යන අදහස් ඇති කල්හිද, සොරකම් නොකළ කල්හි සොරකම් කළේය, යන, අදහස ඇති කල්හිද නිසගිපචිති වේ. නිසගිවූ සිවුර බාරනොදී පාවිච්චි කරයිද දුකුලා ඇවැත් වේ. දසදවස නොඉක්මී කල්හි ඉක්මුණේය යන හැඟීම් ඇත්තාට දුකුලා ඇවැත් වේ. දසදවස නොඉක්මීයේදැයි සැක ඇත්තාට දුකුලා වේ. දසදවස නොඉක්මී කල්හි නොඉක්මුණේය. යන අදහස් ඇත්තාහට ඇවැත් නොවේ.

14 දසදවස ඇතුළත අධිෂ්ඨාන කරයිද, භාරදෙයිද අත්හරීද, නැතිවෙයිද, වැනසෙයිද, දැවෙයිද, සොරසිතින ගනීද, විශ්වාස කමට ගනියද, පිස්සාටද සිතපෙරළුනහුටද ඇවැත් නොවේ.

15 එකල්හි වනාහි සමහර භික්ෂූහු අත්හළ සිවුර නොදෙත්. භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. "මහණෙනි, අත්හළ සිවුර දියයුතුය. යමෙක් නොදේ නම් දුකුලා ඇවැත් වේ."

පළමුවෙනි කඨින ශික්ෂා පදයයි.

---

## 2 උද්දෙසිත ශික්ෂාපදය

16 (i) එකල්හි වනාහි භාග්‍යවත් බුදුරජානන් වහන්සේ සැවැත්නුවර අසල පිහිටි මහසිටාණන් විසින් කරවූ ජේතවනාරාමයෙහි වාසය කරණසේක. (ii) එකල්හි භික්ෂූහු භික්ෂූන් ලඟ සිවුරු බහාතබා අඳනයෙන් සහ තනිපට සිවුරෙන් පමණක් යුක්තව දනවු සැරිසැරීමට යෙත්. ඒ

සිවුරු බොහෝකල් තබනලද්දහු කළු සුදු පුල්ලි ගැසෙත්. භික්ෂූහු ඒවා වියළත්. ආයුෂ්මත් ආනන්ද තෙමේ සෙනසුන් බලමින් ඇවිදින්නෝ සිවුරු වේලන ඒ භික්ෂූන් දැක ඒ භික්ෂූන් යම්තැනෙකත්හිද එහි පැමිණියේය. පැමිණ ඒ භික්ෂූන්ට "ඇවැත්නි, කළුපුල්ලි හැසුණු මේ සිවුරු-කාගේ දැයි" ඇසීය. ඉක්බිති ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්දට මේ කාරණය සැලකළාහුය. "ආයුෂ්මත් ආනන්ද තෙමේ දොස්නගයි. නොසතුට ප්‍රකාශ කරයි. නොසතුටු වචන කියයි. භික්ෂූහු කෙසේ නම් භික්ෂූන් අතට සිවුරුදී අඳනයක් හෝ තනිපට සිවුරෙන් දනවු මාර්ගයේ හැසිරෙත්දැයි" කීයේය. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළේය

17 "මහණෙනි, මහණහු මහණුන්ගේ අතට සිවුරදී අඳනයෙන් හා තනිපට සිවුරෙන් දනවු මාර්ගයෙහි හැසි-රෙත්තේ ඇත්තදැයි" ඇසීය. "භාග්‍යවතුන් වහන්ස, ඇත්තේය." භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ නින්දා කළසේක. මහණෙනි, කෙසේ නම් ඒ හිස් පුරුෂයෝ භික්ෂූන් අතට සිවුරදී අඳනයෙන් හා තනිපට සිවුරෙන් දනවු හැසිරීමට යෙත්ද, මහණෙනි, මේය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිසද (මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v)) මහණෙනි, මෙසේද මේ ශික්ෂාපදය දෙශනා කරව්.

18 "භික්ෂූහුගේ සිවුරකොට තිබිකල්හි කඨින සිවුරේ බලය නැතිවූ කල්හි මහණ තෙමේ ඉදින් එක රාත්‍රියකුදු තුන් සිවුරෙන් සංඝසම්මුතියක් නැතිව වෙන්ව වෙසේ නම් නිසගි පචිති වේ. (මෙහි 4 (ii) )

19 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් කොසඹෑනුවර ලෙඩවූයේවේ. නෑයෝ "පිණවත්හු එත්වා අපි උපස්ථාන කරන්නෙමුයි" භික්ෂුව සමීපයට දූතයෙකු යැවූවාහුය. භික්ෂුහුද 'ඇවැත්නි, යම් නෑයෝ තොපට උපස්ථාන කරත් යයි' කීවාහුය. හෙතෙම 'ඇවැත්නි භාග්‍යවතුන් වහන්සේ තුන් සිවුරෙන් වෙන් නොවිය යුතුයයි ශික්ෂාපද පනවන ලද්දේද යි" කීයේය. "මම්ද ලෙඩවෙමි. තුන් සිවුරු ගෙන යන්නට නොහැක්කෙමි. (මෙහි 2 (ii) ) මේ ධාර්මික කථාව කොට භික්ෂූන්ට කථා කළසේක. 'මහණෙනි, ගිලන්

භික්ෂුවට තුන්සිවුරෙන් වෙන්ව විසීමේ සම්මතය දෙන්නට අවසර දෙමි. මහණෙනි, මෙසේ දියයුතුය. ඒ ගිලන් භික්ෂුව විසින් (මෙහි 9 (iii) ) (ii) "ස්වාමීනි මම ගිලනෙකි. තුන්සිවුරගෙන හැසිරෙන්නට නොහැකිවෙමි. ස්වාමීනි, මම සංඝයාගෙන් තුන්සිවුරෙන් වෙන් නොවීමේ සම්මතය ඉල්වමි." කිවයුතුය. දෙවනුවත් ඉල්වියයුතුය. තුන්වෙනුවත් ඉල්වියයුතුය. උගත් දක්ෂ භික්ෂුවක් විසින් සංඝයාට දැන්වියයුතුය.

20 "ස්වාමීනි සංඝ තෙමේ මා කියන්නක් අසාවා. මේ නම් භික්ෂු තෙමේ ගිලන්ය. තුන්සිවුර රැගෙන යාමට නොහැකිය. හෙතෙම තුන්සිවුරෙන් වෙන්ව විසීමේ සම්මතය සංඝයාගෙන් ඉල්වයි. සංඝ තෙමේ මෙනම් භික්ෂුවට තුන් සිවුරෙන් වෙන්ව විසීමේ සම්මතය දෙයි. මෙනම් භික්ෂුවට තුන්සිවුරෙන් වෙන්ව සිටීමේ සම්මතයදීම යම් ආයුෂ්මතෙකුට රුචිවේසිද හෙතෙම නිශ්ශබ්ද වන්නේය. යම් කෙනෙකු නොකැමැති වේනම් හෙතෙම කියන්නේය. සංඝයා විසින් මෙනම් භික්ෂුවට තුන්සිවුරෙන් වෙන්ව විසීමේ සම්මතය දෙනලදී. සංඝයාට රුචිවෙයි. එහෙයින් නිශ්ශබ්දය මෙසේද මේ තුෂ්ණීම්භාවය දරමියි" කියා යි මෙසේද වනාහි මේ ශික්ෂාපදය උදෙසව්.

21 "භික්ෂූන්ගේ සිවුරකොට නිමිකල්හි කඨින බලය නැතිවූ කල්හි යම් මහණතෙම ඉදින් එක රාත්‍රියකුදු තුන් සිවුරෙන් සංඝ සම්මුතියක් නැතිව වෙන්ව වෙසේ නම් නිස්සග්ගි පචිත්තිවේ

22 "සිවුරකොට නිමි කල්හි" යනු (1 නිස්සග්ගියේ 8 ඡේදයේ i (i) ) "ඉදින් මහණතෙම එකරාත්‍රියකුදු තුන්සිවුරෙන් වෙන්වූයේ නම්" යනු දෙපට සිවුරෙන් හෝ තනිපට සිවුරෙන් හෝ අඳනයෙන් හෝයි. 'භික්ෂු සම්මතය හැර" යනු භික්ෂූන්ගේ කැමැත්තහැර යනුයි 'නිස්සග්ගි වේ" යනු අරුණ නැගීම සමගම නිස්සග්ගි වේ. සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට හෝ භාරකළ යුතුයි 'මහණෙනි මෙසේද වනාහි භාරකළ යුතුයි 9 (ii) "ස්වාමීනි, මගේ මේ සිවුර රාත්‍රියෙහි භික්ෂු සම්මතයක් නැතිව වෙන්වකලදී නිස්සග්ගී

විය. මම මේය සඞ්ඝයාට භාරදෙමියි" කියයි. (මෙහි 9 (iv) හා 10) (මෙහි 12 (i)) දෙන්නාහුය, යනුයි. (මෙහි 12 (ii)) ආයුෂ්මත්හට දෙමි.

23 (මේ වචන අගට මෙය යොදන්න) එක උපචාරයක් (ඉඩක්) ඇත්තේද නොයෙක් උපචාර ඇත්තේද වේ. වාසස්ථානයද ගබඩා සතරැස් ශාලය-ප්‍රාසාදය-හර්ම්‍යය-නැව-කරත්තය-ක්ෂේත්‍රය-කලවිට-ආරාමය-විහාරය-වෘක්ෂමූලය-අභ්‍යවකාශය-

24 එක් ඉඩක් ඇති ගමනම සීමාකරණලද එක් ගෙයකට අයත් ගම්නම් වේ. ඇතුළුගමෙහි සිවුරක් බෙදා ඇතුළු ගමෙහි විසිය යුතුයි. එය නොකරණ ලද්දේ නම් (ii) යම් ගේක සිවුර තබන ලද්දේ නම් ඒ ගෙයි විසිය යුතුයි. (iii) අත්පස හෝ අත් නොහැරිය යුතුයි නොයෙක් ගෙවල්වලට අයත් ගමක්වේද, ගෘහයෙක්හි. (මෙහි (ii)) පිරිස ගැවසෙන තැන හෝ දොර සමීපයෙහි හෝ අත්පස හෝ අත් නොහැරිය යුතුය නොහාවිට යන්නහු විසින් අත්පසෙහි සිවුර තබා පිරිස ගැවසෙන තැන හෝ විසිය යුතුයි. දොරමුල හෝ අත්පස හෝ අත් නොහැරිය යුතුයි.(මෙහි (ii)) (iv) අත් පස හෝ අත් නොහැරිය යුතුයි (v)

25 එක් පවුලකට අයත් ගෙයක්වේද සීමාකරණ ලද්දේද නොයෙක් ගබඩා ඇත්තේවේද නොයෙක් කාමර ඇත්තේවේද, ඇතුළුගෙයි සිවුර තබා ඇතුළුගෙයි විසිය යුතුයි (මෙහි 24 (ii) (iv))

26 පවුල් කීපයකට අයත් ගෙයක්වේද සීමාකරණ ලද්දේද නොයෙක් ගෙවල් ඇත්තේවේද නොයෙක් කාමර ඇත්තේවේද, යම් කාමරයෙක්හි සිවුර තබන ලද්දේවේද ඒ කාමරයෙහි විසිය යුතුය. දොරමුල හෝ අත්පසින් හෝ අත් නොහළ යුතුය. (මෙහි 24 (ii) (iv))

27 නොයෙක් ගෙවලට අයත් උද්දෝසිතනම් ලොකු ගෙයක්වේද, සීමාකරණ ලද්දේවේද, නොයෙක් ගෙවල් ඇත්තේවේද, නොයෙක් කාමර ඇත්තේවේද, ඇතුළු ගෙයි. සිවුරතබා, ඒ ඇතුළු ගෙයිම විසිය යුතුය. (මෙහි 24 (ii) (iv))

28 (මෙහි 26 ඡේදය "ගෙයක්" වෙනුවට "භාණ්ඩ තබන ශාලාවක්" යොදාගත යුතුය.)

29 එක්ගෙයකට අයත් අවල්ලක්වේද අවල්ල ඇතුළෙහි සිවුර තබා අවල්ල ඇතුළෙහි විසියයුතුයි. ගෙවල් කිහිපයකට අයත් අවල්ලක්වේද නොයෙක් ගෙවල් ඇත්තේ වේද නොයෙක් කාමර ඇත්තේවේද, යම් කාමරයෙක්හි සිවුර තබන ලද්දේවේද ඒ කාමරයෙහි විසියයුතුය. දොරමුල හෝ අත්පස හෝ අත්නොහැරියයුතු.

30–39 (මෙහි 29 ඡේදය සොදන්න. එහි "අවල්ල" වෙනුවට මේ වචන යොදාගතයුතුයි.) ප්‍රාසාදයක්-මාලිගාවක්-නැවක්- කරත්තයක්- කුඹුරක්- කලවිටක්-ආරාමයක්-විහාරයක්-ගෙවල් බොහෝ ගණනකට අයත් විහාරයක්

40 එක් ගෙයකට අයත් රුක්මූලයක්වේද, එය මධ්‍යාහ්න කාලයෙහි හාත්පස සෙවන පැතිරෙයි, සෙවනැල්ල අතරෙහි සිවුරබහා තබා ඇතුළ සෙවනැල්ලෙහි විසියයුතුයි නොයෙක් ගෙවලට අයත් රුක්මූලක්වේද අත්පස අත් නොහළයුතුයි. අභ්‍යවකාශය එක් උපචාරයක් ඇත්තේ නම් එවිට ගම් නැති වනයෙහි හාත්පස අභ්‍යන්තර හතක් එක් උපචාරයක්වේ. ඉන්පසු නොයෙක් උපචාර ඇත්තේවේ සංඝ සම්මුතිය හැර විප්‍රවාසවූයේ විප්‍රවාසවූ හැඟීම් ඇත්තාහට නිස්සග්ගි පචිත්තිවේ, සංඝ සම්මතය හැර විප්‍රවාසයෙහි සැක ඇත්තේ නිස්සග්ගිපචිත්තිවේ. සංඝ සම්මතය හැර විප්‍රවාසයෙහි විප්‍රවාස නොවූයේය. යන හැඟීම් ඇත්තේ (ii) නිස්සග්ගි පචිත්තිවේ. (iii) පච්චුද්ධරණය (අධිෂ්ඨානය අතහැරදැමීම) නොකළ දෙයෙහි පච්චුද්ධරණය කළේය, යන අදහස් ඇත්තාට (මෙහි (ii) ) නුදුන් දෙයෙහි දුන්නේය, යන අදහස් ඇත්තාට (මෙහි ii) ) නැතිවූ කල්හි නැතිවූයේ, යන හැඟීම් ඇත්තාට (මෙහි (ii) ) විනාශ නොවූ කල්හි විනාශවූයේය, යන හැඟීම් ඇත්තාහටද, නොදැවුනු කල්හි දැවුනේය, යන අදහස් ඇත්තාහටද (මෙහි (ii) ) පැහැර නොගත් කල්හි පැහැර ගත්තේය යන අදහස් ඇත්තාහටද (සංඝ සම්මතය හැර) නිස්සග්ගි පචිත්තිවේ නිස්සග්ගිවූ සිවුර බාරනොදී පාචිත්තියාපත්තිය දුකුලා ඇවැත්වේ. වෙන් නුවූකල්හි වෙන් වූයේය. යන අදහස් ඇත්තාහටද දුකුලා ඇවැත්වේ. වෙන් නොවූ කල්හි විමති ඇත්තාහටද දුකුලා වේ. වෙන් නොවූයේය. යන අදහස් ඇත්තාහටද ඇවැත් නොවේ.

41 අරුණ ඇතුළත පච්චුද්ධරණය කරයිද, දෙයිද, නැතිවේද, විනාශවේද, දැවේද පැහැරගනිත්ද විශ්වාසකමින් ගනිත්ද, සංඝ සම්මතයෙන් ගන්නාහුද උම්මත්තකවූවහුටද ආදිකර්මිකයාටද ඇවැත් නොවේ.

---

## 3 තුන්වෙනි කඨින ශික්ෂාපදය

42 එකල්හි වනාහි එක්තරා භික්ෂුවකට අකල් සිවුරක් ලැබුණේ වේ. ඔහුට ඒ සිවුර කරද්දී නොසෑහුණේය. ඉක්බිති ඒ භික්ෂුව ඒ සිවුර ඔසවා නැවත නැවත ඇද මට්ටම් කරයි. භාග්‍යවතුන් වහන්සේ සෙනසුන්වල ඇවිදීමෙහි යෙදෙනසේක් සිවුර ඔසවා නැවත නැවත අදින භික්ෂුව දැක ඒ භික්ෂුව යම් තැනෙක්හිද එහි වැඩිසේක. වැඩ ඒ භික්ෂුවට "මහණ, ඔබ කුමක් හෙයින් මේ සිවුර උස්සා නැවත නැවත ඇද මට්ටම් කරන්නේදැයි" ඇසූසේක. "ස්වාමීනි, මට මේ අකල් සිවුර ලැබුණේය. මනා කල්හි නොසෑහුණේය. එහෙයෙයින් මම මේ සිවුර උස්සා නැවත නැවත ඇද මට්ටම් කරමියි" කීයේය. "මහණ, ඔබට සිවුරක් ගැන නැවත ආශාවක් ඇත් නෙහිදැයි" ඇසූසේක. "භාග්‍යවතුන් වහන්ස, ඇත්තේය"

43 (මෙහි (i) මහණෙනි, අකල් සිවුරක් පිළිගෙන සිවුරක් නැවත බලාපොරොත්තුවෙන් බහාතබන්නට අවසර දෙමි" එකල්හි වනාහි භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ විසින් අකල් සිවුරක් පිළිගෙන සිවුරක ආශාවෙන් බහාතබන්නට අනුදන්නා ලද්දේයයි අකල් සිවුරු පිළිගෙන මසකට වඩා තබත්. ඒ සිවුරු සිවුරුදණ්ඩෙහි පොදිබැඳ තිබෙත්.

44 ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ සෙනසුන්වල ඇවිදීමෙහි යෙදෙනසේක් ඒ සිවුරු සිවුරුදමන දණ්ඩෙහි පොදිබැඳ තිබෙනු දැක "ආයුෂ්මත්නි, සිවුරුදමන දණ්ඩෙහි පොදිබැඳ තිබෙන මේ සිවුරු කවරෙකුගේදැයි" ඇසූහ. "ඇවැත්නි, අපගේ අකල් සිවුරුය. සිවුරක් ගැන බලාපොරොත්තුවෙන් තබන ලද්දැයි" කීහුය. "ඇවැත්නි, මේ සිවුරු කොපමණ කල් බහාතබන ලද්දාහුදැයි" ඇසීය. "ඇවැත්නි, මසකට

මැඩියැයි' කිව්හුය. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ දොස් කීයේය. නොසතුට ප්‍රකාශ කෙළේය. නොසතුටු බවත කීයේය. කෙසේ නම් භික්ෂූහු අකල් සිවුරක් පිළිගෙන මසකට වඩා තබාතබත්තාහුද?" ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙර භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළසේක.

45 "මහණෙනි, භික්ෂූහු නොකල් සිවුරක් පිළිගෙන මසකට වඩා තබාතබත් යනු ඇත්තදැයි" ඇසූසේක. "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය" භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගැරහූසේක "මහණෙනි, කෙසේනම් ඒ හිස් පුරුෂයෝ අකල් සිවුරක් පිළිගෙණ මසකට වඩා තබාතබත්තෝද (මෙහි I පාරාජිකාවේ සුදින්න බණ වරේ 30 (v) "ඇමැත්ති" අන්තරාව බලාදන්න.) මහණෙනි, මෙසේද මතු මේ ශික්ෂා පදය උදෙසව්.

46 "භික්ෂුවගේ සිවුර කොට නිමිකල්හි කඨින සිවුර අයිතියෙන් පහකළ කල්හි භික්ෂුවටම අකල් සිවුරක් ලැබෙත් නම් කැමතිවන්නාවූ භික්ෂුව විසින් පිළිගත යුතුයි පිළිගෙණ වහාම මැසිය යුතුයි ඉදින් සම්පූර්ණ නොවීනම් ඒ භික්ෂූහු විසින් අඩුව සම්පූර්ණ කිරීම පිණිස සිවුරක් ලබමියි යන ආශාව ඇතිකල්හි ඒ සිවුර මසක් වැඩිනොව ඇති කාලයක් තබාඉවී නොවීතපා තැබිය යුතු."

47 "සිවුරකොට නිමිකල්හි" යනු භික්ෂුව විසින් සිවුර කරණ ලද්දේ වේද, නටුයේ හෝ විනාශවූයේ හෝ දැවුණේ හෝ සිවුර කිරීමේ ආශාව නැතිවූයේ හෝ වේ. "කඨින සිවුර ඉදිරූ කල්හි" යනු මාතෘකා අට අතුරෙන් එක්තරා මාතෘකාවකින් උදුරණ (අයිතිය නැතිකරණ) ලද්දේ හෝ වේ සංඝයා අතර හෝ උදුරණ (අයිතිය නැතිකරණ) ලද්දේවේ "අකල් සිවුර" කඨිනය නොඇතුරූ කල්හි එකොළොස් මසය තුළ උපන් සිවුරයි. කඨිනය නොඇතුරූ කල්හි සත් මසක් තුළ ලැබුණු සිවුරයි. කාලයෙහිද මේ අකාල චීවරය හැයි කියා දුන් සිවුරයි.

"උපදින්නේය" යනු සංඝයා කෙරෙන් හෝ ගණයා කෙරෙන් හෝ ඥාතීන් කෙරෙන් හෝ මිත්‍රයන් කෙරෙන් හෝ පාංශුකූල වශයෙන් හෝ තමන්ගේ ධනයෙන් හෝ උපදින්නේය.

"කැමතිවන්නහු විසින්" යනු කැමැත්තහු විසින් පිළිගත යුතුය. පිළිගෙණ වහාම කරවිය යුතුයි. දස දවසකින් කරවිය යුතු.

"සම්පූර්ණ නොවූයේ නම්" යනු කරණ සිවුරට නොසෑහේද ඒ භික්ෂුව විසින් මැඩවියයෙන් මසක් ඒ සිවුර බහා තැබිය යුතුයි.

"අඩුව පිරවීමට" යනු අඩුව සම්පූර්ණ කිරීම පිණිසයි.

"සිවුරක් ලබමියි යන ආශාව ඇතිකල්හි" යනු සංඝයාගෙන් හෝ ගණයාගෙන් හෝ ඥාතීන්ගෙන් හෝ මිත්‍රයන්ගෙන් හෝ පාංශුකූල වශයෙන් හෝ තමන්ගේ හෝ ධනයෙන් හෝ සිවුරක් ලැබීමේ බලාපොරොත්තුව ඇතිකල්හි යනුයි. "සිවුරක් ගැන බලාපොරොත්තුව ඇතිකල්හිදු ඊටත් වඩා තබාගන්නේද" යනු මූල චීවරය (චීවර මන්ත්‍රය) ලැබූන කල්හි නැමත බලාපොරොත්තු සිවුර ලැබේද, දස දවසකින් කළයුතුයි. මූල චීවරය ලැබී දවස් දෙකකින් (ii) නැමත බලාපොරොත්තු සිවුර ලැබේද, දස දවසකින් කළයුතුය (iii) මේ වාක්‍ය අගට (මෙහි (ii) යොදන්න.) තුන් දවසකින් ලැබූන කල්හි- සතර දවසකින් ලැබූන කල්හි-පස් දවසකින් ලැබූන කල්හි- සය- සත්- අට- නව- දස- එකොළොස් දවසකින් ලැබූන කල්හි- දොළොස්- තෙළෙස්- තුදුස්- පසළොස්- සොළොස්- සතළොස්- අටළොස්- එකූණවිසි-විසි දවසකින්-විසිඑක් දවසකින් "නැමත ආශාවූ සිවුර ලැබේද දින නවදිනකින් කළයුතුය දෙවිසි-තෙවිසි- විසිහතර - විසිපස- සවිසි- විසිසත- විසිඅට- මූල චීවරය ලැබී එකුනතිස් දවසකින් නැමත බලාපොරොත්තු සිවුර ලැබේනම් එක් දිනකින් කළයුතුය මූල චීවරය ලැබී දවස් තිසකින් නැමත බලාපොරොත්තු සිවුර ලැබේ නම් එදම අධිෂ්ඨාන කළයුතු පැවරීම් කළයුතු, භාරදීම් කළයුතුය. ඉදින් අධිෂ්ඨාන නොකරන්නේ යම්, නොපවරන්නේ නම්, භාර නොදෙන්නේ නම් තිස්එක්වෙනි අරුණෙහි නිස්සග්ගි වේ. (භාරදීමට යෝග්‍යවේ) සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට භාරදිය යුතුයි.

48 "මහණෙනි, මෙසේ වනාහි භාරදිය යුතුයි. (මෙහි 39 (ii) 'ස්වාමීනි, මාගේ මේ අකාල සිවුර මාසයක් ඉක්මූයේය

නිස්සග්ගිවූයේය. මෙය සංඝයාට හැර කරමි. දෙන්නෙමි, දුන් නේය ආයුෂ්මතුන්ට දෙමි. මුල් සිවුර නොහස්ව ලැබුනු කල්හි පසුව සිලාපොරොත්තුවූ සිවුර ලැබුනේ නම් රාත්‍රි ඉතිරිව ඇත් නම් නොකැමැත්තෙන් කළයුතු ය. මසක් ඉක්මුන කල්හි ඉක්මුණේය යන සංඥ ඇත්තේ නම් නිසගි පචිතිවේ මසක් ඉක්මුන කල්හි විමති ඇත්තේ නිසගිපචිතිවේ මසක් ඉක්මුන කල්හි නොඉක්මුනේය යන අදහස් ඇති කල්හිද, අධිෂ්ඨාන නොකළ කල අධිෂ්ඨාන කෙළේය යන අදහස් ඇත්තේද, භාරනුදුන් කල භාරදුන්නේය යන අදහස් ඇත්තාහටද, අත් නොහළ දෙය අත්හළේය යන අදහස් ඇති කළද, නොනටකල නටුයේය යන අදහස් ඇතිකලද, විනාශ නොවූකල විනාශ වූයේය යන අදහස් ඇතිකලද, නොදැවුනුකල දැවුනේය යන අදහස් ඇත්තේ සොරකම් නොකළකල සොරකම් කෙළේය යන අදහස් ඇත්තේ නිසගි පචිතිවේ. නිසගිවූ සිවුර අත්නො හැර පරිභෝග කරයිද, දුකුලා ඇවැත්වේ. මසක් නොඉක්මි කල්හි ඉක්මුණේය යන හැඟීම් ඇත්තාහට දුකුලා ඇවැත්වේ මසක් නොඉක්මුණේයයි විමති ඇත්තාට දුකුලා ඇවැත්වේ. මසක් නොඉක්මි කල්හි ඉක්මුනේය යන අදහස් ඇත්තේ ඇවැත් නොවේ. මසක් ඇතුළත අධිෂ්ඨාන කරයිද, පවරයිද, අත් හරීද, නැසේද, වැනසේද, දැවේද, පැහැරගනීද, විශ්වාසව ගනීද, උම්මත්තකහුට, ආදිකර්මිකයාටද ඇවැත් නොවේ.

---

## 4 පුරාණ චීවර ශික්ෂාපදය

49 (ජෙමිනි 2(i) එකල්හි වනාහි ආයුෂ්මත් උදායිගේ පෙර බිරිඳක් භික්ෂූන් අතර පැවිදිවූවාය. ඕතොමෝ ආයුෂ්මත් උදායිවෙතට නිතරයයි. එකල්හිවනාහි ආයුෂ්මත් උදායි ඒ භික්ෂු -ණිය සමීපයෙහි බත්වෙදීම කරයි. ඉක්බිති ආයුෂ්මත් උදායි පෙරවරු වේලෙහි හැඳපොරවා පාත්‍ර සිවුරු ගෙන ඒ භික්ෂුණිය යම් තැනෙක්හිද එහි පැමිණියේය පැමිණ ඒ භික්ෂුණිය ඉදිරියෙහි පුරුෂ නිමිත්ත පෙණෙනසේ වාඩිවිය. ඒ භික්ෂුණිය ආයුෂ්මත් උදායී ඉදිරියෙහි ස්ත්‍රී නිමිත්ත පෙණෙනසේ විවෘතකොට අස්නෙහි හුන්නාය. ඉක්බිති ආයුෂ්මත් උදායී

තෙමේ රාගාධිකවූයේ ඒ භික්ෂුණියගේ ස්ත්‍රී නිමිත්ත නැවත නැවත බැලුවේය. ඔහුට ශුක්‍ර පිට විය. ඉක්බිති ආයුෂ්මත් උදායී තෙමේ ඒ භික්ෂුණියට "නැඟණිය, යව දිය ගෙනෙව අඳන සිවුර සෝදන්නෙමියි" කීයේය. "ආර්යයන් වහන්ස දෙනුමැනව, මම සෝදන්නෙමියි" ඒ ශුක්‍ර ටිකක් මුවින් ගත්තාය. ටිකක් යෝනියෙහි ගාගත්තීය. ඕතොමෝ ඉන් ගැබ් ගත්තීය

50 භික්ෂුණීහු ගර්භනීවූ මේ භික්ෂුණිය අබ්‍රහමචාරිණියයි කීහූය. "ආර්යයන් වහන්ස, මම අබ්‍රහමචාරිණියක් නොවෙමියි" භික්ෂුණීන්ට මේ කාරණය සැලකළාය. භික්ෂුණීහු (ii) දොස් කියත්. නොසතුටු ප්‍රකාශ කරත්, නොසතුටු බස් කියත්, කෙසේ නම් ආර්ය උදායී තෙමේ භික්ෂුණියක් ලවා පරණ සිවුරක් සෝදවත්තේ දැයි'(iii) කියමින් ඒ භික්ෂුණීහු භික්ෂූන්ට මේ කාරණය සැලකළාහුය. යම් ඒ භික්ෂූහු අල්පේච්ඡවූවාහුද ඔව්හු (මෙහි (ii)

51 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය 'උදායිය, ඔබ භික්ෂුණියක් ලවා පරණ සිවුරක් සේදවූයේ ඇත්තදැයි' ඇසූසේක. 'භාග්‍යවතුන් වහන්ස ඇත්තය' 'උදායිය' තොපගේ නෑයෙක්ද නොනෑයෙක් දැයි' ඇසූසේක. 'භාග්‍යවතුන් වහන්ස, නෑයෙක් නොවේයයි, කීයේය. 'හිස් පුරුෂය, නෑනම් නැත්තෙක් නොනෑ එකියකට සුදුසු හෝ නුසුදුසු හෝ සතුට ඇතිවන්නාවූ හෝ නොසතුට ඇතිවන්නාවූ යමක් නොදනී, හිස් පුරුෂය නොනෑ භික්ෂුණියක ලවා පරණ සිවුරක් සෝදවන්නෙහිද (මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v))

52 "යම්කිසි භික්ෂුවක් නොනෑ මෙහෙණක්ලවා පැරණිවූ සිවුරක් සෝදවා නම් හෝ පඬු පොවවා නම් හෝ පුවරුවක ගස්වා නම් හෝ නිසගි පචිත්තිවේ.'

53 යමෙක් වනාහී, යනු භික්ෂු යනු (මෙහි 1 පාරාජිකයේ පදභාජනීයේ 1-2 ඡේද) 'නොනෑ එකියක් ලවා' යනු (ii) මවුපසින් හෝ පිය පසින් හෝ සත්වෙනි මුතුන්

මුත්තන්ගේ පරපුරෙන් සම්බන්ධ නොවූ යනාර්ථයි (iii) "භික්ෂුණී"යනු (iv) දෙවැදෑරුම් සංඝයා මැද උපසම්පදාවූ යනාර්ථයි 'පුරාණ සිවුර' නම් වරක් ඇන්දාවූ වරක් පෙරෙවාවූද වේ. (v) සෝදවයි. අණ කරවයිද දුකුලා ඇවැත්වේ. සෝදනු ලද්දේද නිසගිවේ. පඬු පොවයි අණ කරයිද. දුකුලා ඇවැත්වේ. වරක් පඬු පොවනු ලද්දේ නිසගි වේ ගස්වයි අණකරණයිද දුකුලා ඇවැත්වේ. වරක් අතින් පහරක් හෝ පොල්ලකින් පහරක් හෝ දුන් කල්හි නිසගිවේ. සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට හෝ භාරදිය යුතුයි.

54 "මහණෙනි, මෙය වනාහි භාරදිය යුතුයි. ස්වාමිනි, මේ මේ පුරාණ සිවුර නොනෑ භික්ෂුණියක් ලවා සෝදවනු ලදී නිසගි විය. මෙය මම සංඝයාට භාරදෙමියි දෙන්නේය. ආයුෂ්මතුන්ට දෙමියි දියයුතුයි නොනෑයෙකු නොවේය යන අදහස් ඇතිව නොනෑ භික්ෂුණියක් ලවා සෝද-වයිද නිසගි පචිති වේ. නෑයෙක් නොවේය" යන අදහස් ඇතිව නොනෑ භික්ෂුණියක් ලවා (ii) පුරාණ සිවුරක් සෝද වයිද පඬුපොවයිද (iii) නිසගී හා දුකුලා ඇවැත්වේ. නෑයෙක් නොවේය යන අදහසින් නෑ නොවන්නිය ලවා (මෙහි (ii)) නිසගියෙන් දුකුලා ඇවැත්වේ නොනෑය යි අදහස් ඇත්තේ නොනෑ එකියක ලවා (මෙහි (ii)) නිසගි පචිතිය හා දුකුලා දෙකක්වේ.

55 නොනෑ අදහස් ඇතිව නොනෑ භික්ෂුණියක් ලවා පුරාණ සිවුරක් පඬු පොවවයිද නිසගි පචිති වේ.

56-63 (මෙහි 55 ඡේදය සෙදීමෙදී පඬු පෙවීමයි. වෙනුවට වේ එවක යොදන්න.) සෝදවයි - ගස්වයි- පඬුපොවයි-ගස්වයි- සෝදවයි- ගස්වයි-ගස්වයි පඬුපොවයි- ගස්වයි- සෝදවයි පඬුපොවයි-

64 නොනෑ ඇත්තිය කෙරෙහි විමති ඇත්තේ (මෙ 54 (ii) නොනෑ නෑ ඇත්තිය කෙරෙහි නෑ යන හැඟීම ඇත්තේද (මෙහි 54 (ii) අනිකෙකුගේ පුරාණ සිවුරක් සෝද යිද දුකුලා ඇවැත්වේ. නිදහන් නො ලද ඇතිරිල්ලක් සෝද-වයිද දුකුලා ඇවැත්වේ. එසේම උපසම්පදාවූවකු ලවා

සෝදවයිද දුකුළා ඇවැත්වේ. නෑයෙකු කෙරෙහි නෑයෙකු නොවේ යන අදහස් ඇත්තේද දුකුළා ඇවැත්වේ. නෑකෙනෙකි විමති ඇත්තේ දුකුළා ඇවැත්වේ. නෑයෙකු කෙරෙහි නෑයෙක්ය යන හැඟීම ඇත්තේ ඇවැත් නොවේ. නෑයෙකු සෝදන කල්හි නොනෑ කෙනෙක් දෙවැන්නා වශයෙන් සිටිද, නොකියන ලද්දී සෝදයිද, පාවිච්චි නොකළ එකක් සෝදවයිද, සිවුරක් හැර අනික් පිරිකරක් සෝදවයිද, ශික්ෂමානාවද සාමණේරියටද උමතුවූවකුටද මුලින්ම ඒ කර්මය කළහුටද ඇවැත් නොවේ.

---

## 5 චීවර පිළිගැනීමේ ශික්ෂාපදය

65 (මෙහි 1 අනියතයේ (i) එකල්හි වනාහි උත්පල වර්ණා භික්ෂුණිය සැවැත් නුවර වාසය කරයි. ඉක්බිති උත්පලවර්ණා භික්ෂුණිය පෙරවරු වේලාවෙහි හැද පොරවා පාත්‍ර සිවුරු ගෙන සැවැත්නුවර පිඬු පිණිස වැඩියාය. සැවැත් නුවර පිඬු පිණිස වැඩ පසු බත පිඬු සිඟීමෙන් ආපසු පැමිණියේ දවල් වාසය පිණිස අන්ධවනය යම් තැනෙක්හිද එහි පැමිණියාය. අන්ධ වනයෙහි වැඩ එක්තරා ගසක් මුල දවල් වාසය පිණිස වැඩහුන්නීය. එකල්හි වනාහි කරණ ලද සොරකම් ඇති සොරු දෙනක් මරා මස් ගෙන අන්ධ වනයට වැදුනාහ. සොරදෙටුවා එක්තරා ගසක් මුල දවල් වාසය පිණිස පැමිණි උත්පල වර්ණා භික්ෂුණිය දැක්කේය. දැක ඔහුට මේ සිත විය. ඉදින් මාගේ දරුවන් සහ සහෝදරයන් මේ භික්ෂුණිය දුටුවොත් හිංසා කරන්නාහු යයි' සිතා අනික් මගකින් ගියේය.

66 ඉක්බිති ඒ සොරදෙටු තෙමේ මස් පිසූ කල්හි හොඳ මසක් ගෙන මුලක් බැඳ උත්පලවර්ණා භික්ෂුණිය සමීපයේ ගසෙක්හි එල්වා "ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ යමෙක් දකීද දෙන ලද්දේමය ගනීවායි" කියා ගියේය. උත්පල වර්ණා භික්ෂුණිය සමාධියෙන් නැගිට කියන්නාවූ සොරදෙටුවාගේ මේ වචන ඇසුවාය. ඉක්බිති උත්පල

වණ්ණා භික්ෂුණිය ඒ රාත්‍රියගේ ඇවෑමෙන් ඒ මස් ගෙන අඳනා සිවුරෙන් පොදියක් බැඳ අහසට පැන නැගී වේළුවනාරාමයෙහි පෙනී සිටියාය.

67 එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ ගමට පිඬු පිණිස පිවිසියේක. ආයුෂ්මත් උදායී තෙමේ විහාරය පාලනයෙහි නැවතුණේ විය. ඉක්බිති උත්පලවර්ණා භික්ෂුණී තොමෝ ආයුෂ්මත් උදායි යම් තැනෙක්හිද එහි පැමිණියාය. පැමිණ ආයුෂ්මත් උදායිට" ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කොහිදැයි'' ඇසීය. ''නැගණිය, භාග්‍යවතුන් වහන්සේ ගමට පිඬුපිණිස ඇතුළුවූයේයයි'' කීයේය.''ස්වාමීනි, මේ මස භාග්‍යවතුන් වහන්සේට දෙනු මැනවයි.'' කීවාය. ''නැගණිය, ඔබ විසින් භාග්‍යවතුන් වහන්සේ සතුටු කරවන ලදී. ඉදින් ඔබ මට අඳනා සිවුර දෙන්නෙහිද මමද අඳනා සිවුරෙන් සතුටු කළා වන්නීයයි'' කීයේය. ''ස්වාමීනි අපි ස්ත්‍රීහු දුකසේ ලබන්නෝ වෙමු. මෙයද මගේ පස්වෙනි අන්තිම සිවුරය. මම නොදෙමියි'' කීහ. 'නැගණිය, යම්සේ පුරුෂයෙක් ඇතකුදී පෝරෝනයකිනුත් සරසන්නේද නැගණිය ඔබත් එසේ භාග්‍යවතුන් වහන්සේට මස් දී මා අඳනා සිවුරෙන් නොසරසන්නේ දැයි'' ඇසීය.

68 ඉක්බිති ආයුෂ්මත් උදායි විසින් කරදර කරනු ලබන උත්පලවර්ණා භික්ෂුණිය අඳනා සිවුරදී ආශ්‍රමයට ගියාය. උත්පල වර්ණා භික්ෂුණියගේ පාත්‍ර සිවුරු පිළිගන්නාවූ භික්ෂුණීහු උත්පල වර්ණා භික්ෂුණියට ''ස්වාමිනි, ආර්යයාණන් වහන්සේගේ අඳනය කොහිදැයි'' ඇසූහ. උත්පල වර්ණා භික්ෂුණීය භික්ෂුණීන්ට මේ කාරණය සැල කළාහ. භික්ෂුණීහු (ii) ඉඳුන් කියත්. නොසතුටු බස කියත් නොසතුට ප්‍රකාශ කරත්. ''උදායි ආර්යයන් වහන්සේ කෙසේ නම් භික්ෂුණි-යකගෙන් සිවුරක් පිළිගන්නේද? (ii) ස්ත්‍රීහු දුකසේ ලැබීම ඇත්තාහයි'' කීයේය. ඉක්බිති ඒ භික්ෂුණීහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැල කළාහුය. යම් ඒ භික්ෂූන් කෙනෙක් අල්පේච්ඡද ඔව්හු (මෙහි (ii) කියයි.

69 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැල කළාහුය. 'උදායිය, ඔබ භික්ෂුණියකගෙන් සිවුරක් ගත්තේ ඇත්තදැයි ඇසූ සේක. 'භාග්‍යවතුන් වහන්ස, ඇත්තය 'උදායිය, ඇය තොපගේ ඥාතිවරියක්ද නොහොත් නොවූවක් දැයි ඇසූසේක.'' 'භාග්‍යවතුන්වහන්ස, ඥාතිවරියක් නොවේ.'' ''හිස් පුරුෂය නෑ නොවන කෙනෙක් නෑ නොවන කෙනෙකුට සුදුස්ස හෝ නුසුදුස්ස හෝ ඇතිබව හෝ නැතිබව හෝ නොදනී හිස් පුරුෂය ඔබ එහි නොනෑ භික්ෂුණියගේ අතින් සිවුරක් පිළිගත්තෙහිද? හිස් පුරුෂය, මෙය (මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v))

70 ''යම්කිසි භික්ෂුවක් නොනෑ භික්ෂුණියකගේ අතින් සිවුරක් පිළිගන්නේ නම් නිස්සග්ගි පචිති වේ. 1 භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට මෙසේද මේ ශික්ෂාපදය පනවන ලද්දේ වේය.

71 එකල්හි වනාහි භික්ෂූහු සැකකරන්නාහු භික්ෂුණීන්ගේ මාරුකරගත් සිවුර නොපිළිගනිත්. භික්ෂූහු දෙය් කියන්නාවූ නොසතුටු ප්‍රකාශ කරන්නාවූ නොසතුටු වචන කියන්නාවූ ඒ භික්ෂූන්ගේ වචන ඇසූවාහුය. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැල කළාහුය.

72 ඉක්බිති 1 භාග්‍යවතුන් වහන්සේ මේ සිද්ධියෙහි දැහැමි කථාකොට භික්ෂූන්ට ඇමතූසේක. (i)) ''මහණෙනි, භික්ෂු භික්ෂුණී සිකඛමානා, සාමණේර, සාමණේරී යන පස්දෙනාට මාරු කරගත් සිවුර පිළිගන්නට අවසර දෙමි. මහණෙනි, මේ පස්දෙනාට මාරුකරගත් සිවුර පිළිගන්නට අවසර දෙමි. මහණෙනි, මෙසේද වනාහි මේ ශික්ෂාපදය දෙසනා කරව්

''යම්කිසි භික්ෂුවක් නොනෑ භික්ෂුණියකගේ අතින් සිවුරක් මාරුකර ගැනීමක් හැරව පිළිගනී නම් නිස්සග්ගි පචිති වේ.

73 (මෙහි 1 පාරාජිකයේ පදභාජනීයේ1-2ඡේද)'නොනෑ එකියක් ලව'යනු (මෙහි 53(ii) භික්ෂුණිය නම් (මෙහි 53 (iv) (ii) සිවුරක් නම් විකල්පනයට (පවරා දීමට)සුදුසු සිවුරු සය

අතුරින් අන්‍යතම සිවුරකි. “මාරු කිරීමක් හැර” යනු මාරු කිරීමක් හැර පිළිගනීද ඒ ක්‍රියාවෙහි දුකුලාවේ ලැබීමෙන් නිස්සගී වේ. සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට හාරදිය යුතුයි. මහණෙනි, මෙසේ වනාහි හාරදිය යුතුයි 'ස්වාමිනි, මා විසින් මේ සිවුර නොනෑවූවකු අතින් මාරු කිරීමක් නැතිව පිළිගන්නා ලදී. නිස්සගිවේය. මම මෙය සංඝයාට හාරදෙමි . දෙන්නේය දුන්නේය ආයුෂ්මත්හට දෙමි කියායි. නොනෑවූවක අතින් නොනෑයක හැඟීම් ඇතිව මාරු කිරීමක් නැතිව සිවුරක් පිළිගනීද නිස්සගි පචිත්ති වේ. විමති ඇත්තේ මාරු කිරීමක් නැතිව නොනෑවූවක අතින් සිවුරක් ගනීද නිස්සගි පචිත්ති වේ නෑයෙක යන හැඟීම් ඇතිව මාරු කිරීමක් නැතිව නොනෑවූවක අතින් සිවුරක් පිළිගනීද නිස්සගි පචිත්ති වේ එකට උපසම්පදා වූවක අතින් මාරු කිරීමක් නැතිව සිවුරක් පිළිගනීද දුකුලා ඇමැත්වේ. ඤාතිවරියකට නොනෑ හැඟීම් ඇත්තේද දුකුලා ඇමැත්වේ. ඤාතිවරිය කෙරෙහි විමති ඇත්තේද දුකුලා ඇමැත්වේ. නෑ වූවකට නෑයෙකැයි හැඟීම් ඇත්තේ ඇමැත් නොවේ. ඤාතිවරියකගෙන් මාරු කිරීමද නොවටිනා දෙයක් තබා වටිනා දෙයක්ද ගැනීමද වටිනා එකක් තබා නොවටිනා එකක් ගැනීමද විශ්වාසයෙන් ගනීද තාවකාලිකව ගනීද සිවුරක් තබා අනික් පිරිකරක් ගනීද සික්ඛමානවියටද සාමණේරියටද උම්මත්තකවූවහුටද මුලින් වැරදි කළහුටද ඇමැත් නොවේ.

---

## 6 අඤ්ඤාතක විඤ්ඤත්ති ශික්ෂාපදය

74 (මෙහි 1 අංකයේ 1 (i) සොදන්න.) එකල්හි වනාහි ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයා ධර්ම කථා කිරීමට දක්ෂ වේ. ඉක්බිති එක්තරා සිටු පුත්‍රයෙක් ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රතෙම යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍රයන් වැඳ එකත් පසෙක සිටියේය. එකත් පසෙක සිටි සිටු පුත්‍රයාට ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රතෙම දහැම් කථාවෙන් උදුරණ සහිතව

කීයේය. සමාදන් කරවූයේය. තෙද ගැන්වීය, සතුටු කොළේය. ඉක්බිති ඒ සිටු පුත්‍රතෙමේ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන් විසින් උදාහරණ සහිතව පෙන්වන ලද්දේ සමාදන් කරවන ලද්දේ, උත්සාහවත් කරවන ලද්දේ, සතුටු කරණ ලද්දේ, ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රව "ස්වාමීනි, යමකින් ප්‍රයෝජන ඇත්තේද කියන්න. අපි ආර්යයන් වහන්සේට සිවුරු, පිණ්ඩපාත, සේනාසන, ගිලන් පස බෙහෙත් බඩු දීමට සමර්ථවෙමුයි" කීයේය (ii) "ඇවැත්නි ඔබ ඉදින් දෙනු කැමැත්තේ නම් මෙයින් එක් සළුවක් දෙව ස්වාමීනි, අප වැනි කුල පුත්‍රයන් විසින් එක් සළුවක් ඇතිව මගායාම ලජ්ජාමයි. ස්වාමීනි, යම්තාක් ගෙට ගොස් එම්ද? තවකිනු මැනවි, ගෙට ගොස් මෙයින් හෝ එක් වස්ත්‍රයක් එවන්නෙමි. මිට වඩා යහපත් එකක් හෝ එවන්නෙමියි" (iii) කීයේය. දෙවනුවත් ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රතෙම ඒ සිටු පුත්‍රයාට මෙසේ කීවේය. (මෙහි 74 (ii) තුන්වෙනුවත් ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රතෙමේ ඒ සිටු පුත්‍රයාට මෙසේ කීවේය. (මෙහි (ii) "ඇවැත්නි, නොදෙනු කැමැත්තාවූ පැවරුවාවූ තොපවිසින් ඔබ යමක් පවරා කුමක් කෙයින්, නොදෙන ලද දැයි" ඇසීය ඉක්බිති ඒ සිටු පුත්‍රතෙම ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන් විසින් කරදර කරණු ලබන්නේ එක් සළුවක් දී ගියේය. මනුෂ්‍යයෝ ඒ සිටු පුත්‍රයා දැක "ආර්යයෙනි, ඔබ කුමක් හෙයින් එක් සළුවකින් එන්නෙහි දැයි" ඇසූහ.

75 ඉක්බිති ඒ සිටු පුත්‍රතෙම ඒ මිනිසුන්ට මේ කාරණය කීයේය. මනුෂ්‍යයෝ දොස් කියත්. නොසතුට ප්‍රකාශ කරත්. නොසතුටු බස් කියත් මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ බොහෝ ආශා ඇත්තෝය ලද දෙයින් සතුටු නොවන්නාහ මොවුන්ට ධර්මයෙන් සංග්‍රහ කරන්නටත් නොහැකිය. කෙසේ නම් ධර්මයෙන් සංග්‍රහ කරද්දී සිටු පුත්‍රයාගෙන් සළුවක් ගනිත් දැයි" කියායි භික්ෂූහු දොස් කියන්නාවූ නොසතුට ප්‍රකාශ කරන්නාවූ නොසතුටු බස් කියන්නාවූ ඒ මිනිසුන්ගේ වචන ඇසූහ. මහත් ආශා නැති යම් භික්ෂූහු ඇද්ද ඔව්හු දොස්

කියත්, නොසතුට ප්‍රකාශ කරත්, නොසතුටු වචන කියත්. කෙසේ නම් ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍ර තෙමේ සිටු පුත්‍රයා ගෙන් වස්ත්‍රයක් ඉල්වන්නේද?"

76 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. "උපනන්දය, ඔබ සිටුපුත්‍රයෙකුගෙන් සිවුරක් ඉල්වූයේ ඇත්තදැයි" ඇසූසේක. "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය." "උපනන්දය, තොපගේ නෑයෙක්ද නොනෑයෙක්දැයි" ඇසූසේක. 'භාග්‍යවතුන් වහන්ස, නෑයෙක් නොවේයයි' කීයේය. හිස්පුරුෂය, නොනෑයෙක් නොනෑයෙකුට පුදුස්ස හෝ නුපුදුස්ස හෝ ඇති බව හෝ නැති බව හෝ නොදනී. හිස් පුරුෂය, ඔබ එසේ නොනෑ සිටුපුත්‍රයෙකුගෙන් වස්ත්‍රයක් ඉල්වන්නෙහිද? හිස් පුරුෂය, මෙය (මේ 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v,) මේ ශික්ෂාපදය දේශනා කරවි. (i) "යම් මහණෙක් වනාහි නොනෑවූ ගෘහපතියෙකුගෙන් හෝ ගෘහපතිනියකගෙන් සිවුරක් ඉල්ලාගනී නම් නිස්සග්ගිපාචිත්තියවේ" යයි (ii) භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ශික්ෂාපදය පනවන ලදී. (iii)

77 එකල්හි වනාහි බොහෝ භික්ෂූහු සාකෙත නුවරින් සැවැත්නුවරට ඇති මහ මගට පිළිපන්නෝ වෙත්. අතරමඟ සොරු නික්ම ඒ භික්ෂූන්ගේ සිවුරු පැහැරගත්තාහුය. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ විසින් "නොනෑ ගෘහපතියෙකුගෙන් හෝ ගෘහපතිනියකගෙන් සිවුරක් ඉල්වන්නට එපාකළහයි සිතා ඇත්තාහු නොඉල්වූහ. සිවුරු නැතිවම සැවැත්නුවරට ගොස් භික්ෂූන්ට වඳිත් භික්ෂූහු "ඇවැත්නි, යම් මේ ආජීවක කෙනෙක් භික්ෂූන්ට වඳිත්ද ඔවුහු යහපත්යයි" කීවාහුය. ඒ භික්ෂූහු ඇවැත්නි, අපි ආජීවකයෝ නොවෙමු. අපි භික්ෂූහුවෙමුයි" කීවාහුය. භික්ෂූහු ආයුෂ්මත් උපාලිට "ඇවැත්නි, උපාලිය එසේනම් මොවුන් විභාග කරවයි" කීහ

78 ඉක්බිති ආයුෂ්මත් උපාලි තෙමේ ඒ භික්ෂූන් විභාග කරවා භික්ෂූන්ට 'ඇවත්නි, මොවුහු භික්ෂූහුය. මොවුන්ට සිවුරු

දෙවයි'කීයේය. යම් ඒ භික්ෂු කෙනෙක් මද ආශා ඇත්තෝද ඔව්හු දෙස් කියත්. නොසතුට ප්‍රකාශ කරත්. නොසතුටු වචන කියත්. "කෙසේ නම් භික්ෂූහු සිවුරු හැතුව එන්නාහු දැයි" කියායි. 'තණවලින් හෝ කොළයකින් හෝ වසා අයුතු නොවේදැයි' කියායි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය (මෙහි 72 (i) )

"මහණෙනි, පැහැරගත් සිවුරු ඇතියහුට නැතිවූ සිවුරු ඇතියහුට නොනෑ ගෘහපතියෙකුගෙන් හෝ ගෘහපතිනියකගෙන් සිවුරක් ඉල්වන්නට අනුදනිමි. යම් ආවාසයකට පළමුවෙන් පැමිණේද ඉදින් එහි සංඝයාගේ විහාරයෙහිවූ සිවුරක් වේද, ඇතිරිල්ලක් හෝ බුමුතුරුණක් හෝ කොට්ටාදී උරයක් වේද, එය ලැබුනකල තබාත් කෙමියි ගෙන පොරවා ගන්නට වන්නේය ඉදින් සංඝයාගේ විහාරයෙහි සිවුරක් හෝ ඇතිරිල්ලක් හෝ බුමුතුරුණක්, උරයක් නොවේ නම් තණයෙන් හෝ කොළයෙන් හෝ වසා පැමිණිය යුතුයි නිර්වස්ත්‍රව නොපැමිණිය යුතුමය. යමෙක් ඒ නම් දුකුළා ඇවැත්වේ. මහණෙනි, මෙසේ මේ ශික්ෂාපදය දේශනා කරව්.

79 "යම්කිසි මහණෙක් තමාගේ ඥාති නොවූ ගෘහපතියෙකුගෙන් හෝ ගෘහපතිනියකගෙන් කාලය හැර සිවුරක් ඉල්වා නම් නිස්සග්ගි පචිත්තිවේ ඒ සිවුරු ඉල්වාගැනීමෙහි මේ කාලයයි. මහණතෙම සොරුන් විසින් පැහැරගත් සිවුරු ඇත්තේ වේද, විනාශවූ සිවුරු ඇත්තේ හෝ වේද මේ එහි කාලයයි."

80 "යමෙක් වනාහි" යනු භික්ෂු යනු (මෙහි 1 පාරාජිකයේ පදභාජනියේ 1-2 ඡේද) "නොනෑ" නම් (මෙහි 53 (ii) 'ගෘහපතියා' නම් (ii) යම්කිසිවෙක් ගෙයි අධිපතිව වේසේද, ඔහුයි (iii) 'ගෘහපතිනිය' නම් යම්කිසි ස්ත්‍රියක් ගෙයි වසාද ඇයයි (iv) 'සිවුරනම්' (මෙහි 73 (ii) 'කාලයතේ පිට' යනු කාලය හැරයි. පැහැරගත් සිවුරු ඇත්තේ නම' භික්ෂුවගේ සිවුර රජුන් විසින් හෝ සොරුන් විසින් හෝ ධූර්තයන් විසින් හෝ යම්කිසිවෙකු විසින් පැහැරගන්නාලද්දේ වේද, 'විනාශවූ

වූ සිවුර ඇත්තේ' යනු භික්ෂුවගේ සිවුර ගින්නෙන් දවන ලද්දේ වේද, දියෙන් ගසාගෙන ගියේ වේද මීයන් විසින් හෝ වේයන් විසින් කනලද්දේ වේද, පාවිච්චිකිරීමෙන් දිරුණේ වේද, කාලය හැර ඉල්ලීමද ක්‍රියාවක් පාසා දුකුලා වේ ලැබීමෙන් නිසඟිපචිති වේ. සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට භාරදිය යුතුයි.

81 මහණෙනි, මෙසේ වනාහි භාරදිය යුතුයි ''ස්වාමීනි, මාගේ මේ සිවුර නොනෑ ගෘහපතියෙකුගෙන් කාලයෙන් පිට ඉල්ලාගන්නා ලදී. නිසඟිවිය මේය මම සංඝයාට භාරදෙමි. දෙන්නේය, දුන්නාහුය. ආයුෂ්මතුන්ට දෙමියි කියයි. නොනෑ හැඟීම ඇතිව නොනෑයෙකුගෙන් කාලයෙන් පිට සිවුරක් ඉල්ලා නම් නිසඟි පචිති වේ. නොනෑවූවෙකු ගැන සැක ඇත්තේ කාලයෙන් පිට සිවුරක් ඉල්ලා නම් නිසඟි පචිති වේ. නෑයෙකියන අදහස ඇතිව නොනෑයෙකුගෙන් කාලයෙන් පිට සිවුරක් ඉල්ලා නම් නිසඟිපචිති වේ. නෑයෙකු ගැන නොනෑයෙක යන හැඟීම් ඇත්තේද දුකුලා ඇවැත්වේ. නෑයෙකු කෙරෙහි විමති ඇත්තේ දුකුලා ඇවැත්වේ. නෑයෙකු කෙරෙහි නෑයෙක යන හැඟීම් ඇත්තේ ඇවැත් නොවේ (iii) කාලයෙහි, නෑයන්ට, පැවරූවන්ට, අනිකෙකු උදෙසා ස්වකීය ධනයෙන්, උම්මත්තකයාට, මුලින් වැරදි කළහුට ඇවැත් නොවේ.

## 7 තතුත්තරි ශික්ෂාපදය

82 (මෙහි 1 අනියතයේ 1 (i)ඒ කාලයෙහි ''ඡබ්බග්ගිය'' භික්ෂූහු පැහැරගත් සිවුරු ඇති භික්ෂූන් සමීපයට පැමිණ මෙසේ කියත්. ''ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් පැහැරගත් සිවුරු ඇති භික්ෂුවට හෝ නැසුන සිවුරු ඇති භික්ෂුවට නොනෑ ගෘහපතියෙකුගෙන් හෝ ගෘහපතිනියක ගෙන් සිවුරක් ඉල්ලාගන්ට අවසර දෙන ලදී. ඇවැත්නි, සිවුරු ඉල්ලව්යසි' කියායි. ''ඇවැත්නි, තුවුම්නාය අප විසින් සිවුරක් ලබන ලදැයි'' (උත්තමහන්සේලා) කීහ. අපි ආයුෂ්මතුන්ගේ ප්‍රයෝජනයට ඉල්ලමුයයි' කීහුය. ''ඇවැත්නි, ඉල්ලවුයසි'' කීහ.

83 ඉක්බිති ඡබ්බග්ගිය භික්ෂූහු නෑනැ ගෘහපතියන් වෙත පැමිණ "ඇවැත්නි, භික්ෂූහු පැහැරගත් සිවුරු ඇත්තෝව ආවාහුය. ඔවුන්ට සිවුරු දෙවයි" කීවාහුය. බොහෝ සිවුරු ඉල්වූහ. එකල්හි වනාහි එක්තරා පුරුෂයෙක් සභාවෙහි හුන්නේ එක්තරා පුරුෂයෙකුට 'ආර්යයෙනි, පැහැරගත් සිවුරු ඇති භික්ෂූහු ආවාහුය. ඔවුන්ට මා විසින් සිවුරක් දුන්නේයයි" කියේය. ඒ පුරුෂතෙමේද "මා විසිනුදු දුන්නේයයි" කියේය. අනිකෙකුදු මා විසිනුදු දුන්නේයයි කීයේය. ඔව්හු දෙස් කියත්, නොසතුට ප්‍රකාශ කෙරෙත්, නොසතුටු වචන කියත්. කෙසේ නම් ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ ප්‍රමාණය නොදැන බොහෝ සිවුරු ඉල්වත්ද, ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ වෙළඳකළක් හෝ විකුණා කෙරෙද්ද, රෙදි වෙළඳාම් මත් කෙරෙත්දැයි" කීවාහුය.

84 භික්ෂූහු දෙස් කියන්නාවූ නොසතුට ප්‍රකාශ කරන්නාවූ නොසතුටු බස් කියන්නාවූ ඒ භික්ෂූන්ගේ වචන ඇසුවාහුය. යම් ඒ භික්ෂූ කෙනෙක් අල්පේච්ඡවූවාහුද ඔව්හු දෙස් කියත්. නොසතුට ප්‍රකාශ කරත්, නොසතුටු බස් කියත්. කෙසේ නම් ෂඩ්වර්ග භික්ෂූහු ප්‍රමාණය නොදැන බොහෝ සිවුරු ඉල්වත්ද?" කියති. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. "මහණෙනි, තෙපි ප්‍රමාණය නොදැන බොහෝ සිවුරු ඉල්වූවාහු ඇත්තදැයි" ඇසූසේක. "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය." භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ නින්දාකළසේක. හිස් පුරුෂයෙනි, කෙසේ නම් තෙපි ප්‍රමාණය නොදැන බොහෝ සිවුරු ඉල්වන්නහුද? හිස් පුරුෂයෙනි, (මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v) ) මේ ශික්ෂාපදය දේශනා කරව්.

85 "නෑනැවූ ගෘහපතියෙක් හෝ ගෘහපතිනියක් හෝ පැහැරගත් හෝ නැටුවාවූ සිවුරු ඇති භික්ෂුව වෙත එළඹ බොහෝ සිවුරු වලින් ඉදින් පවරාහම්, ඒ භික්ෂුව විසින් ඒ ගෙනා සිවුරු වලින් අඳනය හා පොරෝනය පරම කොට ඇති සිවුරක් ඉවසිය යුතුයි. එයින් වැඩියක් ඉදින් ඉවසා නම් නිස්සග්ගි පචිත්තියි."

86 "ඉදින් ඔහු" යනු පැහැරගත් සිවුර ඇති භික්ෂුව යනුයි. "තොතැ" නම් (මෙහි 53 (ii) "බොහෝ සිවුරු මලින්" යනු බොහෝවූ සිවුරු මලින් "තමින් වචනයෙන් එලවන්නේය" යනු යම්තාක් කැමැත්තේද ඒ පමණ ගනී. "ඒ භික්ෂුව විසින් අඳනය හෝ පොරෝනයට සැහෙන ප්‍රමාණ ඒ වස්ත්‍රයෙන් පිළිගතයුතුය" යනු ඉදින් තුනක් නැතිවූයේ නම් දෙකක් ඉවසිය යුතුය. දෙකක් නටුයේ නම් එකක් ඉවසිය යුතුය. එකක් නටුයේ නම් එකක්වත් නොඉවසිය යුතුය "ඉදින් ඊට වඩා පිළිගන්නේ නම්" යනු ඊට වඩා ඉල්වයි නම් එය ගැනීමෙහිදී දුකුලාවේ. ලැබීමෙන් නිසගිමෙි. සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට භාරදිය යුතුය. මහණෙනි, මෙසේ වනාහි භාරදිය යුතුයි. (මෙහි 81 (ii) යෙදීමෙදී "කාලයෙන් පිට" වෙනුවට "එයින් වැඩියක්" යොදන්න) සංඝයා ගෙනගත්තෙමැයිද, ගෙනගියද, සංඝයා තොපට මෙයයි දෙත්ද, සොරාගත් හේතුවෙන් නොදෙත්ද, නැතිවූ නිසා නොදෙත්ද. නෑයන්ට, පැවරූවන්ට තමන්ගේ ධනයෙන්, උමතුවූවහුට, මුලින් වැරැද්ද කළහුට ඇවැත් නොවේ.

---

## 8 උපක්ඛට ශික්ෂාපදය

87 (මෙහි 1 අතිතය 1(i)) එකල්හි වනාහි එක්තරා පුරුෂයෙක් භාර්‍යාවට මෙසේ කීය. "ආර්‍ය උපනන්ද ස්වාමීන සිවුරකින් අන්දවන්නෙමු" (iii) කියායි. එක්තරා පිඩු පිණිස හැසිරෙන භික්ෂුවක් කියන්නාවූ ඒ පුරුෂයාගේ මේ වචනය ඇසුවේය (iv) ඉක්බිති ඒ භික්ෂුව ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍රයන් යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍රයන්ට "ඇවැත්නි, උපනන්දයෙනි, ඔබ මහපින් ඇත්තෙකි. (v) අසවල්තැන එක්තරා පුරුෂයෙක් භාර්‍යාවට (මෙහි (ii) කියේයයි" කීයේය "ඇවැත්නි, එමැන්තෙක් ඇත සෙතෙම මගේ උපස්ථායකයෙක

88 ඉක්බිති ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍රතෙ ඒ පුරුෂතෙම යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ඒ පුරුෂයාට "ඇවැත්නි, ඔබ (ii) මා සිවුරකින් අන්දවනු

කැමැත්තේ ඇත්තදැයි" ඇසීය (iii)(මෙහි 87 (ii) ) ආයුෂ්මතුන් වහන්ස, මට එසේත් අදහසක්වේ. "ඇවැත්නි, ඉදින් ඔබ (iv) මා සිවුරකින් අන්දවනු කැමැත්තෙහි නම් මෙබඳු සිවුරකින් අන්දවව. යම්සේ මම පරිභෝග නොකරන්නේ නම් (v) කවරෙකු විසින් එයින් මම අන්දවන්නෙකු කරන්නෙම්ද?" ඉක්බිති ඒ පුරුෂතෙම දොස්කියයි. නොසතුට ප්‍රකාශකරයි. නොසතුටු වචන කියයි. "මේ ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ (vi) ලද දෙයින් සතුටු නොවන්නාහ. මොවුන් සිවුරකින් අන්දවන්නට පහසු නොවේ. (vii) කෙසේ නම් ආයුෂ්මත් උපනන්ද තෙමේ මා විසින් පෙර නොපැවරූයේ මා මෙත පැමිණ සිවුරෙහි ක්‍රියා කරවීමට පැමිණෙත්ද?" කියයි.

89 (i) භික්ෂූහු දොස් කියන්නාවූ නොසතුට ප්‍රකාශ කරන්නාවූ නොසතුටු වචන කියන්නාවූ ඒ පුරුෂයාගේ වචන ඇසූහ. යම් භික්ෂූ කෙනෙක් අල්පේච්ඡවූවාහු ද ඔව්හු දොස් කියත්. නොසතුට ප්‍රකාශකරත්. නොසතුටු බස් කියත්. (ii) "කෙසේ නම් ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍ර තෙමේ පෙර නොපැවරූයේ ගෘහපතියෙකු මෙත පැමිණ සිවුර නියම කිරීමට පැමිණෙන්නේදැයි" කියයි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. (ii) 'උපනන්දය, ඔබ පෙර නොපවරණ ලද්දේ ගෘහපතියෙකු මෙත පැමිණ සිවුර නියම කිරීමට පැමිණියේය, යතු ඇත්තදැයි" ඇසූසේක "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය." (iii) "හිස් පුරුෂය, නොකැයෙක් නොකැයෙකුගේ සුදුස්ස හෝ නුසුදුස්ස හෝ ඇතිදෙය හෝ නැතිදෙය හෝ නොදනී. හිස් පුරුෂය, ඔබ එහි පෙර නොපවරණ ලද්දේ නොකැ ගෘහපතියෙකු වෙත පැමිණ සිවුර නියම කිරීමට පැමිණෙන්නෙහිද. (මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v) සහ මෙහි 76 (ii)

90 "භික්ෂුවක් උදෙසා නොනෑවූ ගෘහපතියෙකු විසින් හෝ ගෘහපතිනියක් විසින් හෝ මේ සිවුරු මිලයෙන් සිවුරක් මිලකරවගෙන මෙනම් ඇති භික්ෂුව සිවුරකින් අන්දවන්නෙමියි, සිවුරු මුදලක් එකතුකොට තබා

ලද්දේ වේද, ඒ මහණතෙම ඉදින් පෙර නොපවරණ ලද්දේ එහි එළඹ ඇවැත්නි මේ සිවුරු මිලයෙන් සිවුරක් මිලදීගෙන අන්දවව. යහපතක් කැමැති බැව් සිතාගෙන (තවැයි) සිවුරෙහි විධානයට පැමිණේද නිස්සග්ගිය පචිත්තියවේ."

91 (i) "භික්ෂුවක් උදෙසා" යනු භික්ෂුවක් නිසා භික්ෂුවක් අරමුණු කොට, භික්ෂුවක් අඳවනු කැමැත්තේ. (ii) "නොනෑ නම (බලනු 53 (ii)) ගෘහපතියා නම (බලනු 80 (ii) ගෘහපතිනිය නම බලනු 80 (iii)) "සිවුරුමිලයක්" නම රන් හෝ රුවන් හෝ මුතු හෝ මැණික් හෝ පලිඟු හෝ පබළු හෝ පට (?) හෝ නූල් හෝ කපු හෝය. (iii) "මේ සිවුරු මිලයෙන්" යනු තෙපදුන් දෙයිනි, "මිලදීගෙන" යනු මාරු කර යනුයි. අන්දවන්නෙමි" යනු දෙන්නෙමි. "එහි ඒ මහණතෙම," "යනු යම් භික්ෂුවක් උදෙසා සිවුරු මිලයක් රැස්කරණ ලද්දේවේද ඒ මහණයි." "පෙර නොපැවරූ" යනු පෙරනොකීවේය යනුයි. "ස්වාමීනි, ඔබට කෙබඳු සිවුරකින් ප්‍රයෝජන ඇත්තේද, ඔබට කෙබඳු සිවුරක් මිලදී ගන්නෙම්දැයි' කියායි. "පැමිණ" යනු ගෙවගොස් යම්කිසි තැනකට පැමිණ. (iv) "සිවුරෙහි විශේෂ විධානයකට පැමිණේ" යනු දිග හෝ වේවා, පළල හෝ වේවා, දළ හෝ සියුම් හෝ යනුයි. (v) "මේ සිවුරු මිලයෙන්" යනු ඉදිරියට ගෙනාමිලකින් යනුයි. (vi) 'මෙබඳු මෙබඳු හෝ' යනු දිග, පළල, දළ, සියුම් හෝයි. (vii) 'මිලදීගෙන" යනු මාරු-කර, යනුයි. (viii) "අන්දව" යනු දෙව යනායි. (ix) "යහපතක් කැමති බැව් සිතාගෙන" යනු යහපත් බව කැමැත්තේ, වටිනාබව කැමැත්තේ ඔහුගේ වචනයෙන් දික් හෝ පලල හෝ දළ හෝ සිහිඳු හෝ කොට ඉල්වයි. ක්‍රියාසිද්ධියෙහි දුකුලාවේ. (x) ලැබීමෙන් නිස්සග්ගිවේ, සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට භාරදිය යුතුයි

92 "මහණෙනි, මෙසේද වනායි භාරදියයුතුයි 'ස්වාමීනි මගේ මේ සිවුර පෙර නොපවරණ ලද්දේ නොනෑ ගෘහපතියෙකු වෙත පැමිණ සිවුරෙහි විධානයට පැමිණියෙම් නිස්සග්ගියවූයේය. මෙය මම සංඝයාට භාරදෙමියි කියාද, දෙන්

යෙයසිංද දුන්නේය. සිංද ආයුෂ්මතුන්හට දෙමියිංද වේ. (ii) නොනෑයෙකු කෙරෙහි නොනෑය යන හැඟීම් ඇතිව පෙර නොපවරණ ලද්දේ ගෘහපතියෙකු වෙත පැමිණ සිවුරෙහි විධානයට පැමිණේද නිසගි පචිත්තිවේ. නොනෑවූවෙකු කෙරෙහි විමති ඇත්තේ පෙර නොපැවරූයේ, ගෘහපතියෙකු වෙත පැමිණ සිවුරෙහි විධානයට පැමිණේද නිසගිපචිත්තිවේ. නොනෑවූවෙකු කෙරෙහි නෑයෙක යන හැඟීම් ඇත්තේ පෙර නොපැවරූයේ ගෘහපති-යෙකු වෙත පැමිණ සිවුරෙහි විධානයට පැමිණේද නිසගි පචිත්තිවේ. නෑයෙකු කෙරෙහි නොනෑයෙක යන හැඟීම් ඇත්තේ දුකුලාවේ. නෑයෙකු කෙරෙහි විමති ඇත්තේ දුකුලාවේ. නෑයෙකු කෙරෙහි නෑයෙකය යන හැඟීම් ඇත්තේ ඇවැත් නොවේ. නෑයන්ට පැවරූවන්ට, අනිකෙකු උදෙසා, සිය ධනයෙන්, වටිනා එකක් මුදලට ගනු කැමැත්තහු විසින් නොවටිනා එකක් ගනියි. උමතුවූවහුට, මුලින් වැරැද්ද කළාහුටද ඇවැත් නොවේ.

---

## 9 දෙවෙනි උපක්ඛට ශික්ෂාපදය

93 (මෙහි 1 අංකයේ (i) ) එකල්හි වනාහි එක්තරා පුරුෂයෙක් එක්තරා පුරුෂයෙකුට (මෙහි 87 (ii) )සෙසෙමේද මේද (මෙහි 87 (ii) ) එක්තරා පිඬු පිණිස හැසිරෙන භික්ෂු නමක් ඒ මිනිසුන්ගේ මේ කථා සල්ලාපය ඇසුයේය. (මෙහි 87 (iv) ) අසමල් නැත එක් පුරුෂයෙක් එක් පුරුෂයෙකුට (මෙහි 87 (ii) ) කීයේය. සෙසෙමේද මේද (මෙහි 87 (ii) ) කීයේය. ඇවැත්නි එසේ ඇත. ඔව්හු මාගේ උපස්ථායකයෝ වෙති.

94 ඉක්බිති ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර තෙමේ ඒ පුරුෂයා යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ඒ පුරුෂයාට මෙසේ (මෙහි 88 (ii)) ඉදින් තිකාම් ප්‍රයෝජනද, මම ඉන් කොඇන්දුම්නාම් වන්නෙමි. ඉක්බිති ඒ පුරුෂයෝ දොස්කියත් නොසතුට ප්‍රකාශකරත් නොසතුටු වචන කියත්.

ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ බොහෝ බලාපොරොත්තු ඇත්තා (මෙහි 88 (v)) කෙසේ නම් ආර්‍ය්‍ය උපනන්ද තෙමේ අප විසින් කලින් නොපවරණ ලද්දේ පැමිණ සිවුරෙහි විධාන ව පැමිණෙන්නේද?

95 (මෙහි 89 (i)) "උපනන්දය ඔබ පෙර නොපවරණ ලද්දේ ගෘහපතියකු වෙත පැමිණ සිවුරෙහි විධානයට පැමිණියෙහිද?" "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය" ඔව්හු නෑයෝ-නොනෑයෝදැයි" ඇසුයේය. "භාග්‍යවතුන් වහන්ස, නොනෑයෝයයි" කීයේය. (මෙහි 89 (iii)

96 භික්ෂුවක් උදෙසා නොනෑවූ ගෘහපතීන් දෙදෙනකු විසින් හෝ ගෘහපතිනියන් දෙදෙනකු විසින් හෝ අපි මෙ වෙන් වෙන්වූ සිවුරු මිලයෙන් වෙන වෙන සිවුරු මිලදීගෙන මෙනම් භික්ෂුව සිවුරුවලින් අන්දවම්හයි. වෙන වෙනම සිවුරු මිල රැස්කරණ ලද්දාහු වෙත්ද, ඒ මහණතෙම පෙර නොපවරණලද්දේ එහි එළඹ "ආයුෂ්මත්නි, දෙදෙනම එක්ව, මේ වෙන වෙන සිවුරු මිලයෙන් මෙබඳුවූ හෝ මෙබඳු හෝ සිවුරක් මිලදීගෙන මා එක් සිවුරකින් අන්දවව්. මෙසේ කළ හොත් මැනවයි. යහපතක් කැමති බව සිතින්ගෙන සිවුරෙහි අධික විධානයට ඉදිරිපත් පැමිණියේ නම් නිසගි පචිතිවේ. "භික්ෂුවක උදෙසාම යනු භික්ෂුවක උදෙසා, භික්ෂුවක් අරමුණුකොට භික්ෂුවක් අන්දවනු කැමැත්තෝ දෙදෙනකුට යනු දෙන්නෙකුටයි.

97 "නොනෑයෝ" නම් (මෙහි 53 (ii)) "ගෘහපතියෝ" නම් (මෙහි 80 (ii)) "ගෘහපතිනියෝ" නම් (මෙහි 80 (iii)) 'සිවුරුමිලයක්' යනු (මෙහි 91 (ii)) 'ඉම් සිවුරු මිලයෙන්' යනු දෙකලද්දෙති. "මිලදීගෙන" යනු මාරුකර, "අන්දවන්නෙමු" යනු දෙන්නෙමු. "එහිද මේ භික්ෂුව" යනු යම් භික්ෂුවක් උදෙසා සිවුරු මිලක් රැස්කරණ ලද්දේවේද, ඒ භික්ෂුවයි. "පෙර නොපවරණ ලද්දේ" යනු පෙරනොකියනු ලද්දේවේද, "ස්වාමීනි, ඔබට කෙබඳු සිවුරකින් ප්‍රයෝජන ඇත්තේද ඔබ වහන්සේට කෙබඳු සිවුරක් මිලදීගනිමුද?"

කියයි. "එළඹ" යනු ගෙව්ගොස් යම්කිසි තැනකට පැමිණ යනුයි. "සිවුරෙහි විධානයට පැමිණෙන්නේය" යනු (මෙහි 91 (iv) ) "මේ සිවුරු මිලයෙනි" යනු ඉදිරියට ගෙනා මිලකින්ය යනාදීයි "මේබඳු මේබඳු හෝ" යනු (මෙහි (91 (vi) ) "මිලදී ගෙන" යනු පෙරලා, අත්දමව්, යනු දෙව් යනුයි. "දෙදෙනම එකතුවී" යනු මිනිසුන් දෙදෙනම එකව යනුයි. "යහපතක් කැමති බව සිතාගෙන" යනු (මෙහි (91 (ix) )

98 "ක්‍රියා සිද්ධියෙහි දුකුලාවේ. ලැබීමෙන් නිසගිවේ. සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයකුට හාරදිය යුතුය. මහණෙනි, මෙසේද මනාහි හාරදිය යුතුය. 'ස්වාමීනී, මාගේ මේ සිවුර පෙරනොපැවරූයේ නොනෑ-ගෘහපතියෙකු වෙත පැමිණ සිවුරෙහි විධානයට පැමිණියෙමි. නිසගි විය. මම මෙය සඞ්ඝයාට හාරදෙමි. දෙන්නේය, දෙන්නාහුය. ආයුෂ්මතුන්ට දෙමි කියා දියයුතුයි. (මෙහි 92 (ii) ) ගෘහපතියෙකු යන්නට ගෘහපතියන් කියා වෙනස් කොට යොදන්න)

---

## 10 රාජ ශික්ෂාපදය

99 (මෙහි 1 (i) ) එකල්හි වනාහි ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයාගේ උපස්ථායක වූ මහා අමාත්‍යයෙක් ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රට දූතයෙකු අත මේ සිවුරු මිලයෙන් සිවුරක් මිලදීගෙන උපනන්ද ආර්යයන් සිවුරකින් අත්දමවයි සිවුරු මිලයක් යැවූයේය, ඉක්බිති ඒ දූතතෙමේ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රතෙම යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රට "ස්වාමීනි, ආයුෂ්මතුන් උදෙසා සිවුරු මිලයක් ගෙන එනලදී. ආයුෂ්මතුන් වහන්සේ සිවුරු මිලය පිළිගන්නා සේක්වායි" කීයේය මෙසේ කී කල්හි ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රතෙමේ ඒ දූතයාට, "ඇවැත්නි, අපි සිවුරු මිල නොපිළිගන්නෙමු. කාලයෙහි කැපතරදෙන ලද සිවුරක් පිළිගනී-

මුයි" කියෙව්ය. මෙසේ කී කල්හි ඒ දූතතෙම ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන්ට "ආයුෂ්මතුන් වහන්සේගේ කිසි-සම් වතාවක් කරන්නෙක් ඇත්තේදැයි" ඇසුයේය. එකල්හි වනාහි එක්තරා උපාසකයෙක් කිසියම් කටයුත්තක් සඳහා ආරාමයට ගියේය. ඉක්බිති ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර තෙමේ ඒ දූතයාට "ඇවැත්නි, මේ උපාසකතෙම භික්ෂූන්ගේ වතාවත් කරන්නායි" කීයේය.

100 ඉක්බිතියි ඒ දූතතෙම ඒ උපාසකයාට දන්වා ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර තෙමේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රට "ස්වාමීනි, ආයුෂ්මත් තෙමේ වතාවත් කරන්නෙක් දක්වූ-යේද, මා විසින් ඔහුට දැනුම් දෙන ලදී. ආයුෂ් ත්තෙම කලින් පැමිණේවා. ඔහු සිවුරකින් අන්දවනවා ඇතැයි" කීයේය. ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන් තෙමේ ඒ උපාසකයාට කිසිවක් නොකීයේය. එකල්හි වනාහි (ii) ඒ භාමාත්‍යතෙමේ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන් සමීපයෙහි දෙවනුවත් දූතයෙකු යැවීය, "ආර්යයන් වහන්ස, ඒ සිවුර පරිභොග කරණසේක්වා. ආර්යයන්වහන්සේ විසින් ඒ සිවුර පරිභොග කරණ ලද්දේ අපි දකින්නට කැමැත්තෙමුයි" කියායි (iii) තුන්වෙනුවත් (මෙයි (ii)

101 එකල්හි වනාහි නියම්ගම් මැස්සන්ගේ රැස්වීම දම්සය නියම්ගමෙහි කතිකා කමක් කළාහු වෙත්. යමෙක් නොඑයිද ඔහුට පණසක් දඩය කියායි. ඉක්බිති ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රතෙමේ ඒ උපාසක තෙමේ යම තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ඒ උපාසකයාට "ඇවැත්නි, මට සිවුර වුවමනායයි" කීයේය 'ස්වාමීනි, එක් දවසකට ඉවසනු මැනව. අද නියම්ගමෙහි රැස්වීමවේ. නියම ගමේද කතිකාකමවයයි. යමෙක් පසුව ඒ නම පනසක් දඩයයි' කියායි 'අදම මාගේ සිවුර දෙවයි' ඉනෙන් අල්වාගත්තේය. ඉක්බිති ඒ උපාසකතෙමේ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයා විසින් පෙළනු ලබන්නේ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයේ සිවුර මිලට ගෙනදී පසුම ගියේය.

102 මනුෂ්‍යයෝ ඒ උපාසකයාට 'ආර්යයෙනි ඔබ කුමක් හෙයින් පසුව ආයේද? පනයක් දඩයයි' කීවෝය. ඉක්බිති ඒ උපාසක තෙමේ ඒ මිනිසුන්ට මේ කාරණය දැන්වූයේය. මනුෂ්‍යයෝ (ii) දොස් කියත් නොසතුට ප්‍රකාශ කරත්. නොසතුටු වචන කියත්. (iii) "මේ ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ බොහෝ ආශා ඇත්තෝය. ලද දෙයින් සතුටු නොවන්නෝය. මොවුන්ට වතාවත් කරන්නටද නොහැකිය. (iv) කෙසේ නම් උපාසකයෙකු විසින් අදට නවතින්නැයි කියනු ලබන්නේ නොවතින්නේදැයි" කියති. (v) භික්ෂූහු දොස් කියන්නාවූ නොසතුට ප්‍රකාශ කරන්නාවූ නොසතුටු වචන කියන්නාවූ ඒ මනුෂ්‍යයන්ගේ වචන ඇසූවාහුය. යම් ඒ භික්ෂු කෙනෙක් බොහෝ ආශා නැත්තාහුද ඔව්හු (මෙහි (ii) (iv)

103 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැල කළාහුය. "උපනන්දය, ඔබ උපාසකයෙකු විසින් 'ස්වාමීනි, අදට නවතිනු මැනවයි කියන කල්හි නො නැවතුනෙහි යනු ඇත්ත දැයි' ඇසීය. 'භාග්‍යවතුන් වහන්ස, ඇත්තය,' භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළසේක, "කෙසේ නම් හිස් පුරුෂය, උපාසකයෙකු විසින් 'ස්වාමීනි, අද නවතින්නැයි කියන්නේ නොනවතින්නේද, (මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v) හා මේ ශික්ෂා පදය උදෙසම්

104 භික්ෂුවක් උදෙසා රජෙක් හෝ රාජමාත්‍යයෙක් හෝ බමුණෙක් හෝ ගෘහපතියෙක් හෝ මේ සිවුරු මිලයෙන් සිවුරක් මිල දී ගෙන මේ නම් භික්ෂූහු සිවුරෙන් අන්දවයි කියා සිවුරු මිලයක් දූතයෙකු ලවා එවූයේ නම් (ii) ඒ දූතතෙම ඉදින් ඒ භික්ෂුව කරා එළඹ, "ස්වාමීනි, ආයුෂ්මතුන් උදෙසා මේ සිවුරු මිලය ගෙනෙන ලද්දේය. ආයුෂ්මත් තෙමේ සිවුරු මිලය පිළිගනීවා,' මෙසේ කියන්නේ නම් ඒ භික්ෂුව විසින් ඒ දූතයාට "ඇවත, අපි සිවුරු මිලය නොපිළිගනුමෝ. අපි ප්‍රයෝජනයක් ඇති කල්හි කැප වූ සිවුරක් පිළිගනුමෝයි" මෙසේ කිය යුතු වන්නේය.

ඉදින් ඒ දූතතෙම ඒ භික්ෂුවහට "ආයුෂ්මතුන්ගේ වනාහි කිසි කැපකරුවෙක් ඇද්දැයි' යි කියන්නේ නම් මහණෙනි, සිවුරු කැමති භික්ෂුව විසින් කැපකරුවූ ආරාමිකයෙකු හෝ උවසුවෙකු හෝ (iii) 'ඇවත මේ තෙම වනාහි භික්ෂූන්ගේ කැප කරුවායයි' දැක්විය යුතුය. (iv) ඉදින් ඒ දූතතෙම ඒ කැපකරුවා ගිවිස්වා ඒ භික්ෂුව කරා එළඹ මෙසේ කියන්නේ නම් 'ස්වාමීනි, ආයුෂ්මත් තෙම යම් කැප කරුවෙකු හැඳින්වීද මා විසින් හෙතෙම ගිවිස්සන ලද්දේය. ආයුෂ්මතුන් වහන්සේ කාලයෙහි එළඹෙව්; සිවුරෙන් තුඹ වහන්සේ අන්දවන්නේය. මහණෙනි, සිවුරු කැමැතිවූ මහණහු විසින් වතාවත් කරන්නා ලඟට එළඹ (v) 'ඇවත මට සිවුරෙන් ප්‍රයෝජන ඇත්තේයයි' දෙතුන් වරක් ඉල්විය යුත්තේය. දෙතුන්වරෙක ඉල්වන්නේ සිහි කරන්නේ ඒ සිවුර නිපදවී නම් මෙසේ නිපදවීම යෙහෙක ඉදින් නොනිපදවී නම් සතර වරෙක පස් වරෙක සවරක් පරම කොට තුෂ්ණීම් භූත වූවහු විසින් සිටිය යුතුයි. සතරවරෙක පස්වරෙක සවරක පරම කොට තුෂ්ණීම්භූතවූයේ ඒ සිවුර නිපදවූයේ නම් මෙසේ මේ නිපදවීම මැනවි. ඉදින් නොනිපදවූයේ නම් ඉදින් ඒ දුන්වූ කාල ප්‍රමාණයෙන් මත්තෙහි වෑයම් කරන්නේ ඒ සිවුර නිපදවන්නේ නම් නිසගි පචිති වේ. ඉදින් නොනිපදවූයේ නම් යමක්හු කෙරෙන් ඒ භික්ෂුවට සිවුරු මිලය ගෙනෙන ලදද, ආයුෂ්මත්නි, තෙපි භික්ෂුවක් උදෙසා සිවුරු මිලයක් යැවූවාහුද, ඒ සිවුරු මිලය ඒ භික්ෂුවගේ කිසි ප්‍රයෝජනයක් නිෂ්පාදනය නොකෙරෙයි. 'ආයුෂ්මත්හු තමන් සතු ධනය යෙදෙත්වා. තොපගේ වස්තුව නොනැසේවයි' කියා තමා විසින් හෝ යා යුතුය. දූතයෙකු හෝ යැවිය යුත්තේය. එහි මේ ලෝකොත්තර ධර්මානුගත ප්‍රතිපත්තිය වේ.

105 'භික්ෂුවක්ම උදෙසා' යනු භික්ෂුවක් නිසා, භික්ෂුවක් අරමුණු කොට භික්ෂුවක් අන්දවනු කැමැත්තේ යනුයි. 'රජු නම්, යමෙක් රජ කරවයිද, ඔහුයි. 'රජුගෙන් යැපෙන්නෙක් යනු යමෙක් 'රජුගෙන් බත් වැටුප් ලබන්නේ' න ඔහුයි.

'බ්‍රාහ්මණ නම්' උත්පත්තියෙන් බමුණුයි. 'ගෘහපතියෙක්' නම් රජු රජුගෙන් සැපෙන්නා බ්‍රාහ්මණයා හැර ඉතිරි ගෘහපතියෝය. 'සිවුරු මිලයක්' නම් (මෙහි 91 (ii) 'මේ සිවුරු මිලයෙන්' යනු ඉදිරිපත්වූ දෙයින් යනුයි. 'මිලදී ගෙන' යනු 'මාරු කර අත්දව' යනු දෙව යනුයි. (මෙහි 104 (ii) ඇවැත්නි, මේ තෙමේ භික්ෂූන්ගේ වතාවත් කරන්නායයි කියායි. ඔහුට දෙවයි කියා හෝ මෙතෙම තබන්නේය කියා හෝ මෙතෙම මාරු කරන්නේය කියා හෝ මෙතෙම මිලදී ගන්නේය කියා හෝ නොකිව යුතුය (මෙහි 104 (iv) දෙතුන් වරක් දන්විය යුතුය. සිහි කරවිය යුතුය 'ඇවැත්නි මට සිවුරෙන් ප්‍රයෝජන ඇතැයි' කියායි 'මට සිවුර දෙව' මගේ සිවුර ගේන්න. 'මගේ සිවුර මාරු කරන්න. 'මට සිවුරක් මිලදී ගන්නැයි' නොකිව යුතුය. දෙවනුවත් කිව යුතුය. තෙවනුවත් කිවයුතුය. ඉදින් ලැබුණේ නම් යෙහෙක. නොලැබුණේ නම් එහි ගොස් තුෂ්ණීම්භූතව අගෙම සිටිය යුතුය. අසුනෙහි වාඩි නොවිය යුතුය. ආමිසය නොපිළිගත යුතුය. බණ නොකිය යුතුය. 'වැඩියේ කුමකට දැයි' 'ඇසූ කල' 'ඇවැත්නි, නොදනිමියි' කිව යුතුය. ඉදින් අස්නෙහි හිඳ ගත්තේ නම් ආමිසය පිළිගත්තේ නම් බණ හෝ කීයා නම් කාරණය බිඳෙයි. දෙවනුවත් සිටිය යුතුය. තුන්වෙනුවත් සිටිය යුතුය සතර වරක් පැමිණිලි කොට සතරවරක් සිටිය යුතුය. පස්වරක් පැමිණිලි කොට දෙවරක් සිටිය යුතුය. සවරක් චෝදනා කොට නොසිටිය යුතුය. ඉදින් ඊට වඩා වෑයම් කරන්නේ ඒ සිවුර ලැබුණේ නම් ක්‍රියාවෙහි දුකුලාවේ. ලැබීමෙහි නිසගියවේ. සඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට භාරදිය යුතුයි.

106 "මහණෙනි, මෙසේද මනාකී භාරදිය යුතුය. 'ස්වාමීනි, මේ මගේ සිවුර තුන්වරකට වඩා චෝදනා කිරීමෙන් සවරකට වඩා සිටීමෙන් නිපදවන ලදී. නිසගියය. මම මෙය සංඝයාට භාරදෙමියිද දෙන්නේයයිද, දෙන්නාහුයයිද, ආයුෂ්මතුන්ට දෙමියිද දිය යුතු, ඉදින් නොලැබෙන්නේ නම් යම් කෙනෙකුගෙන් ඔහුට සිවුරු මිලයක් ගෙනාවේද එහි

තෙමේ හෝ යා යුතුය. දූතයෙකු හෝ යැවිය යුතුය. "ආයුෂ්මතුනි, තෙපි යම් භික්ෂුවක් උදෙසා සිවුරු මිලයක් යැවූහුද එය ඒ භික්ෂුවට කිසිදු වැඩක් නොවිය. ආයුෂ්මත්හු සවකීයෙ දේව හිමිපවමා. තමන්ගේ දෙය විනාශ නොකෙරේවායි" කියයි. මේ එහි කරි ක්‍රමයයි. මේ එහි ධර්මානුගත ක්‍රමයයි. තුන්වරකට වඩා පැමිණිලි කිරීමෙන් සවරකට වඩා සිටීමෙන් වැඩියක් යන අදහස් ඇතිව නිපදවා නම් නිසගි පචිතිවේ. තුන්වරකට වඩා පැමිණිලි කිරීමෙන් සවරකට වඩා සිටීමෙන් විමති ඇතිව නිපදවයිනම් නිසගි පචිතිවේ. තුන්වරකට වඩා පැමිණිලි කිරීමෙන් සවරකට වඩා සිටීමෙන් අඩුය යන හැඟීම් ඇතිව නිපදවානම් නිසගි පචිතිවේ. තුන්වරකට වඩා අඩුමෙන් පැමිණිලි කිරීමෙන් සවරකට වඩා අඩුවෙන් සිටීමෙන් වැඩිය යන හැඟීම ඇත්තේ දුකුලා ඇවැත්වේ. තුන්වරකට වඩා පැමිණිලි කිරීමෙන් සවරකට වඩා සිටීමෙන් විමති ඇත්තේ දුකුලා ඇවැත්වෙ. තුන්වරකට වඩා පැමිණිලි කිරීමෙන් සවරකට වඩා සිටීමෙන් අඩුය යනහැඟීම් ඇත්තේ ඇවැත් නොවේ. තුන්වරක් පැමිණිලි කිරීමෙන්, සවරක් සිටීමෙන් තුන්වරකට වඩා පැමිණිලි කිරීමෙන්, තුන්වරකට වඩා සිටීමෙන් පැමිණිලි නොකර දෙයිද, හිමිවරු පැමිණිලි නොව දෙත්ද, උම්තුවූවහුට, මුලින් වැරැද්දකළහුට ඇවැත් නොවේ.

---

# 2 එළක ලොම වග්ග

---

## 1 කොසිය ශික්ෂාපදය

1 එකල්හි වනාහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ අලව්නුවර අග්ගාළව් චෛත්‍යස්ථානයෙහි වාසය කරණසේක. එකල්හි වනාහි සවග භික්ෂූහු පටපණුවන් ඇතිකරන්නන් වෙත පැමිණ (ii) "ඇවැත්නි, බොහෝ කොෂ කරන්නන් පිසව්, අපටද දෙව්, අපිදු කෞසෙය්‍ය කුල් මිශ්‍ර ඇතිරිල්ලක් කරණු කැමැත්තෙමුයයි" (iii) කියත්. (iv) ඔවුහු දෙන්

කියත්, නොසතුට ප්‍රකාශකරත්, නොසතුටු බස් කියත්. (v) "කෙසේ නම් ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ අපවෙත පැමිණ (මෙහි (ii) කියත්ද, අපට ද අලාභය, අපිදු දුකසේ ලබමු සම්බඳුවූ අපි ජීවිකාව කාරණකොට ගෙන අඹුදරුවන් නිසා බොහෝ කුඩා ප්‍රාණීන් විනාශයට පමුණුවමුයි'' කියායි. භික්ෂූහු දෙස් කියන්නාවූ නොසතුට ප්‍රකාශ කරන්නාවූ නොසතුටු බස් කියන්නාවූ ඒ මිනිසුන්ගේ වචන ඇසුවාහුය. යම් ඒ භික්ෂු කෙනෙක් අල්පෙච්ඡද (මෙහි (iv)) කෙසේනම් ඡබ්බග්ගිය භික්ෂූහු පටපණුවන් ඇතිකරන්නන් වෙත පැමිණ (මෙහි (ii) කියත්ද?

2 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළාහුය. "මහණෙනි, සැබෑ පටපණුවන් ඇතිකරන්නන් වෙත පැමිණ (මෙහි 1 (ii) කීයෙව්ද?'' "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය'' හිස් පුරුෂයෙනි, කෙසේ නම් තෙපි කොසෙය්‍ය පණුවන් ඇතිකරන්නවුන් වෙත පැමිණ (මෙහි 1 (ii)) හිස් පුරුෂයෙනි, මෙය නොපැහැදුනවුන්ගේ (මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v))

3 "යම් මහණෙක් තෙමේ වනාහි කොසෙය්‍ය තුල් මිශ්‍ර ඇතිරියක් කරවන්නේ නම් නිසගි පචිතිවේ.''

4 "යමෙක් වනාහි යනු භික්ෂු'' යනු (මෙහි 1 පාරාජිකයේ පදභාජනියේ 1-2 ඡේද) "සන්ථත'' යනු අතුරාකරණ ලද්දක් වේ. "කොමියන ලද්දේය. කරවන්නේය'' යනු එක් කොසෙය්‍ය තුලකින් හෝ මිශ්‍රකර කරයි හෝ කරවා නම් ක්‍රියාමෙහි දුකුලාවේ, ලැබීමෙන් නිසගිවේ. සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට හෝ භාරදිය යුතුයි. "මහණෙනි, මෙසේ වනාහි භාරදිය යුතුයි "ස්වාමීනි, මා විසින් මේ කොසෙය්‍ය තුල් මිශ්‍ර ඇතිරිල්ලක් කරවන ලදී. නිසගිවේ. මම මෙය සංඝයාට භාරදෙමියිද දෙන්නේය කියාද දුක්නාහුය කියාද ආයුෂ්මතුන්ට දෙමි කියාද දිය යුතුයි

5 තමා විසින් අඩාල කරණලද්ද තමන්ම අවසන් කෙරේද නිසගි පචිතිවේ. (ii) තමා විසින් අඩාල කරණලද්ද

අන්‍යයා විසින් අවසන් කරයිද නිසගි පචිති වේ. අනුන් විසින් අඩාල කරණලද්දේද, තමා විසින් අවසන් කරයිද නිසගි පචිති වේ. අනුන් විසින් අඩාල කරණලද්දේද අනුන් විසින් අවසන් කරයිද නිසගි පචිති වේ අනිකෙකු සඳහා කරයිද කරවයිද දුකුලා ඇවැත් වේ. අනිකෙකු විසින් කරණලද්දද ලැබ පාවිච්චි කරයිද දුකුලා ඇවැත් වේ" (iii)

"විතානක් හෝ බුමුතුරුණක් හෝ රෙදි තිරයක් හෝ ගුදිරියක් හෝ මෙට්ටයක් හෝ කරයිද, උමතුවූවහුට, මුලින් වැරැද්ද කළහුට ඇවැත් නොවේ."

---

## 2 සුධ කාළක ශික්ෂාපදය

6 එකල්හි වනාහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විශාලානුවර මහ වනයෙහි කූටාගාර ශාලාවෙහි වැඩ සිටිසේක. ඒ කාලයෙහි ඡබ්බග්ගිය භික්ෂූහු තනිකර කළුපාටින් යුත් බැටළුලොම් * වලින් ඇතිරිල්ලක් කරවත්. විහාරවල ඇවිදීමෙහි යුත් මිනිස්සු දැක "කාමභෝගී ගිහීන් මෙන් කෙසේ නම් ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ (ii) තනි කළුපාට බැටළුලොම් වලින් ඇතිරිල්ලක් කරවත්දැයි" (iii) දොස් කියත්, නොසතුටු ප්‍රකාශ කරත්, නොසතුටු වචන කියත්. භික්ෂූහු දොස් කියන්නාවූ නොසතුටු ප්‍රකාශ කරන්නාවූ නොසතුටු වචන කියන්නාවූ ඒ මිනිසුන්ගේ බස් ඇසූහ. යම් භික්ෂු කෙනෙක් අල්පේච්ඡද ඒ භික්ෂූහු කෙසේ නම් ඡබ්බග්ගිය භික්ෂූහු (මෙහි (ii) දොස් කීහ. නොසතුටුව ප්‍රකාශ කළහ. නොසතුටු වචන කීහ ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය 'මහණෙනි, තෙපි (මෙහි (ii) ඇත්තදැයි" ඇසූසේක. "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය" භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගැරහූසේක. හිස් පුරුෂයෙනි, තෙපි කෙසේ නම (මෙහි (ii) හිස් පුරුෂයෙනි, මෙය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිසත් (මෙහි I පාරාජිකයේ සුදින්න ඛණ්ඩයේ මේ සිකපදය මෙසේ උදෙසව්.

7 යම්කිසි මහණෙක් තෙම වනාහි තනි කළුපාටවූ බැටළු ලොම් වලින් ඇතිරියක් කරවත්තේ නම් නිසගි පචිති වේ

---

* බොහෝ පරිවර්තනවල "එළලොම" යන්න යොදා තිබේ.

8 යමෙක් වනාහි යනු භික්ෂු යනු (මෙහි 1 පාරාජිකයේ පදභාජනියේ 1–2 ඡේද)

'කළු' නම් කළු දෙකකි. ස්වාභාවයෙන්ම කළු හෝ පෙඟීමෙන් කළු යනුයි. 'ඇතිරියක්' යනු අතුරා කළේවේ. වියා නොකළේවේ. ''කරවයි'' යනු කරයි හෝ කරවයි හෝ ක්‍රියාවෙහි දුකුලාවේ. ලැබීමෙන් නිසගිවේ සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට භාරදිය යුතුයි. මහණෙනි, මෙසේද වනාහි භාරදිය යුතුයි. ''ස්වාමීනි, මා විසින් තනි කළුපාට බැටළු ලොම් වලින් ඇතිරියක් කරණ ලදී. නිසගිවීය. (ii) මෙය මම සංඝයාට භාරදෙමි. මම මෙය සංඝයාට භාරදෙමියි කියාද දෙන්නේය කියාද දුන්නාහුය කියාද ආයුෂ්මත්හට දෙමි කියාද දියයුතුය.''

9 (මෙහි කොසිය ශික්ෂාපදයේ 5 ඡේදය)

---

## 3 ද්වෙභාග ශික්ෂාපදය

10 (මෙහි 1 (i) එකල්හි වනාහි ඡබ්බග්ගිය භික්ෂූහු තනි කළුපාටින් ඇතිරියක් කරන්නට භාග්‍යවතුන් වහන්සේ එපාකළ සේක්යයි ඔව්හු සුදු ලොම් ටිකක් කෙළවරට ගෙන තනි කළුපාට බැටළු ලොම් වලින් ඇතිරියක් කරවත්. යම් ඒ භික්ෂු කෙනෙක් අල්පෙච්ඡද ඔව්හු දොස් කියත්. නොසතුට ප්‍රකාශ කරත්, නොසතුටු වචන කියත්. කෙසේනම් ෂවග භික්ෂූහු (ii) සුදු ලොම් ටිකක් කෙළවරට ගෙණ එසේ තනි කළුපාටින් ඇතිරියක් (iii) කරත්දැයි කියායි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. ''මහණෙනි, තෙපි (මෙහි (ii)) කළේ ඇත්තදැයි'' ඇසූසේක. ''භාග්‍යවතුන් වහන්ස, ඇත්තය'' භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගැරහූසේක. හිස් පුරුෂයෙනි, කෙසේනම් තෙපි (මෙහි ii) කරවත් කරවන්නහුද හිස් පුරුෂයෙනි, (මෙහි 1 පාරාජිකයේ සුදින්න ඛරමරේ 10 (v)

11 ''අළුත් ඇතිරියක් කරවන්නාවූ භික්ෂුව විසින් වනාහි තනි කළු බැටළු ලොම් පිළිබඳ දෙකොටසක් ගතයුත්තාහ.

සුදු බැටළු ලොම් පිළිබඳ තුන්වැනි කොටසද දුඹුරුපාට සතරවැනි කොටසද ගතයුත්තාහ. මහණතෙම ඉදින් තනි කළුවූ බැටළු ලොම් පිළිබඳ දෙභාගයක් නොගෙන සුදු බැටළු ලොම් පිළිබඳ තුන්වෙනි කොටසද නොගෙන අළුත් ඇතිරියක් කරවන්නේ නම් නිසග්ගි පචිත්තිවේ.''

12 'අළුත්' යනු අළුතෙන්සෑදීමකියනු ලැබේ. 'ඇතිරියක'' අතුරා කරණ ලද්දේවේ. නොවියන ලද්දේවේ. 'කරවන්නාහු විසින්' යනු කරන්නේ හෝ කරවන්නේ හෝයි. දෙභාගයක් තනි කළු බැටළුලොම් ගතයුතුය උපුලා කොටස් දෙකක් ගත යුතුය. 'තුන්වැන්න සුදුපාටින්' යනු කොටසක් සුදු පාටිනි. 'සතරවැන්න දුඹුරු පාටින්' යනු කොටසක් දුඹුරුපාටින් යනුයි. ඉදින් මහණතෙම, දෙකොටසක් තනි කළු බැටළු ලොම් වලින්ද තුන්වැන්න සුදින්ද සතරවැන්න දුඹුරුපාටින්ද නොගෙන දෙකොටසක් තනිකළු බැටළු ලොම්වලින්ද කොටසක් සුදෙන්ද කොටසක් දුඹුරුපාටින්ද ගෙන අළුත් ඇතිරිල්ලක් කරයි හෝ කරවයි හෝ ක්‍රියාවක් පාසා දුකුලාවේ. ලැබීමෙහි නිසගියවේ. සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට හැරදිය යුතුය. මහණෙනි, මෙසේ වනාහි හැරදිය යුතුය, 'ස්වාමීනි, මේ මාගේ ඇතිරිය සුදින් කොටසක් හා දුඹුරින් කොටසක් නොගෙන කරවන ලදී. නිසගි වීය (මෙහි 8 (ii) ) 5 ඡේදයේ (ii)

13 තමාවිසින් අඩාල කරණ ලද්දේ (මෙහි කොසිය ශික්ෂා පදයේ 5 ඡේදය) සුදින් කොටසක්ද දුඹුරු පාටින් කොටසක්ද නොගෙන කරයිද, වැඩි කොටසක් සුදෙද, වැඩි කොටසක් දුඹුරුපාටින්ද ගෙන කරයිද, තනි සුදු තනි දුඹුරු ගෙන කරයිද, වියනක් හෝ බුමුතුරුණක් හෝ රෙදි පවුරක් හෝ ගුදිරියක් හෝ මෙට්ටයක් හෝ කරයිද, උමතුවූ-වහුට මුලින් වැරැද්ද කළහුට ඇවැත් නොවේ.

---

## 4 ඡබ්බස්ස ශික්ෂාපදය

14 (මෙහි 1 අතිශයේ 1 (i) ) ඒ කාලයෙහි භික්ෂූහු (ii) වර්ෂයක් පාසා ඇතිරියක් කරවත් ඔව්හු ඉල්වීම බහුල කොට ඇඟවීම බහුලකොට වාසය කරත්. 'බැටළු ලො-

දෙව බැටළුලොමින් ප්‍රයෝජන ඇත්තේයයි' කියයි. (iii) මිනිස්සු 'කෙසේනම ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ වර්ෂයක් පාසා ඇතිරිල්ලක් කරමින්ද 'බැටළු ලොම් දෙව, බැටළු ලොමින් ප්‍රයෝජන ඇත්තේ යයි' ඉල්ලීම් බහුලව, හැඟවීම් බහුලව වාසය කරත්' දැයි දොස් කියත්, නොසතුට ප්‍රකාශ කරත්. නොසතුටු වචන කියත්. 'අපගේ වනාහි වරක් කළ ඇතිරිලි වර්ෂ පහක්ද සයක්ද පවතිත්. එහි අපගේ දරුවෝ මලපහ කරත්. මුත්‍රා පහකරත්. මීයන් විසිතුරු කත්. මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ (මෙහි (ii) භික්ෂූහු දොස් කියන්නාවූ නොසතුට ප්‍රකාශ කරන්නාවූ නොසතුටු වචන කියන්නාවූ ඒ මිනිසුන්ගේ වචන ඇසුවාහුය. යම් ඒ භික්ෂු කෙනෙක් අල්පේච්ඡද ඔවුහු දොස් කියත්. නොසතුට ප්‍රකාශ කරත්. නොසතුටු වචන කියත්. කෙසේ නම් භික්ෂූහු (මෙහි (ii)

15 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැල කළාහුය. 'මහණෙනි, භික්ෂූහු වර්ෂයක් පාසා ඇතිරිල්ලක් කරමින් යතු ඇත්තද?' 'භාග්‍යවතුන් වහන්ස, ඇත්තේය.' 'භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළ සේක 'මහණෙනි, ඒ හිස් පුරුෂයෝ කෙසේ නම් (මෙහි (ii) ) "මහණෙනි, මේය නොපැහැදුනවුන්ගේ (මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v))

16 භික්ෂුව විසින් වනාහි අළුත් ඇතිරියක් කරවා සවසක් දැරිය යුත්තේය මහණෙනි ඉදින් අවුරුදු සයෙන් මෙපිට ඒ ඇතිරිල්ල දී හෝ නොදී හෝ සංඝසම්මුතියක් නැතිව අන්‍ය අළුත් ඇතිරිල්ලක් කරවන්නේ නම් නිස්සග්ගි පචිත්තිවේ. මෙසේද වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට ශික්ෂාපද පනවන ලදී.

17 එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් කොසඹෑ නුවර ලෙඩෙක් වූයේය. "ස්වාමීනි එන්න, අපි උපස්ථාන කෙරෙමුයි" නෑයෝ ඒ භික්ෂුව සමීපයට දූතයෙකු යැවුවාහුය. භික්ෂූහුද 'ඇවැත්නි, යව ඔවුහු භික්ෂූහු උපස්ථාන කෙරෙත් යයි" මෙසේ කීවාහුය. හෙතෙම 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂු විසින් අළුත් ඇතිරියක් කොට සවසක්

දැරිය යුතුයයි ශික්ෂා පදයක් පනවන ලදී. මමද ගිලන්මි. ඇතිරිල්ලක් රැගෙන ඇවිදින්නට නොහැකි වෙමි. මටද ඇතිරිල්ලක් නැතිව පහසු නොවේ. මම කොයන්නෙමි"යි කීයේය. භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැල කළාහුය.

18 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ සිද්ධියෙහි දැහැමි කථාකොට භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. 'මහණෙනි, ගිලන් භික්ෂුවට ඇතිරිලි ගැන නිදහසක් දෙන්නට අණ කරමි. මහණෙනි, මෙසේද එනාහි දියයුතුය. ඒ ගිලන් භික්ෂුව විසින් සංඝයා වෙත පැමිණ තනිපට සිවුර එකාංශකොට වැඩිමහළු භික්ෂූන්ගේ පා වැඳ උක්කුටුකයෙන් හිඳ ඇදිලි බැඳ, 'ස්වාමීනි, මම ගිලන්ය. ඇතිරියක් රැගෙන යාමට අපහසුය. ස්වාමීනි, ඒ මම සංඝයාගෙන් ඇතිරිල්ල පිළිබඳ නිදහසක් ඉල්ලමි'යි" කිවයුතුය. දෙවනුවත් ඉල්ලිය යුතුය. තෙවනුවත් ඉල්ලිය යුතුය. උගත් භික්ෂුවක් විසින් සංඝයාට දැන්විය යුතුය. 'ස්වාමීනි, සංඝතෙමේ මා කියන්නක් අසාවා. 'මේ මෙනම් භික්ෂුතෙම ගිලන්ය. ඇතිරියක් රැගෙනයන්නට නොහැකිය. හෙතෙම සංඝයාගෙන් ඇතිරිය පිළිබඳ නිදහසක් ඉල්ලයි. ඉදින් සංඝයාට පැමිණි කල් ඇත්තේ වී නම් සංඝතෙමේ මෙනම් භික්ෂුවට ඇතිරිල්ල පිළිබඳ නිදහසක් දෙන්නේය. මේ එහි දැන්වීමයි. "ස්වාමීනි සංඝතෙමේ මා කියන්නක් අසාවා. මේ මෙනම් භික්ෂුතෙමේ ලෙඩෙකි. ඇතිරියක් රැගෙන යාමට නොහැකිය. හෙතෙම සංඝයාගෙන් ඇතිරිය පිළිබඳ නිදහසක් ඉල්ලයි. සංඝතෙම මෙනම් භික්ෂුවට ඇතිරිල්ල පිළිබඳ නිදහසක් දෙයි, යම් ආයුෂ්මත් කෙනෙකුට මෙනම් භික්ෂුවට ඇතිරිල්ල පිළිබඳ නිදහසක් දීම කැමැති වේද හෙතෙම නිශ්ශබ්ද විය යුතුය. යමෙකුට නොහැකි වේනම් හෙතෙම කියන්නේය. සංඝයා විසින් මෙනම් භික්ෂුවට ඇතිරිල්ල පිළිබඳ නිදහසක් දෙනලදී. සංඝයාට රුචි වෙයි. එහෙයින් නිශ්ශබ්දය. මේ නිශ්ශබ්දභාවය මෙසේ දරමි.' මහණෙනි, මෙසේද එනාහි මේ ශික්ෂා පදය දේශනා කරව."

19 "භික්ෂුව විසින් නොහි අළුත් ඇතිරියක් කරවා දැරිය යුත්තේය. මහණෙනි ඉදින් අවුරුදු සයෙන් මෙපිට ඒ ඇතිරිය කිසිවකුටදී හෝ නොදී හෝ සංඝ සම්මුතියෙන් විනා අනික් අළුත් ඇතිරියක් කරවන්නේද නිසගි පචිතිවේ."

20 'අළුත්' යනු කිරීම ගෙන කියනු ලැබේ 'ඇති-රියක්' නම් අතුරා කරණ ලද්දේ වේ. නොවියා කරණ ලද්දේ වේ. 'කරවා' යනු කර හෝ කරවා යනුයි. 'සවසක් දැරිය යුතුය' යනු සවසක් පමණකොට දැරිය යුතුය. 'සවසකට මෙපිට' යනු සවසකට අඩුවෙනි. 'ඒ ඇතිරිය දී' යනු 'අනුන්ට දී' 'අනුන්ට නොදී' යනු 'කිසිවෙකුට නොදී යනුයි 'සංඝ සම්මතයෙන් පිට' යනු සංඝ සම්මතය නොලබා අනෙක් අළුත් ඇතිරිල්ලක් කරයිද කරවයිද: ක්‍රියා මෙහි දුකුලාවේ. ලැබීමෙහි නිසගිවේ. සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයාට හෝ හාරදිය යුතුයි. මහණෙනි, මෙසේද වනාහි හාරදිය යුතුයි. "ස්වාමීනි, මේ ඇතිරිය සවසකින් මෙපිට කරවන ලදී. සංඝ සම්මතය හැර නිසගිවිය. මම මෙය සංඝයාට හාරදෙමියිද, දෙන්නේයයිද, දුන්නාහුයයිද, ආයුෂ්මතුන්ට දෙමියිද දිය යුතුයි. (මෙහි 5 ඡේදයේ (ii) සවසකින් කරයිද, සවසකට මැති කලකින් කරයිද, අනිකෙකු උදෙසා කරයිද, කරවයිද, අනිකෙකු විසින් කරණ ලද්ද ලැබ පරිභොග කරයිද විතානක් හෝ බුමුතුරුණක් හෝ රෙදි පවුරක් හෝ ගුදිරයක් හෝ මෙට්ටයක් හෝ කරයිද, සංඝ සම්මතයෙන්, උම්තුවූවහුට මුලින් වැරැද්ද කළහුට ඇවැත් නොවේ.

## 5 නිසීදන සන්ථත ශික්ෂාපදය

21 (මෙහි 1 අංකයෙහි 1(i) ඉස් බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. "මහණෙනි, මම තුන්මසක් විවේකව සිටින්නට කැමැත්තෙමි. (ii) පිණ්ඩපාත ගෙනෙන කෙනෙකු හැර කිසිවෙකු නොඑළඹිය යුතුය." (iii) "ස්වාමීනි, එසේයයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරුදී පිණ්ඩපාත-

ගෙනෙන එකකු හැර මෙහි භාග්‍යවතුන් වෙත කිසිවෙක් නො එළඹෙයි. එකල්හි වනාහි සැවැත්නුවර සඞ්ඝයා ඇමැත්ති, භාග්‍යවතුන් වහන්සේ තුන්මසක් විවේකව වසන්නට කැමැති සේක. (මෙහි (ii)) යමෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹෙයිද හෙතෙම පචිත්තිය දෙසිය යුතුයයි" කතිකාවතක් කරණ ලද්දේ වේ.

22 ඉක්බිති පිරිස සහිත ආයුෂ්මත් උපසේන වඞ්ගන්ත පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. ආගන්තුක භික්ෂූන් සමග පිළිසඳර කථා කිරීම භාග්‍යවත් බුදුවරුන්ගේ පුරුද්දකි. භාග්‍යවතුන් වහන්සේ එකත්පසෙකහුන් උපසේන වඞ්ගන්ත පුත්‍රව "උපසේනය, තොපට කෙසේද, ඉවසිය හැකිද, කෙසේද යැපිය හැකිද? කිසිමක්ද වෙහෙස මහන්සියක් නැතිව මාර්ගයෙහි ආහුදැයි" ඇසූසේක. එකල්හි වනාහි ආයුෂ්මත් උපසේන වඞ්ගන්ත පුත්‍ර සමග හැසිරෙන භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි සිටියේවේ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂුවට "මහණ, තොපට පාංශුකූල සිවුරු ප්‍රියදැයි' ඇසූහ. "ස්වාමිනි, මට පාංශුකූල සිවුරු ප්‍රිය නැත" "මහණ ඔබ කුමක් හෙයින් පාංශුකූලිකවූයෙහිද?" "ස්වාමිනි, මාගේ උපාධ්‍යායන් වහන්සේ පාංශුකූලිකය එසේ මමත් පාංශුකූලිකවූයෙමියි" කීයේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් උපසේන වඞ්ගන්ත පුත්‍රව "උපසේනය, ඔබගේ මේ පිරිස ප්‍රාසාදිකය. උපසේන, ඔබ කෙසේ පිරිස හික්මවන්නෙහිදැයි" ඇසීය. "යමෙක් මගෙන් උපසම්පදාව ඉල්වයිද, ඔහුට මම (ii) ඇමැත්ති, මම ආරණ්‍යකය, පිණ්ඩපාතිකය, පාංශුකූලිකය ඉදින් තෙපිද ආරණ්‍යක නොවනකු වන්නෙහු නම්, පිණ්ඩපාතයෙන් යැපෙන්නෙකු වන්නෙහි නම් පාංශුකූල සිවුරු දරන්නෙකු වන්නෙහි නම් (iii) මෙසේ මි උපසම්පදා කරන්නෙමියි. මෙසේ කියමි.' ඉදින් මාගේ වචන පිළිගනීද උපසම්පදා කරවමි. ඉදින් මාගේ වචන නොපිළිගනීද, උපසම්පදා නොකරමි. යමෙක් මගෙන් නිශ්‍රය ඉල්වයිද,

ඔවුන්ට මම (මෙහි (ii) ) මෙසේ නොපව නිසදෙමියි. කියන්-නෙමි. ඉදින් මාගේ වචනය පිළිගනීද නිසදෙමි. නොපිළිගනී නම් නිස නොදෙමි. ස්වාමීනි, මෙසේ මම පිරිස හික්මවමියිද" කීයේය.

23 "උපසේනය, යහපත, යහපත, ඔබ යහපත උපායෙන් පිරිස හික්මවන්නෙහිය. (ii) උපසේනය, ඔබ සැවැත්නුවර භික්ෂූන්ගේ කතිකාව දන්නෙහිද?" "ස්වාමීනි, මම සැවැත් නුවර සඞ්ඝයාගේ කතිකාව නොදනිමියි." කීයේය. "උපසේනය, සැවැත් නුවර භික්ෂූහු කතිකාවක් කරණ ලද්දෝය. 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ තුන්මසක් විවේක ගැනීමට කැමැතිසේක. පිණ්ඩපාතය ගෙනයන තෙනෙකු හැර කිසිවෙකු භාග්‍යවතුන් වහන්සේ වෙත නොඑළඹිය යුත්තේය. යමෙක් භාග්‍යවතුන්වහන්සේ වෙත එළඹෙයිද, හෙතෙම පාචිත්තිය දෙසිය යුතුයයි' කතිකාවක් කරණලදී." "ස්වාමීනි, සැවැත් නුවර භික්ෂූහු සවකීය කතිකාවෙන් ප්‍රකටවේ. අපි නොපනවන ලද්දක් නොපනවමු පනවනලද්ද නොකඩමු. පනවන ලද ශික්ෂාපදයන් සමාදන් වී පවතිමු" කියයි. (iii) "උපසේනය, යහපත යහපත, නොපැනවූවක් නොපැනවියයුතුයි. පැනවූවක් නොකැඩියයුතුයි, පැනවූ ශික්ෂාපද සමාදන්වී පැවතියයුතුය. උපසේනය, යම් ඒ භික්ෂු කෙනෙක් කැලේ වාසය කරත්ද පිණ්ඩපාතයෙන් යැපෙත්ද, පාංශුකූල සිවුරු දරත්ද, ඔව්හු සැපසේ මාවෙත පැමිණෙන්ට අවසර දෙමි"

24 එකල්හි වනාහි බොහෝ භික්ෂූහු දොරටුවෙන් පිට කොටුවෙහි සිටියාහුවෙත්. අපි ආයුෂ්මත් උපසේන වඞ්ගන්ත පුත්‍රලවා පාචිත්තිය දෙශනා කරවන්නෙමියි කියයි. ඉක්බිති ආයුෂ්මත් උපසේන වඞ්ගන්ත පුත්‍රතෙම පිරිස් සහිතව අස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ ප්‍රදක්ෂිණාකොට ගියේය. ඉක්බිති ඒ භික්ෂූහු ආයුෂ්මත් උපසේන වඞ්ගන්ත පුත්‍රව" ඇවැත්නි (iii) උපසේනය, ඔබ සැවැත් නුවර භික්ෂූන්ගේ කතිකා දන්නෙහිදයි" (ii) ඇසූහුය. "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේද මගෙන් (මෙහි 23 (ii) ඇවැත්නි, භාග්‍ය-වතුන් වහන්සේ විසින් යම් ඒ ආරණ්‍යකයෝ වෙත්ද, පිණ්ඩපාතිකයෝ වෙත්ද, පාංශුකූලිකයෝවෙත්ද කැමතියේ මාදකිමට පැමිණෙන්ටවාහී අනුදන්නාලදී.'

25 ඉක්බිති ඒ භික්ෂූහු ආයුෂ්මත් උපසේන තෙරුන් ඇත්තක් කීහ. නොපැනවූවක් නොපැනවිය යුතුයි. පැනවූ මක් නොසැඳිය යුතුයි. පැනවූ ශික්ෂාපද සමාදන්ව පැවතිය යුතුයි කියායි 'භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ විසින් යම ඒ භික්ෂු කෙනෙක් ආරණ්‍යකවූවාහුද පිණ්ඩපාතිකවූවාහුද, පාංශුකූලිකවූවාහුද ඔවුනු සුවසේ මා දැකීමට පැමිණෙත්වායි. අවසරදුන්සේලු ඔව්හු භාග්‍යවතුන් වහන්සේ දැකීමට ආශා කරන්නාහු ඇතිරි අත්හැරදමා ආරණ්‍යකාඞ්ගය, පිණ්ඩ-පාතිකාඞ්ගය, පාංශුකූලිකාඞ්ගය සමාදන්වූහ

26 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බොහෝ භික්ෂූන් සමග සෙනසුන්වල ඇවිදීමෙහි යන්නාහු ඒ ඒ තැන්වල දමූ ඇතිරිලි දුටුසේක. දූත මහණෙනි, මේ තැනින් තැන දමූ ඇතිරිලි කාගේදැයි භික්ෂූන්ගෙන් ඇසූසේක. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ සිද්ධියෙහි දැහැමි කථාකොට භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. "මහ-ණෙනි, එසේවීනම් භික්ෂූන්ට ප්‍රයොජන දසයක් බලා-පොරොත්තුවෙන් (මෙහි 1 පාරාජිකාවේ සුදින්න බණවරේ 32 ඡේදය) "මහණෙනි, මෙසේද එකාහි මේ ශික්ෂාපදය උදෙසව්.

27 "හිදිනා ඇතිරියක් කරවන්නාවූ භික්ෂුව විසින් මනාහි දුර්වර්ණ කිරීමට පැරණි ඇතිරියේ හාත්පසින් සුගත් වියතක් ගතයුතු. මහණතෙම ඉදින් පැරණි ඇතිරියේ හාත්පසින් සුගත් වියතක් පමණ තැන් නොගෙන අලුත් හිදිනා ඇතිරියක් කරවන්නේ නම් නිස්සග්ගි පචිත්තියෙව්

28 "නිසීදන" නම් දාවලු ඇති එකක් කියනු ලැබේ. 'ඇතිරිය' නම් අතුරා කරණ ලද්දේවේ. 'විසා නොකරණ ලද්දේය කරවන්නහු විසින්' යනු කරන්නේ හෝ කරවන්නේ හෝයි. "පැරණි ඇතිරිය" නම් වරක් ඇන්දවූද වරක් පෙරෙව්වාවූද යනුයි. "හාත්පසින් දුර්වර්ණකිරීම පිණිස සුගත් වියතක් ගතයුතුය." යනු ස්ථිරභාවය පිණිස මඬලකොට හෝ සිවුරුන්

නොව හෝ සිද එක් ප්‍රදෙශයක හෝ ඇතිරිය යුතුයි. අවුල් හැර හෝ ඇතිරියයුතුයි "ඉදින් මහණ පැරණි ඇතිරියෙන් හාත්පස සුගත් වියතක් නොගෙන" යනු පැරණි ඇතිරියෙන් හාත්පසින් සුගත් වියතක් නොගෙන අළුත් සිදිනා ඇතිරි-යක් කරන්නේ හෝ කරවන්නේ හෝ ක්‍රියාවෙහි දුකුලා වේ. ලැබීමෙන් නිසගිවේ.

29 සඞ්ඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයකුට හෝ හැර දියයුතුයි මහණෙනි, මෙසේද වනාහි හැරදියයුතුයි "ස්වාමීනි, මගේ මේ සිදිනා ඇතිරිය පැරණි ඇතිරියේ හාත්පසින් සුගත් වියතක් නොගෙන කරවන ලද්දේය නිසගිවිය. මම මේය සඞ්ඝයාට හැරදෙමි. දෙන්නේය, දෙන්නාහුය, ආයුෂ්මතුන්ට දෙමියි කියායි. පැරණි ඇතිරියේ හාත්පසින් සුගත් වියතක් නොගෙන කරයිද, නොලබන්නේ ඉතා ස්වල්පයක් ගෙනකරයිද, නොලබන්නේ නොගෙනකරයිද්, අනුන් විසින් කරණ ලද්දක් ලැබ පරිභොග කරයිද, වියනක් හෝ බුමුතුරණක් හෝ රෙදි පවුරක් හෝ ගුදිරියක් හෝ මෙට්ටයක් හෝ කරයිද, උමතුවූවහුට මුලින් වැරැද්දකළහුට ඇවැත් නොවේ.

---

## 6 එළක ලොම ශික්ෂාපදය

30 (මෙහි 1 අතියතයේ (i) එකල්හි වනාහී කොසොල්රටින් සැවැත්නුවරට යන්නාවූ එක්තරා භික්ෂුවක්හට අතරමගදී බැටළුලොම්* ලැබුනාහුය ඉක්බිති ඒ භික්ෂූ ඒ බැටළුලොම් අඳනයෙන් පොදියක් බැඳගෙනගියේය මිනිස්සු ඒ භික්ෂුව දැක කවටකම් කළහ. 'ස්වාමීනි ඔබ කීයකට ගත්තෙහිද, කොපමණක් ලාභ සිටීදැයි" කීයායි ඒ මිනිසුන් විසින් ඒ භික්ෂූවට කවටකම් කරණු ලබන්නේ ලජ්ජාවූයේය ඉක්බිති ඒ භික්ෂූතෙම සැවැත්නුවරට ගොස් ඒ බැටළුලොම් සිටියේම අත හැරියේය. භික්ෂූහු ඒ භික්ෂූවට "ඇවැත්නි, තෙපි කුමක් හෙයින් මේ බැටළු ලොම් සිටියේම අතහැරියේදැයි" ඇසූහ. "ඇවැත්නි, ඒ

---

* අනෙක් මෙය "එළලොම" කියා යොදති.

එසේමය. ඇවැත්නි, මම මේ බැටළුලොම් නිසා මනුෂ්‍යයන් අතින් කවටකම් ලද්දෙමියි' කීයේය. "ඇවැත්නි, ඔබ කොතෙක් දුර සිට මේ බැටළුලොම් ගෙන එව්දැයි" ඇසූහ. "ඇවැත්නි, තුන්යොදුනකට වඩා ඈත සිටය"

31 යම් ඒ භික්ෂු කෙනෙක් අල්පෙච්ඡවූවාහුද ඔව්හු දොස් කියත්. නොසතුට ප්‍රකාශ කරත්. නොසතුටු බස් කියත්. "භික්ෂූහු කෙසේනම් තුන් යොදුනකටත් වඩා බැටළුලොම් ගෙන එත්ද?" ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළාහුය. "මහණ, ඔබ තුන්යොදුනකටත් වඩා බැටළුලොම් ගෙන එයි යනු ඇත්තදැයි" ඇසූසේක. "භාග්‍ය-වතුන් වහන්ස, ඇත්තය." භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළසේක. "හිස් පුරුෂය, තෝ කෙසේනම් තුන්යොදුනකටත් වඩා බැටළුලොම් ගෙනඑත්ද? හිස් පුරුෂය, මෙය (මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v)) මහණෙනි, මෙසේද වනාහි මේ ශික්ෂාපදය දෙශනාකරව්.

32 "දීර්ඝ මාර්ගයට පිළිපන්නාවූ භික්ෂුහට වනාහි බැටළු ලොම් ලැබුනාහුනම් කැමතිමත්තාවූ භික්ෂුව විසින් පිළිගත යුත්තාන පිළිගෙන ගෙනයන්නෙකු නැතිකල්හි තුන් යොදුනක් පමණ කොට ඇති තැන් සියතින් ගෙනයා යුත්තාන. ඒ තුන් යොදුනක් පමණ තැනින් මත්තෙහි ඉදින් ගෙන යන්නෙකු නැති කල්හිත් ගෙනයේනම් නිසගි පචිතිවේ."

33 "දීර්ඝ මාර්ගයට පිළිපන් භික්ෂුව වනාහි" යනු මාර්ගයෙහි යන්නාවූ යනුයි. "බැටළුලොම් ලැබෙන්නේ න " යනු සංඝයාගෙන් හෝ ගණයාගෙන් හෝ නෑයාගෙන් හෝ මිත්‍රයාගෙන් හෝ පාංශුකූල වශයෙන් හෝ තමාගේ ධනයෙන් හෝයි. "කැමතිමත්තහු විසින්" යනු බලාපොරොත්තු ඇති හු විසින් යනුයි. "ගතයුත්තාන ගෙන තුන් යොදුනක් ප ණ තැන් සියතින් ගෙනයා යුතුය' යනු තුන් යොදුන් ප්‍රමාණය සියතින් ගෙනයායුතුය. "ගෙනයන්නෙක් නැතිකල්හි" යනු අනික් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ගිහියෙක් හෝ පැවිද්දෙක් හෝ කිසියම් ගෙනයන්නෙක් නැත්තේ වේද යනු .

ගෙනයන්නෙක් නැතිකල්හි ඊටත් වඩා ඇත ගෙනයන්නේය’ යනු ප්‍රථමපාදය තුන්යොදුනක් ඉක්මවයිද දුකුළා ඇවැත්වේ. දෙවෙනිපාදය ඉක්මවයිද නිසගිවේ. තුන් යොදුන ඇතුළත සිටියේ තුන් යොදුනෙන් පිට හෙළයිද නිසගි පචිතිවේ. අනිකෙකුගේ යානයෙක හෝ බඩු අතර හෝ නොදැනුවත්ව දමා තුන් යොදුන ඉක්මවයිද නිසගිවේ. සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට හාරදිය යුතුය.

34 “මහණෙනි, මෙසේද වනාහි හාරදිය යුතුය. “ස්වාමීනි, මගේ මේ බැටළු ලොම් තුන්යොදුන ඉක්මවූවාහුය. නිසගිවූහ, මම මේවා සංඝයාට හාරදෙමියි කියාද දෙන්නේය කියාද දෙන්නාහුය කියාද ආයුෂ්මතුන්ට දෙමි කියාද දිය යුතුය. තුන් යොදුනට වැඩියෙහි වැඩිය යන හැඟීම් ඇත්තේ ඉක්මවයිද, නිසගිපචිතිවේ. තුන් යොදුනට වැඩියෙහි විමති ඇත්තේ ඉක්මවයිද නිසගිපචිතිවේ. තුන් යොදුනට වැඩියෙහි අඩුය යන හැඟීම් ඇත්තේ ඉක්මවයිද නිසගිපචිතිවේ. තුන්යොදුනට අඩුයෙහි වැඩිය යන හැඟීම් ඇත්තේ දුකුළා ඇවැත්වේ. තුන් යොදුනට අඩුවෙහි විමති ඇත්තේ දුකුළා ඇවැත්වේ. අඩු තුන්යොදුනෙහි අඩුය යන හැඟීම් ඇත්තේ ඇවැත් නොවේ.

35 ‘තුන්යොදුනක් ගෙනයයිද තුන්යොදුනට අඩුවෙන් ගෙනයයිද, තුන් යොදුනක් ගෙනයයිද ගෙනඑයිද තුන් යොදුනක් විසීමට අදහසින් ගොස් ඉන් ඔබ්බට ගෙනයාද සොරකම් කළ දෙයක් සොරුන්ගෙන් ලැබගෙනයයිද, බැහැර ලූවක් ලැබ ගෙනයයිද, කළ බඩුවක් ගෙනයයිද, උමතුවූවහුට ආදිකර්මිකයාට ඇවැත් නොවේ ”

---

## 7 එළක ලොම ධොවන ශික්ෂාපදය

36 එකල්හි වනාහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත් නුවර නිග්‍රොධාරාමයෙහි වාසය කරණසේක. එකල්හි වනාහි “ෂඩ්වග භික්ෂූහු” භික්ෂුණීන් ලවා (ii) බැටළු ලොම් සෝදවත්, පාට පොවත්, අවුල්

හරමින්, බැමඑලොම සෝදන්නාවූ, පාට පොවන්නාවූ, අවුල් හරින්නාවූ, භික්ෂුණීහු පෙලන්නිම, අජ්ඣ විචාරීම, අධිශීලය අධිචිත්තය, අධි ප්‍රඥාව, හිස් කරත් (iii) ඉක්බිති මහා ප්‍රජාපතී ගොතමී තොමෝ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියාය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියාය. එකත්පසෙක සිටි මහා ප්‍රජාපතී ගොතමීව භාග්‍යවතුන් වහන්සේ "ගොතමිය, කිමෙක්ද? භික්ෂුණීහු අප්‍රමාදවූවාහු කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව කාය ජීවිත නිරපෙක්‍ෂව වාසය කරත්දැයි" ඇසුවාහ. "ස්වාමීනි, භික්ෂුණීන්ගේ වීර්‍ය්‍යයක් කොයින්ද? ආර්‍ය්‍යවූ ෂවග භික්ෂූහු භික්ෂුණීන් ලවා බැටඑලොම සෝදවත්. පාට පොවත්, අවුල් හරවත් (මෙහි (ii) )

37 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මහා ප්‍රජාපතී ගොතමිය දැහැමි කථාවෙන් හෙතු උදාහරණ දක්වූසේක සමාදන් කරවූසේක. තෙදගැන්වූහ, සතුටු කළහ. ඉක්බිති මහා ප්‍රජාපතී ගොතමී තොමෝ භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කථාවෙන් කරුණු සහිතව පෙන්වන ලද්දී. සමාදන් කරවන ලද්දී, තෙදගන්වන ලද්දී. සතුටු කරණ ලද්දී. භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට ගියාය.

38 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ සිද්ධියෙහි භික්ෂු සඞ්ඝයා රැස්කරවා ෂවග භික්ෂූන් ගෙන් විචාළසේක "මහණෙනි, තෙපි භික්ෂුණීන් ලවා (ii) බැට්එලොම සෝදවන්නහුද, පාට පොවන්නහුද, අවුල් හරින්නහුදැයි" (iii) ඇසූහ. "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය" "මහණෙනි, තොපගේ නෑයෝද නොනෑයෝදැයි" ඇසූහ. 'භාග්‍යවතුන් වහන්ස, නොනෑයෝයයි' කීහ. "හිස් පුරුෂයෙනි, නොනෑයෝ නොනෑයන්ගේ සුදුස්ස හෝ නුසුදුස්ස හෝ පැහැදීම නොපැහැදීම හෝ නොදනිත්. හිස් පුරුෂයෙනි, තොපි එහි නොනෑ භික්ෂුණීන් ලවා (මෙහි (ii) ) හිස් පුරුෂයෙනි, මෙය නොපැහැදුනවුන්ගේ (මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v) )

39 "යම් මෙහෙණක් තොමෝ වනාහි නොනෑ මෙහෙණක් ලවා පැරණිවූ සිවුරක් සෝදවා නම් හෝ පාට කරවා නම් හෝ ගස්සවා නම් හෝ නිසගි පචිතිවේ

40 ("යම්බඳු යනු භික්ෂු යනු 1 පාරාජිකයේ පද භාජනීයේ 1–2) "නොනෑ නම්" මව්පසින් හෝ පියපසින් හෝ සත් වැනිවූ පිය මුතු පරම්පරාවෙන් නොපැමිණි යනුයි. "භික්ෂුණිය නම්" දෙපැදැරුම් සංඝයා අතර උපසම්පන්න වූවාහුය. සෝදවයි අණකරයිද දුකුලා ඇවැත්වේ. සේදවූ කල්හි නිසගි වෙත්. පාට පොවවයි, අණකරයිද දුකුලා ඇවැත්වේ. පාට පොවන ලද්දහු නිසගිවෙත්. අවුල්හරවයි අණකරමයිද දුකුලා ඇවැත් වේ. අවුල්හැර වූවාහු නිසගිවෙත්. සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට හෝ භාරදිය යුතුය.

41 "මෙහෙණනි, මෙසේද වනාහි අත්හළ යුතුය "ස්වාමිනි, මේ බැමිළෙලෝම නොනෑ භික්ෂුණියක් ලවා සෝද වන ලද්දක. නිසගි වූවාහුය. මම මෙය සංඝයාට භාරදෙමියි කියාද දෙන්නේය කියාද දෙන්නාහුය කියාද ආයුෂ්මතුන්ට දෙමියි කියාද දියයුතුයි."

42 (i) නොනෑයෙකු යන හැඟීම් ඇතිව නොනෑවූවක් ලවා බැමිළ ලොම සෝදවයිද (ii) නිසගි පචිතිවේ. (මෙහි (i) පාට පොවමයිද නිසගිය හා දුකුලා ඇවැත්වේ (මෙහි (i) අවුල්හරවයිද නිසගි හා දුකුලා ඇවැත්වේ. (මෙහි (i) ) පාට කරවයිද. අවුල් හරවයිද නිසගිය හා දුකුලා ඇවැත් දෙකක් වේ. (iii) නොනෑයෙක යන හැඟීම් ඇතිව නොනෑවූවෙකු ලවා බැමිළලොම (iv) පාට කරවයිද නිසගි පචිතිවේ පාට කර වයිද, අවුල්හරවයිද නිසගිය හා දුකුලා ඇවැත්වේ. (මෙහි(iii) පාට කරවයිද සෝදවයිද නිසගිය සමග දුකුලා ඇවැත්වේ. (මෙහි (iii) )පාට කරවයිද, අවුල්හරිද, සෝදවයිද නිසගිය හා දුකුලා ඇවැත් දෙකක් වේ (මෙහි (iii) )අවුල් හරවයිද නිසගි පචිතිවේ (මෙහි (iii) අවුල් හරවයිද සෝදවයිද නිසගිය හා දුකුලා ඇවැත්වේ. (මෙහි (iii) ) අවුල් හරවයිද පාට කරවයිද නිසගිය හා දුකුලා ඇවැත්වේ. (මෙහි (iii) ) අවුල් හරවාද අවුල් හරවයිද සෝදවයිද පාට කරවයිද නිසගිය හා දුකුලා ඇවැත් දෙකක් වේ.

43 (මෙහි 42 ඡේදය සේදීමේදී 'හැඟීම' වෙනුවට 'විමති' යොදන්න)

44 (මෙහි 42 ඡේදයේ 'බැටළුලොම්' වෙනුවට "අනිකෙකුගේ බැටළුලොම්" යෙදිය යුතුයි.) සෝදවයිද දුකුලා ඇවැත්වේ. එතම උපසම්පන්නවූවක ලවා සෝදවයිද දුකුලා ඇවැත්වේ. නොනෑවූමක යන හැඟීම් ඇතිව නෑවූමක ලවා සෝදවයිද දුකුලා ඇවැත්වේ.

45 "නෑවූවක කෙරෙහි විමති ඇත්තේ දුකුලා ඇවැත් වේ. නෑවූවක කෙරෙහි නෑයෙක යන හැඟී ඇත්තේ ඇවැත් නොවේ. නෑයෙකු ලවා සෝදවන කල්හි නොනෑවූවක් දෙවැන්නිය වේද, නොකියනු ලබන්නී සෝදයිද පරිභෝග නොකරණ ඔැටළු ලොම්න් කළ කම්බිලි ආදී බඩුවක් සෝදවයිද ශික්ෂමානාවට සාමණේරියට උම්තුවූවහුට මුලින්ම වැරද්ද කළහුට ඇවැත් නොවේ."

---

## 8 රූපිය ශික්ෂාපදය

46 එකල්හි වනාහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ රජගහනුවර ලෙහෙනුන්ට බත් මැටුප් දුන් වෙළුවනයෙහි වාසය කරණසේක. එකල්හි වනාහි ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍රතෙම රජගහනුවර එක්තරා කුලයකට කුලුපග වූයේවේ. නිති දන් ගන්නේවේ. ඒ ගෘහයෙහි'ය කෑයුතු දෙයක් හෝ බුදියයුතු දෙයක් උපදීද, ඉන් ආයුෂ්මත් උපනන්ද තෙරුන්ගේ කොටස වෙයි. එකල්හි කායි ඒ ගෘහයට සවස මසක් ලැබුනේය. ඉන් ආයුෂ්මත් උපනන්දයන්ගේ කොටස තැබුයේවේ. ඒ ගෙයි දරුවෙක් රාත්‍රියෙහි අළුය වේලෙහි නැගිට හඬයි. මට මස් දෙවයි කියායි. ඉක්බිති ඒ පුරුෂතෙම භාර්‍යාවට "ආර්‍යයන් වහන්සේගේ කොටස දරුවාට දෙව. අන්මසක් මිලදී ගෙන ආර්‍යයන් වහන්සේට දෙමුයි" කීයේය.

47 ඉක්බිති ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍රතෙම පෙර වරුවේලෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරුගෙන ඒ ගෘහය ය

තැනෙකහිද එහි පැමිණියේය. පැමිණ පැනවූ අස්නෙහි වැඩහුන්සේක. ඉක්බිති ඒ පුරුෂතෙම ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍රතෙම යම් තැනෙකහිද එහි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍රයා වැඳ එකත් පසෙක සිටියේය. එකත්පසෙක සිටි ඒ පුරුෂතෙම ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රට "ස්වාමීනි, ඊයේ සමස මසක් ලැබුනේ වේ. ඉන් ආර්යයන් වහන්සේගේ කොටස තබනලදී. ස්වාමීනි, මේ දරුතෙම රාත්‍රියෙහි අළුයම් වේලෙහි නැගිට හඬයි. මටමස් දෙම කියායි. ආර්යයන් වහන්සේගේ කොටස දරුවාට දෙනලදී. ස්වාමීනි, කෙසේද? 'කහවණුවක් ගෙනෙවායි'' කීයේය, "ඇවැත්නි, මට කහවණුවක් පරිත්‍යාග කෙළෙහිදැයි" ඇසීය. "ඇවැත්නි, මට ඒ කහවනුවම් දෙමයි" කීයේය.

48 ඉක්බිති ඒ පුරුෂතෙම ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍රට කහවණුවක්දී දොස් කියයි. නොසතුට ප්‍රකාශ කරයි. නොසතුටු වචන කියයි. "අපි යම්සේ රිදී(මුදල්)පිළිගණ්නෙමුද, එසේ මේ ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ රිදී (මුදල්) පිළිගනිත්යයි" කියායි. භික්ෂුහු දොස් කියන්නාවූ නොසතුටු වචන කියන්නාවූ නොසතුට ප්‍රකාශ කරන්නාවූ ඒ පුරුෂයාගේ වචන ඇසූහ යම් ඒ භික්ෂු කෙනෙක් අල්පෙච්ඡ වූවාහුද ඔව්හු දොස් කියත්. නොසතුට ප්‍රකාශ කරත්. නොසතුටු වචන කියත්. "කෙසේ නම් ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර තෙමේ රිදී (මුදල්) පිළිගන්නේදැයි" කියායි.

49 ඉක්බිති ඒ භික්ෂුහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. "උපනන්ද ඔබ රිදී (මුදල්) පිළිගත්තෙහි ඇත්තදැයි" ඇසූසේක. "භාග්‍යවතුන්වහන්ස, ඇත්තය" භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළසේක. හිස් පුරුෂය, කෙසේ නම් ඔබ රිදී පිළිගත්තෙහිද? හිස් පුරුෂය, මෙය අප්‍රසන්නවූවන්ගේ (මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v) )

50 "යම් මහණෙක්තෙම රන්රිදී මිසුකහවණු ගන්නේ නම් හෝ ගන්වානම් හෝ එළවා තබන (ලගට පමුණුවන) ලද්දක් ඉවසන්නේ නම් හෝ නිසගි පචිතිවේ."

51 "යමෙක් නෑසී" යනු භික්ෂූහු (මෙහි 1 පාරාජිකයේ පදභාජනීයේ 1–2 ඡේද) "රන" නම් තථාගතයන්ගේ ශරීරයේ පාට ඇති ලෝහයෙන් කළ කාසියි "රිදී" නම් කහවනු. තඹ කාසි, ලීකා, කොළවල රූපයෙහිද කළකාසි ඊයම්කාසි. ආදී යමක් ව්‍යවහාරයට යෙත්ද ඒවාය "ගණ්හේ නම් හෝ" යනු තෙමේ ගනීද, නිසගි පචිතිවේ. අනිකෙකු ලවාගන්වයිද නිසගි පචිතිවේ. "දුමු දෙයක් ඉවසයිද" යනු මෙය ආයුෂ්මතුන් වහන්සේට වේවයි. දක්නා ලද්දක් හෝ ඉවසයිද, නිසගිවේ. සංඝයා මැද අත්හළයුතුයි

52 "මහණෙනි, මෙසේ ඒ කාසි අත්හළයුතුයි. ඒ භික්ෂුව විසින් සංඝයා වෙත එළඹ උතුරු සළුව ඒකාංශකොට වැසී මහළු භික්ෂූන්ගේ පාවැද උක්කුටිකයෙන්ද හිඳ ඇඳිලිබැඳ මෙසේ කියයුතු වන්නේය. "ස්වාමිනි, මම රිදී පිළිගතිමි. මට මෙය නිසගියය. මම මෙය සංඝයාට දෙමියි." හැරදී ඇවැත් දෙසියයුතුයි. ව්‍යක්ත දක්ෂ භික්ෂුවක් විසින් ඇවත පිළිගත යුතුයි. ඉදින් එහි ආරාමිකයෙක් හෝ උපාසකයෙක් හෝ වේද, හෙතෙම "ඇවැත්නි, මේව කාරණදෙයක් දනුමවයි." කිය යුතුය. ඉදින් ඔහු "මින් කුමක් ගෙනෙම්දැයි" අසයිද "මෙය මෙය ගෙනෙවයි" නොකිව යුතුය. "කැපවූ ගිතෙල් හෝ තල තෙල් හෝ මී හෝ මීපැණි හෝ" කිවයුතුයි. ඉදින් හෙතෙම ඒ කාසිවලට මාරුකොට කැපදෙයක් ගෙනේද රිදී පිළිගත්තනු හැර සියල්ලෝම පරිභෝග කළයුතුයි මෙසේ ලැබූ නම යහපති නොලැබේ නම් හෙතෙම 'ඇවැත්නි, මෙය ඉවත් කර ළයිද' කිවයුතුය

53 "ඉදින් හෙතෙම ඉවත්කරයිද එය යහපත්ය ඉවත් නොකරයි නම් කරුණු පසකින් යුක්තවූ මහණෙකු කාසි ඉවත්කරන්නෙකු වශයෙන් සම්මතකළයුතුයි. යමෙක් ඡන්දයෙන් අගතියට නොයයිද, ද්වේෂයෙන් අගතියට නොයයිද, මෝහයෙන් අගතියට නොයයිද, භයෙන් අගතියට නොයයිද ඉවත්කළ නොකළ බව දනීද යන පසයි. මහණෙනි, මෙසේද වනාහී සම්මත කළයුතුය. පළමුවෙනුව භික්ෂුව යාච්ඤාකළ යුතුය යාච්ඤාකොට ව්‍යක්තවූ දක්ෂ භික්ෂුවක විසින් සංඝයාට

දැන්වියයුතුය. 'ස්වාමීනි, සංඝතෙම මා කියන්නක් අසාවා. ඉදින් සංඝයාට පැමිණිකල් ඇත්තේ නම්, සංඝතෙම මේනම් භික්ෂුව කාසි ඉවත්කරන්නෙකු කොට සම්මතකරන්නේය.'' මේ දැන්වීමයි 'ස්වාමීනි සංඝ තෙමේ මා කියන්නක් අසාවා, සංඝ තෙමේ මේනම් භික්ෂුව කාසි ඉවත් කරන්නෙකු කොට සම්මතකරයි. මේනම් භික්ෂුවට කාසි ඉවත්කරණ සම්මුතිය යම් ආයුෂ්මතුන් කෙනෙකුට රුචිවේද, හෙතෙම නිශ්ශබ්ද වන්නේය. යමෙකුට රුචි නොවන්නේද හෙතෙම කියන්නේය. සංඝයා විසින් මේනම් භික්ෂුව කාසි ඉවත්කරන්නෙකු කොට සම්මතකරනලදී. සංඝයාට රුචිවෙයි. එහෙයින් නිශ්ශබ්දය. මේ සම්මතය මෙසේ දරමි. ඒ සම්මත කළ භික්ෂුව විසින් ලකුණු සිහිනොකර හෙළියයුතුයි.

54 ''ඉදින් ලකුණක්කර හෙළුයේ නම් දුකුලා ඇවැත් වේ. කාසියෙහි කාසියක හැඟීම් ඇතිව පිළිගනීද නිසගි පචිතිවේ. කාසියෙහි විමති ඇත්තේ කාසි පිළිගනීද, නිසගි පචිතිවේ. කාසියෙහි කාසිනොවේය යන හැඟීම් ඇතිව කාසි පිළිගනීද නිසගි පචිතිවේ. කාසිනොවූයෙහි කාසිය යන හැඟීම් ඇත්තේ දුකුලා ඇවැත්වේ. කාසිනොවූයෙහි සැක ඇත්තේ දුකුලා ඇවැත්වේ. කාසිනොවූයෙහි කාසිය යන හැඟීම් ඇත්තේ ඇවැත් නොවේ. ආරාමයෙහි ඇතුළත හෝ ආවාසය ඇතුළත හෝ ගෙන හෝ ගෙන්වාගෙන හෝ බහා-තබයිද යමෙක් ඔහුගේ නම් ඔහු ගනීවායි කියායි. උමතුවූවහුට, මුලින් වැරැද්ද කළහුට ඇවැත් නොවේ.''

---

## 9 රූපිය සංවොහාර ශික්ෂාපදය

55 (මෙහි 1 අනියතයේ 1(i)) එකල්හි ඡබ්බග්ගිය භික්ෂූහු නානාප්‍රකාරවූ රන්රිදී මසුකහවණු ගනුදෙනුවට පැමිණෙත්. මිනිස්සු (ii) දොස් කියත්. නොසතුට ප්‍රකාශ කරත්. නොසතුටු වචන කියත්. 'කෙසේ නම් ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ ගිහීන්මෙන් නානාප්‍රකාරවූ රන්රිදී මසුකහවණු ගනුදෙනුවට පැමිණෙත්දැයි' කියාය. (iii) යම් ඒ භික්ෂු කෙනෙක්

අල්පෙච්ඡවූවහුද ඔව්හු (මෙහි (ii)) ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. "මහණෙනි, (iv) තෙපි නානාප්‍රකාරවූ රන්රිදී මසුකහවණු ගණුදෙනුවට (v) පැමිණියාහු ඇත්තද?" "භාග්‍යවතුන් වහන්ස ඇත්තය" භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ ගර්හා කළසේක. හිස් පුරුෂයෙනි, (මෙහි (iv)) පැමිණියහුද (මෙහි 1 පාරාජිකයේ සුදින්න ඛණ්ඩයේ 30 (v))

56 "යම්කිසි භික්ෂුවක් අනේකප්‍රකාරවූ රන්රිදී මසුකහවණු ගණුදෙනුවට පැමිණියේ නම් නිස්සගි පචිත්තිවේ."

57 "යමෙක් වනාහි" යනු භික්ෂු යනු (මෙහි 1 පාරාජිකයේ පදභාජනියේ 1-2) 'නොයෙක් ආකාර" නම් කරණලද්දදුවූද නොකරණ ලද්දදුවූද, කළ නොකළාවූදවේ. "කළේ" නම් හිසට ගැළපෙනයේ, බෙල්ලට ගැලපෙනයේ අතට ගැලපෙනයේ පයට ගැලපෙනයේ ඉගටියට ගැලපෙනයේයි. "නොකරණ ලද්දේ" නම් ආභරණයකට කරමා නැත්තක් කියනු ලැබේ. "කළනොකළ" නම් ඒ දෙකමය. රූපිය නම් ශාස්තෘන්වහන්සේගේ ශරීරයේ වර්ණය ඇති කහවණු, ලෝහකාසි, ලීකාසි, ජතුමාසිය, යම් ව්‍යවහාරයට යේද ඒවායි. "පැමිණෙන්නේය" යනු කළදෙය.

58 කළදෙය මිලදී (ii) ගනීද නිස්සගි පචිත්තිවේ. (iii) ෙ වාක්‍ය අනුව "ගනීද නිස්සගි පචිත්තිවේ" යොදන්න.) කළ දෙය හා නොකළ දෙයක් මිලදී (මෙහි (i)) කළදෙයද කළ දෙය හා නොකළ දෙයක්ද නොකළදෙය හා කළදෙයක් (මෙහි (ii)) නොකළදෙය හා නොකළදෙයක් මිලදී (මෙහි (ii)) නොකළ දෙය හා නොකළ දෙයක් මිලදී (මෙහි (ii)) කළදෙයින් හා නොකළ දෙයින් නොකළදෙයක් මිලදී (මෙහි (ii)) කළදෙයින් හා නොකළදෙයින් කළදෙයක් හා නොකළ දෙයක් පිළිගනීද නිස්සගි පචිත්තිවේ

59 සංඝයා මැද අත්හළ යුතුයි. (ii) මහණෙනි, මෙසේද වනාහි අත්හළ යුතුයි. ඒ භික්ෂුව විසින් සංඝයා වෙත පැමිණ තනිපට සිවුර එකාංශකොට පොරවා, වැඩිමහළු භික්ෂූන්ගේ පා වැඳ උක්කුටුකයෙන් හිඳ ඇඳිලි බැඳ සවාමිති,

මම නොගොසෙක් ප්‍රකාර කාසි ගණුදෙනුවට පැමිණියෙමි මට මෙය නිසග්ගිය. මෙය මම සංඝයාට භාරදෙමියි" (iii) භාරදී ඇවැත් දෙසිය යුතුය. ව්‍යක්තවූ දක්‍ෂ භික්‍ෂුවක් විසින් ඇවත පිළිගත යුතුය. ඉදින් එහි ආරාමිකයෙක් හෝ උපාසකයෙක් හෝ එයිද "ඇවැත්නි, මෙය දනුමැයි" කිවයුතුය. ඉදින් ඔහු "මින් කුමක් ගෙනෙන්නේදැයි" කීකල්හි මෙය හෝ මෙය හෝ ගෙනෙවයි" නොකිවයුතුය. කැපවූවක් කිවයුතුයි. ගිතෙල් හෝ, තලතෙල් හෝ, මීපැණි හෝ උක්පැනි හෝ ඉදින් හෙතෙම ඉන් මාරුකොට කැපවූවක්ගෙන එයිද කාසිගත්තහු අත්හැර සියල්ලන් විසින් පරිභොග කළයුතුය. මෙසේ ලැබේ නම් යහපත. නොලබත්තහු නම් හෙතෙම "ඇවැත්නි, මෙය හැරදමවයි" කිවයුතුය.

60 ඉදින් හෙතෙම හැරදමියි නම් එසේ මැනවි. ඉදින් හැරනොදමාතම් කරුණුපසකින් යුක්තවූ භික්‍ෂුතෙම, කාසි ඉවත දමන්නෙකු කොට සම්මත කළයුතුය. ඡන්දයෙන් අගතියට නොයයිද ද්වේෂයෙන් අගතියට නොයයිද මෝහයෙන් අගතියට නොයයිද භයෙන් අගතියට නොයයිද ඉවත් කළනොකළ දෙය දන්නේද, එබඳු භික්‍ෂුවයි. මහණෙනි, මෙසේද වනාහි සම්මත කළයුතුයි. පළමුමෙතුම භික්‍ෂුව යාච්ඤා කළයුතුය. යාච්ඤාකොට ව්‍යක්ත දක්‍ෂ භික්‍ෂුවක් විසින් සංඝයාට දැන්විය යුතුය. "සංඝ තෙමේ මා කියන්නක් අසාවා. ඉදින් සංඝයාට සංඝතෙමේ මෙනම් භික්‍ෂුව කාසිඉවත් කරන්නෙකුකොට සම්මත කරන්නේය. මේ දැන්වීමයි. සංඝ තෙමේ මා කියන්නක් අසාමී. සංඝතෙමේ මෙනම් භික්‍ෂුව කාසි ඉවත් කරන්නෙකුකොට සම්මතකරයි. මෙනම් භික්‍ෂුව කාසි ඉවත්කරන්නෙකු වශයෙන් සම්මත කිරීම යම් ආයුෂ්මත් කෙනෙකුට රුචිවේද හෙතෙම නිශ්ශබ්ද වන්නේය. යමෙකුට රුචිනොවේ නම් හෙතෙම කියන්නේය. සංඝයා විසින් මෙනම් භික්‍ෂුව කාසි ඉවත් කරන්නෙකුකොට සම්මත කරනලදී සංඝයාට රුචිවෙයි. මෙසේ මේ රුචිබව දරමියි කියායි.

61 "සමමතකල ඒ භික්ෂුව විසින් සංඥා නොකොට හෙළිය යුතුය. ඉදින් සලකුණු කොට හෙලයිද දුකුලා ඇවැත්වේ කාසියෙහි කාසිය යන හැඟීම ඇත්තේ කාසි මිලදීගනීද නිසගි පචිතිවේ. කාසියෙහි විමති ඇත්තේ කාසි ලදී ගනීද නිසගි පචිතිවේ. කාසියෙහි කාසි නොවේය. යන හැඟීම ඇතිව කාසිගනීද නිසගි පචිතිවේ කාසියෙහි කාසි නොවේය. යන හැඟීම් ඇතිව කාසිගනීද නිසගි පචිතිවේ. කාසි නොවන්නෙහි කාසියන හැඟීම ඇත්තේ කාසිගනීද නිසගිවේ. කාසිනොවන්නෙහි විමති ඇත්තේ කාසි මිලදී ගනීද නිසගි පචිතිවේ. කාසිනොවන්නෙහි කාසි නොවේය යන හැඟීම ඇත්තේ කාසිමිලදී ගනීද නිසගි පචිතිවේ. කාසි නොවන්නෙහි කාසිය යන හැඟීම ඇත්තේ දුකුලා ඇවැත් වේ. කාසිනොවන්නෙහි විමති ඇත්තේ දුකුලා ඇවැත්වේ. කාසිනොවන්නෙහි කාසි නොවේය, යන හැඟීම් ඇත්තේ ඇවැත් නොවේ. උමතුවූවහුටද මුලින් මැරැද්ද කළහුටද ඇවැත් නොවේ."

---

## 10 කයවික්කය ශික්ෂාපදය

62 (මෙහි 1 අතිශයේ (i) ) එකල්හි වනාහි ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර තෙමේ සිවුරු වැඩ කිරීමෙහි දක්ෂවූයේ වේ. හෙතෙම දිරූ පටරෙදිවලින් දෙපට සිවුරක් කොට මනාකොට පඬුපොවා, මනාකොට පරිකර්මකොට පෙරවූයේය. ඉක්බිති එක්තරා පරිබ්‍රාජකයෙක් වටිනා වස්ත්‍රයක් පොරවා ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර තෙමේ යම් තැනෙක්හිද, එහි පැමිණ, ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රව "ඇවැත්නි, තොපගේ මේ දෙපට සිවුර යහපත්ය. මගේ වස්ත්‍රයට දෙවයි" කීයේය. "ඇවැත්නි, දනුමයි" කීයේය. "ඇවැත්නි, එසේය දනිමි." "ඇවැත්නි, එසේනම් ගනුමයි" දුන්නේය.

63 ඉක්බිති ඒ පරිබ්‍රාජකතෙම ඒ සඟල සිවුර පොරවා පරිබ්‍රාජකාරාමයට ගියේය. පරිබ්‍රාජකයෝ ඒ පරිබ්‍රාජකයාට "ඇවැත්නි, තොපගේ මේ දෙපට සිවුර යහපත්ය. තොප

විසින් කෙසේ ලද්දහුදැයි" ඇසීය. "ඇවැත්නි, මාගේ ඒ වස්ත්‍රය හා මාරු කළේයයි" කීයේය. "ඇවැත්නි, තොපගේ මේ සඟල සිවුර කී දවසක් පවත්නේද? තොපගේ ඒ වස්ත්‍රයම වටිනේයැයි" කීවාහුය ඉක්බිති ඒ පරිබ්‍රාජකතෙම "පරිබ්‍රාජකයෝ ඇත්තක් කීහ. මාගේ මේ දෙපට සිවුර කීදවසක් පවත්නේද? මාගේ ඒ වස්ත්‍රයම උතුම්යයි" ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනෙකක්හිද එහි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන්ට "ඇවැත්නි, තොපගේ දෙපට සිවුර මෙන්න, මාගේ වස්ත්‍රය දෙවයි" කීයේය. "ඇවැත්නි, මා විසින් තුඹට 'ඇවැත්නි, දනුවයි' කියන ලද්දේ නොවේද? මම නොදෙමියි" කීයේය.

64 ඉක්බිති ඒ පරිබ්‍රාජකතෙම දොස් කියයි. නොසතුට ප්‍රකාශකරයි. නොසතුටු වචන කියයි. "ගිහියෝද පසුතැවිලිවූ ගිහියාට දෙත්" කිමෙක්ද පැවිද්දා පැවිද්දාට නොදෙත්දැයි කියායි. භික්ෂූහු දොස් කියන්නාවූ නොසතුම ප්‍රකාශ කරන—නාවූ නොසතුටුබස් කියන්නාවූ ඒ පරිබ්‍රාජකයාගේ වචන ඇසුවාහුය. යම් ඒ භික්ෂූ කෙනෙක් අල්පෙච්ඡද ඔව්හු දොස් කියත්. නොසතුට ප්‍රකාශකරත්, නොසතුටු බස් කියත්, "කෙසේ නම් ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රතෙමේ පරිබ්‍රාජකයෙකු සමග ගණුදෙනුවට පැමිණෙන්නාහුද?" කියායි.

65 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. "උපනන්දය, ඔබ පරිබ්‍රාජකයෙකු සමග ගණුදෙනුවට පැමිණියේ සතු ඇත්තදැයි" ඇසූසේක. "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය" භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගැරහූසේක. හිස්පුරුෂය, ඔබ කෙසේ නම් පරිබ්‍රාජකයෙකු සමග ගණුදෙනුවට පැමිණෙහිද හිස් පුරුෂයෙනි, මෙය (මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v))

66 "යම්කිසි භික්ෂුවක් නන්වැදෑරුම්වූ ගණුදෙනුවට පැමිණෙන්නේද නිසගි පචිතියේ."

67 "යමෙක් වනාහි" යනු "භික්ෂූ" යනු (මෙහි 1 පාරාජිකයේ පදභාජනියේ 1 – 8) "නන්වැදෑරුම" නම් සිවුරු පිණ්ඩපාත සෙනාසන ගිලන්පස බෙහෙත් පිරි

කරයි. යටත් පිරිසෙයින් සුණු පිඩක්ද දැහැටි කූරක්ද දූවිලු නූලක්ද වේ. “ගණුදෙනුවට පැමිණෙන්නේය” යනු මෙයට මෙය දෙව, මෙයට මෙය ගනුව, මෙයට මෙය මාරු කරව. මෙයට මෙය මිලදී ගනුවයි. මරදවා හැසිරේද දුකුලා ඇවැත්වේ. යම් හෙයකින් මිලදී ගන්නා ලද්දේ වේද, විකුණන ලද්දේ වේද, තමන්ගේ බඩුව අනුන් අතට ගියේද, අනුන්ගේ බඩුව තමන් අතට ගත්තේ වේද, නිසගි වේ. සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට හෝ භාර දිය යුතුයි “ස්වාමීනි මම නොයෙක් ආකාර ගණුදෙනුවට පැමිණියෙමි, මාගේ මෙය නිසගි වූ මෙය මම සඞ්ඝයාට භාරදෙමියි කියාද දෙන්නේය කියාද දුන්නාහුම කියාද ආයුෂ්මතුන්ට දෙමි” කියාද දිය යුතුය.

68 “ගණුදෙනුවෙහි ගණුදෙනු කළේය යන හැඟීම් ඇත්තේ නිසගි පචිති වේ. ගණුදෙනුවෙහි විමති ඇත්තේ නිසගි පචිති වේ. ගණුදෙනුවෙහි ගණුදෙනු නොකෙළේය යන හැඟීම් ඇත්තේද නිසගි පචිතිවේ ගණුදෙනු නොකළ දෙයෙහි ගණුදෙනු කෙළේය යන හැඟීම් ඇත්තේද දුකුලා ඇවැත්වේ. ගණුදෙනු නොකිරීමෙහි සැක ඇත්තේ දුකුලා ඇවැත්වේ, ගණුදෙනු නොකිරීමෙහි ගණුදෙනු නොකෙළේය යන හැඟීම් ඇත්තේ ඇවැත් නොවේ.

“වටිනාකම අසයිද කැපකරුවාට කියයිද ‘මෙය අපට ඇත්තේය. අපටද මෙයින්ද ප්‍රයෝජන ඇත්තේයයි’ කියයිද උමතුවූවහුටද මුලින් වැරැද්ද කළහුටද ඇවැත් නොවේ.”

---

# 3 පත්ත වග්ගය

## 1 පළමුවෙනි පාත්‍ර ශික්ෂාපදය

1 (i) එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේපිඬු මහසිටාණන් විසින් කරවා පූජා කරණ ලද ජේතවනාරාමයේ වාසය කරණ සේක, (ii) එකල්හි වනාහි ඡබ්බග්ගිය භික්ෂූහු බොහෝ පාත්‍ර රැස් කරත්. මනුෂ්‍යයෝ

විහාරවල ඇවිදීමෙහි යෙදුනාහු දැක දොස් කීහ. නොසතුටු ප්‍රකාශ කළාහුය. නොසතුටු බස් කීවාහුය. (iii) "කෙසේ නම් ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ බොහෝ පාත්‍ර රැස් කරන්නාහුදැයි. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ පාත්‍ර වෙළඳාම හෝ කරන්නාහුද භාජන වෙළඳ සැලක් හෝ විවෘත කරන්නාහු දැයි" කීහ. භික්ෂූහු දොස් කියන්නාවූ නොසතුටු ප්‍රකාශ කරන්නාවූ නොසතුටු වචන කියන්නාවූ ඒ මිනිසුන්ගේ බස් ඇසූ යම් භික්ෂු කෙනෙක් අල්පේච්ඡද ඔව්හු දොස් කියත් නොසතුටු ප්‍රකාශ කරත්. නොසතුටු වචන කියත්. කෙසේ නම් ෂඩ්වර්ගීය භික්ෂූහු වැඩි පාත්‍රයක් දරන්නාහුද?" කීහයි.

2 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. "මහණෙනි, තෙපි වැඩි! පාත්‍රයක් දරව්දැ?" "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය" භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කොළේය "හිස් පුරුෂයෙනි, කෙසේ නම් තෙපි වැඩි පාත්‍ර දරන්නාහුද? හිස් පුරුෂයෙනි, මෙය නොපැහැදුන (මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v) )

3 "යම් කිසි භික්ෂුවක් වැඩි පාත්‍රයක් දරා නම් නිස්සග්ගි පචිත්තිවේ" භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේද මෙකී ශික්ෂාපද පනවන ලද්දේවේ.

4 එකල්හි වනාහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට වැඩි පාත්‍රයක් ලැබුනේවේ. ආයුෂ්මත් ආනන්ද තෙමේද ඒ පාත්‍රය ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට දෙනු කැමැත්තේවේ. ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙමේ සාකෙත නුවර වාසය කරයි. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට මේ අදහස්වීය. භාග්‍යවතුන් වහන්සේ විසින් වැඩිපුර පාත්‍ර නොදැරිය යුතුයයි, ශික්ෂාපද පණවන ලදී. මට මේ අතිරේක පාත්‍රයක් ලැබුණේය. මමද මේ පාත්‍රය ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්ට දෙනු කැමැත්තෙමි. ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙමේද සාකෙත නුවර වසයි. කෙසේනම් මා විසින් පිළිපැදිය යුතු දැයි' කීයේයි.

5 ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළේය. "ආනන්දය, කොපමණ කාලයකින් ආයුෂ්මත් ශාරිපුත්‍රතෙමේ

එන්නේ දැයි" ඇසූහ. "භාග්‍යවතුන් වහන්ස, නවවෙනි හෝ දසවෙනි දිනයයි" කීයේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ සිද්ධියෙහි දැහැමි කථාකොට භික්ෂූන් ඇමතූසේක. "මහණෙනි, දසදිනක් සීමාකොට තබා අමතර පාත්‍රයක් පරිභෝග කරන්නට අවසර දෙමි. මහණෙනි, මෙසේද මනාහි මේ ශික්ෂාපදය උදෙසව්

6 "දසදවසක් පරමකොට ඇති කාලයක් අතිරේක පාත්‍රයක් දැරිය යුතුයි. එය ඉක්මවන්නාහට නිස්සගි පචිත්තිවේ.

7 "දස දවසක් සීමාකොට" යනු දස දවසක් ප්‍රමාණ කොට දැරිය යුතුය. "අතිරේක පාත්‍රය" නම් අධිෂ්ඨාන නොකළ භාර නුදුන් පාත්‍රයයි. "පාත්‍රය" නම් පාත්‍ර දෙකකි. ලෝහ පාත්‍රය, මැටි පාත්‍රය යන දෙකයි. පාත්‍ර වර්ග තුනකි. ලොකු පාත්‍රය, මධ්‍යම පාත්‍රය, කුඩා පාත්‍රය කියායි. ලොකු පාත්‍රය සහල් නාළි භාගයක නැලි දෙකක බත් අල්ලයි. (ii) සතරින් කොටසක කැවිලිද, ඊට ගැලපෙන ව්‍යඤ්ජනද අල්ලයි. (iii) මධ්‍යම පාත්‍රය සහල් නැළියක බත් අල්ලයි. (මෙහි (ii) කුඩා පාත්‍රය එක සහල් නැළියක බත් අල්ලයි. (මෙහි (ii) උත්කෘෂ්ට පාත්‍රය පාත්‍රයක් නොවේ. පොඩි පාත්‍රය පාත්‍රයක් නොවේ. එය ඉක්මවන්නාහට නිස්සගිවේ. එකොළොස්වෙනි අරුණෙහි නිස්සගි වේ. සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට හෝ භාරදිය යුතුය.

8 "මහණෙනි මෙසේද මනාහි භාරදිය යුතුය. (ii) ඒ භික්ෂුව විසින් සඞ්ඝයා වෙත පැමිණ තනිපට සිවුර එකාංස කොට පොරවා මැහිමහළු භික්ෂූන්ගේ පා වැඳ උක් කුටුකයෙන් හිඳ ඇඳිලි බැඳ (iii) "ස්වාමීනි මගේ මේ පාත්‍රය දස දවසක් ඉක්මීමෙන් නිස්සගි විය මේය මම සඞ්ඝයාට භාර දෙමියි" කිවයුතුය. භාරදී ඇවැත් දෙසිය යුතුය. දක්ෂ භික්ෂුවක් විසින් ඇවැත් පිළිගත යුතුය. භාරදුන් පාත්‍රය දිය යුතුය.

"සංඝතෙම මා කියන්නක් අසාවා මේ පාත්‍රය මෙනම භික්ෂුවට නිස්සගි විය. සඞ්ඝයාට භාරදෙනලදී ඉදින් සංඝයාට

පැමිණි කල් ඇත්තේ වී නම් සඞ්ඝ තෙමේ මේ පාත්‍රය මෙනම් භික්ෂුවට දෙන්නේය' කියායි. ඒ භික්ෂුව විසින් බොහෝ භික්ෂූන් වෙත පැමිණ තනිපට සිවුර එකාංශකොට පොරවා වැඩි මහළු භික්ෂූන්ගේ පා වැඳ උක්කුටුකයෙන් හිඳ ඇඳිලිබැඳ "ස්වාමීනි (ii) මාගේ මේ පාත්‍රය දස දවස ඉක්මියේය. නිස්සගි වියෙ. මෙය මම ආයුෂ්මතුන්ට හරදෙමියි කියයුතුය. (iii) හරදී ඇවැත් දෙසිය යුත්තේය. ව්‍යක්ත දක්ෂ භික්ෂුවක් විසින් ඇවැත පිළිගත යුතුය. නිස්සගිවූ පාත්‍රය දිය යුත්තේය. "ආයුෂ්මත්හු මාගේ වචනය අසත්වා. මේ පාත්‍රය මේ නම් භික්ෂුවට නිස්සගි වූයේ, ආයුෂ්මත්වරුන්ට හර වියෙ. යම් කලෙක ආයුෂ්මතුන්ට පැමිණි කල් ඇත්තේ වී නම් ආයුෂ්මත්හු මේ පාත්‍රය මෙනම් භික්ෂුවට දෙන්නාහුයි' කියායි.

9 ඒ භික්ෂුව විසින් එක් භික්ෂුවක් වෙත පැමිණ තනිපට සිවුර ඒකාංශකොට උක්කුටුකයෙන් හිඳ ඇඳිලිබැඳ 'ඇවැත්නි, (මෙහි 8 (ii)) හරදී ඇවැත් දෙසිය යුතුය. ඒ භික්ෂුව විසින් ඇවැත් පිළිගත යුතුයි. නිස්සගිවූ මේ පාත්‍රය ආයුෂ්මතුන්ට දෙමියි දිය යුතුයි. දසදවස ඉක්මුණු කල්හි ඉක්මුණේය යන හැඟීම් ඇත්තේ නිස්සගි පචිති වේ. දසදවස ඉක්මීමෙහි විමති ඇත්තේ නිස්සගි පචිති වේ, දස දවස ඉක්මුණු කල්හි නොඉක්මුණේය යන හැඟීම් ඇත්තේ නිස්සගි පචිති වේ, අධිෂ්ඨාන නොකළෙහි අධිෂ්ඨාන කෙළේය යන හැඟීම් ඇත්තේ නිස්සගි පචිති වේ, හරනොදීමෙහි හර දුන්නේය, යන හැඟීම් ඇත්තේ නිස්සගි පචිති වේ, හැර නොදැමූමෙහි හැරදැමූයේවේය යන අදහස් ඇත්තේ නිස්සගි පචිති වේ, නැතිනොවූ කල්හි නැතිවූයේය යන අදහස් ඇත්තේ නිස්සගි පචිති වේ, විනාශ නොවූ කල විනාශවූයේය යන අදහස් ඇත්තේ නිස්සගි පචිති වේ, නොබිඳුනු කල්හි බිඳුණේය යන හැඟීම් ඇත්තේ නිස්සගි පචිති වෙ, පැහැර නොගැනීමෙහි පැහැරගත්තේය යන හැඟීම් ඇත්තේ නිස්සගි පචිති වේ. පාත්‍රය හරනොදී පරිභොග කරයිද දුකුළා ඇවැත්වේ. දසදවස ඉක්මුණු කල්හි ඉක්මුණේය යන හැඟීම් ඇති කල්හි දුකුළා ඇවැත්වේ. දසදවස නොඉක්මවූ කල්හි නොඉක්මවූයේය යන හැඟීම් ඇත්තේ ඇවැත් නොවේ.

10 "දසදවස අතරෙහි අධිෂ්ඨාන කරයිද හැරදෙයිද අත්හරීද, නැසේද, වැනසේද, බිඳේද, පැහැරගෙන ගනිත්ද විශ්වාසකමට ගනීද, උමතුවූවහුටද මුලින් වැරැද්ද කළහුටද ඇවැත් නොවේ." එකල්හි වනාහි සමග භික්ෂූහු හැරදමූ පාත්‍රය නොදෙත්, භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. "මහණෙනි, හැරදමූ පාත්‍රය නොදීම නොකට යුතුයි. යමෙක් නොදේද දුකුළා ඇවැත්වේ."

---

## 2 ඌන පඤ්ච බන්ධන ශික්ෂාපදය

11 එකල්හි වනාහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත් නුවර නිග්‍රොධාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි වනාහි එක්තරා කුම්භකාරයෙකු විසින් යම් ආර්‍ය්‍ය කෙනෙකුට පාත්‍රයෙන් ප්‍රයෝජන ඇත්නම් මම පාත්‍රයෙන් පුදමියි ආරාධනා කරණ ලද්දේ වෙයි. එකල්හි වනාහි භික්ෂූහු ප්‍රමාණය නොදැන බොහෝ පාත්‍ර ඉල්වත්. යම් කෙනෙකුට කුඩා පාත්‍ර වේද, ඔව්හු මහත් පාත්‍ර ඉල්වත්. යම් කෙනෙකුට මහත් පාත්‍ර වේද ඔව්හු කුඩා පාත්‍ර ඉල්වත්. (ii) ඉක්බිති ඒ කුම්භකාර තෙමේ භික්ෂූන්ට බොහෝ පාත්‍ර සාදන්නාහු අනික් විකිණිය යුතු බඩු සාදන්-නට නොහැකි විය. තෙමේද නොයැපෙයි. අඹුදරුවෝද ක්ලාන්ත වෙත්. (iii) මනුෂ්‍යයෝ දොස් කියත්. නොසතුට ප්‍රකාශ කරත්. නොසතුටු වචන කියත්. "කෙසේ නම් ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ ප්‍රමාණය නොදැන බොහෝ පාත්‍ර ඉල්වන්නාහුද (iv) මේ තෙමේ මොවුන්ට බොහෝ පාත්‍ර කරන්නේ අනික් විකිණිය හැකි බඩුවක් කරන්නට නොලැබේ. තෙමේද නොයැපෙයි අඹුදරුවෝද ක්ලාන්ත වෙත්යයි' v කියයි. භික්ෂූහු දොස් කියන්නාවූ නොසතුට ප්‍රකාශ කරන්-නාවූ නොසතුටු වචන කියන්නාවූ ඒ මිනිසුන්ගේ වචන ඇසූහ, යම් ඒ භික්ෂූ කෙනෙක් අල්පේච්ඡවූවාහුද ඔව්හු "කෙසේ නම් භික්ෂූහු ප්‍රමාණය නොදැන බොහෝ පාත්‍ර ඉල්වන්නාහුදැයි" දොස් කියත්. නොසතුට ප්‍රකාශ කරත්. නොසතුටු වචන කියත්.

12 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැල කළාහුය, "මහණෙනි, භික්ෂූහු ප්‍රමාණය නොදැන බොහෝ පාත්‍ර ඉල්වත් යනු ඇත්තද?' 'භාග්‍යවතුන් වහන්ස, ඇත්තය." භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළ සේක "මහණෙනි, කෙසේ නම් ඒ හිස් පුරුෂයෝ ප්‍රමාණයක් නොදැන බොහෝ පාත්‍ර ඉල්වන්නාහුද, මහණෙනි මෙය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිස(මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v))

13 "මහණෙනි, පාත්‍රය නොඉල්විය යුතුයි යමෙක් ඉල්වයි නම් දුකුළා ඇවැත් වේ.

14 එකල්හි වනාහි එක්තරා භික්ෂුවකගේ පාත්‍රය බිඳුණේ වේ. ඉක්බිති ඒ භික්ෂුව පාත්‍ර ඉල්වීමට භාග්‍යවතුන් වහන්සේ නහනම් කළ සේකැයි සැක කරන්නේ නොඉල්විය, අතට පිඩු සිඟයි. මිනිස්සු (ii) "කෙසේ නම් ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ තීර්ථකයන් මෙන් අතට පිඩු සිඟන්දැයි"(iii) දොස් කීවාහුය. නොසතුට ප්‍රකාශ කළාහුය, නොසතුටු වචන කීවාහුය, භික්ෂූහු දොස් කියන්නාවූ නොසතුට ප්‍රකාශ කරන්නාවූ නොසතුටු වචන කියන්නාවූ ඒ භික්ෂූන්ගේ වචන මනුෂ්‍යයෝ ඇසූහ.

15 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ සිද්ධියෙහි දැහැමි කථා කොට භික්ෂූන්ට ආමන්ත්‍රණය කළ සේක. "මහණෙනි, නැතිවූ පාත්‍ර ඇත්තහුට හෝ බිඳුණු පාත්‍ර ඇත්තහුට පාත්‍රයක් ඉල්වීමට අවසර දෙමි."

16 එකල්හි වනාහි ෂඩ්වග භික්ෂූහු නැතිවූ පාත්‍ර ඇත්තහුට හෝ බිඳුණු පාත්‍ර ඇත්තහුට පාත්‍රයක් ඉල්වීමට භාග්‍යවතුන් වහන්සේ විසින් අනුදැන්නා ලදැයි ස්වල්පයක් බිඳුනාවූ ස්වල්පයක් කැඩුනාවූද, සීරුණු පමණකින්ම බොහෝ පාත්‍ර ඉල්වත්. (මෙහි 1 (ii) (iii) දොස් කියත්, නොසතුට ප්‍රකාශ කරත්. නොසතුටු වචන කියත්. මේ තෙමේ මොවුන්ට බොහෝ පාත්‍ර හදන්නාහු විකිණීම කැයි ඇතික් ඔවුන් කරන්නට නොහැක්කෝය කෙමේද නොසැපෙති. ඔහුගේ අඹුදරුවෝද ක්ලාන්තවෙත්. දොස් කියන්නාවූ නොසතුටු වචන කියන්නාවූ නොසතුටු බස් කියන්නාවූ ඔවුන්ගේ වචන ඇසූහුය. යම් ඒ භික්ෂූ කෙනෙක් අල්පෙච්ඡද

ඔව්හු දොස් කියත් නොසතුව ප්‍රකාශ කරත්. නොසතුටු වචන කියත්. කෙසේ නම් සවග භික්ෂූහු ස්වල්ප මාත්‍රයක් බිඳුණු කැඩුණු ඉරි ඇඳුනු පමණකින් බොහෝ පාත්‍ර ඉල්වන් නාහුදැයි කියති.

17 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. "මහණෙනි, තෙපි සවල්පයක් බිඳුනාවූ සවල්පයක් කැඩුනාවූ හීරුනාවූ ප්‍රමාණයකින් බොහෝ පාත්‍ර ඉල්වන්නාහුද?" "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය." "භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළසේක." "හිස් පුරුෂයෙනි, කෙසේ නම් තෙපි ස්වල්ප මාත්‍රයක් සිදුණාවූ පමණකින් බොහෝ පාත්‍ර ඉල්මින්නාහුද? හිස් පුරුෂයෙනි, මෙය (මෙහි 1 පාරාජිකාවේ සුදින්න බණවරේ 30 (v) )

18 "යම් මහණෙක් නොමේ වනාහී බන්ධන පසකින් අඩු පාත්‍රයක් ඇතිව අනික් අලුත් පාත්‍රයක් ඉල්ලාගනී නම් නිසගි පචිතිවේ. ඒ මහණහු විසින් ඒ ඉල්වාගත් පාත්‍රය භික්ෂු පිරිස වෙත සබා ආලය හැරපීම කළ යුත්තේය. ඒ භික්ෂු පිරිසෙහි කෙලවර ලද යම් පාත්‍රයක් වේද, ඒ භික්ෂුහට "මහණ, තා විසින් මේ පාත්‍රය බිඳීම දක්වා දරිය යුත්තේය" දිය යුත්තේය. මේ එහි වනයි. (මෙහි 1 පාරාජිකාවේ පදභාජනීයේ 1–2 ඡේද)

19 "පාත්‍රය අඩු බැඳුම් පසක් ඇත්තේ" යනු බන්ධන එකකින්වත් යුක්තනොවූ පාත්‍රයද, එක් බැම්මක් ඇත්තේද බැමි දෙකක් ඇත්තේද, බැමි තුනක් ඇත්තේද, බැමි සතරක් ඇත්තේද බැඳීමට ඉඩක් නැති පාත්‍රයයි. යම් පාත්‍රයක දෙ අඟුල් ඉරක් නැත්තේද බැම්මට අවකාශ ඇති පාත්‍රයයි. යම් පාත්‍රයක දෙඅඟුල් ඉරක් ඇද්ද, බැම්මට ඉඩ ඇති පාත්‍රයයි. යම් පාත්‍රයක දෙඅඟුල් ඉරක් ඇද්ද අලුත් පාත්‍රයක් ඉල්වීම ගෙන තියනු ලැබේ "ඉල්වන්නේය" යනු අගවයි. ප්‍රයොගයෙහි දුකුලාවේ. ලැබීමෙන් නිසගි පචිතිවේ. සංඝයා මැද හැරදිය යුතුයි. සියල්ලෝම අධිෂ්ඨාන කරණ ලද පාත්‍ර රැගෙන අයුත්තාහට වටිනා පාත්‍රයක් ගන්නෙමියි කුඩා පාත්‍රය අධිෂ්ඨාන කළ යුත්තේ නොවේ. ලොකු පාත්‍රයක් ගන්නෙමියි ඉදින් කුඩා පාත්‍රය අධිෂ්ඨාන කරයි නම් දුකුලා ඇවැත් . මහණෙනි, මෙසේද වනාහී අත්හළ යුතුය ඒ භික්ෂුම විසින් සඞ්ඝයා වෙත පැමිණ තනිපට සිවුර ඒකාංශකොට මැඩි කළ-

භික්ෂූන් පා වැඳ උක්කුටුකයෙන් හිඳ ඇඳිලිබැඳ 'ස්වාමීනි මාගේ මේ පාත්‍රය පස් බැඳුම්කට අඩුවූ පාත්‍රයෙන් ප්‍රත්‍යනම ඉල්වන ලදී; නිස්සග්ගිය. මම මෙය සංඝයාට දෙමියි' මෙසේ කියයුතුවන්නේය. හාරදී ඇවැත් දෙසිය යුතුය. ව්‍යක්ත දක්ෂ භික්ෂුවක් විසින් ඇවැත පිළිගත යුතුය. කරුණු පසකින් යුක්තවූ භික්ෂුව පාත්‍රගන්නෙකු වශයෙන් සම්මත කළ යුතුය. යමෙක් ඡන්දයෙන් අගතියට නොයයිද ද්වේෂයෙන් භයින් මෝහයෙන් අගතියට නොයයිද, ගත් නොගත්බව දනීද, යන පසයි. මහණෙනි, මෙසේ මතු හි සම්මත කළයුතුය.

10 "පළමු මෙතුම් භික්ෂූන් යාච්ඤා කළයුතුය. යාච්ඤා කොට ව්‍යක්ත දක්ෂ භික්ෂුවක් විසින් සංඝයාට දැන්විය යුතුය. සංඝතෙම මා කියන්නක් අසාවා, ඉදින් සංඝයාට පැමිණිකල් ඇත්තේනම් සංඝතෙමේ මෙනම් භික්ෂුව පාත්‍රගන්නෙකු කොට සම්මත කරන්නේය. මේ දැන්වීමයි. 'ස්වාමීනි, සංඝතෙම මා කියන්නක් අසාවා, සංඝතෙමේ මෙනම් භික්ෂුව, පාත්‍ර ගන්නෙකු කොට සම්මත කරයි. යම් ආයුෂ්මත් කෙනෙකු මෙනම් භික්ෂුවට පාත්‍රගන්නා සම්මතය කැමතිවේද හෙතෙම නිශ්ශබ්දවන්නේය. යමෙක් නොකැමැත්තේ නම් හෙතෙම කියන්නේය. සංඝයා විසින් මෙනම් භික්ෂුව පාත්‍ර ගන්නෙකුකොට සම්මත කරනලදී. සංඝයාටද ප්‍රියය. එහෙයින් නිශ්ශබ්ද විය මෙසේ මේ තුෂ්ණිම්භාවය දරමි. ඒ සම්මතකළ භික්ෂුව විසින් පාත්‍රය ගතයුතුය. 'ස්වාමීනි, ස්ථවිර තෙමේ පාත්‍රය ගන්නුවයි' ස්ථවිරතෙම කිව යුතුය. ඉදින් තෙරුන් වහන්සේ ගතිනම් තෙරුන් වහන්සේගේ පාත්‍රය දෙවැන්නෙකු ලවා ගැන්විය යුත්තේය. ඔහුට අනුග්‍රහ පිණි සයෙන් නොදෙන නොදිවිය යුතුය. යමෙක් නොගන්නේද දුකුලා ඇවැත්වේ. පාත්‍රයක් නැත්තහුලවා නොගැන්විය යුතුය. මේ ක්‍රමයෙන්ම සංඝනවකයාගේ දක්වා ගැන්විය යුතුය. ඒ භික්ෂු පිරිසෙහි යම් අන්තිම පාත්‍රයක්වේද ඒපාත්‍රය ඒ භික්ෂුවට දියයුතුය 'මහණ තොපගේ මේ පාත්‍රය බිඳෙනතුරු දැරිය යුතුයි' කියායි. ඒ භික්ෂුව විසින් ඒ පාත්‍රය නො තැන නොදැමිය යුතුය පාවිච්චි නොකිරීමෙන් අනුහම් නො කළ යුතුයි අන් නොමෙ යුතුය. 'මේ පාත්‍රය කෙසේ නැසෙන්නේද, විනාශ වන්නේද බිඳෙන්නේදැයි' කියායි,

21 "ඉදින් කොතැන්හි දමාද, පාච්චි කොකර වලදැළු අත්හරිද දුකූලා ඇමැත්වේ, මේ එකී හරික්‍රමයකී, මෙ එකී සවභාවයයි, අණ්ඩ නොදමූ පාත්‍රයකින් පිළියම් නොකළ පාත්‍රයක් ඉල්වයිද නිසගි පචිතිවේ.

22 "පිළියම් නොකළ පාත්‍රයකින් එක් පිළියමක් දමූ පාත්‍රයක් ඉල්වයිද, නිසගි පචිතිවේ. පිළියම් නොදමූ පාත්‍රයකින් පිළියම් දෙකක් ඇති පාත්‍රයක් ඉල්වයිද, නිසගි පචිතිවේ. පිළියම් නොදමූ පාත්‍රයකින් පිළියම් තුනක් ඇති පාත්‍රයක් ඉල්වයිද නිසගි පචිතිවේ. පිළියම් නොදමූ පාත්‍රයකින් පිළියම් සතරක් දමූ පාත්‍රයක් ඉල්වයිද, නිසගි පචිතිවේ. (ii) එක් පිළියමක් ඇති පාත්‍රයකින් පිළියම් නොදමූ පාත්‍රයක් ඉල්වයිද නිසගි පචිතිවේ.

23 (මෙහි (ii) ඡේදය යෙදීමෙදී "පිළියම් නොදමූ" වෙනුවට "එක් පිළියමක් දමූ" කියා වෙනස්කර යොදාගත යුතුයි.)

24 (මෙහි (ii) ඡේදයේ "පිළියම් නොදමූ" වෙනුවට 'පිළියම් දෙකක් දමූ' යොදන්න.)

25 (මෙහි (ii) ඡේදයේ 'පිළියම් නොදමූ' වෙනුවට 'පිළියම් තුනක් දමූ' යොදන්න.)

26 (මෙහි (ii) ඡේදයේ 'පිළියම් නොදමූ' වෙනුවට 'පිළියම් සතරක් දමූ' යොදන්න.)

27 (මෙහි (ii) ඡේදයේ 'පිළියම් නොදමූ පාත්‍රයක්' වෙනුවට 'පිළියමකට අවකාශ ඇති' යොදන්න.)

28 එක් පිළියමක් ඇති පාත්‍රයකින් (මෙහි 11 ඡේදයේ 'එක් පිළියමක් දමූ' වෙනුවට 'පිළියමකට අවකාශ නැති' යොදන්න.)

29 පිළියම් දෙකක් ඇති පාත්‍රයකින් (මෙහි 11 ඡේදයේ 'එක් පිළියමක් දමූ' 'පිළියමකට අවකාශ නැති' යොදන්න.)

30 පිළියම් තුනක් ඇති පාත්‍රයකින් (මෙහි 11 ඡේදයේ 'පිළියම් නොදමූ පාත්‍රයක්' වෙනුවට 'පිළියමකට අවකාශ ඇති යොදන්න·)

31 පිළියම් සතරක් ඇති පාත්‍රයකින් (මෙහි 16 ඡේදයේ යෙදීම මෙනි.)

32 පිළියමකට අවකාශ නැති පාත්‍රයකින් පිළියමක් නැති (මෙහි 11 ඡේදය මෙනි.)

33 එක් පිළියමකට අවකාශ ඇති පාත්‍රයකින් (මෙහි 11 ඡේදය මෙනි.)

34 පිළියම් දෙකකට අවකාශ ඇති පාත්‍රයකින් (මෙහි 11 ඡේදය මෙනි )

35 පිළියම් තුනකට අවකාශ ඇති පාත්‍රයකින් (මෙහි 11 ඡේදය මෙනි )

36 පිළියම් සතරකට අවකාශ ඇති පාත්‍රයකින් (මෙහි 11 ඡේදය මෙනි )

37 පිළියම් දුම්මට අවකාශ නැති පාත්‍රයකින් පිළියම් දුම්මට අවකාශ නැති පාත්‍රයක් ඉල්වයිද, නිසගි පචිති වේ. පිළියම් දුම්මට අවකාශ නැති පාත්‍රයකින් එක් පිළියමකට අවකාශ ඇති පාත්‍රයක් ඉල්වයිද පිළියමකට අවකාශ ඇති පාත්‍රයකින් පිළියම් දෙකකට අවකාශ ඇති පාත්‍රයක් ඉල්ව-යිද, පිළියමකට අවකාශ නැති පාත්‍රයකින් පිළියම් තුනකට අවකාශ ඇති පත්‍රයක් ඉල්වයිද, පිළියම් දුම්මට අවකාශ නැති පාත්‍රයකින් පිළියම් සතරකට අවකාශ ඇති පාත්‍රයක් ඉල්වයිද, නිසගි පචිති වේ.

38-40 (මේ ඡේද සතර සැදීමට 27 ඡේදයේ පිළියමකට අවකාශ ඇති පාත්‍රයෙන් යන් තැන පිළියම් දෙකකට පිළියම් තුනකට, පිළියම් සතරකට, පිළියම් පසකට කියා වෙනස් කර යොදාගත යුතුයි )

41 "නැතිවූ පාත්‍ර ඇත්තාහුවද, බිඳුණු පාත්‍ර ඇත්තාහුවද, නෑයන්වද, පැවරූවන්වද, අනිකෙකු උදෙසාද, තම ධනයෙන්ද. උමතුවූවහුවද, මුලින් වැරැද්ද කළහුවද, ඇවැත් නොවේ."

---

## 3 භෙසජ්ජ ශික්ෂාපදය

42 (මෙහි 1 අතිරතයේ 1 (i) ) එකල්හි වනාහි ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙමේ රජගහනුවර ලෙනක් කරවනු කැමැත්තේ බෑවුමක් සුද්ධ කරවයි. ඉක්බිති සේනිය බිම්බිසාර නම් මගධරජතෙමේ ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙමේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් පිලින්දිවච්ඡට වැඳ එකත්පසෙක හිඳියේය. එකත්පසෙක හිඳි සේනිය බිම්බිසාර නම් මගධ රජතෙමේ ආයුෂ්මත් පිලින්දිවච්ඡට 'ස්වාමීනි,

තෙරුන් වහන්සේ කුමක් කරන්නේදැයි" ඇසුවේය "මහරජ ලෙණක් කරනු කැමැත්තේ පර්වත බෑවුමක් සුද්ධ කරන්නෙමියි" කීයේය. "ස්වාමීනි, ආර්යයන් වහන්සේට වැඩ කරුවෙකු අවශ්‍යදැයි" ඇසුයේය. "මහරජ භාග්‍යවතුන් වහන්සේ, විසින් වැඩකරුවෙකු නොඅනුදන් සේකැයි" කීයේය. "එසේ නම් ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විචාරා මට කියන්නැයි" කීයේය "මහරජ, එසේයයි" ආයුෂ්මත් පිළින්දිවච්ඡතෙමේ සේනිය බිම්බිසාර නම් මගධරජුහු දහැමි කථාවෙන් කරුණුගෙන හැර දක්වූයේය. සමාදන් කරවූයේය. තෙදගැන්වූයේය. සතුටු කළේය.

43 ඉක්බිති සේනිය බිම්බිසාර මගධරජතෙම ආයුෂ්මත් පිළින්දිවච්ඡ තෙරුන් විසින් දහැමි කථාවෙන් කරුණු ගෙනහැර දක්වූයේ, සමාදන් කරවූයේ තෙදගැන්වූයේ සතුටු වූයේ අස්නෙන් නැගිට ආයුෂ්මත් පිළින්දිවච්ඡ වැද පැදකුණුකොට ගියේය. ඉක්බිති පිළින්දිවච්ඡතෙම "ස්වාමීනි, සේනිය බිම්බිසාර මගධ රජතෙම වැඩකරුවෙකු දෙනු කැමැත්තේය. ස්වාමීනි, අපි කෙසේ පිළිපදිමුදැයි" කියා භාග්‍යවතුන් වහන්සේ සමීපයට දූතයෙකු යැවුවේය

44 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ සිද්ධියෙහි දහැමි කථාකොට භික්ෂූන් ආමන්ත්‍රණය කළසේක. "මහණෙනි, වැඩකරුවෙකු අනුදනිමියි" කියාසි. දෙවනුවත් සේනිය බිම්බිසාර මගධ රජතෙම ආයුෂ්මත් පිළින්දිවච්ඡතෙමේ යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් පිළින්දිවච්ඡව වැද එකත්පසෙක හිඳියේය. එකත්පසෙක හිඳි සේනිය බිම්බිසාර නම් මගධ රජතෙමේ ආයුෂ්මත් පිළින්දිවච්ඡව "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් වැඩකරුවෙකු අනුදන්නා ලද්දේදැයි" ඇසීය. "මහරජ, එසේයයි" කීයේය. "ස්වාමීනි, එසේ නම් ආර්යයන් වහන්සේට වැඩ කරුවෙකු දෙමියි" දක්වූයේය ඉක්බිති සේනිය බිම්බිසාරමගධ රජතෙම ආයුෂ්මත් පිළින්දිවච්ඡට ආරාමිකයෙකු පොරොන්දුවී, සිහි නොවී නොබෝ දිනකින් සිහි ලබා හැම කරුණක් ගැනම සොයාබලන එක්තරා මහාමාත්‍යයෙකුට කථාකළේය. "එම්බල යහළ, මා විසින් ආර්යයන් වහන්සේට වැඩකරුවෙකු දෙන්ට පොරොන්දු වන ලදී. ඒ වැඩකරු යැව්වේදැයි"

ඇසීය. "දේවයන් වහන්ස, ආර්ය්‍යයන් වහන්සේට වැඩකරුවෙකු නොදැව්වෙමියි' කීයේය. සගය, අද සිට එයට කොපමණ කලක් ගතවූයේදැයි" ඇසීය. "ඉක්බිති ඒ මහාමාත්‍ය තෙම රාත්‍රි ගණන් කොට සේනිය බිම්බිසාර රජුට "දේවයන් වහන්ස රාත්‍රි පන්සියයකැයි" කීයේය. "සගය, එසේනම් ආර්ය්‍යයන් වහන්සේට පන්සියයක් වැඩකරුවන් දෙවයි" කීයේය. "දේවයන් වහන්ස, එසේයයි' ඒ මහාමාත්‍යතෙම සේනිය බිම්බිසාර මගධ රජහට පිළිතුරුදී ආයුෂ්මත් පිළින්දිවච්ඡට පන්සියයක් වැඩකරුවන් දෙවූයේය. වෙනම එක් ගමක් වාසය කරවීය. එයට ආරාමිකගමයයි නම් කළහ. ඊට පිළින්දි ගමයයිද කියාහුය.

45 එකල්හි වනාහි ආයුෂ්මත් පිළින්දිවච්ඡ තෙමේ ඒ ගමෙහි කුළුපගයෙක් විය. ඉක්බිති ආයුෂ්මත් පිළින්දිවච්ඡ තෙමේ පෙරවරු වේලෙහි හැඳ පොරවා පා සිවුරු ගෙන පිළින්දගමට පිඩු පිණිස වැඩියේය. එකල්හි වනාහි ඒ ගමෙහි උත්සවයක් විය. දරුවෝ සැරසුණාහු මල් පැළැන්දැහු ක්‍රීඩා කරත්. ඉක්බිති ආයුෂ්මත් පිළින්දිවච්ඡතෙමේ පිළින්දගම් ගෙපිළිවෙළින් පිඩු පිණිස හැසිරෙන්නේ එක්තරා කම්කරුවෙකුගේ ගෙයට පිඩු පිණිස පිවිසියේය. පැමිණ පනවන ලද අස්නෙහි වැඩහිටියේය. එකල්හි වනාහි ඒ කම්කාරියගේ දුව සැරසුනාවූ මල් පැළැන්දාවූ සෙසු දරුවන් දක අඬයි. 'මට මල් දෙව, මට ආභරණ දෙවයි' කියයි. ඉක්බිති ආයුෂ්මත් පිළින්දිවච්ඡතෙමේ ඒ කම්කාරියගෙන් 'මේ අඬන්නාවූ දරුවා කාගේදැයි" ඇසුයේය. "ස්වාමීනි, අනිත් දරුවෝ අලංකාරව මල් පැළඳ සිටින්නාහු දැක 'මට මල් දෙව, මට ආභරණ දෙවයි' අඬයි. දුප්පත් අපට මල් කොයින්ද? ආභරණ කොයින්ද?"

46 ඉක්බිති ආයුෂ්මත් පිළින්දිවච්ඡතෙමේ එක්තරා තණකොළ දරණුවක් දී ඒ කම්කාරි ස්ත්‍රියට එසේ නම් මේ තණ දරණුව ඒ දැරියගේ හිසේ දමවයි කීයේය. ඉක්බිති ඒ කම්කාරි තොමෝ ඒ තණ දරණුව ගෙන ඒ දරුවාගේ හිසේ දැම්මාය. ඕ තොමෝ මනා රූ ඇති, දැකුම්කළු සතුට ගෙන දෙන රන්මාලාවක් විය. රජුගේ අන්තඃපුරයෙහිද එබඳු රන් මාලාවක් නැත්තේය. මනුෂ්‍යයෝ සේනිය බිම්බිසාර නම්

මගධ රජහට "දේවයන් වහන්ස, අසවල් කම්කරුවාගේ ගෙහි ඉතා රූමත්වූ, දැකුම්කළු, සතුට ගෙන දෙන රන් මාලාවක් ඇත. දේවයන්වහන්සේගේ ඇතුළු නුවරතුළද එබඳු රන්මාලාවක් නැත. ඒ දුප්පතාට එබැන්නක් කොයින්ද? ඒකාන්තයෙන් සොරකමින් ගෙනෙන ලද්දේයයි" කීවාහුය. ඉක්බිති සේනිය බිම්බිසාර මගධ රජතෙම ඒ කම්කරුවා සහ පිරිස සිරකරවූයේය.

47 දෙවෙනි දිනත් ආයුෂ්මත් පිලින්දිවච්ඡතෙමේ පෙරවරු සමයෙහි හැඳපොරවා පාත්‍ර සිවුරුගෙන පිලින්ද ගමට පිඬු පිණිස හැසිරෙයි, පිලින්දි ගමෙහි ගෙපිළිවෙලින් පිඬු පිණිස හැසිරෙන්නේ ඒ ආරාමිකයාගේ ගෘහය යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ සමීප ගෙවලින් විචාළේය. "මේ කම්කරු ගෙය කොහිදැයි" කියායි "රන් මාලාවක් නිසා සිරකරන ලදැයි" කීවාහුය.

48 ඉක්බිති ආයුෂ්මත් පිලින්දිවච්ඡතෙමේ සේනිය බිම්බිසාර නම් මගධ රජුගේ මාලිගාව යම් තැනෙක්හිද එහි පැමිණියේය, පැමිණ පනවන ලද අස්නෙහි වැඩහුන්නේය. ඉක්බිති සේනිය බිම්බිසාර නම් මගධ රජතෙම ආයුෂ්මත් පිලින්දිවච්ඡතෙරුන් වැඳ එකත් පසෙක සිටියේය. එකත් පසෙක සිටි සේනිය බිම්බිසාරනම් මගධ රජුගෙන් ආයුෂ්මත් පිලින්දිවච්ඡතෙමේ "මහරජ, කුමක් හෙයින් කම්කරු ගෙයට අයත් පිරිස සිරකරන ලද්දදැයි" ඇසීය. "ස්වාමීනි, ඒ කම්කරු ගෙයෙහි මනහර දැකුම්ඇති දැකුම්කළු ප්‍රසාද උපදවන රන් මාලාවක් විය. එබඳුවූවක් අපේ ඇතුළු නුවරවත් නැත. ඒ දුප්පතුන්ට එබැන්නක් කොයින්ද? නියතයෙන්ම සොරකම් කරගත් එකක් වන්නේයයි" කීයේය.

49 ඉක්බිති ආයුෂ්මත් පිලින්දිවච්ඡතෙමේ සේනිය බිම්බිසාර නම් මගධ රජුගේ ප්‍රාසාදය රුවන් වේවායි අධිෂ්ඨාන කළේය. එය රත්රන් විය. "මහරජ, ඔබට මෙතරම් රත්රන් කොහිදැයි" ඇසීය. "ස්වාමීනි, ඒ ආයුෂ්මතුන් වහන්සේගේ සෘද්ධියයැයි දනිමියි" කියා ඒ කම්කරු ගෙයට අයත් පිරිස මිදෙව්වේය.

50 මනුෂ්‍යයෝ ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙරුන් විසින් රජුන් සහිත පිරිසෙහි උත්තරි මනුෂ්‍ය ධර්ම සෘද්ධි ප්‍රාතිහාර්යය

ජාතලදූයි සඤ්ඤාවූවාහු පැහැදුනාහු ආයුෂ්මත් පිළින්දිවච්ඡයන්ට ගිතෙල්, වෙඬරු, තලතෙල්, මී, උක්පැණි ගෙනාවාහුය. ප්‍රකෘතියෙන්ද ආයුෂ්මත් පිළින්දිවච්ඡතෙමේ පස් බෙහෙත් ලබන්නෙක් විය. ලැබූ ලැබූ දේ පිරිසට දෙයි. උන්වහන්සේගේ පිරිසද ප්‍රත්‍යයබහුලවූවාහු ලද්ද ලද්ද කල්දේරම් වලද කළලද පුරවා තැබුවාහුය. පෙරහන්කඩද පසුම්බිද පුරවා ජනෙල්වල එල්වයි. කෑන්පසින් වැක්කෙරෙත්. මීයෝද විහාරයෙහි ගැවසුනාහු වෙත්.

51 මිනිස්සුයෝ විහාරයෙහි ඇවිදීම කරන්නාහු දැක දොස් කියත්. නොසතුටු වචන කියත්. නොසතුට ප්‍රකාශ කරත්. මේ ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ ඇතුළත කොටුගුල් ඇත්තෝය සෙනිය බිම්බිසාර මගධ රජ සමයේද එමෙනි. භික්ෂූහු දොස් කියන්නාවූ නොසතුටු වචන කියන්නාවූ නොසතුට ප්‍රකාශ කරන්නාවූ ඒ මිනිසුන්ගේ වචන ඇසූහ. යම් ඒ භික්ෂු කෙනෙක් අල්පෙච්ඡද (ii) ඔව්හු දොස් කියත්. නොසතුට ප්‍රකාශකරත්. නොසතුටු වචන කියත් (iii) "කෙසේනම් භික්ෂූහු මෙබඳු ප්‍රත්‍යය බහුල භාවය පිණිස උත්සාහවත් වන්නාහු දැයි" කියායි.

52 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. "මහණෙනි, භික්ෂූහු මෙබඳු බහුල භාවයකින් උත්සාහකරන්නාහු යනු ඇත්තද?" "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය." භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළසේක. "මහණෙනි, කෙසේනම් ඒ හිස් පුරුෂයෝ මෙබඳු ප්‍රත්‍යය බහුල භාවය පිණිස ක්‍රියාකරන්නාහුද, මහණෙනි, මෙය අප්‍රසන්නවූවන්ගේ ප්‍රසාදය පිණිස (මෙහි 1 පාරාජිකයේ සුදින්න බණ වරේ 30 (v))

53 "ගිලන් භික්ෂූන් විසින් අනුභව කටයුතුවූ යම් ඒ බෙහෙත් ඇද්ද, ඔව්හු නම් ගිතෙල්ය, වෙඬරුය, තලතෙල්ය, මීය, උක්පැණිය යන මොහුයි. ඒ බෙහෙත් පිළිගෙන සත් දිනකට වැඩිනොවන කාලයක් සුරක්ෂිතකොට අනුභව කටයුත්තාහ. ඒ සත් දිනට වැඩිකාලයක් ඉක්මවත් කහුට නිසගි පචිතිවේ."

54 "ගිලන් භික්ෂූන් විසින් අනුභව කටයුතු බෙහෙත් අතර ගිතෙල් නම්" ගව ගිතෙල් හෝ එළු ගිතෙල් හෝ මීගව

ගිතෙල් හෝ යම්කිසි සතුන්ගේ මස් කැපද ඔවුන්ගේ ගිතෙල්ය. 'වෙඩරු' නම් ඔවුන්ගේම වෙඩරුය. 'තෙල්' නම් තලතෙල්, අබතෙල්, මීතෙල්, එඩරුතෙල්, (සතුන්ගේ) මස් තෙල් යනුයි. 'මී' නම් මීමැස්සන්ගේ මීපැනි, 'පැණි' නම් උක් පැණි යනුයි.

55 "මෙවා පිළිගෙන වැඩිවශයෙන් දවස් සතක් තබා ගෙන ප්‍රයෝජන ගතයුත්තාහ. වැඩිවශයෙන් සත් ද සත් ප්‍රයෝජන ගතයුතුය. එය ඉක්මවන්නාහට නිස්සග්ගි පචිත්තිවේ. අටවෙනි අරුණ නැගෙන කල්හි නිස්සග්ගිවේ සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට හාරදිය යුතුය

56 "මහණෙනි, මේ බෙහෙත් මෙසේ හාරදිය යුතුයි 'ස්වාමීනි, මාගේ මේ බෙහෙත සත් දවසක් ඉක්මවූයේය, නිස්සග්ගිවිය, මම මෙය සංඝයාට හාරදෙමියි' කියාද දෙන්නෝය කියාද දෙන්නාහුය කියාද ආයුෂ්මතුන්ට දෙමි කියාද' දියයුතුය. සත් දවස ඉක්මුණු කල්හි ඉක්මුණේය යන හැඟීම් ඇත්තේ නිස්සග්ගි පචිත්තිවේ. සත් දවස ඉක්මීමෙහි විමති ඇත්තේ නිස්සග්ගි පචිත්තිවේ. සත් දවසක් ඉක්මුණු කල්හි නොඉක්මුණේය යන හැඟීම් ඇත්තේ නිස්සග්ගි පචිත්තිවේ. අධිෂ්ඨාන නොකළ කල්හි අධිෂ්ඨාන කෙළේය යන අදහස් ඇත්තේද නිස්සග්ගි පචිත්තිවේ. බාරනුදුන් කල්හි බාරදුන්නේය යන හැඟීම් ඇත්තේද නිස්සග්ගි පචිත්තිවේ. නැති නොවූ කල්හි නැතිවූයේය යන හැඟීම් ඇත්තේද පචිති ඇවැත්වේ විනාශ නොවූ කල්හි විනාශවූයේය යන හැඟීම් ඇත්තේද නිස්සග්ගි පචිත්තිවේ. නොදැවුනු කල්හි දැවුනේය යන හැඟීම් ඇත්තේද පචිති ඇවැත්වේ සොරකම් නොකළ කල්හි සොරකම් කෙළේය යන හැඟීම් ඇත්තේද නිස්සග්ගි පචිත්තිවේ හැරදමන ලද්දක් ලැබ ශරීරයෙහි පරිභෝග නොකළ යුතුයි නොගිලිය යුතුයි. පහණෙන හෝ කළපාවන දැමිය යුතුය. අන් භික්ෂූන් විසින් ශරීරය සඳහා ප්‍රයෝජන ගතයුතුය. නොගිලිය යුතුයි. සත් දවස නොඉක්මුණු කල්හි ඉක්මුණේය යන අදහස් ඇත්තේ දුකුළා ඇවැත්වේ. සත්දවස ඉක්මීමෙහි විමති ඇත්තේ දුකුළා ඇවැත්වේ. සත් දවස නොඉක්මී කල්හි නොඉක්මුණේය යන හැඟීම් ඇත්තේ ඇවැත් නොවේ. සත් දවස ඇතුළත අධිෂ්ඨාන කරයිද, හාරදෙයිද, නැසේද, වැනසේද, දැවේද, පැහැර ගෙන යයිද, විශ්වාසයෙන් ගනීද, අත්හරින ලද, මමාරණ ලද,

මුදහලද්දවුන් විසින් බලාපොරොත්තු රක්ෂිතව දී ලැබ පරිභෝග කරයිද, උමතුවූ හුටද, ආදිකර්මිකයාටද ඇවැත් නොවේ."

---

## 4 වස්සික සාටික ශික්ෂාපදය

57 (මෙහි 1 අනියතයේ 1(i) ඡේදයේ විසාඛා) භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට වැසි සළුවක් අනුදත්තේ විය. "සවග භික්ෂූහු" භාග්‍යවතුන් වහන්සේ විසින් වැසිසළු සිවුර අනුදන්නා ලද්දේයයි ප්‍රථමයෙන්ම වැසිසළු සිවුර සොයති. කලින්ම මසා හඳින් දිරූ වැසිසළු සිවුරෙන් නග්න ශරීරය තෙමත්, යම් ඒ භික්ෂූන් අල්පේච්ඡද ඔව්හු කෙසේ නම් "සවග භික්ෂූහු" කල් ඇතිවම වස්සික සාටික සිවුර සොයන්නාහුද, කලින්ම කොට හඳිත්ද කියායි දිරූ වැසිසළු සිවුරෙන් නග්න ශරීරය තෙමත්දැයි කියා දොස් කිව්හුය. නොසතුටු ප්‍රකාශ කළාහුය (i) නොසතුටු බස් කීවාහුය.

58 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැල කළහ. "මහණෙනි, කලින්ම වැසිසළු සිවුරු සොයන්නාහුද, කලින්ම මසා අඳින්නාහුද? දිරූ වැසිසළු සිවුරෙන් නග්න ශරීරය තෙමන්නාහුදැයි" භාග්‍යවතුන් වහන්සේ ඇසූසේක. "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය." භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගැරහූසේක. හිස් පුරුෂයෙනි, කෙසේ නම් තෙපි පළමුවෙන්ම වැසිසළු සොයන්නාහුද. සොයා මසා අඳිව්ද, දිරූ වැසි සළුවෙන් නග්න ශරීරය තෙමන්නාහුද හිස් පුරුෂයෙනි, මෙය නොපැහැදුන වුන්ගේ පැහැදීම (මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v)

59 "ග්‍රීෂ්ම සාරමස අතුරෙන් මසක් ශේෂව සිටියේයයි භික්ෂුව විසින් වැසි සළු සිවුරක් සෙවිය යුත්තේය. ග්‍රීෂ්ම සාරමාසයට අඩමසක් ඇත්තේයයි කොට හැඳ යුතු ග්‍රීෂ්ම සාරමාසය අතුරෙන් මාසයක් ඉතිරිවූයේයයි කියයුතු කලට මැතින් ඉදිනා වැසිසළු සිවුරක් සොයන්නේද, ග්‍රීෂ්ම සාරමාසය අතුරෙන් අඩමාසයක් ඉතිරිව සිටියේයයි කියයුතු කලට මැසමකොට හඳින්නේ නම් නිසගි පචිතිවේ.

60 'ග්‍රීෂ්ම සෘතුවෙන් මාසයක් ඉතිරිව ඇත්තේයයි භික්ෂුව විසින් වස්සිකසාටික සිවුරක් සෙවියයුතුය'' යනු යම්

මනුෂ්‍ය කෙනෙක් පෙරද වැසි සළු සිවුරක් දෙත්ද ඔවුන්මෙන පැමිණ වැසි සළුවට කලැයිද, වැසිසළුවට සමයයයිද මෙසේ කිවයුතු වන්නේය. සෙසු මිනුෂ්‍යයෝද වැසිසළු සිවුර දෙත්ද 'ඔබ වැසිසළු සිවුරක් දෙව, ඔබ වැසි සළු සිවුරක්ගෙන එවයිද, මගේ වස්සිකසාටික චීවරය මාරුකරව මාගේ වස්සික සාටික චීවරය මිලදීගනුමයි' නොකිවයුතුයි." "ග්‍රීෂ්ම සෘතුවට අඩ-මසක් ඇත්තේද මසා හැන්ද යුතුය," යනු ග්‍රීෂ්ම සෘතු-වෙහි අඩමසක් ඇත්තේයයි මසා හැන්දයුතුය. "ඉදින් ග්‍රීෂ්ම සෘතුවට මාසයක් ඉතිරි වූයේයයි කිව යුතුකලට මැත" යනු ගිම්හානයෙහි මාසයකට වඩා ඉතිරිකල්හි වැසිසළු සිවුර සොයයිද නිසගි පචිතියෙ. "ග්‍රීෂ්ම සෘතුවෙහි අඩමසකට මැතමය කිවයුතුකලම" යනු ග්‍රීෂ්ම සෘතුවෙහි මසකට වඩා ඉතිරිව තිබියදී මසා අඳියිද, නිසගි පචිතියෙ සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට භාරදියයුතුයි

61 "මහණෙනි, මෙසේද වනාහි භාරදියයුතුයි.' ස්වාමීනි මාගේ මේ වැසිසළු සිවුර ගිම්හානයට මාසයට වඩා ඉතිරිව ඇතිකල්හි සොයනලදී. ග්‍රීෂ්ම කාලයෙහි අඩමසක් තිබියදී අඳිනලදී. මම මේය සංඝයාට භාරදෙමියිද දෙන්නේයයිද දෙන්නාහුයයිද ආයුෂ්මතුන්ට දෙමියිද" දියයුතුයි.

62 ග්‍රීෂ්ම කාලයෙහි මාසයකට වඩා ඉතිරිකල්හි ඉතිරිය යන හැඟීම ඇත්තේ වැසිසළු සිවුරක් සොයයිද නිසගි පචිතියෙ. ග්‍රීෂ්ම කාලයෙහි මාසයකට වඩා ඉතිරිකල්හි විමති ඇතිව වැසිසළු සිවුරක් සොයයිද, නිසගි පචිතියෙ ග්‍රීෂ්ම කාලයෙහි මාසයකට වඩා ඉතිරිකල්හි අඩුවූයේය යන හැඟීම ඇත්තේ වැසි සළු සිවුරක් සොයයිද නිසගි පචිතියෙ.

63 ග්‍රීෂ්ම කාලයෙහි අඩමසකට වඩා ඉතිරිවූ කල්හි ඉතිරිය යන හැඟීම ඇතිව අඳියිද නිසගි පචිතියෙ. ග්‍රීෂ්ම කාලයෙහි අඩමසකට වඩා ඉතිරිවූ කල්හි විමති ඇතිව අඳියිද, නිසගි පචිතියෙ. ග්‍රීෂ්ම කාලයෙහි අඩමසකට වඩා ඉතිරි කල්හි අඩුය යන හැඟීම ඇතිව අඳියිද නිසගි පචිතියෙ.

64 වස්සිකසාටිකය ඇතිකල්හි නිර්වස්ත්‍රව ශරීරය සෝදයිද දුකුළා ඇවැත්වේ. ග්‍රීෂ්ම කාලය මසකට වඩා අඩුව ඉතිරිවූයේයයි විමති ඇත්තේද දුකුළා ඇවැත්වේ ග්‍රීෂ්ම කාලය මසකින් අඩුයයි යන හැඟීම ඇත්තේ ඇවැත් නොවේ.

65 ග්‍රීෂ්ම කාලයෙහි අඩමසකට වඩා අඩුවූයේ වැඩි වූයේය යන සංඥා ඇත්තේ දුකුළා ඇවැත්වේ. අඩමසකට වඩා අඩුවෙන් ග්‍රීෂ්ම කාලය ඉතිරි කල්හි විමති ඇත්තේ දුකුළා ඇවැත්වේ. ග්‍රීෂ්ම කාලයෙහි අඩමසකට වඩා අඩුවූයේ අඩුය යන හැඟීම් ඇත්තේද ඇවැත් නොවේ.

66 ග්‍රීෂ්ම කාලයට මාසයක් ඉතිරියයි වැසිසළු සිවුරක් සොයයිද, ග්‍රීෂ්ම කාලයට අඩමසක් ඉතිරියයි මසා අඳීද, ග්‍රීෂ්ම කාලයට මාසයකට අඩුකාලයක් ඉතිරියයිද වැසි සළු සිවුරක් සොයයිද ග්‍රීෂ්ම කාලයට අඩමසකට වඩා අඩුව ඉතිරි වූයේයයි මසා අඳියිද, වැසිසළු සිවුර තිබී කල්හි, වැස පසුවට තබයිද, වැසි සළු සිවුර ඇඳි කල්හි වැස පසුකරයිද, සෝදවා තැබියයුතුයි. කාලයෙහි ඇඳියයුතුයි. පැහැරගත් සිවුරු ඇත්තාහටද නැතිවූ සිවුර ඇත්තාහටද විපත්තීන්හිදීද උමතුවූවහුටද ආදිකර්මිකයාටද ඇවැත් නොවේ.

---

## 5 චීවර අච්ඡින්දන ශික්ෂාපදය

67 (මෙහි 1 අතීයතයේ 1 (i)) එකල්හි වනාහි ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර තෙමේ සහෝදරයාගේ සද්ධිවිහාරික භික්ෂුවට "ඇවැත්නි, අපි දනවු හැසිරීමට යමුයි" කීයේය. "ස්වාමීනි, මම නොයන්නෙමි. දුබල සිවුරු ඇත්තෙමියි" කීයේය. "ඇවැත්නි, එව මම ඔබට සිවුර දෙමියි" ඔහුට සිවුරක් දුන්නේය. "ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේ වනාහි දනවු හැසිරීමට වඩිනාසේයැයි ඇසුයේය. ඉක්බිති ඒ භික්ෂුහට 'මම දැන් ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍රයන් හා දනවු හැසිරීමට නොයන්නෙමි. භාග්‍යවතුන් වහන්සේ සමග දනවු හැසිරීමට යන්නෙමියි' මෙසේ සිතවිය. ඉක්බිති ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍රතෙම ඒ භික්ෂුවට "ඇවැත්නි, දැන් එව, දනවු හැරිහැරීමට යන්නෙමුයි" කීයේය "ස්වාමීනි, මම ඔබ සමග දනවු හැසිරීමට නොඑන්නෙමි. භාග්‍යවතුන් වහන්සේ සමග දනවු හැසිරීමට යන්නෙමියි" කීයේය. ඇවැත්නි, මම තොපට මා සමග දනවු හැසිරීමට යන්නේයයි. යම සිවුරක් දුන්නෙමියයි" කිපියේ නොසතුටු වූයේ සිවුර පැහැර ගත්තේය.

68 ඉක්බිති ඒ මහණතෙම භික්ෂූන්ට මේ කාරණය සැල කෙළේය. යම් ඒ භික්ෂු කෙනෙක් අල්පේච්ඡවූවාහුද ඔව්හු 'කෙසේ නම් ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රතෙම භික්ෂුවක්හට තෙමේම සිවුරක්දී පැහැර ගන්නේදැයි' දොස්කියත්, නොසතුටු ප්‍රකාශකරත්. නොසතුටු වචන කියත්. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැල කෙළේය. "උපනන්දය, ඔබ භික්ෂුවක්හට තෙමේම සිවුරක්දී කිපියේ නොසතුටු වූයේ පැහැර ගන්නෙහිද?" "භාග්‍යවතුන් වහන්ස ඇත්තය." භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළසේක. හිස් පුරුෂයෙනි, කෙසේ නම් තෙපි භික්ෂුවක්හට තෙමේම සිවුරක්දී කිපියේ නොසතුටු වූයේ පැහැරගන්නෙහිද? හිස් පුරුෂයෙනි, මෙය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිසත් (මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 80 v)

69 "යම්කිසි භික්ෂුවක් භික්ෂුවක්හට තෙමේම සිවුරක්දී කිපියේ නොසතුටු සිත් ඇතියේ පැහැරගනී නම් හෝ පැහැර ගන්වා නම් හෝ නිසගි පචිති වේ."

70 "යමෙක් වනාහී" යනු "භික්ෂු" යනු (මෙහි 1 පාරාජිකයේ පද භාජනීයේ 1–2) "භික්ෂුවගේ" යනු අන් භික්ෂුවකගේ යනුයි. "තෙමේ" යනු තෙමේදී යනුයි. "සිවුරක්" නම් සාවැදෑරුම් සිවුරු අතුරින් හාරදීමට අන්තිම සුදුසුකම් ඇති සිවුරු අතුරින් එකක්. "කිපියේ නොසතුටු සිත් ඇත්තේ" යනු නොඇලුනේ පහර -- ලැබූ සිත් ඇත්තේ. තදවූ සිත් ඇත්තේ. "පැහැර ගන්නේය" යනු තෙම පැහැර ගනීද නිසගි පචිති වේ. පැහැර ගන්වන්නේය. යනු අනිකෙකුට අණකරවයි. දුකුළා ඇවැත්වේ. වරක් අණවූයේ බොහෝකොට පැහැරගනීද නිසගි වේ. සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට හෝ හාරදියයුතුයි.

71 "මහණෙනි, මෙසේද වනාහී හාරදියයුතුයි. 'ස්වාමීනි, මගේ මේ සිවුර භික්ෂුවකට තමන්මදී පැහැර ගන්නාලදී. නිසගිවිය. මම මෙය සඞ්ඝයාට හාර දෙමියි. කියාද දෙන්නේයයි කියාද, දෙන්නාහුය කියාද, ආයුෂ්මතුන්ට දෙමි කියාද දියයුතුයි.

62 "උපසපන්වූවකුට උපසපන් වූයේය, යන හැඟීම් ඇත්තේ සිවුරක්දී කිපියේ නොසතුටුවූයේ පැහැර ගනීනම් හෝ පැහැරගන්වා නම් හෝ නිසගි පචිති වේ. උපසම්පදා වූමෙකු කෙරෙහි විමතිවූයේ සිවුරක්දී කිපියේ නොසතුටු වූයේ පැහැර ගනීනම් හෝ පැහැර ගන්වා නම් නිසගි පචිති වේ. උපසපන් වූමහු කෙරෙහි උපසපන් නොවූයේය. යන හැඟීම් ඇත්තේ සිවුරක්දී කිපියේ නොසතුටු වූයේ පැහැරගනී නම් හෝ පැහැරගන්වා නම් හෝ නිසගි පචිති වේ.

63 අන් පිරිකරක්දී කිපියේ නොසතුටුවූයේ පැහැර ගනී නම් හෝ පැහැර ගන්වා නම් හෝ දුකුලා ඇවැත් වේ. උපසම්පදා නොවූවෙකුට සිවුරක් හෝ අන්පිරිකරක් හෝ දී කිපියේ නොසතුටුවූයේ පැහැර ගනීනම් හෝ පැහැරගන්වා නම් හෝ දුකුලා ඇවැත් වේ. උපසපන් නොවූවකු කෙරෙහි විමති ඇත්තේ දුකුලා ඇවැත් වේ. උපසපන් නොවූමෙකු කෙරෙහි උපසපන් නොවූයේය යන හැඟීම් ඇත්තේ දුකුලා ඇවැත් වේ. තෙමෙම හෝ දෙයිද, ඔහු කෙරෙහි විශ්වාසයෙන් ගනීද, උමතුවූවහුටද, ආදිකර්මිකයාටද ඇවැත් නොවේ

---

## 6 සූත්‍ර විඥප්ති ශික්ෂාපදය

64 එකල්හි වනාහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ රජගහ නුවර ලෙහෙනුන්ට බත්වැටුප් දුන් වේළුවනාරාමයේ වාසය කරණසේක. එකල්හි වනාහි ඡබ්බග්ගිය භික්ෂූහු සිවුරු කරණ කාලයේ බොහෝ නූල් ඉල්ලූවාහුය. සිවුරු කොට නිමිකල්හිද බොහෝ නූල් ඉතිරිවූයේමැ. ඉක්බිති ඡබ්බග්ගිය භික්ෂූන්ට මේ අදහස විය. "ඇවැත්නි, එසේ නම් අපි තවනූල් ඉල්වා රෙදිවියන්නන් ලවා සිවුරක් වියවන්නෙමු' කියාහ. ඉක්බිති ඡබ්බග්ගිය භික්ෂූහු තවත් නූල් ඉල්වා රෙදිවියන්නන්ලවා සිවුරක් වියෙව්වාහුය. සිවුර වියූ කල්හිද බොහෝ නූල් ඉතිරිවූයේ වේ. තුන්වෙනුවත් ඡබ්බග්ගිය භික්ෂූහු තමත් නූල් ඉල්වා රෙදිවියන්නන් ලවා සිවුරක් වියෙව්වාහුය "ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ, කෙසේ නම් තමාමම නූල් ඉල්වා රෙදිවියන්නන්ලවා සිවුරක් වියවත්දැයි"

දොසකියත් නොසතුටු ප්‍රකාශකරත්. නොසතුටු වචන කියත්, භික්ෂූහු දොස්කියන්නාවූ නොසතුටු ප්‍රකාශ කරන්නාවූ නොසතුටුබස් කියන්නාවූ ඒ මිනිසුන්ගේ වචන ඇසූහ ය ඒ භික්ෂු කෙනෙක් අල්පේච්ඡවූවාහුද ඔව්හු "කෙසේ න ජබ්බග්ගිය භික්ෂූහු තෙමෙම නූල් ඉල්වා රෙදිවියන්නන් ලවා සිවුරක් වියවත්දැයි දොස්කියත්, නොසතුටු ප්‍රකාශකරත් නොසතුටු වචන කියත්.

65 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට ෙ කාරණය සැලකළාහුය. "මහණෙනි, තෙපි තෙමෙම නූල් ඉල්වා රෙදිවියන්නන් ලවා සිවුරක් වියෙව්වාහු ඇත්තද?" "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය," භාග්‍යමත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළසේක. "හිස් පුරුෂයෙනි, කෙසේනම් තෙපි තෙමෙම නූල් ඉල්වා රෙදිවියන්නන්ලවා සිවුරක් වියවන්න හුද? හිස් පුරුෂයෙනි, මෙය නොපැහැදුනවුන්ගේ පැහැදී (මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v) )

66 "යම් භික්ෂුවක් තෙමෙම නූල් ඉල්වා රෙදිවියන්නන් ලවා සිවුරක් වියවයිද, නිස්සගි පචිතිවේ.

67 "යමෙක් මහණි" යනු "භික්ෂු යනු" (මෙහි 1 පාරාජිකයේ පද භාජනියේ 1-2) "තෙමෙම" යනු තමන් ඉල්වා. "නූල්" නම් නූල් සය වර්ගයකි. පමටා, කපු, කොෂවලින් ගත්තා නූල්, ලොම, හන, මැහැරි, "රෙදි වියන්නන් ලවා" යනු ඔවුන් ලවා යනුයි. වියවයිද ක්‍රියාවෙහි දුකුළා ඇවත් වේ ලැබීමෙහි නිස්සගි පචිතිවේ. සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට හෝ හාරදිය යුතුයි.

68 "මහණෙනි, මෙසේද වනාහි හාරදියයුතුය. 'ස්වාමීනී, මාගේ මේ චීවරය තෙමෙම නූල් ඉල්වා රෙදිවියන්නන්ලවා වියවනලදී. නිස්සගිවිය. මම මෙය සඞ්ඝයාට දෙමියි, කියාද දෙන්නේය කියාද දෙන්නාහුය කියාද, ආයුෂ්මතුන්ට දෙ කියාද දියයුතුයි.'

69 වියවූ කල්හි වියවූයේය යන හැඟීම් ඇත්තේද නිස්සගි පචිතිවේ. වියවූකල්හි විමතී ඇත්තේද නිස්සගි පචිතිවේ.

වියූ කල්හි නොවියූයේය, යන හැඟීම ඇත්තේද, නිසගි පචිත්තිවේ. නොවියූ කල්හි වියූයේය යන හැඟීම ඇත්තාහටද දුකුලා ඇවැත්වේ නොවියූ කල්හි විමති ඇත්තේද දුකුලා ඇවැත්වේ නොවියූ කල්හි නොවියූයේය, යන හැඟීම ඇත්තාහටද ඇවැත් නොවේ.

70 සිවුරක් වියන්නට දීමෙහි පටියෙහි අංසබඩයෙහි පාත්‍රා පසුම්බි දීමෙහි, පෙරහන් කඩෙහි හැයන්ට දීමෙහි, පැවරුවන්ට දීමෙහි අනිකෙකු සඳහා ගැනීමෙහි තමන්ගේ ධනයෙන් ගැනීමෙහි උමතුවූවහුට, ආදිකර්මිකයාට යන මොවුන්ට ඇවැත් නොවේ

71 (මෙහි 1 අධිකරණයේ 1(i)) එකල්හි වනාහි (ii) එක්තරා පුරුෂයෙක් රටින් පිට යන්නේ භාර්‍යාවට මෙසේකීය. නූල් රැස්කොට 'අසවල් රෙදි වියන්නාට දෙව. සිවුරක් වියවා තබව. ආකල්හි ආර්‍ය උපනන්ද තෙරුන් සිවුරකින් අන්දවන්නෙ නෙමියි'' කීයයි (iii) පිඩු පිණිස හැසිරෙන එක්තරා භික්ෂුවක් මේ වචනය කියන්නාවූ ඒ පුරුෂයාගේ වචන ඇසුයේය. ඉක්බිති ඒ මහණතෙම උපනන්ද ශාක්‍ය පුත්‍රතෙමේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රට ''ඇවැත්නි, උපනන්ද ඔබ මහ පින් ඇත්තෙහි. අසවල් පලාතෙහි(මෙහි (ii)''ඇවැත්නි, ඇත්තේය. හෙතෙම මට උපස්ථාන කරන්නෙකැයි'' කීයේය. ඒ රෙදි වියන්නාද ආයුෂ්මත් උපනන්දගේ උපස්ථායකයෙකි.

72 ඉක්බිති ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍රතෙමේ ඒ රෙදි වියන්නා යම් තැනෙක්හිද එහි පැමිණියේය පැමිණ රෙදි වියන්නාට (ii)) ඇවැත්නි, මේ සිවුර මා උදෙසා වියන්නෙහි නම් දික්ද කරව පලල්ද කරව, ඝනද කරව, හැම තැනම සමකොට විවීමද කරව, හැම තැනම නූල් සමකොට තන්හි පහරන ලද්දක්ද කරව. මොනවට ඉරී ගසන ලද්දක්ද කරව. කොස්සෙන් ගසා මොනවට මදනාලද්දක්ද කරවයි'' (iii) කීයේය. ''ස්වාමීනි, මට මේ නූලෙන් සිවුරක් වියවයි ඔව්හු මට නූල් රැස්කොට දුන්නාහ. ස්වාමීනි, දික්ද

පලල්ද ඝනද නොකළහැක. මනාකොට විම්මද, ගැසීද, සීරී ඇදීමද, මැදීමද කළහැක.' 'ඇමැත්නි, ඔබ එසේවීන දික්ද පලල්ද, ඝනද කරව, ඒ නූල් ප්‍රමාණවත් නොවන බව දන්වම.

73 ඉක්බිති ඒ රෙදි වියන්නා ගෙනා පරිදි නූල් යන්ත්‍රයෙහි දමා ඒ ස්ත්‍රිය යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ඒ ස්ත්‍රියට "ආර්යාවෙනි නූල් මදියයි" කීයේය. "ඇමැත්නි, මා විසින් දුන් නූල් වලින් සිවුරක් වියවයි මා කීවා නොවේද?" "ආර්යාවෙනි, ඔබ මේ නූල් වලින් සිවුරක් වියවයි කීයේ ඇත්තය. එතකුදුවුවත් මට ආර්ය උපනන්ද තෙමේ ඇමැත්නි ඔබ ඉදින් දික්ද පලල්ද ඝනද කරන්නේ නම් ඒ නූල් ප්‍රමාණවත් නොවේයයි කියවයි" කීවේය. ඉක්බිති ඒ ස්ත්‍රී තොමෝ යම්තරමක් නූල් පළමු දුන්නේද එපමණම පසුවද දුන්නාය.

74 ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර තෙම ඒ පුරුෂ තෙම පිටරට විසීමෙන් ආපසු ආයේයයි ඇසුවේය. ඉක්බිති ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර තෙම ඒ පුරුෂයාගේ වාසස්ථානය යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ පනවන ලද අස්නෙහි හිඳසිටියේය. ඉක්බිති ඒ පුරුෂ තෙම ආයුෂ්මත් උපනන්ද තෙමේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක හුන් ඒ පුරුෂ තෙම ආර්යයාවට "ඒ සිවුර වියවන ලද්දේදැයි" ඇසීය. "ආර්යය, එසේය. ඒ සිවුර වියවන ලද්දේයයි" කීයේය. "ගෙනෙව, ආර්ය උපනන්ද තෙරුන් සිවුරින් අන්දවන්නෙමියි" කීයේය.

75 ඉක්බිති ඒ ස්ත්‍රී තොමෝ ඒ සිවුර බැහැරකොට ස්වාමියාට දී මේ කාරණය සැලකෙළේය. ඉක්බිති ඒ පුරුෂ තෙමේ ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍රයන්ට සිවුරදී දොස් කියයි. නොසතුට ප්‍රකාශ කරයි, නොසතුටු වචන කියයි. 'මේ ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ බොහෝ ආශා ඇත්තෝය. ලද දෙයින් නොසතුටු වන්නෝය, මොවුන් සිවුරකින් අන්දවන්ට පහසු නොවේ. ආර්ය උපනන්ද තෙමේ කෙසේනම් ත ▸

මකින් පෙර නොපවරණ ලද්දේ ගෘහපතියෙකුගේ රෙදි වියන්නා වෙත පැමිණ සිවුරෙහි නොයෙක් විධානයට පැමිණෙන්නේදැයි" කියායි. භික්ෂූහු දෙස් කියන්නාවූ නොසතුට ප්‍රකාශ කරන්නාවූ නොසතුටු බස් කියන්නාවූ ඒ පුරුෂයාගේ වචන ඇසූහ. යම් භික්ෂූ කෙනෙක් අල්පෙච්ඡවූවාහුද ඔව්හු දෙස් කියත් නොසතුට ප්‍රකාශ කරත්, නොසතුටු බස් කියත්. "කෙසේනම් ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රතෙම පෙර නොපැවරූයේ ගෘහපතියෙකුගේ රෙදි වියන්නන් වෙත පැමිණ සිවුරෙහි විධානයට පැමිණෙන්නේදැයි" කියායි.

76 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. උපනන්දය, ඔබ පෙර නොපවරණ ලද්දේ ගෘහපතියෙකුගේ රෙදිවියන්නන් වෙත පැමිණ සිවුරෙහි විධානයට පැමුණුණේ ඇත්තදැයි" ඇසූසේක. 'භාග්‍යවතුන් වහන්ස, ඇත්තය.' 'උපනන්දය, තොපගේ නෑයෙක්ද නොනෑයෙක්දැයි' ඇසූසේක. 'භාග්‍යවතුන් වහන්ස, නොනෑයෙකැයි' කීයේය. 'හිස් පුරුෂයෙනි, නොනෑයෝ නොනෑයෙකුට සුදුස්ස හෝ නුසුදුස්ස හෝ ඇති බව හෝ නැති බව නොදනිති. හිස් පුරුෂය, ඔබ එහි පෙර නොපවරණ ලද්දේ නොනෑ ගෘහපතියෙකුගේ රෙදි වියන්නන් වෙත පැමිණ සිවුරෙහි අධික විධානයට පැමුණුනෙහිද? හිස් පුරුෂය මෙය නොපැහැදුනවුන්ගේ (මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v))

77 භික්ෂුව උදෙසා වනාහි නොනෑවූ ගෘහපතියෙක් හෝ ගෘහපතිනියක් රෙදි වියන්නන් ලවා සිවුරු වස්ත්‍රයක් වියවානම් ඒ මහණතෙම පෙර නොපවරණ ලද්දේ එහි රෙදි වියන්නන් වෙත පැමිණ ඇවැත්නි, මේ සිවුරු පිළිය මා උදෙසා වියනු ලැබේ. දික්ද කරව්, පුළුල්ද, ඝනද, සම්සේව වීමද, සම්සේව තන්ති ගසනලද්ද, මනාසේව ඉරි ගසනලද්ද, මොනවට මදනාලද්ද, කරව්. අපිද ආයුෂ්මතුන්ට කිසිවක් දුන්නෙමුනම් ඉතා මැනවයි කියා ඉදින් සිවුරෙහි අධික විධානයට පැමිණියේ නම් මෙසේත් කියා ඒ භික්ෂුතෙම කිසිවක් යටත්පිරිසෙයින් පිණ්ඩපාත මාත්‍රයකුදු දුන්නේනම් නිස්සග්ගි පචිති වේ."

78 "භික්ෂුව උද්දෙසා වනාහි" යනු භික්ෂුසඞ්ඝයා උද්දෙසා භික්ෂුව අරමුණුකොට භික්ෂුවක් අදවනු කැමැත්තේ යනුයි. "නොනෑනම" (මෙහි 4 පුරාණ චීවර ශික්ෂාපදයේ 53 (ii)) "ගෘහපතියා" නම් යම්කිසිවෙක් ගෙයි අධිපතිකොට වෙසේද ඔහුයි. "ගෘහපතිනී" නම් යම් ස්ත්‍රියක් ගෙහි අධිපතිව වෙසේද ඇයයි. "වියන්නන් ලවා" යනු පේෂකාරයන් ලවාය. "සිවුරක්" නම් සිවුරු සය අතුරින් එක්තරා සිවුරකි. පවරාදීමට සුදුසු අන්තිම සිවුරයි "වියවන්නේය" යනු වියවයිද, 'එහි ඒ භික්ෂුව" යනු යම් භික්ෂුවක් උද්දෙසා සිවුර වියයිද ඒ භික්ෂුවයි. "පෙර නොපැවරූ" යනු පෙර නො කියන ලද්දේවේ යනුයි. ස්වාමීනි, නුඹවහන්සේට කෙබඳු සිවුරකින් ප්‍රයෝජන ඇත්තේද? නුඹවහන්සේට කෙබඳු සිවුරක් වියවන්නේදැයි කියයි. 'රෙදි වියන්නන් වෙත පැමිණ' යනු ගෙට හෝ යම්කිසි තැනෙක්හි එළඹ යනුයි. සිවුරෙහි අධික විධානයට පැමිණෙයි' යනු (මෙහි 72 (ii)) බලයි. "අපිදු ආයුෂ්මතුන්ට කිසිවක් දෙන්නට වුවමනායයි ඒ මහණතෙම මෙසේද කියා කිසිවක් දෙන්නේද, යටත් පිරිසෙයින් පිණ්ඩපාත පමණකුත් දෙන්නේද' යනු 'පිණ්ඩපාත නම් කැඳද, බත්ද, කැවිලිද, සුනු පිඩක්ද, දැහැටි දණ්ඩක්ද, දමල්ලේ නූලක්ද යටත්පිරිසෙයින් බණක්වත් කියා නම් ඔහුගේ වචනයෙන් දික්ද, පළල්ද, ඝනකොට විසීමද, තරයීද, සෙදීමෙහි දුකුලාවේ ලැබීමෙහි නිස්සග්ගි පචිත්තියවේ. සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට හෝ භාරදියයුතුයි.

79 "මහණෙනි, මෙසේද වනාහි භාරදිය යුතුය, 'ස්වාමීනි, මාගේ මේ සිවුර පෙර නොපැවරූයේ නෑයෙකු නොවන ගෘහපතියකුගේ රෙදිවියන්නන් වෙත පැමිණ සිවුරෙහි අධික විධානයට පැමිණියෙම් නිස්සග්ගියවේ. මේය මම සංඝයාට භාරදෙමියි කියාද දෙන්නේය. කියාද දුන්නාහුය කියාද ආයුෂ්මතුන්ට දෙමි කියාද දියයුතුයි. නොනෑයකු කෙරෙහි නෑයෙකු නොවේය යන අදහස් ඇතිව පෙර නොපැවරූ ගෘහපතියකුගේ රෙදි වියන්නන් වෙත පැමිණ සිවුරෙහි අධික විධානයට පැමිණේද නිස්සග්ගි පචිත්තියවේ. නොනෑ වූවෙකු කෙරෙහි විමති ඇත්තේ පෙර නොපවරණ ලද්

ගෘහපතියෙකුගේ රෙදි වියන්නන් වෙත පැමිණ සිවුරෙහි විධානයට පැමිණෙසිද නිස්සග්ගි පචිත්තියවේ. නෑනොවූවෙකු කෙරෙහි නෑයෙකි යන හැඟීම් ඇත්තේ පෙර නොපැවරූයේ ගෘහපතියෙකුගේ රෙදිවියන්නන් වෙත පැමිණ සිවුරෙහි අධික විධානයට පැමිණේද නිස්සග්ගි පචිත්තියවේ. නෑයෙකු කෙරෙහි නෑයෙක් නොවේය යන හැඟීම් ඇත්තෝහට දුකුලා ඇවැත්වේ. නෑයෙකු කෙරෙහි විචිකිති ඇත්තේ දුකුලා ඇවැත්වේ. නෑයෙකු කෙරෙහි නෑයෙක්ය යන හැඟීම් ඇත්තේ ඇවැත්නොවේ. නෑයන්ට, පැවරූවන්ට, අනිකෙකු සඳහා, තමන්ගේ ධනයෙන්, වටිනා එකක් වියවනු කැමැත්තාට නොවටිනා එකක් වියම්ද, උමතුවූවහුට ආදි කර්මිකයාට ඇවැත්වේ.

## 8 අච්චේක චීවර ශික්ෂාපදය

80 (මෙහි 1 අතිරේකයේ 1 (i)) එකල්හි වනාහි එක්තරා මහාමාත්‍යයෙක් පිටරට යන්නේ "භික්ෂූන් සමීපයට පින්වත්හු එත්වා. වස්සාවාසික සිවුරක් දෙමියි" දූතයෙකු යැවීය. භික්ෂූහු වස්වීසූවන්ට භාග්‍යවතුන් වහන්සේ විසින් වස්සාවාසික සිවුරක් අනුදන්නා ලද්දේයයි සැක ඇතිව නොගියාහ. ඉක්බිති ඒ මහාමාත්‍යතෙම "කෙසේ නම් භික්ෂූහු මා විසින් දූතයෙකු යැවූ කල්හි නොඑන්නෝදැයි" දොස් කියයි නොසතුට ප්‍රකාශ කරයි. නොසතුටු වචන කියයි, මම සේනාව සමගයමි. ජීවිතය නොසිතිය හැකියි. මරණය නොසිතිය හැකියි." භික්ෂූහු දොස් කියන්නාවූ නොසතුට ප්‍රකාශ කරන්නාවූ නොසතුටුබස් කියන්නාවූ ඒ මහාමාත්‍යයාගේ වචන ඇසූවාහුය.

81 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට මේකාරණය සැලකළාහුය. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ මේනිදානයෙහි මෙසිඩියෙහි දැහැමිකථා කොට භික්ෂූන්ට කථාකළසේක. "මහණෙනි, ඉක්මන් සිවුර පිළිගෙන බහා තබන්නට අවසර දෙමි. 'එකල්හි වනාහි භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ විසින් ඉක්මන් සිවුරපිළිගෙන බහාතබන්නට අනුදන්නා ලද්දේයයි' ඉක්මන් සිවුර පිළිගෙන සිවුරු කරණ කාලයත් ඉක්මවත්. ඒ වස්ත්‍ර සිවුරු දණ්ඩෙහි පොට්ටනි බැඳ තිබෙත්.

82 ආයුෂ්මත් ආනන්දතෙම විහාර චාරිකාවෙහි ඇවිදින්නේ ඒ වස්ත්‍ර සිවුරු දමන ලියෙහි පොදිබැඳ තිබෙනු දැක භික්ෂූන්ට "ඇවැත්නි, සිවුරු ලියෙහි පොදිබැඳ ඇති වස්ත්‍ර කවරක් හුගේ දැයි" ඇසීය. "ඇවැත්නි, අපේ ඉක්මන් සිවුරු යයි" කීවාහුය. "ඇවැත්නි, මේ වස්ත්‍රය කොපමණ කල්සිට තබන ලද්දාහුදැයි" ඇසීය. ඉක්බිති ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට තැබූ පරිදි සැලකළාහුය. ආයුෂ්මත් ආනන්දතෙම "මොවුහු කෙසේනම් ඉක්මන් සිවුරු පිළිගෙන සිවුර කරණ කාලය ඉක්මවත්තාහුදැයි" දොස් කීයයි. නොසතුට ප්‍රකාශ කරයි, නොසතුටු වචන කියයි.

83 ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙම භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළේය. "මහණෙනි, මහණ ඉක්මන් සිවුරක් පිළිගෙන කෙසේනම් සිවුරු කරණකාල ඉක්මවත්යනු ඇත්තාදැයි" ඇසූසේක, "භාග්‍යවතුන්වහන්ස, ඇත්තය. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළසේක 'හිස්පුරුෂයෙනි, කෙසේනම් තෙපි ඉක්මන් සිවුරක් පිළිගෙන සිවුරු කරණ කාලය ඉක්මවත්ද මහණෙනි, මෙය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිසත්(මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v)

84 "වප්මස මැදී පොහොය දස දවසකින් පැමිණෙන කල්හි භික්ෂුවක් හට මේ වනාහි ඉක්මන් සිවුරක් ලැබුනේවිත ඉක්මන් සිවුරකැයි හඟින්නාවූ එම භික්ෂුව විසින් පිළිගත යුත්තේය පිළිගෙණ චීවර කාල කැමැති සමය යම්තාක් කම් එතාක් තැබිය යුත්තේය. ඉදින් ඒ චීවර කාල සමයෙන් මත්තෙහි තබන්නේ නම් නිසගි පචිතිවේ.

85 'දසදවසකින් නොපැමිණි' යනු පවාරණයට දස දවසක් තිබියදී යනුයි, "වප්මස මැදි පොහොය" යනු වප් මාසයේ පැවරීම කියනු ලැබේ. "ඉක්මන් සිවුර නම සේනාවෙහි හෝ යනු කැමැත්තේ මෙහිද රටින් පිට හෝ යනු කැමැත්තේ වේද ලෙඩෙක් හෝ වේද ගැබිනියක් හෝ

යේද, අශ්‍රද්ධාවන්තයාට හෝ ශ්‍රද්ධාව ඇතිවූයේ වේද නොපැහැදුනහුට හෝ පැහැදීම ඇතිවූයේවේද මෙසෙමේ ඉදින් භික්ෂූන් සමීපයට දූතයෙකු යවන්නේය. "පින්වත්හු එත්වා. වස්සාවාසිකයක් දෙමියි' කියයි. මෙය ඉක්මන් සිවුර නමවේ. ඉක්මන්යයි හඟින්නාවූ මහණ විසින් පිළිගත යුතුයි. පිළිගෙන සිවුර කරණ කාලය දක්වා බහා තැබිය යුතුයි. මෙය ඉක්මන් සිවුරක්යයි ලකුණුකොට තැබිය යුතුයි. "සිවුරු කරණ කාලය' නම් කඨිනය නොඇතුරූ කල්හි වර්‍ෂා කාලයේ අන්තිම මාසයයි. කඨිනය ඇතුරූ කල්හි පස්මසෙකි. ඉදින් ඉන් මත්තෙහි තබයිද යත්හු කඨිනය නොඇතුරූකල්හි වස්කාලයාගේ අන්තිම දවස ඉක්මවයිද නිස්සගි පචිත්තිවේ. කඨිනය ඇතුරූ කල්හි කඨිනය ඉදිරෙන (බලය නැතිවෙන) දවස ඉක්මවයිද නිස්සගිවේ. සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට හෝ භාරදිය යුතුය.

86 "මහණෙනි, මෙසේද වනාහි භාරදිය යුතුය 'ස්වාමීනි, මගේ මේ ඉක්මන් සිවුර සිවුරු කරණ කාලය ඉක්මවිය. නිස්සගි විය. මෙය මම සංඝයාට දෙමියි කියාද දෙන්නේය කියාද දුන්නාහුන කියාද ආයුෂ්මතුන්ට දෙමි, කියාද' දිය යුතුය.

87 ඉක්මන් සිවුරෙහි ඉක්මන් සිවුරය යන හැඟීම ඇත්තේ (ii) සිවුරු කරණ කාලය ඉක්මවයිද නිස්සගි පචිත්තිවේ (iii) ඉක්මන් සිවුරෙහි විමති ඇත්තේ සිවුරු කරන කාලය ඉක්මවයිද නිස්සගි පචිත්තිවේ ඉක්මන් සිවුරෙහි ඉක්මන් සිවුර නොවේයයි යන හැඟීම ඇත්තේ සිවුරු කරණ කාලය ඉක්මවයිද නිස්සගි පචිත්තිවේ. අධිෂ්ඨාන නොකළ සිවුරෙහි අධිෂ්ඨාන කළේය යන හැඟීම ඇතිව (මෙහි (ii) භාර නුදුන් සිවුරෙහි භාර දුන්නේය, යන හැඟීම ඇතිව අත්නොහළ සිවුරෙහි අත්හළේය යන අදහස් ඇතිව නැති නොවූ සිවුරෙහි නැතිවූයේය යන අදහස් ඇතිව විනාශ නොවූ සිවුරෙහි විනාශවූයේය යන අදහස් ඇතිව නොදැවුනු සිවුරෙහි දැවුනේය යන අදහස් ඇතිව පැහැර නොගත් සිවුරෙහි පැහැර ගත්තේය යන අදහස් ඇතිව සිවුරු කරණ

කාලය ඉක්මවයිද නිසගි පචිති වේ. නිසගිවූ සිවුර අත් නොහැර පරිභොග කරයිද දුකුලා ඇවැත් වේ. නොඉක්මුන් සිවුරෙහි ඉක්මුන් සිවුරය යන අදහස් ඇත්තේද දුකුලා ඇවැත්වේ. නොඉක්මුන් සිවුරෙහි විමති ඇත්තේ දුකුලා ඇවැත්වේ. නොඉක්මුන් සිවුරෙහි නොඉක්මුන් සිවුරය යන හැඟීම් ඇත්තේද ඇවැත් නොවේ. කාලය ඇතුලෙහි අධිෂ්ඨාන කරයිද, භාරදෙයිද, අත්හරියිද, නැතිවේද, මැකෙද්ද, දවාද පැහැර ගනීද විශ්වාස වශයෙන් ගනීත්ද උමතුවූවහුටද ආදි කර්මිකයාටද ඇවැත් නොවේ

## 9 සාසංක ශික්ෂාපදය

88 (මෙහි 1 අතියතයේ 1 (i) එකල්හි වනාහි භික්ෂූහු වස්විසූවාහු අරණ්‍යයෙහිවූ සෙනසුන්හි වාසය කරත්ද (ඉල් මසේදී) සොරු භික්ෂූන් ලැබූ ලාභ නැති කරත්.

89 භාග්‍යවතුන් වහන්සේට මේකාරණය සැලකළාහුය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ සිද්ධියෙහි දැහැමි කථාකොට භික්ෂූන්ට ආමන්ත්‍රණය කළ සේක. "මහණෙනි, වන සෙනසුන්හි වසන්නාවූ භික්ෂූන් විසින් තුන් සිවුරු අතරින් එක්තරා සිවුරක් ඇතුළු ගමෙහි බහා තබන්නට අවසර දෙමි,"

90 එකල්හි වනාහි භික්ෂූහු වන සෙනසුන්හි වසන්නාවූ භික්ෂූන්ට තුන් සිවුරු අතරින් එක්තරා සිවුරක් ඇතුල්ගමෙහි බහාතබන්ට අවසර දුන්නේයයි තුන් සිවුරු අතරින් එක්තරා සිවුරක් ඇතුළු ගමෙහි තබා සයමසට වඩා වෙන්ව වසත්. ඒ සිවුරු නැසෙත්. මැකෙත්, දැවෙත් මීයන් විසිනුදු කත්. භික්ෂූහු ඔසුරු දුර්ලභවූවාහු වෙත්, රූක්ෂ සිවුරු ඇත්තෝ වෙත්, භික්ෂූහු 'ඇවැත්නි, තොපි කුමක් හෙයින් දුර්ලභ සිවුරු ඇත්තාහුද රූක්ෂ සිවුරු ඇත්තාහුදැයි' ඇසූහ. ඉක්බිති ඒ භික්ෂූහු භික්ෂූන්ට මේ කාරණය දැන්වූය. යම් ඒ භික්ෂූ කෙනෙක් අල්පෙච්ඡවූවාහුද ඔව්හු දොස් කියත්. නොසතුට ප්‍රකාශ කරත්, නොසතුටු වචන කියත්, 'කෙසේ නම් භික්ෂූහු තුන් සිවුරු අතරින් එක්තරා සිවුරක් ඇතුළු ගමෙහි බහා තබා සයමසට වඩා වෙන්ව වසත්ද කියායි.'

91 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. 'මහණෙනි, භික්ෂූහු තුන් සිවුරු අතුරෙන් එක්තරා සිවුරක් ඇතුළු ගමෙහි බහා තබා රෑසයකට වඩා වෙන්ව වසත්ද?' ''භාග්‍යවතුන් වහන්ස, ඇත්තය' භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළසේක. මහණෙනි, ඒ හිස් පුරුෂයෝ කෙසේ නම් තුන් සිවුරු අතරින් එක්තරා සිවුරක් ඇතුළු ගමෙහි තබා රෑසයකට වඩා වෙන්ව වසත්දැයි'' ඇසූසේක. 'මහණෙනි, මෙය නොපැහැදුනවුන්ගේ (මෙහි 1 පාරාජිකයේ සුදින්න බණවරේ 30 (v))

92 පෙර වස් විසීම වැස වනාහි ඉල්මස මැදි පොහොය දක්වා වනයෙහි කරණ ලද සැක සහිතයයි දක්නා ලද බිය සහිතවූ යම් ඒ සෙනසුන් කෙනෙක් ඇද්ද, එබඳුවූ සෙනසුන්වල වාසය කරන්නාවූ භික්ෂුතෙම කැමතිවූයේ තුන් සිවුරු අතුරෙන් එක්තරා සිවුරක් ගොදුරු ගමෙහි තබන්නේය. ඒ භික්ෂුහට සිවුරෙන් වෙන්ව විසීමට කිසි කටයුත්තෙක් ඇත් නම් ඒ භික්ෂූහු විසින් රෑ සයක් වැඩිනොවී ඇති කාලයක් ඒ සිවුරෙන් වෙන්ව විසිය යුතුය. සංඝ සම්මුතියක් හැර ඉදින් එයින් මත්තෙහි වෙන්ව විසූයේනම්, නිසගි පචිති වේ.

93 ''වස්වැස වනාහී'' යනු වසන ලද වස් ඇත්තේ යනුයි. ''ඉල්මස මැදි පොහොය'' යනු ඉල්මසින් අවසන්වන සතර මාසය කියනු ලැබේ. ''අරණ්‍යයෙහිවූ යම් ඒ සෙනසුන් කෙනෙක් වෙත්ද'' යනු දුනු පන්සියයක් අන්තිම කොට ඇති අරණ්‍ය සෙනාසනය නම් වේ. ''භය සහිතවූ'' යනු ආරාමයෙහිද ආරාමය අවටද සොරු වාසය කළ තැන දකීද, අනුභව කළ තැන දකීද, සිටි තැන දකීද, හුන් තැන දකීද හොත් තැන දකීද බිය සහිතවූ නම් ආරාමයෙහිද ආරාමය අවටද සොරුන් විසින් නසනලද මිනිසුන් දකීත්ද මංපැහැර ගත්තාහු දකීත්ද, මට්ටම කළ තැන් දකීත්ද, එබඳු සෙනසුනක වසන භික්ෂුතෙම'' යනු මෙබඳු සෙනසුනක වසන භික්ෂුතෙමයි. ''කැමතිවන්නේ'' යනු බලාපොරොතුවන්නේ යනුයි. ''තුන් සිවුර අතින් එක්තරා සිවුරක්'' යනු දෙපට සිවුර හෝ

නසිපට සිවුර හෝ අඳනය හෝයි "ඇතුළු ගමෙහි ම ෙ තබන්නේය" යනු හාත්පස ගොදුරු ගමෙහි තබන්නේය. "ඒ භික්ෂුවට ඒ සිවුරෙන් වෙන්වීමට කිසි හේතුවක් වන්නේය" යනු හේතුවක් ඇත, කටයුත්තක් ඇත. "රෑ සයක් ඒ භික්ෂුව විසින් ඒ සිවුරෙන් වෙන්ව විසිය යුතුය" යනු රෑ සයක් සීමාකොට වෙන්ව විසිය යුතුයි. "සංඝ සම්මුතිය හැර" යනු සංඝ සම්මුතියෙන් පිට යනුයි "ඉදින් ඊටත් මත්තෙහි වෙන්ව වසන්නේය." යනු සත්වෙනි අරුණ නැගෙන කල්හි නිස්සගි වේ. සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට හෝ හැරදිය යුතුයි.

94 "මහණෙනි, මෙසේද වනාහි හැරදිය යුතුය. ස්වාමීනි, මාගේ මේ සිවුර රෑ සයකට වැඩිකොටකොට සඞ්ඝ සම්මතයක් නැතිව නිස්සගිය. මම මෙය සඞ්ඝයාට හැරදෙමි කියාද, දෙන්නේය කියාද දෙන්නාහුය කියාද ආයුෂ්මතුන්ට දෙමි' කියාද දිය යුතුයි. රෑ සයකට වඩා ඉකුත්වී ගිය සිවුරෙහි රෑ සයකට වඩා ඉක්ම ගියේය යන හැඟීම ඇත්තේ (ii) සඞ්ඝ සම්මතය හැර වෙන්ම වසයිද නිස්සගි පචිතිවේ. (iii) රෑ සයකට වැඩිවූ සිවුරෙහි විමති ඇත්තේ සඞ්ඝ සම්මතය හැර වෙන්ව වසයිද නිස්සගි පචිතිවේ. රෑ සයකට වැඩිවූ සිවුරෙහි අඩුය යන හැඟීම ඇතිව සඞ්ඝසම්මුතිය හැර වෙන්ම වසයිද, නිස්සගි පචිතිවේ. පච්චුද්ධරණය නොකළ කල්හි පච්චුද්ධරණය කෙළේය යන හැඟීම ඇත්තේද (මෙහි (ii) හැර) නුදුන් සිවුරෙහි හැරදුන්නේය යන හැඟීම ඇති කල්හිද (මෙහි (ii) නැතිනොවූ සිවුරෙහි නැතිවූයේය යන හැඟීම ඇති කල්හිද, විනාශ නොවූ සිවුරෙහි විනාශ නොවූයේය යන හැඟීම ඇති කල්හිද, නොදැවුණු සිවුරෙහි දැවුණේය යන හැඟීම ඇති කල්හිද, පැහැරනොගත් සිවුරෙහි පැහැරගත්තේය යන හැඟීම ඇති කල්හිද, සඞ්ඝසම්මුතිය හැර වෙන්ව වෙසෙයිද නිස්සගි පචිතිවේ. නිස්සගිවූ සිවුර හැරනොදී පරිභෝග කෙරේද දුකුලා ඇවැත්වේ. රෑ සයකට වඩා අඩු කාලයෙහි වැඩිය යන හැඟීම ඇත්තේද දුකුලා ඇවැත්වේ රෑ සයකට වඩා අඩු සිවුරෙහි විමති ඇත්තේ දුකුලා ඇවැත් වේ. රෑ සයකට වඩා අඩු සිවුරෙහි අඩුය යන හැඟීම ඇත්තේ

ඇවැත් නොවේ. රෑ සයක් වෙන්ව වසයිද, රෑ සයකට මඳ අඩුවෙන් වෙන්ව වසයිද, රෑ සයක් වෙන්ව වැස නැවත ගමට ඇවිත් වසයිද රෑ සයක් අතර අධිෂ්ඨානය අතහරිද හාරදෙයිද, නැසේද, වැනසේද, දැවේද, පැහැරගෙන යද්ද, විශ්වාස කමට ගනිද්ද, සඞ්ඝසම්මුතියෙන් ගනිද්ද, උමතුවූවහුටද ආදිකර්මිකයාටද ඇවැත් නොවේ."

## 10 පරිණත ශික්ෂාපදය

95 (මෙහි 1 අතිකාය 1 (i)) එකල්හි වනාහි සැවැත්නුවර එක්තරා පිරිසක් සඞ්ඝ සමූහයාට සිවුරු සහිත දානයක් මලදවා සිවුරු අන්දවන්නෙමුයි පිළියෙල කෙළේවී. ඉක්බිති ඡබ්බග්ගිය භික්ෂූහු ඒ පිරිස යම් තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ ඒ පිරිසට 'ඇවැත්නි, මේ සිවුරු අපට දෙවයි'ඉල් වූහ. 'ස්වාමීනි, අපි නොදෙමු. අප විසින් සංඝයාට වර්ෂයක්පාසා සිවුරු සහිත දානයක් පනවන ලද්දෙමුයි'කීවාහුය. 'ඇවැත්නි, සංඝයාට දායකයෝ බොහෝය. සංඝයාට බතපත් ලැබීම බොහෝයි. අපි තොප නිසා තොප බලාපොරොත්තුවෙන් මෙහි වසමු. ඉදින් තෙපි අපට නොදෙව් නම් නැවත මෙහි කවරෙක් අපට දේද? ඇවැත්නි, මේ සිවුරු අපට දෙවයි' කීවාහුය.

96 ඉක්බිති හෙහෙතම් ඡබ්බග්ගිය භික්ෂූන් විසින් කරදර කරණු ලබන්නේ සකස් කරණු ලද සිවුරු ඒ භික්ෂූන් සඳෙහාටදී සංඝයා බතින් වැළඳවූයේය. සංඝයාට සිවුරු සහිතව පිළියෙල කළ බත යම් ඒ භික්ෂු කෙනෙක් දනිත්ද, සමග භික්ෂූන් සිවුරු දුන්බැව් නොදනිත්. ඔව්හු "ඇවැත්නි සංඝයාට සිවුරු පිළිගන්වව්" "ස්වාමීනි, නැත. පිළියෙළකළ සිවුරු ආයුෂ්මත් ඡබ්බග්ගිය භික්ෂූහු තමන්ට හරවාගත්තාහුය.' යම් ඒ භික්ෂු කෙනෙක් අල්පේච්ඡවූවාහුද කෙසේ නම් ඡබ්බග්ගිය භික්ෂූහු දැන දැන සංඝයාට අයිති සාංඝික ලාභයක් තමන්ට හරවත්දැයි දොස් කියත්, නොසතුට ප්‍රකාශ කරත්, නොසතුටු වචන කියත්.

97 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුයි. 'මහණෙනි, තෙපිදන්නෝ සංඝයාට

අයත් සාංඝික ලාභයක් තමන්ට යොමු කරමින් යනු. ඇත්ත දැයි" ඇසූහ 'භාග්‍යවතුන් වහන්ස, ඇත්තය' භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හාකළ සේක "හිස් පුරුෂයෙනි, කෙසේනම් හෙපි දැන දැන සංඝයාට අයත් සාංඝික ලාභයක් තමන්ට හරවත්ද? හිස් පුරුෂයෙනි, මෙය නොපැහැදුනවුන් ගේ පැහැදීම පිණිසද (මෙහි 1 පාරාජිකයේ සුදින්න බණ වරේ 30 (v) )

98 "යම්කිසි භික්ෂුවක් දන්නේ සංඝයාට අයත් ලාභයක් තමන්සතු කරවාගැනීනම නිස්සග්ගි පචිත්තියවේ.

99 'යමෙක් මනාහි යනු භික්ෂු යනු (මෙහි 1 පාරාජිකයේ පදභාජනියේ 1–2 "දනී' නම් තෙමේ හෝ දනී අන්‍යයන් හෝ ඔහුට කියත්, හෙතෙම හෝ කියයි.' "සංඝයාට අයත්' නම් සංඝයාට දුන්නේවේ. පරිත්‍යාග කළේවේ. "ලාභය" නම් සිවුරු පිණ්ඩපාත ගිලන්පස බෙහෙත් පිරිකර යනුයි. යටත්පිරිසෙයින් සුණු පිඩක් වත්, දැහැටි කූරක්මත්, දශිඑතුලක්මත් යනුයි.'භාරදෙනලද' යනු දෙමුකරන්නෙමුයි. වචන පිටකළේ වෙයි. තමාට හරවාගනීයි ක්‍රියාවෙහි දුකුළා වේ. ලැබීමෙන් නිස්සගිවේ. සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට හෝ හරදිය යුතුය.

100 "මහණෙනි, මෙසේ මනාහි භාරදිය යුතුවෙයි. ස්වාමීනි, මාවිසින් සංඝයාට අයිති ලාභය දැන දැන තමාට හරවා ගන්නා ලදී. නිස්සග් විය. මම මෙය සංඝයාට භාර දෙමියි කියාද දෙන්නෝය කියාද දෙන්නාහුය කියාද ආයුෂ්මතුන්ට දෙමි' කියාද දියයුතුයි. පිරිනැමූ දෙය පිරිනැමූයේය යන අදහස් ඇතිව තමාට හරවයිද නිස්සගි පචිතිවේ. පිරිනැමූ දෙය කෙරෙහි විමති ඇත්තේ තමාට හරවයිද නිස්සගී පචිති වේ· පිරිනැමූ දෙයෙහි පිරිනොනැමූවේය යන හැඟීම ඇත්තේ තමාට පිරිනමවයිද නිස්සගි පචිතිවේ. සංඝයාට පිරිනැමූ දෙය අන් සංඝ පිරිසක හෝ චෛත්‍යයකට හෝ පිරිනමවයිද දුකුළා ඇවැත්වේ චෛත්‍යයකට පිරිනැමූවක් අන් චෛත්‍යයකට හෝ සංඝයාට හෝ ගණයාට හෝ පුද්-ගලයෙකුට හෝ පිරිනමවයිද දුකුළා ඇවැත්වේ. පුද්ගලයෙකුට

පිරිනැමුවක් අන් පුද්ගලයෙකුට හෝ සංඝයාට හෝ ගණයාට හෝ චෛත්‍යයකට හෝ පිරිනමවයිද දුකුලං ඇවැත්වේ. පිරිනොනැමූ දෙයෙහි පිරිනැමූ වේය. යන හැඟීම් ඇත්තේද දුකුලං ඇවැත්වේ. පිරිනොනැමූවෙහි විමති ඇත්තේද දුකුලං ඇවැත්වේ පිරිනොනැමූ දෙයෙහි පිරිනොනැමූයේය යන අදහස ඇත්තේද ඇවැත් නොවේ. කාට දෙමුදැයි අසනු ලබන්නේ යම් තැනෙක්හි තොපගේ දෙය ධර්මය ප්‍රයෝජන හෝ වන්නේද, සත්කාර හෝ ලැබෙන්නේද බොහෝ කල් පවත්නේද යම් තැනෙක්හි හෝ තොපගේ සිත පහදීද එහි දෙවයි කියයි. උම්තුවූවටද ඇදි කර්මික යාටද ඇවැත් නොවේ

තුන්වැනි පාත්‍රවර්ගය නිමි.

"ඇවැත්නි, නිසගි පචිති තිස උදෙසන ලද්දාහ. එහි ආයුෂ්මතුන් විචාරමි. කිම පිරිසිදු වන්නාහුද දෙවනුවත්, තුන්වෙනුවත් විචාරමි. කිම පිරිසිදු වන්නාහුද ආයුෂ්මත්හුද, මෙහි පිරිසිදුය. එහෙයින් නිශ්ශබ්ද වනුයි මේ පිරිසිදුකම මෙසේ දරමි."

නිසගි පචිති තිස නිමි.

(පාරාජික පාළිය නිමි.)

# 2 පාචිත්තිය පාළිය

## 1 මුසාවාද වග්ග

### 1 මුසාවාද ශික්ෂාපදය

"ආයුෂ්මත්නි, මේ අනූදෙනක්වූ පචිති ශික්ෂාපද දෙසීමට පැමිණෙත්.

1 (i) ඒ කාලයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර අනේපිඬු මහසිටාණන් කරවූ ජේතවනාරාමයෙහි වාසය කරන සේක. (ii) එකල්හි වනාහි ශාක්‍ය කුලයෙන් පැවිදිවූ හත්ථක නම් ස්ථවිරතෙමේ වාදයෙහි ඉදිරිපත්වූයේ වේ. හෙතෙම තීර්ථකයන් සමග කථාකොට 'මෙය මගේ වාදය නොවේයයි' නින්දකොට පසුව 'මෙය මගේ වාදයයි' එයටම එකඟවේ. (iii) දින හෝ තැන නියමකොට (iv) මුළාකරයි. තීර්ථකයෝ කෙසේ නම් ශාක්‍යපුත්‍ර හත්ථකතෙමේ අප සමග කථාකරන්නේ නින්දකොට එකඟවේද, (මෙහි (iii, මුළාකරන්නේදැයි (v) දොස් කියත්, නොසතුට ප්‍රකාශකරත්) නොසතුටු වචන කියත්. (vi) භික්ෂූහු දොස් කියන්නාවූ නොසතුට ප්‍රකාශ කරන්නාවූ ඒ තීර්ථකයන්ගේ බස් ඇසූහ.

2 ඉක්බිති ඒ භික්ෂූහු ශාක්‍යපුත්‍ර හත්ථකතෙමේ යම් තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ ශාක්‍යපුත්‍ර හත්ථක තෙරුන්ට "ඇවැත්නි, හත්ථකය, ඔබ තීර්ථකයන් සමග කථාකරන්නේ නින්දකොට පසුව එකඟවේද, එකඟවී නින්දකෙරේද, අනික් කරුණකින් අනිකක් වසයිද, බොරු කියයිද, දින හෝ තැන නියමකොට මුළාකරයිදැයි" ඇසූහ. ඇවැත්නි, මෙ තීර්ථකයෝ නම් පැරද්දිය යුතුයි යම් කෙනෙකු විසින් ඔවුනට ජයක් නොදිය යුතු නොවේද කියායි. යම් ඒ භික්ෂූ නමක් අල්පෙච්ඡවූවාහුද ලද දෙයින් සතුටුවූවාහුද, ලජ්ජා ඇත්තාහුද, කුකුස් ඇත්තෝද හික්මෙනු කැමැත්තෝද ඔව්හු කෙසේනම් ශාක්‍යපුත්‍ර හත්ථක (ස්ථවිර) තෙමේ තීර්ථකයන් සමග කථාකරන්නේ නින්දකොට එකඟවේද එකඟවී නින්ද

කෙරේද අනික් කරුණකින් අනිකක් වසයිද, දැන දැන බොරු කියයිද දැන නිශ්ශබ්දකොට මුළාකරයිදැයි (මෙහි 1 (v)) ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය.

3 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ ප්‍රකරණයෙහි භික්ෂු සංඝයා රැස්කරවා ඡන්න ශාක්‍ය පුත්‍රයන් විචාළේය. 'ඡන්නය, ඔබ (ii) චෝදකයන් සමග කථාකරන්නේ නිශ්ශබ්දකොට එකඟමෙහිද එකඟවී සිටිද, නොකෙරෙයිද, අනිකකින් අනිකක් වසන්නෙහිද දැන දැන බොරු කියන්නෙහිද, දැන හෝ නැත නිශ්ශබ්දකොට මුළාකරන්නෙහිදැයි' (iii) ඇසූසේක. "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය" (iv) භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ නින්දා කළසේක. හිස් පුරුෂය, ශාසනයට නොගැලපෙන, නුසුදුසු, ශ්‍රමණ භාවයට අයත් නොවූ නොකැප නොකටයුත්තක් කළේ නුසුදුසුය (v) හිස් පුරුෂය, කෙසේනම් ඔබ (මෙහි (ii)) 'හිස් පුරුෂය (iv) මෙය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිසද පැහැදුනවුන්ගේ පැහැදීම වැඩිවීම පිණිසද නොවේ. හිස් පුරුෂය, එතකුදුවුවත් මෙය නොපැහැදුනවුන්ගේ නොපැහැදීම පිණිසද පැහැදුනා ඇතැමෙකුගේ වෙනස්වීම පිණිසද වේ. (vii) ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂුවම නොයෙක් ආකාරයෙන් ගර්හාකොට අසංවරව කය වැඩීමෙහි අසංවර දිවිපැවැත්මෙහි බොහෝ ආශා ඇති බැවිහි ලද දෙයින් සතුටු නොවීමෙහි විවේකයට බාධාඇති කරන රැස්ව සිටීමෙහි කුසීත බවෙහි අගුණ කියා නොයෙක් ආකාරයෙන් සංවරකය වැඩීමෙහි සංවරව දිවිපැවැත්මෙහි අල්පෙච්ඡ බවෙහි, ලද දෙයින් සතුටු වීමෙහි කෙලෙස් ලියා හැරීමෙහි කෙලෙස් කම්පා කිරීමෙහි දුටුවන් පැහැදීමෙහි කෙලෙස් සිඳ බිඳ දැමීමෙහි පටන් ගත් වීර්යයෙහි ගුණ කියා භික්ෂූන්ට ඊට ගැලපෙන ඊට සුදුසු ධාර්මික කථාකොට භික්ෂූන්ට කථාකළසේක.

4 "මහණෙනි, එසේ නම් සඞ්ඝයාගේ යහපත පිණිස, සංඝයාගේ පහසුව පිණිස අප්‍රිය පැවතුම් ඇති දුශ්ශීල පුද්ගලයන්ට නිග්‍රහ පිණිස ප්‍රියශීලි භික්ෂූන්ගේ පහසු විහරණය

පිණිස මෛත්‍රලාභී විපාක දෙන කෙලෙස්වල සංවරය පිණිස පරලොව විපාක දෙන කෙලෙස්වල නැති කිරීම පිණිස නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිස පැහැදුනවුන්ගේ වැඩි පැහැදීම පිණිස ත්‍රිපිටක ධර්මයාගේ පැවැත්ම පිණිස සතර වැදෑරුම් විනයට පිහිට පිණිස භික්ෂූන්ට ශික්ෂාපද පනවන් නෙමි. මහණෙනි, මෙසේද වනාහි මේ ශික්ෂාපදය ප්‍රගුණ කරව්. දූන දූන බොරුකීමෙහි පචිති ඇවැත්වේ.”

5 “දූන දූන බොරුකීම් නම්” යනාදියෙහි මුල්කොට ඇති බොරු වචන පිළිතුරණ චෙතනාව, ශබ්දය, වචනය මාර්ගය, වචනයෙන් ඇඟවීම් අට වැදෑරුම් බාල පෘථග්ජනයන්ගේ භාෂිතය නොදක්නා ලද්දේ මා විසින් දක්නා ලද්දේයයි නො අසන ලද්ද මා විසින් අසන ලද්දේයයිද, නාසය දිව ශරීරය යන මෙයින් නොගන්නා ලද්ද මා විසින් එසේ ගන්නා ලද්දේයයිද, නොදන්නා ලද්ද, මා විසින් දන්නා ලද්දේයයිද, මා විසින් දක්නා ලද්ද නොදක්නා ලද්දේයයි කියාද මා විසින් නොඅසන ලද්ද අසන ලද්දේයයි කියාද, ගන්ධරස ස්පර්ශ මෙයෙන් ගන්නාලද්ද එසේ නොගන්නා ලද්දේයයි කියාද නුවණින් දන්නා ලද්ද නොදන්නා ලද්දේයයි දමේ.

6 ‘නොදක්නා ලද්දේ’ යනු ඇසින් නොදක්නා ලද යනුයි ‘කණින් නොඅසන ලද්දේ’ යනු කණින් නොඅසන ලද ගන්ධරස ස්පර්ශ මෙයෙන් ගන්නාලද ‘එසේ නොගන්නා ලද්දේ’ යනු ‘නාසය දිව ශරීරය යන මෙයින් ආඝ්‍රාණය රස විඳීම, ස්පර්ශය නොලද යනුයි ‘නොදන්නා ලද්ද’ යනු සිතින් නොදන්නා ලද්දේ නම් වේ ‘දක්නා ලද්දේ’ යනු ඇසින් දක්නා ලද්දේ යනුයි ‘අසන ලද්දේ’ යනු කණින් අසන ලද්දේ දැනගන්නා ලද්දේ නම් නාසයෙන් ආඝ්‍රාණය කරණ ලද දිවෙන් රසවිඳින ලද ශරීරයෙන් ස්පර්ශ කරණලද යනුයි ‘දන්නා ලද්දේ’ යනු සිතින් දන්නා ලද්ද යනුයි.

7 නොදක්නා ලද්ද තුන් ආකාරයකින් මා විසින් දක්නා ලද්දේයයි, දූන දූන බොරු කියන්නාහට පචිති ඇවැත්වේ පෙරම ඔහුට බොරු කියන්නෙමියි යන සිත වේ කියන්නාහට බොරු කියමියි මේ සිතවේ. කීවහුට

මා විසින් බොරු කියනලද්දියයි මෙ සිතමේ, සතර ආකාරයකින් (ii) නොදක්නා ලද්ද මා විසින් දක්නා ලද්දේයයි දැන දැන බොරුකියන්නාහට පචිති ඇමැත්වේ. ඔහුට පෙරම බොරු කියන්නෙමියි සිතවේ. කියන්නාහට බොරු කියමියි සිතවේ. කීවාහුට මා විසින් දෘෂ්ටිය මැරදිකොට තබා බොරුකීමෙමියි සිතවේ. (iii)

8 පස් ආකාරයකින් (මෙහි 7 (ii) ) දෘෂ්ටිය වැරදිකොට ''තබා'' වෙනුවට ''ඉවසීම වැරදිකොට තබා'' කියා යෙදිය යුතුයි.)

9 සය ආකාරයකින් (මෙහි 9 ඡේදය ''ඉවසීම වැරදිකොට තබා'' වෙනුවට ''කැමැත්ත වැරදිකොට තබා'' කියා යෙදිය යුතු)

10 සත් ආකාරයකින් (මෙහි 9 ඡේදය ''කැමැත්ත වැරදිකොට තබා'' වෙනුවට ''ස්වභාවය වැරදිකොට තබා'' කියා යෙදිය යුතුයි.)

11 තුන් ආකාරයකින් මා විසින් නොඇසනලද්ද අසන ලද්දේයයි (ii) දැන දැන බොරු කියන්නහුට පචිති ඇවතවේ. (iii) තුන් ආකාරයකින් ගන්ධරස ස්පර්ශ වශයෙන් නොගන්නා ලද්ද එසේ ගන්නා ලද්දේයයි (මෙහි(ii)නොදක්න(iv) නොදැන ගන්නාලද්ද දැනගන්නා ලද්දේයයි (v) (මෙහි (ii) නොදක්න) පෙරම ඔහුට බොරු කියන්නෙමියි. අදහසවෙයි. කියනු කල්හි බොරුකියමියි අදහසවෙයි. කියනලදුහු අදහසවේ (vii) සතරාකාරයකින් (මෙහි (iv) හා (ii) ) පස් ආකාරයකින් (මෙහි(iv) හා(ii) ) සයාකාරයකින් (මෙහි (iv) හා (ii) ) සත් ආකාරයකින් (මෙහි (iv)හා (ii) )(මෙහි (iv) )දෘෂ්ටිය වැරදියේ තබා ඉවසීම වැරදියේ තබා රුචිය වැරදියේ තබා, කැමැත්ත වැරදියේ තබා, භාවය වැරදියේ තබා (මෙහි (ii) )

12 තුන් ආකාරයකින් මා විසින් නොදක්නා ලද්ද දක්නා ලද්දේය (ii) අසන ලද්දේයයි දැන දැන බොරු කියන්නහුට පචිති ඇවතවේ. (මෙහි 11. (vi) ) (මෙහි (i) ) ගන්ධ රස ස්පර්ශ වශයෙන් දැනගන්නා ලද්දේයයි දැන දැන බොරුකියන්නහුට පචිති ඇවතවේ (මෙහි 11(vi)) (මෙහි (i) ) දැන ගන්නා ලද්දේ යයි දැන දැන බොරුකියන්නහුට පචිති

ඇවැත වේ. (මෙහි 11 (vi) ) (මෙහි (i) ) අසන ලද්දේය. ගන්ධාදී මුත වශයෙන් දැන ගන්නා ලද්දේද වේයයි දැන දැන බොරු කියන්නහුට පචිති ඇවැත වේ- (මෙහි 11 (vi) ) (මෙහි(i) ) අසන ලද්දේය. දැනගන්නා ලද්දේයයි. දැන දැන බොරු කියන්නහුට පචිති ඇවැතවේ.(මෙහි(i))අසන ලද්දේය. ගන්ධාදී මුත වශයෙන් ගන්නා ලද්දේය. දැනගන්නා ලද්දේයයි දැන දැන බොරු කියන්නහුට පචිති ඇවැතවේ. (මෙහි 11 vi))

13 තුන් ආකාරයෙන් මා විසින් නොඅසන ලද්ද අසන ලද්දේයයිද (ii) ගන්ධාදී මුත වශයෙන් ගන්නා ලද්දේයයිද (iii) දැන දැන බොරු කියන්නාහට පචිති ඇවැත්වේ. (iv) (මෙහි 11 (iv–vii) (14–65 ඡේදය දක්වා ඡේද අගට (13 සහ 11 (iv–vii) යොදන්න )

14 (මෙහි 13 (i) දක්නා ලද්දේයයිද.

15 (මෙහි 13 (i) ගන්ධ රස ස්පර්ශ වශයෙන් දන්නා ලද්දේයයිද.

16 (මෙහි 1 ගන්ධ රසාදී මුත වශයෙන් ගන්නා ලදැයිද දන්නා ලද්දේයයිද

17 (මෙහි 13 (i) ගන්ධ රස ස්පර්ශ වශයෙන් දන්නා ලද්දේයයිද දැනගන්නා ලද්දේයයිද.

18 (මෙහි 13 (i)) ගන්ධරස ස්පර්ශ වශයෙන් දන්නා ලද්දේයයිද දක්නා ලද්දේයයිද.

19 (මෙහි 13 (i) ගන්ධරස ස්පර්ශ වශයෙන් දන්නා ලද්දේයයිද දැනගන්නා ලද්දේයයිද දක්නා ලද්දේයයිද,

20 (i) තුන් ආකාරයකින් මා විසින් ගන්ධරස ස්පර්ශ වශයෙන් නොදැන ගන්නා ලද්ද (ii) දැන ගන්නා ලද්දේයයි දන්නා ලද්දේයයිද

21 (මෙහි 20 (i) අසන ලද්දේයයිද.

22 (මෙහි 20 (i) දැනුණේයයිද දැන ගන්නා ලද්දේයයි අසන ලද්දේයයිද

23 (මෙහි 20 (i) දැනගන්නා ලද්දේයයිද අසන ලද්දේයයිද.

24 (මෙහි 20 (i) දැනගන්නා ලද්දේයයිද දන්නා ලද්දේයයිද දක්නා ලද්දේයයිද අසන ලද්දේයයිද.

25 (i) තුන් ආකාරයකින් නොදැනගන්නා ලද්ද මා විසින් දැනගන්නා ලද්දේයයිද (ii) දක්නා ලද්දේයයිද.

26 (මෙහි 25 (i) අසන ලද්දේයයිද.

27 (මෙහි 25 (i) ගන්ධරස ස්පර්ශ වශයෙන් දැනෙන ලද්දේයයිද.

28 (මෙහි 25 i) දක්නා ලද්දේයයිද අසන ලද්දේයයිද.

29 (මෙහි 25 (i) දක්නා ලද්දේද ගන්ධ රස ස්පර්ශ වශයෙන් දැනෙන ලද්දේයයිද

30 (මෙහි 25 (i) අසන ලද්දේයයිද ගන්ධ රස ස්පර්ශ වශයෙන් දැනගන්නා ලද්දේයයිද,

31 (i) තුන් ආකාරයකින් මා විසින් දක්නා ලද්දේයයිද, නොදක්නා ලද්දේයයිද.

32 (i) තුන් ආකාරයකින් මා විසින් අසන ලද්ද නො අසනලද්දේයයි (ii)

33 (මෙහි 32 (i) ගන්ධාදි මූන වශයෙන් ගන්නා ලද්ද නොගන්නා ලද්දේයයි (ii)

34 (මෙහි 32 (i) දක්නා ලද්ද නොදක්නා ලද්දේයයිද

35 (i) තුන් ආකාරයකින් මා විසින් දක්නා ලද්දේය. (ii) අසන ලද්දේයයි.

36 (මෙහි 35 (i) ගන්ධරස ස්පර්ශ වශයෙන් දැනගන්නා ලද්දේයයි.

37 (මෙහි 35 (i) දැනගන්නා ලද්දේයයි.

38 (මෙහි 35 (i) අසන ලද්දේද ගන්ධරස ස්පර්ශ වශයෙන් දැනගන්නා ලද්දේයයිද.

39 (මෙහි 35 (i) අසන ලද්දේද දැනගන්නා ලද්දේද වේයයි.

40 (මෙහි 35 (i) අසන ලද්දේද ගන්ධරස ස්පර්ශ වශයෙන් දැනෙන ලද්දේය දැනගන්නා ලද්දේයයි.

41 (i) තුන් ආකාරයකින් මා විසින් අසන ලද්දේය (ii) ගන්ධරස ස්පර්ශ වශයෙන් දැනගන්නා ලද්දේයයි.

42 (මෙහි 41 (i) දක්නා ලද්දේයයි

43 (මෙහි 41 (i) දක්නා ලදීයයි.

44 (මෙහි 41 (i) ගන්ධ රස ස්පර්ශ වශයෙන් දැනෙන ලද්ද දක්නා ලද්දේද වේයයි.

45 (මෙහි 41 (i) ගන්ධරස ස්පර්ශ වශයෙන් දැනෙන ලදී. දැනගන්නා ලදී. දක්නා ලද්දේ වේයයි.

46 (මෙහි 41 (i) ගන්ධරස ස්පර්ශ වශයෙන් දැන ගන්නා ලදී, දක්නා ලදීයයි

47 (i) තුන් ආකාරයකින් මා විසින් ගන්ධරස ස්පර්ශ වශයෙන් දැනෙන ලදුයි (ii) දැනගන්නා ලදී.

48 (මෙහි 47(i) දක්නා ලද්දේයයිද.

49 (මෙහි 47 (i) දැනගන්නා ලදී. දක්නා ලදීයයිද

50 (මෙහි 47 (i) මා විසින් දැන ගන්නා ලදි. අසනා ලදියිද.

51 (මෙහි 47 (i) දැන්නා ලදී. දක්නා ලදී. අසනලදීයි.

52 තුන් ආකාරයකින් දැනගන්නා ලදී. (ii) මා විසින් දක්නා ලදීයයි.

53 (මෙහි 52 (i) මා විසින් අසන ලදීයයි

54 (මෙහි 52 (i) ගන්ධරස ස්පර්ශ වශයෙන් දැනුණේයයි

55 (මෙහි 52 (i) දක්නා ලද්දේ අසනා ලද්දේද වේයයි.

56 (මෙහි 52 (i, දක්නා ලද්දේය. ගන්ධ රස ස්පර්ශ වශයෙන් දැනුණේයයි.

57 (මෙහි 52 (i) දක්නා ලදී. අසන ලදී. ගන්ධරස ස්පර්ශ වශයෙන් දැනෙන ලදීයි

58 (i) තුන් ආකාරයකින් දක්නාලද දෙයෙහි (i) සැබෑ ඇත්තේ දක්නා ලද්ද කල්පනා නොකරයි. සිහි නොකරයි දක්නා ලද්ද අමතකවූයේ වේ. (ii) මා විසින් දක්නා ලද්දේද අසනා ලද්දේයයි.

59 (මෙහි 58(i) මා විසින් දක්නාලද්දේය අසනලද්දේය. ගන්ධරස ස්පර්ශ වශයෙන් දැනෙන ලදී. දන්නාලද්දේයයි.

60 (i) තුන් ආකාරයකින් ඇසීමෙහි සැබෑ ඇත්තේ ඇසූ දෙය කල්පනා නොකරයි, සිහි නොකරයි, අසනා ලද්ද අමතක වෙයි.

61 (i) තුන් ආකාරයකින් ගන්ධ රස ස්පර්ශ වශයෙන් දැනුන දෙයෙහි සැබෑ ඇත්තේ දැනුන දෙය කල්පනා නො කරයි· දැනුන දෙය සිහි නොකරයි. දැනුන දෙය අමතක කරයි.

62 (i) තුන් ආකාරයකින් දක්නා ලද්දෙහි සැබෑ ඇත්-තේ දක්නා ලද්ද කල්පනා නොකරයි දක්නා ලද්ද සිහි නොකරයි. දක්නා ලද්ද අමතක කරයි.

63 (මෙහි 62 (i) මා විසින් දන්නා ලද්දේද දක්නා ලද්දේද වේ යනුයි.

64 (මෙහි 62 (i) මා විසින් දන්නා ලද්දේද අසන ලද්දේද වේ.

65 (මෙහි 62 (i) දන්නා ලද්දද ගන්ධ රස ස්පර්ශ මගෙන් දැනගන්නා ලද්දේදවේ. දක්නා ලද්ද අමතකවූයේවේ. මා විසින් දැනගන්නා ලද්දේද දක්නා ලද්දේද අසන ලද්දේද වේ දැනගන්නා ලද්ද අමතකවූයේවේ. මට දක්නා ලද්දේද ගන්ධ රස ස්පර්ශ මගයෙන් දැනුණේවේ. දන්නා ලද්ද අමතකවූයේ වේ. මා විසින් දන්නා ලද්දේද දක්නා ලද්දේද අසන ලද්දේද ගන්ධ රස ස්පර්ශ මගයෙන් දැනුණේද වේයයි

66 සෙල්ලම් පිණිස කියයිද, වරදමා කියයිද, සෙල්ල පිණිස කියයිනම් ඉක්මනට කියයි. වරදමා කියයි නම් අනිකක් කියන්නෙමියි සිතා අනිකක් කියයි. උම්මතුවූවහුට ආදි කර්මිකයාට ඇවැත් නොවේ.

## 2 ඔමසවාද ශික්ෂාපදය

1 (මෙහි මුසාවාද ශික්ෂාපදයේ 1 (i)) එකල්හි මතාහි සවග භික්ෂූහු (ii) සිල්වත් භික්ෂූන් සමග කලහ කරන්නාහු සිල්වත් භික්ෂූන් ජාතියෙන්ද නාමයෙන්ද, ගෝත්‍රයෙන්ද, කර්මයෙන්ද ශිල්පයෙන්ද. රෝගයෙන්ද සලකුණින්ද, ක්ලේශයෙන්ද ඇවතින්ද, පහත් බැනීමෙන්ද, හෙළා දකින් බැන මදින්, අවමන් කරත්. (iii) යම් ඒ භික්ෂූකෙනෙක් අල්පෙච්ඡ වූවාහුද (මෙහි 1 වෙනි මුසාවාද ශික්ෂාපදයේ 2 (ii)) ඔව්හු දොස් කියත්. නොසතුට ප්‍රකාශ කරත්. නොසතුටු වචන කියත් කෙසේනම් සවග භික්ෂූහු සිල්වත් භික්ෂූන් සමග කෝලාහල කරන්නාහු සිල්වත් භික්ෂූන් (මෙහි (ii)යයි කියාහි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. (මෙහි මුසාවාද ශික්ෂාපදයේ 3 (i)) "මහණෙනි, තෙපි" (මෙහි (ii) නොදන්න) දූයි, කියාහි. "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය" භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළසේක (මෙහි මුසාවාද ශික්ෂාපදයේ 3(iv)) හිස් පුරුෂයෙනි, කෙසේනම් තෙපි (මෙහි (ii) හිස් පුරුෂයෙනි, මෙය නොපැ දූතවූන්ගේ (මෙහි මුසවාද ශික්ෂාපදයේ 3 (vi))

2 ''මහණෙනි, බොහෝ කලකට පෙර තක්සලා නුවර එක්තරා බමුණෙකුගේ නන්දිවිශාල නම් ගොනෙක් සිටියේය. මහණෙනි, ඉක්බිති නන්දිවිශාල ගොන් තෙම ඒ බ්‍රාහමණයාට 'බමුණ, ඔබ යන්න. සිටුවරයා සමග මගේ ගොනා එකට බැඳි කරත්ත සියයක් අදින්නේයයි දහසකට ඔට්ටු තබවයි'' කීයේය මහණෙනි, ඉක්බිති ඒ බ්‍රාහ්මණ තෙම මගේ ගොනා එකට බැඳි ගැල් සියයක් අදින්නේයයි සිටුවරයා සමග දහසකින් ඔට්ටු තිබ්බේය. මහණෙනි, ඉක්බිති ඒ බ්‍රාහ්මණතෙම ගැල් සියය එකට බැඳ නන්දිවිශාල නම් ගොනා යොදා 'අදුව, කූල උපුලව, කූලයයි' කීයේය. මහණෙනි, ඉක්බිති නන්දිවිශාල ගොන්තෙම එහිම සිටියේය. මහණෙනි, ඉක්බිති ඒ බමුණුතෙම දහසකින් පැරදුනේ කල්පනා කරන්නට විය.

3 ''මහණෙනි, ඉක්බිති නන්දිවිශාල ගොන්තෙම ඒ බමුණාට 'බමුණ, ඔබ කුමක් හෙයින් කල්පනා කරන්නෙහිදැයි' ඇසීය. 'එසේය, පින්වත නා විසින් මා දහසකින් පරදවන ලද්දැයි' කීයේය. බමුණ, ඔබ විසින් කුමක්හෙයින් කුළුනොවූ මා කුළු නාමයකින් ආමන්ත්‍රණය කෙළේදැයි ඇසීය. බමුණ, ඔබ යව. සිටුවරයා සමග දෙදහසකින් ඔට්ටු තබවයි' කීයේය 'මගේ ගොනා එකට බැඳි ගැල් සියයක් අදින්නේය' කියායි. 'කුළුනොවූ මට කුළු නාමයෙන් නාම නොකරවයි' කීයේය.

'මහණෙනි, ඉක්බිති ඒ බ්‍රාහ්මණතෙම සිටුවරයා සමග දෙදහසකින් ඔට්ටු කෙළේය. මගේ ගොනා එකට බැඳි ගැල් සියයක් අදින්නේය කියායි. මහණෙනි, ඉක්බිති ඒ බ්‍රාහ්මණ තෙම ගැල් සියයක් එකට බැඳ නන්දිවිශාල නම් ගොනා යොදා 'හොඳ පුතා, ඇදපන්, හොඳ පුතා උසුලපන්යයි' කීයේය. මහණෙනි, ඉක්බිති නන්දිවිශාල ගොන්තෙමේ එකට බැඳි ගැල් සියය ඇද්දේය. මනාප වචනයක්ම කියන්නේය. කිසිකලෙකත් අමනාපයක් නොකියන්නේය. මනාප වචන කියන්නාගේ මහබරක් ඇද්දේය. ඔහු ධනයද ලද්දේය. එහෙයින් සතුටුසිත් ඇත්තේ විය. මහණෙනි, එදා මොවුහු ප්‍රියනොවූ වචන ඇත්තෝය. සිත් රිදවන වචන ඇත්තෝය.

අවමනම්බු කරණ වචන ඇත්තෝය. මේ කාලයෙහි දෙස්සිම් අවමනම්බු කිරීම් ගැන කියනුම කවරේද? මහණෙනි, මෙය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිසද (මෙහි මුසාවාද ශික්ෂා පදයේ 3 (iv) )

4 "ජාත්‍යාදීන් ගර්හා බිනීමෙහි පචිති ඇවැත්වේ."

5 ජාත්‍යාදීන් ගර්හා බිනීම නම් දස ආකාරයකින් බිනීමයි. ජාතියෙන්ද නාමයෙන්ද ගෝත්‍රයෙන්ද කර්මයෙන්ද ශිල්පයෙන්ද, ආබාධයෙන්ද, සලකුණින්ද, ක්ලේශයෙන්ද ඇවැත්තින්ද ආක්‍රෝශ කිරීමෙන්ද වේ.

5 'ජාති' නම් ජාති දෙකකි පහත් ජාතියද උසස් ජාතියද යන දෙකයි. 'පහත් ජාතිය' නම් සැඬොල් ජාතිය, කුළු පොකු ජාතිය, මැදි ජාතිය, රියකරු ජාතිය, කසළශෝධක ජාතිය, මේ පහත් ජාතිනම් වේ. 'උසස් ජාති' නම් ක්ෂත්‍රිය ජාතිය, බ්‍රාහ්මණ ජාතිය මේවා උත්කෘෂ්ට ජාති නම් වේ. 'නාමය' නම් නාම දෙකකි පහත් නාම උසස් නාම යනුයි, පහත් නාම නම් අවකණ්ණක, ජවකණ්ණක, ධනිට්ඨක, සවිට්ඨක, කුලවඩ්ඪක, යන දස නාමයෝය ඒ ඒ ජනපදයන්හි අවමන් කරණ ලද පරිභව කරණ ලද පිළිකුල් කරණ ලද මෙහුනෙක් කුමක්දයි නින්ද කරණ ලද ගරු නොකරණ ලද යම් නොනොක් ඇද්ද මේ හීන ජාති නම් වේ. 'උසස් නාම' නම් බුදුන් හා යුක්තවූ ධර්මය හා යුක්තවූ සංඝයා හා යුක්ත වූ ඒ ඒ ජනපදයන්හි අවමන් නොකරණ ලද, පරිභව නොකරණ ලද, පිළිකුල් නොකරණ ලද, අත් නොහරිණ ලද, සිත්හි කරණ ලද නාම උසස් නාම නම් වෙති.

6 'ගෝත්‍රය' නම් ගෝත්‍ර දෙකකි. පහත් ගෝත්‍රය උසස් ගෝත්‍රය යනුයි. පහත් ගෝත්‍රය නම් කෝසිය ගෝත්‍රය භාරද්වාජ ගෝත්‍රය යන දෙකයි ඒ ඒ ජනපදයන්හි අවමන් කරණ ලද පරිභව කරණ ලද පිළිකුල් කරණ ලද නින්ද කරණ ලද ගරු නොකරණ ලද යම් නොනොක් ඇද්ද මේ හීන ගෝත්‍ර නම් වේ. 'උසස් ගෝත්‍ර' නම් ගෞතම ගෝත්‍රය, මොග්ගල්ලාන ගෝත්‍රය, කච්චායන ගෝත්‍රය, වාසෙට්ඨ ගෝත්‍රය ඒ ඒ ජනපදයන්හි අවමන් නොකරණ ලද පරිභව නොකරණ ලද පිළිකුල් නොකරණ ලද අත් නොහරින ලද ඇලුම් ඇති කරණ මේය උත්කෘෂ්ට ගෝත්‍ර නම් වේ.

7 ‘කර්ම’ නම් කර්ම දෙකකි. පහත් කර්මය උසස් කර්මය යන දෙකයි. පහත් කර්මය නම් කොට්ඨක (ලී සැසීම) කසල ශෝධක කර්මාදියයි. ඒ ඒ ජනපදයන්හි අවමන් කරණ ලද පරිභව කරණ ලද පිළිකුල් කරණ ලද නින්දා කරණ ලද ගරු නොකරණ ලද, සිත්හි නොකරණ ලද මේ පහත් කර්ම නම් වේ. උසස් කර්ම නම් කෘෂිකර්මය, වෙළඳ කර්මය, ගව පාලනය ඒ ඒ ජනපදයන්හි අවමන් නොකරණ ලද පරිභව නොකරණ ලද පිළිකුල් නොකරණ ලද අත් නොහරින ලද සිත්හි කරණ ලද මේ උසස් කර්ම නම් වේ.

8 “ශිල්ප” නම් ශිල්ප දෙකකි. පහත් ශිල්පය උසස් ශිල්පයයි. “පහත් ශිල්ප” නම් කුම්භකාර ශිල්පය, කුඹල්කරු ශිල්පය, පේෂකාර ශිල්පය, සොම්මර ශිල්පය, පනීස්සි ශිල්පය, ඒ ඒ ජනපදයන්හි අවමන් කරණලද, පරිභව කරණ ලද පිළිකුල් කරණලද නින්දා කරණලද ගරු නොකරණලද සිත්හි නොකරණලද, මේ පහත් ශිල්ප නම් වේ. උසස් ශිල්ප නම් හස්ත මුද්‍රා ශිල්පය, ගණිතය, ලිවීම, හා ඒ ඒ ජනපදයන්හි අවමන් නොකරණලද පරිභව නොකරණලද පිළිකුල් නොකරණලද අත් නොහරිනලද සිත්හි කරණලද යම් ශිල්පයක් ඇද්ද එය උසස් ශිල්ප නම් වේ.

9 සියලු ලෙඩ පහත්ය. එනමුදුවුවත් මධුමේහ රෝගය (වේදනා අඩු බැවින්) උසස්ය. “හැඩහුරුව” නම් හැඩහුරුකම් දෙකකි. පහත් හැඩහුරුකම් හා උසස් හැඩහුරුකමය. පහත් හැඩහුරුකම නම් ඉතා දිග ඉතා කෙටි ඉතා කළු, ඉතා සුදු මේ පහත් හැඩහුරුකම් නම් වේ. උසස් හැඩහුරුකම නම් ඉතා දිගත් නොවූ, ඉතා කොටත් නැති ඉතා කළුත් නැති ඉතා සුදුත් නැති. මේ උසස් හැඩහුරුකම නම් වේ.

10 සියලු කෙලෙසෝ පහත්ය. සියළු ඇවැත් පහත්ය එනමුදුවුවත් සෝවාන් සමාපත්තිය උසස්ය.

11 “ආක්‍රොශය” නම් ආක්‍රොශ (බැණවැදීම්) දෙකකි. පහත් ආක්‍රොශය උසස් ආක්‍රොශය යන දෙකයි පහත් ආක්‍රොශය නම් ඔටුවෙක, බැටළුවෙක, ගොනෙක, කොටළු-

ඔටක, තිරිසනෙක, නිරිසනෙක, 'තට සුගතියක් නැත. තට දුගතියම අගත්ය' යනුයි. යකාරය හෝ භකාරය යොදා ආක්‍රොශයක් ඇද්ද, ස්ත්‍රී පුරුෂ නිමිති යොදා කරණ කථාවක් ඇද්ද, මේ පහත් ආක්‍රොශ නම්වේ. උසස් ආක්‍රොශනා න පණ්ඩිතයෙක, ව්‍යක්තයෙක නුවණැත්තෙක බොහෝ සුපිරුනැත් ඇත්තෙක. ධර්ම කථිකයෙක. නොපව් දුගතියක් නැත. නොපවිසින් සුගතියම නැමණිව්යයුතුයි. මේ උසස් ආක්‍රොශය නම්වේ.

12 උපසම්පන්නයෙක් උපසම්පන්නයකුට ආක්‍රොශ කරණු කැමැත්තේ අවමන් කරණ කැමැත්තේ තෙජය් නැති කරණු කැමැත්තේ හීනජාති ඇත්තෙකුට හීන වචනයෙන් එනම්, සැඩොල්, කුළුපොතුවැදි, රියකරු, කසල සොධක යන වචනවලින් සැඩොලෙක, කුළුපොත්තෙක, වැද්දෙක, රිය කරුවෙක, කසල සොධකයෙකැයි (ii) පහත් වචනයෙන් කියයි. කථාකරයි. වචනයක් වචනයක් පාසා පචිති ඇවැත්වේ

13 (i) උපසම්පන්නයෙක් උපසම්පන්නයකු, ආක්‍රොශ කරණු කැමැත්තේ, අවමන් කරණු කැමැත්තේ, තේජස් නැතිකරණු කැමැත්තේ, (ii) උසස් ජාති ඇති ක්ෂත්‍රියකුට බ්‍රාහ්මණයකුට සැඩොල්ය, කුළුපොතුය, වැදිය, රියකරුය, කසල සොධකයයි (iii) පහත් වචනයෙන් කියයි. කථාකරයි. වචනයක් පාසා පචිති ඇවැත්වේ.

14 උපසම්පන්නයෙක් උපසම්පන්නයකු ආක්‍රොශ කරණු කැමැත්තේ, අවමන් කරණු කැමැත්තේ, තේජස් නැති කරුණු කැමැත්තේ, පහත්වූ සැඩොල්ය, කුළුපොතුය රියකරුය, කසලසොධක යන ජාති ඇත්තෙකුට ක්ෂත්‍රිය බ්‍රාහ්මණයයි (iii) උසස් වචනයෙන් කියයිද කථාකරයිද වචනයක් පාසා පචිති ඇවැත්වේ.

15 උපසම්පන්නයෙක් උපසම්පන්නයකුට ආක්‍රො කරණු කැමැත්තේ අවමන් කරණු කැමැත්තේ තේජස් නැති කරණු කැමැත්තේ උසස් ක්ෂත්‍රියකුම බ්‍රාහ්මණයකුට ක්ෂත්‍රියෙක, බ්‍රාහ්මණයෙකැයි කියයි (iii) උසස් වචනයෙන් කථාකරයි. වචනයක් පාසා පචිති ඇවැත්වේ.

16 උපසම්පන්නයෙක් උපසම්පන්නයෙකුට ආක්‍රොශ කරණු කැමැත්තේ අවමන් කරණු කැමැත්තේ තේජස් නැතිකරණු කැමැත්තේ පහත්වූ අවණ්ණණක, ජම්භණණ්ණක, ඛනිටඨක, සම්ඨක, කුලවඩ්ඪක යන මේකුව අම්භණණ්ණකයෙක් වෙහිය, ජම්භණණ්ණකයෙක් වෙහිය, ඛනිඨකයෙක් වෙහිය, සම්ඨකයෙක් වෙහිය, කුලවඩ්ඪකයෙක් වෙහියයි. (මෙහි 15-(iii))

17 උපසම්පන්නයෙක් උපසම්පන්නයෙකුට ආක්‍රොශ කරණු කැමැත්තේ, අවමන් කරණු කැමැත්තේ, තේජස් නැති කරණු කැමැත්තේ උසස් වචනයෙන් එනම් බුද්ධරක්ඛිතය, ධම්මරක්ඛිතය, සංඝරක්ඛිත නම් ඇත්තහුට අවණ්ණණකය, ජම්භණණ්ණකය, ඛනිඨකය, සම්ඨකය, කුලවඩ්ඪකයයි. පහත් වචන කියයිද වචනයක් පාසා පචිති ඇවැත්වේ.

18 උපසම්පන්නයෙක් උපසම්පන්නයෙකුට ආක්‍රොශ කරණු කැමැත්තේ අවමන් කරණු කැමැත්තේ, තේජස් නැති කරණු කැමැත්තේ පහත් නම් ඇති අවණ්ණණක, ජම්භණණ්ණක, ඛනිඨක, සම්ඨක, කුලවඩ්ඪකයෙකුට බුද්ධරක්ඛිතය, ධම්මරක්ඛිතය, සංඝරක්ඛිතයයි උසස් වචන කියාසිද වචනයක් පාසා පචිති ඇවැත්වේ.

19 උපසම්පන්නයෙක් උපසම්පන්නයෙකු ආක්‍රොශ කරණු කැමැත්තේ අවමන් කරණු කැමැත්තේ, තේජස් නැති කරණු කැමැත්තේ, බුද්ධරක්ඛිතය ධම්මරක්ඛිතය සංඝරක්ඛිතය යන උසස් නම් ඇත්තෙකුට බුද්ධරක්ඛිත වෙහිය ධම්මරක්ඛිත වෙහිය සංඝරක්ඛිත වෙහියයි උසස් වචනයක් කියයිද වචනයක් පාසා පචිති වේ.

20 උපසම්පන්නයෙක් උපසම්පන්නයෙකුට ආක්‍රොශ කරණු කැමැත්තේ, අවමන් කරණු කැමැත්තේ තේජස් නැති කරණු කැමැත්තේ තොපිය, භාරද්වාජය පිටක ගිහි මගෙන් ඉතා තොපිය භාරද්වාජ වෙහියයි කියයි (ii) වචනයක් පාසා පචිති ඇවැත්වේ.

21 (මෙහි 11 ඡේදයේ (i)) උසස් ගෞතම, මුගලන්, කච්චාන, ඉසිය වචනවලට තොපිය . වෙහිය, භාරද්වාජ වෙහියයි පහත් වචනයෙන් කියයිද (මෙහි 26(ii))

22 (මෙහි 12, (i) ) කොසිය, භාරද්වාජ යන පහත් ගෝත්‍ර ඇත්තා කුල වචනවලට ගෞතම වෙනිය මොග්ගල්ලාන වෙනිය කච්චාන වෙනිය, වාසිඨ වෙනියයි උසස් ගෝත්‍ර වචන කියයි. වචනයක් පාසා පචිති ඇවැත්වේ.

23 (මෙහි 14 (i) ) ගෞතම, මොග්ගල්ලාන කච්චාන වාසිඨ යන උසස්නාම ඇත්තෙනකුට ගෞතම වෙනිය, මොග්ගල්ලාන වෙනිය, කච්චාන වෙනිය, වාසිඨ වෙනියයි උසස්ම කියයි. (මෙහි 14 (iii) )

24 (මෙහි 12 (i) ) හීන කොට්ඨනාමයට, කුසලශෝධනාමයට, කොට්ඨනාම වෙනිය. කුසලශෝධනාමවෙනියයි, හීනකොට කියයි. 14 (iii) )

25 (12) උසස් ගොවියා, වෙළෙන්දා, ගවයින් රක්නාව ලීයහින්නෙන කුසල ශෝධනයෙකැයි පහත් කොට කියයි. (iii)

26 (මෙහි 13 (i) ) පහත් කොට්ඨන කුසල ශෝධනයන්ට ගොවියෙක, වෙළෙන්දෙක, ගවසාමියෙකැයි උසස් කොට කියයිද, (මෙහි 13 (iii) )

27 (මෙහි 14 (i) ) උසස් ගොවි, වෙළෙඳ, ගොසාමින්ට උසස් ගොවියෙක, වෙළෙන්දෙක, ගොසාමියෙකැයි කියයිද එවන ගණයින් පචිති ඇවැත්වේ.

28 (මෙහි 12 (i) ) පහත්වූ කුලපොත්තු, කුඹල්කරුවෝ, පේෂකාරයෝ, නොම්බිරු, පතිත්තියන මොවුන්ට උසස් කුල පොත්තෙක් වෙනිය, කුඹලෙක් වෙනිය, පේෂකාරයෙක් වෙනිය. නොම්බිරෙක් වෙනිය. පතිත්තියෙක්වෙයයි (මෙහි 12 (iii) )

29 (මෙහි 12 (i) ) උසස් සසන මුද්‍රා ගණන් තබන්නාය. ලිපිකරුවාය යන මොවුන් පහත් කුලපොත්තෙක, කුඹල් කරුවෙක, පේෂකාරයෙක, නොම්බිරෙක, පතිත්තියෙකැයි මෙහි 12 (iii) )

29 (මෙහි 13 (i)) කුලපොතු කුඹල්කරු, පේෂකාර, නොම්බිරු, පතිත්ති යන මොවුන්ට උසස් සාමුද්‍රිකාදන්නෙකි, ගණන් තබන්නෙකි, ලියන්නෙකි, (මෙහි 13 (iii))

30 (මෙහි 14 (i) උසස් සාමුද්‍රිකා දතුවකුට, ගණන් තබන්නෙකුට, ලියන්නෙකුට උසස් සාමුද්‍රිකා දතුමෙකි, ගණන් තබන්නෙකි, ලියන්නෙකියි, (මෙහි 14 (iii))

31 (මෙහි 11 (i)) පහත් කුෂ්ඨ ඇත්තෙකුට, ගඩු ඇත් තෙකුට, කසන්නෙකුට, ක්ෂය රෝග ඇත්තෙකුට, මීමැස් මෝරය ඇත්තෙකුට පහත් කුෂ්ඨ ඇත්තෙක් වෙහිය, ගඩු ඇත්තෙක් වෙහිය, කැසිලි ඇත්තෙක් වෙහිය, ක්ෂය ඇත්තෙක් වෙහිය මීමැස්මෝරය ඇත්තෙක් වෙහියයි, (මෙහි 11 (iii))

32 (මෙහි 12 (i)) උසස් වේදනා නොවිඳිනා දියවැඩියා රෝගය ඇත්තෙකු පහත් කුෂ්ඨ ඇත්තෙකි ගඩු ඇත්තෙක ක්ෂය ඇත්තෙක, මීමැස්මුරය ඇත්තෙකැයි (මෙහි 12 (iii))

33 (මෙහි 13 (i)) පහත් කුෂ්ඨ ඇත්තෙකු, ගෙඩි ඇත් තෙකු, කැසිලි ඇත්තෙකු, ක්ෂය ඇත්තෙකු, මීමැස්මුර ඇත් තෙකු, උසස් වේදනා නොවූ දියවැඩියාව ඇත්තෙකැයි (මෙහි 13 (iii))

34 (මෙහි 14 (i)) උසස් වේදනා නොවිඳින දියවැඩියා ඇත්තෙකුට උසස් වේදනා නොවිඳින දියවැඩියා ඇත්තෙ කැයි (මෙහි 14 (iii))

35 (මෙහි 12 (i)) ඉතා උස් එනෙකු ඉතා කොට එනකු ඉතා කළු එනකු ඉතා සුදු එනකු පහත්වූ ඉතා දික්වූවෙහිය, ඉතා කොට වූවෙහිය, ඉතා කළුවූවෙහිය, ඉතා සුදුවූවෙහියයි, පහත්ව කියයිද කථාකරයිද (මෙහි 12 (iii))

36 (මෙහි 13 (i)) පහත්වූ, ඉතා උස්වූවෙකු, ඉතා කොටවූවෙකු, ඉතා කළුවූවෙකු, ඉතා සුදුවූවෙකු, ඉතා උස් කෙනෙක් නොවේ, ඉතා කොට කෙනෙක් නොවේ, ඉතා කලු කෙනෙක් නොවේ, ඉතා සුදු කෙනෙක් නොවේ යයි උසස් කොට කියයිද කථාකරයිද (මෙහි 13 (iii))

37 (මෙහි 13 (i)) ඉතා උස් නොවූවෙකුට, ඉතා කොට නොවූවෙකුට' ඉතා කලු නොවූවෙකුට, ඉතා සුදු නොවූවෙක් ඉතා උස් නැතැයිද, ඉතා කොට නැතැයිද, ඉතා කලු නැතැයිද, ඉතා සුදු නැතැයිද, උසස්කොට කියයිද කථා කරයිද (මෙහි 14 (iii))

38 (මෙහි 11 (i) ) පහත්වූ රාගයෙන් යට නොවගත්, වෙෂයෙන් යට නොවගත් මෝහයෙන් යට නොවගත් කෙනෙකුට පහත්වූ රාගයෙන් යටපත්වන ලද්දෙකිය, වෙෂයෙන් යටපත්වන ලද්දෙකිය, මෝහයෙන් යටපත්වන ලද්දෙකියයි, කියයි. කථාකරයි, (මෙහි 11 (iii) )

39 (මෙහි 12 (i) ) උසස්වූ පහවූ රාග ඇති, පහවූ වෙෂ ඇති, පහවූ මෝහ ඇතියෙකුට රාගයෙන් යටවූ වෙහිය. වෙෂයෙන් යටවූයෙහි මෝහයෙන් යටවූ යෙහියයි. (මෙහි 12 (iii) )

40 (මෙහි 13 (i) ) රාගයෙන්යටවූ, වෙෂයෙන්යටවූ, මෝහයෙන්යටවූ සත්වූවෙකුහට උසස්වූ පහවූ රාග ඇත්තෙක් වෙහිය පහවූ වෙෂ ඇත්තෙක් වෙහිය, මෝහ ඇත්තෙක් වෙහියයි (මෙහි 13 (iii) )

41 (මෙහි 14 (i) ) උසස්වූ පහවූ රාග ඇත්තෙකුට පහවූ වෙෂ ඇත්තෙකුට පහවූ මෝහ ඇත්තෙකුට උසස් පහවූ රාග ඇත්තෙක් වෙහිය. පහවූ වෙෂ ඇත්තෙක් වෙහිය පහවූ මෝහ ඇත්තෙක් වෙහියයි, (මෙහි 14 (iii) )

42 (මෙහි 11 (i) ) (ii) ) පහත්වූ පාරජිකාවට පැමිණියෙකු සංඝාදිසෙසයට පැමිණියෙකුට ථුලච්චයට පැමිණියෙකුට පචිත්තියට පැමිණියෙකුට පාටිදෙසනීයට පැමිණියෙකුට දුකුලාවට පැමිණියෙකුට දුර්භාෂිතයට පැමිණියෙකුහට පහත්වූ පාරජිකාවට පැමිණියෙක් වෙහිය, සංඝාදිසෙසයට පැමිණියෙක් වෙහිය, ථුලච්චයට පැමිණියෙක් වෙහිය, පචිත්තියට පැමිණියෙක් වෙහිය, පාටිදෙසනීයට පැමිණියෙක් වෙහිය, දුකුලාවට පැමිණියෙක් වෙහිය, දුර්භාෂිතයට පැමිණියෙක් වෙහියයි (මෙහි 11 (iii) )

43 (මෙහි 12 (i) ) උසස්වූ සෝවාන් වූවෙකුට උසස්වූ (මෙහි 12 (iii) )

44 (මෙහි 13 (i)–41 (ii) සහ 13 (iii) )

45 (මෙහි 14 (i) ) උසස්වූ සෝවාන්වූවෙකුට පහත් සෝවාන්වූවෙකැයි උසස් වචනයක් කියයි. කථාකරයි වචනයන් පාසා පචිති ඇවැත්වේ.

46 (මෙහි 11 (i)) (ii) පහත්වූ ඔටුවෙකුට බැටළුවෙකුට ගොණෙකුට කොටළුවෙකුට තිරිසන් ගතයෙකුට නිරිසතෙකුට (iii) ඔටුවෙක් වෙහිය, බැටළුවෙක් වෙහිය, ගොණෙක් වෙහිය, කොටළුවෙක් වෙහිය, තිරිසනෙක් වෙහිය, නිරිසතෙක් වෙහිය තට සුගතියක් නැත. තොපවිසින් දුගතියම බලාපොරොත්තු විය යුතුයයි පහත් වචනයෙන් කියයිද කථාකරයිද වචනයක් පාසා පචිති ඇවැත්වේ.

47 (මෙහි 12 (i)) උසස්වූ පණ්ඩිතයෙකුට දක්ෂයෙකුට නුවණැත්තෙකුට බහුශ්‍රැතයෙකුට ධර්ම කථිකයෙකුට ඔටුවෙක් වෙහිය, බැටළුවෙක් (මෙහි 46 (iii) සහ 12 (iii))

48 (මෙහි 13 (i) සහ 46 (iii)) (පණ්ඩිතයෙක් වෙහිය දක්ෂයෙක් වෙහිය, නුවණැත්තෙක් වෙහිය, බහුශ්‍රැතයෙක් වෙහිය, ධර්ම කථිකයෙක් වෙහිය, 'තට දුගතියක් නැත. තොප විසින් සුගතියම කැමතිවිය යුත්තේයයි' උසස් වචනයෙන් කියයිද කථාකරයිද, වචනයක් පාසා පචිති ඇවැත්වේ.

49 (මෙහි 14 (i) 47 (ii) සහ 48 (iii))

50 (i) උපසම්පන්නයෙක් උපසම්පන්නයෙකුට ආක්‍රොශ කරණු කැමැත්තේ අවමන් කරණු කැමැත්තේ තේජස් නැති කරණු කැමැත්තේ (ii) මේ ලොකයෙහි සමහර චණ්ඩාලයෝ ඇත්තාහ. කුලුපොත්තෝ ඇත්තාහ. මැද්දෝ ඇත්තාහ. රිය කරුවෝ ඇත්තාහ. කාළු සොධකයෝ ඇත්තාහයි (iii) කියයිද, කථාකරයිද, වචනයක් පාසා දුකුලා ඇවැත්වේ.

51 උපසම්පන්නයෙක් උපසම්පන්නයාකු ආක්‍රොශ කරණු කැමැත්තේ අවමන් කරණු කැමැත්තේ තේජස් නැති කරණු කැමැත්තේ මේ ලොකයෙහි ඇතැම් ක්ෂත්‍රියෝ බ්‍රාහ්මණයෝ ඇත්තාහයි කියයි. කථාකරයි. වචනයක් වචනයක් පාසා දුකුලා ඇවැත්වේ.

52 (මෙහි 50 (ii)) මේ ලොකයෙහි ඇතැම් අවකණ්ණකා ජවකණ්ණකා, ධනිඨකා, සවිඨකා, කුලවඩ්ඪකා, දසයෝ (මෙහි 50 (iii))

(මෙහි 50 (ii)) මේ ලොකයෙහි ඇතැම් බුද්ධරක්ඛිතයෝ, ධම්මරක්ඛිතයෝ, සංඝරක්ඛිතයෝ ඇත්තාහයි.

(මෙහි 50 (i)) මේ ලොකයෙහි ඇතැම් කොසිය ගාර් මාජයෝ ඇත්තාහයි (මෙහි 50 (iii))

(මෙහි 50 (i)) මේ ලොකයෙහි ඇතැම් ගෞතමයෝ, මොග්ගල්ලානයෝ, කච්චායනයෝ, වාසිට්ඨයෝ ඇත්තාහයි (මෙහි 50 (iii))

(මෙහි 50 (i)) මේ ලොකයෙහි ඇතැම් කොටඨකයෝ, කසල සෝධකයෝ (මෙහි 50 (iii))

(මෙහි 50 (i)) මේ ලොකයෙහි ඇතැම් ගොවියෝ වෙළෙන්දෝ ගවගන් රක්නෝ (මෙහි 50 (iii))

(මෙහි 50 (i)) කුළුපොත්තෝ කුඹල් කරුවෝ පෙ - කරුවෝ, සොම්වරු, පතික්කියෝ, (මෙහි 40 (iii))

(මෙහි 50 (i)) මේ ලොකයෙහි ඇතැම් සාමුද්‍රිකා දන්නාහු ගණන්තබන්නෝ, ලියන්නෝ (මෙහි 50 (ili))

(මෙහි 50 (i)) මේ ලොකයෙහි ඇතැම් කුෂ්ට රෝගීහු, ගඬු ඇත්තාහු, කැසිම් ඇත්තාහු, කාස ඇත්තාහු, ජ් ඣුර ඇත්තාහු (මෙහි 50 (iii))

(මෙහි 50 (i)) මේ ලොකයෙහි ඇතැම් ධූමක ඇත්තෝ (මෙහි 50 (iif))

(මෙහි 50 (i) මේ ලොකයෙහි ඇතැම් ඉතා උස්වූවාහු ඉතා කොටවූවාහු ඉතා කළුවූවාහු, ඉතා සුදුවූවාහු (මෙහි 50 (iii)

(මෙහි 50 (i) මේ ලොකයෙහි ඇතැම් ඉතා උස්නොවූ, ඉතා කොටනොවූ, ඉතා කළුනොවූ, ඉතා සුදු නොවූ, මෙහි 50 (iii) සහ 50(i)මේ ලොකයෙහි ඇතැම් රාගයෙන් මඩන ලද්දාහු ද්වෙෂයෙන් මඩන ලද්දාහු මෝහයෙන් මඩන ලද්දාහු (මෙහි 50 (iii)

මේ ලොකයෙහි ඇතැම් පහවූ රාග ඇත්තාවූ පහවූ ද්වෙෂ ඇත්තාහු පහවූ මෝහ ඇත්තාහු (මෙහි 50 (iii)

(මෙහි 50 (i) මේ ලෝකයෙහි ඇතැම් (මෙහි 42 (ii) පැමිණීසකු යන්නට පැමිණියාහු කියා මෙසස්කර (මෙහි 50 (iii)

මේ ලොකයෙහි ඇතැම් සොම්නස්වූවාහු (මෙහි 50 (iii)

මේ ලොකයෙහි ඇතැම් (මෙහි 46 (ii)වකුසන්නට මෙසේ කියා වෙසස්කර–

මේ ලෝකයෙහි ඇතැම් පණ්ඩිතයෝ, දක්ෂයෝ, නුවණැත්තෝ බහුශ්‍රැතයෝ, ධම් කථිකයෝ ඇත්තාහ. ඔවුන්ට දුගතියක් නැත. ඔවුන් විසින් සුගතියම කැමති විය යුතුයයි කියයි. කථාකරයි. වචනයක් පාසා දුකුළා ඇවැත්වේ

53 (i) උපසම්පන්නයෙක් උපසම්පන්නයෙකුට ආක්‍රොශ කරණු කැමැත්තේ අමනාප කරණු කැමැත්තේ තේජස් නැති කරණු කැමැත්තේ මෙසේ කියයි. (ii) යම් කෙනෙක් ජාතියෙන් සැඬොල්හුද, කුළුපොත්තෝද මැද්දෝද, රියකරුවෝද, කසල සෝධකයෝද මින් කාහුය කියා (iii) කියයිද කථාකරයිද වචනයක් පාසා දුකුළා ඇවැත්වේ,

54 (මෙහි 53 (i)) යම් කෙනෙක් එකානාතයන් පණ්ඩිතයෝය, දක්ෂයෝය, සදෑණමනාතයෝය, බහුශ්‍රැතයෝය ධම් කථිකයෝයයි කියාද කථාකරයිද, (මෙහි 53 (iii)

55 (මෙහි 53 (i)) අපි සැඬොල්හු නොවෙමු, කුළුපොත්තෝ නොවෙමු, මැද්දෝ නොවෙමු, රියකරුවෝ නොවෙමු, කසලසෝධකයෝ නොවෙමුයි (මෙහි 53 (iii))

56 (මෙහි 53 (i)) අපි පණ්ඩිතයෝ දක්ෂයෝ ප්‍රඥාව ඇත්තෝ, බහුශ්‍රැතයෝ, ධම්කථිකයෝ නොවෙමු, අපට දුගතිය නැත, අප විසින් සුගතියම කැමති විය නොහැකැයි කැමැති වෙයි, කියයි කථාකරයි,

57 උපසම්පන්නයෙක් අනුපසම්පන්නයකුට ආක්‍රොශ කරණු කැමැත්තේ, අමනාප කරණු කැමැත්තේ, තේජස් නැතිකරණු කැමැත්තේ පහත් කෙනෙකුට පහත් වචනයෙන් කථාකරයිද (මෙහි 53 (iii)) උසස් කෙනෙකුට පහත් වචනයෙන් කථාකරයිද (මෙහි 53 (iii)) පහත් කෙනෙකුට උසස් වචනයෙන් කථා කරයිද, උසස් පණ්ඩිතයකු ; මූර්ඛයකු දක්ෂයෙකු බහුශ්‍රැතයෙකු ධම් කථිකයකුට පණ්ඩිතයෙක් වෙහිය. දක්ෂයෙක් වෙහිය. නුවණැත්තෙක් වෙහිය, බහුශ්‍රැතයෙක් වෙහිය, ධම්කථිකයෙක් වෙහිය, 'තොපට දුගතියක් නැත, තොප විසින් සුගතියම කැමති විය යුතුයයි' කියයි, කථාකරයි, වචනයක් පාසා දුකුළා ඇවැත්වේ.

58 (මෙහි 53(i) උපසම්පන්නයකුගේ නම් අනුපසම්පන්නයකු කියාද මේ ලෝකයෙහි ඇතැම් චණ්ඩාලයෝ කුළු-පොත්තෝ, වැද්දෝ, රිය කරුවෝ කසල සෝධකයෝ ඇතැයි කියයි. කථාකරයි. (52 (iii) මේ ලෝකයෙහි ඇතැම් පණ්ඩිතයෝ, දක්ෂයෝ, ඥාණවන්තයෝ, බහුශ්‍රැතයෝ ධර්මකථිකයෝ වෙති, ඔවුන්ට දුගතිය නැත, ඔවුන් විසින් සුගතියම කැමති විය යුතුයයි කියයි කථාකරයි. වචනයක් පාසා පචිති ඇවැත්වේ.

59 (මෙහි 53 (i) උපසම්පන්නයකුට යන් නම් අනුපසම්පන්නයකුට කියා මෙතන්හි යොදාගත යුතුය. ඔවුහු ඒකාන්තයෙන් කුලුපොත්තෝ, වැද්දෝ, රිය කරුවෝ, කසල සෝධකයෝ වෙති (මෙහි 53 (iii) ) ඔවුහු ඒකාන්තයෙන් පණ්ඩිතයෝය, දක්ෂයෝය, නුවණැත්තෝය, බහුශ්‍රැතයෝය. ධර්මකථිකයෝයයි කියයි. කථාකරයි. (මෙහි 53 (ili)

60 (මෙහි 53 උපසම්පන්නයෙකුගේ නම් අනුපසම්පන්නයෙකු කියාද, අපි සැඩොල්ලු කුලුපොත්තෝ, වැද්දෝ, රිය කරුවෝ, කසල සෝධකයෝ නොවෙමුයයි කියයි කථාකරයි. (මෙහි 53 (iii))

61 (මෙහි 53 මෙයි ඡේදයේ කරුණු කැමැත්තෝ යන් නම් නොකරණු කැමැත්තෝ කියාද මෙහේ වෙනුවට නම කරුණු කැමැත්තෝ කියා මෙතන්හි යොදාගතයුතුයි.) පක්සැඩොලෙකුට, කුලුපොත්තෙකුට, වැද්දෙකුට, රියකරුවෙකුට, කසල සෝධකයෙකුට, චණ්ඩාලයෙක් වෙහිය. කුලුපොත්තෙක් වෙහිය, වැද්දෙක් වෙහිය, රියකරුවෙක් වෙහිය, කසල සෝධකයෙක් වෙහියයි පහත් චිත්තයෙන් කියයි කථාකරයිද වචනයක් පාසා දුබ්භාසිත ඇවැත්වේ.

62 (මෙහි 53 (i) කරණු යන පද වෙනුවට නොකරණු කියාද මෙහේ වෙනුවට නමවතාම කරණු කැමැත්තෝ කියා මෙතන්හි යොදාගත යුතුයි,) උසස්වූ ක්ෂත්‍රියයෙකුට බ්‍රාහ්මණයෙකුට චණ්ඩාලයෙක කුලුපොත්තෙක වැද්දෙක රියකරුවෙක සැඩොලෙකැයි (මෙහි 53 (iii) )

63 (මෙහි 53 (i) කරණ්ඩු යන පද වෙනුවට නොකරණ්ඩු කියාද, එමෙන් අන්හට නමටනම් කරණ්ඩු නැමැත්තේ කියා වෙනස්කර යොදාගතයුතු.) පහත්වූ සැඩොලෙකු කුලුපොත්තෙකු, වැද්දෙකු, රියකරුවෙකුට කුසල සොබනයෙකුට ක්ෂත්‍රියයෙකි, බ්‍රාහ්මණයෙකැයි කියයි. කථාකරයිද එවනායක් නහට දුබ්භාසිත ඇවැත්වේ

64 (මෙහි 53 (i) ) කරණ්ඩු යන පද වෙනුවට නොකරණ්ඩු කියාද එමෙන් අන්හට නමටනම් කරණ්ඩු නැමැත්තේ කියාද වෙනස්කර යොදාගතයුතු) උසස්වූ ක්ෂත්‍රිය බ්‍රාහ්මණ යන මවුනොද ක්ෂත්‍රියයෙක් නොවිය, බ්‍රාහ්මණයෙක් නොවියයි උසස්නොවී කියයි කථාකරයි. (මෙහි 53 (iii) )

65 (මෙහි 46, 47, 48, 49 ජේදවල කරණ්ඩු වෙනුවට 'නොකරණ්ඩු කියාද, නැමැත්තේ යන 3 වෙනි පදය ලගට නමටනම් කරණ්ඩු නැමැත්තේ කියාද, 'පාචිත්තිය' යන්නට 'දුබ්භාසිත' කියාද වෙනස්කර යොදාගතයුතු)

66 (මෙහි 50, 51, 52 වෙනි ජේද 'කරණ්ඩු' වෙනුවට නො' කරණ්ඩු කියාද නැමැත්තේ යන තුන්වෙනි පදය ලගට නමට නම් කරණ්ඩු නැමැත්තේ කියාද ඒ අවසානට නමටනම් කරණ අදහසින් කියාද පාචිත්තිය යන්නට දුබ්භාසිත කියාද වෙනස්කර යොදාගතයුතුයි.)

67 (මෙහි 53, 54 වෙනි ජේද, කරණ්ඩු වෙනුවට නො-කරණ්ඩු කියාද, නැමැත්තේ යන පද නට නොනැමැත්තේ කියාද, ඒ අවසානයට නමටනම් කරණ අදහසින් කියාද පාචිත්තිය වෙනුවට දුබ්භාසිත කියාද වෙනස්කර යොදාගතයුතු)

68 (මෙහි 55, 56 වෙනි ජේදවල, කරණ්ඩු වෙනුවට නො-කරණ්ඩු කියාද නැමැත්තේ යන පදනට නොනැමැත්තේ කියාද පාචිත්තිය වෙනුවට දුබ්භාසිත කියාද වෙනස්කර යොදාගතයුතුයි.)

69 (මෙහි 57 වෙනි ජේදයේ නැමැත්තේ යන පදවෙනුව නොනැමැත්තේ කියාද, ඒ අවසානයට නමටනම් කිරීමේ අදහසින් කියාද දුකකට යන්නට දුබ්භාසිත කියාද වෙනස්කර යොදාගතයුතු.)

70 (මෙහි 58 වෙනි ඡේදයේ, කැමැත්තේ යන පදවලම නොකැමැත්තේ කියාද, ඒ අවසානයෙහි සමච්චල් කරණ අදහසින් කියාද, දුක්කට වෙනුවට දුබ්භාසිත කියාද වෙනස් කර යොදාගනු)

71 උපසම්පන්නයෙක් අනුපසම්පන්නයෙකුට ආක්‍රොශ කරණු නොකැමැත්තේ, අවමන් කරණු නොකැමැත්තේ තේජස් නැති කරණු නොකැමැත්තේ සමච්චල් කරණ අදහසින් ඒ ආකාරයෙන් සම්භිනි කෙනෙක් සැඩොල්හුද කුළුපොත්තෝද, මැද්දෝද රියකරුවෝද කසල සෝධක යයි දුයි (ii) කියයිද කථාකරයිද, මහුගේ පාසා දුබ්භාසිත ඇවැත් වේ.

72 උපසම්පන්නයෙක්, අනුපසම්පන්නයකුට ආක්‍රොශ කරණු නොකැමැත්තේ අවමන් කරණු නොකැමැත්තේ, තේජස් නැති කරණු නොකැමැත්තේ සමච්චල් කරණ අදහසින් යම් කෙනෙක් ඒ ආකාරයෙන් පණ්ඩිතයෝ වෙත්ද, දක්ෂයෝ වෙත්ද; නුවණැත්තෝ වෙත්ද, බහුශ්‍රැතයෝ වෙත්ද, ධර්ම කථිකයෝ වෙත්දැයි මේ යේ කියයිද කථාකරයිද මහු-ගේ පාසා දුර්භාෂිත ඇවැත් වේ.

73 (i) උපසම්පන්නයෙකු අනුපසම්පන්නයෙක් ආක්‍රොශ කරණු නොකැමැත්තේ, අවමන් කරණු නොකැමැත්තේ, තේජස් නැතිකරණු නොකැමැත්තේ, සමච්චල් කිරීම ම-යෙන්, අපි චණ්ඩාලයෝ නොවෙමු, කුළුපොත්තෝ නො-වෙමු, මැද්දෝ නොවෙමු, රියකරුවෝ නොවෙමු, කසල සෝධකයෝ නොවෙමුයයි (මෙහි 71 (ii) )

74 (මෙහි 73 (i) ). අපි පණ්ඩිතයෝ නොවෙමු, දක්ෂයෝ නොවෙමු, නුවණැත්තෝ නොවෙමු, බහුශ්‍රැතයෝ නොවෙමු, ධර්ම කථිකයෝ නොවෙමු, අපට දුගතියක් නැත, අපි විසින් සුගතියම කැමතිවිය යුත්තේමහයි (මෙහි 71 (ii))

75 පැලියේ අත්තියන්නාට, පැලිය කියමන්නාට, අම්මාද කරන්නාට, උම්තුමූවහුට, සිහි නැත්තාට, වේදනාවෙන් පෙළෙන්නාට ඇවැත් නොවේ.

## 3 පෙසුඤ්ඤ ශික්ෂාපදය

1 (මෙහි 1 ශික්ෂාපදයේ 1 (i)) ඒ කාලයෙහි වනාහි ෂඩ්වර්ග (ඡබ්බග්ගිය) භික්ෂූහු (ii) හබගත් ඔබර ඇති කලහගත් කලහ ඇති, කලහගත් විවාද ඇති, භික්ෂූන්ගේ කේලාම් අසත්. මොහු සමීපයෙන් අසා මොහුගේ බිඳීම පිණිස අසවලාට කියත්. අසවල් කෙනෙකුන් අසා අසවලුන්ගේ බිඳීම පිණිස මොහුට කියත්. ඒ කාරණකොටගෙන නූපන්නාවූ ඩබර ඇති වෙත්. උපන්නාවූ ඩබර දියුණුවීම පිණිස පළල්වීම පිණිස පමණක් (iii) යම් ඒ භික්ෂූ කෙනෙක් අල්පේච්ඡවූවාහුද (මෙහි මුසාවාද ශික්ෂාපදයේ 3 (iv)) ඔව්හු දොස් කියත්, නො සතුට ප්‍රකාශ කරත්, නොසතුටු වචන කියත්. කෙසේ නම් ෂඩ්වර්ග භික්ෂූහු (මෙහි (ii)) දැයි කියායි.

2 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. (මෙහි මුසාවාද ශික්ෂාපදයේ 3 (i)) රැස්කරවා යම් සේ නම් "මහණෙනි, තෙපි (මෙහි 1 (ii)) දැයි' කියායි. "භාග්‍යවතුන් වහන්ස, සත්‍යයයි" කීයේය. භාග්‍යවත් බුදුරජානන් වහන්සේ ගර්හා කළසේක. හිස් පුරුෂයෙනි, කෙසේ නම තෙපි (මෙහි 1 (ii))දැයි කියායි. හිස් පුරුෂයෙනි, මෙය නොපැහැදියවුන්ගේ පැහැදීම පිණිස (මෙහි මුසාවාද ශික්ෂාපදයේ 3 (iv)) මහණෙනි, මෙසේද වනාහි මේ ශික්ෂාපදය උදෙසව්.

3 "භික්ෂූන්ගේ ප්‍රිය බව ශූන්‍ය කරණ කේලාම් කීමෙහි පචිති ඇවැත්වේ."

4 "කේලාම් කීම" නම දෙපරිද්දෙකින් කේලාම් වේ. ප්‍රිය බව කැමැත්තහුගේ හෝ බිඳුවන අදහසින් හෝයි. ක්‍රම දසයක් ප්‍රියශූන්‍යබව ගෙන එයි. ජාති වශයෙන්ද, නාම වශයෙන්ද, ගොත්‍ර වශයෙන්ද, කර්ම වශයෙන්ද, ශිල්ප වශයෙන්ද, ආබාධ වශයෙන්ද, සටහන් වශයෙන්ද, කෙලෙස් වශයෙන්ද ඇවැත් වශයෙන්ද, ආක්‍රොශ වශයෙන්ද වේ. "ජාතිය" නම (2 ශික්ෂාපදයේ 4 ඡේදය)

5 'ආක්‍රොශය' නම (මෙහි 2 ශික්ෂාපදයේ (ii) ඡේදය)

6 (i) උපසම්පදාවූවෙක් උපසම්පදාවූවෙකුගෙන් අසා උපසම්පදාවූවෙකුට කේලාම් ගෙන එයිද (ii) මෙනම තැනැත්

යෙක් නොපව සැබෑලෙන, කුළුපොත්තෙන, මැද්දෙන, රිය කරුවෙන, සකල සෝධකයෙකැයි (iii) කියායයි කියාද වචන යක් මවනයක් පාසා පවිති ඇවැත්වේ.

(7-25 ඡේදවල මුලට 6 (i) ද අගට 6 (iii) ද යොදන්න)

7 ක්ෂත්‍රියයෙක, බ්‍රාහ්මණයෙකැයි

8 අමතණ්ණතාය, ජමතණ්ණතාය, ධනිටය්‍යතාය, සමිටය්‍යතාය, කුටුම්බිකතායයි,

9 බුද්ධරක්ඛිතාය, ධම්මරක්ඛිතාය, සංඝරක්ඛිතායයි

10 සොභිය භැරවාජ කියා කියයි.

11 ගෞතමිය, මොග්ගල්ලායනය, කච්චායන මාණිටයයි

12 කොටයනය, කාසලගොතනයයි,

13 ගොවියෙක, වෙළෙන්දෙක, ගෙරි රකින්නෙකැයි

14 කුළුපගෝත්තෙක, කුඹල් කරුවෙක, පෙහෙකම් කරන්නෙක, කොමිකරුවෙක, සකලසෝධකයෙකැයි

15 සාමුද්‍රිකා දන්නෙයයි. ගණන් තබන්නෙයි. ලියන් නෙකියි

16 කුෂ්ට රෙගියෙක, ගෙඩි ඇත්තෙක, කැසිලි ඇත්තෙක, කාසය ඇත්තෙක මිදැල්ලමාරන ඇත්තෙකැයි

17 මධුමෙහ ඇත්තෙකැයි

18 ඉතා උස්ය, ඉතා මිටිය, ඉතා කළුය, ඉතා සුදුයයි

19 ඉතා උසය, ඉතා නොමිටිය, ඉතා නොකළුය. ඉතා නොසුදුසුය.

20 රජයෙන් අවසර ලත් වූයේය. මවපියන් අවසර ලත් නොවූයේය, බිරිඳගෙන් අවසර ලත් නොවූයේද,

21 සහමුළු රූප ඇත්තේය, සහමුළු වෙදන ඇත්තේය, සහමුළු සඤ්ඤා ඇත්තේය

22 පාරාජිකාවට පැමිණුනෝ, සංඝාදිසේසයට පැමිණුනෝ, ථුල්ලච්චයට පැමිණුනෝ, පාචිත්තියට පැමිණුනෝ, පාටිදේසනීයට පැමිණුනෝ, දුක්කටයට පැමිණියේය, දුබ්භාසිතයට පැමිණියේ-

8 දෙවියන් වූමෙනැයි-

24 ඔටුවෙක, ඇටිඑළුවෙක, ගොනෙක, කොටිඑළුවෙක, තිරිසනෙක්, තිරිසනා ඔහුට පුණතියක් නැත. 'ප්‍රාප දුගති යම් තැනෙක විය යුතුයයි-

25 ප්‍රණිධිතයෙක, දක්ෂයෙක, නුවණැත්තෙක බහුශ්‍රැතයෙක, ධර්මකථිකයෙක, ඔහුට දුගතියක් නැත, ඔහුට සුගතියම කැමතිවිය යුතුය.

26 (ප්‍රශ්න 6 (i) මේනම් තැනැත්තේ මේ ලෝකයෙහි ඇතැම් සැඩොල්ලු ඇත, කුළුපොත්තෝ ඇත, රියකාරුවෝ ඇත කසළශෝධකයෝ ඇත (ii) නොහොත් අන් ලෙසක් නොකියයිද එසේම කියයිද, වචනයක් මවනයක් පාසා දුකුලා ඇමැත්තෙමි.

27 (ප්‍රශ්න 6 (i) මෙයනම් තැනැත්තේ මේ ලෝකයෙහි ඇතැම් ක්ෂත්‍රියයෝ බ්‍රාහ්මණයෝ ඇත්තාහයි කියයි. නොහොත් අන් ලෙසක් නොකියයි. එසේම කියාහයි කියයි. වචනයක් මවනයක් පාසා දුකුලා ඇමැත්තෙමි.

28 (8 වන පිට 25 දක්වා ඇති ඡේදවල 1 ඡේදය හා දෙවෙනි ඡේදවල පුද්ගලයින්ගේ නම්වල ඔහු වචන යොදා ඡේද 18 ක් 26 වෙනි ඡේදයේ (ii) ඡේදය ලෙස යොදා ගත යුතුයි.)

29 (ප්‍රශ්න 6 (ii) මේනම් තැනැත්තේ යම් කෙනෙක් ඒකාන්තයෙන් චණ්ඩාලයෝ වෙත්, කුළුපොත්තෝ වෙත්, වැද්දෝ වෙත්, රියකාරුවෝ වෙත්, කසලශෝධකයෝ වෙත් යයි කියයි. නොහොත් අනිකක් නොකියයි. එසේම කියායයි කියයි. වචනයක් වචනයක් පාසා දුකුලා ඇමැත්තෙමි.

30 (ප්‍රශ්න 6 (ii) මෙයනම් තැනැත්තේ යම් කෙනෙක් ඒකාන්තයෙන් ප්‍රණිධිතයෝය, දක්ෂයෝය, නුවණැත්තෝය, බහුශ්‍රැතයෝය, ධර්මකථිකයෝයයි කියයි. (ප්‍රශ්න 26 (ii)

31 (ප්‍රශ්න 6 (i) මේනම් තැනැත්තේ අපි චණ්ඩාලයෝ නොවෙමු, කුළුපොත්තෝ නොවෙමු, වැද්දෝ නොවෙමු, රියකාරුවෝ නොවෙමු. කසල ශෝධකයෝ නොවෙමුයයි කියයි (ප්‍රශ්න 26 (ii) )

32 (ප්‍රශ්න 6 (ii) මේනම් තැනැත්තේ (7 වන 19 දක්වා ඇති ඡේද 13 හි පුද්ගල නාමවල බහුවචන යොදා ඡේද 13 ක් 26 (ii) ඡේදයේ යොදන්න)

33 ප්‍රශ්න 6 (ii) දුකුලා ඇමැත්තෙමි.

34 උපසම්පදා වූවෙක් උපසම්පදාවූවෙකුගෙන් අසා උපසම්පදා නොවූවෙකුට කේලාම් කියයිද දුකුළා ඇවැත්වේ.

35 උපසම්පදාවූවෙක් උපසම්පදා නොවූවෙකුගෙන් අසා උපසම්පදාවූවෙකුට කේලාම් කියයිද දුකුළා ඇවැත්වේ.

36 උපසම්පදාවූවෙක් උපසම්පදා නොවූවෙකුගෙන් අසා උපසම්පදා නොවූවෙකුට කේලාම් කියයිද දුකුළා ඇවැත්වේ.

37 ප්‍රිය බව කැමතිනැත්තාහටද බිඳවීමට අදහස් නැත්තාහටද උමතුවූවහුටද ආදිකර්මිකයාහටද ඇවැත් නොවේ.

## 4 පදසොධම්ම ශික්ෂාපදය

1 මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 1 (i) යොදන්න) එකල්හි වනාහි (ii) ෂබ්බග භික්ෂූහු උපාසකයන්ට පද වශයෙන් ධර්මය කියවත්. උපාසකයෝ භික්ෂූන් අතරෙහි ගෞරව නැතිව, අභිකරුණු, විරුද්ධ පැවතුම් ඇතිව වාසය කරත්. (iii) යම් භික්ෂූහු නොහොත් අල්පෙච්ඡද (මෙහි මුසාවාද ශි-ෂ-3 iv) ඔව්හු දොස් කියත් නොසතුටු ප්‍රකාශ කරත්, නොසතුටු වචන කියත්.. කෙසේ නම් ෂබ්බග භික්ෂූහු (මෙහි (ii) ) දැයි කියති.

2 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. (මෙහි 1(ii) "මහණෙනි, තෙපි (මෙහි 1 (ii) යයි. ඇත්තද? භාග්‍යවතුන් වහන්ස, ඇත්තය 'භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ ගර්හා කළසේක (මෙහි මුසාවාද-ශි-ෂ 3 iv) හිස් පුරුෂයෙනි, කෙසේනම් තෙපි (මෙහි 1 (ii)) දැයි කියාති. හිස් පුරුෂයෙනි, මෙය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිස හෝ (මෙහි මුසාවාද-ශි-ෂ-3 vi) මහණෙනි, ය ශික්ෂාපදය මෙසේද උදෙසව්.

3 "යම් කිසි භික්ෂුවක් අනුපසම්පන්නයෙකුට පාළිධර්ම පද වශයෙන් කියවා නම් පචිති ඇවැත්වේ."

4 "යමෙක් වනාහි" යනු 'භික්ෂු'' යනුයි (මෙහි පාරාජික පාලියේ 1 පාරාජිකයේ පදභාජනියේ 1-2) 'උපසම්පදා නොවූයේ නම්' භික්ෂුවත් භික්ෂුණියත් හැර ඉතිර ඇත්තෝ උපසම්පන්නයෝ නොවෙති. 'පද වශයෙන්' යනු පදය අනුපදය අන්වක්ඛරය අනුබ්‍යඤ්ජනයයි සතර විධියකි. පද' නම් එකට පටන් ගෙන

එකට අවසන් කරයි 'අනුපද' නම් වෙන වෙනම පටන්ගෙන එකට අවසන් කරයි 'අන්වක්ඛර' නම් රූපය අනිත්‍යයයි කියනු ලබන්නේ රූපය කියා අවසන් කරයි. 'අනුබ්‍යඤ්ජන' නම් රූපය අනිත්‍යයයි කියන්නේ වේදනාව අනිත්‍යයයි ශබ්දය පිට කරයි. යමක් පදයද යමක් දෙවෙනි පදයද මක් යමක් එක එක අකුරද, යමක් ඊළඟ අකුරද මේ සියල්ල පදසෝ ධර්ම නම්. 'ධර්මය' නම් බුද්ධභාෂිතය, ශ්‍රාවක භාෂිතය, ඍෂිභාෂිතය, දේව භාෂිතය අර්ථයෙන් යුක්තය ධර්මයෙන් යුක්තය,

5 'කියවන්නේය' යනු පදයක් පාසා පදයෙන් කියවයි. පචිති ඇවැත්වේ. අකුරු වශයෙන් කියවයිද පචිති ඇවැත්වේ. උපසම්පදා නොවූවහු කෙරෙහි උපසම්පදා නොවූයේය යන අදහස් ඇත්තේ පදවශයෙන් පාලි ධර්මය කියවයිද පචිති ඇවැත්වේ. උපසම්පදා නොවූවකු කෙරෙහි විමති ඇත්තේ පදවශයෙන් පාලි ධර්මය කියවයිද පචිති ඇවැත්වේ උපසපන් නොවූවහු කෙරෙහි උපසම්පදා වූයේය යන අදහස් ඇත්තේ පද වශයෙන් පාලිධර්මය කියවාද පචිති ඇවැත්වේ. උපසම්පදාවූවකු කෙරෙහි උපසම්පදා නොවූයේය යන අදහස් ඇත්තේ දුකුලා ඇවැත්වේ. උපසම්පදාවූවකු කෙරෙහි විමති ඇත්තේ දුකුලා ඇවැත්වේ. උපසම්පදාවූවහු කෙරෙහි උපසම්පදාවූයේය යන හැඟීම ඇත්තේ ඇවැත් නොවේ. එකට පෙළ කියවාගත් තේ, එකට හැදෑරීම් කරන්නේ අමතකවූ දෙය මතක්කර දීමේදී අනුපසම්පන්නයාට අමතකවේයයි අනුසම්පාමෙන් එකම කීමේදිද, උමතුවූවහුටද, ආදිකර්මිකයාටද ඇවැත් නොවේ.

## 5 සහසෙය්‍ය ශික්ෂාපදය

1 එකල්හි මහාකි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ අලව්නුවර අග්ගාලව චෛත්‍යයෙහි වාසය කරණසේක. එකල්හි මහාකි උපාසකයෝ බණ ඇසීමට ආරාමයට එන්නාහුය. බණ නිමකල්හි ස්ථවිර භික්ෂූන් විහාරවලටගත්
(ii) බාලභික්ෂූන් ඒ උපස්ථාන ශාලාවෙහිම උපාසකයන් ස

මුළාසිහි ඇත්තාහු මොළොදනුම් නැත්තාහු නිර්වස්ත්‍රව දෙබ-වමින් ගොරවමින් ශයනය කරත්. (iii) මනුෂ්‍යයෝ කෙසේ නම් පින්වතුන් වහන්සේලා මුළාසිහි ඇත්තාහු මොළොදනුම් නැත්තාහු නිර්වස්ත්‍රව දෙබවමින් ගොරවමින් ශයනය කරත් (iv) දැයි දොස් කීවාහුය. නොසතුටු ප්‍රකාශ කළාහුය. නොසතුටු වචන කීවාහුය. භික්ෂූහු දොස් කියන්නාවූ නොසතුටු ප්‍රකාශ කරන්නාවූ නොසතුටුබව කියන්නාවූ ඒ උපාසකයන්ගේ වචන ඇසූහ. යම් ඒ භික්ෂූ කෙනෙක් අල්පේච්ඡවූවාහුද ඔව්හු (මෙහි (ii)) කෙසේ නම් භික්ෂූහු උපසම්පදා නොවූවන් සමග එකට නිදීම කරත්දැයි දොස් කීවාහුය නොසතුටු ප්‍රකාශ කළාහුය. නොසතුටු වචන කීහ.

2 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය.(මෙහි 1 (ii)) "මහණෙනි, උපසම්පදා නොවූවන් හා එකට ශයනය කරත් සැබෑ ඇත්තදැයි?" ඇසූසේක "භාග්‍යවතුන් වහන්ස, ඇත්තේය." භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගැරහූසේක. (මෙහි මුසාවාද ශික්ෂාපදයේ 3 (vi)) මහණෙනි, කෙසේ නම් ඒ හිස් පුරුෂයෝ උපසම්පදා නොවූවන් සමග ශයනය කරන්නාහුද? මහණෙනි, මෙය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිස (මෙහි මුසාවාද ශික්ෂාපදයේ 3 (vi)) මහණෙනි, මෙසේද මේ ශික්ෂාපදය උදෙසව්.

3. "යම්කිසි භික්ෂුවක් උපසම්පදා නොවූවෙකු සමග එක්ගෙයි වාසය කරන්නේ නම් පචිති ඇවැත්වේ" භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේද මේ ශික්ෂාපදය පනවනලදී.

4 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අලව් නුවර කැමති තාක් කල් වැස කොසඹෑ නුවර යම් තැනෙකද, එහි වැඩිසේක. අනුක්‍රමයෙන් චාරිකාවෙහි හැසිරෙන්නාහු කොසඹෑ නුවර යම් තැනෙකද, එහි පැමිණියේය. භාග්‍යවතුන් වහන්සේ වනාහි එහි බදරිකාරාමයෙහි වාසය කරණසේක. භික්ෂූහු ආයුෂ්මත් රාහුල තෙරුන්ට "ඇවැත්නි රාහුලයෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් උපසම්පදා නොවූවන් හා එක්ගෙයි නිදීම නොකළයුතුයයි ශික්ෂාපද පනවන ලද්දේයයි" කීවාහුය. "ඇවැත්නි රාහුලය, නිදනතැනක් දනීවාසි" කීහ.

5 ඉක්බිති ආයුෂ්මත් රාහුල තෙමේ ශයනයක් නොලබන්නේ වැසිකිළියෙහි ශයනය කෙළේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රාත්‍රියෙහි උදෑසන නැගිට වැසිකිළියට වැඩිසේක. වැඩ කෑරූයේක. ආයුෂ්මත් රාහුල තෙමේද කෑරූවේය. "මෙහි කවරෙක්දැයි" ඇසූසේක. "භාග්‍යවතුන් වහන්ස, මම රාහුලයයි" කීයේය. "රාහුලය ඔබ කුමක් හෙයින් මෙහි සිටියේදැයි" ඇසූසේක ඉක්බිති ආයුෂ්මත් රාහුල තෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ සිද්ධියෙහි භික්ෂූන් ආමන්ත්‍රණය කළසේක. "මහණෙනි, උපසම්පදා නොවූවෙකු හා දෙතුන් රාත්‍රයක් එකගෙහි ශයනය කරන්නට අවසර දෙමි මහණෙනි, මෙසේද වනාහි මේ ශික්ෂාපදය උදෙසව්.

6 "යම්කිසි භික්ෂුවක් උපසම්පදා නොවූවෙකු සමග දෙතුන් රාත්‍රයකට වඩා එකගෙහි සයනයකරයි නම් පචිති ඇවැත්වේ."

7 "යමෙක් වනාහි යනු භික්ෂු යනු (මෙහි පාරාජිකා පාළියේ 1 පාරාජිකයේ පදභාජනියේ 1-8) "උපසම්පදා නොවූවෙකු" නම් භික්ෂුව අත්හැර, ඉතිරි අය උපසම්පදා නොවූයේයි. "දෙරාත්‍රයකට තුන් රාත්‍රයකට මත්තෙහි" යනු දෙතුන් රාත්‍රයකට වඩා. "සමග" යනු එකවිට. 'ශයනය' නම් සම්පූර්ණයෙන් සෙවිලි කළ සම්පූර්ණයෙන් වැසුනු, බොහෝ සෙයින් සෙවිලිකළ බොහෝසෙයින් වැසුනු, "ශයනයකරයි" යනු, සතරවෙනි දවසෙහි හිරු අස්තංගව ගිය කල්හි උපසම්පදා නුවූවකු වැද හොත් කල්හි භික්ෂුව හොවීද, පචිති ඇවැත්වේ භික්ෂුව නිදන කල්හි උපසම්පදා නොවූයේ හොවීද පචිති ඇවැත්වේ. දෙදෙනම හෝ හොවිත්ද, පචිති ඇවැත්වේ. නැගිට නැවත නැවත හොවිත්ද පචිති ඇවැත්වේ.

8 "භාගයක් සෙවිලි කළ කල්හි භාගයක් වැසුනු කල්හි දුකුලා ඇවැත්වේ. උපසම්පදාවූවෙකු කෙරෙහි උපසම්පදා නොවූයේය යන හැඟීම් ඇත්තේ දුකුලා ඇවැත්වේ. උපසම්පදාවීමෙහි විමති ඇත්තේ දුකුලා ඇවැත්වේ. උපසම්පදා-

[illegible]මේකු කෙරෙහි උපසම්පදාවූයේය යන හැඟීම් ඇත්තේ ඇවැත් නොවේ. දෙරැයක් තුන්රැයක් වසයිද දෙතුන් රැයකට අඩුවෙන් වසාද, දෙරැයක් වසා තුන්වෙනි රාත්‍රියේ අරුණට පෙර නැගිට නැවත වසයිද, සියල්ල සෙවිලිනොකළ සියල්ල නොවැහුන බොහෝ සෙවිලි නොකළ බොහෝ නොවැහුන උපසපන් නොවූවෙක් හොත් කල්හි භික්ෂුව හිඳියිද, භික්ෂුව හොත් කල්හි උපසපන් නොවූයේ හිඳීද දෙදෙනම හෝ හිඳීත්ද, උමතුවූවහුට ආදිකර්මිකයාට ඇවැත් නොවේ.”

## 6 දෙවෙනි සහසෙය්‍ය ශික්ෂාපදය

1 (මෙහි 1 මුසාවාද ශික්ෂාපදය 1 (i)) එකල්හි වනාහි ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිර තෙමේ කොසොල් දනව්වෙන් සැවැත්නුවරට යන්නේ සවස් වේලෙහි එක්තරා ගමකට පැමිණියේය. එකල්හිවනාහි ඒ ගමෙහි එක්තරා ස්ත්‍රියක් විසින් ආගන්තුක ශාලාවක් කරණ ලද්දේවේ. ඉක්බිති ආයුෂ්මත් අනුරුද්ධ තෙමේ ඒ ස්ත්‍රිය යම් තැනෙකක්හිද එහි පැමිණියේය. ඒ ස්ත්‍රියට “නැගණියෙනි, ඉදින් ඔබට බරක් නොවන්නේ නම් පැමිණ එක් රාත්‍රියක් ආගන්තුක ශාලාවෙහි වසන්නෙමුයි” කීයේය. “ස්වාමීනි, වසනුවයි” කීවාය. අනිකුත් මගීහුද යන්–නෝ ඒ ස්ත්‍රිය යම් තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ ඒ ස්ත්‍රියට “ආර්‍යාවෙනි, ඉදින් ඔබට බරක් නොවේනම් එක් රැයක් ආගන්තුක ශාලාවෙහි වසමුයි” කීවාහුය. පින්වතුන් මේ ආර්‍ය ශ්‍රමණ තෙමේ පළමුවෙන් පැමිණියේය. ඉදින් හෙතෙම අනුදනීනම් වසවයි” කීවාය.

2 ඉක්බිති ඒ මගියෝ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් යම් තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ ආයුෂ්මත් අනුරුද්ධට “ස්වාමීනි, ඉදින් ඔබවහන්සේට බරක් නොවේ නම් එක්රැයක් ආගන්තුක* ශාලාවෙහි වසන්නෙමුයි” කීවාහුය. “ඇවැත්නි, වසවයි” කීයේය. ඉක්බිති ඒ ස්ත්‍රී තොමෝ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් කෙරෙහි දුටුමෙන් පිළිබඳ සිත් ඇතිවූවාය. ඉක්බිති ඒ ස්ත්‍රී තොමෝ ආයුෂ්මත්

අනුරුද්ධ තෙමේ ද නැතොත්හිද, එහි පැමිණියාය. පැමිණ ආයුෂ්මත් අනුරුද්ධට "ස්වාමිනි, ආර්යයන් වහන්සේ ෙ මිනිසුන් විසින් ගැවසී ගත්තේ ශූන්‍යයේ මාසය නොකරන්-නේය. ස්වාමිනි මම ආර්යයන් වහන්සේගේ ඇඳ ඇතුළත පනවන්නෙමි නම් යහපතැයි." ආයුෂ්මත් අනුරුද්ධයන් වහන්සේ නිශ්ශබ්දව ඉවසූසේක.

3 ඉක්බිති ඒ ස්ත්‍රී තොමෝ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්ගේ ඇඳ ඇතුළත පනවා, සැරසී සුවඳමත්වී ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් යම් තැනෙක්හිද එහි පැමිණියාය. පැමිණ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්ට (ii) "ස්වාමිනි ආර්යයන් වහන්සේ දක්මිකළය. සතුටිනෙන දෙන්නේය. මමද දක්මිකළය, ප්‍රසාදය ගෙනදෙන්නේය. ස්වාමිනි මම ආර්යයන් වහන්සේට භාර්යාමින්නෙමි න යහපතැයි" කීමාය. මෙසේ කීකල්හි ආයුෂ්මත් අනුරුද්ධ තෙමේ නිශ්ශබ්ද විය. (iii) දෙවනුවත් ඒ ස්ත්‍රී තොමෝ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්ට (මෙහි (ii) ) තුන්වෙනුවත් ඒ ස්ත්‍රී තොමෝ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්ට "ස්වාමිනි ආර්යයන් වහන්සේ දක්මිකළය, සතුටිනෙන දෙන්නේය. මාද දක්මිකළය, සතුටිනෙන දෙන්නේය. ස්වාමිනි ආර්යයන් වහන්සේ මාද සියළු වස්තුවද පිළිගන්නාසේක්වායි" කීමාය. ආයුෂ්මත් අනුරුද්ධ තෙමේ නිශ්ශබ්ද වූයේය.

4 ඉක්බිති ඒ ස්ත්‍රී තොමෝ සළුව ඉවත්කොට ආයුෂ්මත් අනුරුද්ධතෙරුන් ඉදිරියෙහි සක්මන්ද කරයි. සිටිමද කරයි, හිඳීමද කරයි, හොවීමද කරයි ඉක්බිති ආයුෂ්මත් අනුරුද්ධ තෙමේ ඉන්ද්‍රියන් මෙහෙයා ඒ ස්ත්‍රිය නොබැලුවේය. කථාත් නොකෙළේය. ඉක්බිති ඒ ස්ත්‍රී තොමෝ "භවත්නි, ආශ්චර්යයෙන් පුදුමය. පින්වත්නි, ආශ්චර්යයෙන් අද්භූතය මට බොහෝ මිනිස්සු සියය බැගින් දහස බැගින්ද එවත්. මා විසින් මේ ශ්‍රමණයා කෙරෙහිම ආයාචනා ලබන්නේ මා පිළිගන්නට්ත් සියලු වස්තුව පිළිගන්නට්ත් නොකැමතිවේ යයි" සළුවහැඳ ආයුෂ්මත් අනුරුද්ධයන්ගේ පාමුල හිස තබා වැටී ආයුෂ්මත් අනුරුද්ධතෙරුන්ට "ස්වාමිනි, වැරැද්ද මා යටකොට

පැවැත්තේය. යම්බඳුවූ මා බාල බැවින් මුළා බැවින් කිළුටු බැවින් මෙසේ කෙළෙමි. ස්වාමීනි, ආර්‍ය්‍යයන්වහන්සේ ඒ මාගේ වැරැද්ද මත්තෙහි සංවරවීම පිණිස පිළිගනීවා.”

“නැගණිය, එසේනම් වැරැද්ද යටකොට පවතීවා. යම්බඳුවූ ඔබ බාල බැවින් මුළා බැවින් කිළුටු බැවින් මෙසේ කෙළේද, නැගණිය, ඔබ යම් වේලාවක සිට වැරැද්ද වැරැද්ද වශයෙන් දැක ධර්මයවූ පරිදි පිළියම් කරන්නෙහිද, තොපගේ ඒ වැරැද්ද මම පිළිගනිමි. නැගණිය, යම්කෙනෙක් වැරැද්ද වැරැද්ද වශයෙන් දැක ධර්මයවූ පරිදි පිළියම් කෙරේද, මත්තෙහි සංවරයට පැමිණේද, මේතොමෝ ආර්‍ය්‍ය විනයෙහි වැඩි දියුණුවකි.”

5 ඉක්බිති ඒ ස්ත්‍රීතොමෝ ඒ රාත්‍රිය ඇවෑමෙන් ආයුෂ්මත් අනුරුද්ධතෙරුන් ප්‍රණීතවූ කැයුතු බුදියයුතු දෙයින් සියතින් සතප්වා පවරා, වැළඳූ පාත්‍රයෙන් ඉවත්කළ අත් ඇති කල්හි වැද එකත්පසෙක සිටියාය. එකත්පසෙක සිටි ඒ ස්ත්‍රියට ආයුෂ්මත් අනුරුද්ධතෙමේ දැහැමි කථාවෙන් කරුණු ගෙනහැර දක්වූයේය. සමාදන් කරවූයේය. තෙද ගැන්වූයේය, සතුටු කෙළේය. ඉක්බිති ඒ ස්ත්‍රීතොමෝ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් විසින් කරුණු ගෙනහැර දක්වනු ලද්දී සමාදන් කරවනු ලද්දී තෙදගන්වනු ලද්දී සතුටු කරණු ලද්දී ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්ට (ii) ‘ස්වාමීනි, යහපත. ස්වාමීනි යහපත, ස්වාමීනි, යම්සේ යටිකුරු කරණ ලද්දක් උඩුකුරු කරන්නේද වැසූ දෙයක් විවෘත කරන්නේද, මුළාවූවෙකුට මාර්ගය කියන්නේද ඇස් ඇත්තෝ රූප දකිත්වායි අන්ධකාරයෙහි තෙල් පහනක් දරන්නේද එමෙන්ම ආර්‍ය්‍යවූ අනුරුද්ධ තෙරුන් විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය ප්‍රකාශ කරණ ලදී. ස්වාමීනි, ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ සරණ යමි. ධර්මයේද භික්ෂු සඞ්ඝයාගේද සරණ යමි. ආර්‍ය්‍යයන් වහන්සේ අද සිට දිවිහිමියෙන් සරණ ගිය උපාසිකාවකු කොට මා දරාවායි’ කීවාය (iii)

6 ඉක්බිති ආයුෂ්මත් අනුරුද්ධ තෙමේ සැවැත්නුවරට ගොස් භික්ෂූන්ට මේ කාරණය සැලකෙළේය. යම් ඒ භික්ෂු කෙනෙක් අල්පේච්ඡවූවාහුද (1 මුසාවාද ශික්ෂාපදයේ 2 (ii)

ඔව්හු දොස් කියත්, නොසතුටු ප්‍රකාශ කරත්, නොසතුටු වචන කියත්. කෙසේ නම් ආයුෂ්මත් අනුරුද්ධතෙමේ ස්ත්‍රියක් හා එකට සයනය කරන්නේ දැයි" කියති. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. (1 මුසාවාද ශික්ෂාපදයේ 3 (i) රැස්කරවා යන තැනට යොදන්න) අනුරුද්ධය, ඔබ ස්ත්‍රියක් හා සමග සයනය කෙළෙහි ඇත්තදැයි' ඇසීය. 'භාග්‍යවතුන් වහන්ස, ඇත්තය.' 'භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළසේක. (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 3 (iv)) 'අනුරුද්ධය, කෙසේනම් තෝ ස්ත්‍රියක් හා සමග සයනය කෙළෙහිද? අනුරුද්ධය මේය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිසද (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 3(vi) මෙන්නේනි, මෙසේ මේ ශික්ෂාපදය උදෙසව්.

7 "යම් මහණෙක් තෙම වනාහි මිනිස් ස්ත්‍රියක් හා සමග එක්ව සයනය කෙළේනම් පචිති ඇවැත්වේ."

8 "යමෙක් මහණෙක්" යනු භික්ෂු යනු (මෙහි පාරාජිකපාලියේ 1 පාරාජිකයේ පදභාජනීය 1-2) 'ස්ත්‍රිය' (ii) නම් මනුෂ්‍ය ස්ත්‍රියකි. යක්ෂ, ප්‍රේත, තිරිසන් ගතයෝ නොවී යටත්පිරිසෙයින් එදා උපන් දැරියකි. මැහුණියක ගැන කියනුම කවරේද? (iii) සමග යනු එකවිය. "සයනය" නම් (මෙහි සහසෙය්‍ය ශික්ෂාපදයේ 7 ඡේදය යොදාගෙන යනු බලන්න) "සයනය කරන්නේය" යනු සූර්යයා බැසගිය කල්හි ස්ත්‍රිය හුන් කල්හි භික්ෂුව හොවීද, පචිති ඇවැත්වේ. දෙදෙනාම හොවත්ද පචිති ඇවැත්වේ. නැගිට නැවත නැවත හොවිත්ද පචිති ඇවැත්වේ.

9 "ස්ත්‍රියක් කෙරෙහි ස්ත්‍රියක්ය යන හැඟීම් ඇත්තේ සමග සයනය කරයිද පචිති ඇවැත්වේ ස්ත්‍රිය කෙරෙහි විමති ඇත්තේ සමග සයනය කරයිද, පචිති ඇවැත්වේ ස්ත්‍රියක් කෙරෙහි ස්ත්‍රියක් නොවේය යන අදහස් ඇත්තේ සමග සයනය කරයිද පචිති ඇවැත්වේ. අඩක් වැසිලිකළ අඩක් වැසුණු තැනක සයනය කරයිද දුකුලා ඇවැත්වේ. යක්ෂණියක් සමග හෝ ප්‍රේතියක් සමග හෝ නපුංසකයකු සමග හෝ තිරිසන් ගත එකියක සමග හෝ සයනය කරයිද දුකුලා ඇවැත්වේ. ස්ත්‍රියක් නොවන්නක කෙරෙහි ස්ත්‍රියක යන හැඟීම් ඇත්තේ දුකුලා ඇවැත්වේ ස්ත්‍රියක් නොවන්නක කෙරෙහි විමති ඇත්තේ දුකුලා ඇවැත්වේ. ස්ත්‍රියක් නොවන්නකු කෙරෙහි ස්ත්‍රියක් නොවේය යන අදහස් ඇත්තේ ඇවැත් නොවේ. සියල්ල වැසිලි නොකළ කල්හි, සියල්ල

නොවැසුණු කල්හි, බොහෝ සෙයින් නොසෙවිලි කළ කල්හි බොහෝ සෙයින් නොවැසුණු කල්හි, ස්ත්‍රිය වැද හොත් කල්හි භික්ෂුව වැඩහිඳිද්ද, භික්ෂුව හොත් කල්හි ස්ත්‍රිය වැඩහිඳ සිටිද්ද දෙදෙනාම වාඩිවී සිටිත්ද, උමතුවූවාහට ආදිකර්මිකයාට ඇවැත් නොවේ.

## 7 ධම්මදෙසනා ශික්ෂාපදය

1 (i) (පෙ෴ 1 මුසාවාද ශික්ෂාපද 1 i) ඒ කාලයෙහි ආයුෂ්මත් උදයි ස්ථවිරතෙමේ සැවැත් නුවර ගෙදර වලට පැමිණෙන්නෙක් වේ. බොහෝ ගෙදරවලට පැමිණෙයි. ඉක්බිත්තෙන් ආයුෂ්මත් උදයි තෙමේ පෙරවරු වේලාවෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන එක්තරා ගෙදරක් යම් තැනෙකක්හිද එහි පැමිණියේය. එකල්හි මහලු ගෘහණී තොමෝ ගෙයි දොරකඩ සිටියාය. ලේලි කාමරය ඉදිරිපිට සිටියාය. ඉක්බිති ආයුෂ්මත් උදයිතෙමේ ගෘහ සවාමිනිය, යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ගෘහ සවාමිනියගේ කනට කොඳුරා බණ කීයේය.

2 ඉක්බිති ලේලියට 'කිමෙක්ද ඒ ශ්‍රමණතෙම නැන්දගේ සොර සැමියෙක්ද, නොහොත් රහසක් කියයිදෝ දැයි' මේ සිතවිය. ඉක්බිති ආයුෂ්මත් උදයිතෙමේ ගෘහණියගේ කණට කොඳුරා බණ කියා ලේලි යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ලේලියගේ කණ කොඳුරා බණ කීයේය. ඉක්බිති ගෘහණියට මේ සිත විය. 'කිමෙක්ද ඒ ශ්‍රමණතෙම ලේලියගේ සොර සැමියෙක්ද නොහොත් රහසක් කියා දැයි' කියායි. ඉක්බිති ආයුෂ්මත් උදයිතෙම ලේලියගේ කණට කොඳුරා බණකියා ගියේය. ඉක්බිති ගෘහිණිය ලේලියට මෙසේ කීයේය. "එම්බල කෙල්ල ඒ ශ්‍රමණතෙම තොපට කුමක් කීයේදැයි" ඇසීය. "ආර්යාවෙනි, මට බණ කීයේය ආර්යාවන්ට කුමක් කීයේදැයි" ඇසීය. "මට බණ කීයේයයි" කීහ. ඒ ස්ත්‍රීහු දොස් කියත්, නොසතුටු ප්‍රකාශ කරත්, නොසතුටු වචන කියත්, (ii) කෙසේ නම් ආර්ය උදයි තෙමේ කණට කොඳුරා බණ කියන්නේද, විශදවූ පැහැදිලිවූ නොවැසුණාවූ, ඔවනයෙන් බණ කිවයුතු නොවේදැයි(iii) කියායි.

3 භික්ෂූහු දොස් කියන්නාවූ නොසතුටු ප්‍රකාශ කරන්නාවූ නොසතුටු වචන කියන්නාවූ ඒ ස්ත්‍රීන්ගේ වචන ඇසූවාහුය. ආයුෂ්මත් උදයිතෙමේ (කනිටු) එක ස්ත්‍රීන්ට බණ කියන්නේදැයි කියායි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැල කළාහුය. (පෙ෴ 1 මුසාවාද

ශික්ෂාපදයේ 3 (i) රැස් කරවා යන තැනට උදායිය, ඔබ (තනිවූ) එක ස්ත්‍රියකට බණ කියෙහි ඇත්තදැයි" ඇසූසේක. භාග්‍යවතුන් වහන්ස, ඇත්තය. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළසේක, හිස් පුරුෂය, කෙසේ නම් තෝ (තනිවූ) එක ස්ත්‍රියකට බණ කියන්නෙහිද? හිස් පුරුෂය, මෙය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිස පැහැදුනවුන්ගේ (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 3 (vi) "මහණෙනි, මෙසේද මිනායි මේ ශික්ෂාපදය උදෙසව්.

4 'යම් කිසි භික්ෂුවක් (තනිවූ) එක ස්ත්‍රියකට බණ කියේද පචිති ඇවැත්වේ' භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ශික්ෂාපදය මෙසේ පනවන ලදී "

5 එකල්හි වනාහී උපාසිකාවෝ භික්ෂූන් දැක ආරාධනා කෙරෙති "බණ කියව්වයි" කීහුය. "නැගණියෙනි ස්ත්‍රියකට බණ කියන්නට නොකැපයයි" කීහ. "ආර්යයෙනි, එසේවීනම් වචන පසකින් සයකින් බණ කියව් එපමණකින් තේරුම් ගැනීමට පුළුවනැයි" කීහුය. "නැගණියෙනි, ස්ත්‍රියකට බණ කියන්නට නොකැපයයි" සැක කරමින් නොදෙසූහ. උපාසිකාවරු දොස් කියත්, නොසතුටු ප්‍රකාශ කරත්, නොසතුටු වචන කියත්, "ආර්යයන් වහන්සේලා කෙසේ නම් අප විසින් ඉල්ලනු ලබන්නාහු බණ නොකියත්ද!" කියායි. භික්ෂූහු දොස් කියන්නාවූ නොසතුටු ප්‍රකාශ කරන්නාවූ නොසතුටු වචන කියන්නාවූ ඒ භික්ෂූණීන්ගේ වචන ඇසූහ."

6 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ සිද්ධියෙහි දැහැමි කථා කොට භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක "මහණෙනි, ස්ත්‍රියකට වචන පසකින් සයකින් බණ කියන්නට අවසර දෙමි. මහණෙනි, මෙසේ වනාහී මේ ශික්ෂාපදය උදෙසව්.

7 "යම් කිසි භික්ෂුවක් ස්ත්‍රියකට පද පසකට සයකට වඩා බණ කියන්නේ නම් පචිති ඇවැත්වේ 'භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේද මේ ශික්ෂාපදය අනුඥාත කරන ලදී.

8 එකල්හි වනාහී ෂඩ්වර්ග භික්ෂූහු ස්ත්‍රියකට වචන පසකින් සයකින් බණ කියන්නට භාග්‍යවතුන් වහන්සේ විසින් අනුදන්නා ලදැයි නුවණැති පුරුෂ ශරීරයක් දරන්නහු ළඟ හිඳුවාගෙන ස්ත්‍රියකට වචන පසකට වඩා බණ කියත්ද, යම් ඒ භික්ෂු කෙනෙක් අල්පේච්ඡවූවාහුද (මෙහි 1 මුසාවාද

ශික්ෂාපදයේ 2 (ii) ඔව්හු දොස් කියත්. නොසතුටු ප්‍රකාශ කරත්. නොසතුටු වචන කියත්. 'කෙසේනම් නුවණ ඇති පුරුෂයෙකු ලඟ ගිදුවාගෙන ස්ත්‍රීන්හට වචන පහකට සයකට වඩා බණ කියන්නේදැයි'' කියායි

9 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 3 (i) රැස්කරවා යන තැනට ("මහණෙනි, තෙපි නුවණ ඇති පුරුෂයෙකු ලඟ නොහිඳුවා ස්ත්‍රීන්හට වචන පහකට සයකට වඩා ධර්ම දේශනා කරත් යනු ඇත්තදැයි'' ඇසූසේක. ''භාග්‍ය-වතුන් වහන්ස, ඇත්තය. භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ ගර්හා කළසේක. ' හිස් පුරුෂයෙනි, මෙය නොපැහැදුනවුන් ගේ පැහැදීම පිණිසත් (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 8 (v i) "මහණෙනි, මෙසේ දක්වා මේ ශික්ෂාපදය උදෙසව්.

10 "යම්කිසි භික්ෂුවක් නුවණැති පුරුෂයෙකු නැතිව ස්ත්‍රීයකට වචන පහකට සයකට වඩා බණ කියන්නේ නම් පචිති ඇවැත් වේ."

11 "යමෙක් වනාහි'' යනු භික්ෂුයනු (මෙහි පාරාජිකා පාලියේ 1 පාරාජිකයේ පද භාජනියේ 1-2 ඡේද) මේ මේ අර්ථයෙහි අදහස් කරණ ලද භික්ෂුවයි. 'ස්ත්‍රිය'' නම් මෙහි 6 ශික්ෂාපදයේ 8 (ii) ) "වචන පහකට සයකට වඩා'' යනු වචන පහකට සයකට අතිරේක යනුයි. ''ධර්මය'' නම් අර්ථ සහිත ධර්ම සහිත බුදුන් විසින් දේශනා කරණ ලද ශ්‍රාවකයන් විසින් දේශනා කරණලද ඍෂින් විසින් ප්‍රකාශ කරණ ලද දෙවියන් විසින් ප්‍රකාශ කරණ ලද අර්ථයෙන් යුත් ධර්මයෙන් යුත් දේශනාකරන්නේය යනු පදවශයෙන් කියයි. පදයක් පදයක් පාසා පචිති ඇවැත්වේ. අකුරු වශයෙන් දේශනා කරයි. අකුරක් අකුරක් පාසා පචිති ඇවැත්වේ "නුවණ ඇති පුරුෂයකු හැර'' යනු නුවණ ඇති පුරුෂයකු නැතිව යනු. ඥාණවන්ත පුරුෂයා යහපත් වචන අයහපත් වචනවල නපුර ඇසුරුකළ නපුර ඇසුරු නොකළ කියම්න දැනගන්නට දක්ෂවේ.

12 "ස්ත්‍රියක් කෙරෙහි ස්ත්‍රීයක යැයි හැඟීම ඇත්තේ නුවණැති පුරුෂයෙකු නැතිව මිස්තෙනි වචන පහකට සය කට වඩා බණ කියයිද පචිති ඇවැත්වේ. ස්ත්‍රියක් කෙරෙහි සැක ඇත්තේ මිස්තෙනි නුවණ ඇති පුරුෂයකු නැතිව මිස්තෙනි වචන පහකට සයකට වඩා බණ කියාද පචිති

ඇවැත්වේ. ස්ත්‍රියක් හෝ ස්ත්‍රියක් නොවේය යන හැඟී ඇත්තේ ඥාණවන්තපුරුෂයෙකු නැතිව මත්තෙහි වචන පසකට හයකට මඩා බණ කියාද පචිති ඇවැත්වේ. යක්ෂණියකට හෝ ප්‍රේතියකට හෝ නපුංසකයෙකුට හෝ තිරිසන් ගත මිනුෂ්‍ය ශරීරයක් දරන්නියකට හෝ මත්තෙහි වචන පසකට හයකට වඩා ඥාණවන්ත පුරුෂයෙකු නැතිව බණ කියාද දුකුලා ඇවැත්වේ. ස්ත්‍රියක් නොවන කෙනෙකු කෙරෙහි ස්ත්‍රියක යන හැඟීම ඇත්තේ දුකුලා ඇවැත්වේ. ස්ත්‍රියක් නොවන කෙනෙකු කෙරෙහි සැක ඇත්තේ දුකුලා ඇවැත්වේ. ස්ත්‍රියක නොවන කෙනෙකු කෙරෙහි විමතිය ස්ත්‍රියක් නොවේ යන අදහස් ඇත්තේ ඇවැත් නොවේ.

13 "නුවණැති පුරුෂයෙකු සමග (සිටියදී) වචන පසකට හයකට වඩා බණ කියසීද වචන පසකට හයකට අඩුවෙන් බණ කියාද නැඟිට නැවත හිඳ බණ කියසීද, ස්ත්‍රිය නැඟිට හිඳගත්සිද එසි බණ කියසිද, අනික් ස්ත්‍රියකට කියසිද, ප්‍රශ්න විචාරසීද, ප්‍රශ්න විචාරණ ලද්දේ කියසිද, අන් කෙනෙකුට කියද්දී ස්ත්‍රිය අසසිද උමතුවූවනුට ආදී කර්මිකයාට ඇවැත් නොවේ

## 8 භූතාරෝචන ශික්ෂාපදය

1–7 (මෙහි පාරාජික පාලියේ උත්තරි මනුස්ස ධම්ම ශික්ෂාපදයේ 1 සිට 7 ඡේදයේ තුරු කිවායුද යන තැනට බලාදත්ත.) මහණෙනි, මෙය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිසද (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 3 (vi) මහණෙනි, මෙසේද මහණෙනි' මේ ශික්ෂාපදය උදෙසව්

8 "යම්කිසි භික්ෂුවක් උපසම්පන්න නොවූවෙකුට උත්තරි මනුෂ්‍ය ධර්මය කියන්නේද උත්තරි මනුෂ්‍ය ධර්මය ඇතිකල්හි පචිති ඇවැත්වේ "

9 "යමෙක් මහණෙකි" යනු භික්ෂු යනු (පාරාජික පාලියේ 1 පාරාජිකයේ පදභාජනීයේ 1-2 ඡේද) 'උපසම්පන් නොවූවේ' නම් භික්ෂුවද භික්ෂුණියද හැර අන්‍යයා උපසම්පන් නොවූවේ නම්වේ. 'උත්තරි මනුෂ්‍ය ධම්' නම් ධ්‍යානය විමොක්ෂය, සමාධිය, සමාපත්තිය, ඥාණ දර්ශණය, මාර්ග වැඩීම, ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම, කෙලෙසුන් නැතිකිරීම, සිත නීවරණවලින් ඇත්වූ බව, ශූන්‍යාගාරයෙහි ඇලීම යනුයි. 'ධ්‍යාන' නම් ප්‍රථමධ්‍යානය. ද්විතීයධ්‍යානය තෘතීයධ්‍යානය, චතුර්ථධ්‍යානයයනුයි. 'විමොක්ෂ' නම් ශූන්‍යත විමොක්ෂය, අනිමිත්ත විමොක්ෂය,

අප්පණිහිත විමොක්ෂයයි. 'සමාධි' නම් ශූන්‍යතා සමාධිය, අනිමිත්ත සමාධිය, අප්පණිහිත සමාධියයි. 'සමාපත්ති' යනු ශූන්‍යතා සමාපත්තිය, අනිමිත්ත සමාපත්තිය, අප්පණිහිත සමාපත්තියයි. 'ඥානය' යනු ත්‍රිවිද්‍යාවයි. 'මාර්ග වැඩීම' යනු සතර සතිපට්ඨානය, සතර සම්‍යක් ප්‍රධානය, සතර ඍද්ධිපාදය, ඉන්ද්‍රිය පස, බල පස, බොජ්ඣංග සත, ආර්‍ය අෂ්ටාංගික මාර්ගයයි. 'ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම' නම් සෝවාන් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම, සකෘදාගාමි ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම, අනාගාමි ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම, රහත් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමයි. 'කෙලෙසුන් ප්‍රහීණ කිරීම' නම් රාගය ප්‍රහීණ කිරීම, ද්වේෂය ප්‍රහීණ කිරීම, මෝහය ප්‍රහීණ කිරීමයි. 'සිතේ නීවරණ රහිත භාවය' නම් සිත රාගයෙන් නොවැසුන බව, සිත ද්වේෂයෙන් නොවැසුණු බව, සිත මෝහයෙන් නොවැසුන බව. "ශූන්‍යාගාරයෙහි ඇලුන බව" නම් ප්‍රථමධ්‍යානයෙන් ශූන්‍යාගාරයෙහි ඇලුන බව, ද්විතීයධ්‍යානයෙන් ශූන්‍යාගාරයෙහි ඇලුන බව, තෘතීය ධ්‍යානයෙන් ශූන්‍යාගාරයෙහි ඇලුන බව, සතරවෙනි ධ්‍යානයෙන් ශූන්‍යාගාරයෙහි ඇලුන බවයි. 'කියන්නේය' යනුයි.

10 ප්‍රථමධ්‍යානයට පැමිණියෙමියි (ii) උපසම්පදා නොවූ කෙනකුට කියන්නාහට පචිති ඇවැත් වේ. (iii)

11–15 (ඡේද සෑදීමේදී 10 ඡේදයේ 'පැමිණියෙමි' වෙනුවට 'පැමිණෙමි' 'පැමිණෙන ලදී' "ලැබුවෙක් වෙමි" 'වසඟවූයේ වෙමි' 'මා විසින් ප්‍රත්‍යක්ෂ කරන ලදී' යන වචන යොදාගත යුතුයි.)

16–21 (ඡේද සෑදීමේදී 'ප්‍රථමධ්‍යානයට' යනු 'ද්විතීය ධ්‍යානයට' කියා යොදා මුලින් වචනම යොදන්න.)

23–27 (ඡේද සෑදීමේදී 'ප්‍රථමධ්‍යානයට' වෙනුවට 'තෘතීයධ්‍යානයට' කියා යොදා ගත යුතුයි.)

28–33 (ඡේද සෑදීමේදී 'ප්‍රථමධ්‍යානය' වෙනුවට 'චතුර්ථ ධ්‍යානයට' කියා වෙනස්කර ගතයුතුයි.)

34 (පහත දක්වන වචනයන්වද (11–15) දැක්වූ වචන යොදා ඡේද සාදගත යුතුයි.)

ශූන්‍යතා විමොක්ෂයට, අනිමිත්ත විමොක්ෂයට, අප්පණිහිත විමොක්ෂයට ශූන්‍යතා සමාධියට අනිමිත්ත සමාධියට අප්පණිහිත සමාධියට, ශූන්‍යතා සමාපත්තියට, අනිමිත්ත සමාපත්තියට, අප්පණිහිත සමාපත්තියට, ත්‍රිවිද්‍යාවට, සතර සතිපට්ඨානයන්ට, සතර සම්‍යක් ප්‍රධානයනට සතර ඍද්ධි

පාදයන්ට, ඉන්ද්‍රිය පසට, බලපසට, බොජ්ඣඞ්ග සතට, ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයට, සෝතාපත්ති ඵලයට, සකෘදාගාමි ඵලයට, අනාගාමි ඵලයට, අර්හත් ඵලයට,

§5 "මා විසින් රාගය (ii) දුරු කරණ ලදී වමාරණ ලදී, මුදන ලදී, ප්‍රහීණ කරණ ලදී, දුරු කරණ ලදී, ඉවත්කරණ ලදී, බැහැර කරණ ලදීයයි (iii) අනුපසම්පන්නයෙකුට කියන්නහුට පචිති ඇවැත්වේ. (iv)

"ද්වේෂය (මෙසේ (ii) (iii)) මෝහය (මෙසේ (ii) (iii)) රාගයෙන් මාගේ සිත නොමැනෙන ලදීයයි (මෙසේ(iii)) ද්වේෂයෙන් මෝහයෙන් (මෙසේ (iii)) ශූන්‍යාගාරයෙහි ප්‍රථමධ්‍යානයට පැමිණියේ සමවුණිමි. විතීයධ්‍යානයට, ප්‍රථම විතීයධ්‍යානයන්ට, ප්‍රථම තෘතීයධ්‍යානයන්ට, ප්‍රථම චතුර්ථධ්‍යානයන්ට, ප්‍රථම ධ්‍යානයටද, ශූන්‍යතා විමෝක්ෂයටද අනිමිත්ත විමෝක්ෂයටද, අප්පණිහිත විමෝක්ෂයටද, ශූන්‍යතා සමාධියටද, අනිමිත්ත සමාධියටද, අප්පණිහිත සමාධියටද, ප්‍රථමධ්‍යානයද, ශූන්‍යතා සමාපත්තියද, අනිමිත්ත සමාපත්තියද, අප්පණිහිත සමාපත්තියද, ප්‍රථම ධ්‍යානයටද, ත්‍රිවිද්‍යාවටද, ප්‍රථම ධ්‍යානයටද, සතර සතිපට්ඨානයටද, සතර සම්‍යක් ප්‍රධානයටද, සතර සෘද්ධිපාදයටද, ප්‍රථමධ්‍යානයටද, ඉන්ද්‍රිය පසටද, බලපසටද, ප්‍රථම ධ්‍යානයටද, බොජ්ඣඞ්ග සතටද, ප්‍රථම ධ්‍යානයටද, ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයටද, ප්‍රථම ධ්‍යානයටද සෝවාන් ඵලයටද, සකෘදාගාමි ඵලයටද, අනාගාමි ඵලයටද, රහත් ඵලයටද, (මෙසේ §5 (iii) ) රාගයෙන්ද, ද්වේෂයෙන්ද, මෝහයෙන්ද, මාගේ සිත නොමිදුනේයයි. දෙවෙනි ධ්‍යානයටද තුන්වෙනි ධ්‍යානයටද, දෙවෙනි ධ්‍යානයටද, සතරවෙනි ධ්‍යානයටද, දෙවෙනි ධ්‍යානයටද; (මෙසේ 30 (ii) ) විතීය ධ්‍යානයටද, ප්‍රථම ධ්‍යානයටද, මෝහයෙන්ද මාගේ සිත යට මිය ප්‍රථම ධ්‍යානයටද, පැමිණියෙමි. මෝහයෙන්ද, මාගේ සිත මිදුනේය. ද්වේෂයෙන්ද, මාගේ සිත මිදුනේය. ප්‍රථම ධ්‍යානයද, (v) විතීය ධ්‍යානයද, තෘතීය ධ්‍යානයද, චතුර්ථ ධ්‍යානයද, ශූන්‍යතා විමෝක්ෂයද, අනිමිත්ත විමෝක්ෂයද, අප්පණිහිත විමෝක්ෂයද, ශූන්‍යතා සමාධියද, අනිමිත්ත සමාධියද, අප්පණිහිත සමාධියද, ශූන්‍යතා සමාපත්තියද, අනිමිත්තා සමාපත්තියද. අප්පණිහිත සමාපත්තියද ත්‍රිවිද්‍යාවද, සතර සතිපට්ඨානයද, සතර සම්‍යක් ප්‍රධානයද. සතර සෘද්ධි- පාදයද, ඉන්ද්‍රියපසද, බලපසද, බොජ්ඣඞ්ගසතද, ආර්‍ය්‍ය

අෂ්ටාංගික මාර්ගයද, සෝවාන් ඵලයද, සකෘදාගාමි ඵලයද, අනාගාමි ඵලයද, රහත් ඵලයද, රාගයද, මා විසින් අත්හරින ලදී. ද්වේෂයද, මා විසින් අත්හරින ලදී. මෝහයද මා විසින් අත්හරින ලදී රාගයෙන්ද. මගේ සිත මිදෙන ලදී ද්වෙ - ෂයෙන්ද, මෝහයෙන්ද මගේ සිත මිදෙන ලදී. (iii) කියන්නේය යනු උපසම්පදා නොවූවෙකුට ප්‍රථම ධ්‍යානයට පැමිණියෙමියි කියනු කැමැත්තේ ද්විතීය ධ්‍යානයට පැමිණියෙමියි කියද්දී දන්නහු කල්හි පචිති ඇවැත්වේ. නොදන්නහුට දුකුලා ඇවැත්වේ.

36 (මෙහි 35 (v) සොදන්න) උපසම්පදා නුවූවෙකුට දෙවෙනි ධ්‍යානයට පැමිණියෙමියි කියනු කැමැත්තේ මෝහයෙන් මගේ සිත නොමිදුනේයයි කියද්දී දන්නහු කල්හි පචිති ඇවැත්වේ. නොදන්නාහට දුකුලා ඇවැත්වේ.

37 උපසම්පදා නුවූවෙකුට ද්විතීය ධ්‍යානයට පැමිණියෙමියි කියනු කැමැත්තේ ප්‍රථම ධ්‍යානයට සම්වැදුනෙමියි කියද්දී දන්නහුට පචිති ඇවැත්වේ. නොදන්නහුට දුකුලා ඇවැත්වේ.

38 උපසම්පදා නුවූවෙකුට මෝහයෙන් මගේ සිත නොමිදුනේයයි කියනු ලබන්නේ ප්‍රථම ධ්‍යානයට (ii) පැමිණියෙමියි' කියද්දී දන්නහු කල්හි පචිති ඇවැත්වේ. නොදන්නහුට දුකුලාවේ.

39 උපසම්පදා නොවූවෙකුට මෝහයෙන් මගේ සිත සවී නොමිදුනේයයි කියනු කැමැත්තේ ද්වේෂයෙන් මගේ සිත සවි නොමිදුනේයයි, කියද්දී දන්නහු කල්හි පචිති ඇවැත්වේ. නොදන්නහුට දුකුලා ඇවැත්වේ.

40 උපසම්පදා නොවූවෙකුට ප්‍රථම ධ්‍යානයටද ද්විතීය ධ්‍යානයටද, තෘතීය ධ්‍යානයටද, චතුර්ථ ධ්‍යානයටද, (මෙහි 38 (ii) ) 'ද්වේෂයෙන් මගේ සිත සවිමුදුනේයයි' කියනු කැමැත්තේ 'මෝහයෙන් මගේ සිතයට නොවූයේයයි' කියද්දී දන්නහුට පචිති ඇවැත්වේ. නොදන්නහට දුකුලාවේ.

41 (මේ ඡේදයේම ප්‍රථම ධ්‍යානය අත්හැරද මෙසේ මෙතුමට මෝහය තියා සොදද 39 වෙනි ඡේදය සොදන්න.)

42 "කියන්නේය" යනු උපසපන් නොවූවෙකුට යමෙක් නොපගේ විහාරයෙහි වාසය කෙළේද ඒ භික්ෂුතෙම ප්‍රථම ධ්‍යානයට සම්වැදුනේය, සම්වැදී, සම්වදිනාලදී, ඒ

මහණෙනි මේ ප්‍රථම ධ්‍යානය ලැබූවෙති, වසඟවූවෙති. ඒ භික්ෂුව විසින් ප්‍රථම ධ්‍යානය ප්‍රත්‍යක්ෂ කරණලද්දීයයි කියන්නාහට දුකුලා ඇමැත්තේ

43 (මෙහි 42 ඡේදය යොදන්න.) ප්‍රථම ධ්‍යාන යන්නට ද්විතීයධ්‍යාන, තෘතීයධ්‍යාන, චතුර්ථධ්‍යාන කියා යොදා මාරතුනක් යොදගතයුතුයි.)

44 (මෙහි 42 ඡේදය යොදන්න) ප්‍රථම ධ්‍යානය වෙනුවට ශූන්‍යතා විමෝක්ෂයට, අනිමිත්ත විමෝක්ෂයට, අප්පණිහිත විමෝක්ෂයට, ශූන්‍යත සමාධියට, අනිමිත්ත සමාධියට, අප්පණිහිත සමාධියට, ශූන්‍යත සමාපත්තියට, අනිමිත්ත සමාපත්තියට අප්‍රණිහිත සමාපත්තියට, ත්‍රිවිද්‍යාවට, සතර සතිපට්ඨානයට සතර සම්‍යක්, ප්‍රධානයට, සතර ඍද්ධිපාදයට, ඉන්ද්‍රියපසට, බලපසට, බොජ්ඣඞ්ග සතට, ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයට, සෝවාන් ඵලයට, සකෘදාගාමි ඵලයට, අනාගාමි ඵලයට, රහත් ඵලයට, කියා වෙනස්කර යොදනු. (මෙහි 35 ඡේදයේ මා විසින් යනු ඒ භික්ෂුව විසින් කියාද පචිත් ඇමැත්තේ යන්න දුකුලාවේ. කියාද වෙනස්කොට ඒ ඡේදය සම්පූර්ණයෙන් යොදන්න )

45 "කියන්නේයි යනු යමෙක් තොපගේ විහාරයෙහි විසූවේද ඒ භික්ෂුව ශූන්‍යාගාරයෙහි ප්‍රථම ධ්‍යානයටද, ද්විතීය, තෘතීය, චතුර්ථ ධ්‍යානයන්ටද සමවැදුනේය. සමවදියි, සමවදිනලද්දී ඒ භික්ෂුව ශූන්‍යාගාරයේ චතුර්ථ ධ්‍යානලාභීය, වසීය, ඒ භික්ෂුව විසින් ශූන්‍යාගාරයේ චතුර්ථ ධ්‍යානය ප්‍රත්‍යක්ෂ කරණලද්දීයයි අනුපසම්පන්නයෙකුට කියන්නහුට දුකුලාවේ.

46 "කියන්නේය යනු උපසම්පන් නොවූවෙකුට යමෙක් තොපගේ විහාරය පරිභොගද, කෙළේද-සිවුර පරිභොග කෙළේද-පිණ්ඩපාතය පරිභොග කෙළේද-සෙනසුන පරිභොග කෙළේද-ගිලන්පස බෙහෙත් පිරිකර පරිභොග කෙළේද ඒ භික්ෂුව ශූන්‍යාගාරයෙහි සතරවෙනි ධ්‍යානය ලැබුවේය, වසග කෙළේය - ඒ භික්ෂුව විසින් ශූන්‍යාගාරයෙහි සතරවෙනි ධ්‍යානය ප්‍රත්‍යක්ෂ කරණලද්දීයයි කියන්නාට දුකුලා ඇමැත්තේ

47 (මෙහි 46 ඡේදය යොදන්න ) පරිභොග කෙළේද, යන්නට පරිභොග කරණ ලද්දේද කියා වෙනස්කර යොදගතයුතු )

48 (මෙහි 46 ඡේදය බලනු) යමෙක් කෝපයේ විකාරය පරිත්‍යාග කළේද තන්හි යමෙකුමෙන ඔබ පැමිණි විකාරය දුටුයෙහිද කියා මෙතන් පටන් සොදගතයුතු) උපසම්පන්නවූවෙකුට ඇතිගුණය කීයාද, ආදීනවර්ණ කාමවද, ඇවැත් නොවේ.

## 9 දුට්ඨුල්ලාරෝචන ශික්ෂාපදය

1 (මෙහි 1 මුසාවාද ශික්ෂා පදයේ 1 (i)) එකල්හි වනාහි ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර තෙමේ ෂඩ්වර්ග භික්ෂූන් සමග කෝලාහල කළේය. හෙතෙම දූත දූත ශුක්‍ර මෝචනය කිරීමේ ඇවැතට පැමිණ සංඝයාගෙන් ඒ ඇවැතට පිරිවෙස් ඉල්වූයේය. ඔහුට සඞ්ඝ තෙමේ ඒ ඇවැතට පිරිවෙස් දුන්නේය. එකල්හි වනාහි සැවැත්නුවර එක්තරා උපාසකයකුගේ සඟහට දෙන බතක් ලැබුණේවේ. හෙතෙම පිරිවෙස් වසන්නේ දන්ශාලාවෙහි අසුන් කෙළවර හුන්නේය.

2 ෂඩ්වර්ග භික්ෂූහු ඒ උපාසකයන්ට ''ඇවැත්නි, මේ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර තෙමේ තොප ඇසුරු කරන කුලූපගයෙකි. යම් අතකින් ශ්‍රද්ධාවත් දෙන භෝජනය වළඳද ඒ අතින්ම උපක්‍රමයෙන් ශුක්‍ර පිට කොළේය. හෙතෙම දූත දූත ශුක්‍ර පිට කිරීමේ ඇවැතට පැමිණ සඞ්ඝයාගෙන් ඒ ඇවැතට පිරිවෙස් ඉල්වීය. සංඝ තෙමේ ඔහුට ඒ ඇවැතට පිරිවෙස් දුන්නේය, හෙතෙම පිරිවෙස් වසන්නේ අසුන් කෙළවර හිඳින්නේයයි'' කීවාහුය.

3 යම් ඒ භික්ෂූහු සොතෙක් අල්පේච්ඡවූවාහුද ඔව්හු (1 මුසාවාද ශික්ෂාපදයේ 2 (ii)) ''කිමෙක්ද, තෙපි භික්ෂූවකගේ නපුරු අසුරු නපුරු ඇවැතක් (සංඝාදිසෙස පත්තියක්) උපසම්පන් නොවූවෙකුට කියන්නාහු සැබෑදැයි'' ඇසූහ. ''භාග්‍යවතුන් වහන්ස, ඇත්තය. ''භාග්‍යවතුන් වහන්සේ ගර්හා කළසේක (1 මුසාවාද ශික්ෂාපදයේ 3 (iv)) ''හිස් පුරුෂයෙනි, කෙසේ නම් තෙපි භික්ෂුවකගේ නපුරු අසුරු කළ ඇවැත උපසම්පන් නොවූවෙකුට කියව්ද. හිස් පුරුෂයෙනි, මේය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිස (1 මුසාවාද ශික්ෂාපදයේ 3 vi) මෙසේද වනාහි මේ ශික්ෂාපදය උදෙසවු.

4 ''යම්කිසි භික්ෂුවක් භික්ෂුවක්හුගේ සංඝාදිශේෂාපත්තිය උපසම්පන් නුවූවෙකුට සංඝ සම්මුතියක් හැරකියාද, පචිත ඇවැත්වේ.''

5 (මෙහි පාරාජික පාලියේ 1 පාරාජිකයේ පදභාජනියේ (1–2)) මේ මේ අර්ථයෙහි අදහස් කළ භික්ෂුවයි. "භික්ෂුවකට" යනුඅත් භික්ෂුවකටවත්, 'නපුර ඇසුරු කළ ඇමත" යනු සතර පාරාජිකාමද සංඝාදිසෙස දහතුනද වේ. "උපසපන් නොවූයේ" නම් භික්ෂුවද භික්ෂුණියද හැර ඉතිරිවූවන් අනුපසම්පන්නනම්. 'කියන්නේය' යනු ස්ත්‍රියකට හෝ පුරුෂයෙකුට හෝ ගෘහස්ථයෙකුට හෝ පැවිද්දෙකුට හෝ කීයි. "සංඝ සම්මුතියක් හැර" යනු භික්ෂු සම්මුතියක් හැරයි. (i) ඇමැත්වල සීමාවක් (ii) ඇති කුල සීමාවක් නැති (iii) සංඝ සම්මුතියක් ඇත. (iv) කුල සීමාවක් නැති (මෙහි (iii)) (මෙහි (i)) ඇත්තාවූද කුල සීමාවක් ඇත්තාවූද සීමාවක් ඇත්තාවූද (මෙහි (iii)) ඇමැත් සීමාවක් නැත්තාවූද කුලසීමාවක් නැත්තාවූද (මෙහි (iii)) "ඇමැත් සීමාව" නම් මෙතෙක් ඇමතින් කිව යුත්තාහයි ඇමැත් වෙන් කළාහු වෙත්ද, "කුලසීමාව" නම් මෙතෙක් කුලයන්හි කිව යුත්තාහයි කුල වෙන් කළාහු වෙත් (මෙහි (i)) ඇත්තාවූද කුලසීමාව ඇත්තාවූද සම්මුතිනම් මෙතෙක් ඇමැත් මෙතෙක් කුලවලට කිව යුත්තාහයි. ඇමැත්ද වෙන් කළාහු වෙත්ද, කුලද, වෙන්කළාහු වෙත් මෙතෙක් ආපත්ති මෙතෙක් කුලයන්හි කිව යුත්තාහ. ඇමැත් සීමාවක් නැත්තේද. කුලසීමාවක් නැත්තේද, ඇමැත් සීමා නැත්තේද, කුලසීමා නැත්තේද වේ

6 ඇමැත් සීමාවෙහි යම් ඇමැත් කොතෙක් වෙන්කළාහු වෙත්ද, ඒ ඇමැත්හැර සෙසු ඇමැත් කියයිද, පවිති ඇමැත් වේ (මේ වාක්‍ය ගත "පවිති ඇමැත්වේ" යෙදිය යුත) කුල සීමාවෙහි යම් කුල කොතෙක් වෙන්කළාහු වෙත්ද, ඒ කුලහැර සෙසු කුලයන්හි කියයිද–, ඇමැත් සීමාවෙහිත් කුල සීමාවෙහිත් යනු යම් ඇමැත් කොතෙක් වෙන්කළාහු වෙත්ද, ඒ ඇමැත් හැර යම්කුලයක් වෙන්කළාහුවෙත්. ඒ කුලහැර අනෙක් ඇමැත්වලින් අනෙක් කුලයන්හි කියයිද–, ඇමැත් සීමාවක්නැතිකල්හි කුලසීමාවක් නැතිකල්හි ඇමැත්තෝවේ. (ii) නපුර ඇසුරු කළ ඇමත (iii) නපුර ඇසුරුකළ ඇමතාන යන හැඟීම් ඇතිව උපසපන් නොවූවෙකුට සංඝ සම්මුතියක් හැර කීයද–, (මෙහි (ii)) ශංකා සහිත ඇත්තේ සංඝ සම්මුතියක් නැතිව උපසපන් නොවූවකුට කීයද–, (මෙහි (iii)) නපුර ඇසුරු නොකළ ඇමතානෙයි යන හැඟීම් ඇතිව සංඝ සම්මුති–යක් නැතිව උපසපන් නොවූවෙකුට කියයිද–, නපුර ඇසුරු නොකළ ඇමත කියයිද, (iv) දුකුලා ඇමැත්වේ. (vi) උපසම්

පද නොවූවෙකුට නපුර ඇසුරු කළ හෝ නොකළ ඉක්මවීමක් කියයිද–, (මෙහි (iii)) නපුර ඇසුරු නොකළ ඇවැතෙහි නපුර ඇසුරු නොකළ ඇවැතය යන හැඟීම් ඇත්තේ (මෙහි (iii)) නපුර ඇසුරු නොකළ ඇවැතෙහි විමති ඇත්තේ (මෙහි (iii)) නපුර ඇසුරු නොකළ ඇවැතෙහි නපුර ඇසුරු නොකළ ඇවැතය යන හැඟීම් ඇත්තේ (මෙහි (iii) ) ඇවැත්වේ. සංඝ සම්මුතියෙන් වස්තුව කියයිද ඇවැත නොකියයිද ඇවැත කියයිද වස්තුව නොකියයිද, උම්මත්තකවූවහුට ආදිකර්මිකයාට ඇවැත් නොවේ.

## 10 පඨවිඛණන ශික්ෂාපදය

1 එකල්හි වනාහි භාග්‍යවත් බුද්ධරජාණන් වහන්සේ ආළව්නුවර අග්ගාලව චෛත්‍යස්ථානයෙහි වාසය කරණසේක. එකල්හි වනාහි අලව්නුවර භික්ෂූහු අලුත්කම්නාන කරන්නාහු පොළොව හාරත්, හාරවත්. කෙසේනම් ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ (ii) පොළොව හාරන්නාහු හාරවන්නාහු එක් ඉන්ද්‍රියක් ඇති ප්‍රාණයන් වෙහෙසන්නාහුදැයි (iii) දොස් කියත්, නොසතුට ප්‍රකාශ කරත්, නොසතුටු වචන කියත්.

2 භික්ෂූහු දොස් කියන්නාවූ නොසතුට ප්‍රකාශ කරන්නාවූ නොසතුටු වචන කියන්නාවූ ඒ මිනිසුන්ගේ වචන ඇසූහ. යම් ඒ භික්ෂූ කෙනෙක් (1 මුසාවාද ශික්ෂාපදයේ 2 (ii) කෙසේ නම් අලව්වරට භික්ෂූහු (මෙහි (ii) ) "මහණෙනි තෙපි පොළොව හාරන්නාහු හාරවන්නාහු ඇත්තදැයි" ඇසූසේක "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය." භාග්‍යවත් බුද්ධරජාණන් වහන්සේ ගැරහූසේක. (1 මුසාවාද ශික්ෂාපදයේ 3 (iv)) හිස් පුරුෂයෙනි, කෙසේ නම් තෙපි (මෙහි (ii) හිස් පුරුෂයෙනි මෙය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිසද (1 මුසාවාද ශික්ෂාපදයේ 3 (vi)) මහණෙනි, මෙසේද වනාහි මේ ශික්ෂාපදය උදෙසව්.

3 "යම්කිසි භික්ෂුවක් පොළොව හාරන්නේද හාරවන්නේද පචිති ඇවැත්වේ.

4 (මෙහි පාරාජිකපාලියේ 1 පාරාජිකයේ පදභාජනියේ 1-2) 'පොළොව' නම් පොළොව දෙකකි. ජාත පොළොවය අජාත පොළොවය යන දෙකයි. 'ජාත පොළොව' නම් තනිකර පස්, තනිකර මැටි, ගල් කැට අඩු කැබිලිති අඩු බොරළු වැලි අඩු පස් බොහෝ ඇති, මැටි බොහෝ ඇති නොදැවුනු පොළොව ජාත පොළොව නම් වේ. යම්කිසි පස්පිඩක් හෝ මැටි පිඩක් හෝ සතර මාසයට

වඩා වැටී තිබුණේද එසේද ජාත පඨවි නම්. 'අජාත පඨවි' නම් තනිකර ගල්, තනිකර කැට ගල්, තනිකර කැබිලිති, තනිකර බොරළු, තනිකර වැලි ය. දවන ලද්දේද අජාත පඨවි යයි කියනු ලැබේ. යම්කිසි පස් පිඩක් හෝ මැටි පිඩක් හෝ සතර මාසයකට වඩා අඩුවෙන් වැටී තිබුණේ අජාතපඨවියයි කියනු ලැබේ

5 'හාරන්නේය' යනු තෙමේ හාරයිද පචිති ඇවැත් වේ. (මේ වාක්‍ය අගට "පචිති ඇවැත්වේ" යෙදෙන්නේ.) 'හාරවන්නේය' යනු අනිකෙකුට අණකරයිද- එවරක් අණවූයේ බොහෝ හාරයිද- පෘථිවියෙහි පෘථිවිය යන හැඟීම් ඇත්තේ හෝ හාරයිද හාරවයිද බිඳියිද බින්දවයිද අළුකරයිද අළුකරවයිද පෘථිවියෙහි විමති ඇත්තේ පචිති යන්නට දුකුලා කියා මෙතන්තර යොදා ගතයුතු (iii) පචිති යන්නට ඇවැත් නොවේ කියා මෙතන්තර යොදාගතයුතු. පෘථිවිය නොවන්නෙහි පෘථිවිය යන හැඟීම් ඇත්තේ දුකුලා ඇවැත්වේ පෘථිවිය නොවන්නෙහි පෘථිවිය නොවෙන්නේයයි විමති ඇත්තේ දුකුලා ඇවැත්වේ. පෘථිවිය නොවන්නෙහි පෘථිවිය නොවේය යන හැඟීම් ඇත්තේ ඇවැත් නොවේ. මෙය දනුව, මෙය දෙව, මෙය ගෙන එව, මෙයින් ප්‍රයෝජන ඇත. මෙය කැප කරවයි කියයිද නොසිතීමෙන් නොසිහියෙන්, නොදන්නාහුට, උමතුවූවහුට, ආදිකර්මිකයාට ඇවැත් නොවේ.

(පළමුවෙනි මුසාවාද වර්ගය නිමි)

---

# 2 සෙනාසන වග්ග

---

## 1 භූතගාම ශික්ෂාපදය

1 එකල්හි වනාහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ අලව්නුවර අග්ගාලව චෛත්‍යස්ථානයෙහි වාසය කරණසේක. එකල්හි වනාහි අලව්නුවර භික්ෂූහු අළුත් කර්මාන්ත කරන්නාහු ගස් සිඳීමද සිඳවීමද කරත් එක්තරා අලව් භික්ෂුවක්ද ගසක් සිඳියි ඒ වෘක්ෂයෙහි අධිගෘහිත දේවතාවෝ ඒ භික්ෂුවට 'ස්වාමීනි තමන්ගේ ගෘහ කරණු කැමැත්තේ මගේ ගෙය නොසිඳුමැයි' කීයේය. ඒ භික්ෂුතෙම නොපිළිගෙන සිඳිද්දීම ඒ දේවතාවාගේ දරුවාගේ අතට ගැටුවේය. ඉක්බිති ඒ දේවතාවා 'මම මේ භික්ෂුව මෙහිම ජීවිතයෙන්

ප්‍රකාරයක් නම් නැති කෙනෙකැ'යි සිතීය. ඉක්බිති ඒ දේව තාවෝ 'සම්බුදුවූ මම මේ භික්ෂුව මෙහිම ජීවිතයෙන් තොර කරන්නෙම් නම් එය මට නුසුදුසු වන්නේය. මම මේ කාරණය භාග්‍යවතුන් වහන්සේට නිවේදනය කරම් නම් යහපතැ'යි සිතුවිය.

2 ඉක්බිති ඒ දේවතාවෝ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාය. "දේවතාව යහපත, යහපත, දේවතාව ඒ භික්ෂුව ජීවිතයෙන් තොරනොකළ හෙයින් එය යහපත්ය. දේවතාව ඉදින් ඔබ ඒ භික්ෂුව අද ජීවිතයෙන් තොරකෙළේනම් දේවතාව, ඔබ බොහෝ අකුසල් රැස් කරන්නේනිය. දේවතාව, ඔබ යව, අසවල් ස්ථානයෙහි විවෘතවූ ගසක් ඇත. එයට එළඹෙව' කීසේක

3 මනුෂ්‍යයෝ 'කෙසේ නම් ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ ගස් සිඳිත්ද සිඳවත්ද? ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ එක් ඉන්ද්‍රියක් ඇති ප්‍රාණීන් වෙහෙසවන්නාහුදැ'යි කියා (ii) දොස් කියත්, නොසතුට ප්‍රකාශ කරත් නොසතුටු වචන කියත් (iii) ඒ මිනිසුන්ගේ වචන භික්ෂූහු ඇසූහ. යම් භික්ෂු කෙනෙක් අල්පේච්ඡවූවාහුද (1 මුසාවාද ශික්ෂාපදයේ 2 (ii) බලනු (මෙහි (ii) කොටසේ නම් අල්පේච්ඡවූවර භික්ෂූහු ගස් සිඳින්නාහුද සිඳවන්නා හුදැයි කීහයි. භාග්‍යවතුන් වහන්සේට මේය සැලකළාහුය (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 3 (i) 'රැස් කරවා' යන තැනේ) 'මහණෙනි, තෙපි ගස් සිඳින්නාහු සිඳවන්නාහු ඇත්තදැ'යි ඇසූසේක "භාග්‍යවතුන් වහන්ස ඇත්තය" භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගැරහූසේක (මෙහි මුසාවාද ශික්ෂාපදයේ 3(iv)) හිස් පුරුෂයෙනි, කෙසේ නම් තෙපි ගස් සිඳින්නාහුද සිඳවන්නාහුදැ'යි ඇසූහ හිස්පුරුෂයෙනි, මිනිස්සු වෘක්ෂවල පණ ඇත්තාහයි හඟිත් හිස් පුරුෂයෙනි, මෙය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිසද (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 3 (iv)) මහණෙනි, මෙසේ මේ ශික්ෂාපදය උදෙසව්

4 "වෘක්ෂලතාදී භූමියෙහි සිටිගස් ජීව සමූහයාගේ නැසීම කෙළෙසීමෙන පචිති ඇවැත්වේ"

5 "භූත සමූහය' නම් බීජජාති පසයි. මූලබීජ, ඛන්ධබීජ, ඵළුබීජ, අග්ගබීජ, බීජබීජය පස්වෙනියි. 'මූලබීජ' නම් කහ, ඉඟුරු, වදකහ, ඉරමුසු, කටුකරෝසන, සැවැන්දරා, කලාඳුරු, නෑකුදු යම මුලින් උපදිත්ද, මුලින් හටගනිත්ද, මේ මූලබීජ

නම් 'ඛන්ධබීජ' නම් ඇසතු, නුග, පුලිල, දිඹුල්, දිවුල් යනාදි අති කයක් සඳින් පැලවෙත්ද, සඳින් හටගනිද්ද මේ ඛන්ධබීජ නමි. 'ඵලුබීජ' නම් උක්, හුණ, බට ආදී වූ යම් පුරුකින් පැලවෙද්ද, පුරුකෙන් හටගනිද්ද මේ ඵලුබීජ නමි. 'අග්ගබීජ' නම් කුඹුක් මුරුංගා ආදිවූවිරියෙයි. අනිකුදු යම් අගින් පැලවෙත්ද අගින් පහළවෙත්ද මෙය අග්ගබීජ නමි. 'බීජබීජ' නම් වී, මුං, මෑ, ඇටදී අනිකුදු යම් ඇටවලින් හටගන්නාහුවෙත්ද ඇටින් පහළවන්නාහු වෙත්ද මේය බීජ බීජ නමි.

6 (10 වෙනි ශික්ෂාපදයේ අග සැකිවිතකයි යන පදයේ සිට අවසානට සැකිවියෙහි යන්නට බීජයෙහි සිතාද සැකිවිය යුතුවන්නේහි යන්නට බීජ නොවන්නේහි සිතාද යනාදී වශයෙන් යොදගතයුතු )

## 2 අඤ්ඤවාදක ශික්ෂාපදය

1 එකල්හි වනාහි භාග්‍යවත් බුද්ධරජාණන් වහන්සේ කොසඹෑනුවර ඝෝෂිතාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි වනාහි ආයුෂ්මත් ඡන්න ස්ථවිරයන්වහන්සේ අනාචාර යෙහි හැසිර (ii) සංඝයා මැද ඇමතීන් ප්‍රශ්නකරණු ලබන් නේ නුඹගේ පැමිණියේද කුමක් පැමිණියේද කුමක්හි පැමිණියේද කෙසේ පිළිපන්නේද කවරෙකුට කීයෙද කුමක් කියවද්දයි අනිකක් අනිකක් කියන්නේයයි

2 යම් ඒ භික්ෂූ කෙනෙක් අල්පේච්ඡවූවාහුද ඔව්හු (1 මූසාවාද ශික්ෂාපදයේ 2 (ii) කොටසේහි ආයුෂ්මත් ඡන්න තෙමේ (මෙහි 1 (ii) ඇත්තාදයි ඇසූසේක. (ii) භාග්‍යවතුන් වහන්ස ඇත්තය භාග්‍යවත් බුද්ධරජාණන් වහන්සේ ගර්හා කළසේක (1 මූසාවාද ශික්ෂාපදයේ 3 (iv) හිස් පුරුෂය, නම් කෙසේ (මෙහි 1 (i) හැසිරෙයි මෙතුමට හැසිරෙන්නාහුද යොදගත යුතුයි.) හිස් පුරුෂයෙනි, මෙය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිස (1 මූසාවාද ශික්ෂාපදයේ 3 (vi) තින්ද තොට දහම් කථාකොට භික්ෂූන් ආමන්ත්‍රණය කළසේක

3 "මහණෙනි, එසේනම් සංඝතෙමේ ඡන්න භික්ෂූහට අනිකක් කියන්නේනත යන වාදය ආරෝපනය කෙරේවා. මහණෙනි මෙසේද වනාහි ආරෝපනය කළයුතුය. දක්ෂ භික්ෂුවක් විසින් සංඝයාට දැන්විය යුතුය. සංඝතෙම 'ස්වාමීනි, අසාවා. (ii) මේ ඡන්න භික්ෂුව සංඝයා මැද ඇමතීන් ප්‍රශ්නකරණු ලබන්නේ අනිකක් අනිකක් කියයි.

(iii) ඉදින් සංඝයාට පැමිණිකල් ඇත්තේවී නම් සංඝතෙමේ ඡන්න භික්ෂුවට අනිකක් කියන්නේය යන වාදය ආරෝපනය කරව්' මේ දැන්වීමයි. ස්වාමීනි, සංඝතෙමේ මා කියන්නක් අසාවා (මෙහි (ii) සංඝතෙමේ ඡන්න භික්ෂුවට අනිකක් කියයි යන වාදය ඉදිරිපත් කරයි. ඡන්න භික්ෂුවට අනිකක් කියයි යන වාදය ඉදිරිපත්කිරීමට (iv) යම් ආයුෂ්මත් කෙනෙකුට කැමති වේද, හෙතෙම නිශ්ශබ්ද වේවා. යමෙකුට කැමති නොවේනම් හෙතෙම කියන්නේය. (v) සංඝයා විසින් ඡන්න භික්ෂුවට අනිකක් කියයි. අනිකක් කියයි යන කථාව නගන ලදී. සංඝයා කැමතිවෙයි. එසේහෙයින් නිශ්ශබ්දය. මෙසේ මේ තුෂ්ණීම්භාවය දරමියි' කියායි. ඉක්බිති ආයුෂ්මත් ඡන්නට නොයෙක් ආකාරයෙන් ගර්හාකොට (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 3 (vii) මහණෙනි, මෙසේද වනාහි මේ ශික්ෂාපදය උදෙසව්.

4 "සඟ මැද යමෙක් විචාලකල කෙලින් උත්තර නොදී, අනිකක් කීමෙහි පචිති ඇවැත්වේ" භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට මේ ශික්ෂාපදය මෙසේද පනවන ලදී.

5 එකල්හි වනාහි (ii) ආයුෂ්මත් ඡන්නතෙමේ භික්ෂූන් මැද ඇවතින් විචාරණු ලබන්නේ (ප්‍රශ්නයට පිළිතුරු නොදී) අනිකක් කීමෙන් ඇවතකට පැමිණෙන්නෙමියි නිශ්ශබ්දව සිට සංඝයා වෙහෙස(iii)කරවූයේය. යම් ඒ භික්ෂූ කෙනෙක් අල්පෙච්ඡවූවාහුද (1 මුසාවාද ශික්ෂාපදයේ 2 (ii)) කොයේනම් (මෙහි (ii)) කළාහයි දොස් කියත්. නොසතුට ප්‍රකාශ කරත්. නොසතුටු බස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මේය සැල කළහ. (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 3 (i) 'රැස්කරවා' යන තැනට) 'ඡන්නය' ඔබ සඟ මැද ඇවතින් විචාරණු ලබන්නේ නිශ්ශබ්දව සංඝයා වෙහෙසන්නේදැයි ඇසූසේක. (මෙහි 2 (ii) බලාදන්න.) හිස් පුරුෂය, මෙය නොපැහැදුනාවූන්ගේ පැහැදීම පිණිසද (1 මුසාවාද ශික්ෂාපදයේ 3 (iv) ගර්හාකොට දැහැමි කථාකොට භික්ෂූන් ආමන්ත්‍රණය කළසේක.

6 "මහණෙනි, එසේ නම් සංඝයා ඡන්න භික්ෂුව වෙහෙසන්නෙකු කොට ආරෝපනය කෙරේවා. මහණෙනි, මෙසේද වනාහි ආරෝපනය කළයුතුය. දක්ෂ බලවත් භික්ෂුවක් විසින් සංඝයාට දැන්විය යුතුය (ii) සංඝතෙමේ මා කියන්නක් අසාවා. මේ ඡන්න භික්ෂු සංඝයා මැද ඇවතින් විචාරණු ලබන්නේ නිශ්ශබ්ද වූයේ සංඝයා වෙහෙසයි.

(iii) ඉදින් සංඝයාට කල් ඇත්තේවී නම් සංඝතෙම ඡන්න භික්ෂුවට වෙහෙස කරන්නෙකැයි ආරොපනය කරවි, මේ දක්වීමයි "සවාමිති, (මෙහි (ii)) සංඝතෙමේ ඡන්න භික්ෂුව වෙහෙස කරන්නෙකු කොට ආරොපනය කරයි. ඡන්න භික්ෂුවට වෙහෙස කරන්නෙකු කොට ආරොපනය කිරීම යම් ආයුෂ්මත් කෙනෙකුට කැමතිනම්වීද හෙතෙමේ නිශ්ශබ්ද වන්නේය. යමෙකුට නොකැමැත්තේ නම් හෙතෙම කියාව සංඝයා විසින් ඡන්න භික්ෂුවට වෙහෙස කරන්නෙකැයි ආරොපනය කරණ ලදී. (iv) සංඝයා ඊට කැමැතිය එහෙයින් නිශ්ශබ්දය මේ තූෂ්ණීම්භාවය මෙසේ දරමියි(v) කියායි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ඡන්න තෙරුන්ට නොයෙක් ආකාරයෙන් නරකා වැරදිවූ කාය පොෂණයෙහි මුසාවාද ශික්ෂාපදයේ 4 ඡේදය යොදන්න). මහණෙනි, මෙසේද වනාහී මේ ශික්ෂාපදය උදෙසව්.

7 සංඝයාගේ ප්‍රශ්නයට නියම පිළිතුරක් නොදී "අනිකක් කියමින් කථාකොට කර සිටීමෙහි පචිති ඇවැත්වේ. අනිකක් කියන්නේ නම් සංඝයා මැද වස්තුවෙන් හෝ ඇවතින් හෝ ප්‍රශ්න කරණු ලබන්නේ එය නොකියනු කැමැත්තේ එය අනන දමනු කැමැත්තේ (මෙහි 1 (ii)) මෙ අසැසැවාදන නම්. වෙහෙස කරන්නේ (මෙහි 1(ii) නිශ්ශබ්දව සංඝයා වෙහෙසවයිද මේ විහෙසක නම් අනිකක් කියන්නෙකැයි ආරොපනය කළ කල්හි (මෙහි 1 (ii) දුකුලා ඇවැත්වේ.

8 වෙහෙස කරන්නෙකැයි ආරොපනය කළ කල්හි (මෙහි 1 (ii)) දුකුලා ඇවැත්වේ, අනිකක් කියන්නෙකැයි (දොස්) පැවරීම කළ කල්හි (මෙහි 1 (ii) පචිති ඇවැත්වේ, වෙහෙස කරන්නෙකැයි (දොස්) පැවරීම කළ කල්හි (මෙහි 1 (ii)) පචිති ඇවැත්වේ (මේ වාක්‍ය ලෙසට "පචිති ඇවැත්වේ." යොදන්න.) ධර්ම කර්මයෙහි ධර්ම කර්මය යන හැඟීම් ඇත්තේ අනිකක් කීමෙහි, වෙහෙස කිරීමෙහි, ධර්මකර්මයෙහි විමති ඇත්තේ අනිකක් කීමෙහි වෙහෙස කිරීමෙහි, ධර්ම කර්මයෙහි ධර්ම කර්මය යන හැඟීම් ඇත්තේ අනිකක් කීමෙහි වෙහෙස කිරීමෙහි අධර්ම කර්මයෙහි ධර්මකර්මය යන හැඟීම් ඇත්තේ දුකුලා ඇවැත්වේ. අධර්ම කර්මයෙහි විමති ඇත්තේ (මෙහි (ii)) අධර්ම කර්මයෙහි අධර්ම කර්මය යන හැඟීම් ඇත්තේ (මෙහි (ii)) නොදන අසයිද ගිලන් බැවින් හෝ නොකියාද සංඝයාගේ පලිද්දක් හෝ කලහයක් හෝ විරුධ

ගැටීම හෝ විවාදයක් හෝ වන්නේයයි නොකියාද, සංඝ භේදයක් හෝ සංඝයාගේ අසමගියක් හෝ වන්නේයයි නොකියයිද අධර්මයෙන් හෝ කොටස් විසින් හෝ ක ගව නුසුදුස්සාට හෝ කර්මයක් කරන්නේයයි නොකියයිද උම්මත්තහුටද ආදි කර්මිකයාහටද ඇවැත් නොවේ

## 3 උජ්ඣාපනක ශික්ෂාපදය

1 එකල්හි වනාහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ රජගහ නුවර ලෙහෙණුන්ට බත් පිළුප් දුන් වෙළුවනයෙහි වාසය කරණ සේක. එකල්හි වනාහි ආයුෂ්මත් දබ්බමල්ල පුත්‍රතෙම සංඝයාට සෙනසුන්ද පනවයි. දානයද නියම කරයි. ඒ කාලයෙහි මෙත්තිය භූමජක දෙදෙනම අලුත මහණවූවෝද ප්‍රඥ අඩුවූවෝද වෙත්. සංඝයාගේ යම් පහත් සෙනසුනක් වේද, ඒවා ඔවුන්ට ලැබෙත්, දුප්පත් දානද ඒ දෙදෙනාට ලැබෙත්; ඔව්හු ආයුෂ්මත් දබ්බමල්ල පුත්‍රට 'දබ්බමල්ල පුත්‍රතෙමේ කැමැත්තවූ පරිදි සෙනසුන් පනවයි, කැමැත්තවූ පරිදි දානය නියම කරයි(ii)'යයි දොස් කීහ. නොසතුට ප්‍රකාශ කළහ. නොසතුටු වචන කීවාහුය. (iii)යම් ඒ භික්ෂු කෙනෙක් අල්පෙච්ඡවූවාහුද ඔව්හු (මෙහි 1 මූලාවෘද ශික්ෂාපදයේ 2 (ii)) කෙසේනම් මෙත්තිය භූමජක භික්ෂූහු ආයුෂ්මත් දබ්බමල්ල පුත්‍රට භික්ෂූන් කලකිරවන්නාහු (මෙහි (ii) දක්වා) භාග්‍යවතුන් වහන්සේට මේ දන්වූහ. (මෙහි 1 මූලාවෘද ශික්ෂාපදයේ 3 (i)) 'රැස්කරවා' යන තැනට) 'මහණෙනි, තෙපි දබ්බමල්ල පුත්‍ර තෙරෙහි භික්ෂූන් කලකිරවූවාහුද, සත්‍ය ස්වාමීනි, මේ නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිසද (1 මූලාවෘද ශික්ෂා පදයේ 3 (vi) මහණෙනි, මෙසේ මේ ශික්ෂාපදය උදෙසව්

2 "අගුණ ප්‍රකාශකිරීමෙහි පචිති ඇවැත්වේ." මෙසේද වනාහි භාග්‍යවතුන්වහන්සේ විසින් ශික්ෂාපදය පනවන ලදී.

3 එකල්හි වනාහි මෙත්තිය භූමජක භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ විසින් අගුණ ප්‍රකාශ කිරීම තහනම් කරණ ලද්දීයයි මෙපමණකින් භික්ෂූහු අසත්වායි භික්ෂූන් ළඟ සිට ආයුෂ්මත් දබ්බමල්ල පුත්‍රට දොස් කියත් කැමැත්තෙන් දබ්බමල්ල පුත්‍රතෙමේ සෙනසුන් පනවයි, කැමැත්තෙන් දන් නියම කරයි යනාදීයෙනි. යම් ඒ භික්ෂු කෙනෙක් අල්පෙච්ඡවූවාහුද (1 මූලාවෘද ශික්ෂාපදයේ 2 (ii) ) ඔව්හු මෙත්තිය භූමජක භික්ෂූහු කෙසේනම් ආයුෂ්මත් දබ්බමල්ල පුත්‍රට දොස් කියන්නාහුදැයි දොස් කීහ නොසතුට ප්‍රකාශකළහ නොසතුටු වචන

කිහ. (iii) භාග්‍යවතුන් වහන්සේට මේය දැන්වූහ. (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 3 (i) "රැස්කරවා" යන තැනට) "මහණෙනි, තෙපි දබ්බමල්ල පුත්‍රව දෙස් කියන්නහු ඇත්තදැ?" "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය" භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළ සේක (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 3 (iv)) හිස්පුරුෂයෙනි, කෙසේ නම් තෙපි දබ්බමල්ල පුත්‍රව දෙස් කියන්නහුද? හිස් පුරුෂයෙනි, මෙය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිස (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 3(vi)) මහණෙනි, මෙසේද මතු මේ ශික්ෂාපදය උදෙසව්.

4 "අවමන් කිරීමෙහි නුගුණ ප්‍රකාශ කිරීමෙහි පචිති ඇවැත්වේ"

5 "අවමන් කිරීම" නම් උපසම්පන්වූ සංඝයා විසින් සම්මත කරණ ලද සෙනසුන් පනවන්නෙක් හෝ දන් නියම් කරන්නෙක් හෝ කැඳ බෙදන්නෙක් හෝ ගෙඩි බෙදන්නෙක් හෝ කැවිලි බෙදන්නෙක් හෝ සවල්පමාත්‍රයක් බෙදන්නෙක් හෝ අගුණයට පත්කරණු කැමැත්තේ, අපකීර්තියට පත්කරණු කැමැත්තේ තේජස නැති කරණු කැමැත්තේ උපසම්පදාවූවෙකුට දෙස් කියාද, අවමන් කරයිද, පචිති ඇවැත්වේ ධම් කම්මයෙහි ධම් කම්ම යන හැඟීම් ඇත්තේ අවමන් කිරීමෙහි නුගුණ ප්‍රකාශ කිරීමෙහි පචිති ඇවැත්වේ. ධම්කම්මයෙහි විමති ඇත්තේ අවමන් කිරීමෙහි නුගුණ ප්‍රකාශ කිරීමෙහි පචිති ඇවැත්වේ. ධම් කම්මයෙහි අධම් කම්ම යන හැඟීම් ඇත්තේ අවමන් කිරීමෙහි නුගුණ ප්‍රකාශ කිරීමෙහි පචිති ඇවැත්වේ. උපසම්පන්නොවූවෙකුට අවමන් කරයිද දුකුලා ඇවැත්වේ උපසම්පදාවූ (මෙහි 5 ඡේදයේ (ii)) සම්මතවූ යන්නට සම්මතනොවූ කියා පචිති යන්නට දුකුලා කියාද මෙකී තැර යොදගත යුතුයි) උපසම්පදා නොවූ සංඝයා විසින් සම්මතවූ හෝ නොවූ (මෙහි 5 ඡේදයේ (ii)) පචිති යන්නට දුකුලා කියා මෙතැන්සිට අධර්ම කර්මයෙහි ධර්ම කර්මය යන හැඟීම් ඇත්තේ දුකුලා ඇවැත් වේ අධර්ම කර්මයෙහි විමති ඇත්තේ දුකුලා ඇවැත් වේ අධර්ම කර්මයෙහි අධර්ම කර්මය යන හැඟීම් ඇත්තේ දුකුලා ඇවැත්වේ. ප්‍රකෘතියෙන්, ඡන්දයෙන්, ද්වේෂයෙන් භයෙන්, මෝහකමින්, කරන්නහුට අවමන් කරයිද දෙස් කියන්නාටද උමතුවූවහුටද ආදිකර්මිකයාටද ඇවැත් නොවේ.

# 4 පළමුවන සෙනාසන ශික්ෂාපදය

1 (මෙහි 1 මුසාවාද ශික්ෂාපදය 1 (i)) ඒ කාලයෙහි භික්ෂූහු හිම වැටෙන කාලයෙහි අවකාශස්ථානයෙහි සෙනසුනක් පනවා ශරීරය තවන්නාහු කාලය දැන්වූ කල්හි එයින් බැහැර යන්නාහු නොහකුලා යත්, නොවිචාරා යත්, සෙනසුන් හිම වර්ෂාවෙන් තෙමුණේ වීය. යම් ඒ භික්ෂු කෙනෙක් අල්පේච්ඡවූවාහුද (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 2 (ii)) කොටස් ... ම භික්ෂූහු (ii) අවකාශස්ථානයෙහි සෙනසුනක් පනවා යන්නාහු එය රැගෙන නොතබන්නාහුද, නොහකුළුවන්නාහුද නොවිචාරා යන්නාහුදැයි සෙනසුන් තෙමීයැයි දොස් කියත්. නොසතුටු ප්‍රකාශ කරත්, නොසතුටු වචන කියත්.

2 ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහුය. (1 මුසාවාද ශික්ෂාපදයේ 3 (i)) මහණෙනි, භික්ෂූහු (මෙහි (ii)) යනු ඇත්තක්ද (1 මුසාවාද ශික්ෂාපදයේ 3 (i) "රුස්සරවා" යන තැනට) මහණෙනි, මෙසේද වනාහි මේ ශික්ෂාපදය උදෙසව්.

3 "යම් භික්ෂුවක් තෙම වනාහි සංඝසතුවූ ඇඳක් හෝ පුටුවක් හෝ බිස්සක් හෝ කොට්ටයක් හෝ එළිමහනෙහි අතුට හෝ අනුන් ලවා අතුරවා හෝ බැහැරයන්නේ ඒ ඇඳන් ආදිය නැවත නොතැන්පත් කොට හෝ අනුන් ලවා තැන්පත් නොකරවන්නේ හෝ නොවිචාරා යන්නේ නම් හෝ පචිති වේ" භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේද වනාහි මේ ශික්ෂාපදය පනවන ලදී.

4 එකල්හි වනාහි භික්ෂූන් වහන්සේලා අවකාශස්ථානයෙහි වැස කල් ඇතුවම සෙනසුන් ගෙනයති. කල් ඇතුවම සෙනසුන් ගෙනයන්නවුන් බුදුහු දැක, මේ නිදානයෙහි මේ ප්‍රකරණයෙහි දැහැමි කථාවක් කොට භික්ෂූන්ට ඇමතූ සේක. "මහණෙනි, වර්ෂා මාසයෙහි සංකේත නොකරණ ලද අට මාසයෙහි යම් තැනෙක කපුටෝ හෝ උකුස්සෝ හෝ වසුරු නොහෙළත්ද, එබඳු මණ්ඩපයක හෝ ගසක් මුල හෝ සෙනසුන් තබන්නට අනුදනිමි.

5 (පාරාජිකා පාලියේ 1 පාරාජිකයේ පදභාජනීයේ 1-2 "සාංඝිකං" නම් (ii) සංඝයාට දෙන ලද්දේ වේ. පරිත්‍යාග කරණ ලද්දේ වේ (iii) "ඇඳ" නම් ඇඳන් සතරෙකි. මසාරක, බුන්දිකාබද්ධ, කුළිරපාද, ආහච්චපාද යන සතරයි. "පුටු" නම් පුටු සතරෙකි මසාරක, බුන්දිකාබද්ධ කුළිරපාද

සාකච්ඡාපාද යන සතරයි. බිසි නම් බිසි පසකි. බැටළුලොම් බිස්ස, රෙදිබිස්ස, පට්ටා මලින් කළ බිසි, තණකොළ බිසි, කොළබිසියි. කොච්ච නම් පට්ටා මලින්ද, සැමැක්දරමලින්ද, මුදුතාණ මලින්ද, ඔබුත්තණ මලින්ද ඇතුළු වෙලා බදින ලද්දේයි (iv) "අතුරා" යනු තෙමේ අතුරා යනුයි "අතුරවා" යනු අනිකෙකු ලවා අතුරවා යනුයි (v) උපසම්පදා නොවූවෙක් අතුරවයිද ඔහුට දෙකම වේ උපසම්පදාවූවෙක් අතුරවයිද ඇතුරූවහුට දෙකම වේ. "යන්නේ එය නගා නොතබයි" යනු තෙමේ නගා නොතබන්නේද "නගා නොතබ්බවන්නේද" යනු අනිකෙකු ලවා නගා නොතබ්බවන්නේද, "නොවිචාරා යන්නේද" යනු භික්ෂුවක් හෝ සාමණේරයෙක් හෝ ආරාමිකයෙක් හෝ නොවිචාරා මධ්‍යම පුරුෂයෙකු ගැසූ ගලක් වැටෙන දුරක් ඉක්මවයිද පචිති ඇවැත්වේ.

6 (i) "සාංඝික බඩුමෙක්හි සාංඝිකය යන හැඟීම් ඇත්තේ (ii) අවකාශස්ථානයෙහි (iii) අතුරා හෝ අතුරවා හෝ යන්නේ එය නගා නොතබයිද නගා නොතබ්බවයිද නොවිචාරා හෝ යයිද පචිති ඇවැත්වේ. (iv) සාංඝිකවූ දෙයෙහි විමති ඇත්තේ (මෙහි (iv)) සාංඝික දෙයෙහි පුද්ගලික හැඟීම් ඇත්තේ (v) අවකාශස්ථානයෙහි අතුරා හෝ අතුරවා හෝ යන්නේ එය නැන්පත් නොකරයිද නැන්පත් නොකරවයිද විචාරා හෝ යයිද (vi) පචිති ඇවැත්වේ. කොට්ට ආදියෙහි උරයක් හෝ ඇතිරිල්ලක් හෝ තලාලක් හෝ ඇත්තඹක් හෝ සම්කඩක් හෝ පාපිස්නක් හෝ ලී පුටුවක් හෝ (මෙහි (v)) දුකුළා වේ පුද්ගලික දෙයෙහි පුද්ගලිකය යන අදහස් ඇත්තේ (vii) දුකුළා ඇවැත්වේ. (viii) පුද්ගලික බඩුවෙහි විමති ඇත්තේ (මෙහි (vii) පුද්ගලික දෙයෙහි පුද්ගලිකය යන හැඟීම් ඇත්තේද අනිකෙකුගේ පුද්ගලික දෙයෙහි (මෙහි (vii)) තමාගේ පුද්ගලික දෙයෙහි ඇවැත් නොවේ. නගාතබා යේද නගාතබ්බවා යේද, විචාරා යේද, ඉවුරස්සාය ගස්සමින් යේද කිසිවෙකු විසින් සාදර කරණ ලද්දේද විපත් ඇතිතැනදී උමතුවූවහුට ආදිකර්මිකයාටද ඇවැත් නොවේ."

## 5 දෙවෙනි සෙනාසන ශික්ෂාපදය

1 (මෙහි 1වූ පාචිත්ති ශික්ෂාපද 1 (i)) එකල්හි විනාශී සප්තරස වර්ගීය භික්ෂූන් සතළොස් දෙනෙක් වෙත්. ඔව්හු මත් මතන් සාහුද එකාව වසත් '[illegible] එකාව යත්' ඔව්හු එක්තරා (ii) සාංඝික විහාරයෙක්හි සේනාසන් අතුරා බැහැරයන්නෝ

එස නගා නොතබා (iii) ගියහ. සෙනසුන වේයන් විසින් කනලද්දේමය. යම් ඒ භික්ෂු කෙනෙක් අල්පේච්ඡවූවාහුද ඔව්හු කෙසේනම් ෂඩ්වර්ගීය භික්ෂූහු (මෙහි (ii)) නගා නොතබ්බවයිද, නොවිචාරා යත්ද සෙනසුන වේයන් විසින් කනලද්දේයයි දොස් කියත්. නොසතුටු ප්‍රකාශ කෙරෙත්, නොසතුටු වචන කියත්. භාග්‍යවතුන් වහන්සේට මේ දන්වූහ. (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 3 (i) ) "රැස්කරවා', යනා තැනට)

2 "මහණෙනි, ෂඩ්වර්ගීය භික්ෂූහු (මෙහි 1 (ii)) නොතිබ්බවූහුද නොවිචාරා ගියාහුද සෙනසුන වේයන් විසින් කනලද්දේ ඇත්තද?" ඇසූහ "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය." "භාග්‍යවත් බුදුරජාන් වහන්සේ ගැරහූසේක. මහණෙනි, කෙසේනම් ඒ හිස් පුරුෂයෝ (මෙහි 2 (ii) මහණෙනි, මෙය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිසද (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 3 (vi)) මහණෙනි, මෙසේද මේ ශික්ෂාපදය උදෙසව්.

3 "යම්කිසි භික්ෂුවක් සංඝික විහාරයක සයනයක් අතුරා හෝ යන්නේ එය නගා නොතබයිද, නගා නොතබ්බවයිද නොවිචාරා යයිද පචිති ඇවැත්වේ

4 (මෙහි 4 ශික්ෂාපදය 5 (i)) "සාංඝික විහාරය" ත (මෙහි 4 ශික්ෂාපදයේ 5 (ii)) 'සයනයක්'නම් ගුදිරිය කොච්චිදියේ උරණ, ඇතිරිල්ල, බුමුතුරුණ, පත්කඩය, සම්කඩ, නිසීදනය, උඩ ඇතිරිල්ල, තණ ඇතිරිල්ල, කොළ ඇතිරිල්ලය. "අතුරා" යනු තමාම අතුරා, අතුරවාතම් අනුන් ලවා අතුරවා "යන්නේ එය නගා නොතබයි" යනු තමා නගා නොතබන්නේද, නගා නොතබ්බවන්නේ යනු අනිකෙකු ලවා නගා නොතබ්බවන්නේය."

5 "නොවිචාරා හෝ යන්නේය" යනු භික්ෂුවක් හෝ සාමණේරයෙක් හෝ ආරාමිකයෙක් හෝ නොවිචාරා වට කරණ ලද ආරාමයාගේ ඒ වටකිරිම ඉක්මවන්නාහට (ii) පචිති ඇවැත්වේ (iii) වට නොකරණ ලද ආරාමයාගේ ආසන්නය ඉක්මවන්නාහට (මෙහි (ii) (මෙහි 6 (i)) සයනයක් (මෙහි 6 (iii) ) සාංඝික දෙයෙකැයි විමති ඇත්තේ (iv) සයනයක් අතුරා හෝ අතුරවා හෝ යන්නේ නගා නොතබන්නේද නොතබ්බවන්නේද නොවිචාරා හෝ යන්නේද (v (මෙහි (ii)) සාංඝික දෙයෙකි පුද්ගලික හැඟීම ඇත්තේ (මෙහි (iv))

(මෙහි (ii) වේ. විහාරයට සමීපයෙහි හෝ උපස්ථාන ශාලාවෙහි හෝ මණ්ඩපයෙහි හෝ ගසක් මුල හෝ (මෙහි (iv) දුකුලා ඇවැත් වේ. ඇඳක් හෝ පුටුවක් හෝ විහාරයෙහි හෝ විහාරය සමීපයෙහි හෝ උපස්ථාන ශාලාවෙහි හෝ මණ්ඩපයෙහි හෝ ගසක් මුල හෝ අතුරා හෝ අතුරවා හෝ යන්නේ නගා නොගන්නේද නොගන්වන්නේද නොවිචාරා යන්නේද දුකුලා ඇවැත් වේ. පුද්ගලික දෙයෙහි සාංඝිකය යන අදහස් ඇත්තේ දුකුලා ඇවැත් වේ. පුද්ගලික දෙයෙහි විමති ඇත්තේ දුකුලා ඇවැත් වේ. පුද්ගලික දෙයෙහි පුද්ගලිකය යන අදහස් ඇත්තේද අන්කෙනෙකුගේ පුද්ගලික දෙයෙහි දුකුලා ඇවැත් වේ. තමාගේ පුද්ගලික දෙයෙහි ඇවැත් නැත උද්ධරාගෙන යයිද, උද්ධරවාගෙන යයිද, විචාරා යයිද කිසිවකු විසින් උපද්‍රව කරණ ලද්දේ වේද අපෙක්ෂා සහිතව ගොස් එහි සිටියේ විචාරයි කිසිවෙකු විසින් විපත් කළේ වේද, ආපදාවෙක්හි උමතුවූවහුට ආදිකර්මිකයාට ඇවැත් නොවේ.[1]

## 6 අනුපඛජ්ජ ශික්ෂාපදය

1 (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 1 (i)) එකල්හි වනාහි ෂවග භික්ෂූහු වටිනා ඇඳන් දෙන සහිතයැයි ස්ථවිර භික්ෂූන් නැගිට්වූහ. ඉක්බිති ෂවග භික්ෂූහු අපි කිනම් උපායකින් මෙහිම සිටින්නෙමුදැයි මේ සිතුවිය. ඉක්බිති ෂවග භික්ෂූහු ස්ථවිර භික්ෂූන් හැපිගෙන ශයනය කරත්. 'යමෙකුට අවකාශ නැත්තේ නම් ඔහු යන්නේය.' කියායි.

2 'යම් ඒ භික්ෂු කෙනෙක් අල්පේච්ඡවූවාහු (1 මුසාවාද ශික්ෂාපදයේ (2 (ii) ) කෙසේ නම් ෂවග භික්ෂූහු ස්ථවිර භික්ෂූන් හැපිගෙන ශයනය කෙරෙත්දැයි දොස් කියත්. නොසතුට ප්‍රකාශ කරත්. නොසතුටු වචන කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය දැන්වූහ. "මහණෙනි, තෙපි ස්ථවිර භික්ෂූන් හැපිගෙන ශයනය කරව් යනු ඇත්තදැයි?" ඇසූහ. "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය," භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගැහී කළසේක. (මෙහි 1 මුසාවාද ශික්ෂා පදයේ 3 (iv)) "හිස් පුරුෂයෙනි, තෙපි කෙසේ නම් ස්ථවිර භික්ෂූන් හැපිගෙන ශයනය කරන්නහුද හිස් පුරුෂයෙනි, මෙය නො-පැහැදුනවුන්ගේ පැහැදීම (මෙහි 1 මුසාවාද ශික්ෂා පදයේ 3 (vi) ) මහණෙනි, මෙසේ මේ ශික්ෂා පදය උදෙසව්.

3 "යම් භික්ෂුවක්තෙම වනාහි සඟසතු විහාරයෙහි සංඝයා විසින් දෙනලද බව දැන දැන පළමුකොට පැමිණියාවූ

භික්ෂුවක් ගටාගෙන 'යමෙකුට ගැහැටක් වන්නේ නම් මෙතැනින් බැහැර යන්නේයයි' මේ සංඝයා සතු සෙම් කරුණු කොටගෙන අනිකක් කරුණු කොට නොගෙන සයනය කෙළේ නම් පචිති ඇවැත්වේ.

4 "(මෙහි 4 ශික්ෂාපදයේ 5 (i))" "සාංඝික විහාරය" නම් (මෙහි 4 ශික්ෂාපදයේ 5 (ii)) "දන්නේ" නම් වැඩිමහලුයි දන්නේ ගිලන්යයි දනියි, සංඝයා විසින් දෙනලද්දේයයි දනී "ගටාගෙන" යනු ඔහා ඇතුල්ව යනුයි. "සයනය කරන්නේය" යනු ඇඳට හෝ පුටුවට හෝ ප්‍රවිෂ්ට වන්නහුගේ හෝ නික්මෙන්නහුගේ හෝ සමීපයෙහි සයනයක් අතුරයි හෝ අතුරවයි හෝ දුකුලා ඇවැත්වේ වහා හිඳියි හෝ ඔහා හොවියි හෝ පචිති ඇවැත්වේ "අනිකක් නැතිව මෙයම හේතුකොට" යනු වහා ඇතුල්ව සයනය කරන්නම අන්කිසි හේතුවක් නොමැදයනුයි.

5 සාංඝිකයෙහි සාංඝිකය යන හැඟීම් ඇත්තේ (ii) ගටාගෙන ශයනය කෙරේ නම් පචිති ඇවැත්වේ. (iii) සාංඝිකයෙහි විමති ඇත්තේ මෙහි (ii) සාංඝිකයෙහි පුද්ගලිකය යන හැඟීම් ඇත්තේ (මෙහි (ii)) ඇඳකට හෝ පුටුවකට හෝ ඇතුල්වන්නහුට හෝ නික්මෙන්නහුට හෝ ඉඩක් තබා (iv) සයනයක් අතුරා නම් හෝ අතුරවා නම් හෝ දුකුලා ඇවැත්වේ (v) විහාරයාගේ හාත්පස හෝ උපස්ථාන ශාලාවෙහි හෝ මණ්ඩපයක හෝ ගසක්මුල හෝ අවකාශයෙහි හෝ (මෙහි (iv)) හිඳියි හෝ හොවියි හෝ (vi) දුකුලා ඇවැත්වේ (vii) පුද්ගලිකයෙහි සාංඝිකය යන හැඟීම් ඇත්තේ (මෙහි (vi)) පුද්ගලිකයෙහි විමති ඇත්තේ (මෙහි (vi)) පුද්ගලිකයෙහි පුද්ගලික යන හැඟීම් ඇත්තේ අන්-කෙකුගේ පුද්ගලිකයෙහි (මෙහි (vi)) තමාගේ පුද්ගලික-යෙහි ඇවැත් නොවේ ගිලන්වූයේ ඇතුල්වේද සීතයෙන් හෝ උෂ්ණයෙන් හෝ පෙළුනේ ඇතුල්වේ ආපදාවක්හි හෝ උමතුවූවහුට හෝ ඇදිකර්මිකයාට හෝ ඇවැත් නොවේ.

## 7 නික්කඩ්ඪන ශික්ෂාපදය

1 (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 1 (i)) එකල්හි වනාහි සප්තරස වර්ගීය භික්ෂූන්ට අයත් භික්ෂූහු එක්තරා පිටිසර බද මහාවිහාරයක් ප්‍රතිසංස්කරණය කරති. මෙහි අපි මින් වසමුයි සිතාති. සමග භික්ෂූහු විහාරය ප්‍රතිසංස්කරණය

කරණ සප්තරස වර්ගීයව අයත් භික්ෂූන් දුන" ඇවැත්නි, මේ සප්තරස වර්ගීය භික්ෂූහු විහාරයක් ප්‍රතිසංස්කරණය කරත්. දුන් ඔවුන් පන්නන්නෙමුයි" කීහුය. ඇතැම් කෙනෙක් "ඇවැත්නි, යම් තාක් ප්‍රතිසංස්කරණය කෙරෙත්ද ඒ තාක් නැවතුන මැනවයි කීහ. ප්‍රතිසංස්කරණය කළ කල්හි පන්නන්නෙමුයි" කීහුය. ඉක්බිති සව්ග භික්ෂූහු "ඇවැත්නි, සාංඝික විහාරය අපට ලැබෙයි" කීහුය. "ඇවැත්නි, මුලින්ම කිවයුතුව තුබුනා නොවේද එසේනම් අපිද අනිකක් ප්‍රතිසංස්කරණය කරමුයි." "ඇවැත්නි, සාංඝික විහාරයක් නොවේද?" "ඇවැත්නි එසේය. සාංඝික විහාරයකි." "ඇවැත්නි, නැගිටිව් විහාරය අපට ලැබෙයි" කීහුය "ඇවැත්නි, විහාරය විශාලය නොපිද ඔබත් අපිද වසමුයි" කීහුය. "ඇවැත්නි, නැගිටිව් විහාරය අපට ලැබෙයි" කියා, කිපියාහු නොසතුටුවූවාහු බෙල්ලෙන් අල්ලා ඇද දමත් ඇද දමනු ලබන්නාවූ ඔව්හු අඩත්.

2 භික්ෂූහු මෙසේ කීහුය. "ඇවැත්නි, කෙසේ හෙයින් නොපි අඩව්දැයි" ඇසූ කල්හි 'ඇවැත්නි, මේ සව්ග භික්ෂූහු කිපී නොසතුටුව අප සාංඝික විහාරයෙන් ඇද දැම්මාහයි" කීහුය. යම් ඒ භික්ෂූ කෙනෙක් අල්පේච්ඡවූවාහුද (මෙහි 1 මූලාංග ශික්ෂා පදයේ 2 (ii)) 'කෙසේ නම් සව්ග භික්ෂූහු කිපුනාහු නොසතුටු සිත් ඇත්තාහු භික්ෂූන් සාංඝික විහාරයෙන් බැහැර කෙරත්දැයි," (කීහුය.) භාග්‍යවතුන් වහන්සේට මෙය දැන්වූහ. "මහණෙනි, නොපි කිපියාහු නොසතුටු සිත් ඇත්තාහු භික්ෂූන් සාංඝික විහාරයෙන් ඇද දමත්දැයි?" ඇසූහ "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය." භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළසේක. (මෙහි 1 මූලාංග ශික්ෂා පදයේ 3 iv)) 'හිස් පුරුෂයෙනි, කෙසේ නම් තෙපි කිපියාහු නොසතුටු සිත් ඇත්තාහු භික්ෂූන් සාංඝික විහාරයෙන් ඇද දමත්ද. හිස් පුරුෂයෙනි මෙය නොපැහැදුන වුන්ගේ (මෙහි 1 මූලාංග ශික්ෂා පදයේ 3 (vi)) මහණෙනි, මෙසේද මනාහී මේ ශික්ෂා පදය උදෙසව්

3 "යම්කිසි භික්ෂුවක් භික්ෂුවකට කිපුනේ නොසතුටු සිත් ඇත්තේ සාංඝික විහාරයෙන් බැහැරකරයිද හෝ බැහැර කරවාසි හෝ පචිති ඇවැත්වේ."

4 (මෙහි 4 ශික්ෂා පදයේ 5 (i)) "කිපියේ නොසතුටු වූයේ" යනු නොඇලුනේ පැරුණු සිත් ඇත්තේ උල් ඇති වූයේ. "සාංඝික විහාරය" නම් (මෙහි 4 ශික්ෂා පදය 5 (ii))

5 "බැහැරකරන්නේ" යනු ඇතුලෙහිදී අල්වාගෙන ඉදිරිපිටව පිටකරයිද පචිත්ති ඇවැත්වේ. (මේ වාක්‍ය අගට "පචිත්ති ඇවැත්වේ" යොදන්න ) ගෙයි ඉදිරිපිටදීගෙන පිටකට පිටකරයිද, එක් ප්‍රයෝගයකින් බොහෝ දොරවල් ඉක්මවයිද, අනිකෙකුට අණවයිද, දුකුලා ඇවැත්වේ බොහෝ වාරයක් ඇණවූයේ බොහෝ දොරටු ඉක්මවයිද- සාංඝිකයෙහි සාංඝිකය යන හැඟීම් ඇත්තේ කිපියේ නොසතුටුවූයේ (ii) බැහැර කරයි හෝ බැහැරකරවයි හෝ (iii) - සාංඝිකයෙහි විමති ඇත්තේ කිපියේ නොසතුටුවූයේ (මෙහි (ii) )-සාංඝිකයෙහි පුද්ගලිකය යන හැඟීම් ඇත්තේ කිපියේ නොසතුටුවූයේ (මෙහි (ii) )-ඔහුගේ පිරිකර (මෙහි (ii)) දුකුලා ඇවැත්වේ. (මේ වාක්‍ය අගට "දුකුලා ඇවැත්වේ" යොදන්න ) විහාරයාගේ හාත්පසින් හෝ උපස්ථාන ශාලාවෙන් හෝ මණ්ඩපයෙන් හෝ වෘක්ෂ මූලයෙන් හෝ අවකාශස්ථානයෙන් හෝ (මෙහි (ii) ) උපසම්පදා නොවූවෙක් විහාරයෙන් හෝ විහාර සමීපයෙන් හෝ උපස්ථාන ශාලාවෙන් හෝ මණ්ඩපයෙන් හෝ වෘක්ෂමූලයෙන් හෝ අවකාශස්ථානයෙන් හෝ (මෙහි (ii) )-ඔහුගේ පිරිකර (මෙහි (ii) ) - පුද්ගලිකයෙහි සාංඝික යන හැඟීම් ඇත්තේ-පුද්ගලිකයෙහි විමති ඇත්තේ-පුද්ගලිකයෙහි පුද්ගලිකය යන හැඟීම් ඇත්තේ අනිකෙකුගේ පුද්ගලිකයෙහි තමාගේ පුද්ගලිකයෙහි ඇවැත් නොවේ. දුශ්ශීලයෙකු (මෙහි (ii) ) ඔහුගේ පිරිකර (මෙහි (ii) ) පිස්සෙකු (මෙහි (ii) ) ඔහුගේ පිරිකර (මෙහි (ii) ) ඩබර කරුවෙකු-කොලාහලකරුවෙකු-විවාදකරුවෙකු- වාචාලයෙකු -සංඝයා අතරෙහි විවාදකරුවෙකු-(මෙහි (ii) ) ඔහුගේ පිරිකර (මෙහි (ii) ) යහපත්ව නොපවතින අතවැස්සෙකු හෝ සඟිග මයන්නෙකු හෝ (මෙහි (ii) ) ඔහුගේ පිරිකර (මෙහි (ii) ) උමතුවූවෙකුට හෝ ආදිකර්මිකයාට හෝ ඇවැත් නොවේ.

## 8 වෙහාසකුටි ශික්ෂාපදය

1 (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 1 (i) එකල්හි වනාහි භික්ෂූ දෙනමක් සාංඝික විහාරයෙහි ලෑලි නොඇතුරූ උඩු මහල් කාමරයක ඔහත්තෙහි එක් භික්ෂුවක් යට මාලේ සිටියි එක් භික්ෂුවක් උඩු මාලේ සිටි උඩමාලේ සිටි භික්ෂුතෙම ඇණ නොගසා සවිකල කකුල් ඇති ඇඳක වහා හිඳගත්තේය. ඇඳ කකුල ගැලවී යට සිටි භික්ෂුවගේ හිසමත වැටුණේය. ඒ භික්ෂුව දුක්ඛිත ශබ්ද පැවැත්වී භික්ෂූහු දුවමින් ඒ භික්ෂූවට

"ඇවැත්නි, තෙපි කුමක් හෙයින් දුඃඛිත ශබ්ද පවත්වව්දැයි" ඇසූහ. ඉක්බිති ඒ භික්ෂුතෙම භික්ෂූන්ට මේ කාරණය කීයේය. යම් භික්ෂු කෙනෙක් අල්පෙච්ඡවූවාහුද (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 2 (ii) කෙසේ නම් භික්ෂුහු සාංඝික විහාරයෙහි පෝරු නොඅතුල මතු මහල්ලයෙහි ඇණගසා සවිකළ කකුල් ඇති ඇඳක වහා හිඳින්නේදැයි දොස් කියත්, නොසතුට ප්‍රකාශ කරත්. නොසතුටු වචන කියත් භාග්‍යවතුන් වහන්සේට මේ දන්වූහ.

2 "මහණ, ඔබ සාංඝික විහාරයෙහි මතුමහල්තලයෙහි ඇණ නොගසා සවිකළ පා ඇති ඇඳක වහා හිඳිද?" "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය" "භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගැරහූ සේක. (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 3 (iv) "හිස් පුරුෂයෙනි, කෙසේ නම් තෙපි සාංඝික විහාරයෙහි පෝරු නොඅතුල මතුමහල්තලයෙහි ඇණ නොගසා සවිකළ පා ඇති ඇඳක වහා හිඳින්නෝද? හිස් පුරුෂය, මේ නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිසද (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 3 (vi)) මහණෙනි, මෙසේද මතුහි මේ ශික්ෂාපදය උදෙසව්.

3 "යම්කිසි භික්ෂුවක් සාංඝික විහාරයෙක්හි පෝරු නොඅතුල මතුමහල්තලයෙක්හි ඇණ නොගසා සවිකරණ ලද පා ඇති ඇඳක හෝ පුටුවක හෝ වහා හිඳින්නේ නම් හෝ හොවින්නේ නම් හෝ පචිති ඇවැත්වේ"

4 "යමෙක් වනාහි" යනු (මෙහි පාරාජිකා පාලියේ 1 පාරාජිකයේ පදභාජනීයේ 1-2) 'භික්ෂු' යනු මේ අර්ථයෙහි අධිප්‍රේත කරණ ලද භික්ෂුවයි. 'සාංඝික විහාරය" නම් සංඝයාට දුන්නේවේ. පරිත්‍යාග කළේවේ "මතුමහල් තලයෙහි කුටිය" නම් මධ්‍යම පුරුෂයාගේ හිස නොගැටෙන ප්‍රමාණයේය. ඇණ නොගැසූ පා ඇති ඇඳ යනු ලිය කාරා සවි කළේවේ. "හිඳින්නේය" යනු එහි හිඳී. පචිති ඇවැත්වේ. "හොවී" නම් එහි හොවීයි. පචිති ඇවැත්වේ. "සාංඝිකයෙහි සාංඝික අදහස් ඇත්තේද (ii) මතුමහල් තලයෙහි මත විද සවිකරණ ලද (ඇණ නොගැසූ) පා ඇති ඇඳක හෝ පුටුවක හෝ හිඳී නම්" හෝ හොවී නම් හෝ පචිති ඇවැත්වේ.

5 "සාංඝිකයෙහි විමති ඇත්තේ (මෙහි 4 (ii)) සාංඝිකයෙහි පුද්ගලික අදහස් ඇත්තේ මතු මහල්තලයෙහි මත විද සවිකරණ ලද පා ඇති (ඇණ නොගැසූ) ඇඳක හෝ පුටුවක හෝ හිඳී නම් හෝ හොවී නම් හෝ පචිති ඇවැත්වේ.

පුද්ගලිකයෙහි සාංඝික යන හැඟීම් ඇත්තේ දුකුලා ඇවැත්වේ. පුද්ගලිකයෙහි පුද්ගලිකය යන හැඟීම් ඇත්තේ පුද්ගලික අනිකෙකුගේ දෙයෙහි දුකුලා ඇවැත්වේ. තමාගේ පුද්ගලිකයෙහි ඇවැත් නොවේ. හිස ගැවෙන මුලුම්ගල් කල්හි කොටමින් හෝද පරිභාවයෙම නොගන්නේද, පුමරා අතුරන ලද්දේ වේද, ඇණ ගසන ලද්දේ වේද, එහි සිවියේ බැඳ ගනී හෝ එල්වයි හෝ උමතුවූවහුටද ආදි කර්මිකයාටද ඇවැත් නොවේ."

## 9 මහල්ලක විහාර ශික්ෂාපදය

1 එකල්හි වනාහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ කොසඹෑ නුවර ඝෝෂිතාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි වනාහි ආයුෂ්මත් ඡන්නයන්ගේ උපස්ථායක මහාමාත්‍යයෙක් ආයුෂ්මත් ඡන්නට විහාරයක් කරවයි. ඉක්බිති ආයුෂ්මත් ඡන්න තෙමේ අවසන් කරණ ලද විහාරයක් නැවත නැවත සෙවිලි කරවූයේය. නැවත නැවත බදා ගැවූයේය. ඉතා බරින් විහාරය වැටුණේය. ඉක්බිති ආයුෂ්මත් ඡන්න තෙමේ තණද දරද ඇදින්නේ එක්තරා බ්‍රාහ්මණයෙකුගේ යව කෙතක් පාළු කෙළේය.

2 ඉක්බිති ඒ බ්‍රාහ්මණ තෙමේ "කෙසේ නම් පින්වතුන් වහන්සේලා අපගේ යව කෙත දූෂ්‍ය කරන්නේදැයි" කියා දොස් කියයි නොසතුටු ප්‍රකාශ කරයි. නොසතුටු වචන කියයි. භික්ෂූහු දොස් කියන්නාවූ නොසතුටු ප්‍රකාශ කරන්නාවූ නොසතුටු වචන කියන්නාවූ ඒ බ්‍රාහ්මණයාගේ වචන ඇසූහ. යම් ඒ භික්ෂූහු පෙරකී අල්පේච්ඡවූවාහුද ඔව්හු කෙසේ නම් ආයුෂ්මත් ඡන්න තෙමේ අවසන් කළ විහාරය නැවත නැවත සෙවිලිකරවන්නේද, නැවත නැවත පුණු ගාවන්නේදැයි ඉතා බරින් විහාරය වැටුණේයයි දොස් කියත් නොසතුටු ප්‍රකාශ කරත්, නොසතුටු වචන කියත්

3 "ඡන්නය ඔබ අවසන් කළ විහාරය නැවත නැවත සෙවිලි කරවූයෙහිද, නැවත නැවත පුණු පිරියම් කළෙහිද, ඉතා බරින් විහාරය වැටෙයිද, එබඳු දෙයක් කළේ ඇත්තදැයි ඇසූහ "භාග්‍යවතුන් වහන්ස ඇත්තය." භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගර්හා කළසේක. (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 3 (vi) "හිස් පුරුෂය කෙසේනම් තෝ අවසන් කළ වෙහෙර නැවත නැවත සෙවිලි කෙළෙහිද, අවසන් කළ

මෙමෙහෙර ඇලේපනය කරවූයෙහිද ඉතා බරින් විහාරය වැටු-ණේය. හිස් පුරුෂයෙනි, මේය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිස පැහැදුනවුන්ගේ (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 3(vi)) මහණෙනි' මෙසේද මේ ශික්ෂාපදය උදෙසව්.

4 "මහල්ලක නම්වූ විහාරයක් කරවන්නාවූ භික්ෂුව විසින් දොරහි උළුවස්සේ සිට දෙරියන් පමණ දක්වා තැනක් (උළුවස්ස හෝ දොර සවිකිරීමට අගුලක් දැමීමට) කවුළු පිරියම් කිරීම පිණිස (ඉඩ තැබිය යුතුයි) පියසි අග සිට රවුම් දෙතුනක් තුනක්හුගේ බිම ඉඩක් (තබාගත යුතුය.) ධාන්‍ය මුද්ග මාෂාදිය හා ශාකාදිය නැති තැන්හි සිටියහු විසින් ගෙහි බැමවල විධානය කළයුත්තේය. ඉදින් ශාකාදිය නැති තැන්හිද සිටියේ ඉන් එහා සිට විධාන කෙළේ නම් ඇවැත්වේ.

5 'මහල්ලක විහාරය" නම් කරවා දෙන ස්වාමියෙක් ඇති විහාරයයි කියනු ලැබේ 'විහාරය' නම් ඇතුළත සුණු පිරියම් කරණ ලද්දේද, පිටත සුණු පිරියම් කරණ ලද්දේද ඇතුළත පිටත සුණු පිරියම් කරණ ලද්දේවේ. 'කරමින් නම් විසින්' යනු කරන්නේත් හෝ කරවන්නේහෝයි. 'දොරබාව දක්වා' යනු උළුවස්සේ පසුපස මටේව දක්වනු යනුයි. 'දොර සවිකිරීම පිණිස' යනු දොරේ පැවැත්ම පිණිසයි. 'පිරියම් කිරීම පිණිස' යනු ජනෙල් පසු සායම් කිරීම පිණිසය. සුදුපාට, කළුපාට, ගේරුපාට, මල්වැල, මැල්වැල, මෝරදත් කැටයම් පන්චාකාර පටිකාද කළයුතුයි. ජනෙලේ දෙතුන් රවුම් ඇතිව තණ නැති තැන්හි සිට නියම කළ යුතුය. 'ධාන්‍ය' නම් වී ආදිවූ හෝ මුං ආදීවූ හෝ ද්‍රව්‍යයි. ඉදින් මුං තණ පැළෑටිවල සිට නියම කරයිද දුකුලා ඇවැත්වේ. මාගීමයක් වසන නම් විසින් මාගී දෙකක් නියමකොට තුන් වෙනි මාගීය නියම කොට යායුතුයි. උළුමෙන් වසන්නනු විසින් රවුම් දෙකක් නියමකොට තුන්වෙනිරවුම නියමකොට යායුතුයි. ඒවමින් තෙයි තණ නැති තැන්හි සිට නියම කොට නම් යනු "ගඩොලින් වසනු ලැබූ ගඩොල් ගඩොල් ගණනින් පවිති ඇවැත්වේ. ගලින් වසන්නාහට ගලක් ගලක් ගානේ පවිති ඇවැත්වේ. හුණු මලින් වසන්නාහට පිඩක් පිඩක් පාසා පවිති ඇවැත්වේ. තණයෙන් වසන්නාහට මිටක් මිටක්

පායා පචිති වේ. කොළින් මයක්තාකට කොළයක් කොළයක් පායා පචිති ඇවැත්වේ. දෙතුන් රවුම්කට මැඩිවුමෙහි වැඩිය යන හැඟීම් ඇත්තේද, නියම් කරයිද පචිති ඇවැත්වේ. දෙතුන් රවුම්කට වඩා විමති ඇත්තේ නියම් කරයිද පචිති ඇවැත්වේ. දෙතුන් රවුම්කට වඩා අඩුවූ අදහස් ඇත්තේ නියම් කරයිද පචිති ඇවැත්වේ. දෙතුන් රවුම්කට වැඩියෙහි අඩුය යන හැඟීම් ඇත්තේ නියම් කරයිද පචිති ඇවැත්වේ. දෙතුන් රවුම්කට අඩුවූ කල්හි වැඩිය යන හැඟීම් ඇත්තේද දුකුළා ඇවැත්වේ දෙතුන් රවුම්කට වඩා අඩුවූ කල්හි විමති ඇත්තේද දුකුළා ඇවැත්වේ. දෙතුන් රවුම්කට අඩුවූයෙහි අඩුවූයේය යන හැඟීම් ඇත්තේ ඇවැත් නොවේ දෙතුන් රවුම්ක, දෙතුන් රවුම්කට අඩුවූවක, ලෙනක, ගුහාවක, තණකුටියක අනිකෙකු උදෙසා තමන්ගේ ධනයෙන් කරණ කල්හි වාසය කරණ ගෙයක් හැර අන්තන්හි යන මෙතැන්හි ඇවැත් නොවේ. උමතුවූවහුටද ආදිකර්මිකයාටද ඇවැත් නොවේ "

## 10 සප්පාණක ශික්ෂාපදය

1 එකල්හි වනාහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ අලව්නුවර අග්ගාලව චෛත්‍යස්ථානයෙහි වාසය කරණසේක. එකල්හි වනාහි (ii) අලව්නුවර භික්ෂූහු අලුත් කර්මාන්ත කරන්නාහු දැන දැන ප්‍රාණීන් සහිත ජලය තණකොළ වලටද මැටි වලටද (iii) ඉසිත්, ඉස්සවත්. යම් ඒ භික්ෂු කෙනෙක් අල්පේච්ඡවූවාහුද (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 2 (ii)) කෙසේනම් ඉසිත්ද, ඉස්සවත්දැයි දොස් කියත්, නොසතුට ප්‍රකාශකරත්. නොසතුටු වචන කියත්. භාග්‍යවතුන් වහන්සේට මේ දැන්වූහ. "මහණෙනි, (iii) තෙපි දැන දැන ප්‍රාණීන් සහිත ජලය තණකොළ වලටද මැටිවලටද ඉසිත්, ඉස්සවත්, (iv) යනු ඇත්තද?' "භාග්‍යවතුන් වහන්ස, ඇත්තය." භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගැරහූසේක (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 3 (iv)) හිස් පුරුෂයෙනි, කෙසේනම් (මෙහි (iii)) දැයි ඇසූහ. හිස් පුරුෂයෙනි, මේ නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිසත් පැහැදුනවුන්ගේ (මෙහි 1 මුසාවාද ශික්ෂාපදයේ 3 (vi) මහණෙනි, මෙසේද වනාහි මේ ශික්ෂාපදය උදෙසව්

2 "යම් භික්ෂුවක් තෙම වනාහි දැන දැන ප්‍රාණීන් සහිතවූ ජලය ගෙන තණයෙහි හෝ මැටියෙහි හෝ ඉසින්නේනම් ඉස්සවන්නේනම් පචිති ඇවැත්වේ."

3 "යමෙක් මහණෙක්" යනු "භික්ෂු" යනු (මේකී පාරාජිකා පාලියේ 1 පාරාජිකයේ පදභාජනීයේ 1 2) මේ මේ අර්ථයෙහි අදහස් කරණ ලද භික්ෂුවයි. "දනී" නම් තෙමේ හෝ දනීද, අනිකෙකු හෝ ඔහුට කියත්. 'ඉසින්නේය' යනු තෙමේ ඉසීද පචිති ඇවැත්වේ. "ඉස්සවයි" යනු අනිකෙකුට අණ කිරීද පචිති ඇවැත්වේ

4 මරක් ඇණවූයේ බොහෝ ඉසීද පචිති ඇවැත්වේ. ප්‍රාණීන් සහිත ජලයෙහි ප්‍රාණීය යන සැඟීම ඇත්තේ තණ හෝ මැටි වලට ඉසීද ඉස්සවයිද පචිති ඇවැත්වේ ප්‍රාණීන් සහිත ජලයෙහි විමති ඇත්තේ තණ වලට හෝ මැටි වලට ඉසීද ඉස්සවයිද දුකුලා ඇවැත්වේ. ප්‍රාණීන් සහිත ජලයෙහි ප්‍රාණීන් නැත යන සැඟීම ඇත්තේ තණ හෝ මැටි වලට ඉසීද ඉස්සවයිද ඇවැත් නොවේ. ප්‍රාණීන් නැති ජලයෙහි ප්‍රාණීන් ඇත යන සැඟීම ඇත්තේ දුකුලා ඇවැත්වේ. ප්‍රාණීන් නැති ජලයෙහි විමති ඇත්තේ දුකුලා ඇවැත්වේ. ප්‍රාණීන් නැති ජලයෙහි නැත යන සැඟීම ඇත්තේ ඇවැත් නොවේ. නොදැනීමෙන් නොසිහියෙන් නොදන්නාහට උමතු වූවහුට ආදිකර්මිකයාට ඇවැත් නොවේ."

(දෙවෙනි භූතගාම වර්ගය නිමි.)

MW 3356

## National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07

2. Date Scanned : 2017/10/26

3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara

4. Scanning Officer

Name : N.D.R. Gamage

Signature : [signature]

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Irani Wijesundara

Signature : [signature]

Date : 2017/10/26

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*